බුදුරජාණන්

බුදු සා 2500 ලබුවහාකි මහා ලය.

ප්‍රකාශකයා
ජීවන්තා ධම්මික
ශ්‍රී සුමේධාරාම මහනුවර.

"සම්පාදිකා"
ආනන්ද
සාහිත්‍ය සංගමය

මුදලකට විකිණීම තහනම්

" ලොකවිජය "
ග්‍රන්ථමාලා අංක 6

මාරවිජය

හෙවත්

පඤ්චමාර දමනය

කොළඹ දෙමටගොඩ
මහාවිහාරාරාම ත්‍රිපිටක විද්‍යාලයෙහි ආචාර්‍ය
දෙවිනුවර සද්ධාවාස
සඞ්ඝාධිපාදයන් වහන්සේ විසින්
සංශොධනය කරණ ලදී.

ආචාර්‍ය
මුනිදාස වීරකෝන් මහතා
විසින් සම්පාදනය කරණ ලදී.

කොළඹ - පිටකොටුවේ
ශ්‍රී සද්ධම්මෝදය සමිතිය
මගින් පූර්ණ 2500 (2501) ශ්‍රී සම්බුද්ධ මහාපලය නිමිත්තෙන්
සෑදැහැවතුන් පිණිස ආධාර ඇතිව මුද්‍රණය කරවා ධර්මදාන
වශයෙන් ප්‍රචාරය කරවන ලදී.

වෙසක් පුරපසළොස්වක් දින දිය.
ශ්‍රී බුද්ධවර්ෂ 2501

පිළිගැන්වීම

සිරිමා නිය ශ්‍රී ලඞ්කා බුද්ධශාසනය මහත් පරිශ්‍රම යෙන් නඟාලූ බොධිසත්ව වරිතොප ශොභිත

වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණඞ්කර

සඞ්ඝරාජ මාහිමියන්ගේ

ශ්‍රී නාමයට ද

●

සිරිමා නිය සිංහළ සංස්කෘතියට හා බෞද්ධ සංස්කෘතියට පුනර්ජීවය දුන් බොධිසත්ව ගුණොපෙත

ශ්‍රීමත් අනගාරික ධම්පාල

(පසුව සිරිදෙවමිත්ත ධම්පාල සෙට්ඨීන්) තුමන්ගේ

ශ්‍රී නාමයට ද

●

2501 ශ්‍රී සම්බුද්ධ මණ්ඩලය නිමිත්තෙන් සම්පාදනය කරන ලද මේ "මාරවිජය" ධම් ග්‍රන්ථය සම්පාදක යන් විසින් මහත් ගෞරවයෙන් පිළිගන්වනු ලැබේ.

සම්පාදකයන්ගේ හැඳින්වීමයි

1932 වර්ෂයේ "සිංහල බෞද්ධයා" පත්‍රයෙහි "බෞද්ධ මාමා" නමින් පෙනීසිට "ලමා තීරය" මෙහෙයවූ කතෘ මණ්ඩලීය භවතෙකුගෙන් ලමා පාඨකයෙකු විසින් "බොදු මාමේ! මාරයෙක් ඇද්ද? ඔහුගේ තත්ත්වය කෙසේද? යන ප්‍රශ්න දෙක අසා යවන ලදුව එයට පිළිතුරු වශයෙන් "බැනෝ "මාරයා" නමින් පුද්ගලයෙක් නැත. කෙලෙශයෝම "මාරයා" නමින් හඳුන්වනු ලැබේ.', යන පිළිතුර "බොදු මාමා" නමින් පත්‍රයෙහි පළවී තිබෙනු දුටුවෙමි. ඒ කාලයේ ශිෂ්‍යයෙකුව සිටි මමද මේ පිළිබඳව විවේචනාත්මක ලිපියක් යවමින් "බොදු මාමේ "මාරයා" නමින් සත්වයෙක් නැත්නම් එදා ජයසිරි මහ බෝමුලදී බෝසතුන් සමඟ සටන් කළේ කවරෙක්ද? යන්න නැවත විමසුවෙමි. එවිට "බොදු මාමා මට "බැනෝ ඔබ තවම ශිෂ්‍යයෙක් වෙහි. මොලේ දියුණුවීමෙන් පසුව අනාගතයේදී ඔබට මේ ප්‍රශ්නයට පිළිතුරු සපයාගත්හැකි වෙයි. එබැවින් මාරයා නමින් කෙනෙකු නැතිබව මා කෙසේ කීවත් ඔබගේ ලපටි මොලයට මේය වටහා දෙනු නොහැකියි" යනුවෙන් පිළිතුරු සපයා තිබුණි. මේ **"මාර විජය"** නම් ධර්ම ග්‍රන්ථකය සම්පාදනය කළේ එදා මා සිත තුළ ඇතිවූ හැඟීමක ප්‍රතිඵලයක් වශයෙනි.

මාරයා හා මාර දුහිතෘන්

එදා බොදු මාමා තුළ ඇතිව තිබූ "මාරයෙක් නැත" යන අදහස අද සමාජයේද පවතී. මතු සමාජයේද ඇතිවනු හැක. එසේම ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසළ බුද්ධිමත් ඇතැම් පැවිදි පඬිවරයින් තුළද "මාරයෙක් නැත" යන හැඟීම බලපවත්වන බව. එබඳු බොහෝ පඬිවරයන්ගේ ලියුම්-කියුම් වලින් පෙනේ. මේ පඬිවරයින් මාරයෙකු නැතිබව සලකන්නේ කුමක් නිසාද යනු රහසකි. තථාගත දෙශනාව පිළිගනිත් නම් මාරයෙකු පිළිබඳව පමණක් කුමක් නිසා සැක කරන්නාහුද? "මාරයා නොමැතෙක හෙයින් නැත" යනු ඔවුන්ගේ මතය නම් නොපෙනෙන දෙවිලොව; බඹලොව; දුගතිය; හා භූතයින් පිළිබඳව තථාගතයන් වහන්සේ වදාළ දෙශනා සියල්ලම අසත්‍ය විය යුතුයි. එය එසේ වුවද දිව්‍යගණයට අයත් වසවත්මර දෙවිපුත් නොපෙනෙන

නෙසින් මාරයෙකු නැතැයි කියන්නෝ ඒ දෙවගණයටම අයත් ශක්‍රයා ඇතැයි පිළිගන්නාහුද? එසේ නම් ඔවිහු ශක්‍රයා දුටුවාහුද? **දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන** යනුවෙන් "මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් මම දකිමි" යයි වදාළ බුද්ධ වචනය පිළිගන්නාහුද? අපට "මරු" නොපෙනෙන පළියට තථාගත වචනය ඉවත දැමිය යුතුද? මාරයෙකු නැතැයි නිගමනය කළ හොත් මාරයා **නිම්මිකරගෙණ** තථාගතයන් වහන්සේ වදාළ දෙශනා සියල්ලම ඉවත දැමිය යුතුවෙයි. කෙලෙස් මරුන් අරමුණු **කරගෙණ** තථාගතයන් වහන්සේ වදාළ දෙශනා පිළිබඳ කාගේ වත් මතභේදයක් නැති නමුත් සම්බුද්ධත්වයෙන් පසුව ඊරින් වර නානා ප්‍රකාර "වෙස්" මවාගෙණ පැමිණියේ කෙලෙස්මරුද? එසේ නම් සියලු කෙලෙසුන් නසා සම්බුදුවූ බව පිළිගත හැකිද? වසවත් මරු අරමුණු කරගෙණ වදාළ තථාගත දෙශනා සියල්ල අටුවාචාරීන් වහන්සේලාගේ දෙශනා යයි නිගමණය කරමුද? එසේ නම් සෙසු ධම්ද අටුවාචාරීන් වහන්සේලාගේ යයි නිගමනය කිරීම නුසුදුසුද?

මාරයා පිළිබඳව දෙශනා කළ ධම් කලාපයන් බොරුයයිද නොපිළිගත හැකි යයිද පවසන ඊනියා ධම්ධරයෝ කිසිකලෙක කවදාවත් සියැසින් තබා සිතෙන්වත් නුදුටුවිරූ ශක්‍රබ්‍රහ්මාදීන් පිළිබඳව විශ්වාස කරන්නාහුද? එයටත් වඩා ප්‍රදුමය ඊනියා පඬුවන් සම්බුදුරදුන් වෙත පැමිණි මාරදුහිතෑන් නිදෙනා රාග-දෙස-මෝහ යන "පව් මුල් තුන" හැටියට පිළිගැනීමයි **"දියාන තණ්හං අනිංරණඤ්ච - නාභොසිඡ්ජනෙ අපි මෙථුනඤ්ච"** ආදී තථාගත දෙශනාවෙන් ඊනියා පඬිමතය නිරායාසයෙන්ම බිඳ වැටේ. එතරම් ප්‍රණීත තථාගත දෙශනාවකට සැක කරන පඬුවෝ බෞද්ධයෝද?

දසමරසෙන්

මාරයා නැතැයිද "වසවත් මරු නමින් කෙනෙක් බෝසතුන් වෙතට හා බුදුරදුන් වෙතට නොපැමිණියේය"යිද පවසන ඇතැම් අය **"කාමාතෙ පඨමා සෙනා දුතියා අරතිවුච්චති"** යනාදී තථාගත දෙශනාව එයට ආවුධයක් කරගෙන ඇත. එහෙත් අග-මුල නොසෙයා පඬුවන් අල්ලාගත්තේ ඔවුන්ම ඔවුන් කපාගත්තා ආවුධයෙකි. ඒ ඇයිද? වසවත් මරු හා කෙලෙස්මරු එකට අනා කලතා ගොහොරු කරගන් පඬුවෝ එහිම එරී ගියහ. "කාමාතෙ පඨමා සෙනා" ආදී දේශනා ඇතුළත් "ප්‍රධාන" සූත්‍රයෙහි **"පඤ්ඤා**

බන්ධු මාපිම යෙනමෙවන ඉධාගතෝ-අනුමතෙකනපි පුඤ්ඤන අපෙතොඔයනං නවිජ්ජති. ආදීන් වදාළ මුල් දෙශනා පඹුවන්ට **කොපෙනුනේය.** එයද මරු නොපෙනීම වැනි දෙයකි. "එම්බා **මාරය! පමත්ත බන්ධු!** (පව්ටන්ගේ ඤාතිවරය!) නුඹ කියන ගිනි **දෙවියා පිදීමවත් යාග හෝම කිරීමවත් මට අවශ්‍ය නැත. එබඳු දෙයින් පලක් ඇති අයට නුඹේ අවවාදය සුදුසුය" යනුවෙන් බෝසතුන් එදා ආමන්ත්‍රණය කොට මාරයාට කී බව "ප්‍රධාන" සූත්‍රයෙහි විස්තර ලෙස ඇත්තේය. මාරයා එදා බෝසතුන්ට කථා **කාශ්‍යපී ඔවින්නේනෙහිය.** එනිසා මේ දුෂ්කර ක්‍රියාව නවතා ගමට **ගොස් එහිදී පින් දහම් කරගෙන කලින් කල ගිනිදෙවියාද පුදන්-නේනම් එයින් පල ලැබේ" යනුවෙන් අවවාද කළ බව "ප්‍රධාන" සූත්‍ර යෙහි විස්තර වේ. එදා බෝසතුන් කරා ආවේ "කෙලශ මාරයා" නම් එදා බෝසතුන්ට නවුස්දම් එපාවී ගම-රට මතක්වී යසෝදරාව හෝ සතර මහා නිධානය හෝ මතක්වී දුෂ්කර ක්‍රියාව හැරදමා ගමට ගොස් ගිනිදෙවියා පුදමින් පින් සිදුකර ගැනීමට සිතෙන්ට ඇත.** නැවතත් ඒ සිත හැරදැම්ම දුෂ්කර ක්‍රියාව පුරණ බවම තීරණය කරගන්ට ඇත. ඒ එසේද? එහෙයින් කාමාදී සේනාවෝම මාරසේනා බව නිශ්චය කළයුතුවේ. තවද කෙලශමාරයා විස්තර කළ තැනදී ලොභ-දෙස-මොහ-මාන-දිට්ඨි-විචිකිච්ඡා-උද්ධච්ච - අහිරික - අනොත්තප්ප - පීන - මිද්ධ ඉස්සා-මච්ඡරිය-කුක්කුච්ච-ථින තුදුස් අකුශලයන් සංග්‍රහ කරනු ලැබූ "දශකෙලශයෝ" ඇතුළත් කරණ ලදී. තථාගතයන් වහන්සේ "මරසෙන්" විසතර කළ තැනදී,

"කාමාශාව-අරති-බඛගින්න හා පිපාසය-ආහාර පාන සෙවී මෙහි ආශාව-පිනමිද්ධ-භය-සැකය - ගුණමකුඛව හා අවවාදයට නොනැමෙන දැඩිබව-ලාභ කීර්ති ප්‍රසංශා යස ඉසුරු යන මේවා පිළිබඳව යෙදෙන තෘෂ්ණා හා මානය-අනතුක්කං සහ පරවමඤ්ඤන (තමා උසස් නැත නැඹීම හා අනුන්ට අවමන් කිරීම) නම් වූ පහත් ගතිය" යන කරුණු දශය වදාරා ඇත්තේය. වසවත් මරු යෝගාවචරයන් දුබල කරවන්නේ යෝගාවචරයින්ගේ සිතට මෙකී දසමරසෙන් ඇතුල්කරවමින් යෝගාවචරයාගේ සිත වික්ෂෙප (නොසන්සුන්) කරවීමෙනි. නියම වෛතසික බලයෙන් යුත් යොගාවචරයා මෙකී මාරපාසයන්ට නොරැවටී මනදොළ ඉවුකර ගණී. මාරයා කෙලෙස හෝ යෝගාවචරයාගේ සිත නොසන්සුන් කරවයි. සන්සුන් වූ සිතට ධ්‍යාන සමාපත්ති - මාර්ග - ඵල

යකාදී උතුරු මනුෂ්‍යධර්ම උපදවනු හැකි නිසයි. මෙබඳුවූ "මාරයා" සම්බන්ධව තථාගතයන් වහන්සේ වදාළ ඉතා ප්‍රසිද්ධ දෙශනා තිබියදීත් වසවත් මරු ගැන සැක උපදවන්නෝ අවිද්‍යාව බහුලකොට ඇත්තාහුය.

"බෝසත් විෂ්ණු දෙවියෝ"

තථාගත ශ්‍රී මුඛදෙශනා පාළියෙහි නොයෙක් තැන්වල "දෙව පුත්‍ර මාරයා" පිළිබඳ ධර්මදෙශනා මෙතරම් ප්‍රකටව තිබියදී "මාරයා" පිළිබඳව සැක උපදවන්නෝ සුලභවෙති. නමුත් ශ්‍රීමුඛ දෙශනා කොතැනකවත් නොවදාළ බව පෙනෙන; බුද්ධාගමට හෝ බෞද්ධසංස්කෘතියට කිසිසේත් සම්බන්ධයක් නැති "බෝසත් විෂ්ණු" නම් දෙවිකෙනෙකු පිළිබඳව ලොකු භක්තියක් හා ලැදිකමක් බොහෝ ගිහි පැවිද්දන් අතර පවතී. අප විසින් මෙයට පෙර ලියූ "ලොක විජය" නම් ධර්මපුස්තකයෙහි බෞද්ධයින්ගේ "විෂ්ණු භක්තිය" පිළිබඳව කරුණු විස්තර කෙරුණු ය. එසේම පසුගිය වර්ෂයේ ප්‍රචාරයකළ "ලොකොත්පත්තිය හා ලොකවිනාශය" නම් ධර්මපුස්තකයෙහිද "විෂ්ණු දෙවියන් පිළිබඳව විස්තර කෙළෙමු. විෂ්ණු දෙවියන් ලොව මවන හැටි. විෂ්ණු දෙවියන් සදාකාලිකව (නොමැරෙමින්) වෙසෙන අසුරු; ගෞතම සම්බුදුහු විෂ්ණුහුගේ අවතාරයක් ලෙස පිළිගෙණ ඇති අසුරු" හොඳින් සවිස්තර ලෙස දැක්වීමු. ඒ කෙසේ වුවද බෞද්ධයින් අතර මේ "විෂ්ණු භක්තිය" ඉතා දරුණු ලෙස අරටුගැසී තිබෙන අසුරු අද්භූතය. තම තමාට අභිමත ඇදහීමක් විශ්වාසයක් ඇතිකලාට කාගේ හෝ තහනමක් නැත. නමුත් **විෂ්ණු දෙවියන් බොධිසත්වයෙකු ලෙස පිළිගෙණ ඇති මිථ්‍යා විශ්වාසයට නම් අප විසින් ධර්මාන්විතව කරුණු දැක්විය යුතුයි.**

දෙවියන් ඇදහීම; යකුන් ඇදහීම; ගස් ගල් පඹුන ඇදහීම; යන මේවා මිථ්‍යාදෘෂ්ටිබව සම්බුදුහු වදාළහ. මහාමහෙන්ද්‍ර මහරහතන් වහන්සේගේ පැමිණීමට පෙර පුරාණ ලඞ්කාවේ මිනිසුන් යකුන් හා නාගයින් ඇදහූ බව පෙනේ. **ලොව කවදත් දෙව දෘෂ්ටිය බල පවත්වයි.** විපතට පැමිණි මිනිසාගේ සිත දුබල හෙයින් එබඳු වේලාවකදී කාගේ හෝ පිහිටක් බලාපොරොත්තුවීම සවභාවිකය. සවභාව ධර්මයේ අද්භූත ශක්තිය දැන ගැනීමෙහි අපොහොසත්වූ ආදී කල්පික මිනිසා "ජල ගැලීම, වසඹහත රෝග; භූමිකම්පා; වණඹ මාරුත; ගිනිහය ආදී කරදර සිදුවන්නේ අදෘශ්‍යමානව වෙසෙන යම්කිසි මහෙශ්වර භූතයෙකුගේ බලවේගයක් නිසාය" යන

මිථ්‍යා ඇදහීම් ඇති කෙළේය. එකී ඇදහිමේ ප්‍රතිඵලය වශයෙන් බ්‍රහ්ම – විෂ්ණු – මහෙශ්වර නම් ත්‍රිමූර්තීය ලොව ඇතිවිය. කල් යත් යත් අල්ලා – යොහොවා යනාදී මැවුම් කරුවෝද සොයාගණු ලැබූහ. එහෙත් මානව සමාජයෙහි පහළවූ; මානුෂික බලය පිළිබඳ අද්භූත බලවේගයේ නියම ප්‍රතිඵලය ලැබූ; තථාගතයන් වහන්සේ මිනිසාගේ මිනිස් බලය තරම් උසස් බලයක් ලොව නොමැති බව සත්‍ය "අදෙව වාද"යෙන් ලොව හමුවේ පළකළ සේක.

ඒ එසේ වුවද වකවානුව බොහෝ බෞද්ධයින් තුළ පවත්නා දෙව භක්තිය අද්භූතය. "විෂ්ණු දෙවියන් බොධි සත්වයෙකු" ලෙස සලකා වැදුම් පිදුම් කරණ; බොහෝ දෙනා මේ රටේ ඇතත් තථාගත ධර්මයේ; දේශනා නසින්; විෂ්ණු දෙවියන්ට කෙබඳු තැනක් හිමිද? යන්නවත් සොයන බෞද්ධයින් ඉතා විරල වීමය එයටත් වඩා පුදුමය. ශක්‍ර – බ්‍රහ්ම – මාර – සතරවරම් ආදී දෙව් බඹුන් පිළිබඳ සම්බුදුන් වදාළ නමුත් විෂ්ණු නම් බොධිසත්වයෙකු පිළිබඳව වදාරා ඇත්තේ කොතැනකද? ලක් බුදුසසුන විෂ්ණු දෙවියන්ට භාරකළ බව බොහෝ බෞද්ධයින්ගේ පිළිගැණීමක් වෙතත් ඒ පදවිය විෂ්ණු දෙවියන්ට සම්බුදුරදුන් පැවරුයේ කවදාද? ක්‍රොතැන කදීද? සම්බුදුහු පිරිනිවන් මඤ්චකයෙහිදී වදාළායයි පැවසෙන ඓතිහාසිය ප්‍රවෘත්තියක් ඇසුරෙන් විෂ්ණු කෙනෙකු මවාගත් බවක් විනා අන්කිසි තැනකට ඇතුල්වන්ට විෂ්ණු දෙවියන්ට අවකාශයක් නොලැබුනේය. එසේම සසුන රැකීමට දෙවියෙකුට හැකිද? යන්න වත් මේ පඬුවෝ අමතක කළහ. නියම ලෙසින් පිළිවෙත් පුරණ ගිහි පැවිදි ශ්‍රාවකයන්ම සසුන රකින බව සම්බුදුහු වදාළහ. **උත්පල වණ්ණා** නම් දෙවි කෙනෙකුට කථාකොට සක්දෙව් රජ විජය කුමරු සහිත පිරිස රක්ත ලෙස කළ නියමයක් ගැන නම් ඉතිහාසයෙහි සඳහන් වෙයි. නමුත් උත්පලවණ්ණා යනු විෂ්ණු නොවන බව තත්ත්වඥයන්ගේ පිළිගැණීමයි.

පුරාණ ලඞ්කාවේ "උපුල්වන්" නම් දෙවි කෙනෙකුට පුද පූජා පැවැත්වූ බවද; කලුපාට ශරීරයක් ඇති අත් සතරක් ඇති දෙවියෙකු වශයෙන් හිඳු ධර්මයෙහි උගත්වන විෂ්ණු දෙවියන් හා නිල් උපුල් පැහැති උපුල්වන් (වරුණ) දෙවියන්ද එක්කෙනෙකු ලෙස සැලකීම නිසා බෞද්ධයින් අතර මෙලෙසින් විෂ්ණු භක්තිය පවත්නා බවද; උගතුන්ගේ මතයයි. 17 වෙනි ශත වර්ෂයට පෙර උපුල්වන් හා විෂ්ණු දෙදෙනෙකු ලෙස පිළිගෙණ තිබූ බවද එතැන් සිට දෙදෙනා එක් කෙනෙකු ලෙස පිළිගෙණ ඇති බවද **ආචාර්ය් සරණංකාර** මහතාගේ මතයයි. විෂ්ණු දෙවියන්ට ලක්දිව ප්‍රධා-

අසීමිතය. සදාකාලිකවූ ශාස්වතවූ දෙවියන්ට සලකන කල මධ්‍යම් ප්‍රතිපදාව වදාළ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයින්ට තිසරණය-වත් ඉතිරිවේදැයි සිතිය යුතුය.

පරිහාණියක මහත! වත්මන් සෑම වෙහෙරක් පාසාම වගේ දෙවොලක්ද ඇත. දෙවොලක් නැති වෙහෙරක් කරා මිනිස්සුද නොඑති. ප්‍රධාන විහාරස්ථාන බොහොමයක දෙවාල පෙරහැරද පවත්වති. **ඇතැම් භික්ෂූහුද කපුරාළලා මෙන් දෙව ගැතිකම් පවත්වති. විහාරය තුළම දේවරූපද තනාගෙණ බුද්ධපූජාව සමගම දේව පූජාද** පවත්වති. අහෝ! තථා මේ සරණං අඤ්ඤං'' යනාදීන් මට තෙරුවන් පිහිට හැර අනිකක් නැතැයි කියමින් බුදුපිළිමයට වැන්ද බෞද්ධයා දෙවෙනිව බුදුපිළිමය ඇති වෙහෙර තුළම තිබෙන දේව රූපය දෙසට හැරී බුදු පිළිමය දෙසට පිටුපස හරවා දෙවියන් යදින කල තෙරුවන් සරණක් නවත් ඉතුරු වේදැයි විමසන්වා! එසේම දෙවියන්ගෙන් බෞද්ධය බලාපොරොත්තුවන පිහිට ලැබිය නොහැකි බව ධජග්ග සූත්‍රානුසාරයෙන් දැනගත හැකියි.

බොහෝ බෞද්ධයෝ පරලොව සැප සඳහා බුදුන් පුදති. මෙලොව ආරක්ෂාව යහපත පිණිස දෙවියන් අදහති. මෙහෙමන් බුද්ධාගමක් තිබේද? **යස්සත්ථාය කුල පුත්තා-පෙ-දිට්ඨෙව ධම්මෙ** ආදීන් වදාරා ඇත්තේ බුද්ධාගමේ පරමාර්ථය ලැබෙන්නේ මරණින් මතු නොව මෙලොවදී බවයි. එසේ නම් අනිකෙකුගේ පිහිටක් පතන්නට බුදුසරණක් ඇතිවෙයිද? **''එවං බුද්ධං සරණානං ධම්මං සඞ්ඝඤ්ච භික්ඛවෝ** ආදී වශයෙන් ධජග්ගයෙහි වදාළ ආරක්ෂාව ලැබෙන්නේ පරලොවදීද මෙලොවදීදැයි ඇසිය යුතුය. මෙතරම් ආලෝකමත් බුදුසසුනක් දරන මේ කාලයේදීත් බෞද්ධයින්ගේ දේව භක්තිය දුරු නොවීනම් සදහටම බෞද්ධයාත් මිසදිටු අදුරෙහි හිලෙනු ඇත. මුලු ජීවිත කාලයම බාහිර කරදර හා පීඩා වන්ගෙන් කරදර විඳින දුප්පතා තමාගේ පිහිට තකා දෙවියන් යදී. ධනවත් මිනිසා තමාගේ තත්ත්වය රැක ගැණීමට දෙවියන් අදහයි. වාසනාව හෝ අවාසනාව දුරු කිරීමට හෝ ලංකිරීමට කිසිම දෙවියෙකුට හෝ බඹෙකුට බැරිය. ආධ්‍යාත්ම චේතසික බලයට වඩා උසස් දෙවියෙකු හෝ බඹෙකු නැති බව නැණැතියෝ සලකත්වා! බුදුන් පිරිණිවී බවද දෙවියන් ජීවමාන බවද එහෙයින් පිරිණිවී බුදුන්ට වඩා ජීවමාන දෙවියන්ගෙන් පිහිට ලැබිය හැකි බවද සිතීම මිථ්‍යා දෘෂ්ටියක් බව සලකත්වා

නමයක් වැඩිපුර ලැබුනේ සෙංකඩගල රාජධානියේ දමිළ රජ වරුන්ගේ කාලයේය. සතර දෙවොල ක්‍රමය ඇතිවූයේ සෙඞ්කඩගල රාජධානි සමයේ බවද එයට පෙර එබඳු දෙවොල ක්‍රමයක් නොවූ බවද ඉතිහාස නයින් පෙනේ. දුටුගැමුණු පැරකුම්බා ආදී නරනාථ-යන් දෙවියන්ගෙන් පවා වැඩගත් නමුත් වත්තීමාන බෞද්ධයින් මෙන් දේවගැතිකම් නොකළ බව කිව යුතුය.

වත්තීමාන බොහෝ ගිහි පැවිද්දන් බෞද්ධ නමින් පෙනී සිටින දේව භක්තිකයින් බව කිව යුතුය. තිසරණ බලය අජීවමාන ලෙසද දේව බලය ජීවමාන ලෙසද සලකා බුද්ධ පූජාවට වඩා උසස් අඳුමින් දේව පූජා පවත්වන්නාහ.

ක්‍රිස්තියානි – හින්දු මහමත් ආදී දේව ආගම් "මිථ්‍යා ආගම්"යයි කියමින් ඊනියා බෞද්ධ ගිහි-පැවිද්දේ අබෞද්ධවූ විෂ්ණු දෙවියන්ට ගැතිකම් කරන්නාහ.

විශෙෂ ලිපියක්

විෂ්ණු දෙවියන් බොධිසත්වයෙකු ලෙස සලකා වැඳුම් පිදුම් කරන; විෂ්ණු දෙවියන් අදහන; බොහෝ බෞද්ධයෝ මේ රටේ සිටිනත් තථාගත ධර්මයේ විෂ්ණු දෙවියන්ට කෙබඳු තැනක් හිමිද යන්නවත් බොහෝ බෞද්ධයින් නොවිමසිමයි පුදුමය! ශක්‍ර – සුයාම – ප්‍රජාපති – වරුණ – ඉන්ද්‍ර – සන්තුෂිත – නාථ-උත්පලවණ්ණයනාදී බෞද්ධ දෙව් දෙවතාවන් කොතෙකුත් ඇතත් "විෂ්ණු" නමින් දෙවිකෙනෙකු ශ්‍රාවණ බුද්ධවචනයෙහි කොතැනකවත් නැත **වෙණහුව දෙවා සහලිව** යනාදී වශයෙන් "මහා සමය" සූත්‍ර දෙශනාවෙහි ඇතත් එය "වෙණහු" නම් "දෙව නිකායක් බව" සැලකිය යුතුය. **සත්තෙතෙ දෙව නිකායා** යනුවෙන් එහිම ඇති දෙශනා පාඨය එය අනුමත කරයි. එසේ නම් මේ විෂ්ණු දෙවියන්ට බෞද්ධයින් මෙතරම් ගරුකරන්නේ ඇයිද? විෂ්ණු දෙවියන් බොධිසත්වයෙකු ලෙස වදාරා ඇත්තේ කෙබඳු කිනම් දෙශනාවකද? ලක් බුදුසසුන විෂ්ණු දෙවියන්ට භාරකළ බව බොහෝ බෞද්ධයින්ගේ විශ්වාසය නම් තථාගතයන් වහන්සේ විෂ්ණු දෙවියන්ට ඒ පදවිය පැවරුයේ කවදාද? කොතැනකදීද? විෂ්ණු භක්තිකයෝ පිළිතුරු දෙත්වා!

හින්දු ධර්මයේ දැක්වෙන පරිදි විෂ්ණු දෙවියෝ ලොක නිර්මාණකයෝය. ඔහු කියි දිනක නොමැරෙති. සදාකාලික ආත්මයක් ඇති විෂ්ණුනු ලෝකය මවති. එසේම මකති. ඔහුගේ බලය අප්‍රතිහතය.

ශ්‍රී සද්ධම්දාන සමිතිය

අප විසින් මේ ධම් ග්‍රන්ථය සම්පාදනය කරණ ලද්දේ **පිටකොටුවේ ශ්‍රී සද්ධම්දාන සමිතියේ** ඉල්ලීම පිටයි. මෙයට පෙරද අප විසින් "හෙතු-ඵල වාදය" "ලොකොතප්පත්තිය හා ලොක විනාශය" ලොක විජය" යන ධම් ග්‍රන්ථද මෙම සමිතියේ ඉල්ලීම පිට සම්පාදනය කරදෙන ලදී. තවද මෙම සමිතිය මගින් දිනපතා උදේ 6 සිට 7 දක්වා කොළඹ කොටුවේ මල්වත්ත පාරේ බාන් ඔර්ලෝසු කණුව ඉදිරිපිට සති සථානයෙහිදී ධම්දෙශනා පඩිපාටියක් කරවා ගෙණ එන බවද වත්මනකට වරක් වටිනා ධම් ග්‍රන්ථයක් පිළිමයළු කරවා ධම්දාන වශයෙන් ප්‍රචාරය කරවන බවද ප්‍රීතියෙන් සඳහන් කරමු. දැනට සමිතිය මගින් ධම්දෙශනා 1000 කට නොඅඩු ගණනක් අප ලවා දෙශනාකරවා ඇති බවද ගෞරවණීය ධම් කථික සථාම්පාදයන් වහන්සේලා ලවා මාසයකට වරක් ධම්දෙශනා කරවන බවද සැලකිය යුතුය. මෙම සමිතිය මගින් ප්‍රදානය කරණු ලබන වටිනා ධම්ග්‍රන්ථ ලක්දිව බොහෝ පලාත්වල ශීල-භාවනා ව්‍යාප්තිරත්වන්හි යෙදෙන පින්වතුන්ට අතිශයින් ප්‍රයෝජනවත්වී ඇතිබව අප වෙත එවා තිබෙන ලියුම්වලින් පෙනේ. එසේම බෞද්ධසමාජය තුළ බෙහෝසෙයින් මතභේද සහිතව පවත්නා වැදගත් කරුණු අලලා විවේචනාත්මකව ලියනු ලබන අපේ ධම්ප්‍රසාදකයන් නිසා දහස් ගණනකගේ ධම්ඥානය දියුණුවන අතරම "මිථ්‍යා හැඟීම්" දුරුවී ඇති බවද අනිශයොක්තියෙන් තොරව ප්‍රකාශ කරමු වෙසක් උත්සවය නිමිත්තෙන් නොයෙක් ක්‍රමයේ ධම්ප්‍රසාදකයන් මේ රටේ ප්‍රචාරය වෙතත් මෙම සමිතිය මගින් ප්‍රචාරය කරණ තරම් ව්‍යාප්තවූත් ප්‍රයෝජනවත්වූත් ධම්ප්‍රසාදකයන් අන් කිසිම සමිතියකින් මේ දක්වා ප්‍රචාරය නොකරණලද බව අපේ විශ්වාසයයි. එහෙත් මේ සමිතිය ප්‍රචාරය හෝ කිර්තිය බලාපොරොත්තුවෙන් කටයුතු නොකරන බවද අවබෝධ ප්‍රතිපත්තියකින් ක්‍රියා කරන බවද ලෝකයා පිළිගනු ඇත. අද රටේ බොහෝ බෞද්ධ කටයුතුවල ඇත්තේ බාහිර ප්‍රචාරය හා ශොභාවයි. නැතහොත් ඉතා හෙමින් ගෙණයන සම්මාදම් ව්‍යාපාරවෙති. එහෙත් මේ සමිතිය වරායේ සේවයකරණ සැදුහැවතුන්ගේ ධම්ඥානය හා බෞද්ධ හැඟීම් දියුණු කරවන අතරම අපරාධ මර්දනයට හා සුචරිත වර්ධනයට රුකුල්දෙන බවද සඳහන් කළයුතුය. එසේම සමාගමේ ධම්ප්‍රසාදක ලබාගත් සම්භාවණීය ගිනි-පැවිදි උතුමන් විසින් සමාගමේ ශ්‍රේෂ්ට ව්‍යාපාරය ප්‍රශ්ලිබඳව එවා තිබෙන ප්‍රශංසාත්මක පුණ්‍යානුමෝදනා පුළුක ලිපි ගියගණනක් ඇති බවද ප්‍රීතියෙන් සඳහන් කරමු.

දැනට මෙම සමිතියේ ප්‍රධානත්වය දරන; විදෙශ කටයුතු හා **ආරක්ෂක** කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සැතේට් මන්ත්‍රීරයේ **සේවයෙහි නියුකත ඇල්. ජී. එච්. පී. ජෝන් මහත්මයා** පිළිබඳව **විශෙෂයෙන්** සඳහන් කළ යුතුය. සමිතියේ දියුණුව ගැණ විශෙෂ ලැදිකම්කින්ද උදේශයකින්ද ක්‍රියා කරන මේ මහත්-මයා අපටද ධම් ප්‍රසාත්‍ත සමූහයක් පරිත්‍යාග කෙළේය. එසේම ලඞ්කා බෞද්ධ මණ්ඩලය මගින් ප්‍රචාරය කරවනු ලබන **සිංහල ත්‍රිපිටකය හා සිංහල විශව කොෂය** ගැණීම පිණිස අපට රුපියල් 500/ක පරිත්‍යාගයක්ද කෙළේය.

එසේම සමිතියේ භාණ්ඩාගාරික ධුරය දරන පන්නිපිටියේ පී. ඩී. ඇස්. රාජපක්ෂ මහතාගේ විශෙෂ පරිශ්‍රමයද අවඞක ක්‍රියා මාර්ගයද සමිතියේ චිරජීවනයට හේතු බව විශෙෂ වශයෙන් සඳහන් කරමු. එසේම සමිතියේ ලේකම් වරුන් වන **ඇල්. බාලසුන්දරම් මහතා හා වී. ඒ පුන්චිබණ්ඩා** යන මහතුන් පිළිබඳවද උප සභාපති තැන්පත් සී. ඩී. වර්ලිස් වෛද්‍යවාය්‍ය මහතා හා පරීක්ෂක ඞී. ඩී. මුනසිංහ මහතා පිළිබඳවද සඳහන් කළ යුතුය. මේ මහත්වරු සමිතියේ කටයුතු පිළිබඳ ලැදිකමකින් හා උදේශ්‍ය-යකින් ක්‍රියා කිරීම නිසා මෙබදු උදාර ධම්දානමය කුශලයක් කර ගැණීමට හැකිවී තිබේ. එසේම මාසික සාමාජික මුදල් ගෙවාගෙණ දිකපතා කරණු ලබන ධම්දෙශනා පුණ්‍යක්‍රියාවේ මූලික වගකීම් බලය ඇත්තේ නිත්‍ය සාමාජික මහතුන් කෙරෙහි බවද එහෙයින් **මේ සමිතියේ නිත්‍ය සාමාජික මහතුන්ගේ අනුග්‍රහය** සමිතියේ උදාර සේවය තහවුරු වීමට හේතු බවද ප්‍රකාශ කරමු. එසේම අපට මාස්පතා "සීසන් ටිකැව්" එක පරිත්‍යාග කරණ වරායේ "බෝට් හවුස්" එකේ මහතුන්ට වෙනත් අයුරින් අපට සැලකිලිමත්ව ක්‍රියා කරන සියලුම පින්වතුන්ටද හෘදයඞගම දයා පූර්ණ සතුතිය පිරි නමමු.

විශෙෂයෙන් මෙහි මුද්‍රණ කටයුතු ශොභන ලෙසටද සැලකිලි-මත් ලෙසටද කරදුන් **මරදානේ ඩිබර්ශස් ඇවිනිව්ති ගුණරත්න මුද්‍රණාලයේ අධිකාරී මහතුන්ටද කාය්‍යමණ්ඩලයටද සතුති වන්න වෙමු.**

සම්පාදනය හා සංශොධනය

මෙම ධම්ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහිදී හැකි තරම් "පෙළට" හා අටුවාවන්ටද අනුකූලව කරුණු සකස් කෙළෙමු අපේ මූලිකා-ධ්‍යාශය වූයේ "**භාග්‍යවත්** මර දෙවිපුතු" පිළිබඳ පෙළ ධම්යෙන්

කරුණු දැක්වීමටය. ඒ පිළිබඳව **මාරසංයුත්තකය;** මැදුම් සහියේ **නිවාප සූත්‍ර: අහඟ සැඳෑ සූත්‍ර සිංහනාද සූත්‍ර;** ආදී සූත්‍රදෙශනාද, **අඞ්ගුත්තරනිකායට** අයත් ඇතැම් ධර්ම කථාපද **මහා පරිනිර්වාන සූත්‍රයද** මුල්කර ගතිමු. මේ දෙශනාවන්හි අර්ථකථාද; **ජාතක කථාවද; සූත්‍රනිපාතය හා එම අටුවාවද ; ධම්ම පදය කථා හා බුද්ධවංසය කථා** වද; යන ධර්මග්‍රන්ථයන්ගෙන් කරුණු උපුටා ගතිමු.

තවද මෙහි ආරම්භයේ සඳහන් මනොප්‍රණිධාන කථා හා වාග් ප්‍රණිධාන කථාද; සුවිසි විවරණ කථාද; පලාඛත්ගල **"වානවාසික ධර්ම කීර්ති සඞ්ඝරාජ" හිමියන්ගේ** "සද්ධර්මාලඞ්කාර"යෙන් උපුටා, එසේම සංග්‍රහ කෙළෙමු. මෙහි ඇතුළත් "මාර විජය කථා"වෙහි කෙලෙසමාර දමනය පිළිබඳ විස්තරය "බුද්ධඝොෂ" හිමියන්ගේ "විශුද්ධිමාර්ගීය" අනුව සම්පාදනය කෙළෙමු. එපමණක්ද නොවේ. **ලක්මිණි පහන් කතුතුමාගේ හා බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි, දේරැඳානේ චන්‍දවිමල හිමි** යන හිමිවරුන්ගේ කෘතිද ඇසුරු කළ බව ගෞරවයෙන් මතක් කරමු.

තවද විශෙෂයෙන් ආචාර්ය දෙවිනුවර **ඤාණාවාස** සවාමීන් වහන්සේගේ "අභිධර්මයෙන්" ද කරුණු උපුටාගත් බව සඳහන් කරන්නේද ගෞරවයෙනි, එය මෙම ග්‍රන්ථයේ ගෞරවය හා වටිනාකම වැඩිවීමට හේතු වනවා ඇත.

මෙම ධර්මග්‍රන්ථය සංශොධනය කරන ලද්දේ දෙමටගොඩ මහා විශුද්ධාරාම ත්‍රිපිටක විද්‍යාලයේ ආචාර්ය **ගෞරවණීය ආභිධර්මික දෙවිනුවර ඤාණාවාස** හිමියන් විසිනි. බලවත් අව්වේකීතාවයන් මධ්‍යයේ උන්වහන්සේ අප වෙත කරණ ලද **සානුකම්පික අනුග්‍රහය** පිළිබඳව ගෞරවාභිවාදනයෙන් මෙහිලා සඳහන් කරමු.

තවද මූලික ධර්මග්‍රන්ථකයන් සපයාදීමෙන් අපට අනුග්‍රහ කරණ ලද ගෞරවණීය **ගල්කිස්සේ සුමඟල** සවාමීන් වහන්සේද, ගෞරවණීය **මිරිස්සේ සුදස්සී** සවාමීන් වහන්සේද ඉතා ගෞරවයෙන් සිහිපත් කරමු.

2500 ශ්‍රී සම්බුද්ධ මඞ්ගලය

මේ වර්ෂය වනවිට තථාගත ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 2500 ක් ඉක්ම ගියේය. මේ වෙසක් පසළොස්වක්දා සිට 2501 ආරම්භ විය. 2500 දී **දියසේන** කෙනෙකු පහළවන බව කලක සිට බොහෝදෙනා අතර පැවති අදහසකි. එනෙත් එය මාර්ගඵලයක්

නෝ මිරිඟුවක් බව අපි බොහෝ පෙර සිටම පැවසීමු. එය එසේම ය. **"දියසේන පිස්සුව"** ඇතැමුන් තුළ තවමත් බලපවත්වයි. ශීල-භාවනා ප්‍රතිපත්තිද පෙරහර හා උත්සවද මේ සම්බුද්ධ ජයන්ති වර්ෂය තුළ බහුල වශයෙන් පැවැතුන නමුත් **බෞද්ධබලය දියුණුවට හේතුවන එකද සජීව ක්‍රියාමාර්ගයක් මේ බුද්ධජයන්ති වර්ෂය තුළ සිදු නොවූ බව** සංවේගයෙන් පළකළ යුතුව තිබේ. **ශතවර්ෂ 5 ක** පමණ කාලයක සිට මේ රටේ ඇතිව තිබෙන **සංඝර අධ්‍යාපනය හා සංඝර සභ්‍යත්වය** නිසා බෞද්ධබලය පිරිහෙමින් පවතී. පාලක-යෝද දෙශපාලනයම මුල්කොටගෙණ දෙශපාලන පොරපිටියට වැදී ආත්මාර්ථකය තකා සටන් කරති. නානාප්‍රකාර හේතූන් නිසා ගිහි-පැවිදි බෞද්ධසමාජය භේද-භින්නව සිටී. බෞද්ධබලය දියුණුවන ක්‍රියාමාර්ගයක සේයාවක්වත් තවම නොපෙනීම බෞද්ධ-යින් වශයෙන් සංවේග උපදවන්නකි. පින්වත! නොද බෞද්ධයෙක් වන්න! ආත්මාර්ථය තකා බෞද්ධසභ්‍යත්වයට පිටුපා ක්‍රියා නොකරන්න! බුද්ධජයන්ත් තමන් ආරම්භකළ බොහෝ ප්‍රචාරක කටයුතු මේ වර්ෂයේ සිට බොහෝසෙයින් නවතිනු හැකිසි. එහෙත් ඉදිරිකාලයේ නොද බෞද්ධයෙකුවීමට ප්‍රතිපත්ති ආරම්භ කිරීමල් මේ වර්ෂය ඔබට නොද ඉලක්කයක් කරගන්න.

වියතුනි!

පොදු ලෝකයාගේ ප්‍රයෝජනය පිණිස මෙය සම්පාදනය කෙළෙමු. එහෙයින් මෙහි භාෂාව ලිහිල්ලෙස යෙදීමු. වියරණ දෙස් නෝ වෙනත් දෙස් මෙහි ඇතොත් සුධිහු එයට සමාධිය භජනය කරත්වා!

මෙය නැවත මුද්‍රණය කරවීමේ අයිතිය පිටකොටුවේ ශ්‍රී සද්ධම්-දූත සමිතිය සතුය. අපේ අත්සන නොමැති පොතක් ලඟ තබා ගැණීම නීතිවිරෝධී බව සැලකිය යුතුය!

මිට, භිතෙෂී,

1080, නුවරපාර,
කැළණිය.

ශුද්ධි පත්‍රය

(පොත භාවිතයට ගැණීමට පෙර වැරදි වවන නිවැරැදි කරගන්න)

පිට-	පෙළ-	වැරදි	-	නිවැරදි
16 -	23 -	නිගෙගොහවීදෙසි	-	නිගෙගාහවීදෙසි
21 -	30 -	අනනඃකලපයෙහි අසඛඛය කලප	}	අනනඃකලපයෙහි අට අසඛඛය කලප
36 -	21 -	සතා සඛඛය	-	නවා සඛඛය
49 -	23 -	අවජනති	-	අවජානති
,, -	24 -	ලහතො	-	ලහතෙ
50 -	12 -	නජානති	-	නජානනති
51 -	16 -	සතයාවබොධය නිසා	-	සතයාවබොධය පිණිස
,, -	54 -	අනුකූලයවූ	-	අනුකූලවූ
55 -	34 -	සිසුම්	-	සිය්‍යුම්
86 -	10 -	සතුඊධයාන	-	චතුඊධයාන
90 -	8 -	විණයඝඝුම	-	විඝඝුණයම
103 -	24 -	සඛඛයත	-	සඛඛයාත
113 -	12 -	රූපයත් - පරිවිත	-	රූපයත් - පරිවිත
121 -	25 -	දුගතො	-	දුගඅත
134 -	3 -	මහානාම	-	මහනාග
149 -	26 -	පලෙකතො	-	පලොකතො
186 -	9 -	තත්ථි	-	තත්ථ

තවද මෙහි වියරණ දෙස්ද ත-ණ-ළ-ල දෙස්ද නිබෙනු හැකියි. අර්ථය වවහා ගැණීමට බාධා නොවන එබඳු වැරදි මේ ශුද්ධි පත්‍රයෙහි ඇතුළත් නොකළ බව සලකනු මැනවි.

ශ්‍රී ජිනෙන්ද්‍රාය නමොඋතු

මාර විජය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

යෝ සනතිසිනෙනා වර බොධිමූලෙ
මාරං සසෙනං මතිනං විජිතවා
සම්බොධි මාගඡුජි අනනතඤාණෝ
ලෝකුතතමං තං සතතං නමාමි.

යෝ, කෘතාධිකාරවූ මහාවීරවූ යම් මහා ප්‍රාඥයාණසොතෙන්; **වර බොධිමූලෙ,** "අශ්වත්ථ" නම් ප්‍රවර බොධිදෘම මූලයෙහි; **සනති-සිතෙනා,** චතුරඞ්ග සමන්නාගත වීර්‍යාධිෂ්ඨානයෙන් තුදුස් ගියහු වීර්‍යාසනය මත වැඩහුන්නේ; **මතිනං සසෙනං,** මහ පිරිස් සහිතවූ; **මාරං,** දෙවපුත්‍රමාර-කිලෙසමාර-අභිසංසකාරමාර-මෘත්‍යුමාර-ඛන්ධ-මාර යන පස්වැදෑරුම් මරුන්; **විජිතවා,** දමනයකොට; **අනනත-ඤාණෝ,** අපරිමිත, අප්‍රතිහතඥාණයෙන්සමන්විතවූයේ; **සම්බොධිං,** සම්බුද්ධත්වඥානයට; **ආගඡුජි,** අවබොධ ප්‍රතිවෙධ කිරීම වශයෙන් පැමිණියේද; (සම්බුද්ධත්වඥානය ලැබුවේද); **ලෝකුතතමං,** ත්‍රිවිධ ලෝකයට උතුම්වූ, **තං,** ඒ භාග්‍යවත් තථාගතයන් වහන්සේ; **සතතං,** නිරන්තරයෙන්; **නමාමි,** කාය-වාඞ්-මනඃ යන ත්‍රිවිධ ද්වාරයෙන් ත්‍රිවිධ ප්‍රණාමයෙන් (මම) නමස්කාර කරමි.

කෘතාධිකාරවූ මහාවීරවූ කෙබඳු මහොත්තමඥාණ සොතෙනක් සෙසේ නම් "අශ්වත්ථ" බොධිදෘම මූලයෙහි තුමක් සිණිස වැඩහුන්නේදයන්!

මේ මහා භද්‍රකල්පයට විසතා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් ඔබ දඹදිව මධ්‍යදෙශයෙහි උපන් එක් වෙළඳ පුත්‍රයෙක් මාතෘපෝෂක ධර්මය රක්නේ; වෙළඳුම් පිණිස මවත් සමග නැවිනැවී මුහුදු යාත්‍රා-වෙහි නිත්ම ගමන් කරණුයේ, නැවිනැවි සත්වනද, චණ්ඩ වායු වේගයකින් නැව බිඳී ගියකල සැඩ සුළඟින් මහගල්කුළුසේ අහසට නගින මහා රළපහර මඬිමින් මැනියන් කරපිට හොවාගෙන මහ-මුහුදු පිහිනන්ට පටන් ගත්තේය. ශුද්ධාවාස බඹලොව වසන අනාගාම් ධර්මරාජයෙක් එයට පෙර මහාකල්ප අසඞ්ඛ්‍යයක සිට

සම්බුදුවරයාණ කෙතෙකු ලොව නොපහළවූ බව දැන එහෙත් බුද්ධ කාරක ධර්ම පුරණ බොහෝ බෝසතුන් වසන බවත් දැක සතුටු සිත් ඇත්තේ තව තවත් වඩ වඩා වීරපුරුෂයන් ලවා බොධිකාරක ධර්මයන්හි වීර්‍යය වඩවමි සිතා නැවතත් මුලුලොව බලනුයේ යථොක්ත මහා පුරුෂයා දැක්කේය. "අහෝ! මේ මහා වීරයෙක! සිය පණතලවත් රකිනුවට වෙහෙස නොදරිය නැති මේ මහමුහුද මැද සිය මැනියන්ද රැගෙණ පරතෙරක්ද නොපැණෙන මේ මහා සාගරයෙහි එතෙරවන අටියෙන් වෙහෙසෙන මොහු මහා පුරුෂයෙක! අක්මුල් නැති සසර සසුරෙන් තමාද එතෙරවී අනුන්ද එතෙර කරවීමෙහි සමත් විරියක් මොහුට ඇතිබව පෙනේ. බුද්ධ කාරක ධර්ම පුරන්නෝ ලොව විරලයහ. එහෙයින් මේ මහා වීරපුරුෂයා සම්බුද්ධත්වයට පත්කරවනු පිණිස බුද්ධකාරක ධර්ම පූරණයෙහි උත්සාහීමත් කරවිය යුතුය"යි සිතූ ඒ බ්‍රහ්මරාජයා ඒ මහාවීරයාගේ චිත්තාභ්‍යනතරයට ප්‍රවිෂ්ටව බුදුබැව් පතනසේ සිත්සතන් යොමු කරවිය. එකෙණහිම මුහුදු දියපිට පිහිණන සිය පුතු ඇමතූ මැණියෝද "පුත! ඔබ මගේද පණතල රකිණු පිණිස කරණ මේ කුහලය හේතුකොටගෙන ඔබට ලොව්තුරා බුදුබව ලැබේවා"යි පැවසී.

මෙසේ මහබඹහු විසින්ද මැණියන් විසින්ද උත්සාහවත් කරණලද ඒ මහා පුරුෂයාණෝ-

"බුද්ධාහං බොධසිස්සාමි-මුත්තොහං මොචයෙ පරෙ
නිණ්ණොහං තාරයිස්සාමි-සංසාරොඝා මහබ්භයා"

"මම මතු සම්බුදුව ලෝසතුන් දුකින් ගලවමිහ"යි යනාදීන් මෙසේ සිතින්ම ප්‍රාර්ථනා කළහ. ඉක්බිති සිතින් ඇතිකරගත් මේ බුද්ධත්වයෙහිද මහාබ්‍රහ්මයාගේද ආනුභාව බලයෙන් සැපසේ මහ මුහුදින් ගොඩනැගී පිටිසර එක්තරා ගමකට පැමිණ මැණියන් සමග එහි වැස දිවිහිමියෙන්ම මැණියන්ට උවටැන්කොට එසින් මිය දෙව්ලොව උපන්නේය.

(මෙසේ එදා "මම ලොව්තුරු බුදුවෙමිවා! සියලු සතුන් දුකින් ගලවම්වා"යි ප්‍රථම මනෝ ප්‍රණිධානය ඇතිකළ ඒ මහා වීරයාණෝ අන් කෙතෙකු නොව මෙදා ගෞතම ගොත්‍රයෙහිවූ-ශාක්‍යකුල තිලකවූ පරදුඃඛ දුඃඛිතවූ කරුණා නිධානවූ තුන්ලොකාග්‍රවූ තුන්-ලොවට තිලතාවූ මාගෙ අමාමැණිවූ ඒ තථාගත සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රූපෝත්තමයාණන් වහන්සේමය.)

මේසේ ප්‍රථම මනෝ ප්‍රණිධානය ඇතිකළ මහබෝසත්තුමෝ බොහෝ කලක් දෙව්ලොව දිවසැපත් විඳ නැවත ඉන් චුතවූවෝ

දඹදිව එකල "සිරිමතී" නම් (මෙකල බරණැස්පුර) නුවර බඹදත් රජුට පුත්ව ඉපිද සියරජු ඇවැමෙන් රාජ්‍යයට පැමිණියහ. නමින් "ශත්‍රුතාප" යයි ප්‍රසිද්ධවූහ. ("බොධිසත්ව"වූ මේ මහ රජුන්ගේ පේජසින් හැතිගත් දඹදිව්හොලෙහි සියලු රජවරුන් විසින් මෙතුමාට එවනලද පඹුරු පාක්කුඩම් අතුරෙක් නොවීය. ඒ රජවරුද බෝසත් රජු ශත්‍රුතාප නම් වූහ.)

සුරඉසුරු විදිනා සක්දෙව්දු මෙන් අපමණ නරඉසුරු විදිමින් වසන ශත්‍රුතාප රජතුමෝ ඇත්කෙළියෙහි වැඩී ඇල්මකින් වෙසෙති. සම්කිසි තැනෙක ඇතෙකුගේ සිරුරුපයක් ඇසුවාහු වීනම් රැදුවල් කවර වේලක උවද එතැන්හි ගොස් ඒ ඇතු බඳවා නමන්ගේ ජිජිනයට ගෙණවුත් සෙසු ඇතුන් හා දළින් දළ අන්කවා ඇත්කෙළි කෙළනාහ. මෙබඳු ඇත්කෙළියෙහි නිපුණකම වෙසෙති.

එකල එකුවර වසන එක් වැද්දෙක් දුනුහි ගෙණ මුවදඩ සිඟිස වලට ගොස් එහි ඇවිදිනේ එක්තරා විලක් ළඟ සිටි සළුලක්ෂණ සම්පන්න හස්තිරාජයකු දැක නුවරට අවුත් රජුකරා එළඹ ඇතුගේ සිරුරුපය වර්ණනාකොට කීය. ශත්‍රුතාප මහරජාණෝ වැද්දුට බොහෝ සැපත්දී සෙනඟ පිරිවරා වැද්ද පෙරටුකොට නුවරින් නික්ම ඔගඟෙවා ඒ ස්ථානයට පැමිණ ඇතු බඳවා නුවරට ගෙණවුත් සියලු ඇතරුවන්ට ප්‍රධානවූ එක් හස්ත්‍යාචාර්යයකු සමීපයට කැඳවා ඔහුට විශේෂයෙන් බොහෝ සඬ්‍රහ්කොට "එම්බා ආචාරීනි! මිට සත්වන දවස් මා මොහු පිට නැගී නුවර ප්‍රදක්ෂිණාකොට ඇතුන් කෙළිකෙළනා පරිද්දෙන් මේ ඇතු හික්මවා ගෙණවුත් දක්වා ලව්"සි කියා ඇතු පාවා දුන්හ.

හස්ත්‍යාචාර්‍යයී නුමෝද ඒ සත්දවස තුළ ඇතු හික්මවා ගෙණවුත් මහරජුට පාවා දුන්හ. රජ්ජුරුවෝද ඇතු ඉතා විනීත බැව් දැක නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් ඇතු සරසවා ඇතු පිට නැගී සිවුරඟ සෙනඟ පිරිවරා නගර ප්‍රදක්ෂිණාවෙහි යෙදුනෝය. එයට පළමු දින රාත්‍රිය තුදුස්වකවූ හෙයින් බොහෝ ඇත්ඵු වලින් අවුත් රජ උයනට වැද අඹදඹ ආදී නොයෙක් මහඝ ජාතීන් බිඳහෙලා ඔසින් මැඩ සුණුවිසුණු කෙරෙමින් ඒ ඒ තන්හි දිය සලා ඉලතනී ලා උයන බැලිය නොහැකිසේ නිශ්‍රීකකොට ගියහ.

රාත්‍රිය පහන්වූකල උයන් පාලකයෝ එපවත් දැක රජුට ඒ බව සැලකළාහුය. නගර ප්‍රදක්ෂිණාව අවසන්කළ රජතුමෝ ඒ ඇතු පිටින්ම උයනට ගොස් ඒ ඒ තැන්හි ඇතුන් සළ

ඒ ප්‍රකාර බලා බලා ඇවිදුනාහ. අලුත නික්මවනු ලැබූ මඟුලැත්
තෙමේ ඇතින්නන්ගේ ශරීර ගන්ධය ආඝ්‍රාණයකොට මදකැගී මත්ව
තම්සඟේ ශරීරය සොලවා පිටහුන් ඇතුරුවාද බිමහෙලා ඇතින්නන්
ගිය දිශාවට අනිමුඛව නික්මුණේය. ඇත්වාහනය පිටහුන් රජ
තෙමේද සතරගාතය දමා උඩුකුරුව බිම හොත් ඇතරුවා දැක
අකුස්ස ගෙණ කොට කොටා තමන්ගේ බලයෙන් ඇද ඇතු රඳවා
ගත නොහි මහසෙනඟ නොබලාම ඇතු කෙරෙහි ලොභයෙන් ඇතා
අත්නොහැරම ගොසින් එක් වන මධ්‍යයකට වනී. හමන් පසුපස
එන පිරිවර ජනයාගෙන්ද ඉතා ඇත්වූ මහරජු "මේ ඇත් වල්
ඇතුන් සමග සොඬින් සොඬ බඳ පොර ගහන්නේය. එසේකල
මගේ ජීවිතයද නොනිබෙයි. එහෙයින් ඇතු තබා දිවි රැකගනිම්"යි
සිතා ඇතු පිටින් බසින්ට රිසිවිය. එකෙණෙහිම ඇත්රජ මගසරස
නැම් සිටි මහදිඹුල් ගසක් යටින් නික්මුණි. ඒ ගසෙහිද එක්
සුවිසල් අත්තක් බිමටම නැමී සිටියේය. රජ්ජුරුවෝ ඒ ශාඛාව
එල්බගෙණ ඇතු හැර දිඹුල් ගසට නැඟී එහි ඵල අනුභව කරමින්
ශාඛාව පිට උන්හ, පසුපස එන සෙනඟ ඇතුගේ පියවර සලකුණෙන්
අවුත් එක් තෙනක සිට මහත්සොට ශබ්ද පැවැත්වී. රජ්ජුරුවෝ
ඒ ශබ්දය අසා තුමුද ශබ්ද කළහ. මහසෙනඟ රජුගේ ශබ්දය
අසා වහා දිවගෙණ අවුත් ඇතු කෙරෙනි නසින් ගස් නැංගාසේ
ගස උඩ හුන් රජ්ජුරුවන් දැක ගසින් බාගෙණ නොයෙක් තූර්‍ය්‍ය
භාණ්ඩයන් එක පැහැර එකනින් නාද කෙරෙමින් රජ්ජුරුවන්
සමග නුවරට අවුත් වනී.

මෙසේ මහරජතුමෝ නුවරට වැද අමාත්‍ය මණ්ඩලය පිරිවරා
සිංහාසනාරූඪව හුන්නාහු හස්ත්‍යාචාර්‍යයා කැඳවා "කොල!
හස්ත්‍යාචාර්‍යය, තා මා මරණු කැමැත්තෙහිද? මෙයේ මණ්ඩිවූ
සාහසික දුෂ්ට ඇතෙකු පිට කුමන් හිණිස නැංවීද? හයනියා මනාසේ
හික්මවා ඇතැයි තා නොකීවෙහිද? ආදීන් තරයේ ඔහුට උදහස්
බවක් පළකළහ. ඒ අසා හස්ත්‍යාචාර්‍යයා රජුට පිළිතුරු මෙසෙයින්
ඇසි දෙවයනි! මෙසේ සිතා වදුරන්ට කරුණු කවරේද? මේ
ඇත්රජ විශෙෂයෙන් විනීතය, සුශික්ෂිතය, එහෙත් මදයෙන්
මත්ව සිටි හෙයින් රාගයෙන් රත්ව ඇතින්නන් කරා ගියේය.
ඔහුගේ මනොරථය පුරාගෙණ නොබෝදිනකින් ආපසු එන්නේය,
ඊට සැකනොසිතා වැඩහුන මැනවැ"යි කී.

එයින් මදන් මොළොක්වූ සිත් ඇති රජ්ජුරුවෝ "එසේ නිතුම්
ආචාර්‍ය්‍ය! ඇතු එහොත් හෙපි බැහැර නොයෙව! ඉදින් ඇත්රජ
සත්දිනක් තුළ නොආයේනම් නොපගේ ජීවිතය නොසිතව"යි කීය.

සදිනක් ඉක්ම ගියේය. පලාගිය ඇත්රජ හෙමේ ඇතිනි මුලු කරා එලඹ සිය මනදෙළ පුරා සදිනක් වනසිරි විඳ සත්මෙනිය අවුක් ඇක්නළුට පිවිසියේය. හස්ත්‍යාචාර්‍යතෙම එදවස් රාත්‍රි අලුයම නැගී ඇත්ගල කරා ගියේය. එහි සිටි ඇතු දැක රජ්ජුරුවන්ට කරා ගොස් දේවයන් වහන්ස! එදවස් නුඹවහන්සේ ගස් නංවා වල් වැද්දුවූ ඇත්රජතෙම; තෙමේම අවුත් දැන් ඇත්ගල සිටගත. වහා ගොසින් ඇතුන් සිටිනා විනීත ලීලාව බලා වදුළ මැනැවැයි කීය. එතෙපුල් අසම්ත්ම රජ්ජුරුවෝ හුතස්තෙන් නැගී වහා ප්‍රාසාදයෙන් බැස ඇත්ගලට ගොස් බැලුවාහු "එදවස් නමා කළ මොලකමට ගැනැටත් කෙරෙනි"සි යන භයින් හැතිගෙණ සිටියාවූ ඇත්රජ දැක ඔහුගේ සොඩ පිරිමැද මැද හස්ත්‍යාචාර්‍යයාට කියන්නාහු "එම්බා ආචාරීනි මෙබඳු සුවිනීතවූ ඉතා සුශික්ෂිතවූ හයනිරාජයා කවර කාරණයක් නිසා එදවස් මා අකුස්සෙන් වළකැද්දීන් නොටැලක දිවිදැයි විමාලහ.

එවේලෙහි හස්ත්‍යාචාර්‍ය තෙමේ කියනුයේ "දේවයන් වහන්ස! රාගය නම් අකුස්සට වඩා තියුණු දෙයක. හින්නට වඩා උමඟවූ දෙයකා. තවද සත්වයන්ගේ සිත ඇතුළෙහි හැරෙන හියක් වැන්නා විලාදී ගුණධම් නැමැති ධනය පැහැරගන්නා සොරෙකු වැන්න එහෙයින් එදවස් අකුසු සහරින් මැලකුවද නොවැලකම් නිත්මිණ. දැන් වනාහි මාගේ මන්ත්‍රානු භාවයෙන් තමාගේ මනොරථය පිරුණු වේලෙහිම වල නොසිට මහා අවුත් ඇත්ගල සිටගනැ"සි දැන්වී. ඒ අනා රජ්ජුරුවෝ "එසේ වීනම් තොපගේ මන්ත්‍රයෙහි බල දැන්ම. මා දුටුව මැනවැ"සි කීහ. එවේලෙහි ආචාරී යහපතැයි හිවිත මහත්වූ යවටක් ගෙන්වා බැඳූ බැඳුවන් ඇස් පිහියන පරිද්දෙන් නිබිරහුරු රැසක්හේ රත්කරවා යහඳුවකින් ගෙණ තමන්ගේ මන්ත්‍රය සිනිසොවා "එම්බල හයනිරාජය! තෙල යවට සොඬින් බඳ අල්වාගෙණ මා කැවත කීකල මිස බිම නොහෙළව"සි ඇතු දිශාවට දිහැකෙළේය.

එවේලෙහි ඇත්රජ සොඬ දික්කොට යවට අල්වාගෙණ තමාගේ සොඬ දන කල්හිද හස්ත්‍යාචාරීන් කෙරෙහි කළ හසින් යවට අත නොහැර සිටියේය. ඒ දැක රජ්ජුරුවෝ ඇතු දැ මියහිසි යන ශෝකයෙන් යවට අභාහරවා "ආචාරීන් කියේ සැබැමිය"සි කියමින් මහත්වූ සංවේගයට පැමිණ "අහෝ! රාගය නම් ඉතා වණඩිය! පරුෂය! සාහසිකය! ආදීනව සහිතය! සියලු දුකට හාජනය! උපද්‍රවයට කාරණය! යනාදීන් රාගයෙහි ආදීනව සලකා හස්ත්‍යාචාර්‍යවරයාට බොහෝ සම්පත්දී මෙසේ මේ සසර දුක්ගන්නා සත්වයන් කවර ධර්මයකින් යෙදී කෙසේනම් මේ සංසාර දුඃඛයෙන් මුදම්දේහෝසි පරීක්ෂාකොට බුද්ධකාරක ධර්මයන් හැර අන්කිසි

උපායෙකින් සසර දුක් ගෙවා බොහෝදෙනාට උපකාර විය නොහැක්කැයි දැන දැනම (පෙර අත්බැව්හි මාතු පොෂක වෙලෙ-ඳුන්ම ඉපිද සිටියදී නබනලද් ප්‍රථම මනොප්‍රණිධාන බලයද හේතු-වෙන්) මා බුදුබව ප්‍රාර්ථනාකළ මැනවැයි සිතා මනොප්‍රණිධානය කරන්නාහු:-

බුද්ධොහං බොධයිස්සාමි-මුත්තොහං මොචයෙ පරෙ
නිණ්ණොණාහං තාරයිස්සාමි-සංසාරොඝා මහබ්භයා.

යනාදීන් මෙසේ මනොප්‍රණිධානය කොට රාජ්‍යය හැර හිමාල වනයට වැද තාවුස් පැවිද්දෙන් පැවිදිව දිවිහිමියෙන් තාපස්දම් රැක ආයු කෙළවර දෙවිලොව උපන්නේය.

(මෙසේ එදා "ශත්‍රුතාප" නමින් ඉපිද දෙවෙනිව මනොප්‍රණිධා-නය තැබුවෝද අන්කිසිවකු නොව මෙදා සිද්ධාර්ථ ගෞතම නමින් සම්බුදුව ලොවැසි සත්වයා සසර කතරින් එතෙරකර වදාළ ශාක්‍යකුල තිලකවූ පරදුඃඛ දුඃඛිතවූ කරුණා නිධානවූ ඒ ඔහුගේ අමාමැණිවූ තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රාජෝත්තමයාණන්ය.)

ඉක්බිත්තෙන් සටකී ශත්‍රුතාප මහබෝසතාණෝ දෙවලොව බොහෝකල් දිවසැපත් වළඳා නැවත එසින් චුතව දඹදිව මගධ දෙශයෙහි "දලිද්දිය" නම් බමුණුගම නායක බමුණාණන්ගේ බ්‍රාහ්මණ දේවීන් කුස පිළිසිඳ දසමස් ඇවැමෙන් බිහිවූහ. බැලූ බැලූවන්ට ඉතා ප්‍රියඛකර විය. ශොභමාන ශරීර ලක්ෂණයකින්ද සමන්විත වූහ. එහෙයින් කුමරුට නම් තබන දින බ්‍රහ්ම කුමාරයෝ යයි නම් තැබූහ. ඒ බ්‍රහ්ම කුමාරයෝ තමන් නුවණැති හෙයින් සොළසැවිරිදි කල්හිම සෘග්-යජුර-සාම යන ත්‍රිවේදයෙහිද, අක්ෂර-ලිඛිතාදී අෂ්ටාදශ විද්‍යාවෙහිද ශ්‍රැති සමෘති ආදී සූත්‍රයට කලාවස්හිද නිෂ්පත්තියට පැමිණියහ. එකල්හි ඒ මහතාණන් සම්පයෙහි පන්සියයක් පමණ බමුණු කුමරුවෝ ත්‍රිවේදය ඉගෙණ නිමවූහ. මව්පියන් ජීවත්ව සිටිනතුරු අත්පා මෙහෙ ආදිය කරමින් සිටි මව්පියන් කලුරිය කළ පසු තමන්ගේ අතවැසි ඒ පන්සියයක් පමණ බමුණු කුමරුන් ලඟට කැඳවා සෙසු උවමනා ශිල්ප ශාස්ත්‍රද උගන්වා තමන් සතු ධනය ඔවුන්ට අතපැන් වත්කොට දී ගිහි-ගෙයින් නික්ම හිමාල වනයට වැද තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව මෙකල එරණ නම්වූ එකල මුණඩ නම් පර්වත සමීපයෙහි පන්සලෙක වෙසෙති.

එකල බොහෝ කුලපුත්‍රයෝ බෝසතුන් කෙරෙහි පැහැදිව හිසිණු පිරියම් ඉගෙණ තම තමන්ගේ සිතට සැපවූ විවේක සථාන-වල ඉඳ කිසිණු පිරියම් භාවනාකොට ධ්‍යාන උපදවා පරිචිත ධ්‍යානඵලයෙන් ගොස් බඹලොව උපන්හ.

බෝසතුන්ගේ අඟවැසිවූ යට කියනලද පන්සියයක් බමුණු කුමරුවෝද තම තමන්ගේ මවුපියන් ඇවැමෙන් බෝසතුන් සමීපයෙහි මහණව පූජාස්නේහයෙන් බෝසතුන් නොහැරම වෙසෙති ඔවුන් අතුරෙන් මතු බුදුවන මෛත්‍රෙය මහබෝසතාණෝ ඒ ශිෂ්‍යයන්ට ප්‍රධානව අප මහබෝසතුන්ගේ අග්‍ර ශිෂ්‍යවූහ.

දවසක අප මහබෝසතාණෝ සෙසු තාපසවරුන් පලාපල සොයා ඒ ඒ දිග ගිය කල්හි ප්‍රධාන ශිෂ්‍යයන් හා සමග තුමූද පලාපල පිණිස මුඛඬ නම් පර්වතයට නැඟී එක් දිහාවකින් පඤ්ච ප්‍රාණතය බැලුවාහු එහි දරුවන් වද, කිපදිනක් නිරාහාර හෙයින් ක්ෂුධාව ඉවසාගත නොහී තමා හා කෙළනා දරුපැටවුන් කනු කැමතිව හොත්තාවූ එක්තරා ව්‍යාඝ්‍රධේනුවක් දැක සසර කලකිරී "අහෝ මේ සංසාරයට නිදුවේවා! තමාගේ කුසින් වදගත් සුරතල් ලපටි දරුවන් අනුභවකරණ තරමට ක්ෂුධාගින්න දරුණු නොවේද? අනන්තවූ සසර සැරිසරන සත්වයා මෙලෙසින් අන්‍යයන්ට හොඳුරු වන වාරද අනන්තය." ආදීන් සලකා මහත්වූ බෙදයට පැමිණ ප්‍රධාන ශිෂ්‍යයන් කැඳවා "දරුව නොපි මේ වනයෙහි පරීක්ෂාකොට සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් මරණලද යම්කිසි සත්ත්වයාගේ මාංශය්‍යක් දුටු කම් එහා ගෙනවුන් මේ ව්‍යාඝ්‍රධේනුවට දෙව"යි ශිෂ්‍යයාණන් නික්මවා තැවතත් ප්‍රාණතය දෙස බලනුයේ ක්ෂුධාගින්න ඉවසනු නොහැකි ව්‍යාඝ්‍රදෙන දරුපැටවුන් වටා එහා මෙහා ගොරව ගොරවා ඇවිදිමින් පැටවුන් අනුනව කිරීමට සැරසෙනු දැක්කේය. සංවේගයෙන් ඇලලීගිය බෝසතාණෝ ශිෂ්‍ය තවුසාණන් පමාවනු දැක "ව්‍යාඝ්‍රදෙන පැටවුන් අනුභව කළපසු දෙනු ලබන අහරින් කම්කැන කළයුත්තේ පැටවුන්ගේ දිවිරැක දීමයි. එහෙයින් පැටවුන් මරා කෑමට පෙර ව්‍යාඝ්‍රදෙනට අහරක් දියයුතුය'යි සලකා තැවතද තමාගේ ශරීරය නුවණින් පරීක්ෂා කරන්නාහු සෑම ලෙසින්ම ප්‍රතිභය සහිත බව සලකා අතීත ජාතියෙහි කරණලද ප්‍රාර්ථනා වශයෙන් බුද්ධකාරක ධර්මයන් දැක "ඇස් නොදී-ඉස් නොදී-අඹු දරුවන් නොදී- ජීවිතය නොදී බුද්ධකාරක ධර්මයෝ එසේ මෙසේ ලෙහෙසියෙන් පුරාලිය නොහැක්කාහ. එහෙයින් අනෙකාදිනව-යෙන් යුක්තවූ මේ ශරීරය සියලු සත්වයන්ට හිත පිණිස බුදුබැව් පතා දැන්ම දන් දුනහොත් මේ ව්‍යාඝ්‍ර පැටවුන්ගේ ජීවිතයද රැකෙයි මටද මතු බුදුබව සිද්ධවන්නේය"යි මෙසේ ඔදවැඩියාවූ සිත් ඇතිව දෙව්යන්ට පින් දෙන්නාහු-

තස්සමෙ අනුමොදනතු-ලොහා නාරද පබ්බතා
ඉන්දෙව බ්‍රහ්මාව පජාපතීව
සොමෝ යමෝ වෙස්සවණොව රාජා
ඉමෙව දේවානුමොදනතු යම්දං පුඤ්ඤං කතංමයා.

යතාදීන් දෙමියන්ට ඕන්දී පළිත මසතකායෙහි සිට ව්‍යාඝ්‍ර **ගොනුවගේ අනිමුඛයට පිණුහ.** එකල්හි ව්‍යාඝ්‍රගෙනු නොමෝ පළිත **මිදුනේ සිට** හෙන්නාවූ බෝසතුන් දැක තමාගේ දරුවන් හැර **බෝසතුන්ගේ** ශරීර මාංශය අනුභව කළාය. බෝධිසත්වයෝ වනාහී **"ජීවිත පරිත්‍යාග"** කුශලය හේතුකොටගෙන දෙවිලොව උපන්හ

(එදා ඒ ජීවිත පරිත්‍යාගය කළ බ්‍රහ්ම තාපසයෝ නම් මෙදා ශාක්‍යකුලතිලකවූ අප භාග්‍යවත් තථාගත ගෞතම සම්මාසම්බුදු රජාණෝය.)

එකල (පුරාණ) දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේ සොළසා-සංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරණලද පාරමිතා ඇතිව දඹදිව **කපපවති** නුවර රජකුලයෙහි ඉපිද දසදහසක් හවුරුදු ගිහිගෙයි වැස ක්‍රමයෙන් ජරා රුවෙක-ලෙඩ රුවෙක-මළ සිරුරක-මහණ රුවෙක යන දහර පෙරනිමිති දැක මහබිනික්මන්කොට මහණව සත්දිනක් ප්‍රධන් විරිකොට බෝමැඩ අරා බුදුව සදහම් වැසි වස්වමින් **නිනේදනන්** තුටු කරවමින් චාතුර්ද්වීපික මහාමෙඝයක්සේ **වැඩවසනසේක.** මේසේ වැඩවසන සම්බුදුරජාණන් වහන්සේගේ රූපසම්පත්තිය දැකීමෙන් හා පෙර නොඇසූවිරූ මිහිරි සදහම් අසමින්ම සතුටුවූ **කපපවති** නුවර රජකරණ රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියලු මනුෂ්‍යයෝ සම්බුදුරදුන් ප්‍රධානකොට ඇති භික්ෂු මහාසඞ්ඝයා වහන්සේට දවසින් දවස ඔවුනොවුන් පරයා සිවුපසයෙන් උපසථාන කරන්නාහ.

එකල (පශ්චිම) දීපඞ්කර නම් බෝධිසත්වයෝ සියලු උපභොග පරිභොග වස්තුයෙන් සමෘද්ධ බොහෝ සැපසම්පත් ඇති බමුණු මහසල් කුලයක ඉපිද යොවුන් විය පත්කල ගිහිසැපත් හැරපියා මහණව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන ලාභීව වසතුවෝ දවසෙක නොයෙක් ලක්ෂගණන් රහතන් විසින් පිරිවරණලද ඒ **"පුරාණ දීපඞ්කර"** නම් සම්බුදුරජුන්ගේ අසිරිමත් බුදුසිරිය දැක **"මමද මේ දීපඞ්කර බුදුරජාණන් වහන්සේ මෙන්ම මතු ලොවතුරා බුදුවීනම් යෙහෙකැ"යි සිතා තමන්ගේ පාත්‍රය හෙණ තොල් සිහා-ගෙණවුත් බුදුන් වැඩහිඳිනා ගඳකිළිය සිව්දෑගඳින් පිරිබඳ ගන්වා බුදුන් උදෙසා රාත්‍රිය මුළුල්ලෙහි නොයෙක් ලක්ෂගණන් පහන් පූජා කොට ඒ රාත්‍රිය පහන්වූ කල සියලු භික්ෂු සඞ්ඝයා වහන්සේ සම්බුදුරජුන් කරා වැඩි කල්හි නැවත මහාසඞ්ඝයා වහන්සේටද පහන් පූජාකොට බුදුරජුන් කරා එලඹ පසඟ පිහිටුවා වැඳ ශ්‍රීපාද මූලයෙහි බැස හෙව බුදුරජුන්ට දිවිපුදා "සවාමීනි භාග්‍යවත් බුදු-රජාණන් වහන්ස! යම්සේ ඔබ දැන් දීපඞ්කර නම් ලොවුතුරා බුදුව**

සත්වයන් සංසාර බන්ධනයෙන් මුදා සුවපත් කළයේක්ද? එපරිද්දෙන්ම මමද මේ පහන් පූජාවෙහි අනුභාවයෙන් මතු දීපඞ්කර නම් ලොව්තුරා බුදුව සංසාර ගත සත්වයන් එයින් ගොඩනඟා නිවන් දැක්විය හෙම්වා''යි ප්‍රාර්ථනා කළහ.

එකල බුදුහු අනාගතඥනය පතුරුවා ඔවුන්ගේ ප්‍රාර්ථනාව සිද්ධවනසේ දැක භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණයකොට ''මහණෙනි, ඒයේ රැ තුන්යම රාත්‍රියෙහි පහන් පූජාකොට දැන් මට දිවිපුදා හොත්තාවූ මේ මහණතෙමේ මතු මා සේම දීපඞ්කර නම් බුදුවෙයි'' යනාදීන් විවරණදී වදාළහ. මෙසේ විවරණ ලද්දාවූ දීපඞ්කර නම් මහබෝසතාණෝ එතැන් පටන් නිරන්තරයෙන් තෙල් සිහාගෙණ ඵූස් බුදුන්ට පහන් පූජා කරන්නාවූ දවසක කුමර මුළුල්ලෙහි සිහා තෙල් නොලැබ රජගෙට ගොසින් වන්හ.

එසමයෙහි ඔට කියනලද අප මහබෝසතාණෝ පෙර ජාතියෙහි නමන් විසින් සරණලද අපරාපර්‍යියවෙදාවූ කිසි අකුශල කර්මයකින් දෙව්ලොවින් චුතව එම පුරාණ දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේට දෙමිහින්සන් දරුව රජකුලයෙහි ඉපිද රජගෙයි සත්මහල් පාසාදය මුතුමහල්තලයෙහි හුන්නාවූ තොවේලෙහි රජගෙට වැඩිනාවූ දීපඞ්කර මහබෝසතුන් දැක, එක් දාසියක කෑදවා ''එම්බල කෙල්ල එක් භික්ෂූ කෙනෙකුත් රජගෙට වැඩිසේක. තී උන්වහන්සේ සම්පයෙවී ගොසින් කුමක් හිණිස දෙහෝයි විචාරා නියම දැන වහා අවුත් එව කියාලව''හි කියා යැවූහ.

ඕ තොමෝ ''යහපතැයි හිවිස ගොස් වැඩි කාරණා විචාරා, පහන් තෙල් සිහා වැඩිබව අසා එපවත් රාජකුමාරිකාවන්ට දන්වූහ. රාජකුමාරිකාවෝ එතෙපුල් අසම්ම්ම භිදිනා අස්නක් පණවා එහි වැඩහුන් දීපඞ්කර මහබෝසතුන්ගේ පතුල් සොඩවා තෙල් ගල්වා ප්‍රසන්න පිහිටුවා වැඳ, ඉක්බිති ගණ රන්තලියෙක රන්වන් පැහැ ඇති අබතෙල් පුරා තමන් හිස්මුදුනෙහි තබාගෙණ ''මේ කුසලානුභාවයෙන් සියලු සත්වයන්ට හිතපිණිස බැයන්වහන්සේ පරිද්දෙන්ම මතු ලොව්තුරා බුදුවෙම්වා''යි, මා බුදුවූන ජාතියෙහිම මේ සිදුහත් තෙල් තමන් සිද්ධාර්ථ නම් වෙම්වයි මෙසේ සිතින්ම ප්‍රාර්ථනා කොට තෙල්තලිය ගෙණවුන් දීපඞ්කර මහබෝසතුන්ගේ පාත්‍රයෙහි වත්කොට බෝසතුන්ට කියන්නාහු ''ස්වාමීනි, බුද්ධපූජාවට මේ සිදුහත් තෙල් දුන්නාවූ කුශලයෙන් මමද මතු ලොව්තුරා බුදුවන කැමැත්තෙමි. මා බුදුවූ කල්හි මේ සිදුහත් තමන්ම සිද්ධාර්ථ නම්

වඳු කැමැත්තෙමි. එබැවින් මේ කෙල්ලෙණ ගොස් පෑන්. පූජා කොට ඉක්බිති මා මෙසේ ප්‍රාර්ථනා කළ බව මගේ බැයන් වහන්සේට දැන්වුව මැනැවැයි කීහ.

දීපඞ්කර මහබෝසතාණෝද යහපතැයි ගිවිස බුදුන්කරා එලඹ පහන් පූජාකොට ඉක්බිති බුදුන් වැඳ ස්වාමිනි අද මේ පහන් සියල්ලම නුඹවහන්සේගේ නැගනිවූ රාජකුමාරිකාවන් දුන් සිදුහත් තෙලින්ම පූජාකෙළෙමි. නුඹවහන්සේගේ නැඟනියෝද සිදුහත් තෙල් දුන්නාවූ කුශලානුභාවයෙන් මතු බුදුවනු කැමැත්තාහ. බුදුවූ කල්හි එම සිදුහත් තෙල නමින්ම සිද්ධාර්ථ නම්වනු කැමැත්තම්හයි මට දැන්වූහ.

එතෙපුල් අසමින්ම බුදුහු එම්බල මහණ, බුද්ධකාරක ධර්ම පූරණය නම් ඉතා දුෂ්කරය, එබැවින් යම්කිසි කෙනෙක් දැසඳියන් ඇතිව නොයෙක් කප්කෙළ ගණන් මුළුල්ලෙහි පාරමිතා පුරා බෙහෝ කාලයක් ප්‍රාර්ථනාකොට හෙවත් සහාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි මනොවියයිකෙට නවාසඞ්ඛ්‍ය කල්පයක් මුළුල්ලෙහි බාග් වියයිකොට මෙසේ සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් ගියකල්හි අෂ්ටධර්ම සමොධානයෙන් යුක්තවූවාහුවූනම් විවරණලද හැක්ක. ඔවුන්ගේ ප්‍රාර්ථනාද සිද්ධවන්නේයයි වදාරා ඒ කෙසේවූ අෂ්ටධර්ම-යෙක්දැයි විවාලකල්හි අෂ්ටධර්ම ප්‍රකාශකොට් වදාරණ බුදුරජාණන් වහන්සේ-

මනුස්සත්තං ලිඞ්ග සම්පත්ති-හේතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණ සම්පත්ති-අධිකාරෙව ජාදතා
අට්ඨ ධම්ම සමොධානා-අභිනීහාරෝ සම්ජ්ජති.

යනාදීන් එම්බල මහණ, මිනිසෙකු වීමය- පිරිමියෙකු වීමය-රහත්වීමට හේතු සම්පත් ඇති බවය-ජීවමාන බුදුන් දැකීමය-පැවිදි බවෙන් යුක්ත බවය-ධ්‍යාන උපදවාගත් බවය-බුදුන්ට දිවි පිදූ බවය-බුදුකුරු දම් පිරීමෙහි උත්සාහ ඇති බවය (වීර්යයෙන් යුක්ත බවය) යන මේ අෂ්ට ධර්ම නම්වේ.

එබැවින් මනුෂ්‍ය ජාතියෙහි පිරිමිව ඉපද එම ආත්මභාවයෙහි රහත්වීමට හේතු සම්පත් ඇතුව මහණ වෙස්ගෙණ ධ්‍යානලාභීව දිවමන් බුදුන්ට ජීවිතය පරිත්‍යාගකොට බුද්ධකාරක ධර්මයන් පිරීමෙහි මහත්වූ උත්සාහ වීර්යයෙන් යුක්තව ප්‍රාර්ථනා කරන්නා-හට්ම බුදුබව සිද්ධවන්නේය. ඔහු විවරණ ලැබීමට යොග්‍යයෙහ. සත්ත්වයෙහි සිටියහු එබදු අෂ්ටධර්ම සමොධානයක් නැති හෙයින් විවරණ ලද නොහෙතිසි වදාළසේක.

එතෙපුල් අසා දීපඞ්කර මහබෝසතුන් වහන්සේ එසේනම් සවාමීනි, නුඹවහන්සේගේ නැඟණියෝ බුදුවෙම්වසි කලාවූ ප්‍රාර්ථනාව සිද්ධවේද නොවේදැයි විවාළසේක.

එකල බුදුරජාණන් වහන්සේ අතීතඥනය මෙහෙයා සමගිය දවස තුන් ආත්ම භාවයක තමන් සිතින්ම බුදුවෙම්වසි පැතුබව දැක නැවත අනාගතඥනය මෙහෙයා මතු බුද්ධකාරක ධර්මයන් පුරා බුදුවන්ට සමර්ථ බව දැක දීපඞ්කර මහබෝසතුන්ගේ මුතුබලා "එම්බල මහණ, මෙයින් මතු සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් ඉක්ම ගිය කල්හි සාරමණ්ඩ නම් කප නොප මා සේම දීපඞ්කර නම් බුදුවන කල මා නැඟණියෝ තොපගෙන් සම්මුඛ විවරණ ලබති"යි වදාළසේක.

එකල දිව්‍යකුරු බෝසතානෝ එවදන් පිළිගෙණ මහත්වූ සතුටකින්යුක්තවූ බුදුන් වැඳ වැඳ හුනස්නෙන් නැඟී බුදුන් ප්‍රදක්ෂිණා කොට අවසර ඉල්වාගෙණ නික්මුණාහ.

ඉක්බිති රජගෙදරට වැඩ රාජකුමාරිකාව පිළිබඳව දීපඞ්කර බුදුරජාණන් වදාළ ප්‍රවෘත්තිය රජකුමරියට සැලසළාහ. ඉන් පැහැදුණාක් සොම්නසට පත් රාජකුමාරිකාවෝ නත් අයුරින් කුසල් දහම් සපුරා ආයු කෙළවර මිය තුසිදෙව්ලොව මහානුභාවසම්පන්න දිව්‍යරාජයන්ව උපන්හ.

මේසේ අප මහබෝසතාණන් නොයෙක් සිදුගණන් ජාතියෙහි දිව්‍ය-මනුෂ්‍ය සම්පත් විඳිමින් සසර සැරිසරන කල්හි මේ භද්‍ර කල්පයට කප්ලක්ෂයක් උපුරුකොට ඇති ඕසි අසඞ්ඛ්‍යයෙහි මිනිස්ප්‍රණීධානයට පළමුවන නන්ද නම් අසඞ්ඛ්‍යයෙහි ලෞකික ලෝකෝත්තර වශයෙන් ද්විප්‍රකාර සියලු ගුණසාර ඡනකවූ එකම ලොව්කුරු බුදුකෙනකුන් වහන්සේගේ ලොකොත්පත්තිය නිසා විශෙෂානිසංසවූ "සාර" නම් කල්පයෙහි බුද්ධත්ව පතා අවාඤ්ඡ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව සම්‍යක්සම්බෝධි සමධිගමයට පැමිණියාවූ "බ්‍රහ්මදෙව" නම් බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මාරාධනාව පිළිගෙණ දම්සක් පවත්වා සූවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් එක් තැනෙක්හි වැඩසිඳ නිවන් දැක්වීම නොපිළිවන් හෙයින් සත්වානුග්‍රහ බුද්ධඥාන දනව් සැරිසරමින් කාරකණ්ඩක නම් නුවරට පැමිණියේක:

සුවණ්ණ වණ්ණාය පභාය ධිරෙ
සුවණ්ණ වණ්ණෙන කිරමණ්ඩ රූපෙ
සුවණ්ණ වණ්ණාහි සමොකිරන්තෙ
සුවණ්ණ වණ්ණා පථවිප්පදේසා.

අනූ ගෙයින් ඔහුව බුද්ධානුභාවයෙන් යුක්තව නොයෙක් දෙයාම් සුවඳින් ඉර සඳ එකවිට පහළවූ කලක් පරිද්දෙන් සියලුගින් **බැබළුණු සවණක්** ගණබුදුරුසින් එකපැහැර මුලු නුවර මහවේ **ගැවී** පැමිණිසේක.

එකල අප මහබෝසතානෝ එම කාරකණ්ඩක නම් නුවර **ඇතිදෙව්** නම් රජව සක්විති රජ සැපතක් හා සමාන රජ සැපත් **වඳින්** වසනුවෝ, එදවස් රජගෙයි මතුමහල් තෙලෙහි අමාත්‍ය **මණ්ඩලය** පිරිවරා ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් සිංහසනාරූඪව හුන්නාහු **සිහළු** නුවර එකපැහැර පතළ බුදුරැස් කඳ හා අනුපමෙයවූ ශ්‍රී **මුලාසයෙන්**, වඩනා බුදුරදුන් දැක පළමු තමන් එබදු බුදුරුවක් **නුදුටු** හෙයින් මේතෙම දෙවියෙක්, බඹෙක්දෝහෝයි හඟින් තැති **ගෙණ** සිංහාසනයෙන් බස්නට වන්හ. එකල "සිරිගුත්ත" නම් අමාත්‍යව ඒ අතිදෙව නම් රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා **කරන්නාවූ** "මෛත්‍රෙය" මහබෝසතාණෝ රජ්ජුරුවන්ට අභිමුඛව **එකත්පසෙක** උන්නාහු අස්නෙන් බස්නා රජ්ජුරුවන්ද රජගෙයි පතළ ආලෝකයද දැක සීමාදුරු කවුළුවෙන් පිටත බැලුවාහු දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් සශ්‍රීකව අසූ අනුව්‍යඤ්ජනයෙන් සොභමාන බ්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පිරිවරණ ලදුව නොතුමාලාලංකාරයෙන් අලඞ්කෘතවූ නීල-පීත-ලොහිතාවදාතාදීවූ සවණක් සත බුද්ධ රශ්මීන් එකපැහැර මුළු නුවර සරහමින් වඩනා සම්බුදුන් දැක රට පූර්වභාගයෙහි තමන් බ්‍රහ්මදෙව නම් බුදුකෙනෙකුන් වහන්සේ ලෝකයෙහි උපන්සේක යනු ඇසූ හෙයිනුත පෙර තමන් නොයෙක් සිඳුහස් ගණන් බුදුවරුසින් දැක දානමානාදී වශයෙන් බොහෝ සත්කාරකොට බුදුබව ප්‍රාර්ථනා කෙරෙමින් ආවාවූ කෘතාධිකාර මහතාණන් හෙයිනුත් පළමුවන දැක්මෙහිම බුදුන් බව දැන වහා නුනස්නෙන් නැගී රජහට අභිමුඛව සිට දකුණත ඔසවා කියන්නාහු

එස බුදෙඛා මහාරාජ-ලොකෙ උත්තම පුග්ගලෝ
සබ්බ සත්ත හිතත්ථාය-ලොකෙ උප්පජ්ජිසෝ ජිනෝ
අයඤ්චබෝ මහාරාජ-බ්‍රහ්ම දෙවෝ තථාගතෝ
හාසයෙනෝ වීථියා මජ්ඣ-පස්සථෙතං පුනපපුනං.

යනාදීන් මහරජ මේ ආශ්චර්‍යමත්වූ මනහර පෙළහරක් ඇති මහා පුරුෂයාණෝ නම් සියලු සත්වයන්ට හිතසැප පිණිස මේ ලෝකයෙහි පහළවූ දෙවාති දෙවවූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ බ්‍රහ්මදෙව නම් බුදුරජාණන් වහන්සේය. එබැවින් කිසි භයක් නොකළ මැනවැයි රජ්ජුරුවන් අස්වසා ඉක්බිති බුදුන්ට වඩනා කුශලක්ෂේත්‍රයක් ලෝකයෙහි නැතිබව හඟවන්නාහු-

සතංහත්ථී සතං අස්සා-සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි-ආමුත්ත මණිකුණ්ඩලා
එකස්ස පදවිනි භාරස්ස-කලං නාගඝනන්ති සොළසිං.

යන මේ ගාථාව කියා "මහරජාණෙනි! යම්කිසිවෙක් රත් සැන්, රන්පොරොවූ ඇදී නොයෙක් හස්ත්‍යාභරණයෙන් සරහා නිමවනලද සම්පූර්ණ සම්පත්ත ඇතුන් ලක්ෂයක්ද, එසේම නොයෙක් අශ්වාභරණයන්ගෙන් සරහා නිමකරණලද අශ්වයන් ලක්ෂයක්ද; එපරිද්දෙන් මනහර සැරසීමෙන් සරහා එකවියෙහි අසුන් සතරදෙනා බැගින් යොදා රන්දද තහා නොයෙක් රථාලඞ්කාරයෙන් සරසා නිමවනලද මනහරවූ රථ ලක්ෂයක්ද, එසේම බහා පලඳනා ලද මාණික්‍යමය කුණ්ඩලාභරණ නුපුරාදීවූ නොයෙක් බිසෝ පලඳනාවෙන් සරහනලද ශරීර අවයවයන් ඇති සිව්සැවක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් ශොභමානවූ උතුම් කන්‍යාස්ත්‍රීන් ලක්ෂයක්ද යන මේ සියල්ලම තමාගේ ශක්ති පමණින් යාචකයන්ට දන්දුන්-නේවි නම් එසේවූ ආශ්චර්‍යමත් දානයෙන් ලබන්නාවූ විපාකයට්ත් වඩා යම්කිසිවෙක් බුද්ධරත්නය-ධම්මරත්නය-සඞ්ඝරත්නය යන ත්‍රිවිධ රත්නයෙන් එක් රත්නයක් උදෙසා තමා හුන් තැනින් නික්-මුණේවිනම් ඔහු ඒ යන ගමනේදී එක් පියවරක් ඔසවා තුබූකල සිව් පියවර ඇතිලි අග පටන් ඉදිරියෙහි තැබූ පියවරද විළුම් දක්වා දෙඅතුරෙහි "පදවිනිභාර" නමිවූ පියවරක් පමණ අවකාශයෙන් පෙනෙන්නේය. ඒ "පදවිනිභාර" නමිවූ පියවරක් පමණ භූමි ප්‍රදේශය සොළොස් කොටසක් කොට එයින් භාගයක් ගෙණ නැවතත් එයිද්දු සොළොස් භාගයක්කොට මේසේ සොළොස් භාගයක් කොට මෙසේ සොළොස් වාරයෙක බෙදූකල අස්ලොමක් එලාලන තරම් ඉතා සූක්ෂ්මවූ භූමියෙක් වෙයි. එපමණ භූමියෙහි ජනිතවූ කුශලසම්භාරයම සුවහස් ගුණෙන් වඩතේමය. එබැවින් වහා හුනස්නෙන් නැගී ඔබට පෙර ගමන්කොට නික්මුණු මැනවැයි කීහ.

එතෙපුල් අසමින්ම අප මහබෝසතාණෝ ප්‍රීතිවේගයෙන් මත්ව උඩුමාලෙහි බස්නා දෙරකවුළු හිතිමං ආදිය විභාග දැනගත නොහි මතුමහල් තෙලෙහි සිට බුදු පුදයට දමන මිණිරුවණක්සේ සිමැදුරු කවුළුවෙන් කිමට පැන තමන්ගේ ශ්‍රද්ධා බලයෙන් මහ පොළොව පළාගෙණ දහසක් පෙත්තෙන් ගැවසී ගත්තාවූ රියසකත් පමණ වූ මහ පියුමෙක් නැගී තමන්ගේ සාපියුම් පිළිරුත් කල්හි පුෂ්පරජස පානයකොට අනිමත සථානයට නික්මුණු සුවණ්ණහංස රාජයකුසේ පියුම් ගැබින් බැස බුදුරජුන් කරා එලඹ සමහ්

මලින් පුදා නැවත සත්රුවණින් විසිතුරු මහපියුම් තුණක් සමග නොයෙක් රත්නයන්ගෙන් බුදුන් පුදා පසඟ පිහිටුවා වැඳ පළමුන් නමන්ගේ හේතු සම්පත් ඇති හෙයින් බුදුන්ගේ ප්‍රථම දර්ශනයෙන්ම බුද්ධත්වයෙහි සාභිලාෂිව සිතින්ම ප්‍රාර්ථනා කරන්නාහු සාමීනි! ජනහිත නිරතවූ බුදුරජාණෙනි! දැන් නුඹවහන්සේ ලොව්තුරා බුදුව සව්සතුන් සසර සයුරෙන් එතරකොට නිවන් පුරසිරි ගෙණහැර දුන්නේද එපරිද්දෙන් මමද ලොව්තුරා බුදුව සත්වයන් සසර සයුරෙන් ගොඩනඟා නිවන්පුර පුරාලිය හෙම්ව"යි යනාදීන් සිතින්ම ප්‍රාර්ථනාකොට බුදුරදුන් වැඳ අවසර ගෙණ නමන්ගේ අන්තඃපුරයට වන්හ.

මෙසේ එදා "අතිදෙව" නම් රජව බ්‍රහ්මදෙව තථාගතයන් වහන්සේ දැක වැඳපුදා සිතින්ම බුදුබව පැතූ උතුමා නම් මෙදා ගෞතම නමින් ලොව්තුරා බුදුවූ සත්වයා සසර සයුරෙන් ගොඩනඟාලූ ශාක්‍යකුල තිලකවූ පරදුඃඛ දුඃඛිතවූ කරුණා නිධානවූ නිලෝතුරු අප භාග්‍යවත් සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රශ්මියුත්තමයාණන්ය.

* * *

තවද ඔබට ඉක්බිති ඒ "නන්ද" නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ පන්දහසක් පමණ සර්ව්ඥවරයින් හා දෙවන "සුනන්ද" නම් අසඞ්ඛ්‍යයෙහි නවදහසක් පමණ සර්ව්ඥවරයින් හා තුන්වන "පෘථිවි" නම් අසඞ්ඛ්‍යයෙහි දසදහසක් පමණ සර්ව්ඥවරයින් හා සතරවන "මේඛ්‍ය" නම් අසඞ්ඛ්‍යයෙහි එකොළොස් දහසක් පමණ සර්ව්ඥවරයින් හා පස්වන "ධරණී" නම් අසඞ්ඛ්‍යයෙහි විසිදහසක් පමණ සර්ව්ඥවරයින් හා සවන "සාගර" නම් අසඞ්ඛ්‍යයෙහි තිස්දහසක් පමණ සර්ව්ඥවරයින් හා සත්වන "පුණ්ඩරීක" නම් අසඞ්ඛ්‍යයෙහි සතළිස් දහසක් පමණ සර්ව්ඥවරයින් හා මෙසේ සත්අසඞ්ඛ්‍යයක් ඇතුළත ලොව පහළවූ එක්ලක්ෂ පස්විසි දහසක් පමණ සර්ව්ඥවරයින් හැම නොවරදවා දැක බුදුබව පතා මහදන්දී මනොප්‍රණිධානය මස්තකප්‍රාප්ත කළහ, වදාරණ ලදමැයි:-

නන්දෝ සුනන්දෝ පඨවී-මේඛෝ ධරණී සාගරෝ
පුණ්ඩරීකෝති මේ සත්ත-අසඞ්ඛ්‍යා පකාසිනා
මනසා පත්ථනා මයහං-නිදහිංසා සබ්බසා ඉමේ.
සත්තු සත්ත අසඞ්ඛ්‍යා-ජාතා ලොකේ නායකා

පඤ්චවිස සහස්සාව-ලක්ඛමෙකං භවෙකතෝ.
එතෙකකානං මහෙසීනං-මනසාපත්ථනෙ තදා

දුතොන මෙ සමොනත්ථි-එසාමෙ දූන පාරමී.

මහා නිධාන හා මහෝ ප්‍රණිධාන කථා.

මෙසේ උපනුපන් බුදුරදුන් නොවරදවා දැක මසුනකප්‍රාප්තකළ මනොප්‍රණිධාන ඇති අප මහබෝසතාණෝ නොයෙක් සියගණන් බුදු හුන්‍ය කල්පවල දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි නොයෙක් සිරි සැපත් විඳ සසර ඇවිදිනාහු එක් ජාතියක මිනිස් ලොව ඉපිද වැඩිවිය පැමිණ පූර්වහෙතු බලයෙන් බුදුබව පතා තවුස් පැවිද්දෙන් පැවිදිව ප්‍රථමධ්‍යානය ප්‍රණීත වශයෙන් භාවනාකොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා අපරිහීන ධ්‍යානයෙන් ගොස් එක්අසඞ්ඛ්‍ය කල්පලක්ෂයකට ආයු ඇති "මහාබ්‍රහ්ම" නම් බඹලොව ඉපිද එහි ආයු පමණින් ධ්‍යානසුවවිඳ වසනුවෝ මේ මහාභද්‍ර කල්පයට තෙර-සාසඞ්ඛ්‍ය (13) කල්ප ලක්ෂයකින් යට **වාශ් ප්‍රණිධානය** ආරබ්ධ කරණලද ප්‍රථම "සම්භව" නම් අසඞ්ඛ්‍යයෙහි සම්භවරාජින් සතර දෙනෙකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් කල්පයෙහි දඹදිව ධඤ්ඤවතී නුවර රජකුලයෙහි උපන්හ. එකල ඔවුන්ට නම් තබන්නාහු **සාගර කුමාරයෝ** නම් තැබූහ. ඒ සාගර කුමාරයෝ වැනිවිය පැමිණ තමන් පියා මහරජාණන් ඇවැමෙන් ඔවුනු පැළඳ රාජ්‍යයට පැමිණ දශරාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් කලක් ගියකල්හි-මැන භාගයෙහි පුරොහිත බ්‍රාහ්මණයෙකු විසින් ලබන්වනලද "දශවිධ සක්විතිවත්" පුරාමසතකප්‍රාප්තකොට චක්‍ර **රත්නය**, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රී **රත්නය**, ගෘහපති රත්නය, පරිණායක රත්නය යන සප්තවිධ **රත්නයන්** ලදින් සාගර නම් චක්‍රවර්ති රජව වසින් සතරැස් ලක්ෂ දසදහස් තුන්සිය **පණස්** යොදුන් පමණ ඇති චක්‍රවාට කුහරය ඇතුළත දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතර මහාද්වීපයෙහි එකාතපත්‍ර චක්‍රවර්ති රාජ්‍යය කෙරෙමින් අමරගණානුබද්ධ දෙවෙන්ද්‍රාභිඥාවෙන් මහසෙනඟ පිරිවරා දෙවඟනන් බදු වරඟනන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයෙන් සන්තුෂ්ටවෙමින් සක්විති සැපත් විඳුනාහ.

එකල සොළසාසඞ්ඛ්‍ය කල්පයක් පිරූ පාරමිතා ඇති "පුරාණ ගෞතම" නම් ශාක්‍ය බුදුරජාණන් වහන්සේ; සම්භද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි සාරමණ්ඩ නම් කප දඹදිව මධ්‍යමණ්ඩලයෙහි සිරිනිවාස නුවර යසවතී රජහු කිසා නෙත්‍රාභිරාමවූ රූපලාවණ්‍ය ගුණොපොහොනිත විමලා නම් මහාදේවීන් කුස පිළිසිඳ දසමස් ඇවැමෙන් කිහිව යෞවනාවස්ථාවට පැමිණ නොයෙක් සියදහස් වරඟණන් විසින් පිරිවරණ ලදුව පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි මධුර කෙළි රසිකව රාජ්‍යශ්‍රී අනුභවකොට සතර පෙර නිමිති දැක මහඛිනික්මන් කොට අඩමසක් මහාවිය්‍යීකොට බොධිපය්‍යීඞ්කාරුසව මරසෙනඟ බිඳ බුදුව සක්සති යවා බ්‍රහමාරාධනා පිළිගෙණ, දම්සක් පවත්වා වදාළසේක. එකල සම්බුදුන්ගේ ධම්චක්‍ර තේජසින් තැති ගත්තාවූ දසදහසක් සක්වළ මහපොළොව එකපැහැර ගුගුරා පැණ නැංගාය. මේරු මහාසුරාදී මහාපර්වතයෝ අත් බඹරක්සේ එකපැහැර නැමී වැදුම් ගත්හ. ලෝකයෙහි නොයෙක් ආශ්චය්‍ය පහළවිය. මේසේ සක්කුළපව්, සිත්සයුරු, සත්දහතළා, සක්වළගල් ආදීන්ගේ කම්පාවීම හා සමගම ඒ සක්විති රජහුගේ චක්‍රරත්නයද වෙවුලා පළමු තමා ආකාශයෙහි සිටියාවූ ස්ථානයෙන් ඉගිල පාත්ව පසුබැස නිශ්ශොභව සිටියේය.

ඒ දැක සක්විති රජ්ජුරුවෝ මහත්වූ සංවේගයට පැමිණ සිතන්නාහු:-මේ චක්‍රරත්නය මගේ කුශලබලයෙන් පහළවිය. රාජරාජ මහමාත්‍යාදිවූ ලෝවැසියන් විසින් පුදන ලද්දේය. දැන් මේ චක්‍රරත්නය කවර කාරණයක් පිණිස පළමු තමා සිවි තැතින් පාත්ව පසුබැස නිශ්ශොභවීදෝසි සිතා බමුණන් අතින් විචාළහ. එකල ලක්ෂණ පාඨක බමුණෝ ඊට කාරණා කියන්නාහු එම්බා මහරජාණෙනි! සක්විති රජුන්ගේ කාලක්‍රියාව ආසන්නවීමෙන් හෝ සක්විති රජුන් මහණවීමෙන් හෝ බුදුන් ලෝකයෙහි ඉපදීමෙන් හෝ චක්‍රරත්නය නිශ්ශොභව අනාදීන්ත වන්නේය. නුඹ නුඹවහන්සේ වනාහී ඉතා දීඝායුෂ්කසේක. එසේහෙයින් නුඹවහන්සේ ජීවිතයට කිසි සැකයක් නොසිතුව මැනවි. දැන් වනාහී "ගෞතම" නම් ශාක්‍ය බුදුකෙනෙකුන් වහන්සේ ලෝකයෙහි උපන්සේක. ඒ බුදුන්ගේ බුද්ධානුභාවයෙන් හා ධම්චක්‍රයෙහි ආනුභාව බලයෙන් මේ චක්‍රරත්නය නිශ්ශොභා විය. තවද ඒ ගෞතම නම් ශාක්‍ය බුදුන්ගේ "ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ" යනාදීන් සංක්ෂේප වශයෙන් නවප්‍රකාරකොට දක්වන ලද කළුත ගුණයෙන් යුක්තවූ කීර්ති ශබ්දය කෙළලක්ෂයක් සක්වළ එකහෙලා පැතිර උස්ව පැන නැංගේය. යනාදීන් අනන්තාපරිමාණවූ බුද්ධගුණයන් තමන් නුවණ පමණින් වර්ණනාකොට කීහ.

එකල ඒ සක්විති බෝසතාණෝ "බුදුහු ලෝකයෙහි උපන්හ" යනු අසමින්ම පස්වණක් ප්‍රීතීන් පිණාතිය ශරීර ඇතිව සාධු සාධු දුන් ඒ බුදුහු කොහි වැඩවසනසේක්දැයි විචාළහ. ඒ වේලෙහි බ්‍රාහ්මණයන් අතුරෙන් බුදුන් කෙරෙහි අති ප්‍රසන්නවූ ඉතා නුවණැති එක් බ්‍රාහ්මණයෙක් තමාගේ උතුරු සළුව ඒකාංශකොට ඕහාගෙණ එකල බුදුන් වැඩවසන මිගාචින නම් උයන දිශාවට අභිමුඛව පසඟ පිහිටුවා වැඳ නැඟ බද්ධාඤ්ජලීව දෙහොත් මුදුනෙහි තබාගෙණ නැමී සිට බොහෝදෙනාට ඇසෙනසේ මහත්කොට හඬහා කියනුයේ:-

එසබුද්ධා මහාරාජ-ලොකනාථෝ අනුත්තරෝ
ලොකමහි අසමෝ වෙති-මහෙසි අග්ගපුග්ගලෝ.

සබ්බඤ්ඤූ බුද්ධා භගවා-සක්‍යමුනීති විස්සුතෝ
නිසභාසීමංඛඤ්ඤවතිං-මිගාචිතං වනං ගතෝ.

යනාදීන් මහරජ, ඒ ලෝකස්වාමිවූ, ලොකනාථවූ, ලොකෙඝාගුරුවූ, අසමසමවූ, අප්‍රතිපුද්ගලවූ, අනුත්තරවූ, සම්‍යක් සම්බුද්ධවූ ගෞතම නම් ඒ ශාක්‍ය බුදුහු දැන් මේ ඛඤ්ඤවතී නුවර නිසා මිගාචින නම් උද්‍යානයට වැඩිසේකැයි කීහ. එතෙපුල් අසුමින්ම සක්විති රජ්ජුරුවෝ මහත්වූ සන්තෝෂයෙන් පින පිනා ප්‍රීතියෙන් හරිනවුණෝ එම විටම නොයෙක් යාල ගණන් සුවඳ මල්, සුවඳ සුණු, ධූපදීප ආදිවූ බොහෝ පූජා භාණ්ඩ ගෙන්වාගෙණ යොදුන් ගණනෙක පැතිරසිටි තමන්ගේ මහ පිරිවර සෙනඟ හා සම්භ නුවරින් නික්ම ඒ මිගාචින වන නම් උයනට ගොසින් වැඳ බුදුරජුන් කරා එලඹ බුදුරුවට සලකුණුවූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් හා ව්‍යාමප්‍රභා මණ්ඩල කේතුමාලාලඞ්කාරයෙන් විරාජමානවූ ආත්මභාවයක් ඇතිව සඛණිඝිරිද්වාරයක හුන්නාවූ කෙශරසිංහ රාජයෙකුසේද, උදයගිරිශිඛරයට පැමිණියාවූ බාලභාස්කරයාසේද, අලඞ්කෘතවූ බුද්ධාසන මස්තකයෙහි සවණක් රැසින් දිලිනි දිලිනි බැබළුන්නා වූ බුදුරජුන් දැක අතිශයින්ම විස්මයට පැමිණියාවූ සිත් ඇතිව අමාහැල්ලෙක ගිලෙන්නාක්හුමෙන් සවණක් ඝණ බුද්ධරශ්මි මාලාවන් පිරිවරාගෙන බුදුරජුන් කරා එලඹ තමන් උපන් ජාතිය සඵල කරමින් පසඟ පිහිටුවා වැඳ අනුපමෙයවූ බුද්ධශ්‍රී බල බලා සිට සිත උපන්නාවූ ප්‍රීතිවේගය උතුරවා දමන්නාක්හු සෙයින්:-

සුදිට්ඨං වත මේ දිට්ඨං-පස්සිතබ්බඤ්ච පස්සිතං
සඵලං ජීවිතං මය්හං-යං පස්සාමි තථාගතං.

නතෙ සමෝ නොවිමනුස්ස ලොකෙ
සමොපි තෙ නත්ථි ච දෙව ලොකෙ
සදිසොපි තෙ නත්ථිච බ්‍රහ්මලොකෙ
යං ලොකනාථං අසමං හ පසෙසෙ.

"යම්බඳුවූ මේ උත්තම රූපශ්‍රියෙන් හා ගුණස්කන්ධයෙන් ඔබ-ලන්නාවූ බ්‍රහ්මාදී ලොකයක හිඳිමෙකුටවත් සම නැති ලොකනාථවූ මහොත්තම කෙනෙක් වේද, ඒ මේ භාග්‍යවතුන් වහන්සේ දැකීමෙන් මගේ ජීවිතය සඵල විය" යනාදිය බුදුන්ගේ තුන් ලෙවිනි පතල තව අරහාදී ගුණ සමූහයන් අරබයා නොයෙක් ලෙසින් සතුතිකොට සුවඳින් මලින් බුදුන් පුදා දෙළොස් යොදනෙක පැතිර සිටිනා තුර්‍ය්‍ය සේනාවක් හා පස්විසි යොදනෙක පැතිර සිටිනා බ්‍රාහ්මණ මණ්ඩලයක් හා අටසාළිස් යොදනෙක පැතිර සිටිනා අමාත්‍ය මණ්ඩලයක් හා අනූ යොදනෙක රන්කොන්ත ගෙණ සිටිනා යොධ මණ්ඩලයක් හා පන්සිය යොදනෙක පැතිර සිටිනා මහා පෙත් මණ්ඩලයක් හා මේසා මහත් පෂ්දෙනින් දලිහි දිලිහී චක්‍රවාටය වට කරමින් මහමෙර සිසාරා ගමන්ගත් චක්‍රරත්නයසේ බුදුනාසිසාරා ප්‍රදක්ෂිණාකොට පසඟ පිහිටුවා මැඳ අවසර ගෙණ නුවරට අවුත් දෙවතාවුන් ලවා හිමාලය වනයෙන් වණී ගඤ්ධ සම්පන්න රත්සඳුන් හර ගෙන්වාගෙණ තුන් සතර පස්මහල් ආදී ප්‍රාසාද දැනි ප්‍රාසාද ලක්ෂයෙක, කූටාගාර ලක්ෂයෙක, රාත්‍රිස්ථාන ලක්ෂයෙක, දිවාස්ථාන ලක්ෂයෙක, සක්මන්මලු ලක්ෂයෙක, මණ්ඩප ලක්ෂයෙක, භොජන ශාලා ලක්ෂයෙක, හිනිහල් ලක්ෂයෙක යනාදී වශයෙන් වහසල් දෙරටු පැන්හල් ආදිවූ සියල්ලම මාහැඟිකොට රන්සඳුනෙන්ම තාරවා වෙහෙර වටා සුරක්ෂිතකොට පවුරු පදනම් බඳවා විහාර කම්මාන්ත නිමි කල්හි:-

සඛකීර්‍යවූ රාජ භවනය හා උභයවීථි පාර්ශ්වයන්ද වෙහෙරට නිත්මේන්නාවූ මඟද යන සැමතැන්හි කලුවැලි පියා සුදුවැල්ලෙන් තවරා ලඳපස්මල් ඉස නානා සථානයෙහි විත්‍යාසකොට ලනලද රන්තොරණ, වීදිතොරණ, කෙහෙල් තොරණ, මල් තොරණ, පිළි තොරණ ආදිවූ තොරන් පඬිකාතියෙන්ද, රන් ඇගැ-රිදී ඇගැ ආදිවූ පහන් ඇගැ පඬිකාතියෙන්ද, සවණ්කුමිහ, රජතකුමිහ ආදිවූ පුණ්ඩ්‍ර පඬිකාතියෙන්ද ඉපැස නහනලද රන්දඳ, රිදීදඳ ආදිවූ නානාවණ්ණ ධජ පතාක පඬිකාතියෙන්ද අතුරු, දෙවුදුරු, කළුවැල් ආදියෙන් ලනලද සුවඳ සුඹුලු සුණු පඬිකාතියෙන්ද හිරුරැස් වළකණු පිණිස මුදුනෙහි බඳනාලද කෙෂෙණම කොශෙය්‍යාදිවූ නානාවණ් වසත්‍ර ජාතියෙන් විචිත්‍රවූ විතාන පඬිකාතියෙන්ද එම දියන්හි එල්වනලද

ඕඝ දහස් හණින් ඔලම්බන පද්මයෙන් හා කුසුමදාම පඩික්කියෙන්ද **අභිනව දිවාකර කිරණ** දර්ශනයෙන් පිපී වැනී ගිය පස්පියුම් වනයන් **හා සදෘශවූ** නානාවණ් ඡත්‍ර සමූහයෙන්ද එසේ අනේක ප්‍රකාරවූ **ඕන්ඩුර** පඩික්කියෙන්ද රන් සන්නාහ රිදී සන්නාහ බහා සිළිලියෙළ **කරණලද්දාවූ** ඇත් සෙනගින්ද, අස් සෙනගින්ද, **සක්** රුවනින් **මිසිතුරුවූ** කම්මන්තකොට නිමවන ලද චක්‍රවාලයෙන් යුක්තවූ රථ පඩික්කියෙහි යොදනලද සෛකිව අශ්වයන්ගෙන්ද ඒ ඒ ස්ථානයෙහි **සිට සතුතිකරන්නාවූ** වන්දිභට්ටයන්ගේ ජයනාද සහශ්‍රයෙන්ද **දසදිග සුවඳ** මිහිදුනාවූ නා, සප්, දුනුකේ, සීනිද්ද, බෙලිද්ද, **මහනෙල්, උපුල්, ජයසුමන** ආදී නොයෙක් පුෂ්ප ජාතියෙන්ද **ඒ සියලුම** චිත්තාභිරාම දිගන්තරය එකපැහැර නිරන්තර කෙරෙමින් නොයෙක් අලංකාරයෙන් **සරසවා** නන්විසිකුරු වෙෂභූෂණයෙන් සැරසුන වූ නළුනාටකයන් ඒ ඒ **කැන්හි සිට** මහබෙර, මිහිඟුබෙර, ලොහොබෙර, පණාබෙර, එකැස්බෙර, ඩවුර, තංමැට ආදිවූ නොයෙක් හෙරි තූර්‍ය්‍ය හාණ්ඩයන් ගෙනවා යනසේ නිශෝෂතෙට තුමුල සම්භාරණයෙන් සැරසී අභිෂෙකධාරව මහත්වූ ශ්‍රී විහූකින් යුක්තව නානාප්‍රකාර ධනුර් විකානි හා බඩිග කොන්ත තෝමර හෙණ්ඩිවාල කරවාලාඩී වජ්‍ර චක්‍රාදී ආයුධ ගත් දන් ඇතිව නානාවණ් සන්නාහ බහා සැරසුනාවූ සතිස් යොදනෙක පැතිර සිටි **සමන්ගේ** මහසෙනහ හා සමහ **සම්බුදු** රදුන් කරා එළඹ පසඟ සිහිටුවා වැඳ නැගී සිට මුදුනෙහි ඇඳිලිබැඳ:—"ස්වාමීනි, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්ස! **නුඹවහන්සේ** උදෙසා මා විහාරයක් කරවනලදී. මා කෙරෙහි අනුකම්පායෙන් වැඩ දැන් එය පිළිගන්නා **සේක්වා**"යි ආරාධනාකොට මුළුලෝ බිහිරිකාරවන්නාක්හු මෙන් නොයෙක් පූජෝත්සව කරවමින් බුදුන් වඩා ගෙණවුත් විහාරය පිළිගන්වා ප්‍රණීතවූ ආහාරපානාදියෙන් සම්බුදුන් වළඳවා නොයෙක් රත්නයෙන් බුදුරජුන් පුදා බුදුරජුන්ගේ ශ්‍රීපාද මූලයෙහි සැසඟව **දෙහොත්** මුදුනෙහි තබාගෙණ පූර්වහේතු බලයෙන් ප්‍රාර්ථනා **කරන්නාහු**:-

ස්වාමීනි භාග්‍යවත් බුදුරජාණන් වහන්ස! යම්සේ දැන් නුඹ වහන්සේ **ශාක්‍යවංශයෙහි** ඉපිද ගෞතම නම් බුදුව:-

චතූ වීසති අසඞ්ඛ්‍යෙය්‍ය-සතසහස්සඤ්ච නව ඛොමියා
පාණීනං සතසස්සානි-ඒකෝ බුද්ධා පමොචයෙ.

ඇතැම් වශයෙන් දක්වන ලද නවඅසඞ්ඛ්‍ය ලක්ෂයක් උතුරුඅතට ඇතිව සුවිසි අසඞ්ඛ්‍යයක් සක්වළ අමාමහ නිවන් දක්වා ලොව්ට

අනුග්‍රහ කෙරේද? එපරිද්දෙන්ම මමද මතු මේ කුශලානුභාවයෙන් ශාක්‍යරාජ වංශයෙහි ඉපිද ගෞතම නම් බුදුව ඔබසේම සත්‍යය සසර සගුරෙන් ගොඩනඟා නිවන්පුර සිරිගෙණ හැර දීලියහෙම්ව''යි යනාදීන් ප්‍රථම වාග්භේදය කොට-වාග්ප්‍රණිධානයකොට බුදුබව ප්‍රාර්ථනා කළහ. එකල බුදුහු බුද්ධකාරක ධර්මයන් පුරා බුදුවීම ඉතා දුෂ්කර නියාව නොයෙක් උපමාවන්ගෙන් විස්තර කර දක්වා වදාළසේක. ''මහරජ ඉදින් බුදුවනු කැමතිහොත් අධිකතර වීර්‍ය්‍ය ඇතිව අනෙකප්‍රකාර දුෂ්කරක්‍රියාකොට අෂ්ටධර්ම සමොධානයෙන් යෙදී ත්‍රිවර්ණශ්‍රී ලදින් දානාදීවූ දශවිධ පාරමී ධර්මයන් අඛණ්ඩකොට රක්ෂාකළා නම් මතු මාසේම ලොව්තුරා බුදුවන්නේ වේද''යි මෙසේ අනියත විවරණ පමණක්ම දුන්හ. වදාරණ ලදමැයි:-

භවිස්සා සිත්වං සම්බුදෙධා-ලොකෙ ලොකහ නායකෙනා
දසබ්බුධකරෙ ධම්මෙ-සවෙ කාතුං සක්කුසි.

මෙසේ ඒ බුදුන්ගෙන් අනියත විවරණ පමණක් ලදින් එදවසම ලැබෙන බුදුබවක්සේ මහත් සතෙනාෂයට පැමිණියාවූ මහබෝසතාණෝ සප්තවිධ රත්නයන් සමග සියලු සක්විති රජ සැපත බුදුන්ට පුදා සසුන් වැද මහණව ධ්‍යාන උපදවා බඹලොව උපන්හ.

(එදා පුරාණ ගෞතම නම් සම්බුදුරජුන් වෙතින් අනියත විවරණලද සාගර චක්‍රවර්ති මහරජාණෝ නම් මෙදා ශාක්‍යකුල තිලකවූ ශාක්‍යසිංහවූ ශාක්‍යමුනීවූ අප මහා ගෞතම සම්බුදු රජාණෝය.)

මෙසේ ජාතියෙන් ජාතියෙහි සංසාරගතව ඇවිදින්නාවූ අප මහබෝසතාණෝ එම සම්භද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළවූ පණස්දහසක් පමණ සම්බුදුරජුන් හා; දෙවන සදෘශුල්ල නම් අසඞ්ඛ්‍යයෙහි අසූදහසක් පමණ සම්බුදුරජුන් හා තුන්වන සම්-රත්න නම් අසඞ්ඛ්‍යයෙහි අනූදහසක් පමණ සම්බුදුරජුන් හා සතර වන උෂභසඤ්ඤ නම් අසඞ්ඛ්‍යයෙහි සැත්තෑදහසක් පමණ සම්බුදු-රජුන් හා පස්වන මාණිභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි සැටදහසක් පමණ සම්බුදුරජුන් හා සවන පද්ම නම් අසඞ්ඛ්‍යයෙහි විසිදහසක් පමණ සම්බුදුරජුන් හා සත්වන උසභ නම් අසඞ්ඛ්‍යයෙහි දසදහසක් පමණ සම්බුදුරජුන් හා අටවන සඤ්ඤාඤ්ඤ නම් අසඞ්ඛ්‍යයෙහි පන්දහසක් පමණ සම්බුදුරජුන් හා නවවන සම්මෙල නම් අසඞ්ඛ්‍යයෙහි දෙදහ-සක් පමණ සම්බුදුරජුන් හා මෙසේ මේ නවාසඞ්ඛ්‍යය ඇතුළත ලොකයෙහි පහළවූ තුන්ලක්ෂ සතාසූදහසක් පමණ සම්බුදුරජුන් දැක බුදුබව පතා අපමණ වසතු පරිත්‍යාගයෙන් මහදන් පවත්වා **වාක් ප්‍රණිධානය** මියාකප්‍රාප්ත කළහ. වදාරණ ලදමැයි:-

සබ්බඤ්ඤුදේදව චූළෙලාච-රතනොඝසඤ්ඤකෝ
මංගලදේදව පදුමෝ-උසභෝ බ්‍රහ්මා මෙවච.

සබ්බසෙලා අසඛ්ඛෙය්‍යෝ-නවමෝනි පවුච්චති
වචසා පත්ථනා මයහං-නිදදිට්ඨා සබ්බියා ඉමෙ.

සතසු නව අසඛ්ඛෙසු-ජාතා ලොකෙ හිතෙසිනෝ
තිංශේ සත සහස්සානි-සත්තහාසිනි සතස්ස ච.

එතෙසානං මහෙසිනං-වචසා පත්ථනෙ කදා
දූසනෙන මෙ සමොහන්ති-එසා මෙදනා පාරමී.

———:———

මේසේ අප මහ බෝසතාණෝ මනෝ ප්‍රණිධානය පිරීමෙන් සත් අසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් හා වාග් ප්‍රණිධානය පිරීමෙන් නවා-සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් හා ඇතුළුව සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් ඇතුළත ලොව පහළවූ සලක්ෂ දෙලොස් දහසක් සම්බුදුවරයන් දැක බොහෝ පින් රැස්කරමින් මහාභිඤ්ඤාප්‍රාප්ත කරණලද මනෝ-වාක්-ප්‍රණිධාන ඇතිව බුදුකාරක ධර්මයන් සොයා සසර සැරිසරන්නාහු මැත භාග්‍යයෙහි සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් ඇතුළත ලොව පහළවූ සුචිසි බුදුකෙනෙකුන් දැක සුචිසි විවරණයක් ලදහ. එයද මෙහි ඉතා සංක්ෂේපයෙන් දැක්විය යුතුව තිබෙන හෙයින් සත්පුරුෂයන් විසින් සාවධානව ඇසිය යුත්තේය. ඒ කෙසේදයත්:-

මේ මහා භද්‍රකල්පයට සාරා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් යටි සම්බුදුරජාණන් සතර දෙනෙකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් කල්පයෙක් විය. ඒ කල්පයෙහි තණ්හඞ්කර-මේධඞ්කර-සරණඞ්කර-දීපඞ්කර යන නම් ඇති සම්බුදුරජාණෝ සතර් නමක් ලොව පහළවූහ. එයින් සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව පුෂ්පවතී නුවර සුනන්ද නම් රජහු සීසා සුනන්දා දෙවිය කුස පිළිසිඳ දසමස ඇවැමෙන් මවුකුසින් බිහිව දසදහසක් අවුරුදු ගිහි සැපත් වළඳා සතර පෙර නිමිති දැක මහණව සත්දිනක් ප්‍රධන් වීර්‍යකොට රුක්අත්තන බොම්බිල හිඳ අරසෙනඟ බිඳ බුදුව අවුරුදු ලක්ෂයක් ආයු වළඳා වැඩ සිටි තණ්හඞ්කර බුදුරජාණන් වහන්සේය.

එම කප දෙවන අසඞ්ඛ්‍යකල්පයෙහි අසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මේඛලා නම් නුවර සුදෙව රජුට දුව යසෝධරා නම් අග මෙහෙසිය කුසින් ඉපිද අවුරුදු අටදහසක් හිඳ සැපත් විඳ මහාභිනික්මන් කොට මහණව අටමසක් ප්‍රධන්

වීයත්කොට කැලි බෝමුල්හි වැඩ හිඳ පස්මරුන් පරද බුදුව අනූ දහසක් හවුරුදු ආයු වළඳා වැඩසිටි මෙධඞ්කර නම් බුදුරජාණන් වහන්සේය.

එම කප තුන්වන අසංඛ්‍යකල්පයෙහි අටාසඞ්ඛ්‍ය කල්පයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව විපුල නම් නුවර මඞ්ගල නම් රජුට දුව යසවතී නම් අගබිසව කුසින් ඉසිද සත්දහසක් හවුරුදු ගිහි සැපත් විඳ මහාභිනිෂ්ක්මන්කොට පැවිදිව මසක් ප්‍රධන් වීයත්කොට පුලිල බෝරුක් මූල වැඩහිඳ පස්මරුන් දිනා බුදුව අසූදහසක් හවුරුදු ආයු වළඳා වැඩසිටි සරණඞ්කර නම් බුදුරජාණන් වහන්සේය.

යන තුන්බුදුවරසින් සමයෙහි යට කියනලද, අප මහ බෝසතාණෝ සම්බුදුබව පතා දානාදී වශයෙන් දසපාරමී සපුරා ඒ බුදුවරසින් වහන්සේලා වෙතින් අනියත විවරණය පමණක්ම ලදහ.

මෙසේ සාරමණ්ඩ කප තුන්බුදුවරසින්ගෙන් පසුව සත්වන අසංඛ්‍යකල්පයෙහි ලෝපහළුවූ ලෝකාලෝක දිවාකරවූ දීපඞ්කර නම් සම්බුදුරජාණන් වෙතින්ම අප මහබෝසතාණෝ නියත විවරණය ලදහ. ඒ කෙසේදයත්:-

දීපඞ්කර විවරණය

සම්බුදුවරසින් වහන්සේලා තෙනමක් පහළුවූ මේ සාරමණ්ඩ නම් කපට සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් යට පුරාණ දීපඞ්කර නම් සම්බුදු රජාණන් වහන්සේ වෙතින් නියත විවරණය ලද මේ (පශ්චිම) දීපඞ්කර නම් මහබෝසතාණෝ සම්පූර්ණ කරණලද පාරමී ගුණ ඇත්තාහු මේ සාරමණ්ඩ නම් කප දඹදිව මධ්‍ය මණ්ඩලයෙහි රම්‍යවතී නම් නුවර සුදෙව නම් මහරජුට දුව සුමේධා නම් අගබිසව කුස ඉපිද දසමස ඇවැමෙන් මවුකුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහි සැපත් විඳ පියුමා නම් අගබිසව කුසින් උසභක්ඛණ නම් පුත්රුවන උපන්ද, මහාභිනිෂ්ක්මන්කොට පැවිදිව දස මසක් ප්‍රධන් වීයත්කොට පුලිල බෝරුක්මුල් හිඳ පස්මරුන් දිනා ලෝවිතුරා බුදුව සත්සති යවා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ සුනක්ඛත්ත-මියෙහි දහම්සක් පවත්වා ක්‍රමයෙන් සුමඞ්ගලය-නිසභය යන අග්‍ර ශ්‍රාවකයන් දෙනම ඇතුළුවූ ශ්‍රාවක පිරිසක් ඇතිව සාගර නම් අග්‍ර උපස්ථායක තෙරනමකගෙන් උපස්ථාන ලබමින් අවුරුදු ලක්ෂයකට ආසිරි ඇතිව අසූරියන් උස බුදුබඳින් මුළුලොව බබුලුවමින් සාරලක්ෂයක් රහතුන් විසින් පිරිවරණ ලදුව දනව් සැරිසරමින්

ජනකම නුවර සමීපයෙහි සුදර්ශන නම් මහා විහාරයට වැඩ දහම්වැසි **මස්වා** වෛනෙය ජනයන්ගේ කෙලෙස්ගිම් නිවාලමින් එහි වැඩ **සිසභාසද** තථාගතශ්‍රී සද්ධර්මය අසා පහන්වූ රඹගම් නුවර වැසියන් **බුදුපෘමෙක්** මහසඟට ආරාධනාකොට දෙවන දවස් උදෑසන **මහමහ** සරසනු සඳහා කැති උදලු යහුල් ආදිවූ කම්මන්ත උපකරණ **ගෙණ** මහත්වූ සතෙනාශයෙන් විනපිනා ඔල්වරසන් ගඩගසමින් **සාඛුකාර** දෙමින් කටුපහණ පහකොට වලයොඛ සමකරමින් සුදු **වැලි** ගෙණහැර තනමින් කොරණ ලමින් ධජ පතාක නන්වම්මින් **මෙසේ** සතුටු සතුටුව එකපැහැර මහ සරසන්ට පටන්ගත් කල්හි:-

නගරෙ අමරවතියා-සුමෙඛො නාම බ්‍රාහමණෝ
අනෙක කොටි ධනනිචයො-පහූත ධන ධඤඤවා.

(බුද්ධවංස)

යනු හෙයින් අප මහා ගෞතම බෝසතාණෝ යටකියන ලද **පරිද්දෙන්** පූර්ණචන්ද්‍රවරයින් කෙරෙහි කරණලද මනෝ-විත්ප්‍රණිධාන ඇතිව **පාංශුවෙන්** ප්‍රච්ඡන්නවූ දූරහම්ණිරුවණක්සේ සංසාර ගතව වසනුවෝ එකල අමරාවතී නම් නුවර නොයෙක් කෙළගණක් වසතු ඇති බමුණු මහසල් කුලයක ඉපිද **සුමෙඛ** නම් බ්‍රාහ්මණ කුමාරව වැඩිවිය **පැමිණ** මව්පිය දෙදෙනාගේ ඇවැමෙන් පසු තමන් සතුවූ සියලු ධනරාශිය දුගි-මගී-යාචකයන්ට පරිත්‍යාගකොට යිම්-වනට වැද ධම්මික නම් පර්ණශාලයක් මුදුනෙහි සක්දෙවිඳු මවාදුන් පන්සලට වැද තවුස් වෙස්ගෙණ පැවිදිවූ සතියක් ඇතුළත **පඤ්චාභිඥ, අෂ්ටසමාපත්ති** උපදවා ධ්‍යාන සුවයෙන් දවස් යවන්නාහු එදවස් තමන් හුන් ආශ්‍රමපදයෙන් නික්ම ආකාශයට පැන නැඟී **ඝුමයෙන්** මනුෂ්‍ය පථයට පැමිණ මහමඟ සරසන්නාවූ මනුෂ්‍යයන් **දැක** ආකාශයෙන් බැස බවුත් කරා එලඹ මෙසේ මතහරකොට මේ **මාගීය** කාට සරසාදැයි විචාරා තුන්ලොවට අසහාය ප්‍රදීපයක් බඳුවූ **දීපඞ්කර** නම් බුදුරජාණන් වහන්සේ අද පෙරවරු වළඳන වේලාවට **මේ** නුවර වඩනා සේක. එසේ හෙයින් මේ මාගීය සරසා පිළියෙල **කරම්හයි** කී කල්හි බුදුහු සත නම අසම්න්ම පස්වණක් ප්‍රීතීන් **පිනාගිය** ශරීර ඇතිව සැබවින්ම බුදුකෙනෙකුන්ට සරණ මාගීයෙක් **හිනඹ** මටද මෙසින් කොටසක් දෙවයි ඉල්වා සිහිල් දිය පිරි ගැඹුරු අඳුරු කඳුරැලියක් ලදින් තමන්ට පැමිණියාවූ ඒ මාගී කොටසාශය සරසමින් සිටින අතර:-

තමාගේ දහස් ගණන් රශ්මි කදම්බයන් දසදිග විහිදුවමින් ලොව **පතළ** ගණුදුරු විදහා නහොමණ්ඩල මධ්‍යයට පැමිණ බබළන්නාවූ සඟල කිරණ (සූයී) යාසේ නීල පීත ලොහිතාවදාතාදීවූ

සවණක් සහ බුදුරැසින් දසදිග බබුළුවමින් සඟ්කුළපව් පිරිවැරූ සවණිමේරු රාජයාසේ සාරලක්ෂයක් රහතුන් පිරිවරා බ්‍රහ්ම, දිව්‍ය, නාග, සුපණ්ණ, යක්ෂ, රාක්ෂස, සිද්ධවිද්‍යාධර නරෙන්ද්‍රාදීන් මිසින් පුදන ලදුව අපමණ පුද පෙළහරින් වැනියාවූ බුදුරජාණන් වහන්සේ දැක තමන්ට නියකවූ මාගී භාගයද සරසා නොනිම් හෙයින් පිරිවර හා සමග "මේ උතුමාණන් වහන්සේ කිලිල් මඩ නොමැඩ වනිතා සේක්ව"සි සිතා දෙඹ මල් ඇතිරියක් සමානවූ අදුන් දිවිසම් මත්තෙහි අතුව බුදුන් දිසාවට හිසලා "මාද මේ බුදුන්වහන්සේ මෙන්ම ලොවිතුරා බුදුව සුවිසි අසඟ්ඛ්‍යයක් සතියන් නිවන් දැක්මිය හෙම්වා"සි මෙසේ බුදුබව පතා දිවිපුදා බුදුන්ට හෙයක් (ඒදණ්ඩක්) ව හොත්තාවූ තමන්ගේ අදහස් දැන එදවස් අභාධම් සමොධානය සිදුවූ හෙයින් එවේලෙහි දීපඞ්කර බුදුරජාණන් වහන්සේ මිසින්:-

පස්සථ ඉමං තාපසං-ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍යෙ ඉතෝ කප්පෙ-අයං බුද්ධෝ භවිස්සති.

යනාදීන් කැවිව වඩනා රහතුන් වහන්සේට ආමන්ත්‍රණයකොට වදාළ "මහණෙනි! උග්‍රවූ තපස් තේජස් ඇති මේ සුමේධ තාපස-යන් බලව, මුතුමූ ලාමක කෙනෙක් නොවෙත්. මෙයින් මතු සාර-සඟ්ඛ්‍ය කල්පලක්ෂයක් ගියකල මා හේමා ලොවිතුරා බුදුවෙති. මෙයින් බුදුවන ජාතියෙහි උපදනා නගරය කපිලවස්තු නම්වෙයි. සුද්ධෝදන නම් රජෙක් පිය වන්නේය. මහාමායා නම් බිසවක් මවු වන්නීය. බෝධි වන්නේ අසතු වෘක්ෂයෙක. මුතුමූ ගෞතම නම් වෙති. කොලිතය උපතිස්සය යන මහා ශ්‍රාවකයෝ දෙදෙනෙක් අග්‍රශ්‍රාවක වෙති. ක්ෂේම, උත්පලවණ්ණා යන මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වෙති. ආනන්ද නම් තෙර කෙනෙක් අග්‍රෝපස්ථායක වෙති. යනාදීන් එකල දෙනලද මේ පළමුවන නියත විවරණය ලදින් සතුටුවූ මහබෝසතාණෝ බුද්ධකාරක ධර්මයන් ඵිරීක්ෂාකොට දානය; ශීලය; නෛෂ්ක්‍රම්‍යය; ප්‍රඥාය; වීර්‍යය; ක්ෂාන්තිය; සත්‍යය; අධිෂ්ඨානය; මෛත්‍රීය, උපෙක්ෂාය යන දස පාරමිතාවන් දැක එකී එකී පාරමිතාවක් පාරමී-උපපාරමී-පරමත්ථ පාරමී යන ක්‍රමයෙන් සම්පූර්ණ කළයුතු බව නිශ්චයකොට දැන පාරමීන් විෂයෙහි දැඩ සමාදාන කළහ.

---

(2) තවද ඒ දීපඞ්කර නම් සම්බුදුන් ඉක්බිතිවූ බුද්ධශූන්‍යවූ කප් අසඟ්ඛ්‍යයක් ගියකල මෙයට නෙයාසඟ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට සාර නම් කල්පයෙහි බුදුබව පතා පිරූ පාරමිතා ඇති කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණන් වහන්සේ හවුරුදු ලක්ෂයකට ආයු ඇතිකුළ දඹදිව ධම්මවතී නුවර සුනන්ද රජුට දුව සුජාතා නම් අගබිසොව කුසින්

[illegible]ෂ්ණ නම් පුත්‌රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව දස **[illegible]ක් බුඩන්** විරියකොට සල් බෝරුක මුල වැඩහිඳ පස්මරුන්ා දිනා **[illegible] බුදුබව සත්‌ඝනි** යවා දම්සක් පවත්වා නද සුනද යන අගසව් **[illegible]මෙමක්ද** නිසසා උපතිසසා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව **[illegible]ඛුරුණ්ඩ** නම් මහතෙර කෙනෙකු අතින් උවටැන් ලබම්න් අසූඅට **[illegible]** බුදුබදින් මුළලෝ හොබවා කෙළලක්‍ෂයක් රහතුන් පිරිවරා **[illegible]** සැරිසරණසේක් වඳුවයි නම් නුවරට වන්සේක.

එකල අප මහබෝසතාණෝ ඒ නුවර විජිතාවී නම් සක්විති **රජව** විසනුවෝ බුදුරජුන් වැඩි බව අසා සොමනසින් පින පිනා **අවුත්** බුදුන් වැඳපුදා ලක්‍ෂයක් වියදම්කොට වෙහෙරක් කරවා වස් සාරම්භ මහදන් දී අවසානයේ සළු පිරිකර දන්දී බුදුබව පතා ඒ සසුන් වැඳ මහණව දෙවන විවරණය ලදහ.

---

(3) කොණ්ඩඤ්ඤ සම්බුදුන් ඉක්බිති බුදුසුනෙහි ශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යයක් ගියකල මෙයට දෙයාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් යට **සාරමණ්ඩ** නම් කල්පයෙහි **මඞ්ගලය, සුමනය, රේවතය, සොභිතය,** යන සම්බුදුවරයෝ සතරදෙනෙක් ලොව පහළවූහ. ඒ සම්බුදුවරයන්ගේ අතුරෙන් මඞ්ගල නම් බුදුරජාණන් වහන්සේ:- දෙසාළුසාඞ්ඛ්‍ය කල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව උත්තර නම් රජුට දුව උත්තරා අග මෙහෙසිය කුසින් බිහිව නවදහසක් හවුරුදු ගිහි සැපත් විඳ යසවතී නම් සීය අගබිසව කුසින් සීලව නම් පුත්‌රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව අටමසක් පුධන් විරියකොට නාගශ්‍රී බෝධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදු බවට පැමිණ දහම්සක් පවත්වා සුදෙව-ධම්සේන යන අගසව් දෙදෙනාද සීවලී-අසොකා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව පාලිත නම් තෙර කෙනෙකුගෙන් උවටැන් ලබම්න් අසූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව අසූරියන් උස බුදුබදින් දසදහසක් සක්වළ එකාලොකකොට බබුළුවමින් කෙළලක්‍ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක් මෙබල නම් නුවරට වැඩිසේක.

එකල ඒ නුවර සුරුම් නම් බමුණකුව, මහ ධනවතෙකුව සිටි අස මහබෝසතාණෝ බුදුරජුන් කරා එලඹ බණ අසා පැහැද දැන් පිණිස ආරාධනාකොට සක්දෙවිඳු මවා දුන් අටසාලිස් ගව්දිග පුළුල් ඇති රුමත් මණ්ඩපයක බුදුපාමොක් සඟන වඩාහිඳුවා සත් දිනක් **ගවපාන** දුනයි නම්වූ දිය නුමුසු කිරිබත් දන් දී අවසන් දින බෙහෙත් බඳු සමඟ සිවුරු පිරිකර පුද, බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

සවණක් සන බුදුරජසින් දසදිග බබුළුවමින් සත්කුළපවි සිරිවැරූ සුවණ්ණමේරු රාජයාසේ සාරලක්ෂණයන් රහතුන් සිරිවරා බ්‍රහ්ම, දිව්‍ය, නාග, සුපණ්ණ, යක්ෂ, රාක්ෂස, සිද්ධවිද්‍යාධර නරෙන්ද්‍රාදීන් වැසින් පුදන ලදුව අපමණ පුදා පෙළහරින් වැනියාවූ බුදුරජාණන් වහන්සේ දැක නමස්කාර නියුතුවූ මාගී නාගයද සරසා කොනිමි හෙයින් සිරිවර නා සමග "මේ උතුමාණන් වහන්සේ කලින් මඟ නොමැඬ වඩිනා සේක්වා"සි සිතා දෙඹ මල් ඇතිරියක් සමානවූ අදුන් දිවිසම් මත්තෙහි අතුව බුදුන් දිසාවට හිසලා "මාද මේ බුදුන්වහන්සේ මෙන්ම ලොවිතුරා බුදුව සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් නිවන් දැක්විය හෙම්වා"සි මෙසේ බුදුබව පතා දිවිපුදා බුදුන්ට හෙයක් (ඒදණ්ඩක්) ව හොත්තාවූ තමන්ගේ අදහස් දැන එදවස් අෂ්ටධර්ම සමොධානය සිදුවූ හෙයින් එවේලෙහි දීපඞ්කර බුදුරජාණන් වහන්සේ විසින්:-

පස්සථ ඉමං තාපසං-ජටිලං උග්ගතා පනං
අපරිමෙය්‍යෙ ඉතෝ කප්පෙ-අයං බුද්ධෝ භවිස්සති.

යනාදීන් කැටිව වඩනා රහතුන් වහන්සේට ආමන්ත්‍රණයකොට ථූම්බා "මහණෙනි! උග්‍රවූ තපස් තේජස් ඇති මේ සුමේධ තාපස-ඍෂීන් බලව, මුතුමූ ලාමක කෙනෙක් නොවෙත්. මෙයින් මතු සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් ගියකල මා හේම ලොවිතුරා බුදුවෙති. මෙයින් බුදුවන ජාතියෙහි උපදනා නගරය කපිලවස්තු නම්වෙයි. සුද්ධෝදන නම් රජෙක් පිය වන්නේය. මහාමායා නම් බිසවක් මව වන්නීය. බෝධි වන්නේ ඇසතු වෘක්ෂයෙක. මුතුමූ ගෞතම නම් වෙති. කෝලිතය උපතිස්සය යන මහා ශ්‍රාවකයෝ දෙදෙනෙක් අග්‍රශ්‍රාවක වෙති. ක්ෂේම, උත්පලවණ්ණ යන මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වෙති. ආනන්ද නම් තෙර කෙනෙක් අග්‍රොපස්ථායක වෙති. යනාදීන් එකල දෙනලද මේ පළමුවන නියත විවරණය ලදින් සතුටුවූ මහබෝසතාණෝ බුද්ධකාරක ධර්මයන් ඵිරීක්ෂාකොට දානය; ශීලය; නෛෂ්ක්‍රම්‍යය: ප්‍රඥාය; වීර්‍යය; ක්ෂාන්තිය; සත්‍යය; අධිෂ්ඨානය; මෛත්‍රීය, උපෙක්ෂාය යන දස පාරමිතාවන් දැක එකී එකී පාරමිතාවක් පාරමී-උපපාරමී-පරමත්ථ පාරමී යන ක්‍රමයෙන් සමන්විතාංශත් ආකාරයෙන් සම්පූර්ණ කළයුතු බව නිශ්චයකොට දැන පාරමීන් විෂයෙහි දැඩ සමාදාන කළහ.

---

(2) තවද ඒ දීපඞ්කර නම් සම්බුදුන් ඉක්බිතිවූ බුද්ධශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යයක් ගියකල මෙයට නෙයාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට සාර නම් කල්පයෙහි බුදුබව පතා පිරූ පාරමිතා ඇති කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණන් වහන්සේ හවුරුදු ලක්ෂයකට ආයු ඇතිකල දඹදිව රම්‍යවතී නුවර සුනන්ද රජුට දව සුජාතා නම් අගබිසොව කුසින්

විස්සභූ නම් පුන්රුවන උපන්දා මහබ්නික්මන්කොට පැවිදිව අස **මසක්** ප්‍රධන් විරියකොට සල් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා **සම්බුදුව** සත්සති යවා දම්සක් පවත්වා හද්‍ර සුහද්‍ර යන අගසව් **දෙනමක්ද** නිසභා උපනිසභා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව **අනුරුද්ධ** නම් මහතෙර කෙනෙකු අතින් උවටැන් ලබමින් අසුරට **සිහන්** බුදුබඳින් මුළුලෝ හොබවා කෙළලක්ෂයක් රහතුන් පිරිවරා **දනව්** සැරිසරණසේක් චන්ද්‍රවතී නම් නුවරට වන්සේක.

එකල අප මහබෝසතාණෝ ඒ නුවර වීජිතාවී නම් සක්විති **රජව** වසනුවෝ බුදුරජුන් වැනි බව අසා සොමනසින් පින පිනා **අවුත්** බුදුන් වැඳපූදා ලක්ෂයක් වියදම්කොට වෙහෙරක් කරවා වස් සැරමස මහදන් දී අවසානයේ සළු පිරිකර දන්දී බුදුබව පතා ඒ සසුන් වැද මහණව දෙවන විවරණය ලදහ.

---

(3) කොණ්ඩඤ්ඤ සම්බුදුන් ඉක්බිති බුදු ශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යයක් ගියකාල මෙයට දෙයාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් ඔබ **සාරමණ්ඩ** නම් කල්පයෙහි **මඞ්ගලය, සුමනය, රේවතය, සොභිතය,** යන සම්බුදුවරයෝ සතරදෙනෙක් ලොව පහළවූහ. ඒ සම්බුදුවරසින් අතුරෙන් මඞ්ගල නම් බුදුරජාණන් වහන්සේ:- අසංඛ්‍යේයාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව උත්තර නම් රජුට දුව උත්තරා අග මෙහෙසිය කුසින් බිහිව නවදහසක් හවුරුදු නිති සැපත් විඳ යසවතී නම් සිය අභිසව කුසින් සිලව නම් පුන්රුවන උපන්දා මහබ්නික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට නාගශ්‍රී බොධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදු බවට පැමිණ දහම්සක් පවත්වා සුදෙව-ධම්සේන යන අගසව් දෙදෙනාද සීවලී-අසෝකා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව පාලිත නම් තෙර කෙනෙකුගෙන් උවැටන් ලබමින් අසූදහසක් අවුරුද්දට ආයිරි ඇතිව අසුරියන් උස බුදුබඳින් දසදහසක් සක්වළ එකාලොකකොට බබුළුවමින් කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක් මෙඛල නම් නුවරට වැඩසේක.

එකල ඒ නුවර සුරුචි නම් බමුණකුව, මහ ධනවතෙකුව සිටි අප මහබොසතාණෝ බුදුරජුන් කරා එලඟ බණ අසා පැහැද දුන් බිණිස ආරාධනාකොට සක්දෙවිඳු මවා දුන් අටසාලිස් ගව්දිග පුළුල් ඇති රුවන් මණ්ඩපයක බුදුපාමොක් සහන වඩාහිඳුවා සත් **දිනක් මහපාන** දුනය් නම්වූ දිය නුමුසු කිරිබත් දන් දී අවසන් දින බෙහෙත් බඳු සමඟ සිවුරු පිරිකර පූජා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

විජිතසේන නම් පුත්‌රුවන උපන්දා, මහබිනික්මන්කොට පැවිදිව දස මසක් ප්‍රධන් විරියකොට සල් බෝරුක මූල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව සත්සති යවා දම්සක් පවත්වා හද්‍ර සුභද්‍ර යන අගසව් දෙනමක්ද තිස්සා උපතිස්සා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව අනුරුඬ නම් මහතෙර කෙනෙකු අතින් උවටැන් ලබමින් අසූඅට රියන් බුදුබඳින් මුළලෝ හොබවා කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක් වඳුවති නම් නුවරට වන්සේක.

එකල අප මහබෝසතාණෝ ඒ නුවර විජිතාභී නම් සක්විති රජව වසනුවෝ බුදුරජුන් වැඩි බව අසා සොමනසින් සිත පිනා අවුත් බුදුන් වැඳපුදා ලක්ෂයක් වියදම්කොට වෙහෙරක් කරවා වස් සාරම්භ මහදන් දී අවසානයේ සඵ පිරිකර දන්දී බුදුබව පතා ඒ සසුන් වැද මහණව දෙවන විවරණය ලදහ.

---

(3) කොණ්ඩඤ්ඤ සම්බුදුන් ඉක්බිති බුඬ ශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යයක් ගියකලී මෙයට දෙයාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට **සාරමණ්ඩ** නම් කල්පයෙහි **මඞ්ගලය, සුමනය, රේවතය, සොභිතය,** යන සම්බුදුවරුයෝ සතරදෙනෙක් ලොව පහළවූහ. ඒ සම්බුදුවරුන් අතුරෙන් මඞ්ගල නම් බුදුරජාණන් වහන්සේ:- ඉඤ්ඡාළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව උත්තර නම් රජුට දුව උත්තරා අග මෙහෙසිය කුසින් කිඹිව නම්දහසක් හවිරුදු හිඳි සැපත් විඳ යසවති නම් සිය අගබිසව කුසින් සීලව නම් පුත්‌රුවන උපන්දා, මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට නාගශ්‍රී බොධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදු බවට පැමිණ දහම්සක් පවත්වා සුදෙව-ධම්මසේන යන අගසව් දෙදෙනාද සීවලී-අසොකා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනාද ඇතිව පාලිත නම් තෙර කෙනෙකුගෙන් උවැටන් ලබමින් අසූදහසක් අවරුද්දට ආයිරි ඇතිව අසූරියන් උස බුදුබඳින් දසදහසක් සඵ්ඵල එකාලොකකොට බබුළුවමින් කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක් මෙඛල නම් නුවරට වැඩිසේක.

එකල ඒ නුවර සුරුචි නම් බමුණකුව, මහ ධනවතෙකුව සිටි අප මහබෝසතාණෝ බුදුරජුන් කරා එලඹ බණ අසා පැහැද දන් පිණිස ආරාධනාකොට සක්දෙවිඳු මවා දුන් අටසාලිස් හවිදිග පුළුල් ඇති රුවන් මණ්ඩපයක බුදුපාමොක් සඟන වඩාහිඳුවා සත් දිනක් **ගවපාන** දානය නමවූ දිය නුමුසු කිරිබත් දන් දී අවසන් දින බෙහෙත් බඳු සමඟ සිවුරු පිරිකර සුදු බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

(4) මඬගල සම්බුදුරදුන් ඉක්බිති එම කප දෙවෙනිව **සුමන** නම් බුදුරජාණන් වහන්සේ:-අටාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මෙඛල නුවර සුදත්ත නම් රජුගේ සිරිමා නම් අග මෙහෙසිය කුසින් බිහිව නවදහසක් අවුරුදු ගිහි සැපත් විඳ විටංසකා නම් සිය අග බිසව කුසින් අනුපම නම් පුත්රුවන උපන්දා, මහබිනික්මන් කොට පැවිදිව දසමසක් ප්‍රධන් වීයර්‍යකොට නාගශ්‍රී බොධියට පිටලා පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා සරණ-භාවිතත්ත යන අගසව් දෙනමද; සොණා-උපසොණා යන අග්‍ර ශ්‍රාවිකා දෙනමද; උදේනි නම් අග්‍ර උපස්ථායක තෙර නමක්ද ඇතිව අසුරියන් බුදුබඳින් තුන්ලොව බබුළුවමින් කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ අතුල නම් දිව්‍යනාග රජව සුවහස්නසින් පිරිවරා බුදුන් කරා පැමිණ බුදුපාමොක් මහසඟනට මහදන් හා පිරිකරද පූදා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(5) සුමන සම්බුදුන් ඉක්බිති එම කප අටාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇති **දේවත** නම් බුදුරජාණන් වහන්සේ:-දඹදිව් ධඤඤවතී නුවර විපුල නම් රජු නිසා විපුලා නම් අගබිසව කුසින් බිහිව දසදහසක් අවුරුදු ගිහි සැපත් විඳ සුදස්සනා නම් සිය අගමෙහෙසිය කුසින් වරුණ නම් පුත් රුවන උපන්දා, මහබිනික්මන් කොට පැවිදිව සත්මසක් ප්‍රධන් වීයර්‍යකොට නාගශ්‍රී බොධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා වරුණ බ්‍රහ්මදෙව යන අග්‍රශ්‍රාවක දෙනමද; භද්‍රා-සුභද්‍රා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සම්භව නම් අග්‍ර උපස්ථායක තෙරනමද ඇතිව සැටදහසක් අවුරුදු ආසිරි ඇතිව අසුරියන් බුදුබඳින් මුළුලොව බබුළුවා රහතුන් ලක්ෂගණන් පිරිවරා ජනපද චාරිකාවෙහි වඩනා සේක.

එකල අප මහබෝසතාණෝ අතිදෙව නම් බ්‍රාහ්මණව බුදුන් කරා එලඹ සරණසීලයෙහි පිහිටා ශ්ලෝක දහසකින් බුදුන්ට සතුතිකොට ලක්ෂයක් වටිනා උතුරුසළුවක් පූදා බුදුබැව් පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(6) දේවත සම්බුදුන් ඉක්බිති එම කප සොභිත නම් බුදු-රජාණන් වහන්සේ:-සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව සුධම්ම නම් නුවර සුධම්ම නම් රජු නිසා සුධම්මා නම් අගබිසව කුසින් බිහිව නවදහසක් අවුරුදු ගිහිසැපත් විඳ මෙඛලා නම් සිය අගමෙහෙසිය කුසින් සිංහ නම් පුත්රුවන උපන්දා, මහ-බිනික්මන්කොට පැවිදිව සත්දිනක් ප්‍රධන් විරියකොටී නාගශ්‍රී

බොධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා අසම-සුනෙත්ත යන අගසව් දෙනමද; නකුලා-සුජාතා යන අග්‍ර-ශ්‍රාවිකා දෙනමද; අංසුම් නම් අග්‍ර උපස්ථායක තෙරුනමද; ඇතිව අනූදහසක් අවුරුදු ආයිර් ලදින් අටපණස්රියන් බුදුබඳින් මුළුලොව බබුළුවමින් තිස්කෙළක් රහතුන් පිරිවරා සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ රම්‍යවතී නුවර සුජාත නම් බමුණු කුමාරව බුදුරජුන් කරා එළඹ බණ අසා සරණගිලයෙහි පිහිටා බුදුපාමොක් මහසඟනට තුන්මසක් දන්දී පිරිකරද පුදා බුදුබැව් පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(7) සොහිත බුදුරජුන් ඉක්බිති බුඩ ශූන්‍යවූ කල්පඅසඞ්ඛ්‍ය-යක් ගියකල මේ කපට එකාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් යට වර නම් කල්පයෙහි **අනොමදස්සි, පදුම, නාරද** යන සම්බුදුවරයෝ තුන්දෙනෙක් ලොව පහළවූහ. ඒ තුන්දෙනා වහන්සේ අතුරෙන් අනොමදස්සී නම් බුදුරජාණන් වහන්සේ: සොළසාසඞ්ඛ්‍ය කල්ප-ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව සඳවත් නුවර යසවත් නම් රජු නිසා යශොධරා නම් අගබිසව කුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහි සැපත් විඳ සිරිමා නම් සිය අගමෙහෙසිය කුසින් උපවාරණ නම් පුත්රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව දසමසක් ප්‍රධන් විරියකොට කුඹුක් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා නිසභ-අනොම යන අගසව් දෙනමද; සුන්දරී-සුමනා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; වරුණ නම් අග්‍ර උපස්ථා-යක තෙරද ඇතිව හවුරුදු ලක්ෂයකට ආයු ඇතිව අටපණස් රියන් බුදුබඳින් තුන්ලෝ සරහමින් තිස්දහසක් රහතුන් පිරිවරා දනව් සැරිසරා වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ මහෙශාක්‍ය මහානුභාව සම්පන්න යක්ෂසේනාධිපතියෙකුව දහස් ගණන් යක්ෂයින් පිරිවරා බුදුරජුන් කරා එළඹ සත්රුවන් මණ්ඩපයක් මවා බුදුපෑමොක් මහ සඟපිරිස් වඩා හිඳුවා සත්දිනක් දිවඅහර දන්දී බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(8) ඔබට ඉක්බිති එම කප පදුම නම් බුදුරජාණන් වහන්සේ;- අසංඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව චම්පා පුරයෙහි අසම නම් රජු නිසා අසමා නම් අගමෙහෙසිය කුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහි සැපත් විඳ උත්තරා නම් සිය අග බිසව කුසින් රම්‍ය නම් පුත්රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට මහබුරුන බෝරුකට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා සාල-උපසාල යන

අගසව් දෙනමද; රම්‍ය-සුරම්‍ය යන අග්‍රශ්‍රාවිකා දෙනමද; වරුණ නම් අග්‍ර උපස්ථායක තෙරනමද ඇතිව අවුරුදු ලක්ෂයකට ආසිරි ඇතිව අටපණස් රියන් බුදුබඳින් තුන්ලෝ බබුළුවා මහ සඟපිරිස් පිරිවරා දහවී සැරිසරමින් වඩනාසේක් හිමවු පියස එක්තරා රුකක් මුල නිරොධ සමාපත්තියට සමවැද වැඩහුන්සේක.

එකල අප මහබෝසතාණෝ සිංහ රාජව ඉපිද එම හිමවන් වසනුවෝ ධ්‍යාන සුවයෙන් හුන් බුදුරජුන් දැක තෙවරක් පැදකුණු කොට තුන්යලක් සිංහනාද පවත්වා බුඩාලම්බන ප්‍රීතියෙන් සතියක් මුළුල්ලෙහි ගොදුරු සොයා නොගොස් බුදුන්ම බලබලා හිඳ ජීවිතය පුදා සත්වන දවස් බුදුරදුන් ධ්‍යානයෙන් නැගිකල බුදුරජුන්ගේ අදහස පරිදි ඒ ඇසිල්ලෙහි එතැනට පැමිණි බුදුරදුන් සිසාරා වැඩසිටි රහතුන්ද දැක ප්‍රීති උපදවා බුදුවීමේ කැමැත්ත ඇතිව ඔබගෙන්ද විවරණ ලදහ.

---

(9) ඔබට ඉක්බිති එම කප නාරද නම් බුදුරජාණන් වහන්සේ: සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව ධඤඤවතී නුවර සුදෙව නම් රජු නිසා අනොපමා නම් අග බිසව කුසින් බිහිව නවදහසක් අවුරුදු ගිහි සැපත් වළඳා විජිතසේනා නම් සිය අඟබිසව කුසින් නඤ්ඤතර නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සත්දිනක් ප්‍රධන් විරියකොට සුළුමූරුන බෝමුල වැඩහිඳ පස්මරුන් දිනා බුදුව භද්දසාල-සුනෙත්ත යන අගසව් දෙනමද; උත්තරා-එගඵණී යන අග්‍රශ්‍රාවිකා දෙනමද; වාසිට්ඨ නම් අග්‍ර උපස්ථායක තෙරද ලැබ අනූදහස්හ් අවුරුද්දට ආසිරි ඇතිව අටඅසූරියන් බුදුබඳින් තුන්ලෝ බබුළුවා අසූකෙළක් රහතුන් පිරිවරා දහවී සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ තවුස් වෙස් ගෙණ ධ්‍යාන උපදවා වසනුවෝ තමන් කෙරෙහි කරුණාවෙන් අසූකෙළක් රහතුන් හා දසදහසක් අනාගාමී උපාසකවරුන් පිරිවරා පන්සලට වැඩි බුදුරජුන් දැක බුදුපාමොක් මහසඟ පිරිසට වෙන වෙනම් විශිතුරු පන්සල් මවා එහි සතපජවා තුන්යම් රාත්‍රියෙහි බණ අසා උදේ බුදුපාමොක් පිරිසට අනර ගෙණවුත් වළඳවා මෙලෙසින් සතියක් දුවටැන්කොට අවසන් දින ලක්ෂයක් වටිනා රන්සඳුන් ගරක් ගෙණවුත් බුදුන් පෙරට පුදා එදා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(10) නාරද නම් සම්බුදුන් ඉක්බිති බුඩ ශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යයක් ගියකල මේ මහා භද්‍ර කල්පයට ලක්ෂයක් වන සාරකල්පයෙහි සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇති පියුමතුරා නම්

බුදුරජාණන් වහන්සේ:- දඹදිව හංසවතී නුවර ආනන්ද නම් රජු නිසා සුජාතා නම් බිසව කුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහිසැපත් විඳ සුදත්තා නම් සිය අගබිසව කුසින් උත්තර නම් පුත්‌රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සත්දිනක් ප්‍රධන් විරියකොට සල්ල ඛෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා දේවල් සුජාත් යන අගසවි දෙනමදා; අමිත්‍රා-අසමා යන අග්‍රශ්‍රාවිකා දෙනමදා; සුමන නම් අග්‍රඋපස්ථායක තෙරද ඇතිව අවුරුදු ලක්ෂ-යකට ආසිරි ඇතිව අටඅසූරියන් බුදුබඳින් මුළුලෝ ආලෝක කෙරෙමින් සැත්නැලක්ෂයක් රහතුන් පිරිවරා ජනපද චාරිකාවෙහි වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ මහා ධනවත් ජටිල නම් මහ-රැටිව බුදුපාමොක් මහසඟනට පිරිකර සහිත මහදන් පවත්වා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

මෙහි දක්වනලද සාරාසඛ්‍යයෙන් දීපඞ්කර සම්බුදුරජුන් කෙරෙහි පටන් කොණ්ඩඤ්ඤ බුදුන් දක්වා අතුරෙහි බුද්ධ ශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යය **සෙල** අසඞ්ඛ්‍යය නම්. කොණ්ඩඤ්ඤ බුදුන් කෙරෙහි පටන් මඞ්ගල බුදුන් දක්වා අතර බුද්ධශූන්‍ය කල්පය **භාග** අසඞ්ඛ්‍යය නම්. මඞ්ගල-සුමන රෙවත සොභිත යන සතර බුදුවරුන්ගේ වහන්සේ එක් සාරමණ්ඩ නම් කප බුදුවූ සෙයින් සොභිත සම්බුදුන් කෙරෙහි පටන් අනොමදස්සී සම්බුදුන් දක්වා අතුරෙහි බුද්ධශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යය **වය** අසඞ්ඛ්‍යය නම් වෙයි. අනොමදස්සී-පදුම නාරද යන දුන්දෙනා වහන්සේම එකම වර නම් කප බුදුවූ නෙයින් නාරද බුදුන් කෙරෙහි පටන් පියුමතුරා සම්බුදුන් දක්වා අතුරෙහි බුද්ධශූන්‍යවූ කප් අසඞ්ඛ්‍යය **රැවි** නම්වෙයි. එසේ හෙයින් වදාරණ ලදී:-

සොදන්තක නිධානයෙහි:-

සෙලෝ භාගෝ වයෝ චෙව-රැවියා සඞ්ඛ්‍යා ඉමේ
චතුනාරෙ තෙ අසඞ්ඛෙය්‍යා-විනිපාතාති වුච්චති.

---

(11) මේසේ මේ සාරාසඛ්‍යයට ඉක්බිති පියුමතුරා නම් සම්බුදුන් කෙරෙහි පටන් සිට ලක්ෂයක් කපින් සැත්නැදහසක් ගියකල මේ මහා භද්‍ර කල්පයට කප් තිස්දහසක් වන මණ්ඩ නම් කල්පයෙහි සුමේධ-සුජාත යන සප්ත්‍රවරයෝ දෙනමක් ලොව පහළ වූහ. එහිදී සුමේධ නම් බුදුරජාණන් වහන්සේ:-අටාසඛ්‍ය කල්ප

ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව සුදත්ත නම් රජු නිසා සුදත්තා නම් අගබිසව කුසින් බිහිව නවදහසක් හවුරුදු ගිහි සැපත් විඳ සුමනා නම් සිය අගමෙහෙසිය කුසින් ප්‍රනර්සුමිත්‍ර නම් පුත්-රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරිය-කොට බක්මී බොධියට පිටලා වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා සරණ-සබබකාම යන අගසව් දෙනමද, රාමා-සුරාමා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සාගර නම් අග්‍රඋපස්ථායක තෙරනමද; ඇතිව අනූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව අසූරියන් බුදුබඳින් මුළුලෝ සරහා කෙළසියයක් රහතුන් පිරිවරකොට ජනපද චාරිකාවෙහි වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ උත්තර නම් මාණවකව බුදුපා-මොක් මහසඟනට (අසූකෙළක් ධන ත්‍යාගදම්කොට) මහදන්දී මාණව බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(12) සුමෙධ සම්බුදුන් ඉක්බිති එම කප සුජාත නම් බුදුරජා-ණන් වහන්සේ:-අටාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව සුමඞ්ගල නම් නුවර උගහන නම් මහරජු නිසා ප්‍රභාවතී නම් අගබිසව කුසින් බිහිව නවදහසක් හවුරුදු ගිහිසැපත් විඳ සිරිනන්දු නම් සිය අගබිසව කුසින් උපසෙන නම් පුත්රුවන උපන්දා, මහබි-නික්මන්කොට පැවිදිව නවමසක් ප්‍රධන් විරියකොට "හුණ" බෝරුක් මුල වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා සුදස්සන සුදෙව නම් අගසව් දෙනමද, නාගා-නාගසේනා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; නාරද නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ඇතිව අනූදහසක් අවු-රුද්දට ආසිරි ලැබ අටපණස්රියන් බුදුබඳින් මුළුලෝ බබුළුවා කෙළ ලක්ෂයක් රහතුන් පිරිවරකොට දනව් සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ සක්විති රජව ඵස්සපුරෝ බුදුන් කරා එළඹ රටවැසියන්ට තෙරුවන් පුදනසේ නියමකොට සක්විති සැපත බුදුරදුන්ට පුදා මහණව බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(13) තවද ඔබට ඉක්බිතිව ශෙෂව තිබූ කල්ප තිස්දහසෙක් විසිනවදහස් අටසිය දෙයාසූ කපක් බුද්ධ ශූන්‍යව ගියකල්හි මේ කල්පයට එක්සිය අටළොස්වන කල්පයෙහි පියදස්සී-අත්ථදස්සී-ධම්මදස්සී යන සම්බුදුවරයෝ තුන්දෙනෙක් ලොව පහළවූහ. එසින් පියදස්සී නම් බුදුරජාණන් වහන්සේ:- අටාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව ඛඤ්ඤවතී නුවර සුදත්ත නම් මහරජු නිසා සඳවතී බිසව කුසින් බිහිව නවදහසක් හවුරුදු ගිහිසැපත් වළඳා, විමලා නම් සිය අගමෙහෙසිය කුසින් කඤ්චනාවෙල නම් පුත්

රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව සමසක් ප්‍රධන් විරිය කොට කුඹුක් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා පාලිත-සබ්බදස්සී යන අගසව් දෙනමද; සුජාතා-ධම්මදින්නා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සොභිත නම් අග්‍ර උපස්ථායක තෙරුන්ද ඇතිව අනූදහසක් අවුරුද්දට ආසිරි හා අසූඅටරියන් බුදුබඳ ඇතිව දිලිනි දිලිනි සියක් ලක්ෂයක් රහතුන් පිරිවරා ජනපද චාරිකාවෙහි වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ කාශ්‍යප නම් බමුණුව වෙදතුයෙහි කෙළපැමිණ වසනුවෝ බුදුරදුන් කරා එලඹ බණ අසා පැහැද කෙළලක්ෂයක් වසතු වියදම්කොට විහාරයක් කරවා බුදුරජුන් සහිත සඟනට පූජා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(14) ඔබට ඉක්බිති එම කප දෙවෙනිව අත්‍ථදස්සී නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව සොභන නම් නුවර සාගර නම් රජුන් නිසා සුදස්සනා නම් අගබිසව කුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහිසැපත් විඳ විසාඛා නම් සිය අගබිසව කුසින් සෙල නම් පුත් රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරිය කොට සප්‍ර බෝරුක් මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා සාන්ත-උපසාන්ත යන අගසව් දෙනමද; ධම්මා-සුධම්මා නම් අග්‍රශ්‍රාවිකා දෙනමද. අභය නම් අග්‍ර උපස්ථායක තෙරද ලැබ .අනූදහසක් අවුරුදු ආසිරි ඇතිව අසූරියන් උස බුදුබඳින් මුළුලෝ සරහමින් නවකෙළක් රහතුන් පිරිවරා ජනපද චාරිකාවෙහි වඩිනාසේක.

එකල අප මහබෝසතාණෝ චම්පක නුවර සුසීම නම් බ්‍රාහ්මණව ගිහිසැප හැරපියා තවුස් පැවිද්දෙන් පැවිදිව අභිඥලාභීව වසනුවෝ සම්බුදුන් කරා එලඹ බණ අසා පැහැද දිවමල් වැසිවස්වා පරසතු මලින් සරහා මල් කුඩයක් බුදුන් සිරසට පූජා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(15) අත්‍ථදස්සී සම්බුදුන් ඉක්බිති එම කප ධම්මදස්සී නම් බුදුරජාණන් වහන්සේ:- සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව සරණ නම් නුවර සරණ රජු නිසා සුනන්දා නම් අගබිසව කුසින් බිහිව අටදහසක් හවුරුදු ගිහිසැපත් විඳ විචිකොලි නම් සිය අගබිසව කුසින් පූණ්ණවඩ්ඪන නම් පුත්රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව සත්දවසක් ප්‍රධන් විරියකොට රත්කරවි බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා බුදුව දම්සක් පවත්වා පදුම-ථූසදෙව යන අගසව් දෙනමද; ඛේමා-සිඛ්බනාම්බා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සුනෙත්‍ර යන අග්‍ර උපස්ථායක

කෙරෙනමක්ද; ඇතිව අවුරුදු ලක්ෂයකට ආසිරි ඇතිව අසූරියන් බුදුබඳින් මුළුලෝ විස්මය පත්කරමින් කෙළලක්ෂයක් රහතුන් පිරිවරා ජනපද චාරිකාවෙහි වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ ශක්‍රදෙවෙන්ද්‍රව දෙදෙව් ලොව දෙවියන් පිරිවරා දිව අවුත් දිව්‍යමයවූ නොයෙක් හෙරිතුයෂ්‍ය හා දිවමල් දිවසුවඳ ආදියෙන් බුදුන් පුද, බුදුබව ප්‍රාර්ථනාකොට ඔබ-ගෙන්ද විවරණ ලදහ.

---

(16) ධම්මදසසී සම්බුදුන් ඉක්බිති ශෙෂව තිබූ එක්සිය අටළොස් කපින් බුදුශූන්‍යවූ කප් සුවිස්සක් ගියකල මේකපට සිවු-අනුවන සාර නම් කප සිද්ධාර්ථ නම් සම්බුදු කෙනෙකුන් වහන්සේ:- අටාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මෙහාර නුවර උදෙන රජු නිසා සුඵස්සා බිසව කුසින් බිහිව දසදහසක් ශවුරුදු කිහිසැපත් විඳ සොමනස්සා නම් සිය අගමෙහෙසිය කුසින් අනෝපම නම් පුත්රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව දස්මසක් ප්‍රධන් විරියකොට කිණිහිරි නම් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා සමඟහුලය සුචින්තය යන අග්‍රශ්‍රාවක දෙනමද; සීවලී-සුනාමා යන අග්‍රශ්‍රාවිකා දෙනමද, බෝවන නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ලදින් අවුරුදු ලක්ෂයකට ආසිරි ඇතිව සැදරියන් උස බුදුබඳින් මුළුලෝ සරහමින් නව කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරමින් වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ සුරසේන නුවර මඞ්ගල නම් බ්‍රාහමණව කිහිසැපත් හැරපියා හිමවතට වැද තවුස්වෙස් ගෙණ අභිඥලාභීව වසනුවෝ සම්බුදුන් කරා එලඹ බණ අසා පැහැද මහ-දඹගසින් දඹ ගෙණවුත් නව කෙළලක්ෂයක් රහතුන් සහිත බුදුන් වළඳවා බුදුබව ප්‍රාර්ථනාකොට ඔබගෙන්ද විවරණ ලදහ.

---

(17) සිද්ධාර්ථ සම්බුදුන් ඉක්බිතිව ශෙෂව තිබූ කල්ප සිවුඅනූ-වෙන් එක් කපක් බුදුශූන්‍යව ගියකල මෙයට නොයනුවන මණ්ඩ නම් කල්පයෙහි තිස්ස-පුස්ස යන සම්බුදුවරයෝ දෙනමක් පහළවූහ. එයින් තිස්ස නම් බුදුරජාණන් වහන්සේ: අටාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂ-යක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මෙඛල නුවර ජනසම්බව නම් රජු නිසා පියුමා නම් අගබිසව කුසින් බිහිව සත්දහසක් අවුරුදු ගිහි-සැපත් වළඳා සුභද්‍රා නම් සිය අගමෙහෙසිය කුසින් ආනන්ද නම් පුත්රුවන උපන්ද, මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට පියා බෝධිද්‍රුම මූලයෙහි වැඩහිඳ පස්මරුන් දිනා සම්-බුදුව දම්සක් පවත්වා බ්‍රහමදෙව-උදය යන අගසව් දෙනමද; සුඵස්සා-සුදත්තා යන අග්‍රශ්‍රාවිකා දෙදෙනාද; සමඟව නම් උපස්ථා-

යක තෙරනමක්ද; ඇතීව අවුරුදු ලක්ෂයක් ආයිරි ලදින් සියක් ලක්ෂයක් රහතුන් පිරිවරා සැටරියන් බුදුබදින් මුළුලෝ බබුලුවා මොහදුරු දුරුකරමින් වැඩවසනසේක.

එකල අප මහබෝසතාණෝ යසවත් නුවර සුජාත නම් රජව රජ සැපත් හැර මහණව ධ්‍යාන උපදවා වසනුවෝ බුදුරදුන් කරා එලඹ බණ අසා පැහැද තව්තිසා දෙව්ලොවට ගෝස් දිවැලයන් වැද යොදනක් කරඬුවකින් නානාවණ්වන් දිවමල් පුරා ගෙණවුත් බුදුරදුන් පෙරට පුදා ඉඳුනීල්මණිමුවා දඹු ඇති ඝන කනකමය පෙති ඇති පබලුමය රත්කෙසුරු ඇති විසිතුරු මහපියුමක් බුදුන් සිරසට පුදා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(18) නිස්ස නම් බුදුරදුන් ඉක්බිති එම කප ඵුස්ස නම් බුදුරජාණන් වහන්සේ:- සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව කසී නුවර ජයසේන නම් රජු නිසා සිරිමා නම් අග මෙහෙසිය කුසින් බිහිව දසදහසක් හවුරුදු ගිහිසැපත් වළඳා කිසාගොතම් නම් සිය අගමෙහෙසිය කුසින් අනුපම නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සමසක් ප්‍රධන් විරියකොට ඇඹුලු බෝරුක් මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා සුරක්ඛිත-ධම්සේන යන අගසව් දෙනමද; මාලා-උපමාලා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සනීය නම් අග්‍ර උපස්ථායක තෙරනමක්ද; ලදින් අනුදහසක් අවුරුද්දට ආයිරි ඇතිව අටපණස්රියන් බුදුබදින් මුළුලෝ බබුලුවා කෙළක් පමණ රහතුන් පිරිවරා දහම් දෙසමින් දනව් සැරිසරා වඩනාසේක.

එකල අප මහබෝසතාණෝ විජිතාවි නම් රජව වසනුවෝ බුදුන් කරා එලඹ බණ අසා මහදන්දී සියලු රාජ්‍යය සම්බුදුන්ට පුදා පැවිදිව සියලු බුදුවදන් ඉගෙණ ධම්කථිකව ප්‍රතිපත්ති ගරුකව බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(19) ඵුස්ස සම්බුදුන් ඉක්බිති ශෙෂව තිබූ දෙයානූ කපින් එක් කපක් ඉක්ම ගියකල මේ කල්පයට එකානූවන සාර නම් කල්පයෙහි විපස්සී නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව බන්ධුමතී නුවර බන්ධුමා රජු නිසා බන්ධුමතී බිසවගේ කුසින් බිහිව අටදහසක් හවුරුදු ගිහිසැපත් වළඳා සිය අග මෙහෙසියවූ සුතනු දෙවියගේ කුසින් සමවත්තඛණ්ඩ නම් පුත්රුවන උපන්දා මහබිනික්මන් කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට පලොල් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා ඛණ්ඩ-තිස්ස යන අගසව් දෙනමද; චන්දා-චන්දමිත්‍රා යන අග්‍රශ්‍රාවිකා දෙනමද;

අශෝක නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ලදින් අසූදහසක් අවුරුදු ආයිරි ඇතිව අටාසූරියන් බුදුබඳින් මූලුලෝ බබුලුවා සුවාසූ දහසක් රහතුන් පිරිවරා දහම් දෙසමින් දනවී සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ අතුල නම් දිව්‍ය නාගරජව කෙළ ගණන් නසින් පිරිවරා බුදුරදුන් කරා එලඹ රුවන් මණ්ඩපයක් නිර්මිතකොට ඒපිරිවර සම්බුදුන් එනි වඩාහිදුවා සත්දිනක් දිව අහර පුදා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(20) විපස්සී සම්බුදුරදුන් ඉක්බිති ශෙෂව තිබූ අනූකපින් පණස්කපක් ගියකල මේ කල්පයට එක්නිස්වන මණ්ඩ නම් කල්පයෙහි සිඛී-වෙස්සභූ යන සම්බුදුවරයින් වහන්සේලා දෙනමක් පහළ වූහ. එසින් සිඛී සම්බුදු රජාණන් වහන්සේ:- දඹදිව අරුණවතී නුවර අරුණවතී රජු නිසා ප්‍රභාවතී දෙවියගේ කුසින් බිහිව සත්දහසක් අවුරුදු ගිහිසැපත් වළඳා සම්කාම නම් සිය අගබිසව කුසින් අතුල නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව අවමසක් ප්‍රධන් වීරියකොට ඇටඹ නම් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා අභිභූ-සම්භව නම අගසව් දෙනමද; මඛිලා-පදුමා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; ඛෙමඞ්කර යන අග්‍ර උපස්ථායක තෙරනමද; ලදින් සැත්තැදහසක් අවුරුදු ආයිරි ඇතිව සැත්තැරියන් උස බුදුබඳින් දිලිහි දිලිහී සැත්තැදහසක් සව්වන් පිරිවරා ලෝවැඩ වඩනසේක.

එකල අප මහබෝසතාණෝ අරිඳම නම් රජව සම්බුදුන් කරා එලඹ බණ අසා පැහැදී බුදුපාමොක් සඟනට සත්දිනක් මහදන්දී කෙළවර දවස් මඟුලැතු සරහා ඔහුද ඔනු උසට කපපිය භාණ්ඩ දන්දී බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(21) සිඛී නම් සම්බුදුන් ඉක්බිති එම කප වෙස්සභූ නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව අනුපම නුවර සුප්‍රතිමා රජුන් නිසා යසවතී නම් අගබිසව කුසින් බිහිව සැදහසක් හවුරුදු ගිහිසැපත් වළඳා සුමිත්‍රා නම් සිය මෙනෙසිය කුසින් සුප්‍රතිබුද්ධ නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සමසක් ප්‍රධන් වීරකොට සල් බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා සොණ-උත්තර යන අගසව් දෙනමද; දුමා-සුදුමා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; උපසාන්ත නම් අග්‍ර උපස්ථායක මහතෙරනමද; ලදින් සැටදහසක් අවුරුද්දට ආයිරි ඇතිව සැටරියන් උස බුදුබඳින් දිලිහි දිලිහී දනවී සැරිසරමින් ලෝවැඩ සලසනසේක.

එකල අප මහබෝසතාණෝ සුදශීන නම් රජව බුදුපාමොක් සඟනට මහදන්දී විහාර දහසක් හා ගඳකිළියක්ද සඟනට හා සම්-බුදුන්ට පුදා රජසුව හැර සසුනෙහි පැවිදිව බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

---

(22) වෙස්සභූ සම්බුදුන්ට ඉක්බිති ශෙෂව නිබූ තිස්කපින් විසිනව කපක් ගියකල මේ මහාභද්‍රකල්පය සම්බන්ධවූ ප්‍රථම අන්තර කල්පයෙහි කකුසඳ නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව ඛේමවති නුවර ඛෙම නම් රජහට අග්‍රපුරොහිතවූ අග්ගිදත්ත නම් බමුණු නිසා විශාඛා නම් බමුණුදෙවීන් කුසින් බිහිව සාරදහසක් හවුරුදු ගිහිසැපත් උසස්ලෙස වළඳා රොචන නම් සිය අගමෙහෙසිය කුසින් උත්තර නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව අටමසක් ප්‍රධන් විරියකොට මහරී බෝරුක මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා විධුර-සංජීව යන අගසව් දෙනමද; සාමා-උපසාමා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; බුදධිජත නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ඇතිව සතළිස් දහසක් අවුරුද්දට ආසිරි ඇතිව සතළිස් රියන් බුදුබඳින් දිලිහි දිලිහි ලෝවැඩ වඩමින් දනව් සැරිසරණසේක.

එකල අප මහබෝසතාණෝ ඛෙම නම් නරපතිවූවෝ සතළිස් දහසක් සවිවන් සහිත සම්බුදු රදුන් පවරා සත්දිනක් මහදන්දී සිවුරු පිරිකරද පිළිගන්වා සසුන් වැද මහණව බුදුබව පතා ඔබ-ගෙන්ද විවරණ ලදහ.

---

(23) කකුසඳ සම්බුදුරදුන් ඉක්බිතිව එම කප දෙවන අන්තර කල්පයෙහි කොණාගමන නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව සොභාවතී නුවර යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණයාණන් නිසා උත්තරා නම් බමුණු දෙවියගේ කුසින් බිහිව තුන්දහසක් හවුරුදු ගිහිසැපත් වළඳා රුචිගාත්‍රා නම් සිය අගමෙහෙසිය කුසින් සාධීවාහ නම් පුත්රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සමසක් ප්‍රධන් විරියකොට දිඹුල් බෝතුරු මුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා සම්බුල-උත්තර යන අගසව් දෙනමද; සමුද්‍රා-උත්තරා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සොත්ථිජ නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ඇතිව තිස්දහසක් අවුරුද්දට ආසිරි ලදින් තිස්රියන් උස බුදුබඳින් මුලුලෝ සතහ සතහා තිස්දහසක් සවිවන් පිරිවරා දනව් සැරිසරමින් ලෝවැඩ සලසනසේක.

එකල අප මහබෝසතාණෝ මිලිඳු නුවර පඤ්ඤ නම් රජව-බුදුන් කරා එලඹ බණ අසා පැහැද බුදුපාමොක් සඟනට මහදන්දී හෙමසක්, උවටැන් කොට අවසානයේ සම්බුදුරදුන්ට හා මහසඟනට සල්ලපිරිකරද පුදා බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

(24) කොණාගමන සම්බුදුන් ඉක්බිති මේම කප තෙවන අසංඛ්‍ය කල්පයෙහි කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ:- දඹදිව බරණැස් පුර බඹදත් නම් බමුණුතුමන් නිසා ධනවතී නම් බමුණු දෙවියගේ කුසින් බිහිව දෙදහසක් හවුරුදු ගිහිසැපත් වළඳා සුනන්ද නම් සිය අගමෙහෙසිය කුසින් විජිතසේන නම් පුත්‌රුවන උපන්දා මහබිනික්මන්කොට පැවිදිව සත්දිනක් ප්‍රධන් විරියකොට නුග බෝරුකමුල වැඩහිඳ පස්මරුන් දිනා සම්බුදුව දම්සක් පවත්වා තිස්ස-භාරද්වාජ යන අගසව් දෙනමද; උරුලා-උරුවෙලා යන අග්‍රශ්‍රාවිකා දෙනමද; සම්මිත්‍ර නම් අග්‍ර උපස්ථායක තෙරනමද; ඇතිව විසිදහසක් අවුරුද්දට ආයිරි ලදින් විසිදහසක් පිරිවර සහිතව විසිරියන් බුදුබදින් මුලුලෝ සතහ සතහා ලෝවැඩ වඩමින් බරණැස් පුර වෙසෙනසේක.

එකල අප මහබෝසතාණෝ ජෝතිපාල නමින් (භාවකාලික මිථ්‍යාදෘෂ්ටි කුලයක) බමුණු කුමරකුට වෙදවෙදඟ හෙද ගෙවා දුන සකල ශාස්ත්‍රයෙහි ආචාර්‍යත්ව වසනුවෝ සීකාර නම් අනාගාමී කුම්භකාරයක්හුගේ මිත්‍ර බලයෙන් සංඝබුදුන් කරා එලඹ බණ අසා පැහැදගිනිසැපත් හැරපියා මහණව සියලු බුදුවදන් ඉගෙණ ප්‍රතිපත්ති පූජාකොට බුදුබව පතා ඔබගෙන්ද විවරණ ලදහ.

සුවිසි විවරණ කථා.

මෙසේ මේ මහාවීරවූ මහබෝසතාණෝ බුද්ධ රාජ්‍යය පිණිස සතාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් මනෝ ප්‍රණිධානය නිමවා, සතාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් වාග් ප්‍රණිධානය නිමවා, සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් කාය-වාක්-ප්‍රණිධානය සම්පූර්ණ කළහ. එසේහෙයින් වදාරණ ලදුයේමැයි:-

චිනතීතං සතසහසෙඛය්‍යං--නවාසඞ්ඛෙය්‍ය වාචකං
කාය වාචා චතුසඞ්ඛෙය්‍යං-බුද්ධත්ත සමුපාගමි.

(සොදත්තක නිධානය)

තවද ඒ දීපඞ්කර තථාගතයන් වහන්සේගේ පාදමූලයෙහිදී අෂ්ටධර්මී සමොධානයෙන් යෙදී ලබන ලද නියත විවරණ ඇති මහබෝසතාණෝ එතැන් පටන් මේ භද්‍රකල්පය දක්වා සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි බුද්ධකාරක ධර්ම වශයෙන් දානාදී සම්භාරයන් පාරමිතාවෝ සම්පූර්ණ කළහ.

අසිත්තී බ්‍රාහ්මණ, විසයහ සිටු, නිමි මහාරාජ ආදී කාලවල දුන සාරම්භාවද;

සීලව නාගරාජ, චම්පෙය්‍ය නාගරාජ, ජයද්දිස, අලීනසත්තු කුමාර ආදී කාලවල ශීල පාරමිතාවද;

ජෝතිපාල කුමාර, අයොඝර කුමාර ආදී කාලවල නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවද;

විධුර පණ්ඩිත, මහෞෂධ පණ්ඩිත ආදී කාලවල ප්‍රඥාපාරමිතාවද;

මහාජනක, පඤ්චායුධ, මහාසීලව ආදී කාලවල වීර්‍ය්‍ය පාරමිතාවද;

ඛාන්තීවාදී, චුල්ලධම්මපාල, මහාකපි ආදී කාලවල ක්ෂාන්ති පාරමිතාවද;

මහාසුතසෝම, භාරිත, වානරින්ද, ආදී කාලවල සත්‍යපාරමිතාවද;

තලපාක, බදිරඞ්ගාර, ලොමහංස ආදී කාලවල අධිෂ්ඨාන පාරමිතාවද;

අරක, එකරාජ, සාම්පණ්ඩිත ආදී කාලවල මෛත්‍රී පාරමිතාවද;

ලොමහංස, අටඨිසෙන, චුල්ලබෝධි ආදී කාලවල උපේක්ෂා පාරමිතාවද, යන දසපාරමී ධර්මයන්:- අනන්ත කාලවල, අනන්ත ජාතිවල රට රාජ්‍යයන් නොතකා-අඹුදරුවන් නොතකා-ජීවිතය නොතකා සම්පූර්ණ කළහ.

මේ පාරමී ධර්ම බලයෙන් මහබෝසත්තුමෝ දීපඞ්කර පාදමූලයෙන් පටන් මේ බුදුවන දැ අතර අවීචිමහානරකය - ලෙ කාන්තාරික නරකය - නිඛ්ඣාම තණ්හික ඛුත්පිපාසික යන ප්‍රේතලෝක කාලකඤ්ඤ අසුර යොනිය යන දුගතී භවයන්හි නූපන්හ. එසේම තිරිසන් භවයෙහි වටුවෙකුට කුඩා සතෙකුවද අලියෙකුට වඩා ලොකු සතෙකුවද නූපන්හ. දුර පිඹුරු ගැරඬි පොළොන් ආදී අපවිත්‍ර දිඹි ජාතීන්වද නූපන්හ. ජාත්‍යාන්ධ-ජාති බධිර - ජාතිමූග පණ්ඩක උභතෝ ව්‍යඤ්ජනක යන දුබල තත්වයක නූපන්හ. කිසි කලෙකත් පඤ්චානන්තරිය කර්මයක්ද නොකළහ. නියත මිථ්‍යාදෘෂ්ටිද නොවූහ. කාමාවචරයෙහි මාරදිව්‍ය රාජ්‍ය නූපන්හ. රූපාවචර අසඤ්ඤාලයෙහිද පඤ්චසුද්ධාවාසයෙහිද නූපන්හ. උපනුපන් ජාතිවලදී ඤාත්‍යත්‍ථචරියා - ලොකත්‍ථචරියා - බුද්ධත්‍ථචරියා - යන ත්‍රිවිධ චර්‍යාවන් සම්පූර්ණ කරමින් අන්තිම වෙස්සන්තර ආත්ම භවයෙහිදී සිත් පිත් නැති මහා පෘථිවිය සත්වරක් කම්පා කරවමින් සත්තසතුකාදී මහා දාන පරිත්‍යාගයන් කොට; ශ්‍රද්ධා නැමති පෘථිවියෙහි පිහිටි; මනෝ - වාග් ප්‍රණිධාන නැමති බිජුවට ඇති; ප්‍රඥා

නැමති තෝතැනි ඇති, කරුණා නැමති ජලය වත් සිරීමෙන් වඩතා ලද මෛත්‍රී නැමති කද ඇති. ත්‍රිවිධ බොධි චයස්ථ නැමති ශාඛාවන් දරන්නාවූ; පඤ්ච මහා පරිත්‍යාග නැමති පලු පල්ලව පත්‍රයන් ඇති; සමත්‍රිංශත් පාරමිතා නැමැති විකශිත පුෂ්පයන් ඇති බොධිසම්භාර නමැති උතුම්වූ කලප වෘක්ෂයෙහි සර්ව්ඥතාඥාන නැමති අමෘතඵල ගන්වනු කැමතිව වෙසසන්තරාත්ම භාවයෙන් චුතව ගොස් තුසිත දෙව්ලොව ශ්වේත කේතු නමින් දේවරාජව උපන්හ.

දූරෙ නිබ්බාන කථා නිමි.

මනුලොව ඉපදීම

—:—

පුරණලද පාරමිඥානයන් ඇති මහබෝසතුන් මෙසේ තුසි පුර වසන කල මිනිස් ලොව හවුරුදු දහසක් කල් සිටම පැවති බුදු කොලහලයකින් ඇලලී ගොස් තිබුනි. දඹදිව උතුරු ඉන්දියාවේ ඉතා දියුණුව පැවති ශාක්‍ය ජනපද නම්වූ රාජධානියෙක් විය. රෝහිණී නදිය අසබඩ පිහිටි කපිල වස්තු පුරය එහි අගනුවර විය. මේ අනන්‍ය කල්පයේ මුල් භාගයේ සිටම ආරම්භවූ මහ සම්මත රාජ පරම්පරාවේ ශාක්‍ය නම් වංශයට අයත් ශුද්ධොදන මහරජතුමා බුදුවන මහොත්තමයෙකුට පියෙකුවීමේ වාසනා බලය ඇතිව සිටි නරශ්‍රෙෂ්ඨයාණන් දෙනෙනෙක් වූහ. ඒ රජුගේ අගමෙහෙසියවූ මහමායා දේවී තොමෝද එසේම බුදුවන උතුමෙකුට මවෙකුවීමේ වරප්‍රසාදය ඇතිව සිටි උභය කුල පවිත්‍රවූ දෙවිදහපුර රාජ කුලයට අයත් කොලිය වංශික උත්තමාවකි. ශාක්‍ය රාජධානියේ පවුල් 1. 60. 000 කටත් අධික පිරිසක අධිපති වශයෙන් විසූ මේ රජ පවුල ඇසුරු කරගෙණ පූර්වෝක්ත මහාවීරයාණෝ ශාන්ති නායකයාණෝ මනුලොව උපන්හ. ඒ කෙසේද යත්

මෙසේ මනුලොව පෙරනිමිති පහළව පවත්නා කල්හි දස දහසක් සක්වළ බොහෝ දෙව් බඹුන් එක්රැස්ව තුසිත දෙව්ලොව වසන මහ බෝසතුන් කරා එළඹ

කාලොයංතෙ මහවීර – උපපජ්ජමාතු කුච්ඡියං
සදෙවකං තාරයන්නෙතා – බුජ්ඣස්සු අමතං පදං

යනාදීන් නිදුකාණෙනි; දානාදී දස පාරමී ධර්මයන් පුරන්නාවූ ඔබ වහන්සේ විසින් ශක්‍ර සම්පත්ත් හෝ බ්‍රහ්ම සම්පත්ත් හෝ මාර සම්පත්ත් හෝ චක්‍රවර්ති සම්පත්ත් හෝ ප්‍රාර්ථනා කරමින් පිරුණේක්

නොවෙයි. ලෝ සතුන් සසර දුකින් මුදන පිරිස සර්ව්ඥතාඥානය ප්‍රාර්ථනා කරමින්ම පාරමී දම් පුරණ ලද්දේය. දැන්වූ කලි නුඹ වහන්සේට ඒ පාරමී ධර්මයෝ සම්පූර්ණ වූහ. එහෙයින් නිදුකාණන් වහන්ස බුදුවීමට කල් වන්නේය. නිදුකාණන් වහන්ස බුදුවීමට සමය වන්නේයයි කියා යාඥා කළාහුය.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ දෙව්යන්ට ප්‍රතිඥා නොදීම.

කාලං දෙසඤ්ච දීපඤ්ච – කුලං මාතර මෙවච
එතෙ පඤ්ච විලොකෙත්වා – උපපජ්ජති තථාගතා

යනු හෙයින් කාල – දීප – දෙස – කුල – මව – යනුවෙන් පඤ්ච මහා විලෝකනයක් කළ සේක. (මෙහි කාලවිලෝකනය නම්. මිනිසුන්ගේ පරමායු ලක්ෂයකින් අඩු සියයකින් වැඩි කාලයයි. දීපය නම් මේ ජම්බුද්වීපයයි. දේශය නම් මධ්‍ය දෙශයයි. කුලය නම් ලොක සම්මත උසස්ම කුලයයි. උසස් කුලයක නූපත් කෙනෙකුගේ වචනය ලෝකයා උසස් කොට නොපිළිගන්නා හෙයිනි. මාතා විලෝකනය නම් මවගේ ගුණය හා ආයු බලයයි. බෝසතුන් ඉපිද සත් දිනකින් මවගේ ආයුසය අවසන් වන කාලය බලාගෙණ බෝසතුන් මව්කුස ප්‍රතිසන්ධිය ලැබීම ධර්මතාවයක් වන හෙයිනි.)

එකල පූර්වොක්ත මධ්‍යදෙශය හා උභයකල පවිත්‍රවූ මව් පියන්වත මහාමායා – සුදොවුන් දෙදෙනාද; ශ්‍රේෂ්ඨවූ රජ කුලය හා නොකැළල් ශාක්‍යවංශයද, මවගේ සත්දිනක් අධික කොට ඇති දසමසකින් පරිවේෂ්ඨවූ ඉදිරි ආයු බලයද යන සියල්ලම දිවැසින් බලා නිදුකා-නෙනි! මේ බුදුවීමට කාලයයි. දෙව්යන්ට සංග්‍රහ කරමින් ප්‍රතිඥාදී නෙපී හැම්දෙන යවසි දෙවියන් යවා දෙවියන් විසින් පිරිවරණ ලදුව නන්දන වනොද්‍යානයෙහි උයන් කෙළි කෙළමින් ඇවිදිමින් සිටම චුතවූවාවූ මිනිස් ලෝ ගණනින් ඇසළ මස මැදි පොහෝදා දස දහසක් සක්වළ දෙනිස් පෙර නිමිති පහළ කරවමින් මහමායා දෙවිය කුස ප්‍රතිසන්ධි ග්‍රහණය කළ සේක.

ලබන ලද ප්‍රතිසන්ධිය ඇති මහබෝසතාණෝ වජ්‍ර ගර්භයෙහි පිහිටි ජෝතිරඹක මාණික්‍යයක්සේ මවට පෙනී පෙනී දෙවියන්ගේ රූකවරණද ඇතිව මවටද කිසි පීඩාවක් නොමැතිව වැඩෙනුවෝ දසමස් සම්පූර්ණවී නියකල වෙසක් මස මැදි පොහෝදා විසා නැකතින් ලුම්බිනී ශාලවනොද්‍යානයෙහිදී ධර්මාසනයකින් බස්නා ධර්මකථිකයෙකු මෙන් දික් කරණලද හස්ත පාදයන් ඇතිව කසීවස්ත්‍රයෙක්හි තබන ලද මැණිකක් සෙසින් පිරිසිදු ශරීර ඇතිව දෙවියන් – බඹුන්ගෙන් පුද ලබමින් මව්කුසින් බිහිවූහ.

ඉක්බිති මහතාණෝ තමන් විදිගත් මහබඹුන් ගේ රත් දැලින් කීමට බැස අහසින් පැමිණි ජලධාරාවකින් පිරිසිදුවූ ශරීර ඇත්තාහු සත් පියවරක් පූර්ව දිශාභිමුඛව ගොස් **අග්ගොහං හමස්මි ලොකස්ස** ආදීන් අර්ථ වාක්‍යයන්ද ප්‍රකාශ කළහ.

විසිතුරු ප්‍රතාපවත් පෙරහරකින් සිය ජන්ම භූමිය කරා ගිය මහාමායා දෙවියට අතරමග ලුම්බිනී සල්වනෙහිදී උදාරතර ශ්‍රේෂ්ඨ පුත්‍ර කුමාරයාණ කෙනෙකු උපන් බව ඇසූ ශුද්ධෝදන මහරජතුමෝ සොම්නසින් ඉවිල ගියාහු දෙවිය සහිත කුමරුන් පිදිගෙණ කුමරුට කිරිමවුන්ද නියමකොට දෙවිකුමරෙකු ලෙසින් වඩන්නට වූහ.

භාග්‍යවත් පුත්‍රසම්පත්කි ප්‍රතිලාභයෙන් ප්‍රමුදිතවූ සුද්ධෝදන මහරජාණෝ කුමරුන් උපන් පස්දිනෙන් කුමරුට නාමකරණ මඟුලය නියමකොට රජමැදුර සිව්දෙගදින් පිරිඔඩගන්වා ලදපස්මල් ඉස අසම්භින්න ක්ෂීරපායාසය (දිය නුවුසු කිරිබත්) පිසවා ත්‍රිවේදයෙහි පරතෙර පැමිණි අවෝරාගියක් බමුණන් නිමන්ත්‍රණයකොට රජගෙහි පණවනලද අසුන්වල වඩා හිඳුවා මනාබොජුන් අනුභව කරවා මහත් සත්කාරකොට බ්‍රාහ්මණයෙනි! මේ පුත්කුමරුගේ අඟලක්ෂණ බලා හතුලෙස කියව! සුදුසු නමක්ද තබව! යි නියම කළහ. ඒ බමුණන් අතුරෙන් ලක්ෂණ ප්‍රතිග්‍රාහක නමිවූ අඟ ලක්ෂණ බලා පලාපල කීමෙහි සමත්:-

රාමෝ-ධජෝ-ලක්ඛණෝ-චාපි-මන්ති
කොණ්ඩඤ්ඤෝ-ජෝ-සුයාමෝ-සුදත්තෝ.

ආදීන් දක්වන ලද බමුණෝ අටදෙනෙක් වූහ. ඔවුන්ගෙන්ද සත්දෙනෙක් කුමරුගේ ශරීර ලක්ෂණ බලා:- "මහරජාණෙනි! මේ කුමාරොත්තමයා මහා භාග්‍යසම්පන්න කෙනෙක. දෙනිස් මහාපුරුෂ ලක්ෂණ හා අසූ අනුව්‍යඤ්ජනයන්ගෙන්ද හොබනේය. මෙබඳු ලක්ෂණයෙන් සමන්විතවූයේ ගිහිගෙයි වසිනම් දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සහර මහාද්වීපයෙහි අධිපතිව සක්විති රජසැප ලබා. පැවිදි වූවහොත් ලොවිතුරු බුදුබව ලබති" යි කීවාහුය. ඔවුන්හෙන් සැමට බාලවූ ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නමිවූ මාණවකයෝ මහබොසතුන්ගේ ලක්ෂණවර නිෂ්පත්තිය බලා මේ මහාපුරුෂයාණෝ ඒකාන්තයෙන් පැවිදිව බුදුබව ලබන්නාහ. ගිහිගෙයි නොවසන්නාහයි නියතකොට එකම ඇඟිල්ලක් ඔසවා එකක්ම කීහ. ඉක්බිති සිද්ධත්ථ කුමරුට මේ උතුම් කුමරුට "සිද්ධාර්ථ (තමාගේ අර්ථසිද්ධිය සලසා ගන්නේ") යන නම සුදුසුයයි නිශ්චය කළාහුය.

(ඒ එසේමැයි! මේ කොණ්ඩඤ්ඤ මාණවක තෙම පශ්චිම භවික සත්වයෙක. රහත්වීම පිණිස කෘතාධිකාරවූ පුරුෂයෙක. එසේ හෙයින් එක ගතියක්ම දැක එකම ඇඟිල්ලක් ඔසවා මෙසේ කී බව දතයුතුයි.)

එවේලෙහි වනාහී සුද්ධෝදන මහරජාණෝ මාගේ පුතනුවෝ කුමක් දැක කුමන කරුණක් නිසා රජසුව හැර පැවිදිවෙද්දැයි විවාළෝය. සතර පෙර නිමිති දැක පැවිදි වෙතියයි කීහු. සතර පෙර නිමිති නම් කවරෙක්දැයි විවාරා ජරාජීණී-ව්‍යාධි-මෘත-ප්‍රව්‍රජිත යන සතර රූපයයි අසා එසේ උවහොත් මෙතැන් පටන් මෙබඳු වූවන් මපුතනුවන්ට දක්නට නොදෙව, මපුතනුවන්ම බුදුවීමෙන් කම් නැත. මම මපුතනුවන් සතර මහාද්වීපයට අධිපතිව අහරළු කෙරෙමින් සතිස් යොදනෙක පැතිර සිටිනා පිරිවරින් පිරිවරණ ලදුව අහස්තලෙහි ඇවිදින්නාහු දක්නා කැමැත්තම්හයි කියා ජරාජීණී-ව්‍යාධි-මෘත-ප්‍රව්‍රජිත යන මොවුන්ගේ ඊම වළකනු පිණිස සිවුදිගින් ගව්වෙන් ගව්වට ආරක්ෂා කරවූය.

(එහෙත් දීපඞ්කර පාදමූලයෙහිදී අනට පත් නිවන්සුව හැරදමා දුකට පත් සත්වයන් දුකින් මුදවම්හයි පතා සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතා ඇති පශ්චිම භවික මහතාණන්ගේ සම්බුද්ධත්වය වැළැක්වීමට කවරෙක් සමර්ථවේද? නොවේමැයි!)

ගුණයෙන් හා සැඟණයෙන්ද රූපයෙන්ද ක්‍රමයෙන් වැඩෙන මනසත් තුමාට සුදුසු වයසෙහිදී සමීමිත්‍ර නම් බමුණුවරයෙකු ලවා වේද-වේදඞ්ගාදී සමයානන්තර හා ශාස්ත්‍රානන්තරයන්ද ඉගැන්වූ සුදොවුන් රජතෙමේ අනාගත රාජ්‍යභාරය සිදුහත් කුමරුට පවරණ අටියෙන් එලෙසට සුදුසු අයුරු ශිල්පශාස්ත්‍ර ඉගැන්වූහ. රම්‍ය-සුරම්‍ය-සුභ යන ප්‍රසාදත්‍රය සෘතු තුනට ගැලපෙන ලෙසින් සාදවා කුමරු එහි වසවා උසස් කුමර සිරියෙන් වඩවා සොළසැවිරිදිවූ කල සඞ්ඝී බිම්බයක් වැනිවූ යශොධරා නම් රජකුමරිය අගමෙහෙසුන් කොට පවරාදී පුරහනන්ද ඇතිකරවා සිය රජ සැපයද පවරාදී කම්සැපයෙහි ඇලුම් කරවීය.

එසේවනුදු උපන්දින කාලදේවල තවුසනුන් සිරසමත දෙපතුල තැබීමෙන්ද, එජම්භුල්ද දඹගසයට අසුන මත පලක් බැඳ වාඩිවී සිටීමෙන්ද, සිදුහත් කුමරුන් කළ අසිරිමත් වැඩ නිසා තම පුත්-රුවන කෙරෙහි අද්භූත අනාගතයක් ඇති බවද සුදොවුන් රජු අමතක නොකෙළේය.

අභිනිෂ්ක්‍රමණය

—§—

සැපෙන් හා යසඝින්ද, පිරිවර බලයෙන්ද අනූනවූ **අප කථා-නායක** මහසත් තුමෝ දෙව්සිරි පරයන රජසිරියෙන් මනුලොව ඇති උසස්ම කම්සැපෙන් කල්යවති. සුදෙවුන් රජතුමෝද සිදුනත් තුමන්ට සීනිනෙනුදු "ලොව දුකය" යන හැඟීමක් ඇති නොවන අයුරින් ක්‍රියා සංවිධානය කරති. එහෙත් බුඩකාරක ධම් නමැති රසොජාවෙන් ශෝරිගිය බොධිසම්භාර නමැති කල්ප වෘක්ෂයෙහි සම්ඥානාඥන නමැති අමෘතඵල ගැන්වීම කවරෙකු විසින් වැළකිය හැකිවේද?

අප මහසත් තුමාගේ ජන්ම වයසින් විසිතවවැන්න උදව්ය. දිනක් උයන් කෙළියට යනු කැමැති **මහතාණෝ** රථාවායර්‍යියාට ආමන්ත්‍රණයකොට රථය යොදවයි කීහ. ඔහුද මැනැවයි **පිළිගෙණ** මහාසීවූ මඟුල් රථය සම්‍යාලඩකාරයෙන් අලඩකාරකොට කුමුදපතු වණ්ණවූ මඟුලසුන් සිවුදෙනෙකු යොදා, මහතාණන්ට ඒ බව සැලකෙළේය. බොධිසත්වයෝ වාහනාරූඪවූවෝ උයනට අභිමුඛව නික්මුණාහුය. "සිද්ධාර්ථ කුමාරයන්ට බුදුවන්ට කල් ආසන්නවිය. පෙරනිමිති දක්වමින" යි එක් දෙවියෙක් ජරාජීර්ණාදී වෙස්ගෙණ සිදුනත් රජතුමන්ට දැක්වීය.) ඉදිරියට යන රජතුමන්ට හා රථාචාර්‍යියාටද ජරාජීර්ණ දුබලයෙක් හමුවිය. රථාවායර්‍යිය! මේ කවරෙක්දැයි (පෙර තමන් එබදු තෙනෙකු මේ ජීවිතයේදී නුදුටුහෙයින්) මහසත්තුමෝ ඇසූහ. දෙවයිනි! මොහු ජරාජීර්ණ දුබලයෙකැයි රථාවාර්‍යියා කීය. ලොව උපන් සියලුදෙනාම ජරාවට පත්වන බවද රියැදුරු තෙමේ විස්තරකොට කීය. **ධිරත්ථු වත භො ජාතියා යත්‍රහිනාම ජානසා ජරා පඤ්ඤායිස්සති.** ආදීන් අහෝ මේ ජාතියට නිතැවේවා උපන්නහුට! ජරාවකුත් වේද? ආදීන් සලකන්නාවූ බෝසතුන්ට කලකිරීමක් ඇතිවිය ඉදිරියටම ගමන් කරණ බෝසතුන්ට දෙවෙනිව හමුවූයේ දරුණු රෝගියෙකි. එහි නතුද (දෙවියන්ගේ ආවිෂ්ටයෙන්) විස්තර කළ රියැදුරු තෙමේ ලොව සියල්ලන්ටම රෝගපීඩා ඇතිවන බව පහදා දුන්නේය. තෙවෙනිව හමුවූයේ මළ සිරුරකි. එහි තතුද රියැදුරු තෙමේ බෝසතුන්ට විස්තර කෙළේය.

අහෝ ලොවක නිසරුකම! උපන් සත්වයාට ජරාව හා රෝග පීඩාද, මරණයද යෙදෙයි නම් ජීවිතයක ඇති සැපය කිම්? ඉදිරියෙහි **ජරාමරණ** නමැති විපතින් ගහණවූ බියකරු ජීවිත **තත්ත්වයක්**

දරමින් කම්සැප විඳීම කන්දක් මත සිටගෙණ පිහුම් ගැසීමක් වැන්න! මරණයට නියමව වධකසථානය කරා ගෙණයන්නෙකුගේ ගායකයෙක් වැන්න! ගසමුල කපද්දී ගසමුදුනේ ම්නෝඥත්මකව සිටින අයෙකුගේ අඥතකම වැන්න! මෙබඳු නිසරු ලොවකින් එතෙරව අජරාමර සඞඛ්‍යාත විමුක්තිය, ශාන්තිය, කවද, සොයම්ද? කෙසේ ලබම්ද?

මෙසේ සලකන බෝසත්තුමෝ විදුරු පර්වතයෙක්හි දක්නාලද සිදුරක් මෙන්ද, අළුත පිපි රත් පියුම් විලෙක්හි දක්නාලද නිඃශ්‍රීකයක් මෙන්ද, හිරු විමනෙහි අන්ධකාරයක් මෙන්ද, ශරත් කාලයෙහි සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලයෙහි දක්නාලද අසෞම්‍යභාවයක් මෙන්ද, දෙව් විමනෙහි-බඹ විමනෙහි දක්නාලද අසුචියක් මෙන්ද, තමන්ගේ රජ සැපයෙහි දක්නාලද ජරාමරණාදී අයස ඇත්තාහු වසතුකාම, ක්ලෙශකාමයෙහි දක්නාලද ආදීනව ඇත්තාහු නන්දන වනොද්‍යානයෙහි කලකිරුණු දිව්‍යපුත්‍රයෙකු මෙන් රාජ්‍යශ්‍රී සම්පත්තියෙහි විපරිණාමය බවක්ද ඇතිකළාහ.

අනතුරුව බෝසත්තුමාට හමුවූයේ සන්සුන් ඉරියව්වෙන් යුත් තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පවිදිවූ පැවිද්දෙකි. එහි නතු රියැදුරුගෙන් දැනගත් මහානුණෝ පැවිද්දෙහි ඇලුම් කෙළේය. වසතුකාම-ක්ලෙශකාමයන්ගෙන් වෙන්ව ලබන පැවිදි ජීවිතය ජරා-මරණ.දී දුක්වලින් එතෙරවීමේ මාර්ගය අනුගමනය කිරීමට තොදම ජීවිත තත්වය විය යුතුයයි සැලකුහ.

දිවා භාගයෙහි සතුටින් උයන්කෙළි කෙළ සවස්භාගයෙහි රජ මැදුර කරා එන්ටසූදානම්ව සිටි මහබෝසත්තුමා ඉදිරියට රාජකියදූතයින් කීපදෙනෙක් පැමිණ අගමෙහෙසියගේ කුසින් පිරිමිකුමරෙකු උපන් බව සැලකළහ: **රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං** (රාහුලයෙක් උපන්නා බැම්මක් ඇතිවිය) යනුවෙන් කියමින් රජමැදුරට පැමිණි මහානුණෝ රාත්‍රි භොජනය වළඳා අතරමග දුටු පැවිදිරුව ගැණ සිතමින් නින්දට වන්හ. නාටිකාඞ්ගනාවෝද නවමින් භාෂයමින් බෝසත්තුමාට විනෝදය ගෙණ දුන්නාහුය.

එහෙත් සසර කලකිරී පැවිදි බව කෙරෙහි පැහැදී සිටි මහසත්තුමන්ට නාටිකාඞ්ගනාවන් විසින් දක්වනලද රූහුම් පියාව රූහුම් මෙන් වැටහෙන්ට විය. එහෙයින් පිටුපස හරවා බෝසත්තුමෝ නිත්දට වන්හ.

මැදියම් රෑ පිබිදුන මිනිසත් තුමාට ගත් ගත් තූර්‍යඝෝෂයන් ඒ ඒ කැන්හි දමා නිද්‍රාවට පැමිණි විකාරවූ අගපසඟ ඇකිළ, විවෘ-

තව්ද දුගද ගමන මුඛයන් ඇතිව අඩක් හෝ සම්පූර්ණයෙන්ම හෝ නීරුවත්ව සිටී, නාට්කාඩහනාවන් දක්නට ලැබුනි. "**උපද්දුතං වතනෝ උපඝාටඨං වතහෝ**" ආදීන් (මේ සසර සඩයාව් ඉතා දරුණු ජාත්‍යාදී උපද්‍රවයෝ වෙති. කාමක්ලෙශාදී සංකිලෙසයෝ ඇත්තාහ') පවසා රජමැදුර පිහාව ගණයාගෙන් සංකිණ්ණවූ සොහොන් බිමක් මෙන් සලකා වහා ඉන් නික්ම යනු රිසිවූවෝ අසල කාමරයක නිදහුන්; (එකද උපන්) තමාගේ ආරක්ෂක ඇමතියාවත, ඡන්න ඇමතිට කථාකොට "ඡන්නය! කඩුක නම් මඟුලසු සරහා ගෙණව"සි නියමකොට එදා උපන් (රාහුල පුතු දකින අවියෙන් යශොධරාවගේ කාමරය කරා පිය නැගුහ.

සුරතල් දරුවා තුරුළුකොට නද නින්දේ සිටි යශොධරාවද නිදන. දරුවාද දැක ආපසු පැමිණ අසුපිට නැගී ඡන්න ඇමති වළගෙහි ඇතිව මහසත්තුමෝ පිටත්වූහ.

එකල්හි වනාහී සුදෙවුන් මහරජාණෝ සිය පුත් සිදුහත් රජුගේ පැවිදි බව සඳහා යන ගමන් වළකනු පිණිස දහසක් පුරුෂයන් විසින් විවෘත කළයුතු ලෙසින් උසින් අටලොස්රියන් පමණවූ ප්‍රධාන වාසල දෙරටුව තැබූහ. මහබෝසත්තුමෝ ඒ වාසල දෙර කරා පැමිණියාහු වසා තිබූ වාසල් දෙර දැක තමන් දස කෙළ දහසක් පුරුෂයින්ගේ බලය දරන සෙසින් වළගෙහි ඡන්න ඇමති සහිතවූ කඩුක අශ්වයා කිසිල්ලේ ගසාගෙන ප්‍රකාර බැමෙන් පිටත පනින්ට සිතුහ. අසු සහ ඇමතිද එලෙසම තම තමන් පනිනු රිසිවිය. එකෙණෙහිම වාසල් දෙර අධිපති දෙවියෝ දෙර හලහ. බෝසත්-තුමෝ මහ ඔතික්මන් නික්මුණහ.

වසවත් මරහුගේ පැමිණීම

ගතවූයේ නිමේෂණයකි! **මාරිස! මානිකඩම** නිදුකාණෙනි. නොනික්මෙව නොනික්මෙව! යනුවෙන් ඇමතනු ලැබූ හඬකින් අසුගේ පා ගමන වැලකූ මහබෝසතාණෝ "කවරෙකුගේ කුමක හඬක්ද"සි පිරික්සා බැලූහ. එසේ බලන මහසත්තුමාට ඉදිරි අහස් කුස වළා ගැබක් පලා ගෙන පැමිණි; පැළඳි මිණි ආබරණ හා මිණි ඔටුනු ඇති, ශරීරලොකයෙන් අවට අහස ආලොකමත් කළ නිල්වත් ගතින් යුත්; යම් කිසිවෙකු දක්නට ලැබිනි. ඔහු බෝසතුන් අමතා:-

මානිකඩම මහාවීර - ඉතෝ තෙ සත්තමෙ දිනෙ ,
දිබ්බනතු චක්කරතනං - අඩ්ඝාපාතු භවිස්සති.

මහාවීරවූ එම්බා සිද්ධාර්ථයෙනි! අදට සත්වෙනි දවස ඔබට චක්‍රවර්ත්ති රාජ්‍යය පහළ වෙයි. දිව්‍යමයවූ චක්‍ර රත්නය ආදී කොට ඇති සත්රුවනින් හෙබි දෙව්සැපත පරයන සක්විති සැපත ඔබට කීසැකයෙන්ම ලැබෙනු ඇත. එබැවින් නොයව!" යනුවෙන් පැවසී

මහබෝසත්:- එම්බා! තොප කවරෙක් වෙහිද?

වසවත්මරු:- මම වසවර්ත්ති මාරයා වෙමි

එවේලෙහි මහබෝසතාණෝ:-

මාර! ජානාමහං මයහං - චක්කස්ස පන සම්භවං
අනප්පිකොහං රජ්ජේන - නිට්ඨතිං මාර මාභුඛ
සකලං දස සහස්සමහි - ලොකධාතු මහං පන
ඒකනාදෙනා භවිස්සාමි - බුද්ධො ලොක විනායකො

(බුද්ධවංස අට්ඨකථා)

මාරය! චක්‍රවර්ත්ති රාජ්‍යය මට පහළවන බව තා නොකීවත් මම දනිමි (එය මා නොදන ය්න්නේ නොවෙමි.) සක්විති සැපතින් මට කම් නැත. මාරය තොප නවතුව! මගේ මේ ගමනෙහිලා තොපගේ වැලැක්මක් නොවේවා!

(මම දස දහසක් සක්වළ ලොක ධාතුව එක පැහැර කම්පා කරවමින් ලොව්තුරා බුදුවෙමි. තාගේ ඉල්ලීමෙන් මගේ ගමන නොවළකී) යනුවෙන් පිළිවදන් දුන්හ.

එකල්හි මාරයා:- "එසේ නම් සිද්ධාර්ථය! මම තට බුදුවන්ට නොදෙමි. තගේ පසුපසින් මා ඇති බව සිහිකරව! තට කාම චිතෂෝභියක් පහළවූ කල මගේ බල තට පෙන්වමි. තගේ තරම තා දනුවසි" වහසි බස් ඔබණෙමින් අතුරු දහන් විය.

* * *

පැවිදිවීම හා තවුස්දම් රැකීම

කිඹුල්වත් පුර නුවරින් එද, ඇසළ මැදි පොහෝදා උතුරුසළ නැකතින් මහබිනික්මන් කළ මහතාණෝ තිස්යොදුන් මග ගෙවා අළුයම් වේලෙහි අනොමා නම් නදී තීරයට පැමිණියහ. අසු ගහින් එතෙර පන්වා පැවිදිවනු රිසිවිය. කඩුවෙන් හිසකේ කපා අහසට දමා සටිසාරතම් මහබඹුන් දුන් අටපිරිකර පැළඳ පැවිද්ම සළුපිළි අහසට දමා අබරණ සහිත කඩුවද අසුද ඇමතිට භාර කොට දිවා හොජනය කරා රජගහ පුර වැඩියෝ [බෝසතුන්ගේ දර්ශන සථය ඉක්මවීමෙන් සමගම අසු සොවින් මළේය. ඉන්ත ඇමති නුදකලාව ආපසු විත් සිදුවූ පුවත සුදොවුන් රජුට දන්වී]

විමුක්තිය සොයා යන මහබෝසතාණෝ පැවිදිවූද රජගහ පුර පිඬු සිඟා වැඩ, එහිදී තමන් වහන්සේ කරා පැමිණි බිම්සර රජු සිය රජයෙන් පැවරූ කල්හි එය ප්‍රතික්ෂේප කොට බුදුවීමට යන බව පවසා ඒ රජහුගේ ඉල්ලීම් පරිදි බුදුවීමෙන් පසුව ප්‍රථමයෙන් රජු දැකීමට නැවත එන බවද වදාරා ඉන් පිටත්ව ක්‍රමයෙන් තවුස්දම් රැකීමට සුදුස්සු පෙදෙසක් සොයමින් යනුවෝ පිඬු සිඟා යමින් එක් වේලක් පමණක් අනුභව කරමින් අරණ්‍ය – වෘක්ෂමූල ශූන්‍යාගාර යන සථානයන්හි වාසය කරමින් දැහැමි පිළිවෙතක් අනුගමනය කරමින් තමන්ට හමුවූ ආළාර කාලාම – උද්දකරාමපුත්‍ර – ආදී තවුසන්ද හමුව ඔවුන්ගේද ධර්මය සියල්ල ඉගෙණ නියම විමුක්තිය ඔවුන් නොදන් බව දැන හුදෙකලාව උරුවෙල් දනව්වට පිවිසිසේක් එහි තමන් වහන්සේ උදෙසා කලින් පැවිදිව එහි විසූ පඤ්චවග්ග තවුසන්ගේ උවටැන්ද ලබමින් තවුස් දම් රකින්නට වූහ.

උරුවෙල් දනව්වට පැමිණි සිද්ධාර්ථ ගෞතම මහබෝසතුන් වහන්සේ ඒ අසලවූ **සේනානී** නම් නිගමය ගොදුරු ගම් කොට් ගෙන නෙරඤ්ජරා නදී තීරයෙහිවූ වන ලැහැබෙක්හි තපෝ ගුණ රකිමින් කල් යැවූහ.

[එහිදී මහසත්තුමන් අනුගමනය කළේ "ආජීවට්ඨමක සීලය" ඔව පෙනේ. කෙනෙකුගෙන් ශික්ෂාපද සීලයක් සමාදන් නොවූවද නියත බ්‍රහ්මචාරීව වාග් සුචරිතය පුරමින් දිවි පැවැත්ම සඳහා නෙබඳු උවද දුරාචාරයක නොහැසිර සෙසු කිසිම තවුසෙකු තුළ නොපිහිටි උදාර ගුණවලින් මහබෝසතුන් සමන්විත වූබව දක්වෙයි.]

ආරම්භයේදීම මෛත්‍රී භාවනාවෙන් කල් යවන්ට විය. තමන් වහන්සේ ගෙන් අනිකෙකුට බියක් නොවන ලෙස පටකිමින්ම බාහිර අරමුණුවලින් තමන් වහන්සේ ද බිය නොවමින් **චිත්ත** ධෛර්‍යය දියුණු කළහ.

මිහිරිවූද ඕජා සහිතවූද අහරින් කාමසංකල්පනාදිය අධික ලෙස උපදනා බව සැලකූ මහසත්තුමෝ **පවත්ත ඵල භොජී** [වැටුණු කොලමල් ගෙඩි ආදිය පමණක් අනුභව කරණ කෙනෙකු] වද; **සයං පතිත ඵල භොජී** [රුකක් මුල හුන්නේ තමා ලඟට වැටුනු ඵල වගී පමණක් අනුභව කරණ කෙනෙකු] වද; කල් යැවූහ. ඇතැම් දිනවල සම්පූර්ණයෙන්ම නිරාහාරවද ඇතැම් දිනයක කොල්ලු හෝ මුං ඇට **තැම්බූ** දිය පමණක් පානය කරමින්ද අල්-පාහාර ජීවිතයක් ගත කළහ, ආහාර අඩු කිරීමද අධික වීර්‍යයද හෙතු කොට ගෙන මහතාණන්ගේ සිරුර ඉතා කෘශ බවටද දුබල බවටද දුර්වර්ණ බවටද පත්විය.

මෛත්‍රී ධ්‍යානය කරුණා ධ්‍යානය අප්‍රාණික ධ්‍යානය ආදී තපෝ ගුණ ධර්ම වර්ධනයෙන් කාම සංකල්පනාදිය දුරුකරන සේක් උපෙක්ෂා ධ්‍යානය නීසා (ව්‍යාපාද විතකී – විහිංසා විතකී – ආදී විතකීයන්ද දුරුකළ සේක. තවද එකල අන්‍ය තවුසන් අතරද පැවති පඤ්චතාප තපන මරුපසතාප තාපන; උදකාරොහණානු යුක්ත, ආදී කෙලෂ තාපන වෘතයන්හි යෙදීමෙන්ම නිතර වියර්‍ය කරන මහොත්තමා-යාණන් වනන්සේ සකීය උදරයෙහි සම පිටකටුවට ඇලෙනතුරුද අතින් සිරුර පිරිමදින කල රොමයන් ගැලවියන තඹයට හා සක්-මන් කරන කල බිම ඇද වැටෙන තරමට දුබල වන තුරුද ප්‍රයත්න දරමින් එහෙත් නින වියර්‍යයකට නොපැමිණ නියම විමුක්තිය සොයනු වස් සාවුරුද්දක් තුළ අන් කිසිවෙකු විසින් කරනු ලබා සිතනුවටත් අසිරු "අත්තකිලමථානුයෝග"යක්ද අනුගමණය කළ-සේක.

මරහුගේ ව්‍යාජ දයාවක්

අනස – පොළොව එකට යොදා ගැටලන්නාසේ – මුහුදෙන් එතෙර මෙතෙර එක්කරන්නාසේ සම්‍යක් සම්බොධිය පතා දැඩි වීර්‍යයෙන් ක්‍රියා කරණ මහතාණෝ වරක සක්මන් මලුවෙහි ඇද වැටෙති. ඇතැම් විට සිරුරු කිස පිණිස හිඳගත් කල සිරුර වියලී මල් ඉහ ඇකිලියාම නිසා ගුද ප්‍රදේශයෙහි දැඩි වේදනා ඇති වූයේ මලකීස කරණු නොහැකිව එහිම මූර්ඡා වූවෝ ඇද වැටෙති. මෙබඳු වේලාවක එක්තරා දෙවියෙක් කිඹුල්වත් පුර සුදොවුන් මහරජ කරා ගොස් සිදුහත් කුමරු මළේයයි දන්වී. කිම? මපුතු මළේ බුදුවීද? නොවීදැයි රජ විවාළේය. "බුදු නොවී යනු දෙවියාගේ පිළිතුරවී. එකල සුදොවුන් රජ "මපුත් බුදුනොවී නොමැරේයයි" පැවසී.

කෙබඳු දුකක් උවද බුදුබවම ලබම් යන සථිර අධිෂ්ඨානය නීසාද; බුදුනොවී ගතකරණ ජීවිතයෙහි කිසිදු ඇල්මක් නැති නිසාද; කෙබඳු අරමුණකින් හෝ බියක් නැති ගැන්මක් නොවන නිසාද මහබෝසතුන්ගේ සිත වික්ෂිප්ත නොවිය. සඬා වීරිය සති සමාධි පඤ්ඤා යන පඤ්චෙන්ද්‍රියයන්ගේ දියුණුවක් විනා පිරිහීමෙක් කම් නොවීය.

නිවන් පිණිසම මෙහෙයවූ සිත් ඇති; කාය ජීවිත දෙක්හි කිසිදු තෘෂ්ණා මමත්වයක් නැතිවැ දැඩි ලෙසින් අප්‍රාණික ධ්‍යානය වඩන මහතාණන් දැක වසවත් මරුතෙම "මේ සිද්ධාර්ථ තවුසුගේ වැයම මහත්ය. දුෂ්කර ක්‍රියාව දැඩිය යම්කිසි දිනක මේ මාර්ගයෙන් බුදු-වනු නිසැකයි. එබැවින් දැන්ම අවවාද කොට මොහුගේ දුෂ්කර ක්‍රියාව නවතාලුවොත් මැනවයි" සිතී එසේ සිතා බෝසතුන් කරා එළඹ උන්වහන්සේ අමතා;

හිතවත! ඔබ ඉතා කෘශයි! දුර්වර්ණයි. මරණය ඔබ කුදුරෙහියි. ඔබගේ මරණයට හේතුවූ අප්‍රාණික ධ්‍යානාදී කරුණු දහසකි. ජීවිතය එක් කොටසකි. ජීවිතය මරණයට වඩා උතුම්. පින්වත ජීවත්වව! ජීවත්ව පින් කරගන්නෙනි, කලින්කල ඔඹසරවස්ද රකිමින් ඔහු-දෙව්යාද පුදතොත් එයින් ඔබට බොහෝ පින් රැස්වේ. ඔබ දැන් පුරණ මේ දුෂ්කරක්‍රියාවෙන් ඔබගේ දිවි තවී කොතෙක් කලක් රැකේද? යනු සැකය. දිවි ගියහොත් මේ කරණ දෙයින්වත් පලක්වේද? එබැවින් පින්වත මේ කරම් දැඩි රළු ප්‍රතිපත්තිය හැරදමා දිවි රැකගනුව! සුජීබුද්ධාඞ්කුරයන් අනුගමනය කළ ප්‍රඥන් විරිය-දුෂ්කරක්‍රියාව ඉතා දැඩිය. එයට පැමිණෙනු ඉතා අසීරුය.

(එකල බෝසතාණෝ "තොප කවුරුදැයි ඔහුගෙන් ඇසී. මම වසවත් මරුවෙමි" යි හේ පිළිවදන් දිනි. එවිට බෝසතුන්වහන්සේ මරු අමතා ඔහුගේ ව්‍යාජ අනුකම්පාවට පිළිතුරු දුන් අයුරු පසුව ප්‍රධාන සූත්‍රයෙහිදී මෙසේ වදාළසේක.)

පමත්ත බන්ධු පාපිම-යෙනත්ථෙන ඉධාගතෝ
අනුමත්තෙනපි පුඤ්ඤන-අත්ථෝ මයහං නවිජ්ජති
යෙසඤ්ච අත්ථෝ පුඤ්ඤානං තෙ මාරෝ වත්තුමරහති.

ප්‍රමත්තවූවන් බැඳගන්නා පාපිමටය! මාගේ ප්‍රධාන වීර්‍යය (බුදුබව පතා කරණ උත්සාහය) වැළැක්වීම් සඞ්ඛ්‍යාත ප්‍රයෝජනය සලකාගෙණ තා මෙහි පැමිණියෙහි නොවේද? එබඳුවූ තා වණන නිනිදෙව්යා පිදීම් ආදී පිණින් මට කම් නැත. යමෙකුට එබඳු පිණින් වැඩක් ඇත්නම් ඔවුන්ට තගේ කථාව සුදුසුවෙයි.

අත්ථි සද්ධා තතෝ විරියං-පඤ්ඤාච මම විජ්ජති
එවං මං පහිතත්තන්තම්පි-කිං ජීව මනුපුච්ඡසි.

ශ්‍රද්ධා-වීර්‍යය-ප්‍රඥා සමාහි සමාධි යන පඤ්ච ඉන්ද්‍රියයෝ මා තුළ උසස් ලෙසින් ඇත්තාහ. මෙකී අඞ්ගවලින් සමන්විතවූ ප්‍රධාන වීර්‍යයෙහි හැවූ සිත් ඇති, නිවන් පිණිස පරිත්‍යාග කරණලද ජීවිතය ඇති; මගේ ජීවත්වීම ගැණ තා කුමකට ප්‍රශ්න කෙරෙනිද?

නදීනම්පි සොතානි-අයං වාතෝ විසොසයෙ
කිඤ්චිමෙ පහිතත්තස්ස ලොහිතං නූපසුස්සයෙ.

ලොහිතෙ සුස්සමානම්හි- පිත්තං සෙම්හංකඤ්ච සුස්සති
මංසෙසු ඛීය මානෙසු – භියෝ චිත්තං පසීදති
භියෝ සතිච පඤ්ඤාච – සමාධි මම තිට්ඨති.

තස්ස මෙ එවං විහරතෝ – පත්තස්සුත්තම වෙදනං
කාමෙනා පෙක්ඛතෙචිත්තං – පස්ස සත්තස්ස සුද්ධිතං.

මාගේ අප්‍රාණික ධ්‍යානයෙන් ඉප්දවූ වායෝ ධාතුකොම් මහා ගඬගාවන්හි හැඩ පහර කුදු වියලවන්ට සමර්ථය. එලෙසින් බලවත්වූ මේ වායුතෙම් කාය - ජීවිත දෙක්හි කිසිදු අපෙක්ෂාවක් නැති; සමෙබාධිය පිණිසම මෙහෙයවූ සිත ඇති මාගේ ශරීරගතවූ කැලියක් පමණ ලෙය කෙසේ නම් නොවියලත්තේද [වියලන්තේ මැයි;] ලෙය වියලෙන කල ඒතන් සෙමත් වියලෙයි. එමෙන්ම ක්‍රම-යෙන් මසුත් ක්ෂීණ වෙයි. එහෙත් මගේ සිත වඩ වඩාත් පහදී. සතියද ප්‍රඥවද සමාධියද සථිරව පිහිටයි. මාගේ මෙබදු දැඩිවූද ධෛර්‍යවිමත්වූද සිත නොදුක ශරීරය පමණක් බලා "කායය" ආදීන් කියඹිද?

පාපිමටය! දැසවූ අධිප්‍රාණ බල ඇතිව මෙසේ කාමසථානානු-යෝගීව වසන මාගේ උතුම් විදීම් බලව! මෙතරම් මා දුබල උවත් "මේ ප්‍රධන් වීරිය හැර නැවත රජ සැපත බලා යම්. යන හැඟීමක් මට කිසි ලෙස කිනුදු ඇති නොවේ. සත්වයෙකුගේ සුද්ධියක සැටි බලව!

කාමාතෙ පඨමාසෙනා - දුතියා අරති වුච්චති
තතියා බුභුක්ඛිපාසා තෙ - චතුත්ථී තණහා පවුච්චති.

පඤ්චමී ථීන මිද්ධංතෙ - ඡට්ඨාභීරු පවුච්චති
සත්තමී විචිකිච්ඡාතෙ - මක්ඛාථම්භෙනාව අට්ඨමෝ.

ලාභෝ සිලොක සක්කාරෝ - මිච්ඡා ලද්ධාව යොයසෝ
යොචත්තානං සමුක්කංසෙ පරෙව අවජානති.
එසා නමුචිනොසෙනා - කණ්හස්සා හිත්‍යපහාරිනී
නානං අසුරෝ ජිනාති - ජෙත්වාව ලභතෙ සුඛං.

පාපිමටය! මම දනිමි. කාමයෝ තගේ පළමුවන මර සෙන්ය. ගුණ ධර්මයෙහි උකටලී බව දෙවන සේනාවය. ක්ෂුධාව හා පිපාසාව තෙවන සේනාවය. ආහාර පානාදිය සෙවීමෙහි ආශාව සිවුවන සේනාවය. පීනම්ධ සඞඛ්‍යාතවූ චිත්ත - චෛතසිකයන්ගේ මලාන බව පස්වන සේනාවය. බියසුලු බව සවන සේනාවය මේ මාගීයද අමාගීයදැයි යන විචිකිච්ඡාව සත්වන සේනාවය. ගුණ මකු බව සිත අවවාදයට නොනැමෙන දැඩි බව අටවන සේනාවය. ලාභ කීර්ති ප්‍රශංසා හා අයුතු ලෙසින් ලැබූ යස ඉසුරු යන මේවා පිළිබඳ තෘෂ්ණා මානයෝ නවවන සේනාවය. තමා උසස් තැන නැඹීම හා අනුන්ට අවමන් කිරීම දසවන සේනාවය.

නමුචිය! මේ අකුශල රාශිය තගේ දස වැදෑරුම් සේනාවය. ගුණවත් මහණ බමුණන්ව නා පිඩා කරන්නේ මේ දස වැදෑරුම්

ආනාපාන සතිය වඩා ප්‍රථම ධ්‍යානය වඩා අසුන මත පලක් බැඳ ගෙන වැඩ හුන් ආකාරය සිහිකොට විමුක්තියට මාර්ගය එයයි සලකා **ආනාපාන සතිය** වඩමින් කල් යවන්ට විය. එපමණක්ද නොවේ ප්‍රණීත ආහාර අනුභවයෙන් පුෂ්ටිමත්ව තමන් වහන්සේගේ ශරීරය හා අවට වන ලැහැබෙහි ශොභාවද බලන බෝසතුන්ගේ සිතේ ඒ නිසා ඇතිවන කාම චිතකීයන්ද දැඩි ශීත සුළං උණුසුම යනාදිය නිසා ඇතිවන ව්‍යාපාද චිතකීයන්ද දුබල සතුන්ට පීඩාකරන ප්‍රබල සතුන් දැකීමෙන් මේ ප්‍රබලයාට ගසා උන එලවා දමා දුබලයා බේරා ගනිමි ආදී විහිංසා චිතකීයන්ද දුරුකරමින් නෙකඛම්ම අව්‍යාපාද අවිහිංසා යනාදී කුශල චිතකීයන්ද වඩන්නට පටන් ගත්හ.

මෙසේ සම්‍යක් සම්බොධිය පතා කෙළෙස් නවන වීර්‍ය ඇතිව ක්‍රියා කරන මහතාණන් වහන්සේ; ලොව දුකින් පිරී ඇත බුදුබව ලබා දුකින් මිදෙමි යන හැඟීම නිසා **සම්මා දිට්ඨිය**; නෙකඛම්ම - අව්‍යාපාද-අවිහිංසා යන සංකල්පනාවන් නිසා **සම්මාසඞ්කප්පය**; සිවුවැදෑරුම් වාග් දුශ්චරිතයෙන් වෙන්වීම නිසා **සම්මාවාචාව**; ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වෙන්වූ නිසා **සම්මාකම්මන්තය**; දැහැමි දිවි පෙවෙත නිසා **සම්මාආජීවය**; චතුස්සත්‍යාවබෝධය නිසා **දළුවඩන නිසා සම්මාවායාමය**; එලඹසිටි සිහිය නිසා **සම්මාසතිය**; **සිතේ සන්සුන් කම නිසා සම්මා සමාධිය** යන ආර්‍ය අෂ්ටාංගික මාර්ගයට අනුකූල්‍යවූ පූර්වභාග ප්‍රතිපදාව සම්පූර්ණ විය.

මේලෙසින් ප්‍රධන් වීර්‍ය වඩන මහතාණන්ගේ ඒ නවුස් ජීවිතය පිළිබඳව වසර 6 ක් ගතවිය. ක්‍රමයෙන් බුද්ධකාරක ධර්මයෙන් මුදුනු කුරන්ට වූහ. බෝධි සම්භාර නැමති වෘක්ෂයෙහි සර්වඥතාඥානය නම්වූ අමාඵල හට ගැණීමට කාලය පැමිණියේය. ජර්ම්යෙන් පන්තිස් (35) වැන්නෙහි වෙසක් මස පුර තුදුස්වක්ද, සිය නවුස් අරමෙහි හින්දට වන් මහබෝසතාණෝ එදින අලුයම **පඨමාභිනිභාය** දුටුවාහුය. එයින් උදෙගිමන් වූ සේක් තමන්වහන්සේගේ මත ඇෙල වහා ඉටුවන බැව් දැන උදයම සිරුර පිළිදැගුම් ආදී කට-යුතු අවසන් කොට නිසඞ්ගාචාර වේලාව බලාපොරොත්තුවෙන් අජපල් නුගරුක මුල වැඩහුන් සේක. එදින සේනානි නිගමයෙහි අධිපති සුජාතා සිටුදේවිය කලක සිට කරගෙන එනු ලබන වාර්ෂික දේවබලි පූජාව පවත්වන දිනයවූ හෙයින් ඕ තොමෝ දියනුම්සු ක්ෂීර පායාසය රැගෙන නුගරුක කරා පැමිණියාය. ගසට අධිපති දෙවතාවාණන් ගසින් බැස රුක මූල දෘශ්‍යමානව සිටිති යන කරිසරින් බෝසතුන් කරා පැමිණ වසා තිබූ තලිය ඉවත් කොට සිළිගැන්වීමට බදුනක් නැති හෙයින් රත්තලිය සම්ගම් අහර පුදා

මාර විජය

දස කෙළක් දහසක් පුරුෂයන්ගේ බල දරන හෙයින් කායබලය; පඤ්චාභිඥාවන් දරන හෙයින් ඤාණබලය යන ද්විධාවූ බලයකින් සමන්විතව අපේ ශ්‍රීමතාණන් සර්ලෝකාභිනවනයට සමත් සර්ඥතාඥන-යාගේ ඉපදවීම පිණිස මෙලෙසින් බෝමුල වැඩහුන් කල්හි; උන්වහන්සේට ගෞරව පිණිස දස දහසක් සක්වළින් මහා ජලෞඝයක් මෙන් දෙවි - බඹ පිරිසද රැස්වන්නට විය. අවට සියලු ප්‍රදේශය දෙව්පුරයක් සෙයින් දෙවියන්ගෙන් හා බඹුන්ගෙන් අතුරු සිදුරු නොවීය. ශක්‍ර - සුයාම - සංතුෂිතාදී දෙව් දෙවතාවෝ තොයෙක් දිව්‍යමය නීත වාදනාදියෙන් සතුතිපූජා හා ආසිරි පැතුම් පවත්වන්නට වූහ. සහම්පතී මහා බ්‍රහ්මයා බෝසතුන් සිරසට සේසත දැරීය. මහාකල නාරජ නාග කන්‍යාවන් අසූ දහසක් පිරිවර කොට ඇතිව තුති ගී ගයමින් වඳිමින් සිටියේය.

සෙසුද දෙව් දේවතාවෝ නානා ප්‍රකාර දිවමල් දිවසුවඳ ආදියෙන් පූජාකරමින් සාධු නාදයන්ද පැවැත්වූවාහුය. මහබෝසතාණෝද පණස් රියන් උස ඇති බෝකදට පිටලා රන්වන් සිරුරෙන් ඒ පෙදෙස ශොභාමත් කරමින් වැඩ හුන්හ.

මේලෙසින් බොධිය අවට පැවති මහුල් සිරිය - උත්සව විලාසය වැර්ණනාවලට නොපැවැතිනි. බෝසතුන් හැර සෙස්සෝ සැම දෙනම යම්කිසි බලවත් සතුරෙකු දැක්මෙන් තැති ගැණුනාහු හිස්ටුවූ අත දිවන්නට වූහ. නිමේෂයකින් අවට ප්‍රදේශය තුළ අන්ධකාරයක්ද පැතිර ගියේය. අහස වැසි වළාකුලින් ආකුල ව්‍යාකුල විය. උල්කාවෝද දහස් ගණන් පතිත වූහ. අවට භය ජනක ප්‍රචණ්ඩ වාතය හැමී. මහා පෘථිවියද සැලෙන්නට විය. අහස ඇතිවූ මේඝ ගර්ජනාවන්ගෙන් බියකරු ආගන්තුක විපතක් දැක්වී. ක්ෂණයක් පාසා ඇතිවන විදුලියෙන් අහස අතරක් නොවනසේ විය. හිරු අහසෙහි පෙනෙන්ට ඇතද ඔහුගේ රශ්මියද නැසුනාක් මෙන් විය. එහෙයින් හිරුද "ග්‍රහණයට" අසුවූ ආකාරයක් දැක්වී. ඇසුවන් කන් පුපුරා යන තරම් බිහිසුණු හඬ ඇති අසනි [හෙන] පතිත වූහ. බකුසු මහ මුහුණු ආදී දිවා අන්ධ පක්ෂීන්ගේ බියකරු රැව් පිළිරැව්ද විය. ගණ්ඩිව්; තළව්; මරව්; පරසක්වළ ගසව්; ආදී ශබ්ද දහස් ගණන් ඇසෙන්නට විය.

මෙසේ මේ අනිෂ්ටවූ භයජනකවූ දුර්නිමිති පහළවන්ටවූ කළ දෙව් බඹ පිරිසෙන් එකෙකුදු එහි සිටින්ට අසමර්ථ විය. මහ බෝසතාණෝ හුදෙකලා වූහ. මේ කුමන සිද්ධියක්ද ඒ? කවරෙකුගේ පැමිණීමක්ද?

බ්‍රහ්ම පෂීදූටද ආඛ්‍යාටව පිඩා කිරීමෙහි සමත් කාම භූමීශ්වරවූ වසවර්ති මාරයා පිරිස් සහිතව පැමිණීමයි

මහබෝසතුන් සය වර්ෂයක් මුළුල්ලෙහි පසුපස ඇවිදත් කිසිදු දෙසක් නොදුටු වසවර්ති මාරයා "දැන් සිද්ධාර්ථයා බෝරුක මූලට පැමිණ සිටී. මගේ විෂය ඉක්මවීමට ප්‍රයත්න දරයි. කෙසේ හෝ මොහුට මගේ විෂය ඉක්මවන්ට ඉඩ නොදෙමි. සිද්ධාර්ථයා අසිද්ධාර්ථයෙකු කරමි"යි කියා තමාගේ පිරිසට කථාකොට කොලෙනී! සිද්ධාර්ථයා ගනිව්! වහවහා නත්වෙස් ගෙණ නත් අවියෙත් සැරසී ගණිව්! මහා සැඩ පහරක් මෙන් එක්ව ගොස් සිද්ධාර්ථයා අල්වා තළව්! මරව්! පරසක්වළ ගසව්! ආදී වහයි බස් බෙණෙමින් අහස අදුරු කරවමින් මහ පොළොව කම්පා කරවමින් දෙව්දුඹු සිය දහස් පහළ කරවමින් තෙමේද යෙල සියයක් යොදුන් උස ඇති දිව්‍යමයවූ බලයක් දරන හිමෙන් වැසි ගිය පළිත ශිඛරයක් වැනි ගිරි මෙඛලා නම් ඇතු පිට පැන නැඟී අත් දහසක් මවා අනෙක ප්‍රකාර ආයුධ ගත්තාහු නානා ප්‍රකාර වණී හා නානා ප්‍රකාශ වෙශ මවාගෙන ගුරුළු රජක්හු ගන්නට නික්මෙණ දියබරණවුන්සේ ත්‍රෛලෝක්‍ය ප්‍රවර සුර දෘමවූ බොධිසත්ත්වයන් මැඩ පවත්වන්ට බෝමැඩ කරා දිව ආහ. ෘමිනී වලින් නැගිට ආ මිනිස් ඇට සැකිලි වැනි දුබල භූත විශෙෂයන් ගුවනෙහි නැන්තැන්වල පාවෙන අතර හිස්සුන් මළකඳන් වැනි විරූප රූපයෝද අහස්හි හැසිරෙන්නට වූහ.

මරසෙන් බෝමැඩ කරා එලඹෙත් එලඹෙත්ම මහබෝසතුන් සිරිවරා සිටි දෙවියන් බඹුන් අතුරෙන් එකකුදු සිටින්ට අසමර්ථ විය. අහිමුඛ අහිමුඛ දිශාවෙහි [හිස් වූ වූ අත) පලා ගියහ.

කාලතම් නා රජ සිය නළු පිරිසද අමතක කර දමා නාලොවට ගොස් මුව වසා ගෙණ යහන්හි වැද හොත්තේ. සත්දෙව් රජ **විජයුත්තර** නම් සංඛය පිට වතුරුවා ගෙණ සක්වළ ගල මුදුනට නැඟී හිඳේ. මහා බ්‍රහ්ම තෙමේ තමා අත තිබූ **ශෙවතච්ඡත්‍රය** සක්වළ ගල මුවාවිටට දමා ඔඛලොව බලා පලා ගියේ. සමාහි - වියර්‍යාදී ගුණ භාරධාරී මහා පුරුෂයාණන් වහන්සේ හුදෙකලාවම වැඩ හුන්සේක් තමන් වහන්සේ කරා යථොක්තාකාරයෙන් දිව එන මරු සහිත සෙනඟ දැක "මෙතෙක් සෙනඟ මා කරා මේ එන්නේ විරූඪකුම් පාන පිණිසය. එක්කෙනෙකුත් වූ මා කරා මෙතෙක් මරසෙනඟ ව්‍යායාම කරණ්. මෙතැන්හි මාගේ මාතා පිතා කෙනෙක් හෝ අන්‍යවූ ඥාතිවතෙක් හෝ නෑ කෙනෙක් හෝ නැත. මාගේ දානාදී දශපාරමිතාවෝම මා විසින් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි පොෂණය *කරණලද මගේ පිරිවර වන්නේය. එහෙයින් පාරමී නැමති මගේ ප්‍රබල

ශාසනයෙන් මා විසින් මේ මර සෙනඟ විහත – විධ්වංසනය කළයුතු වන්නේය" යනුවෙන් පාරමී ගුණ අවර්ජනා කරමින් සිහාල පිරිස-කට බිය නොවන කෙශර සිංහ රාජයක්හු සෙසින් තමන් වහන්සේ ගේ තේජස් කමැති ගින්නෙහි මර සෙනඟ නැමති පලඟැටින් ගැසී වැටෙනැසි සිතා නිර්භීතව වැඩහුන් සේක. කොතෙක් සෙනඟ දිව ඇවත් එකද තෙනෙකුටවත් බෝමැඩ ඇතුළට එන්ට නොහැකි විය. මරු සහිත පිරිස සිටියේ බෝමැඩින් පිටතමය.

වසවත් තෙමේ ප්‍රථමයෙන් මහබෝසතුන්ට නිගාකොට පලවා හරිනු කැමැත්තේ මහබෝසතුන්ට නුදුරුව බෝමැඩ ඉදිරිපස සිට "එම්බා නීව ශ්‍රමණය! කුණු මඩ වගුරක උපන් පණුවකුසේ දුගඳ හමන මිනිස් ලියක කුස කලලයෙහි උපන් නීව උත්පත්තියක් ඇති තා "මම ලොවට දෙටවෙමි, සෙටවෙමි, දෙව්-මිනිසුන්ට මම අග්‍රවෙමි" යනුවෙන් සිතා සිටිනත් තගේ තරම නා දනුව! මා වැනි වසවර්ති (ප්‍රධානි) යෙකු දැක දැකත් නොනැගිට සිටින නා නීර්ලජ්ජි එකෙක, ආදීන් කියමින් මහසතුන්ට නිගා කෙළේය. කිසිත් මූවීන් නොබැණ ධෛර්‍යමත්ව දසපාරමී ගුණ සිහිකරමින් සිටි මහතාණන් දැක "මෙයින්ම මොහු පලවා හරිමි" සි සිතා කල්පාන්ත වාතයක් වැනි මහා මහා වාතයක් උපදවා බෝසතුන් කරා එවීය. ඒ මහා වාතයෙන් අඩ යොදුන්-සමයොදුන්-දෙයොදුන්-තුන්යොදුන් පමණ පළුත කුටයන් ප්‍රදලනය කරන්ටද වන වෘක්ෂාදීන් මුලිනුපුටා හරින්ටද, ග්‍රාමනිගමයන් සුණුවිසුණු කරන්ටද සමර්ථවුවත් අසදෘශ පාරමී ගුණ භාරධාරී මහතාණන්ගේ ආනුභාවයෙන් ඒ වාතය බෝසතුන් කරා පැමිණ සිවුරු කොණක් පමණ සොලවන්ටද නොහැකි විය.

නැවත "මොහු උදකයෙන් අජ්ඣොත්ථරණය (යට) කොට මරම්" සි සිතා කල්පාන්ත වැස්සක් වැනි මහ වැස්සක් වැස්වීය. එයින් නැඟී මහවතුරු අවුත් මාරතිම්බරහරණ සහශ්‍රරශ්මිකරායමාන මහතාණන් කරා පැමිණ ඔබගේ චීවරයෙහි පිණිබිඳුවක් පමණ සථානයකුදු තෙමන්ට අසමර්ථවිය. ඉක්බිත්තෙන් පළුත වශ්‍රාවක් වැස්වීය. ඒ මහත් පළුත කුටයෝ ගිනිගෙණ දිලිසෙමින් ගගන තලයෙන් අවුත් ත්‍රිවිධාග්නි නිර්වාපන සඳහා මේඝ ඇති මහතාණන් කරා පැමිණ දිව්‍යමාලාගුලු සමූහයක් මෙන් වූහ. නැවත ආයුධ වශ්‍රාවක් වැස්වීය. කඩු-තෝමර-නෙණ්ඩිවාලාදී සිඳුම් ආයුධයෝ ගිනිගෙණ දිලියෙමින් අහසින් අවුත් මහබෝසතුන් ඉදිරිපිට දිවමල් පූජාවක් මෙන් වූහ.

නැවත "මොහු දවා අලුකරම්" සි සිතා ගිනිඅඟුරු වැස්සක් වැස්වීය. කිංශුක වණ්ණවූ ඒ අඟඟාරයෝ අහසින් අවුත් බෝසතුන් පාමුල දිවමල් පූජාවක් මෙන් පතිතවූහ.

ඉක්බිත්තෙන් මරහු විසින් මවනලද අත්‍යුෂ්ණවූ අග්නිවර්ණවූ "උණු අලු වැස්ස" බෝසතුන් කරා පැමිණ ශ්‍රීපාද පද්මයට පුදනලද සඳුන්සුණු මෙන් වැගිර ගියහ. අනතුරුව, වැලිවැස්ස කලල්වැස්ස යන වැසීද වැස්වූ නමුත් ඒවාද බෝසතුන් පාමුල පුදනලද සුවඳ සුණු හා සුවඳ කලල් මෙන් වූහ. ඉක්බිත්තෙන් "අදුරෙන් භයගන්වා සිද්ධාර්‍යා පලවා හරිමැ" සි සිතා මහාඝනාන්ධකාරයක් මැවීය මොහදුරට ලඟිරු මඩලක් වැනි මහතාණන් කරා පැමිණි අන්ධකාරය සූර්‍යයී ප්‍රභාව වැදගත් කලක් මෙන් පාරමී ගුණ ලෝකයෙන් අතුරුදන් විය. ආලෝකය පැනිර ගියේය.

මෙසේ මාරදිව්‍ය පුත්‍රතෙමේ වායු-ජල-පර්‍වත-අතුරු=ආයුධ-උණුඅළු-වැලි-මඩ-අඳුරු යන නවවිධ මහා වර්‍ෂාවන්ගෙන් නිශ්චල ගුණභාරධාරී බොධිසත්වයන් පලවාහරින්නට නොහැකිවූයේ තමන් මැවූ මැවූ දෙය බෝසතුන්ට පූජාභාණ්ඩයන් වනු දැක මාරසෙනහට ආමන්ත්‍රණයකොට කොලෙනි! තෙපි කුමක් කරවිද? මේ සිද්ධාර්‍යා වහා ගණුව! විදුව! ගෙනෙව! යා නොදෙව! ආදීන් කිය කියා ගිරිමේඛලා නම් ඇතු පිට හුන්නේ තමාගේ චක්‍රායුධය ගෙණ මහාබෝධිසත්වයන් කරා පැමිණ "කොල! සිද්ධාර්‍යා! මේ පර්‍යාඞ්කය තා සතු නොවෙයි. මා සතුය. එහෙයින් මාගේ පර්‍යාඞ්කයෙහි නොහිඳ වහා නැඟී යා! යනුවෙන් ක්ෂත්‍රිය් කුලයෙහි ඉපිද පුරණලද සක්විතිවත් නිසා ලබනලද චක්‍රරත්නය ඇති සක්විති රජක්හු කරා පැමිණි සැඩොලෙක් "ක්ෂත්‍රිය කුලයෙහි උපත් නොප වැන්නවුන්ට මේ චක්‍රරත්නය හිමි නොවෙයි. අප වැනි සැඩොලුන්ට මෙය අසිත්-යසි කියන්නාක්මෙන්" වහසි බස් තෙපලීය.

එවේලෙහි අප මහබෝසතාණෝ තමන්වහන්සේට කථාකිරීමේ මඳ අවසරයක් ලදැයි සිතා මරහු අමත්‍රා:- මෙසේ වදාළහ

සබ්බන්නා බලිනිං දිස්වා-යුත්තං මාරං සවාහනං
යුද්ධාය පච්චුග්ගම ගච්ඡාමි--මා මං ඨානා අචාවයි.

යන්තෙන තං නපස්සන්ති-සේනං ලෝකෝ සදේවකෝ
තන්තෙන පඤ්ඤාය ගච්ඡාමි-ආමං පත්තංව අස්සමනා.

වසිං කත්වා සංකප්පං-සතිඤ්ච සුසමාහිතං
රට්ඨා රට්ඨං විවත්තිස්සං--සාවකෙ විනයං පුථු.

තෙ අප්පමත්තා පහිතත්තා-මම සාසන කාරකා
අකාමස්ස තෙ ගමිස්සන්ති-යත්ථ ගන්ත්වා න සොචරෙ.

පධාන සූත්‍රය)

"මාරය! මම මෙයින් නොම නැගිටිමි. මේ අවට ප්‍රදෙශය ඉතිර පැකිර සිටි මර සෙනහද; ගිරිමෙඛලා ඇතු නැගී බලවත් මාරයාද දැක මම බිය නොවෙමි. මේ වනාහී ධම්යෙන්ම ජයගත යුතු මිඟුන් **ධම්යුදධයකි.** මෙහිදී මම සිතින් ඉදිරියටම යමි. යම්සේ සේනාව සහිත මාරතෙමේ මේ පය්‍යඞකයෙන් මා සොලවන්නටවත් නොහැකි වන්නේද එලෙස කරන්නෙමි.

මාරය! සදෙවකවූ සෙසු ලෝකයා විසින්ද යුෂ්මතාගේ සේනාව දිනන ලදී. ඒ මේ බිහිසුනු සේනාව අමු මැවි බදුනක් ගලෙකින් මෙන් මගේ ප්‍රඥාවෙන් බිඳ ලන්නෙමි.

කවද මාරය! ආය්‍යීමාගීදෙනයන් වඩිනය කිරීමෙන් සියලු මිථ්‍යා සංකල්පනාවන් දුරුකොට කාය-චිත්ත වෙදනා-ධම්ම යන සතර සථානයන්හි මොනවට පිහිටුවනලද සිහිය ඇතිව (සතර සතිපටය්‍යාන ධම් වඩමින්) ශ්‍රාවකයන් භික්මවමින් රටින් රට නැසිරෙන්නෙමි. මගේ අනුශාසනය පරිදි ක්‍රියාකරන මගේ ශ්‍රාවකයෝ එලඹ සිටි සිහියද නිවන් කරා මෙහෙයූ ගිතද ඇත්තානු යුෂ්මතාගේ විරූඪිකම් පිළිබඳ කිසිත් නොසලකා යම්තැනකට ගියේ ශොක නොකෙරේද? එතැනට (නිවන් පුරයට) යන්නාහ."

මහබෝසතුන්ගේ අතීත වාකෳයෙන් වඩාත් කුපිතවූ වසවත්ති මාරතෙමේ ක්‍රොධය ඉවසාගත නොහි මහතාණන්ට තමාගේ චක්‍රායුධය දමා ගැසීය. එකෙණෙහි එයද මහාපුරුෂයාණන් ඉද්ධිබලය බිම පාවිච්චා බිස්සක් මෙන් සෑදී සිටගත.

ඉක්බිති මාරතෙම බෝසතුන් අමතා:-"මහණ මෙබඳු රළු යකෙකුවූ මා දැකත් නා බය නොවෙහිද" යි ඇසි.

එසේය මාරය! මම බිය නොවෙමි. මේ අසුන සඳහා මා දානාදී දසපාරමී ධම්යන් නොඅඩුව පිරූ හෙයිනැයි මහසත් පැවසී.

මරු:-"යුෂ්මතුන් පාරමී පිරූ බව කවරෙක් දනීද' ශාක්ෂී දෙන්නෝ කවරහුද?

බෝසත්:-තට මේ අසුන අයිති බව කෙසේ දනිමුද? ශාක්ෂී දෙන්නේ කවරහුද?

(ඉක්බිති මාරයා සිය පිරිස් දෙසට හැරී:-මේ මගේ මාරපිරිස මට ශාක්ෂී කියයි කියා මරසෙනඟ දෙසට අත දිගුකොළේ. එකෙනෙහිම මරසෙනඟ ඔවුනොවුන් පරයා එනීතෙක මම ශාක්ෂියෙමි, මම ශාක්ෂියෙමි, යනුවෙන් මහත්සේ හඬනඟා කීය. මේ ශබ්දය බඹලොව දක්වා පැකිර ගියේය.)

මාරඃ- මහණ මගේ මරසෙනඟ මට ශාක්ෂි දෙයි. යුෂ්මතුන්ට මෙහි ශාක්ෂි දෙන්නෝ කවරහුද?

බෝසත්:-මාරය! තාගේ සවෙතනීකවූ මරසෙනඟ තට ශාක්ෂි දෙයි. එහි ඇති අසිරුව කිම? මට මෙහි සවෙතනීකවූ කිසිවෙක් ශාක්ෂි කියන්ට නැත. එහෙත් තට මතු නොවෙයි. මටද ශාක්ෂි දෙන්නෝ ඇත මා අනන්ත ජාතිවල පිරූ පාරමිතා පිළිබඳ ශාක්ෂි තට නොදක්වමි. එසේම වෙස්සන්තර ආත්ම භාවයෙහිදී බුදුබව පතා මා දුන් දනින් සත්වරක් කම්පාවූ මේ මහා පෘථිවියම මට මෙහිදී ශාක්ෂි වේයයි වදාරා වලාගැබින් නික්මුත් විදුලියක් සෙයින් රන්වන් සිවුරු ගැබින් දක්ෂිණ ශ්‍රී හස්තය මහා පෘථිවියට අභිමුඛ කොට දිගුකළසේක. එම්බා මහා පෘථිවිය නී මට ශාක්ෂි ඇද්ද? කැද්දැයි ප්‍රශ්න කළසේක.

එකෙණෙහිම මහා පෘථිවිය "මම ඔබට ශාක්ෂිවෙමි" කියන්-නාක් මෙන් බිහිසුනු හඬ දෙමින් රාව ප්‍රතිරාවයෙන් ගුගුරා කම්පිත විය. ගිරිමේඛලා හස්තිරාජතෙම බෝසතුන් ඉදිරිපිට දනබිම ඇන වැටී ශිරසේ. මාරපිරිස හිස්ලූලූ අත දිවී. වසවත් මරුතෙම පහර ලද්දෙකුසේ බියපත්ව පලාගියේ.

මෙසේ දුවන්නාවූ පිරිස් සහිත මාරයා දුටු දිව්‍ය බ්‍රහමාදීහු "වසවත් මරු පරාජයවී බෝසත් තුමෝ දිනූහ. එහෙයින් අපි ජය පූජාකරමිහ" යි ගඬමාලාදීන් ගත් අත් ඇත්තාහු සතුතිගීතිකා ගායනා කරමින් බෝමැඩ කරා එළඹියාහුය.

ජයොඝි බුද්ධස්ස සිරීමතෝ අයං
අහොසි මාරස්ස පරාජයොඝි
උභෙසාසයුං බොධිමණ්ඩෙ පමොදිතා
ජයං තදා දෙවගණා මහෙසිනෝ.

යනාදීන් දක්වනලද ක්‍රමයෙන් නාග-සුපණී-දිව්‍ය-බ්‍රහම ආදීහුද අවශෙෂ දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහමාදීහුද මාලා ගඬවිලෙපනා-දියෙන් පූජාකරමින් නානාප්‍රකාර සතුති ගීතිකා සහශ්‍රයෙන් පූජා කරමින් සිටියාහුය. මෙසේ මහබෝසතාණන් වහන්සේ හිරු ධර-මාණ කල්හිම හිරු අස්තයට යන්ටත් ප්‍රථම **දෙවපුත්‍රමාර** සංඛ්‍යාතවූ **වසවතී මාරයා** පරාජය කළ සේක.

දෙවියන් බඹුන් හා නාගයන්ද, සුපණීයන්ද මහබෝසතුන්ගේ විජය ශ්‍රිය පිළිබඳ තුති ගී ගැයූ අසුරු පූජාවායීවරයෝ මේසේ ප්‍රකාශ කළහ.

දෙවියෝ:-

ජයොති බුදුසස සිරිමතො අයං
අභොසි මාරසස පරාජයොහි
උභෙසා සසුං බොධි මණ්ඩ පමොදිතා
ජයං තදු දෙවගණා මහෙසිනො

"මේ බුදුවන උතුමා දිනූහ. මරු පැරදුනි."

ප්‍රමුදිතවූ දෙවියෝ එද බෝමැඩ මෙසේ උද්ඝෝෂණය කළාහුය.

බ්‍රහ්මයෝ:-

ජයොති බුදුසස සිරිමතො අයං
අභොසි මාරසස පරාජයොහි.
උභෙසාසසුං බොධි මණ්ඩ පමොදිතා
ජයං තදු බ්‍රහ්මගණා මහෙසිනො.

නාගයෝ:-

ජයොති බුදුසස සිරිමතො අයං
අභොසි මාරසස පරාජයොහි
උභෙසාසසුං බොධි මණ්ඩ පමොදිතා
ජයං තදු නාග ගණා මහෙසිනො.

මේ "දෙවපුත්‍රමාර විජය" යි.

ii මාර විජය

දහසක් රූසින් බබලන හිරු නිම් වලල්ල ගෙණ දියෙහී නිල්වනු ලබන රිය සකස් මෙන් අහස රත්පැහැ ගන්වමින් අවර දිගින් බැස්සේය. සොම් කැලුම් විහිදුවමින් අහස් කුස එලි කරමින් පෙර දිගින් උදාවූ චන්ද්‍රයා; බෝසතුන් දෙස බලා සිනැහෙන්නාක් මෙන් සොළොස් කලාවෙන් පරිපූර්ණ වූයේ බබලන්නට විය. වලා රහිත අහස බබලන තරු ඇවලින් ආකීර්ණවූයේ මහබෝසතුන් මිතුයෙහි මැණික් එබූ වියනක සිරි දැක්විය. උසින් සියක් රියන් පමණවූ උසට සමවන අතුපතරින් සැදුනු මහා පරි මණ්ඩලයකින්ද හෙබි අශ්වත්ථනම් බෝරුක මුල වැඩහුන් මහතාණන්ගේ ශරීරාලෝකයෙන් බෝමැඩ අවට ප්‍රදෙශය රන් රසෙහි ගිලුනාක් මෙන් දිස්විය. සුදම් දෙව් සබය මැද අසුන් අරා දෙව් පිරිස් පිරිවරා නෙද පතුරා වමින් සිටි ඉන්ද්‍රයා (ශක්‍රයා) පරයමින් බෝරුක මුල් වැඩහුන් මහා වීරයාණන් වහන්සේ දිනන ලද දෙවපුත්‍ර මාරයා ඇතිසේක් අවශෙෂ මාරයන් හා සංග්‍රාමයට සැරසී ගත් සේක.

පඤ්ච මාරයෝ

දෙවපුත්තෙනා කිලෙසාව - අභිසඞ්ඛාර මාරකෝ
ඛන්ධමාරෝ මච්චු මාරෝ - මාරෝ පඤ්ච විධොමතෝ.

යනුවෙන් නෙඝණ්ටුකයෝ මාරයින් පස් දෙනෙකු දක්වූහ. බුද්ධඝොෂ වාදීයෝද සවිය "විශුද්ධි මාර්ග" යෙහි **ජින** ශබ්දය විවරණය කරමින් පස් මරුන් දිනු හෙයින් සම්බුදුන්ට ජින යන නම ලැබෙයයි දක්වූහ. **දෙවපුත්‍රමාර; (මරදෙව්පුත්) කෙලෙසමාර; ඛන්ධමාර; අභිසංඛාරමාර; මෘත්‍යුමාර** යන නමින් පඤ්චමාරයෝ හඳුන්වන ලදහ. මෙයින් දෙවපුත්‍රමාරයා බෝසතුන් විසින් පරාජිතලද අයුරු මුලින් දක්වීමු. මරහුගේ තත්ත්‍වය-වයස ආයුස ආදී අමතර විස්තර මතු දක්වෙයි. දැන් ප්‍රකාශ කළ යුත්තේ සෙසු **මාරයන්** දමනය කළ සැටිය.

කෙලෙස මාර

ක්ලෙශ නාම:- සත්වයාගේ චිත්ත සන්තානය කිලිටි කරණ අකුශලයෝය. **ලොභ- ද්වෙෂ- මොහ- මාන- දිට්ඨි- විචිකිච්ඡා- ථීනඤ්ච - අහිරික - අනොත්තප්ප- උද්ධ- ඉස්සා- මච්ඡරිය කුක්කුච්ච** යන දහය අකුශලයෝ සුදුසු පරිදි චිත්ත සන්තානයෙහි

සහිත සිතක් යෙදුනු පුද්ගලයාද බුද්ධාදීන් ඇද්ද? නැද්ද? යනු සෑක කරයි මෙය මොහය අනුවම යෙදෙන බවද දත යුතුයි.

උද්ධච්ච නම් – සිතෙහි ඇතිවන නොසන්සුන් කමයි. සුලඟට සෙලවෙන ධජය වංචලයි. ගලකින් පහර ලැබූ අලුගොඩ මිසිරෙයි. එමෙන් උද්ධච්චය යෙදුනු සිතද එක අරමුණක නොපිහිටා වංචල වන්නේය. තැන්පත් සිත නොවන්නේය. (උඩහු කම් යනු උද්ධච්චයට යෙදෙන සාමාන්‍ය ව්‍යවහාරයයි. උඩහු මිනිසා කිසි-වෙකුට අවනත නොවන අයුරුද ප්‍රකටය.)

අහිරිකය නම්:- සිතෙහි ඇතිවන පාපයට ලජ්ජා නැති බවයි. අහිරිකය සිතේ ඇතිවූ විට පව් කිරීමට සිතයි. ග්‍රාම සූකරයා අසුචියට පිළිකුල් නොකරන්නාක් මෙනි. අකුසල් සිත්වල පමණක් යෙදෙන මේ අහිරික චෛතසිකය ඇතිවූ කළ දුරාචාරකම් සුරාපාන ආදී අකටයුතු කෙරෙහි කිසිත් ලජ්ජාවක් නොදක්වයි.

අනොත්තප්පය නම්:- සිතෙහි යෙදෙන පවට බිය නැති සුභාවයයි. (මිනී මැරීම් මංකොල්ලකෑම් ආදී සාහසික ක්‍රියාවන්ට සතුරා පෙළඹවනු ලබන්නේ මේ අනොත්තප්පය නිසයි.) සිතෙහි අනොත්තප්පය නොයෙදුනි නම් සිත පවට බිය වෙයි. පලහැටියා ගින්නට බියනොවී ගින්නට පනියි. එමෙන් අනොත්තප්පය සිතේ යෙදුනු විට සිත පවට බිය නැති කරයි.

ථීනය නම්:- සිතේ ඇතිවන පසුබස්නා සුභාවයයි. මෙබඳු සිතක් යමෙකුට ඇති වුවහොත් ඔහු කුසල ධර්ම විෂයෙහිද ප්‍රතිපත්ති මාර්ගඵල්හිද පසුබස්නා සුභාවයක් දක්වයි.

මිද්ධය නම්:- චෛතසිකයන්ගේ පසුබස්නා සුභාවයයි. මේ ථින-මිද්ධ දෙක යෙදෙන්නේ එකටමය. චිත්තය දුබලවනවිට ඒ හා යෙදෙන චෛතසිකයෝද දුබල වෙති. එහෙත් සිතේ පදු බැස්මක් ඇති වුවහොත් පමණක් මේ චෛතසික දෙක යෙදෙති. (ධර්මශ්‍රවණයක හෝ භාවනා කර්මයක හෝ එබඳු ප්‍රතිපත්ති මාර්ගයක හෝ යෙදී සිටිනවිට එහි උද්‍යෝගය අඩුවන්නේද නිදිබර ගති ඇති වන්නේද ථින-මිද්ධ දෙක ඇතිවූ විටය.)

ඉස්සා නම්:- සිතේ යෙදෙන; අනුන්ගේ සම්පත් නොඉවසන සුභාවයයි. අන්‍යයා ලබන ධනය- පිරිවර- යසස- කීර්තිය ආදී කාරණයන් දැක සිතෙහි ඇතිවන විපරීත සුභාවයයි. මෙය බොහෝ සෙයින් ක්‍රෝධයට ආසන්නය. එහෙයින්ම මෙය දෙස මූලික සිත්වල පමණක් යෙදෙයි. (කුඩුකේඩුකම යනු මේයට යෙදෙන ගැඹි වහරයි.) ඔවුනොවුන් අතර ඇතිවන විරුද්ධවාදිකම් පිළිබඳ බොහෝ සෙයින් ඉස්සාව හේතුවන බව දක්වා ඇත්තේය.

(මේ දශ කෙලෙශයන් විස්තීර්ණ වශයෙන් ගත්කල 1500 ක් වන බව අභිධම්ම ටීකාවෙහි දක්වා ඇත්තේය. ඒ මෙසේයි:—කාමධම්ම 53 යි + නිෂ්පන්න රූප 18 + ලක්ෂණ රූප 4 + යන මොවුන්ගේ එකතුව=(75) අධ්‍යාත්ම--බාහිර දෙකින් ගුණකළවිට 150 ක්වේ. අනතුරුව දශකෙලෙශයන්ගෙන් ගුණකළ කල්හි 1500 ක් වේ.)

කෙලෙස් මරුන් දමනය කරණ අයුරු

මේ දශ කෙලෙශයන් ප්‍රහීන කරන (නසන) තෙක් සසර ඉපදීම නොවැළැක්විය හැකියි. අනන්තවූ ජාතිවල සත්වයාගේ උපත සිදුවන්නේද ජරා මරණාදී දුක් ඇතිවන්නේද මේ කෙලෙශයන් නිසයි. සීල-සමාධි-ප්‍රඥා යන තිවිධ ප්‍රතිපත්තියෙන් කෙලෙසුන් ප්‍රහීන කොට **අනීත්ථල විමුක්තියෙන්** නිර්වාණ ධාතුව ප්‍රතිවෙධ කළ උතුමෝ නැවත සසර නූපදිති. එහි **සීලය** නම් ඉතා පිරිසිදුවූ කාය-වාචා සංවර (අධිශීල) යයි. **සමාධිය** නම් උසස් චිත්තසංවර (අධිචිත්ත) යයි. **ධ්‍යාන** යනුද එයට නමකි. **ප්‍රඥාව** නම් විදර්ශනා ප්‍රඥා (අධි ප්‍රඥා) වයි. තදඞ්ග-විෂ්කම්භන-සමුච්ඡේද යන ත්‍රිවිධ ක්‍රමයෙන් කෙලෙශයන් ප්‍රහීන කටයුතු බවද දතයුතුයි. ශීලයෙන් තදඞ්ග කෙලෙස් ප්‍රහානය සිදුවෙයි. තදඞ්ග නම් තාවකාලිකවයි. විෂ්කම්භන ප්‍රහානය නම් කලකට මතුවිය නොහෙන පරිදි ධ්‍යාන බලයෙන් කෙලෙසුන් ඔබා තැබීමයි ධ්‍යාන ඇති තාක් මේ කෙලෙසෝ නැගී නොඑති. **සමුච්ඡේද** ප්‍රහානය නම් සම්පූර්ණයෙන් කෙලෙසුන් නැවත නූපදිනා අයුරු කෙලෙසුන් මූල් සහිතව උදුරා දැමීමයි. එය කළ යුත්තේ විදර්ශනා ප්‍රඥාවෙන්ය. සෝතාපත්ති මග්ගඤාණ - සකදාගාමි මග්ගඤාණ-අනාගාමි මග්ගඤාණ-අරහත්ත මග්ගඤාණ යන චතුර්මාර්ගඥාන සිත්වල යෙදෙන ප්‍රඥාවෙන්ම මේ දශ කෙලෙසෝ ප්‍රහීන කළ යුත්තාහුය එකී ප්‍රඥාව **අධිප්‍රඥා** නමින් දක්වේ.

සමුච්ඡේද වශයෙන් කෙලෙස ප්‍රහාණයක් සිදුවන්නේ සතර ආර්ය මාර්ගඥානයන්ගෙන් පමණකි. දශ කෙලෙසයන් අතුරෙන් **දිට්ඨි විචිකිච්ඡා** දෙක **සෝතාපත්ති මග්ගඤාණයෙන්** ප්‍රහීනවේ. එසේම සෙසු කෙලෙසයන්ගේද අපායගාමී ශක්තිය දුරුවෙයි. ලෝභාදී සෙසු කෙලෙසයන් සම්පූර්ණයෙන් ප්‍රහීන නොවූ හෙයින් සෝතාපන්නි මග්ගඤාණලාභී ආර්ය්‍යයා සසර කාම සුගති භවයෙහි උඩත් පිරිසෙයින් සත්වරක් උපදී. **සකදාගාමි මග්ගඤාණයෙන්** කිසිදු කෙලෙසයක් නිරවශේෂයෙන් ප්‍රහීන නොවේ ලෝභයේ අවස්ථා භේදයක් වන කාමරාගයද; දෙවිඳයද; බොහෝ සෙයින් තුනීවෙයි. එහෙයින් සකෘදාගාමී ආර්ය්‍යයාගේ කාම ලොකොත්පත්තිය එක වරකට පමණක් සීමාවෙයි.

දිට්ඨි ආසව – දිට්ඨි ඕඝ – දිට්ඨියෝග යන මෙහි **දිට්ඨි** යන්නෙන් ගනු ලබන්නේ දශ කෙලෙශයන් අතුරෙහිවූ **දිට්ඨියයි. සක්කාය** දිට්ඨි-නත්ථික දිට්ඨි-අහෙතුක දිට්ඨි-අකිරිය දිට්ඨි යනුවෙන් අවස්ථා ප්‍රභෙද වශයෙන් ගණු ලබන්නේද මේ **දිට්ඨියමැයි.**

අවිජ්ජාආසව – අවිජ්ජාඕඝ – අවිජ්ජායොග – වශයෙන් ගණු ලබන්නේ දශ කෙලෙශයන් අතුරෙහිවූ **මොහ** කෙලෙශයයි. චතුස්සත්‍යය හා බුද්ධාදී අටතැන් මුවහ කරමින් සිත අඳුරු කරන මොහයම් **අවිජ්ජා** නමින්ද හඳුන්වා ඇත්තේය

බොහෝ කලක් සත්වයාගේ චිත්ත සන්තානයෙහි පිලුනු වෙමින් පල් වෙමින් පවත්නා නිසා හෝ ව්‍රණයකින් වැගිරෙන ලේ සැරව මෙන් චක්ඛුරාදී සදෙරින් රූපාදී ආරම්මණයන්හි වැගිරෙන නිසා හෝ; භවාග්‍රය හා ගොත්‍රභූ චිත්තය දක්වාද අරමුණු කිරීම් වශයෙන් පැකිර පවත්නා නිසා හෝ ලොභ දිට්ඨි මොහ යන **කෙලෙශ තුනට ආසව** යන නම ලැබේ. මෙතැන්හි ආසව යනුවෙන් **අදහස් කරණු** ලබන්නේ මාගී චිත්ත වීථියෙහිවූ **ගොත්‍රභූ චිත්තයයි.**

ඕඝ නම් සැඩ දිය පහරය හෙවත් දිය වැලය. එයට අසුවූ **සත්වයාට** එසින් එතෙර වන්නට ඉඩ නොදී යටකර මරණු ලබන්නාක් මෙන් **ලොභ දිට්ඨි – මොහ** නමැති කෙලෙස් දියවැල්වලට අසුවූ සත්වයාට එසින් එතෙර විය නොදී සසර සයුරටම හෙලා වනසාලන හෙයින් **ලොභ – දිට්ඨි – මොහ** යනු කෙලෙස් තුනට ඕඝයයිද කියනු ලැබේ.

යෝග නම් රථයෙහි යෙදූ ගොනුන් මෙන් සත්වයන් සසර දුකින් නොමිදෙන පරිදි භවරථයෙහිම යොදවා ලන **ලොභ දිට්ඨි මොහ** යන මොළුමය.

මෙහි දැක්වූ කාමාසව-භවාසව-කාමඔඝ යන මොළුද; අවිජ්ජා ආසව-අවිජ්ජා ඔඝ-අවිජ්ජා යොග යන මොළුද අතීත්මාගී ඥන-යෙන් ප්‍රහීන වෙති. **දිට්ඨි** ආසව-දිට්ඨි ඔඝ-දිට්ඨි යොග යන මොළු සෝවාන් මගින් ප්‍රහීනවෙති.

ග්‍රන්ථ 4

1 අභිධ්‍යා කාය ගන්ථය
2 ව්‍යාපාද කාය ගන්ථය
3 සීලබ්බත පරාමාස කාය ගන්ථය
4 ඉදං සච්චාභිනිවේස කාය ගන්ථය

1 මේහි **අභිධ්‍යා** නම් අන්සතු දෙය තමාටම වේවායි සිතන දැඩි ලොභයයි. කාමරාග-රූපරාග- අරූපරාග යන සියලුම රාගය මෙහි ඇතුළත්ය. වර්තමාන කය (භවය) හා අනාගත කය (භවය) ද වෙන්විය නොදී එකට ගොතන්නාක් (ගැට ගසන්නාක්) මෙන් **සම්බන්ධකරණ** සභාවය ඇති හෙයින් **දැඩි ලොභයම අභිධ්‍යා කාය ග්‍රන්ථය නම්.**

2 **ව්‍යාපාද** කාය ග්‍රන්ථ යන මෙහි ව්‍යාපාදනම් සිත පැරීමෙන් අනුන් වැනසෙත්වායි සිතන **දෙවෂයයි.**

3 **ශීල ව්‍රත පරාමාෂ** කාය ග්‍රන්ථ යන මෙහි **ශීල ව්‍රත පරාමාෂ** නම් ගව-සුනඛ ආදීන්ගේ ගති පැවතුම් අනුව පිළිපැදීමෙන් සසර දුකින් මිදිය හැකියයි නොමග ගිය මිථ්‍යාදෘෂ්ටියයි.

4 **ඉදම් සත්‍යාභිනිවෙෂ** කාය ග්‍රන්ථය යන මෙහි **ඉදම් සත්‍යාභිනිවෙශ** නම් තමාගත් (වැරදි) මතයම සැබෑය. අන් සියල්ලම මිස්සයි දැඩිකොට ගන්නා මිථ්‍යාදෘෂ්ටියයි.

මෙහි **අභිධ්‍යාකායග්‍රන්ථය** නම් කෙලශයන් අතුරෙහිවූ **ලෝභයයි.** **ව්‍යාපාදකාය** ග්‍රන්ථය නම් **දෙවෂයයි. සීලබ්බත පරාමාස** හා **ඉදං සච්චාභිනිවෙශ** කාය ග්‍රන්ථය නම් **දිට්ඨියයි. මෙකී** ග්‍රන්ථයන් ප්‍රහානය කිරීමේදී සීලබ්බත පරාමාස හා **ඉදං සච්චාභිනිවෙශ** යන කාය ග්‍රන්ථ දෙක සෝවාන් මගින්ද; **ව්‍යාපාද** කාය ග්‍රන්ථය අනාගාමි මගින්ද; **අභිධ්‍යා** කාය ග්‍රන්ථය රහත් මගින්ද ප්‍රහානය වෙයි.

උපාදාන 4

1 කාම උපාදානය
2 දිට්ඨි උපාදානය
3 සීලබ්බත උපාදානය
4 අත්තවාද උපාදානය

උපාදාන නම් තෘෂ්ණා විසින් දැඩිව අල්ලාගත් මැණියෙකුසේ (තෘෂ්ණා-දෘෂ්ටීන් විසින්) අරමුණ තදින් අල්ලාගන්නා සභාවයයි.

එසතු **කාමය** තදින් අල්ලාගන්නා **දැඩි ලොභය කාමූපාදානයයි.** ශාස්වත-උච්ඡේද යන මිථ්‍යාදෘෂ්ටීන් දැඩිකොට ගන්නා සභාවය **දිට්ඨි උපාදානයයි.** ගව-සුනඛ ආදීන්සේ ගති පැවතුම් වැනි ගති පැවතුම් සසරින් එතෙරවීමට සුදුසුයයි තදින් ගන්නා සභාවය

සීලබ්බත උපාදානයයි. සත්ත්වයෙක පුද්ගලයෙක යනාදී වශයෙන් ආත්මයක් ඇතැයි දැඩිකොට වටහාගන්නා සක්කාය දිට්ඨියම් **අත්තවාද උපාදානයයි.**

මේ කාම උපාදානය නම් දශකෙලෙශයන් අතුරෙහිවූ **ලෝභයයි.** සෙසු උපාදාන තුනම **දිට්ඨිය** නම් කෙලෙශයයි.

මෙයින් **කාම** උපාදානය රහත් මහින් ප්‍රහීනවේ. දිට්ඨි-සීලබ්බත-අත්තවාද යන උපාදානයෙ; සෝවාන් මහින් ප්‍රහීනවෙති.

නීවරණ 6

1 කාමච්ඡන්ද නීවරණය
2 ව්‍යාපාද ,,
3 ථින-මිද්ධ ,,
4 උද්ධච්ච-කුක්කුච්ච ,,
5 විචිකිච්ඡා ,,
6 අවිජ්ජා ,,

ධ්‍යානාදී වශයෙන් නූපන් කුසල් ඉපදවීමට හෝ උපන් කුසල් පවත්වා ගැණීමට නෝ ඉඩ නොදී වලක්වාලන කාම රාගාදිය නීවරණයයි කියනු ලැබේ. මෙහි **කාමච්ඡන්ද නීවරණය** නම් පඤ්චකාම වස්තූන් කෙරෙහි අධිකව පවත්නා බලවත් කාමරාගයයි. ඒ කාමරාගයම කාමච්ඡන්ද නීවරණයයි. දශ කෙලෙශයන් අතුරෙහි ලෝභයයි. සිත පැරිම් වශයෙන් හටගන්නා ක්‍රෝධයම **ව්‍යාපාද නීවරණයයි.** එය දශ කෙලෙශයන් අතුරෙහිවූ **දෙසයයි.** දශකෙලෙශයන් අතුරෙහිවූ ථින-මිද්ධ යන කෙලෙශයෝ දෙදෙනා මෙහි **ථින-මිද්ධ නීවරණය** නමින් හඳුන්වනු ලැබෙත්. සිතේ නොසන්සුන් ගතිය උද්ධච්ච-කුක්කුච්ච නීවරණයයි. එතම් කෙලෙශයෝ දෙදෙනා වෙති. **විචිකිච්ඡා නීවරණය** නම් විචිකිච්ඡා කෙලෙශයයි. **අවිජ්ජා නීවරණය** නම් දශඅකුලෙශයන් අතුරෙහිවූ **මොහයයි.**

සමුච්ඡේද වශයෙන් ප්‍රහීනවීමේදී සෝවාන් මහින් විචිකිච්ඡා නීවරණයද; අනාගාමී මහින් ව්‍යාපාද-කුක්කුච්ච යන නීවරණද; රහත් මහින් කාමච්ඡන්ද-ථින මිද්ධ-උද්ධච්ච-අවිජ්ජා යන නීවරණද ප්‍රහීනවන බව දතයුතුයි.

අනුශය 7

කාමරාගානුසය - භවරාගානුසය - පටිඝානුසය - මානානුසය - දිට්ඨානුසය-විචිකිච්ඡානුසය-අවිජ්ජානුසය යන මොවුහු අනුශයෝ වෙති.

අනුසය නම් චිත්තසන්තානයෙහි (නිදන්ගතව) අප්‍රකටව පවත්නා කෙලෙස් ශක්තියයි. ගිනිකුරෙහි නිදන්ව පවත්නා ගින්න මෙනි. ගිනිකුර ගිනිබෙත් සමග ගැටෙන කල්හි ඒ ගිනි මතුවී එන්නාක් මෙන් චක්ඛුරාදි ෂඩ්ද්වාරයන්හි රූපාදී ආරම්මණයන් ගැටෙන කල ඒ යටපත්ව පවත්නා රාගාදීහු (අනුසයෝ) මතුවී ප්‍රකට වන්නාහ. මාගීඥනයෙන් නිරවශෙෂයෙන් ප්‍රහීන කරණ ලෙක් සුදුසු අරමුණක් ඇතිවූ කල්හි ඉපදීමට සුදුසුවම පවත්නා ප්‍රහීන නොවූ කෙලෙස්ශක්තිය අනුසය නම්. මොවුනට කෙලෙස් බීජයෝයයිද කියති.

(**අනුසය පරියුට්ඨාන-වීතික්කම** යයි කෙලෙසුන්ගේ අවස්ථා තුනක්වේ. එහි ප්‍රහීණවැන්න අනුසය අවස්ථාවයි. කාම රාගාදිය ජවන් සිත්හි ඉපිද නැගී සිටින අවස්ථාව පරියුට්ඨාන නම්. උපන් පමණින් නොකැමති කයින් හෝ වචනයෙන් පිටවන අවස්ථාව ගෙවත් වැරදි සිදුවන අවස්ථාව වීතික්කම නම්වේ. ජවන් සිතෙහිද නොඉපද පරියුට්ඨානයට බීජයක්ව චිත්තසන්තානය අනුව අප්‍රකටව පවත්නා අවස්ථාව **අනුසය** නම්වේ. මෙහි ගැණෙනුයේ මේ අනුසය අවස්ථාවය. රෝගයකට මූලිකවූ විෂබීජය නොවේනම් රෝගයක් නොහටගන්නාසේ අනුසය කෙලෙසයෝ නොවෙත් නම් පාප ක්‍රියාවෝද නැත. වීතික්කම අවස්ථාවට පැමිණි කෙලෙසයන් නිසා කාය දවාරික-වාග් දවාරිකවූ ප්‍රාණඝාතාදී අකුශල් සිදුවෙත්. එහෙයින් වීතික්කම අවස්ථාවට පැමිණි කෙලෙසයෝ සීලයෙන්ද; පරියුට්ඨාන අවස්ථාවට පැමිණි කෙලෙසයෝ සමාධියෙන්ද; අනුසය අවස්ථාවෙහිවූ කෙලෙසයෝ විදර්ශනා ප්‍රඥාවෙන්ද ප්‍රහීන කළයුතුවෙත්. සීලයෙන් නදඹ වශයෙන්ද, සමාධියෙන් විෂ්කම්භන වශයෙන්ද, ප්‍රඥාවෙන් සමුච්ඡේද වශයෙන්ද, ප්‍රහීනවන අයුරු දක්වා ඇත.)

මෙහි **කාමරාගානුසය** නම් කාම වස්තූන් කෙරෙහි ආශා කිරීමට සමර්ථවූ තෘෂ්ණා බීජධාතුවයි. **භවරාගානුසය** නම් මහද්ගත කුසල් හා එම විපාකයන් කෙරෙහි ආශා කිරීමට සමර්ථවූ තෘෂ්ණා බීජධාතුවයි. මේ දෙනන්හිම ඇති කාම-භව නම්න් හඳුන්වා ඇත්තේ දශකෙලෙසයන් අතුරෙහිවූ **ලෝභයයි.**

දෙවෂ බීජධාතුව (දෙසය) **පටිඝානුසය** නම්. මානබීජධාතුව (මානය) **මානානුසය** නම්. දිට්ඨි බීජධාතුව (දිටඨිය) **දිට්ඨානුසය** නම්. විචිකිච්ඡා බීජධාතුව **විචිකිච්ඡානුසය** නම්. අවිජ්ජා බීජධාතුව (මොහය) **අවිජ්ජානුසය** නම්.

මෙහි දැක්වූ අනුසය ඛම් සය අතුරෙන් දිට්ඨානුසය-විචිකිච්ඡානුසය යන දෙදෙනා සෝවාන් මගින් නිරවශෙෂයෙන් ප්‍රහීනවෙති. පටිඝානුසය අනාගාම් මගින් ප්‍රහීනවේ. සෙසු ලොභානුසය-මානානුසය-අවිජ්ජානුසය යන අනුසයෝ රහත් මගින් ප්‍රහීනවෙති.

———:———

සංයොජන 10

කාමරාග-දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස-පටිඝ-රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන මොව්හු දශ සංයෝජනයෝ වෙති,

සත්වයන් සංසාරයෙහි (සංයොජනීය වස්තූන් හා) බැඳිමට උපකාර වන යොත් වැනි අකුශල ධම්යන්ට සංයොජන යන නම ලැබේ. ඔවිහු නම් දිට්ඨි-විචිකිච්ඡා ආදීහු වෙති. (රූපාදී ආරම්මණයෝ සංයෝජනීය ධම්යෝ වෙති.)

කාමරාග සංයොජනය නම් සත්වයන් සංසාරයෙහි කාම වස්තූන් හා බැඳ තැබීමට උපකාරවන කාම තෘෂ්ණාවය-දශකෙලෙශයන් අතුරෙහි වූ **ලොභයයි**. දිට්ඨි-විචිකිච්ඡා ආදී කෙලෙශයෝම සංයොජන නමින් හඳුන්වනු ලැබෙත්. දශ කෙලෙශයන් අතුරෙහිවූ ලොභ-දෙස-මොහ-මාන-දිට්ඨි-විචිකිච්ඡා-උද්ධච්ච යන කෙලෙශයෝ මෙහි ඇතුළත් වෙති.

මොවුනතුරෙන් දිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස යන සංයෝජනයෝ සෝවාන් මගින්ද; කාමරාග-පටිඝ යන සංයෝජනයෝ අනාගාම් මගින්ද; රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන සංයෝජනයෝ රහත් මගින්ද ප්‍රහීන වෙත්.

අනාගාමී ඵලයත්හිදී ප්‍රහීනවන සිත් පිළිබඳවද දත යුතුවෙයි. ප්‍රභෝකත ලොභ-දෙස-මෝහාදී අකුශල් චෛතසිකයන් (කෙලෙසුන්) යෙදෙන සිත්ද ලොභ මූලික, දෙස මූලික, මොහ මූලික යනුවෙන් ත්‍රිවිධ වෙත්. එහි ලොභ මූලික සිත් 8 ක්ද, දෙස මූලික සිත් 2 ක්ද, මොහ මූලික සිත් 2 ක්ද ඇත. මේ සිත් සියල්ලම පාප සිත්ය.

දෙළොස් අකුසල් සිත් නම්

ලොභ මූලික සිත් 8

සොමනස්ස	සහගතං	දිට්ඨිගත	සම්පයුත්තං	අසඞ්ඛාරික චිත්තං
,,	,,	,,	,,	සසඞ්ඛාරික ,,
,,	,,	දිට්ඨිගත	විප්පයුත්තං	අසඞ්ඛාරික ,,
,,	,,	,,	,,	සසඞ්ඛාරික ,,
උපෙක්ඛා	සහගතං	දිට්ඨිගත	සම්පයුත්තං	අසඞ්ඛාරික ,,
,,	,,	,,	,,	සසඞ්ඛාරික ,,
,,	,,	දිට්ඨිගත	විප්පයුත්තං	අසඞ්ඛාරික ,,
,,	,,	,,	,,	සසඞ්ඛාරික ,,

දෝස මූලික සිත් 2

දෞමනස්ස	සහගතං	පටිඝ	සම්පයුත්තං	අසඞ්ඛාරික ,,
,,	,,	,,	,,	සසඞ්ඛාරික ,,

මොහ මූලික සිත් 2

උපෙක්ඛා	සහගතං	විචිකිච්ඡා	සම්පයුත්තං	,,
,,	,,	උද්ධච්ච	,,	,,

මෙකී දෙළොස් (12) අකුසල් සිත් අතුරෙන් **දිට්ඨිගත සම්පයුත්ත සිත්** සතරය; **විචිකිච්ඡා සහගත** සිතය යන සිත් පහ **සම්පූර්ණයෙන්ම** සෝවාන් මාර්ගඥානයෙන් ප්‍රහීනවේ. **දිට්ඨිගත විප්පයුත්ත සිත්** සතරය; දෝසමූලික දෙසිතය යන සිත් සයෙහි අපායගාමී ශක්තිය පමණක් පහකරයි. එකම **උද්ධච්ච සම්පයුත්ත** සිත පිළිබඳ අපායගාමී ශක්තිය පවා සෝවාන් මගින් පහනොකරයි.

සකෘදාගාමී මාර්ගඥානයෙන් කිසිම සිතක් ප්‍රහීන නොකරයි.

අනාගාමී මාර්ගඥානයෙන් දෝසමූලික අකුසල් සිත් දෙක ප්‍රහීනවෙයි.

ඉතිරිවූ සිත් පහ (එනම්:- ලොභමූලික දිට්ඨිගත විප්පයුත්ත **සිත් 4** යි, මොහමූලික උද්ධච්ච සහගත සිත යන **සිත්** (1) සහමූලින්ම රහත් මගින් නැසේ.

මේසේ මේ නයින් සලකන කල් රහත් බැවින් **සියලුම (1500)** කෙලෙස් ප්‍රහීන කිරීමෙන් අනාදිමත් කාලයක සිට පැවතෙන කාම-

රූප-ධම්මපරම්පරාව පිළිබඳ හේතු ප්‍රතීත ඔවදා එහෙයින්ම පුන-රුත්පත්තිය නැතිවන බවද දැක්වෙයි.

සංක්ෂේප වශයෙන් දශයක්වූද; විස්තර වශයෙන් තුදුස (14) ක් වූද; අති විස්තර වශයෙන් 1500 ක් වූද; කෙලෙශයෝම කෙලෙශමාර නම් වෙති.

ගෞතම සිද්ධාර්ථ මහසත්තුමෝ සොතාපත්ති-සකදාගාමී-අනාගාමී-අරහත්ත යන ලොව්තුරු මඟනැණ (මාගඥාන) උපදවා එසින් ක්ලෙශ මාර පරාජය කළහ.

---

iii අභිසඞ්ඛාර මාර

පස්මරුන් අතුරෙහි අභිසඞ්ඛාර මාරයා තුන්වැන්නට ගැණේ. මෙහි **අභිසඞ්ඛාර මාරයා** යනු කවරෙක්දැයි විමසිය යුතුවේ. අභි + සං + පූර්ව "ඛර" ධාතුවෙන් නිපන් අභිසඞ්ඛාර ශබ්දයෙහි "මේ හේතුකොටගෙණ සංස්කරණය වේ, එකතුවේ." යන අර්ථ දෙක ඇතුළත් හෙයින් මෙහි කුශලාකුශල චේතනාවෝ අදහස් කරණු ලබත්. "අනිච්චා නිකඛවෙ සඞ්ඛාරා" "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදී ස්ථානවල යෙදීනිබෙන සඞ්ඛාර ශබ්දය හේතු-ප්‍රත්‍ය යන්නෙන් හටගත් සවිඤ්ඤණක අවිඤ්ඤණක සියලුම සඞ්ඛත ධර්මයන් සඳහා දෙශනා කරණලදී. "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙහිද අභිසඞ්ඛාර මාර යන්නෙහිද සඞ්ඛාර ශබ්දය "කුශලා'කුශල"යන් සඳහා දෙශනාකරණ ලදී. එසිනුත් "චෙතනාහං නිකඛවෙ කම්මං වදාමි" යනුවෙන් වදාළ පරිදි ලෞකික කුශලා'කුශල සිත්වල යෙදෙන **චෙතනා** චෛතසිකය අභිසඞ්ඛාර නම්වේ.

සඞ්ඛාරයන්ගේ ප්‍රභෙද වශයෙන් **පුඤ්ඤාභිසඞ්ඛාර; අපුඤ්ඤාභි සඞ්ඛාර; ආනෙඤ්ජාභි සඞ්ඛාර;** යනුවෙන් ප්‍රධාන ප්‍රභෙද තුනක් වේ. එසින් කාමාවචර (මහා කුසල් සින් අටේ යෙදෙන කුසල චේතනාවෝද; රූපාවචර කුසල් සින් පහේ යෙදෙන කුසල චේතනාවෝද පුඤ්ඤාභි සඞ්ඛාර නම් වෙති.

දෙලොස් අකුසල් සිත්වල යෙදෙන චේතනාවෝ අපුඤ්ඤාභි සඞ්ඛාර නම්වෙති. අරූපාවචර කුසල් සිත්වල යෙදෙන ආවණ්හ වශයෙන් පැවති අරූපාවචර කුසල චේතනාවෝ (කොසජ්ජාදීන්-ගෙන් කම්පා නොවන හෙයින්) ආනෙඤ්ජාභි සඞ්ඛාර නම් වෙත්. (එකම "චේතනා" චෛතසිකය අවස්ථා ප්‍රභේද වශයෙන් මේසේ නම් ලබයි.)

තවද මෙකී අකුශල චේතනාවෝද කාමාවචර කුසල චේතනා-වෝද කායද්වාරයෙහි කායික වශයෙන්-කාය විඤ්ඤත්ති වශයෙන් සිදුවන හෙයින් "කාය සඞ්ඛාර" නමිද; මේ සම්විසි චේතනාවෝම වාග් විඤ්ඤත්තිය උපදවා වාග් ද්වාරයෙහිද පවත්නා හෙයින් "වචීසඞ්ඛාර" නම්ද වෙති.

අටවැදෑරුම් කාමාවචර චේතනාවෝද; දෙලොස් අකුසල චේතනාවෝද; පස්වැදෑරුම් රූපාවචර හා සිවුවැදෑරුම් අරූපාවචර කුසල චේතනාවෝද යන එකුන්තිස් (29) චේතනාවෝ මනෝද්වා-රයෙහිද පවත්නා හෙයින් "චිත්තසඞ්ඛාර" නම් වෙත්.

"සබ්බේ සඞ්ඛාරා අනිච්චා" ආදී වශයෙන් දක්වනලද සඞ්ඛාර නම් ප්‍රත්‍යයෙන් සංස්කරණය වනු ලබන "සඞ්ඛත" ධර්මයෝයි.

කාම-රූප-අරූප සඞ්ඛ්‍යාතවූ ත්‍රෛභූමික රූපා'රූප ධර්මයෝ කර්මයෙන් නිපදවනු ලබන හෙයින් ඔවුහු "අභිසඞ්ඛත සඞ්ඛාර" නම් වෙත්.

ත්‍රෛභූමික කුසලා'කුසල චේතනාවෝම "අභිසඞ්ඛාරණක සඞ්ඛාරයෝ" වෙති. කායික චෛතසික වීර්‍යය "ප්‍රයෝගාභිසඞ්ඛාර" නම්වේ.

මෙසේ බලන කල භවයක්-භවයක් පාසා; උත්පත්ති-ජරා-මරණයන් ඇතිකරවමින් සත්ත්වයා විපතට පත්කරවන හෙයින්ද; දිවා-රාත්‍රී දෙක්හිම නානාප්‍රකාර "කර්මයන්" රැස්කරවන හෙයින්ද: කුසලා'කුසල් සිත්වල යෙදෙන චේතනාව **අභිසඞ්ඛාර මාර** නම්වේ.

ඛන්ධ- ධාතු- ආයතන- ඉන්ද්‍රිය- බල- බොජ්ඣඞ්ගාදී පරමාර්ථ ධර්මයන් නොදත් ලෞකික ජනතෙමේ ජරා-මරණාදී දුඃඛයන්ගෙන් හා රාගාදී ගින්නෙන් පිරුණු පඤ්චස්කන්ධයද; කාම-රූප-අරූප සඞ්ඛ්‍යාත භවත්‍රයද දුක් බව නොසලකයි. අවිද්‍යාවෙන් යුක්තවූ සත්ත්වයා අධ්‍යාත්මිකවූද, බාහිරවූද ලෝකය සැපයක් හැටියට සලකයි. එබඳු 'සැප' ලබනු පිණිසද, තහවුරු කරගැනීම පිණිසද නොයෙක් ලෙසින් ප්‍රයත්න දරයි.

අනුන් නසා හෝ අනුන්ගේ දෙය සොරාගෙණ හෝ අසත්‍ය-වංචාකාර ප්‍රයෝගයන්ගෙන් හෝ තමාගේ සැපය දියුණුකර ගැණීමට වෙහෙසෙයි. අනුන් මැරෙන සැටිද විපතට ගොදුරුවන සැටිද දැක දැකත් අවිද්‍යාව නිසා තමාට එබදු විපතක් කිසි දිනක සිදුවන බව නොසලකා චිසතු කාම කෙලශකාම සඞ්ඛ්‍යාත තෘෂ්ණා-වෙන්ද හරිතව ඉන්ද්‍රියයන් පිණවමින් නානාප්‍රකාර පාපකර්ම කරමින් කල් යවයි. දුකට හේතුව තෘෂ්ණාව බව නොසලකා මතු භවයන්-හිදී මෙයටත් වඩා හොඳින් පස්කම් සුව විඳීමේ අභිලාෂයෙන් "භවගාමී කුසල" යන්ද සිදුකරයි. දෙව්ලෝ- මිනිස්ලෝ- බඹලෝ ආදී තැන්වල ඇති විපරිණාම දුඃඛය නොසලකා දෙවඟණන් ලබන අටියෙන් මරු ප්‍රපාතයකට පැනීමක් මෙන්ද, මැරෙන අටියෙන් ඕෂ කන්නවුන් මෙන්ද, නානාප්‍රකාර පින්කම් හා පව්කම් සිදුකරයි. තවද මංමුළාවී යක්ෂපුරය කරා යන්නවුන් මෙන් රූපී-අරූපී ලෝකයන් සදකුලිකයයි සලකමින් එහි උපදිනු පිණිස රූපාවචර-අරූපාවචර කුසල්ලයන්ද රැස්කරයි. පින්පව් වශයෙන් රැස්කරණු ලබන මේ සියල්ල අභිසඞ්ඛාර නම් වෙත්. දුක් සහිතවූ පඤ්චස්-කන්ධය අවිද්‍යාව නිසා සැපයක් ලෙස සලකන අන්ධ පෘථග්ජනයා වතීමහා පඤ්චස්කන්ධය රැකගණු පිණිසද පිණවීම පිණිසද; පවත්වා ගැණීම පිණිසද; නානාප්‍රකාර කෘෂිවණිජ් ආදී කර්මාන්තයන්ද කරන්නේය. ආහාර- පාන- යාන- වාහන-ගෘහ මන්දිර ආදියද රැස්කරන්නේය. පඤ්චස්කන්ධය පිණිස සිදුකරන මේ සියල්ලද දාන-ශීල-භාවණාදී වශයෙන් සිදුකරණු ලබන පින්කම්ද සංස්කාරයෝය.

මේ ලොව සත්වයා නිරතුරුවම කවර නමුත් "කම්" රැස්කරයි. කම් රැස්කර ගන්නේද සිතිනි. මේ ශරීරය ඇසුරු කරගෙණ පවත්නා සිතට ක්ෂණයක් ක්ෂණයක් පාසා ගඟදිය ගලන්නාක් මෙන් වැල නොකැඩී හොඳ හෝ නරක හෝ මධ්‍යස්ථ හෝ සිතුවිලි ගලා එන බව කල්පනාවෙන් සිටිනවිට වැටහෙනවා ඇත. සිත යනුද වැල නොකැඩී ගලගලා එන සිතුවිලි පරම්පරාවමැයි. සිත නැති තැන සිතුවිලි නැතුවා මෙන්ම සිතුවිලි නැති තැන සිතාද නැත. එහෙයින් සිත හා සිතුවිලිද පහළවන්නේ එකවිටය. ඒ සිත්ද ක්ෂණයක් පාසා ඉපද ඉපදී පැවති පැවතී බිඳී බිඳී යන සිත් පරම්පරාවෝය. සිතට නැගෙණ සිතුවිලි මිනිසා දෙමහකින් පිට කරයි. සිතුවිලි වචනවලට පෙරළී මුඛයෙන්ද; අත් පා හිස ආදී අඞ්ග ඵලකයන්ගෙන්ද පිටකරයි. සිතීමද කර්මයකි. එය "මානසික කර්ම නම්. කථා කිරීමත් කර්මයකි. එය 'වාචසික කර්ම නම්. අඞ්ග

චලනයත් කර්මයකි. එය "කායික කර්ම" නම්. මිනිසා කථාකළත් නොකළත්: යාම්-ඒම් ආදී ඉරියව් නොපැවැත්වුවත්, සිතුවිලි හටගැණීම නොනැවතී සිදුවෙයි. කථාව හා ඉරියව් නැවැත්වුවත් සිතුවිලි පරම්පරාව නොනැවතී ගමන් කරයි. මෙසේ ඔලනකල මිනිසා නිරතුරුවම "කර්ම" රැස්කරන බව පැහැදිලි වනවා ඇත. අතීත් මාගීඥනයෙන් සම්පූර්ණයෙන්ම කෙළෙස් නැසූ උතුමන්ට මෙබඳු කර්ම රැස් නොවේ. අතීතය පිළිබඳ **අනුස්මරණයක්** හෝ; අනාගතය පිළිබඳ ප්‍රාර්ථණයක් හෝ නැති බුදු-පසේබුදු-රහත් යන උතුමන්ට අභිසඩ්ඛාරයෝ නැත. වර්තමාන භවය පවත්නා තාක් හුදු "**ක්‍රියා**" මාත්‍රයෝම වෙති.

ලොව ඇති විචිත්‍රතම වස්තුව නම් "සිත" ය. ලෝකය විචිත්‍ර වන්නේද සිතේ විචිත්‍රකම නිසාය. සවිඤ්ඤාණක සියලුම සත්වයන්ට සිතක් ඇතත් සවකීය නෝ පරකීය (අනුන් පිළිබඳ සිත දකිනු නොහැකි නිසා සිතේ ආශ්චර්යජනකම වඩාත් ප්‍රකට වෙයි. ලොව ඇති සියලුම දේ ඇසට පෙනෙනතත් තමාගේ මුහුණ ඇසට නොපෙනෙන්නාසේ සිතද යිසිවෙකුට නොදැක්ක හැකියි. ප්‍රත්‍යක්ෂයෙන් **දැකිය** හැකි දෙය පිළිබඳවම පමණක් විශ්වාසය තබන ඇතැම් නවීන විද්‍යව උගත්හෝ අප්‍රත්‍යක්ෂ සිත පිළිබඳව කුමක් කියද්ද? • **ආත්ම ලක්ෂණය; පුද්ගල රූපවිල්ල** ආදී සිත පිළිබඳ විවරණය කරණ **ඇතැම් පණ්ඩිතමානී** උඩුවව හරිත පුද්ගලයෝ මහා පඬුවන් මෙන් **ඥානයක්** ප්‍රලාපයන්ද දෙඛති. ආකාශයේ ගැසෙරෙන ග්‍රහනක්ෂත්‍රාදීන්ගේ පවා ප්‍රතිරූප ගැණීමට හැකි යන්ත්‍රසූත්‍රද; හැතැප්ම දහස් ගණන් ඇත තිබෙන දෙය දැකීමේ ශක්තිය ඇති "දූරෙක්ෂ" වැනි ඡායාරූප යන්ත්‍රද නිපදවා ඇතත් සිත පිළිබඳ ප්‍රතිරූප ගැණීමට හැකි කිසිම යන්ත්‍ර සූත්‍රාදියක් මේ දක්වාම නිපදවා නැත. එබඳු දෙයක් කිසිකලෙක නිපදවනුද නොහැකියි.

අපුඤ්ඤාභි සඩ්ඛාර

දෙලොස් අකුසල් සිත්වල යෙදෙන "චේතනා" අපුඤ්ඤාභි සඩ්ඛාර නමැයි යට දැක්වීමු. එය යෙදෙන සැටිද විමසා බලමු. කුසලයක් හෝ අකුසලයක් සිදුකිරීමට චේතනාවම ප්‍රධානය. චේතනාව යෙදුන කල එහි විපාකදීමේ ශක්තියද ඇතිවෙයි.

දෙලොස් අකුසල් සිත්

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඩ්ඛාරික සිත: 2 සසඩ්ඛාරික සිත; 3 සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඩ්ඛාරික සිත; 4 එම සසඩ්ඛාරික සිත; 5 උපෙක්ඛා සහගත

දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික සිත; 6 එම සසඞ්ඛාරික සිත; 7 උපෙක්ඛා සහගත දිට්ඨිගත විපයුත්ත අසඞ්ඛාරික සිත; 8 එම සඞ්ඛාරික සිත; මේ ලොභ මූලික අකුසල් සිත් 8 යි.

ලොභ සහගත මේ සිත් අතුරෙන් පළමුවන අකුසල් සිත උපදනා අයුරු මෙසේය:- "යදා නත්ථිකාදිමෙසු ආදීනවෝ" ආදීන් දක්වන ලද පරිදි:- පස්කම් විදීමෙහි දෙසක් නැත; දුන් දෙයෙහි විපාක නැත; සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ විපාක නැත; මව් නැත' පියා නැත; මෙලොව නැත; පරලොව නැත; ඔපපාතික සත්වයෝ නැත; මෙකාසේ පිළිපන් මහණ බමුණෝ නැත; යනාදී නියත මිථ්‍යා-දෘෂ්ටියෙන් පෙරළනාවූ සිත් ඇතිව තමාගේ සවභාව කල්පනාවෙන්ම සෝමනස් සහගතව සතුටින් පස්කම් සැප අනුභව කරමින් දිට්ඨ-මඞ්ගල-සුතමඞ්ගල-මුත මඞ්ගලාදී මඞ්ගලයක් ගණිමින් කර්මවිපාක-යෙන් තොරව නක්ෂත්‍ර මුහුතාදිය හා ග්‍රහයින්ගේ බලයෙන් මේ මේ දේ සිදුවේය යනාදී වශයෙන් දෘෂ්ටි ගැණීමක් වේද; ඒ ආදී අවස්ථා-' වන්හි "සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික; (ලොභ මූලික) අකුසල් සිත උපදනේය. අකුසල් හා කුසල් සිදු වන්නේ සිත මූලික කොටගෙන කාය-වාග් දෙකේද ආධාර ඇතුවයි හුදු මානස්ක කර්ම ඇතිබව අමතක කළයුතු නොවේ. මෙහිදී යෙදෙන **ප්‍රථම අකුසල චිත්තය** යෙදෙන අයුරු 'චිත්තවීථි"යකින් දක්වමු.

අ: භ	–	භ: ව	–	භ: ල	–	ම
000		000		000		000

ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ
000	000	000	000	000	000	000
19	19	19	19	19	19	19

ත	ත	ත	ත	ත	ත
000	000	000	000.	000	000

මෙහි කුඩා චිත්තක්ෂණ තුණ බැගින් ඇති මහා චිත්තක්ෂණ 17 කින් පරිමිතවූ මේ චිත්තවීථිය මනොද්වාරික වෙයි. මේහි කුඩා තිත්වලින් අදුන්වන්නේ උත්පාද-ස්ථිති-භඞ්ග යන කුඩා ක්ෂණත්‍ර-යකින් යුත් මහා චිත්ත ක්ෂණයකි. එබඳු මහා චිත්තක්ෂණ 17 කින් චිත්තවීථිය අවසන් වෙයි. එහි අතීත භවඞ්ග-භවඞ්ග චලන-භවඞ්ගුවෙජ්ද-මනොද්වාරාවජ්ජන යන චිත්තෝත්පාදයන්ගෙන් අනතුරුව ප්‍රථම ලොභ මූලික අකුසල් සිත ජවන නමින් සත්වරක්ද

අනතුරුව තදුලම්බන සිත් දෙකකට පසුව භවඔග සිත් සතරක්ද පහළ්ව නිරුද්ධවීමෙන් පසුව චිත්තවීථිය අවසන්වෙයි. මෙහි එක එක ජවන් සිතක වෛතසික 19 බැගින් යෙදෙන හෙයින් ජවන් සිත් යටින් 19 යොදා ඇත. තවද මේ එක එක ජවන් සිතක:- ඵස්ස-වේදනා-සඤ්ඤා-චේතනා-මනසිකාර ජීවිතින්ද්‍රිය- එකග්ගතා-චිත්තක්ක විචාර-අධිමොක්ඛ-විරිය-පීති-ඡන්ද- ලොභ- දිට්ඨි- මෝහ-උද්ධච්ච-අහිරික-අනොත්තප්පය යන මේ වෛතසික ඒ ජවන් සිත්වල යෙදෙන වෛතසිකයෝය. ලොභ මූලික සෙසු **සිත් පිළිබඳව** යෙදෙන **චිත්තවීථිද මේ චිත්තවීථිය ලෙසමැයි.**

1 යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොමනස්ස සහගතව** අකුශලයක් කිරීම වරදක් නැතැයි **දිට්ඨිගත සම්පයුත්තව** අනුන්ගේ මෙහෙයවීමක් නැතුව ඉබේම වගේ උපදනා තියුණු **අසඞ්ඛාරික** සිතින් සොරකම; කාමමිථ්‍යාචාරය; බොරු කීම; කේලාම් කීම; ප්‍රල ප වචන කීම; අන්සතු දෙයට ආසාකිරීම; මිථ්‍යා අදහස් ඇතිකර ගැනීම; යන මේ අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරසිද ඔහුට මේ ලොභ මූලික ප්‍රථම අකුසල් සිත උපදී. චිත්තවීථියේ ජවන් නමින් යොදා ඇත්තේ මේ ප්‍රථම අකුසල් සිතය. **මෙහි යෙදෙන වෛතසික 19 අතුරෙන් චෙතනා** වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම ලබයි.

2 **මේ** අකුසල් සතම අනුන්ගේ මෙහෙයවීමෙන් සිදුකරන්නා දෙවෙනි ලොභ මූලික **සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික** සිත උපදී. එහි චිත්තවීථියද මෙලෙසමැයි. යෙදෙන වෛතසික ගණන විසි එක (21) යි. එහි යෙදෙන චේතනා වෛතසිකය "අභිසඞ්ඛාර" නම ලබයි.

3 යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොමනස්ස සහගතව** මිථ්‍යා අදහස් නැතිව **දිට්ඨිගත විප්පයුත්තව** අනුන්ගේ මෙහෙයවීමක් නැතිව **අසඞ්ඛාරික** සිතින් සොරකම ආදී අකුසල් සයක් (මිථ්‍යාදෘෂ්ටිය නැත) සිදුකරසිද; එහිදී ඔහුට තුන්වන ලොභ සහගත සිත උපදී. චිත්ත වීථියද පෙර ලෙසමැයි. යෙදෙන වෛතසික ගණන එකුන් විස්ස (19) යි. එහි යෙදෙන වේතනා වෛතසිකය "අභිසඞ්ඛාර" නම ලබයි.

4 යමෙක් ඉෂ්ට අරමුණක් ලැබීම නිසා **සොමනස්ස සහගතව** මිථ්‍යා අදහස් නොමැතිව **දිට්ඨිගත විප්පයුත්තව** අනුන්ගේ මෙහෙයවීමක් ඇතිව **සසඞ්ඛාරික** සිතින් සොරකම ආදී අකුසල සයෙන් (මිථ්‍යාදෘෂ්ටිය හැර, යම්කිසි අකුසලයක් කරසිද එකල ඔහුට

සිදුවන ලොභ සහගත සිත උපදී. චිත්තවීථිය පෙරලෙසමැයි. එහි වෛතසික විසි එක (21) ක් යෙදෙයි. එයින් චේතනා වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම් ලබයි.

5 යමෙක් මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යා අදහස් සහිතවූ **දිට්ඨිගත සම්පයුත්තව** අනුන්ගේ මෙහෙය වීමක් නැති **අසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල සතෙන් එකක් කරයිද එකල ඔහට පස්වැනි ලොභ සිත උපදී. ඉහතකී චිත්තවීථියද එහි යෙදෙන වේතනා වෛතසිකයද පෙර ලෙසමැයි. එහි වෛතසික අටළොස (18) ක් යෙදෙයි. වේතනා වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම් ලබයි.

6 යමෙක් මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යා අදහස් නිසා **දිට්ඨිගත සම්පයුත්තව** අනුන්ගේ මෙහෙය වීමක් ඇති **සසඞ්ඛාරික** සිතින් සොරකම් ආදී අකුසල සතෙන් යම්කිසිවක් කරයිද එකල ඔහට සවැනි ලොභ සහගත සිත උපදී. චිත්තවීථිය පෙරලේමැයි. එහි වෛතසික විස්ස (20) ක් යෙදෙයි. වේතනා වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම් ලබයි.

7 යමෙක් මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යාදෘෂ්ටි අදහස් නැති නිසා **දිට්ඨිගත විප්පයුත්තව** මෙහෙය වීමක් නැතිව ඉඹීම වගේ තියුණුවූ **අසඞ්ඛාරික** සිතින් හොරකම් ආදී අකුසල සතෙන් (මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇතිකර ගැණීම හැර) යම් අකුසලයක් කරයිද ඔහුට එකල සත්වැනි ලොභ සිත උපදී. චිත්තවීථිය පෙර ලෙසමැයි. වෛතසික අටළොස (18) ක් යෙදෙයි. වේතනා වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම් ලබයි.

8 යමෙක් මධ්‍යස්ථ අරමුණක් ලැබීම නිසා **උපෙක්ඛා සහගතව** මිථ්‍යා අදහස් නැති නිසා **දිට්ඨිගත විප්පයුත්තව** මෙහෙය වීමක් ඇති **සසඞ්ඛාරික** සිතින් හොරකම් ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයිද එකල ඔහට අවවැනි ලොභ සහගත සිත උපදී. වීථිය පෙරලේමැයි. වෛතසික ගණන විස්ස (20) යි. එහි වේතනා වෛතසිකය **"අභිසඞ්ඛාර"** නම් ලබයි.

විශෙෂයක්:—මෙහි දැක්වූ හොරකම්-කාමමිථ්‍යාචාරය-බොරු කීම-කේළාම් කීම-ප්‍රලාප වචන කීම-අන්සතු දේට ආසා කිරීම-මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇතිකර ගැණීම යන අකුසල සතම දිට්ඨිගත සම්පයුත්ත සිත් සතරෙන්ම සිදුකළ හැකි හෙයින් එහි ලොභ මූලික සිත් 28 ක් ලැබේ. මිථ්‍යාදෘෂ්ටි අදහස් ඇතිකර නොගෙණ

සෙසු අකුසල් සය දිටඨිගත විපපයුත්ත සිත් සතරෙන් සිදුවන හෙයින් සිත් 24 ක් ලැබේ. එසේවූවිට ලොභ මූලික සිත් 52 ක් ලැබේ. එය අතීත-වර්තමාන-අනාගත යන කාල තුනින් වැඩකළ විට සිත් 156 ක් ලැබේ. රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-ධර්ම යන සයෙන් ගුණකළවිට සිත් 936 ක් වේ. නැවත එය අධ්‍යාත්ම-බාහ්‍ය සන්තාන දෙකින් ගුණකළවිට සිත් 1972 ක් වේ.

දෙස මූලික අකුසල් 2 යි.

1 **දෞමනස්ස සහගතපටිඝ සම්පයුත්ත අසඞ්ඛාරික සිත,** 2 **එම සසඞ්ඛාරික සිත,** යන සිත් දෙකේ යෙදෙන චෙතනා චෛතසිකයද **අභිසඞ්ඛාර** නම් ලබයි.

යමෙක්; අනිෂ්ට තමන් නොකැමැති) අරමුණක් ලැබී සිත දුක්වීමෙන් **දෞර්මනස්ස සහගතව**; සැඩ ගති ඇති හෙයින් **පටිඝ සම්පයුත්තව**. මෙහෙයීමක් නැතිව ඉබේම වගේ උපදනා නිසුණු **අසඞ්ඛාරික** සිතින් සතුන් මැරීම, නොරකම් කිරීම, බොරු කීම, කේළාම් කීම, පරුෂ වචන කීම, නිෂ්ඵල වචන කීම; ව්‍යාපාදය; යන අකුසල සතින් එකක් කරයිද එකල ඕහට පළමුවන දෙස මූලික සිත පහළවේ. එහිදීද චිත්තවීථියක් ඇතිවී එය කම්පථ වශයෙන් බැඳේ.

චිත්තවීථිය:—

අ-භ	භ-ච	භ-ඵ	ම
000	000	000	000

ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ
000	000	000	000	000	000	000
20	20	20	20	20	20	20

ත	ත	භ	භ	භ	භ
000	000	000	000	000	000

මෙහිදී අතීත භවඞ්ග; භවඞ්ග චලන; භවඞ්ගුච්ඡේද; මනෝ-ද්වාරාවජ්ජන; යන චිත්තෝත්පාදයන්ගෙන් අනතුරුව දෙස **මූලික** පළමුවෙනි සිතු 7 වරක් **ජවන්** වශයෙන් පහළවී නිරුද්ධවෙයි. මෙහි ජවන් සිතට යටින් 20 බැගින් යෙදී, ඇත්තේ එක ජවන් සිතක චෛතසික 20 බැගින් යෙදෙන බව දැක්වීමටය. එසස-

ඵවේදනා- සඤ්ඤා- චේතනා- මනසිකාර- ජීවිතින්ද්‍රිය- එකග්ගතා- විතක්ක-විචාර-අධිමොක්ඛ-විරිය- ඡන්ද- යන චෛතසිකද මොහ-අහිරික-අනොත්තප්ප- උද්ධච්ච - දෝස- ඉස්සා- මච්ඡරිය- කුක්කුච්ච. යන චෛතසිකද එකතුව 20 චෛතසිකයෝ මේ සිතෙහි යෙදෙති. මෙහි යෙදෙන චේතනා චෛතසිකය **"අහිසඞ්ඛාර"** නම ලබයි.

යමෙක් අනිෂ්ට අරමුණක් ලැබී සිත දුක්විමෙන් **දෞමනස්ස සහගතව** සැඩගති ඇතිවීමෙන් **පටිඝ සම්පයුත්තව** මෙහෙයීමක් ඇතිව මෝචවූ **සසඞ්ඛාරික** සිතින් සතුන් මැරීම ආදී අකුසල් සතෙන් යම්කිසි අකුසලයක් කරයිද; එකල ඕහට දෙවෙනි දෝස මූලික සිත පහළවෙයි. එහිදී චිත්තවීථියක් පෙර ලෙසින් ඇති වෙයි. මනෝද්වාරාවජ්ජන සිතට අනතුරුව මේ දෝස මූලික ජවන සිත 7 වරක් ජවන නමින් පහළවී නිරුද්ධවෙයි. එහි යටකී චෛතසික විස්ස සමග ථීන-මිද්ධ දෙකද එකතුව දෙවිසි (22) චෛතසිකයෝ ඉපද නිරුද්ධවී කර්මපථ වශයෙන් බලවත් වෙති. එහි යෙදෙන චේතනා චෛතසිකය **"අහිසඞ්ඛාර"** නම ලබයි.

දෝස මූලික සිත් දෙකින් ප්‍රාණඝාතාදී අකුසල් සතම සිදුකළ හැකි හෙයින් දෝසමූලික අකුසල් සිත් 14 ක්වේ. එය අතීත-වර්තමාන-අනාගත යන කාලත්‍රයෙන් ගුණකළ විට 52 ක්වේ. එය තැවත රූප-සද්ද- ගන්ධ- රස- පොට්ඨබ්බ- ධම්ම යන ආරම්මණ සයෙන් ගුණකළවිට 312 ක් ලැබේ. තැවත අජ්ඣත්ත-බාහිර දෙකින් ගුණකළවිට 624 ක් ලැබේ. නගර-ජනපද ආදීන් වශයෙන් වැඩිකළ කල්හි අනන්ත වන්නේය.

මොහ මූලික අකුසල් සිත් 2 යි

1 උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත සිත; 2 උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත සිත; යන මේ සිත් දෙක්හි යෙදෙන චේතනා චෛතසිකය **"අහිසඞ්ඛාර"** නම ලබයි.

1 යමෙක්; බලවත් මෝහයෙන් මුළාවීමෙන් **උපෙක්ඛා සහගතව** ධර්මය නුගත්කම ආදිය නිසා **විචිකිච්ඡා සම්පයුත්තව** ඉඳිමේ වාගේ උපදනා සිතින් බුද්ධාදී ගුණුරු අරමුණෙහි සැක කරයිද එකල ඕහට පළමුවැනි මෝහ සිත උපදී. එහිදී

"චිත්තඝීටිය" යෙදෙන අයුරු:—

අ-හ	ඟ-ච	ඟ-ළ	ම
000	000	000	000

ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ
000	000	000	000	000	000	000
15	15	15	15	15	15	15

ත	ත	හ	හ	හ	හ
000	000	000	000	000	000

මෙහිදී මනොද්වාරාවජ්ජනයට අනතුරුව පළමුවෙනි මොහ මූලික සිත 7 වරක් ජවන නමින් පහළවන බව පෙනේ. මෙහි ජවන් සිතක; ඵස්ස- වෙදනා- සඤ්ඤා- චෙතනා- මනසිකාර- ජීවිතින්ද්‍රිය- එකග්ගතා- විතක්ක- විචාර- අධිමොක්ඛ- විරිය- මොහ- අහිරික- අනොත්තප්ප- උද්ධච්ච යන පසළොස් චෛතසිකයෝ යෙදෙති. මෙහි යෙදෙන චෙතනා චෛතසිකය "අභිසඞ්ඛාර" නම් ලබයි.

2 යමෙක්; පෙරසේම උපෙක්ඛා සහගතව **උද්ධච්ච සම්පයුත්තව** යම්කිසි අකුසලයක් කරයිද; එහිදී දෙවෙනි මොහ මූලික අකුසල් සිත පහළවෙයි. එහි චිත්තඝීටියද චෛතසික ගණනද පෙරසේමැයි. මේ සිත්වල යෙදෙන චෙතනා චෛතසිකය "අභිසඞ්ඛාර" නම්වේ.

සැලකිය යුත්තක්:—මොහ මූලික සිත් දෙකින් දශඅකුශලයම සිදුවන හෙයින් මොහ මූලික සිත් 20 ක් ලැබේ. එය කාලත්‍රයෙන් ගුණකළ කල්හි සැටක්ද; නැවත එය ෂඩාලම්බනයෙන් ගුණකළ කල්හි තුන්සිය සැට (360) ක්ද: අජ්ඣත්ත බාහිර වශයෙන් එය ගුණකළවිට සත්සිය විස්ස (720) ක්ද ලැබෙන බව දත යුතුයි. නගර ජනපදාදීන් වශයෙන් ගුණකළ කල්හි අනන්ත වන්නේය.

සියලුම අකුසලයන් පිළිබඳව ලොභ-දෙස-මොහ යන තුන "හේතු" වෙයි. ලොභ-මොහ දෙක හා; දෙස-මොහ දෙක මුල් වීමෙන්ද හුදු මොහය මුල් වීමෙන්ද අකුසල් සිදුවන බව දැක්වේ, එහෙයින් නැවත නැවත භවයෙහි පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත අඞ්කුරය හටගැනීමට **මොහය ගොඩියෙකු මෙන් මූලික වෙයි. මුල් ජවන් සය හා එක්ව යෙදෙන චෙතනා චෛතසිකයෝ සදෙන කෙත මෙනි. සත්වෙනි ජවනය හා එක්ව යෙදෙන චෙතනා චෛතසිකය බිජුවට මෙනි, ජවන් සිත සමගම යෙදෙන තෘෂ්ණාව ජලය මෙනි.** (තෘෂ්ණා ග්‍රහණයෙන් උපාදානයද ගැණේ.) මේ

මොහ-චෙතනා-තණ්හා-උපාදාන යන ධර්ම එකම චිත්තචීථියක එකෙණෙහිම යෙදෙන අතර සෙසු චීථියින් මෙකී ධර්ම සතරට ඒ ක්ෂණයෙහි සහජාත-අඤ්ඤමඤ්ඤ-හෙතු-උපනිස්සය ආදී වශයෙන් උපකාරවත බවද ඔවුන්ගේ උපකාරයෙන් චෙතනා චෛතසිකය වඩාත් බලවත් වන බවද දැක්වෙයි. එය චෙතනා බිජුවටය ඇතැ තොවී පැලවීම පිණිස කරණු ලබන අවිගැස්වීම් පෙලීම් බොල්හැරීම් දුම්දීම් ආදී සංස්කාර මෙනැසිද දතයුතුයි. එහෙයින් අභිසඞ්ඛාර සඞ්ඛ්‍යාත චෙතනා බිජුවටයෙන් පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත අඹැරය පැලවෙන බවද දැක්වේ.

කම් නැමති කුඹුරේ-සෙසින් බිජුවට නොහැරේ
අවිදු කස වපුරේ-උපදි නණ පින් මෙහෙද අකුරේ.

(කාව්‍යශෙඛරය)

"පුඤ්ඤානි සඞ්ඛාර"

"පුඤ්ඤ" යනු පින්ය. "කුසල්" ය්නුද නම්. නුවණින් යුක්තව කරණු ලබන නිසාද; කරණු ලබන වේලාවෙත් විපාක විඳින විටත්; ප්‍රිතිය ඇතිවන නිසාද දනාදීහු කුශල් නම් වෙති. ප්‍රාණඝාතාදී අකුශලයන්ද ප්‍රිතියෙන් කරතත් එය මොහයෙන් වැසීගිය නිසා දුක් විපාක උපදවයි. අකුසල් නිසා දුගතියෙහි දුක්ද කුශල් නිසා සුගතියෙහි සැපද ලැබෙන අතර දෙයාකාරයෙන්ම භවය දික්වීමට හේතු නිසා කුශලා'කුශලාදීහු අභිසඞ්ඛාර නම ලබන බවද දතයුතුයි. කුශලයෝද කාමාවචර-රූපාවචර-අරූපාවචර වශයෙන් ත්‍රිවිධයි. එයින් කාමාවචර-රූපාවචර කුශලයෝ "පුඤ්ඤානි සඞ්ඛාර" නමිද; අරූපාවචර කුශල්යෝ "ආනෙඤ්ජානි සඞ්ඛාර" නමිද ලබන බව මුලින් දැක්වීමු. පරමාර්ථ වශයෙන් කාමාවචර මහා කුශල් සිත් අටේද; රූපාවචර කුශල් සිත් පහේද යෙදෙන චෙතනාව පුඤ්ඤානි සඞ්ඛාර නම්වේ.

කාමාවචර කුසල් සිත් 8

1 සොම්නස් සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත හා 2 එම සසඞ්ඛාරික සිත; 3 සොම්නස් සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත හා 4 එම සසඞ්ඛාරික සිත; 5 උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික සිත හා 6 එම සසඞ්ඛාරික සිත; 7 උපෙක්ඛා සහගත ඤාණවිප්පයුත්ත අසඞ්ඛාරික සිත හා 8 එම සසඞ්ඛාරික සිත; යන මොවුහු කාමාවචර කුශල් සිත් 8 දෙනා වෙත්.

සිත් උපදින ක්‍රමය:— 1 ගමෙක්; දැන වසතු ප්‍රතිග්‍රාහක සම්පත් ආදී ඉෂ්ට අරමුණක් ලැබීමෙන් **සොමනස්ස සහගතව** කම්පල සැලකීම් ආදිය නිසා **ඤාණසම්පයුත්තව** පින්කොට පුරුද්ද ඇති නිසා ඉඛේටම වගේ උපදනා තියුණුවූ **අසඞ්ඛාරික සිතින්** මල් පහන් පිදීම, දන්දීම, සිල්රැකීම ආදී පිනක් කරයිද; ඔහුට එකල ප්‍රථම කාමාවචර මහා කුසල් සිත පහළ වන්නේය, මෙහිදී ප්‍රථමයෙන්ම **පඤ්චද්වාරික චිත්තවීථියක්** පහළවී අනතුරුව තදනුවත්තක මනොද්වාර චිත්තවීථි දෙකක් ඉපිද නිරුද්ධවීමෙන් පසුව **අජ්ඣාසාධක මනොද්වාරික චිත්තවීථිය** පහළවී ප්‍රතිසන්ධි විපාක-ප්‍රවෘත්ති විපාක යන දෙයාකාර විපාක දීමට සමත් ලෙසින් බලවත් වෙයි.

පඤ්චද්වාරික චිත්තවීථිය:— මල් පහන් පිදීමකදී නම් ඵුදන මල් පහන් දැකීම නිසා හෝ; ඛාදු වෛත්‍ය දැකීම නිසා හෝ; නැතහොත් දන පරිත්‍යාගයකදී නම් දනවසතු ප්‍රතිග්‍රාහක ආදීන් දැකීම නිසා හෝ; භවඞ්ග සිත චලනය වෙමින් චිත්තවීථිය ආරම්භ වෙයි.

ආඵුදු අරමුණු වලට සිත යොමුනොවී සාමාන්‍යයෙන් සිත්සතන් පුරාම **භවඞ්ග** යයි කියනු ලැබේ. සිතක් පවත්නේ අරමුණින් ඇතිවීමය. පඤ්චද්වාරික- මනොද්වාරික අරමුණුවලින් ඇතිවූ පුරුද්ද විඤ්ඤාණවීථිවල භවඞ්ගයයි දතයුතුයි. පඤ්චද්වාරය පැවැත්මට හේතුවන්නේ මේ භවඞ්ග චිත්තසන්තතියයි. සිහින නොපෙනී නිදන් නිදන අවස්ථාවේදී අපට බොහෝ භවඞ්ග සිත් පරම්පරා ඇතිවේ. භවඞ්ග සිත් නොමැති නම් පඤ්චද්වාරික-මනොද්වාරික අරමුණු නොමැති විටක කිසි සිතක් නූපදිය යුතුයි. සිතක් නැතිකල චෛතසිකයෝද (වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර) නොලැබෙති. එකල හුදු රූපසන්තතිය පමණක් ලැබිය යුතුවෙයි. එවිට "සත්ත" සන්තතියක්ද නැත. රූපයක් ඇසට හමුවූවිට චලනය වන්නේ සන්තානගතව පවත්නා මේ භවඞ්ග චිත්ත සන්තතියයි.

ඒ සිත් සතන් චලනය වීමත් සමගම එක් චිත්තක්ෂණයක් ඉක්මයයි. එයට **අතීත භවඞ්ග** යයි කියනු ලැබේ. අනතුරුව **භවඞ්ගචලන** නමින් එක් චිත්තවාරයක් ඉක්මයාමට අනතුරුව භවඞ්ග සන්තතිය සිදෙමින් **භවඞ්ගුපච්ඡේද** නම් චිත්තක්ෂණයක් ඉපද නිරුද්ධවීමෙන් පසුව වර්තමානික රූපාරම්මණය කරා සිත අවනත වෙයි. වේගයෙන් දුවන සිත වහා නොසිඳිය හැකි බැවින් එකම භවඞ්ග සිත මෙලෙසින් තෙවරක් උපදී. වේගයෙන් දුවන

රථයක් වහා නොනැවතී මදක් දුර ගොස් නවතින්නාක් මෙනි. භවඞ්ගුපච්ඡේද සිතට අනතුරුව හමුවූ අරමුණ පිළිගැණීම වශයෙන් දෙර හරනාක්මෙන් **පඤ්චද්වාරාවජ්ජන සිත** උපදී. ඒ රූපය දකිමින් ඉක්බිති **දස්සන** හෙවත් චක්ඛුවිඤ්ඤාණ සිත උපදී. ඊට පසු ඇසින් දුටු රූපය ඇතුළතට පිළිගනිමින් **සම්පටිච්ඡන සිතද**; රූපය නිශ්චය කරමින් **සන්තීරණ** සිතද ඉපද නිරුද්ධ වෙයි. ඒ අනතුරුවම ඒ අරමුණ හොඳ හෝ නරක අතට නියම වශයෙන්ම නිශ්චය කර ගනිමින් **වොට්ඨපන** නම් සිත උපදී. ඉක්බිති කුසලා **කුසලයන්** පිළිබඳ ප්‍රධාන අවස්ථාවන **ජවන්** නම් සිත් සත්වරක් උපදී. ' [මේ ජවන අවස්ථාවෙහිදීම ඇතිවන සිත් කුශලා කුශල කම් වශයෙන් සලකනු ලැබේ.] මෙහිදී දැන වස්තු ප්‍රතිග්‍රාහක ආදීන් දැක සොම්නස් සහගතවූ; ඤාණසම්පයුත්තවූ අසඞ්ඛාරික මහා කුසල් සිත 7 වරක් ජවන වශයෙන් පහළවී නිරුද්ධවූවාට පසු අනතුරුව **තදාලම්බන** සිත් දෙකක් ඉපිද නිරුද්ධව චිත්තවීථිය අවසන් වෙයි. ඒ මෙසේයි:-

අ-භ	භ-ව	භ-ඵ	ප	ච	සෘ	සං	ගොෂ
000	000	000	000	000	000	000	000

ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	න	න
000	000	000	000	000	000	000	000	000

මෙසේ දැන වස්තු ආදිය අරමුණු කරගෙණ මෙලෙස පඤ්චද්වාරික චිත්තවීථියක් ඉපිද නිරුද්ධවී ගියපසු නැවත ඒ දැන වස්තු ආදියම අරමුණු කරගෙණ **තදනුවත්තක මනෝද්වාරික** චිත්ත වීථියක් ඉපිද නිරුද්ධවී ගියපසු නැවතත් එබඳුම **මනෝද්වාරික** චිත්ත වීථියක් ඉපිද නිරුද්ධවී ගියපසු අවසාන වරට **අජ්ඣාසාධක කුශල චිත්තවීථිය** ඉපිද ප්‍රතිසන්ධි විපාක ප්‍රවෘත්ති විපාක යන දෙවැ-දෑරුම් විපාකයන් ඉපදවීමෙහි සමත් **පුඤ්ඤාභිසඞ්ඛාරය** සම්පූර්ණ වෙයි.

අජ්ඣාසාධක (මනෝද්වාරික) චිත්තවීථිය

අ-භ	භ-ව	භ-ඵ	ම
000	000	000	000

ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ
000	000	000	000	003	000	000
34	34	34	34	34	84	34

න	න	භ	භ	භ	භ
000	000	000	000	000	000

මේ චිත්තවීථියේ ජවන් යිත් වලට යටින් 34 බැගින් ගොඩ ඇත්තේ චෛතසික ගණන දැක්වීමටය. ඵස්ස – වෙදනා – සඤ්ඤා චෙතනා – මනසිකාර – ජීවිතින්ද්‍රිය – එකග්ගතා – චිත්තක්ක – විචාර අධිමොක්ඛ – විරිය – පීති – ඡන්ද – සද්ධා – සති – හිරි ඔත්තප්ප – අලෝභ – අදෝස – තත්‍රමජ්ඣත්තතා – කාය පස්සද්ධි–චිත්තපස්සද්ධි කාය ලහුතා – චිත්ත ලහුතා – කාය මුදුතා – චිත්ත මුදුතා – කායම්මඤ්ඤතා – චිත්තකම්මඤ්ඤතා – කායපාගුඤ්ඤතා – චිත්ත පාගුඤ්ඤතා – කායුජුජ්ජුකතා – චිත්තුජුජ්ජුකතා – විරති– අප්පමඤ්ඤා යසින් 1 ක්; පඤ්ඤා – යන චෛතසික ධම් තිස් හතර මේ ජවන් යින් සහේම යෙදෙන බව පෙනේ. මෙයින් චෙතනා චෛතසිකය පුඤ්ඤාභිසඞ්ඛාර නම ලබයි

මේ අර්හත්ඵලයට ප්‍රථමයෙන් ඇතිවූ චතුර්වාරික චිත්තවීථියේ ජවන් සතක්ද තදනුවත්තක මනොද්වාරික චිත්තවීථි දෙකේ ජවන්යින් සහ බැගින් 14 ක්ද යන ක්‍රමයෙන්වූ ජවන් යින් 21 කම කුසල් නම් වෙයි. විපාකද දෙයි. එයින් සුගති ප්‍රතිසන්ධියක් දීමෙහි අපොහොසත් බවද වෙන කර්මයකින් ප්‍රතිසන්ධිය ගත් තැනැත්තකුට අවකාශ ලදහොත් ප්‍රවෘත්ති විපාකදීමෙහි සමත් බවද දක්වා තිබේ. එහෙත් මේ අර්හත්ඵල කුසල චිත්තවීථියෙහි යෙදෙන ජවනයෝ දෙයාකාර විපාකදීමෙහි සමත් වෙති. මේ ජවන් යින්වල යෙදෙන ඵලචෛතනාව "පුඤ්ඤාභිසඞ්ඛාර" නම ලබන්නේද එහෙයිනි.

(කාමාවචර සෙසු කුසල් යින් සහ පිළිබඳ විස්තරයට මෙහි ප්‍රපඤ්ච නොවෙමු. විස්තර කැමැත්තෝ දෙව් නුවර ඤාණාවාස හිමියන්ගේ "අභිධම්මය" බලත්වා!)

මේ කාමාවචර මහා කුසල් යින් 8 දශ පුණ්‍යක්‍රියා වස්තූන්ම පිළිබඳව උපදින හෙයින් යින් 80 ක් ලැබේ. එය රූපාදී ඡඞ්ග ලම්බණයන්ගෙන් ගුණ කළවිට යින් 480 ක් ලැබේ. නැවත ඡන්ද – චිත්ත – විරිය – විමංසා යන සතර අධිපතීන්ගේ වශයෙන් ගුණකළ කල්හි යින් 1920 ක් ලැබේ. නැවත කාය – වාඞ් මනස් සඞ්ඛ්‍යාත ත්‍රිවිධ කර්මයන්ගේ වශයෙන් ගුණකළ විට 5760 ක් ලැබේ. එය හීන – මධ්‍යම – උත්තමාදී වශයෙන් ගුණකළ විට 17280 ලැබෙන බව දක්වා තිබේ.

ii පුඤ්ඤාභිසඞ්ඛාර

රූපාවචර කුසල් යින් පසේ යෙදෙන චෛතනා චෛතසිකයද පුඤ්ඤාභිසඞ්ඛාර නම ලබන බව මුලින් දැක්වීමු. රූපාවචර කුසල් යින් ලබන ආකාර සංක්ෂේපයෙන් දක්වමු.

ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය ලත් මිරිසිදු සිල් ඇති කල්‍යාණ පෘථග්ජනයෙක් චිත්ත දමනය ඇතිකර ගණු සඳහා පලිබෝධයන්ගෙන්ද කරදර වලට හේතුවන වෙනත් කරුණු වලින්ද වෙන්ව; කර්මස්ථාන [භාවනා ක්‍රම] උගන්වන ගුරුවරයෙකු වෙත ගොස් කර්මස්ථාන සතළිස අතුරෙන් තමාගේ චරිතයට ගැලපෙන කමටහනක් පරීක්ෂාකිරීමේදී ඉදින් පඨවි කසිණය තමන්ට සුදුසු නම් එය කර්මස්ථාන වශයෙන් ලබාගෙණ ධ්‍යාන භාවනාවට නුසුදුසු නැත් හැර සුදුසු තැනෙක වෙසෙමින් කසිණ මණ්ඩලය ඉදිරියෙහි එය බලාගෙණ හිඳ පඨවි-පඨවි යනාදීන් භාවනා කරන්නේය. ඒ භාවනාව **පරිකර්ම භාවනාව** කියාද ඒනිමිත්ත **පරිකර්මනිමිත්ත** කියාද ව්‍යවහාර කරනු ලැබේ. එසේ භාවනා කරණ කල ඇස් වසා බැලු කලත් ඇතුල් ගබඩා දියකට ගොස් බැලුවත් කසිණ මණ්ඩලයම පෙනේ නම් ඒනිමිත්ත උගහඟ නිමිත්තයයි කියත්. ඊට පසු ඒ කසිණ මණ්ඩලයෙන් උපුටා ගත් උගහඟනිමිත්ත පමණක් අරමුණු කරගෙන භාවනා කරනකල පසුම්බියකින් සැඩපතක් නිකුත් කොට ගත්තාක් මෙන් උගහඟ නිමිත්තයයි කියන ලද කසිණ මණ්ඩලයෙන් එතරම්ම ප්‍රමාණවූ එලියක් හටගනී. ඒ එලිය උපන් තැන් පටන් මණ්ඩලය අත්හැර දමා ඒ එලිය අරමුණු කරගෙණ භාවනා කළ යුතුය. ඒ එලියට **ප්‍රතිභාග නිමිත්ත** යයිද කියති.

කසිණ මණ්ඩලයෙන් උපන් එලිය මුළුලෝකයෙහිම පතුරුවන්ට පුළුවන් නිසා "ඔයල්ල" යන අර්ථ ඇති කසිණ ශබ්දය ව්‍යවහාර කරති යනුද මතයකි. ඒ එලිය උපන්තැන් පටන් **ධ්‍යාන චිත්තයට** මුලින් ඇතිවන ගොත්‍රභූ චිත්තය දක්වා කරණ භාවනාව **උපචාර භාවනාව** හෙවත් ධ්‍යානය ලඟ හැසිරෙන භාවනාව යයිද ව්‍යවහාර කරති. ගොත්‍රභූ චිත්තයට පසුව යෙදෙන ඔහ චිත්තය ප්‍රධාන නිසා **අප්පනා චිත්තය** යි කියති. මේ අප්පණා චිත්තයම **රූපාවචර ධ්‍යාන** නමින්ද හඳුන්වනු ලැබේ. (වැඩි විස්තර "විශුද්ධිමාර්ග" ආදී ධර්ම ග්‍රන්ථයන්ගෙන් දැනගත හැකියි.) රූපාවචර ධ්‍යානයන්හි ප්‍රථම දවිතීය – තෘතීය – චතුර්ථ – පඤ්චම යයි ප්‍රභේද පසෙකි.

මෙයින් ප්‍රථම ධ්‍යානය උපදවනු කැමති කල්‍යාණ පෘථග්ජනයා පූර්වෝක්ත ප්‍රතිභාග නිමිත්ත අරමුණු කරගෙණ භාවනා කරණ කල පඤ්චනීවරණයන් ඔබා ගණිමින් ධ්‍යානාඞ්ග පසක් ඇති මේ ප්‍රථම ධ්‍යාන චිත්තවීථිය උපදී.

හ-ව	හ-ළ	ම
000	000	000

පරි	උප	අනු	හෝ	ඛ්‍යාන
000	000	000	000	000
34	34	34	34	34

හ	හ	හ	හ	හ	හ	හ	හ	හ
000	000	000	000	000	000	000	000	000

මෙහි ආරම්මණය විඤ්ඤත හෙයින් අතීත භවඞ්ගයක් නොලැබේ. **භවඞ්ග වලන** - භවඞ්ගුපච්ඡේද - සිත්වලින් පසු මනොද්වාරා වජ්ජනයද අනන්තරුව සොම්නස් සහගත ඤාණසම්පයුත්ත කාමාවචර **කුසල්** සිත් 8 න් එකක් **පරිකම්ම - උපචාර - අනුලොම - ගොත්‍රභු යන** නමින් සිවුවරක් උපදී. නිකඹ පඤ්ඤයට නම් පරිකම්ම සිත නැති බව දක්වයි.

ඉක්බිති විතක්ක-විචාර-පීති සුඛ-එකග්ගතා යන අඞ්ග පසින් **යුත් පඨමජ්ඣාන කුසල චිත්තය** ලැබේ ඉන්පසු සිත භවඞ්ගවෙයි.

මෙහි පරිකම්මාදී මුල් සිත් 4 ට යටින් 34 බැගින් යෙදුවේ **චෛතසික ගණන** දැක්වීමටය. කාමසොභන ප්‍රථම චිත්තයෙහි **චෛතසික 34** ක් යෙදෙන බව මුලින් දැක්වීමු. ධ්‍යාන සිතෙහිද චෛතසික 34 ක්ම යෙදෙති. ඵස්ස-වෙදනා- සඤ්ඤා- **චේතනා-** මනසිකාර- ජීවිතින්ද්‍රිය- එකග්ගතා- විතක්ක-විචාර- අධිමොක්ඛ- විරිය-පීති-ඡන්ද-සද්ධා-සති-හිරි-ඔත්තප්ප- අලොභ- අදෝස- තත්‍ර-මත්තතා- කායපස්සද්ධි- චිත්තපස්සද්ධි- කායලහුතා- චිත්තලහුතා- කායමුදුතා- චිත්තමුදුතා- කායකම්මඤ්ඤතා- චිත්තකම්මඤ්ඤතා- කායපාගුඤ්ඤතා-චිත්තපාගුඤ්ඤතා-කායුජුකතා-චිත්තඡුකතා- පඤ්ඤා යන චෛතසික 33 සමග අප්පමඤ්ඤා දෙකින් එකක් එකතුව චෛතසික 34 මේ ධ්‍යාන සිතේ යෙදෙන චෛතසිකයෝ වෙති. මෙහි යෙදෙන චේතනා චෛතසිකය **අභිසඞ්ඛාර** යන නම ලබයි.

2 ප්‍රථමධ්‍යාන ලාභියා එම ධ්‍යානයට නීවරණ සතුරන් ඇතැයි කියාද චිත්තේ නැමති ලාමක අඞ්ගයන්ගෙන් යුක්තයයි කියාද එහි දෙස් දැක ද්වීතීය ධ්‍යානය උපදවන්ට එම අරමුණම ගෙණ භාවනා කරණකල **දවිතීය ධ්‍යානය** උපදී එහි චිත්තඒපිය ප්‍රථමධ්‍යාන සිත මෙනි. විතර්කය හැර සෙසු චෛතසික 33 මෙම දෙවෙනි ධ්‍යාන සිතේ ඇතිවේ. එසින් චේතනාව **අභිසඞ්ඛාර** නම් ලබයි.

3 දුතියධ්‍යාන ලාභියා; එම ධ්‍යානයට විතර්ක නැමති සතුරෙක් ඇතැයි කියාද විචාර නැමති ලාමක අඞ්ගයක් ඇතැයි කියාද එහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරනකල් තෘතීයධ්‍යාන සිත උපදී. එහිද චිත්තවීථිය ප්‍රථමධ්‍යානයෙහි මෙනි. විතර්ක-විචාර දෙක හැර සෙසු චෛතසික 32 මේ ධ්‍යාන සිතේ යෙදෙනවා ඇත. වෙතනා චෛතසිකය අභිසඞ්ඛාර නම් ලබයි.

4 තෘතීයධ්‍යාන ලාභියා එම ධ්‍යානයට විචාර නැමති සතුරෙක් ඇතැයි කියාද ප්‍රීති නැමති ලාමක අඞ්ගයකින් යුක්තයයි කියාද එහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරණකල චතුර්ථධ්‍යාන සිත උපදී. චිත්තවීථිය ප්‍රථමධ්‍යානයෙහි මෙනි. ප්‍රථමධ්‍යාන සිතේ යෙදෙන චෛතසික 34 න් විතර්ක-විචාර-පීති යන චෛතසික තුන හැර සෙසු චෛතසික 31 ක මේ චතුර්ථධ්‍යාන සිතේ යෙදෙන්නේය. එහි වෙතනා චෛතසිකය අභිසඞ්ඛාර නම් ලබයි.

5 චතුර්ථධ්‍යාන ලාභියා; "මේ ධ්‍යානයට ප්‍රීති නැමති සතුරෙක් ඇතැයිද: මෙය සුඛ වේදනා නැමති ලාමක අඞ්ගයෙන් යුක්තයයිද" ස්ලකා, චතුර්ථධ්‍යානයෙහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරණකල පඤ්චමධ්‍යානය උපදී. එහි චිත්තවීථියද ප්‍රථමධ්‍යාන චිත්තවීථිය මෙනි. ප්‍රථමධ්‍යාන කුසල් සිතේ යෙදෙන චෛතසික වලින් විතර්කය විචාර-පීති-අපපමඤ්ඤා යන චෛතසික හැර සෙසු චෛතසික එකුන් තිස (29) මෙහි පඤ්චමධ්‍යාන සිතේ යෙදෙන බවද එයින් වෙතනා චෛතසිකය අභිසඞ්ඛාර නම් ලබන බවද දැනයුතුයි.

මේ පුඤ්ඤාභි සඞ්ඛාර සි.

"ආනෙඤ්ජාභි සඞ්ඛාර"

අරූපාවචර කුසල් සිත් සතරෙහි යෙදෙන වෙතනා චෛතසිකය ආනෙඤ්ජාභි සඞ්ඛාර නම් ලබයි. ඒ පිළිබඳ සාමාන්‍ය විස්තරයක් මෙහි දැක්වේ. යථොක්ත ආකාරයෙන් රූපාවචර පඤ්චමධ්‍යානය උපදවාගත් යෝගාවචරයා විසින් ආකාශ කසිණය හැර සෙසු පඨවී ආදී කසිණ නවයෙන් එකක් අරමුණු කරගෙණ පඤ්චමධ්‍යානය උපදවා ගන්නේය. අනතුරුවැඩී පඤ්චමධ්‍යානය උපදවා ගැණීමට අර්මුණුවූ කසිණාරම්මණය හෙවත් කසිණ මණ්ඩල යෙහි ඇතිවූ ප්‍රතිභාග නිමිත්ත කැමතිකාක් ප්‍රදේශයක පතුරුවන්නේය. මේ කසිණාරම්මණය පැනිරගිය ආකාශයට "කසිණුග්ඝාටිමා

සසඤ්ඤී අවකාශය"යි කියනු ලැබේ. රූපාවචර පඤ්චමධ්‍යානය ඉපදවූ **යෝගාවචර** තෙමේ රූපයෙහි ආදීනව දකිමින් රූපය **පිළිබඳව පවත්නා** ඡන්දරාගය දුරුකරගන්නේය. රූපය නොයෙක් කලහ - **විග්‍රහ විවාදදියටද නානාප්‍රකාර රෝග පීඩාවන්ටද** හේතු වන්නේයයි **සලකයි**. එහෙයින්ම කසිණාලෝක සඞ්ඛ්‍යාත රූපය මෙනෙහි නොකොට කසිණාලෝකය පැතිරවූ **සුඛ** ආකාශය පමණක් මෙනෙහි **කරයි**. මේ ශුද්ධ ආකාශය "කසිණුග්ඝාටිම ආකාස" නමින් හඳුන්වනු ලැබේ. මේ "කසිණ ඉගුළු අහස" සිතින් අරමුණු කරගෙන **අනන්තෝ ආකාසෝ අනන්තෝ ආකාසෝ** යනුවෙන් භාවනා **කරයි**. මෙසේ භාවනා කරණකල චිත්ත භාවනාව දියුණුවීමෙන් සිත **සමාධිගතව** නීවරණයන් විෂකම්භන වශයෙන් ප්‍රහීන වෙමින් සුදුසු **පූර්ව ආකාසානඤ්චායතන චිත්තය** උපදී මෙයට අරූපධ්‍යානය **සම්මුඛ** කියනු ලැබේ.

චිත්ත චීජිය.

			හ-ව		හ-ළ		ම	
			000		000		000	
පරි		**උප**		**අනු**		**ගොං**		**ඛ්‍යාන**
000		000		000		000		000-(**29**)
හ	**හ්**	**හ**	**හ**	**හ**	**හ**	**හ**	**හ**	**ඤ**
000	000	000	000	000	000	000	000	000

මෙහි "පරි" යන්නෙන් **පරිකම්ම** සිතද; "උප" යන්නෙන් **උපචාර** සිතද; "අනු" යන්නෙන් **අනුලෝම** සිතද; "ගොං" **ගොත්‍රභූ** සිතද; දත් යුතුයි. උපෙක්ඛා සහගත (කාමාවචර) සුඛසම්පයුත්ත අසඞ්ඛාරික - සසඞ්ඛාරික යන සිත් දෙකින් එකක් සතර වරක් මේ නම් වලින් යෙදෙන බවද නික්ඛපඤ්ඤයාට පරිකම්ම සිත නොයෙදෙන බවද දත යුතුයි. ගොත්‍රභූ සිතට අනතුරුව අරූපාවචර **ආකාසා-නඤ්චායතන** සිත යෙදෙන බව ද පෙන්වා ඇත. ඛ්‍යාන සිතට **අවිරියෙහි** 29 ක් යොදා ඇත්තේ මේ ඛ්‍යාන සිතේ යෙදෙන චෛතසික ගණන දැක්වීමටය.

ඵස්ස-වේදනා- සඤ්ඤා - **චේතනා** - මනසිකාර - ජීවිතින්ද්‍රිය - එකග්ගතා - අධිමොක්ඛ - විරිය - ඡන්ද - සද්ධා - සති හිරි - ඔත්තප්ප - අලෝභ - අදෝස - තත්‍රමජ්ඣත්තතා - කාය පස්සද්ධි - චිත්ත පස්සද්ධි - කායලහුතා - චිත්තලහුතා - කාය මුදුතා චිත්ත මුදුතා - කාය කම්මඤ්ඤතා - චිත්ත කම්මඤ්ඤතා - කායපාගුඤ්ඤතා - චිත්ත -

3 දුතියඣාන ලාභියා; එම ධ්‍යානයට විතකී නැමති සතුරෙක් ඇතැයි කියාද විචාර නැමති ලාමක අඞ්ගයක් ඇතැයි කියාද එහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරනකල **තුතියඣාන සිත** උපදී. එහිද චිත්තචීථිය ප්‍රථමධ්‍යානයෙහි මෙනී. විතකී-විචාර දෙක හැර සෙසු වෙතසික 32 මේ ධ්‍යාන සිතේ යෙදෙනවා ඇත. වෙතනා වෛතසිකය **අභිසඞ්ඛාර** නම් ලබයි.

4 තතියඣාන ලාභියා එම ධ්‍යානයට විචාර නැමති සතුරෙක් ඇතැයි කියාද ප්‍රීති නැමති ලාමක අඞ්ගයකින් යුක්තයයි කියාද එහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරණකල **සතුත්ථඣාන සිත** උපදී. චිත්තචීථිය ප්‍රථමධ්‍යානයෙහි මෙනී. ප්‍රථමධ්‍යාන සිතේ යෙදෙන වෛතසික 34 න් විතක්ක-විචාර-පීති යන වෛතසික තුන හැර සෙසු වෛතසික 31 ක මේ චතුත්ථධ්‍යාන සිතේ යෙදෙන්නේය. එහි වෙතනා වෛතසිකය **අභිසඞ්ඛාර** නම් ලබයි.

5 චතුත්ථධ්‍යාන ලාභියා; "මේ ධ්‍යානයට ප්‍රීති නැමති සතුරෙක් ඇතැයිද: මෙය සුඛ වේදනා නැමති ලාමක අඞ්ගයෙන් යුක්තයයිද" සිලකා, චතුත්ථධ්‍යානයෙහි දෙස් දැක එම අරමුණම ගෙණ භාවනා කරණකල පඤ්චමධ්‍යානය උපදී. එහි චිත්තචීථියද ප්‍රථමධ්‍යාන චිත්තචීථියි මෙනී. ප්‍රථමධ්‍යාන කුසල් සිතේ යෙදෙන වෛතසික වලින් විතක්ක විචාර-පීති-අපපමඤ්ඤා යන වෛතසික හැර සෙසු වෛතසික එකුන් තිස (29) මෙහි පඤ්චමධ්‍යාන සිතේ යෙදෙන බවද එසින් වෙතනා වෙතසිකය **අභිසඞ්ඛාර** නම් ලබන බවද දැනගනුතුයි.

මේ පුඤ්ඤාභි සඞ්ඛාර යි.

"ආනෙඤ්ජාභි සඞ්ඛාර"

අරූපාවචර කුසල් සිත් සතරෙහි යෙදෙන වෙතනා වෛතසිකය **ආනෙඤ්ජාභි සඞ්ඛාර** නම් ලබයි. ඒ පිළිබඳ සාමාන්‍ය විස්තරයක් මෙහි දැක්වේ. යථොක්ත ආකාරයෙන් රූපාවචර පඤ්චමධ්‍යානය උපදවාගත් යෝගාවචරයා විසින් ආකාශ කසිණය හැර සෙසු පඨවි ආදී කසිණ නවයෙන් එකක් අරමුණු කරගෙණ පඤ්චමධ්‍යානය උපදවා ගන්නේය. අනතුරුවත් පඤ්චමධ්‍යානයේ උපදවා ගැණීමට අත්මුණුවූ කසිණාරම්මණය හෙවත් කසිණ මණ්ඩල යෙහි ඇතිවූ ප්‍රතිභාග නිමිත්ත කැමතිතාක් ප්‍රදේශයක පතුරුවන්නේය, මේ කසිණාරම්මණය පැනිරගිය ආකාශයට "කසිණුග්ඝාටිමා

සපරීවූ අවකාශය"යි කියනු ලැබේ. රූපාවචර පඤ්චමධ්‍යානය ඉපදවූ **යෝගාවචර** තෙමේ රූපයෙහි ආදීනව දකිමින් රූපය පිළිබඳව **පවත්නා** ඡන්දරාගය දුරුකරගන්නේය. රූපය නොයෙක් කලහ - විග්‍රහ විවාදාදියටද නානාප්‍රකාර රෝග පීඩාවන්ටද හේතු වන්නේයයි සලකයි. එහෙයින්ම කසිණාලොක සඞ්ඛ්‍යාත රූපය මෙනෙහි නොකොට කසිණාලෝකය පැතිරවූ සුද්ධ ආකාශය පමණක් මෙනෙහි කරයි. මේ ශුද්ධ ආකාශය "කසිණුග්ඝාටිම ආකාස" නමින් හඳුන්වනු ලැබේ. මේ "කසිණ ඉගුළු අහස" සිතින් අරමුණු කරගෙන **අනන්තෝ ආකාසෝ අනන්තෝ ආකාසෝ** යනුවෙන් භාවනා කරයි. මෙසේ භාවනා කරණකල චිත්ත භාවනාව දියුණුවීමෙන් සිත සම්මාධිගතව නීවරණයන් විෂකම්භන වශයෙන් ප්‍රහීන වෙමින් සුදුසු **පැරිදි ආකාසානඤ්චායතන චිත්තය** උපදී මෙයට අරූපධ්‍යානය සඞ්ඥා කියනු ලැබේ.

චිත්ත විථිය.

	හ-ව	හ-ළ	ම
	000	000	000

පරි	උප	අනු	ගොත්‍රභූ	ධ්‍යාන
000	000	000	000	000-(29)

ඡ	ඣ	ඤ	ඥ	හ	හ	හ	හ	හ
000	000	000	000	000	000	000	000	000

මෙහි "පරි" යන්නෙන් **පරිකර්ම** සිතද; "උප" යන්නෙන් **උපචාර** සිතද; "අනු" යන්නෙන් **අනුලෝම** සිතද; "ගොත්‍රභූ" **ගොත්‍රභූ** සිතද; දත යුතුයි. උපෙක්ඛා සහගත (කාමාවචර) ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික - සසඞ්ඛාරික යන සිත් දෙකින් එකක් සතර වරක් මේ නම් වලින් යෙදෙන බවද නිකඛපඤ්ඤයාට පරිකර්ම සිත නොයෙදෙන බවද දත යුතුයි. ගොත්‍රභූ සිතට අනතුරුව අරූපාවචර **ආකාසා-නඤ්චායතන** සිත යෙදෙන බව ද පෙන්වා ඇත. ධ්‍යාන සිතට **පැරිසියෙහි** 29 ක් යොදා ඇත්තේ මේ ධ්‍යාන සිතේ යෙදෙන චෛතසික ගණන දැක්වීමටය.

ඵස්ස-වේදනා- සඤ්ඤා - **චේතනා** - මනසිකාර - ජීවිතින්ද්‍රිය - එකග්ගතා - අධිමොක්ඛ - විරිය - ඡන්ද - සද්ධා - සති හිරි - ඔත්තප්ප - අලෝභ - අදෝස - තත්‍රමජ්ඣත්තතා - කාය පස්සද්ධි - චිත්ත පස්සද්ධි - කායලහුතා - චිත්තලහුතා - කාය මුදුතා චිත්ත මුදුතා - කාය කම්මඤ්ඤතා - චිත්තකම්මඤ්ඤතා - කායපාගුඤ්ඤතා - චිත්ත -

කැසි කියා හෝ නොකියහැකිවාක් මෙන්ම ඇතිසඳහැසැ-නෙකැනී සඳහා ඇත්තේද නැත්තේද නොවේ. එය අරමුණු කිරීමෙහි භාවනා කරණකල පෙරමෙන් චිත්තවීථියක් ඉපිද එහි අනුලොම චිත්තයට අනතුරුව චතුර්ථාරුප්‍ය විත්තය වන **නෙව-සඤ්ඤා නාසඤ්ඤායතන** ධ්‍යාන සිත පහළවේ. එහි යෙදෙන චෛතසික ගණනද ප්‍රථමාරුප්‍ය සිතෙහි මෙනි. වෙතනා වෛත-සික **අතිසඞ්ඛාර** නම් ලබයි.

විරහිත සම්භන්:- විතර්ක- විචාර- ප්‍රීති- සුඛ- එකාග්‍රතා- යන **පඤ්චක වෙන්** වෙන් වශයෙන් ධ්‍යාන අඞ්ග (ධ්‍යාන පිළිබඳ **ධර්ම** සයිද; ඒ ධ්‍යාන අඞ්ගයන්ගේ සමූහය **ධ්‍යාන** යයිද **කියා** ලැබේ.

රථ, ඒරියකද; ව්‍යගහ; තට්ටුව; අම්රාව; යන රථ අවයවයෝ **මෙන** වේතම් රථ අඞ්ගයයිද, රථ අඞ්ගයන් එකට ගැලපූ සමූහය **රථයයිද** කියනු ලබන්නාක් මෙනි.

ධ්‍යාන චිත්තය යනු ධ්‍යානය නොව ධ්‍යානාඞ්ග හා යෙදුනු **ධ්‍යාන සිතය.**

ආරම්මණූපනිජ්ඣානලක්ඛණූපනිජ්ඣානං යනු නිර්වචන හෙයින් භාවනා **කරන්** කරු එලඹ සිහි නුවණ මෙහෙයා බලන හෙයින් චිත්තෝද්‍ය **පාදාධිය** හා යෙදුනු සිත ධ්‍යාන නම්වේ ධ්‍යානය යනු සිත එක **අරමුණක** පිහිටුවීමයි. එය කරන්නේ සෑම සිතක්ම යෙදෙන **ඒකග්ගතා** වෛතසිකයයි. සිත නොයෙක් අරමුණු කරා විසිර **යන්ට** ඉඩ නොදී එක අරමුණෙක්හිම පිහිටුවන නිසා **සමාධි** යනුද **එකග්ගතාවට** නමකි. විතක්ක-විචාර ආදී වෛතසිකයෝ විශෙ-**ෂයෙන්** එකග්ගතා වෛතසිකයට උපකාරවන හෙයින් ධ්‍යානාඞ්ග **යන** නම් ලබති

ධ්‍යානය වනාහී **ආරම්මණූපනිජ්ඣානය, ලක්ඛණූප-නිජ්ඣානය** යයි දෙවැදෑරුම් වේ. රූපාවචර අරූපාවචර භෙදයෙන් **අවැදෑරුම්වූ** හෝ නවවැදෑරුම්වේ. ධ්‍යානය; කසින ආදී අරමුණු කරා එලඹ බලන හෙයින් "ආරම්මණූපනිජ්ඣානය" නම්වේ. විදර්ශනා ඉංගී එලයෝ අනිත්‍යලක්ෂණාදිය කරා එලඹ බලන හෙයින් **ලක්ඛණූපනිජ්ඣානයෝ** නම් වෙති.

විතර්කය අරමුණට සිත නත්වයි, පමුණුවයි. **විචාරය** විතර්ක-**යෙන්** අරමුණට නැංවූ සිත අරමුණෙහි හසුරුවයි. **ප්‍රීතිය** අරමුණෙහි **සිත** පිණවයි. **මානසික සුඛ වෙදනාව** සිත සුවපත්කොට වැඩි-

පාගුණසඤ්ඤා-කායුජ්ජුතා- චිත්තුජ්ජුකතා- පඤ්ඤා යන චෛතසිකයෝ මේ ධ්‍යාන සිතේ යෙදෙති. එයින් චේතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

2 ප්‍රථම අරූපාවචර ධ්‍යාන ලාභියා; එම ප්‍රථමධ්‍යානය වඩා කරගෙන අනතුරුව එහිද දෙස් දක්නේය. සඵියෙට භයවූ තැනැත්තේ සඵියෙකු සමානවූ රුහැනටද භයවන්නාසේ රූපය ඇසුරෙන් උපන් ආකාසානඤ්චායතන ධ්‍යානයටද කලකිරෙයි. අනතුරුව ඒ ආකාශය අරමුණු කරගත් විඤ්ඤාණයඤ්ඤම අරමුණු කරගෙන **අනන්තං විඤ්ඤාණං; අනන්තං විඤ්ඤාණං** යනුවෙන් භාවනා කරන්නේය.

එකල සුදුසු ලෙසින් සිත දියුණුවීමෙන් **විඤ්ඤාණඤ්චායතන** කුසල් සිත උපදනේය. එහි චිත්තවීථිය ආකාසානඤ්චායතන චිත්තවීථිය මෙනි චෛතසික ගණනද එපමණමයි චේතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

3 විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිත උපදවාගත් යෝගාවචරයා එය ඉනාසේ වශී කරගෙන ඉක්බිති ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත උපදවන්නේය. ඒ කෙසේද? ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවාගත් යෝගාවචරයා එයට අනතුරුව විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා ගැණීමෙන් පසු මුලින් පැවති ආකාසානඤ්චායතන සිත අභාවයට යයි. ඒ අභාවමාත්‍රය අරමුණු කරගෙණ භාවනා කිරීමෙන් ආකිඤ්චඤ්ඤායතනය ලැබිය හැකිය එහෙයින් යථොක්ත අභාවමාත්‍රය අරමුණු කරගෙණ **නත්ථිකිඤ්චි; නත්ථි-කිඤ්චි** යනුවෙන් භාවනා කරයි. ඉන්පසු සුදුසු ලෙසින් **ආකිඤ්චඤ්ඤායතන** ධ්‍යාන සිත ලබයි. චිත්තවීථිය හා චෛතසික ක්‍රමය ප්‍රථම අරූපාවචර සිතට දක්වූ ලෙසිනි. එහි යෙදෙන චේතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

4 ආකිඤ්චඤ්ඤායතනය ලැබූ යෝගී තෙමේ එය වශී කර-ගෙණ ඉක්බිති එයටත් වඩා උසස් විත්තබලයක් ලබනු පිණිස ප්‍රයත්න දරයි. "මේ සමාපත්ති තොමෝ විඤ්ඤාණඤ්චායතනයට ආසන්නයයිද නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය මෙන් ශාන්ත නොවන්නීයයිද" ආකිඤ්චඤ්ඤායතනය කෙරෙහි කලකිරුණු සිත් ඇත්තේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිතම අරමුණු කරගෙණ **සන්තමෙතං; පණීතමෙතං** යනුවෙන් භාවනා කරයි. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිතෙහි සඤ්ඤා අඩු බව මිස සඤ්ඤාව නැත්තේ නොවේ. තෙල් නැවරුණු බදුනක තෙල් ඇතැයි කියා

ඵාගුඤ්ඤතා-කායුජ්ජුතා- චිත්තුජ්ජුකතා- පඤ්ඤා යන චෛතසික-කයෝ මේ ධ්‍යාන සිතේ යෙදෙති. එයින් වෙදනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

2 ප්‍රථම අරූපාවචර ධ්‍යාන ලාභියා; එම ප්‍රථමධ්‍යානය වශී කරගෙන අනතුරුව එහිද දෙස් දක්නේය. සපීයාට භයවූ තැනැත්තේ සපීයෙකු සමානවූ රූහැනටද භයවන්නාසේ රූපය ඇසුරෙන් උපන් ආකාසානඤ්චායතන ධ්‍යානයටද කලකිරෙයි. අනතුරුව ඒ ආකාශය අරමුණු කරගත් විඤ්ඤාණඤ්ඤම අරමුණු කරගෙන **අනන්තං විඤ්ඤාණං; අනන්තං විඤ්ඤාණං** යනුවෙන් භාවනා කරන්නේය.

එකල සුදුසු ලෙසින් සිත දියුණුවීමෙන් **විඤ්ඤාණඤ්චායතන** කුසල් සිත උපදනේය. එහි චිත්තවීථිය ආකාසානඤ්චායතන චිත්තවීථිය මෙනි වෛතසික ගණනද එපමණමයි වෙතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

3 විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිත උපදවාගත් යෝගාවචරයා එය ඉනාසේ වශී කරගෙන ඉක්බිති ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත උපදවන්නේය. ඒ කෙසේද? ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවාගත් යෝගාවචරයා එයට අනතුරුව විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා ගැණීමෙන් පසු මුලින් පැවති ආකාසානඤ්චා-යතන සිත අභාවයට යයි. ඒ අභාවමාත්‍රය අරමුණු කරගෙණ භාවනා කිරීමෙන් ආකිඤ්චඤ්ඤායතනය ලැබිය හැකියි එනෙයින් යථොක්ත අභාවමාත්‍රය අරමුණු කරගෙණ **නත්ථිකිඤ්චි; නත්ථි-කිඤ්චි** යනුවෙන් භාවනා කරයි. ඉන්පසු සුදුසු ලෙසින් **ආකිඤ්චඤ්ඤායතන** ධ්‍යාන සිත ලබයි. චිත්තවීථිය හා චෛතසික තත්වය ප්‍රථම අරූපාවචර සිතට දැක්වූ ලෙසිනි. එහි යෙදෙන වෙතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම ලබයි.

4 ආකිඤ්චඤ්ඤායතනය ලැබූ යෝගී තෙමේ එය වශී කර-ගෙණ ඉක්බිති එයටත් වඩා උසස් චිත්තබලයක් ලබනු පිණිස ප්‍රයත්න දරයි. "මේ සමාපත්ති තොමෝ විඤ්ඤාණඤ්චායතනයට ආසන්නයයිද නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය මෙත් ශාන්ත නොවන්නියයිද" ආකිඤ්චඤ්ඤායතනය කෙරෙහි කලකිරුණු සිත් ඇත්තේ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිතම අරමුණු කරගෙණ **සන්තමෙතං; පණීතමෙතං** යනුවෙන් භාවනා කරයි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිතෙහි සඤ්ඤා ඇඩු බව මිස සඤ්ඤාව නැත්තේ නොවේ. තෙල් නැවරුණු බඳුනක තෙල් ඇතැයි කියා

හෝ කැකැයි කියා හෝ නොකියහැකිවාක් මෙන්ම ආකිඤ්චඤ්ඤායතනයෙහි සඤ්ඤාව ඇත්තේද නැත්තේද නොවේ. එය අරමුණු කරගෙණ භාවනා කරණකල පෙරමෙන් චිත්තවීථියක් ඉපිද එහි ගොත්‍රභූ චිත්තයට අනතුරුව චතුර්ථාරුප්‍ය චිත්තය වන **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන** ධ්‍යාන සිත පහළවේ. එහි යෙදෙන චෛතසික ගණනද ප්‍රථමාරුප්‍ය සිතෙහි මෙනි. චෙතනා චෛතසිකය **අභිසඞ්ඛාර** නම් ලබයි.

විශෙෂ සටහන්:- විතර්ක- විචාර- ප්‍රීති- සුඛ- එකාග්‍රතා- යන චෛතසික වෙන් වෙන් වශයෙන් ධ්‍යාන අඞ්ග (ධ්‍යාන පිළිබඳ අවයව) යයිද; ඒ ධ්‍යාන අඞ්ගයන්ගේ සමූහය **ධ්‍යාන** යයිද කියනු ලැබේ.

රෝද, ඒරියකද; වියගහ; තට්ටුව; අමරාව; යන රථ අවයවයෝ වෙන වෙනම රථ අඞ්ගයයිද, රථ අඞ්ගයන් එකට ගැලපූ සමූහය රථයයිද කියනු ලබන්නාක් මෙනි.

ධ්‍යාන චිත්තය යනු ධ්‍යානය නොව ධ්‍යානාඞ්ග හා යෙදුනු ධ්‍යාන සිතය.

ඣායනී උපනිඣායනීති ඣානං යනු නිර්වචන හෙයින් භාවනා **අරමුණ කරා එලඹ** සිහි නුවණ මෙහෙයා බලන හෙයින් විතර්කාදී ධ්‍යානාඞ්ග හා යෙදුනු සිත ධ්‍යාන නම්වේ ධ්‍යානය යනු සිත එක අරමුණක පිහිටුවීමයි. එය කරන්නේ සෑම සිතක්ම යෙදෙන **එකග්ගතා** චෛතසිකයයි. සිත නොයෙක් අරමුණු කරා විසිර යන්ට ඉඩ නොදී එක අරමුණෙක්හිම පිහිටුවන නිසා **සමාධි** යනුද එකග්ගතාවට නමකි. විතර්ක-විචාර ආදී චෛතසිකයෝ විශෙෂයෙන් එකග්ගතා චෛතසිකයට උපකාරවන හෙයින් ධ්‍යානාඞ්ග යන නම ලබති

ධ්‍යානය වනාහී **ආරම්මණූපනිජ්ඣායනය, ලක්ඛණූපනිජ්ඣායනය** යයි දෙවැදෑරුම් වේ. රූපාවචර අරූපාවචර භෙදයෙන් අටවැදෑරුම්වූ හෝ නවවැදෑරුම්වේ. ධ්‍යානය; කසින ආදී අරමුණු කරා එලඹ බලන හෙයින් "ආරම්මණූපනිජ්ඣානය" නම්වේ. ඛිදාදීනා මාගී එලයෝ අනිත්‍යාලක්ඛණාදිය කරා එලඹ බලන හෙයින් ලක්ඛණූපනිජ්ඣානයෝ නම් වෙති.

විතර්කය අරමුණට සිත නත්වයි, පමුණුවයි. **විචාරය** විතර්කයෙන් අරමුණට තැංවූ සිත අරමුණෙහි හසුරුවයි. **ප්‍රීතිය** අරමුණෙහි සිත පිණවයි. **මානසික සුඛ වෙදනාව** සිත සුවපත්කොට වැඩි-

දියුණු කරයි. විතර්කාදීන් නිසා සිත එකඟ කරවන්නේ **එකග්ගතා** චෛතසිකයෙනි. මෙසේ **එකග්ගතාව** විතර්කාදීන්ගේ උපකාරය ලැබී අතිශයින් බලවත්ව සිතට නොයෙක් අරමුණු කරා විසිර යන්ම නොදී කසිණ නිමිත්තාදී අරමුණෙහිම සිත යොමුකරවයි. මෙසේ උපනිධ්‍යාන අරමුණ කරා එලඹ බලන අර්ථයෙන්ද "ධ්‍යාන" නම් ලබයි.

පච්චනීක ධම්මෙ ඣාපෙතීති ඣානං:- යනුවෙන් ප්‍රත්‍යනීක (විරුද්ධ) කාමච්ඡන්දාදී නීවරණයන් දවන හෙයින්ද ධ්‍යාන නම්වේ. ඒ මෙසේයි:—**විතර්කය** තෙම:-පින මිදුණු නීවරණය හෙවත් චිත්ත චෛතසිකයන්ගේ මැලි බවද; **විචාරය** විචිකිච්ඡා නීවරණ (සැක) යද; **ප්‍රීතිය** ව්‍යාපාද නීවරණ (වෛර) යද; **සුඛය** උද්ධච්ච කුක්කුච්ච නීවරණයද **එකග්ගතාව** බලවත් කාමච්ඡන්ද නීවරණය (කාම-තෘෂ්ණාව) ද; දවයි, දුරුකරයි චිත්තසන්තානයෙහි කුසල් ඇති නොවන සේ ආවරණය කරණ අර්ථයෙන් කාමච්ඡන්දාදීහු **නීවරණ** යන නම ලබති. ධ්‍යානයෙන් නීවරණයන්ගේ පරියුට්ඨාන (නැඟී සිටින) අවස්ථාවම දුරුකරණු ලැබේ.

මෙහි විතර්කාදීහු සිත එකඟ කිරීමට විරුද්ධව පවත්නා පින-මිදුණු ආදී නීවරණයන් දවාහැර දුරුකොට එකග්ගතාවට උපකාර වෙත්. මෙසේ විරුද්ධ කෙලෙසයන් දවන අර්ථයෙන්ද ධ්‍යාන නම් වේ.

තවද රූපාවචර ධ්‍යානයෝ විතර්කාදී අඞ්ගයන් ඉක්මවීමෙන් මතු මතු ධ්‍යාන සිත් ලබන හෙයින් **අඞ්ග සමතික්කම** නම් වෙත්. ආකාශාදී ආරම්මණ ඉක්මවීමෙන් මතු මතු ධ්‍යාන ලබන හෙයින් අරූපාවචර ධ්‍යානයෝ **ආරම්මණ සමතික්කම** නම් වෙත්.

රූපාවචර කුසල් සිත් පහ ලැබෙන්නේ **ත්‍රිහෙතුක** ප්‍රතිසන්ධි යකින් යුත්; කම්මාවරණ-කිලෙසාවරණ- විපාකාවරණ- උපවාදා-චරණ-ආණාවිනිච්ඡකම්මාවරණ යන අනන්තරායික බාධක ධර්මයන්ගෙන් තොරවූ පුද්ගලයින්ටය. ත්‍රිහෙතුක පෘථග්ජනයා සහ සෝවාන්-සකදාගාමී-අනාගාමී යන ඵලස්ථයන් තිදෙනා සූක්ෂ්මකෘත බාධක-යන්ගෙන් තොරවූවෝ වෙත්.

අරූපාවචර කුසල් සිත් සතර ලැබෙන්නේ ත්‍රිහෙතුක **පෘථග්-ජනයාටත්-රහතුන් වහන්සේ** හැර සෙසු ඵලවලටු **සැමිණි ශෛක්ෂයන්ටත්ය.**

කර්මය; කර්මභවය; චේතනාවය; චේතනා භවය; සංස්කාරය; යන මේ නම් සියල්ලම කුශලා'කුශල චිත්තයන් හා එක්ව යෙදෙන **චේතනා චෛතසිකයට කියන පර්‍යාය නාම** බව දතයුතුයි.

ප්‍රතීත්‍ය සමුත්පාද දෙශනාවෙහි **කර්මවට** යනුද මේ කුශලා - කුශල සඞ්ඛ්‍යාතවූද; කර්මභව සඞ්ඛ්‍යාතවූද මේ සංස්කාරයෝය.

එදා සිද්ධාර්ථ ගෞතම මහබෝසතාණන් වහන්සේ අශ්වත්ථ නම් බොධිදුම මූලයෙහිදී අතීත් මාගීඥනයෙන් කෙලශ් ශීර්ෂයවන අවිද්‍යාවද; පලිබොධයන්ගේ ශීර්ෂයවන තෘෂ්ණාවද ප්‍රහීන කළසේක් කර්මවවට සඞ්ඛ්‍යාත අභිසඞ්ඛාර මාරයා පරාජය කළසේක.

මුදුන (කරටිය) සිඳ දැමූ තල්ගසක ඵල-මල්-කොළ නැවත නූපදින්නා සේ අවිද්‍යා-තෘෂ්ණා ශීර්ෂයන් සිඳදැමූ නෙයින් ඉන් මතු හුදු ක්‍රියා සිත් මිස කර්ම රැස්වීමක් නොවන්නේය.

උපමාවක්:—සෑම වෘක්ෂයකම බීජාවක් තිබේ. ඵල ගටගැනීමට බීජාව උපකාරවේ. ඒ බීජාවෙන් ඵල උපදවයි. ඵල්යෙන් නැවත වෘක්ෂ ඇතිවේ. ඒ වෘක්ෂයෙහිද බීජාව ඇතිවේ. ඒ බීජාවෙන් ඵල ඇතිවේ. ඒ ඵලයෙන් නැවත වෘක්ෂ ඇතිවේ. එහිද බීජාව ඇතිවේ. වෘක්ෂයට බේතක් විද්දහොත් එහි බීජාව වියලෙයි. බීජාව වියලි යාමෙන් බීජාව නැවත ඇති නොවේ. බීජාව නැතිවීමෙන් ඒ ගස් වගීය නැතිවෙයි.

සත්වයාද වෘක්ෂයක් මෙනි. කිලෙස වට්ටය; (අවිද්‍යා-තෘෂ්ණා) වෘක්ෂ බීජාව මෙනි. කම්ම වට්ටය කුශලා'කුශල චේතනා-අභිසංඛාර) වෘක්ෂයේ ඵල මෙනි. සත්ව සඞ්ඛ්‍යාත විපාකවට්ටය වෘක්ෂය මෙනි. විදර්ශනා ඥානය බීජාවි විනාශ වෘක්ෂයට වීදිකුල බන බෙහෙත මෙනි. විදර්ශනාවෙන් කිලෙස වට්ටය නැතිවේ. එහෙයින්ම කම්මවට්ටය ඇති නොවේ. එහෙයින්ම විපාකවට්ටයද නැති වන්නේය. එය ප්‍රකට කරගැණීමට මේ භවචක්‍රයද බලන්න.



මේ අභිසඞ්ඛාර මාරපරාජයයි.

iv සකඤ්ඣ මාරයා

පස්මරුන් අතුරෙහි සිවුවැන්නා සකඤ්ඣමාරයාය. **පඤ්චුපාදානක්ඛන්ධ** යෙම් මාරයෙකු ලෙස සැලකූ බව පෙනේ. මර ධාතුවෙන් නිපන් මාර ශබ්දය මෙහිද **උච්ච** (සුදුසුය.) **ක්ෂණයක්** පාසා **නාමරූප ධම්ම ඝනතතිය** බිඳි බිඳී යන හෙයින්ද ජීවිතේන්ද්‍රියයාගේ බිඳීමෙන් (සම්මුති වශයෙන්) පඤ්චුපාදානස්කන්ධය බිඳී යන හෙයින්ද පඤ්චුපාදානස්කන්ධයට මාර නම් යෙදීම සෝපචාරයෙන් සුදුසුය.

භාග්‍යවතුන් වහන්සේ විසින්ද; **පඤ්ච වධකා පච්චුප්පන්නා ධම්මා භික්ඛවෙ පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එතං අධිවචනං** යනුවෙන් පසම්තුරුවූ වධකයෝ පස්දෙනය යනු පඤ්ච උපාදානස්කන්ධයන්ට නමකැයි "ආසීවිසොපම" සූත්‍රයෙහිදී දේශනා කරනලදී.

තමා වශයෙහි නොපවත්නා හෙයින්ද; **ජරා-මරණාදී** අනෙක ප්‍රකාර ව්‍යසනයන්ට ලක්වන හෙයින්ද; **පරිහරණයෙහි දුෂ්කර** හෙයින්ද: **පඤ්චුපාදානක්ඛන්ධ** මාරයා වැනිය.

"සත්ත" සඞ්ඛ්‍යාතවූ මේ සම්මුතියෙහි පරමාර්ථ වශයෙන් **ඇත්තේ** පඤ්චුපාදානස්කන්ධයකි. "සකඤ්ඣ" යනු "රාශිය" යන අර්ථයෙහි වැටේ. "උදකසකඤ්ඣ" (උදක රාශිය-වතුර සමූහය) යන ආදියෙහි මෙන් කාලත්‍රයෙහි ඇතිව නැතිවෙමින් පවත්නා ධර්ම සමූහයකට සකඤ්ඣයයි දක්වා ඇත්තේය. එබඳුවූ-රූප- වේදනා- සඤ්ඤා- සඞ්ඛාර-විඤ්ඤාණ යන සකඤ්ඣ (රාශි-මිටි) පසක් එකතුවීමෙන් සත්ත සඞ්ඛ්‍යාතවූ මේ සම්මුතිය සෑදී ඇත.

රූපසකඤ්ඣය:—"රුප්පති සීතුණ්හාදි විරොධිපච්චය සමවායෙන විකාරමාපජ්ජතීති=රූපං" යනුවෙන් සීතය උෂ්ණය යනාදී විරුද්ධ ප්‍රත්‍යයන්ගේ එක්වීමෙන් යමක් විකාරයට පැමිණේද එය රූපය නමැයි දක්වා තිබේ. රූපයන්ගේ රාශිය රූපසකඤ්ඣයයි. පඤ්චුපාදානස්කන්ධයන් අතුරෙන් රූපසකඤ්ඣය ප්‍රකටය. **ඕදාරිකය** චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ට ප්‍රධාන වශයෙන් විෂය වන්නේද රූපයයි. ප්‍රභේද වශයෙන් රූපසකඤ්ඣය අටවිසි වැදෑරුම් වේ. පඨවී-ආපෝ-තේජෝ-වායෝ යන **සතර මහාභූතයන්ද;** නීලපීතාදී **රූප** දර්ශනයට කාරණ වන චක්ඛුප්පසාදය-ශබ්ද ශ්‍රවණයට **කාරණ වන** ශ්‍රෝත්‍රප්‍රසාදය-සුගන්ධ දුර්ගන්ධාදිය ආඝ්‍රාණයට **කාරණ වන ඝ්‍රාණ-**

ප්‍රසාදය- ආහාරාදී රසාස්වාදනයට කාරණවූ ජීවහා ප්‍රසාදය- වස්ත්‍රාභරණ සත්‍රීපුරුෂාදී ස්පර්ශීය ග්‍රහණයට කාරණවූ කායප්‍රසාදය යන **ප්‍රසාද** රූප පසද, චක්ෂුසට ගොචරවූ රූපාලම්බණය-ශ්‍රොත්‍රයට ගොචරවූ ශබ්දාලම්බනය ඝ්‍රාණයට ගොචරවූ ගන්ධාලම්බනය-දිවට විෂයවූ රසාලම්බනය-කායෙන්ද්‍රියට ගෙ වරවූ ස්පර්ශාලම්බනය- යන **විෂයරූප පසද**; සත්‍රීභාව-පුරුෂභාව නම්වූ **භාවරූපයද**; මේනා විඥාන ධාතූන්ට නිශ්‍රයවූ **හෘදය රූපයද**; ශරීරයාගේ පැවැත්මට කාරණවූ **රූපජීවිතෙන්ද්‍රියයද**; කබලිඞ්කාර **ආහාරයද**;

රූප කලාපයන් එකිනෙකට මිශ්‍ර නොවන ලෙසින් **පිරිසිදුභා** ස්වභාවයවූ **ආකාශ** රූපයද; කයින් අභිප්‍රාය අවබෝධ කරවූ **කාය-විඥප්තියද**; වචනයෙන් අභිප්‍රාය අවබෝධ කරවූ **වාග්විඥප්තියද**; ගින්නෙන් රත්වූ යකඩ කඳක් මෙන් රූපයාගේ සැහැල්ලු බවයයි කියනු ලබන **රූපලඝුතාවද**; පදම් කරණලද සමක් මෙන්වූ රූපයාගේ **මෘදුත්වයද**; ගින්නෙන් නැවූ සවණියක් මෙන් ශරීර-යෙන් කටයුතු ක්‍රියාවන්ට අනුකූල බවයයි කියනු ලබන **රූප-කර්මණ්‍යතාවද**;

ගඟබඩ කැපූ ලිඳක නිතර ජලය පිරෙන්නාක් මෙන් රූපාය-තනයන්ගේ මතුමත්තෙහි දියුණුවෙවී යන **උපචයද**; පිරුණු ලිඳෙහි ජලය උතුරායාමක් මෙන් උපන් රූපයන්ගේ නැවත නැවත නොකඩවා යෙදෙන රූපප්‍රවෘත්තියයි කියනු ලබන **රූපසන්තතියද**; උපන් රූපයාගේ විනාශය කරා යොමුවීම් සඞ්ඛ්‍යාත **ජරාතාවද**; රූපයන්ගේ බිඳීම් සඞ්ඛ්‍යාතවූ **අනිත්‍යතාවද** යන මේ අටවිසි රූපයෝ රාශි අර්ථයෙන් රූපස්කන්ධය නම් වේ.

මේ අටවිසිරූපයන් අතුරෙන් පෘථිවී රූපය ආදිකොට ආහාර රූපය අන්තකොට ඇති අටළොස් රූපයෝ නිෂ්පන්න රූප- සල-ක්ෂණ රූප- අනිදර්ශන රූප-රූපරූප නම් වෙත්.

කර්කශ බව-වැහිරෙන බව ආදී තම තමන්ගේ ස්වභාව ලක්ෂණ මනාසේ ප්‍රකට වෙයින්ද; උත්පාද-ස්ථිති-භඞ්ග යන ක්ෂණත්‍ර-යෙන් හා අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රයෙන් යුක්ත බැවින්ද; කර්ම-චිත්ත-ඍතු-ආහාරාදී ප්‍රත්‍යයන්ගෙන් නිපන් වෙයින්ද; අනිත්‍යාදී ත්‍රිලක්ෂණයට නහා මාර්ගඵලයට පැමි-ණෙන්නවුන් විසින් විදර්ශනා ඥානයෙන් සම්මර්ශනය කළයුතු වෙයින්ද පූර්වෝක්ත අටළොස් රූපයෝ නිෂ්පන්න-සලක්ෂණ-අනිදර්ශන ආදී නම් දරන්නාහ.

ආධ්‍යාත්ම රූපාදී දශරූප කලාපයෝ එලෙස කර්මාදී-ප්‍රත්‍යයෙකින් නූපන්නාහුද විඳීමිනාවට කාරණ නොවන්නාහුද වෙත්. එහෙයින් ඔවුනු "අනිෂ්පන්න රූපයෝ" යයි නම් ලබත්.

වේදනාස්කන්ධය:—"වේදයති ආරම්මණ රසං අනුභවතීති= වේදනා" යනු කී හෙයින් අරමුණු රසය විඳිනුයි අනුභව කෙරෙනුයි **වේදනා** නම් වේ. චක්ඛු සොත-ඝාණ-ජිවහා කාය-මනෝ යන දොරයන්ට ගොමුවන රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ ධර්ම යන් ආරම්මණයන් ඉෂ්ටවූවහොත් සුඛ වේදනාවද; අනිෂ්ට වූවහොත් දුඃඛ වේදනාවද; මධ්‍යස්ථ වූවහොත් උපේක්ෂා වේදනාවද යන ක්‍රමයෙන් එකම වේදනාව ජාති වශයෙන් ත්‍රිවිධ වේ. සෑම සිතක් පාසාම යෙදෙන සජීවිතන සාධාරණ චෛතසිකයක් වන වේදනාව කුසල් සිත්වල යෙදුනුකල "කුසල වේදනා" යන්නෙන්ද අකුසල් සිත්වල යෙදුනුකල "අකුසල වේදනා" යන්නෙන්ද අව්‍යාකෘත සිත්වල යෙදුනුකල "අව්‍යාකෘත වේදනා" යන්නෙන්ද හඳුවන්වනු ලැබේ. රූපාදී ආරම්මණයන් පිළිබඳව මෙය අශුභය කියා නෝ මෙය මධ්‍යස්ථය කියා හෝ සලකන්නේ වේදනා චෛතසිකයෙන්ය. ඒ හැර ආරම්මණ රසය විඳින ,සත්වයෙක්-පුද්ගලයෙක් නැත. සිත් ඇති තරමටම වේදනා ඇති නෙසින්ද සෑම සිතක් පාසාම යෙදෙමින් අරමුණු රසය විඳින නෙසින්ද වේදනාවන්ගේ රාශිය යන අර්ථයෙන් වේදනා සකන්ධ නම්වේ.

සඤ්ඤාක්ඛන්ධය:—"සඤ්ජානාති සඤ්ඤං කත්වා ජානාතීති= සඤ්ඤා" යනු දැක්වූ හෙයින් හඳුනාගැනුයි සලකුණුකොට දනීනුයි සඤ්ඤා නම්වේ. වඩුවන් විසින් දැව ආදියෙහි කලුහුය ගසා ලකුණු කිරීමක් මෙන් චක්ඛුරාදී ඉන්ද්‍රියයන්ට හමුවූ රූපාදී ආරම්මණයන් මේ මේයයි හැඳිනගන්නා සභාවය සඤ්ඤා නම්වේ. මෙයද චෛතසිකයකි. චක්ඛු-සොත-ඝාණ-ජිවහා-කාය-මනෝ යන දොරයන්ට හමුවන රූපාදී ආරම්මණයන් පිළිබඳව මේ අසුවල් රූපයය-මේ අසුවල් ශබ්දය ආදී වශයෙන් වෙන් වෙන්කොට හැඳිනගන්නා ලක්ෂණය ඇති "සඤ්ඤා" නම්වූ මේ චෛතසිකය සෑම සිතක් පාසාම යෙදෙන හෙයින් රාශි වශයෙන් සඤ්ඤාක්ඛන්ධ නම්වේ.

සඞ්ඛාරක්ඛන්ධය:- "සඞ්ඛත මභිසංඛරොන්ති භෝ භික්ඛවෙ සඞ්ඛාරාති වුච්චන්ති" යනු වදාළ හෙයින් යම් හෙයකින් ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් රැස් කරද්ද; ඔව්හු සඞ්ඛාරයෝයයි කියනු ලැබෙත්. ඔවුනු නම් චෛතනාව ප්‍රධාන කොට ඇති සම්පයුත්ත (50) චෛතසික ධර්මයෝය චෛතනා - සඵශී එකග්ගතා - ජීවිතින්ද්‍රිය - මනස්කාර - ආදී චෛතසික පණස එක්කොට "සංඛාරක්ඛන්ධ" යයි

කියනු ලැබේ. (සංඝකාරයන් පිළිබඳ පැහැදිලි විස්තරයක් අප විසින් ලියූ "හෙතු ඵල වාදයේ" 103-104-105 යන පිටුවල සඳහන්ව ඇත්.) මෙහි ප්‍රධාන වශයෙන් චෙතනාවම සංඝකාර නම් ලබන බව **"තං සම්පයුත්ත සඞ්ඛාරා පනතාය ගහිතාය ගහිතාව හොනති"** යනු "ඛිනඞ්ගවය කථා"වෙහි දැක්වූ හෙයින් ආයූහනයයි කියනු ලබන රැස්කිරීම් අර්ථයෙන් ප්‍රකට බැවින් චෙතනාවම සංඝකාරයන් අතුරෙහි ප්‍රධාන වේ.

විඤ්ඤාණක්ඛන්ධය:- "විජානාති විජානාතීති බෝ ආවුසෝ තස්මා - විඤ්ඤාණංති වුච්චති" ආදීන් දැක්වූ හෙයින් අරමුණු දැනීම් ලක්ෂණ කොට ඇති සිතම විඤ්ඤාණය නම්වේ. මනස යනුද විඤ්ඤාණයට නමකි. අරමුණු දැනීමය. සිතීමය යන අර්ථ විඤ්ඤාණ ශබ්දයෙහි පවතී. "විඤ්ඤාණ ලක්ඛණං චිත්තං" සිතීම ලක්ෂණකොට ඇත්තේ සිත යයිද විඤ්ඤාණ යයිද කියනු ලැබේ.

සඤ්ඤා-විඤ්ඤාණ-ප්‍රඥා යන තිදෙනාම දැනීම කරන්නාහු වෙත්. එහෙත් ඔවුහු ලක්ෂණ වශයෙන් එකිනෙක වෙනස් වන්නාහ. **සඤ්ඤා** වනාහී නීල පීතාදී වශයෙන් හැඳිනීම පමණක් කරන්නීය. අනිත්‍යාදී වශයෙන් ලක්ෂණ ප්‍රතිවෙධය කරන්නට අසමර්ථය **විඤ්ඤාණය** වනාහි නීලපීතාදී වශයෙන් හැඳිනීමද ලක්ෂණ ප්‍රතිවෙධය ද කරන්නේය. එහෙත් කෙලෙස් ප්‍රහීන කිරීමටද මාර්ග-ඵල ප්‍රතිවෙධයටද සමත් නොවේ. **ප්‍රඥාව** වනාහි නීලාදී වශයෙන් හැඳිමය. ලක්ෂණ ප්‍රතිවෙධය; මාර්ග ඵලයන්ට පැමිණවීමය යන මේ තුනම සිදුකරන්නීය. විඤ්ඤාණ ලක්ෂණ වශයෙන් විඤ්ඤාණය එකක්ම වුවද ජාති වශයෙන් කුශල - අකුසල - අව්‍යාකෘත - යයි තෙවැදෑරුම් වේ. එසේම භූමි වශයෙන් කාමාවචර (සිත් 54 යි) රූපාවචර (සිත් 15 යි) අරූපාවචර (සිත් 12) ලෝකොත්තර (සිත් 8) යයි සිවුවැදෑරුම්වේ. මේලෙසින් එකුන් අනූ (89) ප්‍රභේද ගතවූ විඤ්ඤාණය විඤ්ඤාණක්ඛන්ධ නම්වේ.

අඩුවැඩි නොකොට සඤ්ඤ **පඤ්ච දෙශනා කළේ ඇයි?** උපමා වශයෙන් එහි විනිශ්චය දත යුතුයි. රූපය භාජනයක් වැන්න. වෙදනාව භොජනයක් වැන්න. සඤ්ඤා ව්‍යඤ්ජනයක් වැන්න; සංස්කාරය අරක්කැමියෙක් වැන්න; විඤ්ඤාණය අනුභව කරන්නෙක් වැන්න. මේ උපමාවිය දැක්වීම පිණිස පඤ්ච ඛන්ධ දේශණ ලදී. මෙසේම රූපඝනක්ඛය ගිලන් හලක් වැන්න; වේදනා ඝනක්ඛය ලෙඩක් වැන්න; සංඥාඝනක්ඛය රෝග නිදානයක් වැන්න. සංඛාරඝනක්ඛය නොසැළ විහරණයක් වැන්න. විඤ්ඤාණඝනක්ඛය ලෙඩෙක් වැන්න;

විඤ්ඤාණ-වෙදනා-සඤ්ඤා ආදී ක්‍රමයෙන් නොවදරා රූප-වේදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන **පිළිවෙලින් පඤ්චඋපාදානස්කන්ධය වදාළේ ඇයි?** ප්‍රථමයෙන් ඔළාරිකවූ රූපසඤ්ඤාවද අනතුරුව "මෙය යහපත්ය. මෙය අයහපත්ය" යන හැඟීම් ඇතිකරවන වේදනා සඤ්ඤාවද-ඉන්පසු සත්ත්‍ව පුරුෂාදී වශයෙන් ගඳුනන්නාවූ සඤ්ඤාසඤ්ඤාවද; එහි ඇලුම් කරවන්නාවූ සංඝඨාරාසඤ්ඤාවද අවසානය වශයෙන් වේදනාදීන්ට නිශ්‍රයවන- ප්‍රධානවන විඤ්ඤාණයද යන ක්‍රමයෙන් පඤ්චඋපාදානස්කන්ධයක්ම වදාළ බව දත යුතුයි.

ශීත-උෂ්ණ-බඩගිනි පිපාසා ආදී ප්‍රත්‍යයන් හේතුකොට ගෙණ වෙනස්වන ධර්ම සමූහයකට රූපසඤ්ඤාවයි ව්‍යවහාර කෙරෙයි නම් චිත්ත චෛතසිකාදී නාම ධර්මත් වෙනස්වන නිසා ඔවුන්ට රූප ව්‍යවහාරය නොයෙදෙන්නේ ඇයිද යනු ප්‍රශ්නයකි. එයට පිළිතුරු සපයන කල් නාම ධර්මයන්ගේ වෙනස්වීම අප්‍රකටය. නොපෙනෙන්නේය. රූප ධර්මයන්ගේ වෙනස්වීම ප්‍රකටය. පෙනෙන්නේය. එහෙයින් නොපෙනෙන ධර්මයන්ගේ වෙනස මෙහි නොගත යුතුය යනු උත්තරයයි.

නැවත ශීත-උෂ්ණ-ක්ෂුධා-පිපාසාදී විරෝධ හෙතු බඹලොව නැත. එහෙත් එහි ඇත්තාවූ රූපයන්ට කෙසේ නම් රූප ව්‍යවහාරය වන්නේද්දැයි ප්‍රශ්නයයි. විරුද්ධ හේතු නැතිමුත් උපකාරක හේතු නිසා වෙනස්වීම් ඇති හෙයින් එහිදී රූප ව්‍යවහාරය යෙදේය යනු උත්තරය වේ.

විශේෂයක්:- ලොභාදී අකුශල චෛතසිකයන් කෙලෙසමාරයා වශයෙන්ද; චේතනා චෛතසිකය අභිසංඛාර මාරයා වශයෙන්ද ගත්කළ නැවත සකල පඤ්චඋපාදානස්කන්ධයම ඛන්ධමාරයා වශයෙන් ගැණීමේ යුක්තියුක්ත භාවය කෙසේද? යනු ප්‍රශ්නයකි. එයට පිළිතුරු මෙන්න.

පඤ්චවිකාර කථාවෙහි ඛන්ධමාරයා යන්නෙන් දක්වූයේ ප්‍රතීත්‍ය සමුත්පාද දේශනාවට අයත් "විපාක වට්ටය" බව දත යුතුයි. එහි දක්වූ **කම්මවට්ටය අභිසඞ්ඛාර මාරයා** ලෙසද; **කිලෙස වට්ටය කෙලෙස මාරයා** ලෙසද ඉතිරි විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස වෙදනා උපපත්ති භව-ජාති-ජරා-මරණ යන මොවුහු **විපාක වට්ට සඞ්ඛ්‍යාත ඛන්ධමාරයා** ලෙසද සැලකිය යුතුයි.

අතීත භවයෙහිවූ කිලෙස වට්ට හා කම්ම වට්ටයන් නිසා වර්තමාන භවයෙහි විපාක වට්ට සඞ්ඛ්‍යාත සකල පඤ්චකය (පුනරුත්පත්තිය වශයෙන්) ලැබෙන බවද අතීත් මාගීඤ්ඤනයෙන් අවිද්‍යා-

තෘෂ්ණා-උපාදානයන් සමූල ඝාතනයෙන් නැසුකල සකාඞ්ඛමාරයා පරාජය වන බවද දත යුතුයි **සකාඞ්ඛ මාර පරාජයෙන් පුනරුත්පත්තියද නැසෙයි.**

(කිලෙස වට්ට-කම්ම වට්ට-විපාක වට්ට යන මේ "තිවට්ට"යන් හා පුනරුත්පත්තිය පිළිබඳ වැඩි විස්තර අප විසින් ලියූ "හේතු-ඵල වාදය" බලා දන්නේය.)

මේ සකාඞ්ඛ මාර පරාජයයි.

මෘත්‍යු මාරයා 5

පඤ්චමාරයන් අතුරෙහි "මෘත්‍යු මාරයා" (මච්චුමාරෝ) එස් වැන්නාය. **මරණයම** මෙහි මාරයා ලෙස සැලකූ බව පෙනේ මර= (ප්‍රාණවාගෙ) ධාතුවෙන් නිපන් "මච්චු" ශබ්දය සංස්කෘතයෙහි "මෘත්‍යු" කියා යෙදෙයි මරණය යනු එහි අර්ථය.

නත්ථි මච්චුස්ස නාගමෝ (මරහුගේ නොඒමක් නැත) **මච්චුනාඛ්‍යාහතෝ ලෝකෝ** (මාරයා විසින් ලෝවැසිතෙම ඵලවා ගෙණ එන ලද්දේය) යනාදී තථාගත දේශනාවන්හි ඇතුළත් මච්චු (මෘත්‍යු) ශබ්දයෙන් "මරණය" ව්‍යවහාරයෙයි. ජීවිතෙන්ද්‍රියයාගේ බිඳීමෙන් සිදුවන මරණය ජීවිතෙන්ද්‍රියයාගේ සතුරෙකු ලෙස පෙනෙන හෙයින් මරණය මාරයෙකු වශයෙන් සැලකීම සුදුසු වෙයි.

මරණ ප්‍රභේද;— මරණය යනු එක් භවයෙකින් වෙන්කරණ ලද ජීවිතෙන්ද්‍රිය පරම්පරාවගේ බිඳියාමයි. **ක්ෂණික මරණ; සම්මුති මරණ; සමුච්ඡේද මරණ;** යයි මරණයෙහි ප්‍රභේද තුනකි. සියලු සංස්කාරයන්ගේ භඞ්ගයයි කියනලද ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳිබිඳියාම "ක්ෂණික මරණ" නම් වේ වෘක්ෂය මළේය ලතා නොමෝ මළාය. මිනිසා මළේය යනාදීන් ලෝක සම්මතයෙහි ව්‍යවහාරවන මරණය "සම්මුති මරණ" නම්වේ. සියලුම ආශ්‍රව (කෙලෙස) යන් ප්‍රහීන කළ බුදු-පසේබුදු-මහරහත් යන උතුමන්ගේ සවිප්‍රකාරයෙන් සංසාර දුකින් මිදීම "සමුච්ඡේද මරණ" නම් වේ.

කාල මරණ අකාල මරණ:—යනුවෙන්ද මරණයේ ප්‍රභේද දෙකකි. එයින් කාල මරණය නම් ඵල හෝ ආයුසය හෝ ඒ දෙකම හෝ ගෙවීමෙන් සිදුවන මරණයයි. සියක් අවුරුද්දට ආයු

ඇති කලක පණස් අවුරුද්දක් ආයු ඇබීමේ සුදුසු ප්‍රතිසන්ධිජනක කර්මයකින් උපන් පුද්ගලයෙක්; ජීවිතෙන්ද්‍රිය පරම්පරාවගේ පැවැත්මට කාරණවූ ආහාරාදී ප්‍රත්‍යය ඇතත් ප්‍රතිසන්ධිජනක කර්මය ගෙවීයාමෙන් පණස් අවුරුද්දේ කෙළවරදී මරණයට පැමිණෙද, එය "ජීණ ගෙවීයාමෙන්" සිදුවන මරණයයි. සියක් අවුරුද්දට ආයු ඇති කාලයක; සියක් අවුරුද්දටත් වඩා ජීවත්-වීමේ පිණ ඇතිව උපන් පුද්ගලයෙක් නිසි සෘතු-භෝජනාදී-ප්‍රත්‍යයන් නොලැබීමෙන් සියවෙනි වයසේදී මරණයට පැමිණේද; එය "ආයු ගෙවීයාමෙන්" සිදුවන මරණයයි. ප්‍රතිසන්ධිජනක කර්මයද ලෝක සම්මත ආයුසයද යන දෙකම ගෙවීයාමෙන් සිදුවන මරණය "පිණ හා ආයුසය ගෙවීයාමෙන්" සිදුවන මරණයයි.

කකුසඳ සම්බුදු රජුන්ගේ අගසව් තෙරුන් වන "විධුර" නම් රහතුන් වහන්සේගේ සිරසට ගලකින් ගැසූ **දුසිමාරයා**; ක්ෂාන්ති-වාදී තාපස තුමන්ට පිඬාකළ **කලාබුරජ**; සැරියුත් මහරහතුන්ගේ සිරසට ටොකු පනරක් දුන් **නන්ද යක්ෂයා**; උපුල්වන් මහ මෙහෙ-ණියට පිඬාකළ **නන්ද මාණවකයා**; සම්බුදුන්ට අපහාස කළ **චිඤ්චීමාණවිකා** ආදීන්ට මෙන් එකෙණෙහිම (ඒ ඒ කර්මය කළ ක්ෂණයෙහිම) ඒ කර්මය විපාකදීම් වශයෙන් ("දිට්ඨධම්ම වෙදනීය කම්ම බලයෙන්] සිදුවන මරණයද, හදිසි තුවාල ආවුධ පිඬා ආදී යෙන් සිදුවන මරණයද; ඝන මරණයෝ අකාල මරණ නම් වෙත්.

අකාල මරණය පිළිබඳව **"මිලින්ද ප්‍රශ්නයෙහි"** විශේෂ විස්-තරයක් ඇත්තේය. ක්ෂුධාව-පිපාසය-විෂ වෙගය-ගින්න-ජලය-ආවුධ-ආදී උපක්‍රම වලින් සත්වයාට අකාල මරණ සිදුවන බව දැක්වේ. අඹ, දඹ ආදී වෘක්ෂයන්හි ඵල; (ගෙඩි) සුලඟින්ද; සතුන් විසින් විදිනු ලැබීමෙන්ද පොලු පහර වැදී මෙන්ද වැටෙන්නාක් මෙන් සත්වයන්ට අකාල මරණ පූර්වෝක්ත අතුරු උවදුරු නිසා යෙදෙන බව දැක්වේ. තවද දැව දඬු දැවී අවසන්වීමට පෙර ආගන්-තුක වශයෙන් පැමිණි ඛාත වෙගයකින් හෝ වර්ෂා ජලයකින් ගින්න නිවී යන්නාසේ;

නිසිකල ජලය නොලැබී මෙන් පැල ගොයම් වියළී මැරී යන්නා සේ සත්වයෝ ආගන්තුක වශයෙන් යෙදෙන ක්ෂුධාව පිපාසය; විෂ වේගය; ගින්න; ජලය; ආදී කාරණයන් නිසා අකාලයේ මිය යන්-නාහයි දක්වා ඇත්තේය.

සිද්ධාර්ථ ගෞතම මහා බෝධිසත්වයන් වහන්සේ එදා අශ්වත්ථ නම් බෝධිදුම මූලයෙහිදී **අනිත්‍ය ඵල විමුක්තියෙන් නිර්වාන ධාතුව ප්‍රතිවේධ කොට අජරාමර තත්වයට පැමිණි සේක් මාතෘමාරයා ද පරාජය කළ සේක.**

ii මාර විජය

මෙතෙක් අප විසින් විස්තර කරණ ලදුයේ "පස් මරුන්" පිළිබඳවයි, මේ කියවන ඔබට දැන් "පස් මරුන්" පිළිබඳ සැලකිය යුතු දැනීමක් ලැබී ඇතැයි සිතමු. පස්මරුන් අතුරෙහිවූ වසවත් මරුන් පරාජය කළ අයුරු යට දැක්වීමු. දැන් විස්තර කළ යුත්තේ සෙසු සිවුමරුන් දැමූ අයුරුය.

මෙහිදී **ත්‍රිවිධ ශික්ෂා; පඤ්චවිධ කෙලශ ප්‍රහාණය; සප්ත-විශුද්ධි** ආදී [illegible] පිළිබඳ විස්තරයක්ද සිදුකළ යුතුවේ. ත්‍රිවිධ ශික්ෂාවන් [illegible] විශුද්ධීන් අනුව නුවණ දියුණු කිරීමෙන් පඤ්ච-විධ කෙලශ ප්‍රහාණයෙන් මහතාණෝ "මාර විජය" කළහ. පෙළ-අටුවා ටීකා හා ආචාර්‍යවරුන්ද සසඳා බලා "මාර විජය" කළ අයුරු ප්‍රකාශ කරණු ලැබේ.

මහබෝසතුන් වහන්සේ අනෝමා නදීතීරයෙහිදී පැවිදිවී සංවරසීලය සමාදන් විය "සංවරසීලය නම් "ආජීවට්ඨමක" සීලයයි. ත්‍රිවිධකාය දුශ්චරිතයෙන්ද චතුර්විධ වාග් දුශ්චරිතයෙන්ද වෙන්ව දූරුම් දිවිපෙවෙතක් ගත කළහ. එයින් ආජීවට්ඨමක සීලය සම්පූර්ණ විය. චක්ෂුරාදී ඉන්ද්‍රියයන්ද සංවරකර ගැණීමෙන් ඉන්ද්‍රිය සංවරයද ඇතිවිය. මෙය මහතාණන්ගේ **සීලවිසුදධිය** වෙයි.

එසේම විශුදධිය සොයා යන මහතාණන් ආළාරකාළාම; උද්දකරාම පුත්‍ර; යන තවුසන් දෙදෙනා සමීපයෙහිදී ලබනලද **පඤ්චාභිඥා** හා අෂ්ටසමාපත්තිද දුෂ්කර ක්‍රියා සමයෙහි මල බැඳුනාක් මෙන් යටපත් විය. නැවත සුජාතා සිටු දේවිය විසින් පුදනලද කිරිපිඬු වැළඳූ දින සවස් භාගයෙහි භද්‍රශාල වනයෙහිදී නැවතත් මහසත්තුමෝ පූර්වේනන අභිඥාවන් පිටිසිදු කළහ. එය මහබෝසතුන්ගේ **චිත්තවිසුදධිය** හා **සමාධි ශික්ෂාවද වීය**.

ඉක්බිති බොධිපර්‍යඞ්කයෙහි වැඩ සිටිමින් ප්‍රථම යාමයෙහි "පූර්වේනිවාසානුසමෘති ඥානය" උපදවා නාම-රූපයන්ගේ උත්පත්තිය දැක සත්කාය දෘෂ්ටිය දුරු කළහ. එය **දිට්ඨි විසුදධියයි**.

මධ්‍යම යාමයෙහි "දිව්‍යං චක්ෂුරහි ඥානය උපදවා "යථා-කම්මූපග" (කුශලා'කුශල කර්මානුරූපව සුගති දුගති දෙක්හි උපදින) සත්වයන් බලනුවෝ කර්මය හා කර්මඵලය ප්‍රත්‍යක්ෂ කළහ.

එසින් නාම-රූපයන් පිළිබඳ හේතු ප්‍රත්‍ය ධර්මයන් සොයා දැන අතීතාදී කාලත්‍රය විෂයකොට ඇති සොළොස් ආකාර සැකයන්ද; බුද්ධාදී අටතන්හි පවත්නා සැකයන්ද දුරුකළහ එය මහසත්තුමාගේ **කංඛාවිතරණ විසුදධියයි.**

නැවත අතීතාදී එකාදස (11 ස්) ප්‍රභේදවූ, අවිද්‍යාදී හේතු-ප්‍රත්‍යයෙන් සහිතවූ කාමාවචරාදී තෙභූමිකවූ සංස්කාරයන්; අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රයට නඟා භාවනා කිරීමෙන් සම්මසන ඤාණයද; සංස්කාරයන් පිළිබඳ උදයව්‍යය ඤාණයද ලැබීමෙන් පසු භාවනා බලයෙන් හටගත් **ඔභාසය** ප්‍රධානකොට ඇති දස වැදැරුම් උපක්ලෙශයන්ට නොරැවටී "උප කෙලෙශයන්-ගෙන් මිදුනු මාගී ඵලයට බැසගත් විදර්ශනා ඥානයම මාගීය මේ" යයි නිශ්චයකොට දැන ගත්හ. එය **මග්ගා'මග්ග ඤාණ දස්සන විසුදධියයි.**

ඉක්බිති උදයබ්බයානු පස්සනා-භඞ්ගානු පස්සනා-භයතු-පට්ඨාන-ආදීනවානු පස්සනා-නිබ්බිදානු පස්සනා-මුඤ්චිතු කම්‍යතා-පටිසඞ්ඛානුපස්සනා - සඞ්ඛාරුපෙක්ඛා - අනුලොම යන නව මහා විදර්ශනාඥානයන් සම්පූර්ණවීමෙන් **පටිපදා ඤාණ දස්සන විසුද්ධිය** ලැබූහ. එය මහානාණන්ගේ ලොකොත්තර මාගීඥානයට බැසීමේ මාගීය විය.

අවසානයෙහි "ආසවක්ඛය කරඤාණ"යෙන් සකල කෙලෙශයන් ප්‍රහීන කිරීමෙන් සියලුම ඤාණයන්ගෙන් හා ගුණයන්ගෙන් පරිපූර්ණ වූ සේක්; සම්‍යක් සම්බෝධි සමධිගමය කළ සේක. එය මහසත්-තුමාගේ **ඤාණ දස්සන විසුද්ධිය** හා ප්‍රඥා ශික්ෂාවේ අවසානයද විය

මෙසේම කායද්වාරික-වාග්ද්වාරික් සඞ්ඛත චිත්තකර්ම කිලෙස-යන් සීල විසුදධියෙහි දී **තදඞ්ග ප්‍රහාණයෙන්ද;** නීවරණ ධර්ම සඞ්ඛ්‍යාත පරියුට්ඨාන කිලෙසයන් චිත්ත විසුදධියෙහිදී විෂකම්භණ ප්‍රහාණයෙන්ද; අනුශය කෙලෙශයන් ආර්‍ය මාගීඥාන බලයෙන් සමුච්ඡේද ප්‍රහානයෙන්ද ප්‍රහීන කළ මහසත්තුමෝ ආර්‍ය ඵලඥාණ බලයෙන් කෙලෙසුන්ගේ උණුසුම ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාණයෙන් නිවා දැමූහ.

ගසක් උදුරා දමා එහි මුලද ගින්නෙන් දවා පසුව එහි උණු-සුම නිවීමට ජලය වත්කිරීමක් මෙන් මාගීඥාන බලයෙන් ප්‍රහීන කළ කෙලෙසුන්ගේ උණුසුම (රස්නය) ඵලඥාණ බලයෙන් නිවීයයි. අසඞ්ඛ්‍යාත ධාතු සඞ්ඛ්‍යාත අමෘතමහා නිර්වාණ ධාතුව ප්‍රතිවෙධ කිරීමෙන් සියලුම කම්මභව-උපපත්ති භවයන් ප්‍රහීන කිරීම **නිඃශරණ** ප්‍රහානය වේ.)

"මාර විජය" කළ අයුරු

ප්‍රථම යාමයෙහිදී:—පූර්ව්වේනිවාසානුස්මෘතිඥාන ප්‍රතිලාභය ඒ "මාර විජයට" පැමිණි මහබෝසතුන් වහන්සේ ප්‍රථම කොට ආනාපාන සති කම්මට්ඨාන වශයෙන් ප්‍රථම දවිතීය තෘතීය චතුර්ථ යන ධ්‍යානයන් ලැබූ සේක. නැවත චතුර්ථ ධ්‍යානයෙන් නැගී සිට ඒ ධ්‍යානාරම්මණයෙන් (මෙහිදී ධ්‍යානාරම්මණය වූයේ ආශ්වාස ප්‍රශ්වාස වායුයයි.) ඉවත්කොට පෙර වූ සූ කඳපිළිවෙල අතට මෙහෙයවූ සේක. මෙසේ අතීත ජාතීන් සිහිකරණ සේක් අනෙක කෙළ දහස් ගණන් ජාතීන් නඩාකාරයෙන් දුටු සේක. බෝ මැඩ වප්‍රාසනාරූඪව වැඩහුන් නැන් පටන් ක්‍රමයෙන් ආපසු දීපඞ්කර පාද මූලය දක්වාද; වාග්-ප්‍රණිධාන- මනෝ ප්‍රණිධාන පුරන්ට ආරම්භ කළ දූරෙ නිදාන මහා නිදාන ආදී කාලයන් තෙක්ද; අතීතයෙහි නොයෙක් කල්ප අසඞ්ඛ්‍යයන් පිළිබඳ ජාතීන්ද මනාසේ දුටහ. පෙර විසූ කඳපිළිවෙල වසා ලන මෝහය බිඳී යාමෙන් ප්‍රථම යාමයෙහි මහබෝසතාණන් වහන්සේට පූර්ව්වේනිවාසානුස්මෘතිඥාන ප්‍රතිලාභය ඒය.

නමන් වහන්සේ බුදුවූ දින ප්‍රථම යාමයෙහි මෙසේ ඉපෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ලැබූ බව සම්බුද්ධත්වයෙන් පසුව එක් කලක තථාගතයන් වහන්සේ වෙරඤ්ජා නම් බමුණෙකුට මෙසේ වදාළ සේක.

"සෝ එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදු භූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහාරමෙසිං. සෝ අහං අනෙක විහිතං පුබ්බ නිවාසං අනුස්සරාමි. සෙය්‍යථිදං? එකම්පි ජාතිංචෙපි ජාතියෝ තිස්සොපි ජාතියෝ චතස්සොපි ජාතියෝ පඤ්චපි ජාතියෝ දසපි ජාතියෝ වීසතිම්පි ජාතියෝ තිංසම්පි චත්තාලීසම්පි පඤ්ඤාසම්පි ජාතියෝ ජාති සතම්පි සහස්සම්පි අනෙක සංවට්ට-කප්පෙ අනෙකවිවට්ට කප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ අමුත්‍රාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එව මාහාරෝ එවං සුඛං දුක්ඛ පටි සංවෙදී එවමායුපරියන්තෝ සෝ තතෝ චුතෝ අමුත්‍ර උප්පාදිං තත්‍රාපාසිං එවං නාමෝ එවං වණ්ණෝ එවං ගොත්තෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායු පරියන්තෝ සෝ තතෝ ඉධූපපන්නොනි; ඉතිසාකාරං සඋද්දෙසං අනෙක විහිතං පුබ්බ නිවාසං අනුස්සරාමි. අයං බොමෙ බ්‍රහ්මණ රත්තියා පඨමෙ යාමෙ ඨඨමා විජ්ජා අධිගතා අවිජ්ජා විහතා උප්පන්නා තමෝ විහතෝ ආලොකෝ උප්පන්නෝ යථා තං අප්පමත්තස්ස ආතාපිතෝ පහි-

නත්ථසස විහරතො. අයං බො මේ බ්‍රාහමණ පඨමාභිනිබ්බිදා අහොසි. කුක්කුටච්ඡාපකසෙසව අණ්ඩකොසමහාති." (අට්ඨකඛුත්තර වෙරඤ්ජ සුත්තං)

බ්‍රාහ්මණය මෙසේ (රූපාවචර චතුර්ථධ්‍යාන සමාධියෙන්) සිත එකඟවූ කල්හි; (උපෙක්ෂාවෙන් හටගත් සමාධි පරිශුද්ධිය ඇති බැවින්) පිරිසිදුවූ කල්හි; (පිරිසිදු බැවින්ම) ප්‍රභාස්වරවූ කල්හි; [සුඛ වෙදනාව සොම්නසටද සොම්නස රාගයටද දුඃඛ වෙදනාව දොම්නසටද දොම්නස දොෂයටද කාරණවන බැවින් ඒ සුඛාදීන්ට කාරණවන රාග දොෂයන් විෂ්කම්භණ වශයෙන් ප්‍රහීන කිරීම නිසා] පහවූ රාගාදී අඛහන ඇති කල්හි; [එහෙයින්ම] පහවූ උපක්ලෙශයන් ඇති කල්හි; [මනාසේ ප්‍රගුණ බවට පැමිණීම නිසා මනාකොට මැඩ ගන්නා ලද සම්කඛක් මෙන්ද මනාකොට පදම් කර ගන්නා ලද ලා රසයක් මෙන්ද] මොලොක්වූ කල්හි; එහෙයින්ම මනාසේ පිඛදවා උණු කරවා ගන්නා ලද සවණීයක් මෙන් ධ්‍යාන) කර්මයට යෝග්‍යවූ කල්හි; (ඒ පරිසුද්ධ පරියොදාත ආදියෙහි මනාකොට) පිහිටි කල්හි; (එහෙයින්ම) නොසැලෙන බවට පැමිණි කල්හි පූර්වයෙහි ඒ ඒ ජාතියෙහි පහළව තුබූ සකඛ පරම්පරාව මෙතෙහි කිරීමේ නුවණ උපදවා ගැනීම පිණිස සිත එහි නැමීම්. (යොමු කෙළෙම්.) ඒ මම (භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති-සත්තාවාස ආදීන්ගේ වශයෙන්) නානාප්‍රකාරවූ අනන්තරයෙහි ඉක්ම ගිය භවය පටන් ඒ ඒ භවයෙහි පහළවූ සකඛ පරම්පරාව සකඛ පරිපාටියෙන් හෝ ව්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් හෝ නුවණින්. පසුපසුව ගොස් සිහිකෙළෙම්. එනම් එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, සිහි කෙළෙම්. ඒ කෙසේද;-අසවල් සංවර්ත කල්පයෙහි ඒ මම කාමභවාදී මෙනම් භවයක හෝ අණ්ඩජාදී මෙනම් යෝනියක හෝ දිව්‍ය මනුෂ්‍යාදී මෙනම් ගතියක හෝ නානත්තකාය නානත්තසඤ්ඤාදී ආදී මෙනම් විඤ්ඤාණට්ඨිතියක හෝ මෙනම් සත්ත්වාවාසයක හෝ ක්ෂත්‍රිය බ්‍රාහමණාදී මෙනම් සත්ත්වනිකායක හෝ මෙනම් ඇත්තෙක් වීම්, මෙනම් ගොත්‍ර ඇත්තෙක් වීම්, මෙබඳු වර්ණ ඇත්තෙක් වීම්, මෙබඳු ආහාර ඇත්තෙක් වීම්, මෙබඳු සැපදුක් විඳින්නෙක් වීම්, මෙබඳු ආයු කෙළවරකොට ඇත්තෙක් වීම්, ඒ මම ඒ භවයෙන් හෝ -පෙ- ඒ සත්ත්ව නිකායෙන් හෝ චුතවූයෙම් අසවල් කාමභවයෙහි හෝ -පෙ- සත්ත්වනිකායෙහි හෝ උපන්නෙම්.

එහිදු මෙනම් ඇත්තෙක් වීම්; -පෙ- මෙබඳු ආයු කෙළවර කොට ඇත්තෙක් වීම්; ඒ මම ඒ භවයෙන් හෝ -පෙ- **ඒ සත්තීකායෙන්** හෝ චුතවූයෙම් මෙහි උපන්නෙමි' මෙසේ නාම ගොත්‍ර වශයෙන් ආකාර සහිතවූද වණ්ණාදි වශයෙන් උදෙසීම් සහිතවූද, **තන්වැදෑරුම්වූ පෙර විසූ කඳපිළිවෙල සිහිකරම්.**

බ්‍රාහ්මණය! මේ වතාහී මාගේ (බුදුවූ දින) ප්‍රථම යාමයෙහි **පහළවූ සූළේනිවාසානුසමෘතිඥාන** සඞ්ඛ්‍යාතවූ ප්‍රථම විද්‍යාවගේ පහළ වීමයි. මෙයින් පෙර වූසූ කඳපිළිවෙල වසාලන අවිද්‍යාව දුරුවිය. ප්‍රථම විද්‍යාව උපන්නීය. අන්ධකාරය දුරුවීය. ආලෝකය උපන්නේය. අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍යයී ඇති නීවන් පිණිස මෙහෙයවූ සිත් ඇති කෙනෙකුට පහළවන විද්‍යාඥානයක් වේද එය මට මැනවින් පහළවිය. බ්‍රාහ්මණය! මේ වතාහී මගේ ප්‍රථම බිඳීම විය. යම්සේ කුකුලු පැටවෙක් සිය අණ්ඩකෝෂය බිඳගෙන බිහිවේද එමෙන් මගේද මෙබඳු අවිද්‍යා සඞ්ඛ්‍යාත අණ්ඩකෝෂයෙහි බිඳීම විය.''

මෙසේ පෙර විසූ කඳපිළිවෙල දන්නා නුවණින් පෙර වූසූ කඳපිළිවෙල බලන මහබෝසතාණන් වහන්සේ ඒ ඒ භවයන්හි පරම්පරා වශයෙන් පැවති නාම-රූප ධර්මයන්ද ඒ නාම-රූප පරම්පරාව පිළිබඳවූම චක්ෂුරාදී ද්වාරයන්හි නානාප්‍රකාර චකුවිඤ්ඤාණාදී විඥප්තීන්ද හටගනිමින් බිඳෙමින් පවත්නා අයුරු මනාසේ දුටුසේක. **ඉපද ඉපදී නැසි නැසී** යන පහන් සිළු මෙන්ද නොසිඳී ගලායන නදී ශ්‍රෝතයක් මෙන්ද, **ඉපද ඉපදී පැවති පැවතී බිඳි බිඳී** සන්තති වශයෙන් පවත්නා නාම-රූප ධර්ම පරම්පරාවද යථාභූත නුවණින්ම දුටුසේක. එයින් මහතාණන්ගේ **දිට්ඨිවිසුද්ධි සම්පාදනය** විය.

ප්‍රකීර්ණක විවරණ:—මේ ''පෙරවූසූ කඳපිළිවෙල දන්නා නුවණ'' චතුර්ථ-පඤ්චම ධ්‍යාන ලැබූ කවරෙකු විසින් උවද උපදවනු ලැබිය හැකිය. එහෙත් එහි වෙනස්කමද ඇත්තේය. කර්මය හා කර්මඵලයද අදහන; නෙක්ඛම්ම-අව්‍යාපාද-අවිහිංසා යන සම්‍යක් කල්පනාවන් ඇති; මනාසේ ක්‍රමානුකූල යෝග භාවනාවන්ගෙන් චිත්තසමාධිය (චතුර්ථධ්‍යානය හෝ පඤ්චක නයින් පඤ්චමධ්‍යානය) ලැබූ; අන්‍ය තීර්ථකයෝද ඉදින් අභිඥාවන් උපදවා ගත්තාහු නම් ඔවුහුද පෙරවූසූ කඳපිළිවෙල සිහිකරති. (පෙරවූසූ කඳපිළිවෙල දන්නා නුවණද අභිඥාවන්ගෙන් එකකි.) එහෙත් අන්‍යතීර්ථකයෝ කල්පාසතලිසක්ම සිහිකරති. ඉන් වැඩියක් සිහිකළ නොහෙති. එසේම ඔවුහු සකල පරිපාටියෙන්ම සිහිකරති. චුති-පටිසන්ධි වශයෙන් සිහි

නොකරති. අඞ්ගයන්ට කැමති පෙදෙසකට පැමිණීමට ශක්තිය නැතුවාක් මෙන්ම අන්‍යතීර්ථකයන්ටද කැමති භවයක් සිඟිකරන්ට නොපිළිවන. සැරයටි කොණ අත්නොහැරම සැරයටි කොණ අනුවම යන අඞ්ගයා මෙන් අන්‍යතීර්ථකයාද සකාඞ්ගපරිපාටිය නුමුදුම පිළිවෙළින් සිඟිකරත්. තවද තීර්ථකයින්ගේ පෙරවුසූ කඳපිළිවෙළ දන්නා නුවණ කඳෙපැණියන්ගේ ආලෝකය මෙන් එලඹ සිටිනේය.

මෙසේම මේ නුවණ ඉපදවූ "ප්‍රකෘති තථාගත ශ්‍රාවකයෝ" සකාඞ්ග පරිපාටිය වශයෙන්ද චුති-පටිසන්ධි වශයෙන්ද පෙරවුසූ කඳපිළිවෙළ සිඟිකරත්. එසේම මහා කල්ප සියයක්ද දහසක්ද; අත්වැල් සහිත ඒදණ්ඩක ගමන් කරන්නාක් මෙන් පහසුවෙන් සිඟිකරත්. මේ පෙරවුසූ කඳපිළිවෙළ දක්නා නුවණ (ප්‍රකෘති) ශ්‍රාවකයින්ට පහන් ආලෝකයක් මෙන් එලඹ සිටියි. අසුමහා-ශ්‍රාවකයෝද සකාඞ්ග පරිපාටියෙන් හා චුති-පටිසන්ධි වශයෙන් සිඟිකරති. උන්වහන්සේලා කල්ප ලක්ෂයක් සිඟිකරන්නාහුය. පදික මාගීයෙක [අඞ්ගාරක] ගමන් කරන්නාක් මෙන් වඩාත් පහසුවෙන් සිඟිකරත්. එසේම උන්වහන්සේලාට පෙරවුසූ කඳපිළිවෙළ එලඹ සිටින්නේ "හුලු එලියක්" මෙනි.

ඒකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පුරණලද පාරමී ඇති අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේ ඒකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක්ම සිඟිකරත්. සකාඞ්ග පරිපාටිය වශයෙන් නොව චුති-පටිසන්ධි වශයෙන්ම සිඟිකරත් එක් ආත්මභාවයක්හුගේ චුතිය දැක ඉක්බිති පටිසන්ධිය දක්නාහුය. නැවත අනික් ආත්මභවයක්හුගේ චුතිය හා පටිසන්ධිය දක්නාහුය. මෙසේ අගසවු දෙනම චුතිපටිසන්ධි වශයෙන් "කුඩා රියමඟක. ගමන සෙයින්" පහසුවෙන්ම සිඟිකරත්. තවද උන්වහන්සේලාට පහන් තරුවක එලියක් මෙන් පෙරවුසූ කඳපිළිවෙළ දන්නා නුවණ එලඹ සිටියි.

දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පුරණලද පාරමී ගුණ ඇති පසේ-බුදුන් වහන්සේලාගේ පෙරවිසූ කඳපිළිවෙළ දන්නා නුවණින් උන්වහන්සේලා දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක්ම සිඟිකරණසේක. සඳ එලිය මෙන් එලඹ සිටින ඒ නුවණින් උන්වහන්සේ දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පහසුවෙන් "මහා රියමඟක ගමනක්" සෙයින් අතීත ජාතීන් චුති-පටිසන්ධි වශයෙන් සිඟිකරණසේක.

මෙය උසස් අයුරින්ම පිහිටන්නේ ලොව්තුරු බුදුවරයින් වහන්සේලාටය. සරත් කාලයෙහි මහදවල් බබලන සූර්‍යයා මෙන් උන්වහන්සේලාට එලඹ සිටින මේ නුවණින් උන්වහන්සේලා කාල

පරිවෙජ්දයක් නොමැතිව අනන්ත කාලයක් දකින්නේකි. තවද සකක පරිපාටියක් හෝ චුති-පටිසන්ධියක්ද නැතිව නොයෙක් කල්ප කෙළගණන් අතුරෙහි යම්තැනක සිහිකරණු කැමැත්තාහුද ඒ ඒ ස්ථානය මනසේ ප්‍රකටව දක්නාහුය. "රිය ගමන්කරන මහා ප්‍රසිද්ධ පාරක ගමනක් සෙසින්" අනන්තවූ සංවට්ටකප්ප-විවට්ට කප්ප ආදී කල්පයන් පිළිබඳ ජාතීන් ආවජ්ජනා කළ ක්ෂණයකින්ම දක්නාසේක.

මේ නුවණ ලබනු කැමති ආදි කාර්මික භික්ෂුව විසින්:— දවල් දානය වැළඳීමෙන් පසු රහොගතව විවේකස්ථානයකට එළඹ පිළිවෙළින් චතුර්ථධ්‍යානයට සමවැද අභිඥාපාදක චතුර්ථධ්‍යාන-යෙන් (මේ වතුසකනය වශයෙනි. පඤ්චක නයින් නම් පඤ්චම-ධ්‍යානයෙන්) නැඟී; එහි අනන්ත හිදගැණීම සිහිකළ යුතුයි. අනතුරුව අසුන පණවා ගැණීමද; සෙනසුනට පැමිණීමද, පාසිවුරු තැන්පත්කර තැබීමද; ආහාර වැළඳු කාලයද; ගම්න් ආ කාලයද ගමෙහි පිඬු පිණිස හැසුරුණු කාලයද; විහාරයෙන් නික්ම ගිය කාලයද; චෙතියඞ්ගණ බෝධියඞ්ගණ වැන්ද කාලයද; පාත්‍ර සේදූ කාලය ආදී වශයෙන් ගතවූ සියල්ල ප්‍රතිලෝම වශයෙන් (ආපසු) සිහිකළ යුතුය. තවද මුව දෙවීම දක්වා අලුයම කළ කටයුතුද; ඉක්බිති ගතවූ දින මධ්‍යම යාමයෙහි හා ප්‍රථම යාමයෙහි කළ කටයුතුද අනුලෝම වශයෙන් ආපසු මෙනෙහි කළයුතුය. ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය ඇති මනා සිහියෙන් යුත් යෝගාවචරයාගේ ප්‍රකෘති සිතටද මේ කරුණු හොඳින් ප්‍රකටව වැටහෙයි. පරිකර්ම සමාධි ඇති උපදවා ගත් ධ්‍යාන බල ඇති යෝගාවචරයාගේ සමාධි සිතව මේ කරුණු හොඳින්ම ප්‍රකටව වැටහෙයි. යම්තැනක් සිහියට නොනැගේ නම් එහිදී පාදක ධ්‍යානයට සමවැද එයින් නැඟී නැවත සිහිකළ යුතුය. එසේ කරණකල පහන් එලියකින් මෙන් පෙනෙන්නේය.

මෙසේ ප්‍රතිලෝම වශයෙන් එයට පෙරදවසද; එයටත් පෙර දවසදැයි පිළිවෙළින් දෙවෙනි තෙවෙනි සිවුවෙනි පස්වෙනි දින ආදී වශයෙන් අතීතය සිහිකරන්නේය. මේ ක්‍රමයෙන් වර්ෂය දෙවර්ෂය පඤ්චවර්ෂය දශවර්ෂය ආදී වශයෙන් ගොස් අන්තිමයේදී මේ භවයේ බිහිවුනු කාලයද අනතුරුව මේ භවයේ ප්‍රතිසන්ධි අවස්ථාවද සිහි කරන්නේය. නමුත් මේ භවයේ ප්‍රතිසන්ධිය දුක්ම පෙරඹුණු කඳපිළිවෙල දුක්ම නොවේ. මේ භවයේ ප්‍රතිසන්ධියෙන් යව අනතුරු භවය පිළිබඳ චුතික්ෂණයෙහි පැවති නාම-රූපයන් සිහි

කෙළේ නම් එය "පෙරවිසූ කඳපිළිවෙළ දන්නා නුවණ" වේයි. "තිකඛපඤ්ඤ" භික්ෂුව ප්‍රථම වාරයෙහිදීම අනතුරු භවයෙහි චුතිය දකියි. (මෙහිදීද ඇතැමෙක් ප්‍රථමයෙන් රූපයද ඇතැමෙක් නාමයද දකියි.)

මේ අනන්තර භවයෙහි චුතිය දැකීම ඉතා දුෂ්කරයි. එහෙයින් සිහි නොවතොත් "නොබැරිය" යි නොසිතා නැවත නැවතත් පාදක ධ්‍යානයට සමවැද සිහිකළ යුතුයි. ගසක් කපන තැනැත්තේ ගස බොහෝදුර කපා පොරොව මොටවූ කල්හි නැවත නැවතත් ආවුධ මුවහත්කොට ගෙණ ගස කපා හෙලන්නේද එසේම යෝගාවචර තෙමේ නැවත නැවතත් පාදක ධ්‍යානයට සමවැද අනතුරු භවයෙහි චුතිය සිහිකරන්නේය.

මෙහි පූර්වෝක්තාකාරයෙන් හිඳගෙණ සිටි තැන් පටන් මේ භවයේ මූලික ප්‍රතිසන්ධි සිත තෙක් ගතවූ නාම-රූපයන් අරමුණු කරගෙණ පවත්නා ඤාණය පූර්වේනිවාසානුස්මෘතිඥානය නොවේ. එය පූර්වේනිවාසානුස්මෘතිඥානයට පරිකර්ම භාවයෙන් ප්‍රවෘත්ත සමාධිය හා සම්ප්‍රයුක්ත බැවින් "පරිකර්මසමාධි ඥානය" නම් වේ. මේ සමාධි ඥානයට ඇතැමෙක් "අතීතංසඤ්ඤාණය" යි කියනත් ඒ නම මෙයට නුසුදුසු බව විසුද්ධිමාර්ගයෙහි දක්වෙයි. අතීතංසඤ්ඤාණය රූපාවචරය. මේ සමාධි ඥානය කාමාවචරවේ. එහෙයිනි.

මෙසේ ක්‍රියාකරන භික්ෂුවට මේ භවයේ ප්‍රතිසන්ධික්ෂණය ඉක්ම අනතුරු භවයෙහි චුතික්ෂණයෙහි පැවති නාම-රූපයන් පෙනේද ඒ නාම-රූපයන් අරමුණු කරගෙණ රූපාවචර චිත්තවීථියක් පහළ වේ. එහිදී මනොද්වාරාවර්ජනය ඉපිද නිරුද්ධවූ පසු යටකී නාම-රූපයන්ම අරමුණු කරගෙණ මන්දපඤ්ඤයාට නම් පරිකර්ම උපචාර-අනුලෝම-ගොත්‍රභූ යන කාමාවචර ජවන සතරද; තික්ඛපඤ්ඤයාට නම් උපචාර-අනුලෝම-ගොත්‍රභූ යන ජවන් තුනද පහළවෙත්. අනතුරුව "රූපාවචර චතුත්ථඣානික අප්පණා චිත්තය" පහළවේ. එහි පවත්නා ප්‍රඥාව "පෙරවූසූ කඳපිළිවෙළ දන්නා නුවණ" වේ. ඒ ප්‍රඥාවෙන් යුක්තවූ සිහියෙන් ජාති දෙකක් හෝ තුනක් ආදී වශයෙන්ද සංවට්ට විවට්ට කල්ප ආදී වශයෙන්ද අතීතය සිහි කරන්නේය.)

පූර්වෝක්තාකාරයෙන් මහබෝසතුන් විහරන්සේ; (පුරණලද පාරමී බලයෙන්) මධ්‍යාහ්නයෙහි සූර්යාලෝකය මෙන් එලබ සිටි "පෙරවූසූ කඳපිළිවෙළ දන්නා නුවණින්" තමන්වහන්සේ පිළිබඳ අතීතවූ ජාතිවල අනන්තවූ සංවට්ට-විවට්ට කල්පයන්හි

පැවතී නාම-රූප-ධම්-සන්තතිය දුටුවේක. "සකාය" වශයෙන්ද; චුති-පටිසන්ධි වශයෙන්ද දක්නාලද නාම-රූප-ධම්-සන්තතිය පිළිබඳ සම්මසංඥව හා **සත්කාය** දෘෂ්ටියද විෂ්කම්භණ වශයෙන් දුරුකළ හේක. එහෙයින්ම **දිට්ඨි විසුද්ධියද** සම්පාදනය විය.

"සක්කාය දිට්ඨිය" යනු කිම? **විභඞ්ගයෙහි** මෙසේ වදාළහ. **තත්ථ කතමා සක්කාය දිට්ඨි?** ඉධ අස්සුතවා පුථුජ්ජනෝ අරියානං අදස්සාවී අරිය ධම්මස්ස අකෝවිදෝ, අරියධම්මෙ අවිනීතෝ සප්පුරිසානං අදස්සාවී සප්පුරිස ධම්මස්ස අකෝවිදෝ, සප්පුරිස ධම්මෙ අවිනීතෝ **රූපං** අත්තතෝ සමනුපස්සති; රූපවන්තංවා අත්තානං; අත්තනිවාරූපං; රූපසම්වා අත්තානං; **වෙදනා**ං අත්තතෝ සමනුපස්සති; වෙදනාවන්තංවා අත්තානං; අත්තනිවා වෙදනං; වෙදනායසම්වා අත්තානං; **සඤ්ඤං** අත්තතෝ සමනුපස්සති; සඤ්ඤාවන්තංවා අත්තානං; අත්තනිවා සඤ්ඤං සඤ්ඤායසම්වා අත්තානං; **සඞ්ඛාරා** අත්තතෝ සමනුපස්සති; සඞ්ඛාරවන්තංවා අත්තානං; අත්තනිවා සඞ්ඛාරා; සඞ්ඛාරෙසුවා අත්තානං; **විඤ්ඤාණං** අත්තතෝ සමනුපස්සති; විඤ්ඤාණවන්තංවා අත්තානං; අත්තනිවා විඤ්ඤාණං විඤ්ඤාණසම්වා අත්තානං යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහණං දිට්ඨිකන්තාරෝ දිට්ඨිවිසූකායිතං දිට්ඨි විපඵන්දිතං දිට්ඨිසංයෝජනං ගාහෝ පතිට්ඨාහෝ අභිනිවෙසෝ පරාමාසෝ කුම්මග්ගෝ මිච්ඡාපථෝ මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහෝ අයං වුච්චති **සක්කාය දිට්ඨි**-(**විභඞ්ග**)

"එහි සක්කාය දිට්ඨි යනු කවරේද? මේ ලෝකයෙහි ආගම-අධිගම අභාවයෙන් අශ්‍රැතවත්වූ; බුද්ධ-පච්චෙකබුද්ධ-බුද්ධසාවක සම්මතයන් ආර්‍යයන් නොදක්නාවූ; සතර සතිපට්ඨානාදී ප්‍රභේද ඇති ආර්‍යධම්මයෙහි නොහික්මුනාවූ; බුද්ධ-පච්චෙකබුද්ධ-බුද්ධ-සාවක සම්මතයන් සත්පුරුෂයන් නොදක්නාසුලුවූ; **සත්පුරුෂ** ධම්මයෙහි අදක්ෂවූ; සත්පුරුෂ ධම්මයෙහි නොහික්මුනාවූ; **පෘථග්ජන** තෙමේ **රූපය** ආත්මය වශයෙන් දකියි. යම් රූපයක් **මේනම්** හේ මම වෙමි; මම යමෙක් නම් හේ රූපයයි මෙසේ රූපයද තමාද එකක් කොට දකියි. ආත්මය කෙරෙහි රූපය වේයයි දකියි. රූපය කෙරෙහි ආත්මය වේයයි දකියි.

වේදනාව ආත්මය වශයෙන් දකියි. යම් වේදනාවක් **මේනම්** ඒ මම වෙමි. මම යමෙක් නම් ඒ වේදනාවයි. මෙසේ මේ **වේදනාව** හා තමා එකක් කොට දකියි. ආත්මය කෙරෙහි වේදනාව **වේයයි** දකියි. වේදනාව කෙරෙහි ආත්මය වේයයි දකියි.

සංඥාව ආත්මය වශයෙන් දකියි. යම් සංඥාවක් වේනම් නෝ මම වෙමි මම යමෙක් නම් හෝ සංඥාව යයි සංඥාවද තමාද එකක් කොට දනියි. ආත්මය කෙරෙහි සංඥාව වේයයි දනියි. සංඥාව කෙරෙහි ආත්මය වේයයි දනියි.

සංඝස්කාරයන් ආත්මය වශයෙන් දකියි. යම් සංඝස්කාරයක් වේනම් ඒ මම වෙමි. මම යමෙක් නම් ඒ සංඝස්කාරය වේයයි මෙසේ සංඝස්කාරයන් හා තමා එකක් කොට දනියි. ආත්මය කෙරෙහි සංඝස්කාරයන් වේයයි දකිමි. සංඝස්කාරයන් කෙරෙහි ආත්මය වේයයි දනියි.

විඥානය ආත්මය වශයෙන් දනියි. යම් විඥානයක් වේනම් ඒ මම වෙමි. මම යමෙක් නම් ඒ විඥානයයි මෙසේ විඥානය හා තමාද එකක්කොට දනියි. විඥානය කෙරෙහි ආත්මය වේයයි දනියි.

මෙබඳු යම්කිසි **විපරීත** දෘෂ්ටියක් වේනම්– **මිථ්‍යාග්‍රහණයක්** වේනම් එය **සක්කාය** දිට්ඨිය නම් වේ."

මේ තථාගත දෙශනා නයින් **සක්කාය** දිට්ඨිය යනු කුමක්දැයි විස්තර ලෙස දැනගත හැකියි. රූප – **වේදනා** – **සඤ්ඤ** – **සඞ්ඛාර** – **විඤ්ඤාණ** යන **සතර පඤ්චකය** කෙරෙහි ඇති කරන ආත්ම සංඥාව – ආත්ම දෘෂ්ටිය **සක්කාය** දිට්ඨිය නමින් වදාළ සේක. **පඤ්චස්කන්ධය පිළිබඳ** නියම තතු නොදන්න අඥබාල අඥානයෝ පඤ්චස්කන්ධය තුළ **ආත්මයක්; ජීවයක්;** ඇතැයි කියති. වේදනා **ස** **ඤ්ඤ**– සඞ්ඛාර – විඤ්ඤාණ යන ප්‍රභේද ගතවූ නාමයේ බලයෙන් රූපස්කන්ධය ක්‍රියා කරයි. ඒ නාම – රූප දෙකම ඇතිවෙමි (විනාශවීම නෙක්) පැවති පැවතී; බිඳි බිඳී; යන සන්නතියකි. එහි තුළ ක්‍රියා කරන කරවන යම්කිසි ජීවයක්–ආත්මයක් බල වේගයක් හෝ හුදු නොවෙනස් වන සභාවයක් නැත.

තථාගත ධර්මය දැනගත් බෞද්ධයාට ආත්ම දෘෂ්ටිය බොහෝ සෙයින් අඩු වෙතත් සම්පූර්ණ යෙන්ම ආත්ම දෘෂ්ටිය දුරු වන්නේ සෝවාන් මගින්ය. ආත්ම දෘෂ්ටිය යනුද **සක්කාය** දෘෂ්ටිය යනුද එකමැයි. පරමාර්ථ වශයෙන් නම් දිට්ඨි චෛතසිකයයි. එහෙයින් **සක්කාය** දිට්ඨිය සෝවාන් මගින් නැසුවත් සෝවාන් **සකෘදාගාමී** – **අනාගාමී** – යන ආර්යීයන්ට මරණ භය ඇත්තේය. **අනාථ පිණ්ඩික** සිටුතුමන් මරණාසන්න මොහොතෙහි මරණ භයින් තැති ගැණුනු කල්හි **සාරිපුත්ත** මහතෙරණුවන් සිටුවරයාට **බණ** දෙසා භය දුරුකළ බව ධර්මයෙහි දක්වේ. භය නැත්තේ රහතුන්ට **ප්‍රහීණයි**. එයට හේතුව කිම? **සක්කාය** දිට්ඨිය සෝවාන් මගින්

නැසුනත් රහත් වනතුරු ලොභය පවත්නා නිසාය. ලොභය සමුච්ඡේද වශයෙන් දුරුකළ රහතුන් වහන්සේ කිසිම බියකරු අරමුණකින් බිය නොවනසේක.

සක්කාය දිට්ඨිය (ආත්ම දෘෂ්ටිය) විසිවැදෑරුම් වේ. ඒ මෙසේයි. රූප-වේදනා-සඤ්ඤා-සඞ්ඛාර විඤ්ඤාණ යන සකඬ පසෙහි එකි එකී සකඬයක් පාසා ආත්මදෘෂ්ටිය සතරාකාරයෙන් ගෙන බැලූ කල (4 x 5=20) විස්ස ලැබේ.

රූපඛන්ධයෙහි:—

(1) රූපය ආත්මය වශයෙන් දැකීම; වෘක්ෂයෙහි සෙවනැල්ල දැක මේ වෘක්ෂය සෙවනැල්ල සහිතයයි දක්නාක් මෙනි.

(2) "යම් රූපයක් වේනම් හේ මම වෙමි මම යමෙක් නම් ඒ රූපයයි." මෙසේ රූපය හා ආත්මය එකක් කොට දැකීම; ඇවිලෙන පහනෙහි ගිණිසිළුව යමක්ද වර්ණයද එයම වේ; වර්ණය යමක්ද ගිණි සිළුවත් එයම වේයයි දක්නාක් මෙනි.

(3) ආත්මය කෙරෙහි රූපය වේයයි දැකීම; මලෙහි සුවඳ ඇතැයි දක්නාක් මෙනි.

(4) රූපය කෙරෙහි ආත්මය වේ යයි දැකීම; කරඬුවෙහි මැණික හෝ කලගෙඩියෙහි ජලය හෝ දක්නාක් මෙනි.

වේදනා- සඤ්ඤා- සඞ්ඛාර- විඤ්ඤාණයන් පිළිබඳවද මේසේ සැලකීමෙන් විසිආකාර සක්කාය දිට්ඨිය ඇතිවේ. දිට්ඨිවිසුද්ධි සම්පාදනයෙන් මේ සක්කාය දිට්ඨිය දුරුවේ.

දිට්ඨිවිසුද්ධිය:—"සත්වයා" යන මේ සම්මුතියෙහි ඇත්තේ පරමාර්ථ වශයෙන් නාම-රූප දෙකයි. දිට්ඨිවිසුද්ධියක්- විසුද්ධ දැකීමක්- නැති සාමාන්‍ය ලෝකයා; නාම-රූප ධර්මයන් තමන්යයිද; තවත් නාම-රූප ධර්මයන් පිළිබඳ ඇසුවල් නැයාය අසුවල් පුද්ගලයාය අසුවල් සත්වයාය ආදී වශයෙන්ද ව්‍යවහාර කරයි. මිනිසා-දෙවියා-තිරිසනා-නිරිසතා ආදී වශයෙන් හැඳින්වෙන්නේ වෙන් වෙන්වූ නාම-රූප ධර්ම සමූහයක්ය. එසේම රූපාදී සකඬ පඤ්ච-ස්කන්ධයක්ය. මෙකී නාම-රූප; පඤ්චස්කන්ධ ආදීන් පිළිබඳ පිරිසිදු දැනීම දිට්ඨි විසුද්ධියයි. මේ දිට්ඨි විසුද්ධිය නැති කිසිවෙකුට නිවන් අවබෝධ නොවේ. සංස්කාර සඞ්ඛ්‍යාත නාම රූප - ඛන්ධ - ධාතු ආදීන් පිළිබඳ නියම දැනීමක් නොමැතිව නිලකුණු දැනීමක් නොවේ. නිලකුණු නුවණින් තොරව නිවන් දැකීමක් නැත. අවිද්‍යා

වූවත්ටද සීලවිසුද්ධිය චිත්තවිසුද්ධිය ලැබිය හැකි වෙතත් කිසිම අබෞද්ධයෙකුට කිසි කලක දිට්ඨිවිසුද්ධි උපදවනු නොහැකිසි. ඔවුන් තුළ ආත්ම දෘෂ්ටිය දැඩිලෙස ඇති හෙයිනි. කථාගත ධර්මය දැන ගැණීම නිසා බෞද්ධයාගේ සක්කාය දිට්ඨිය දුරු කරගණු හැකිසි.

දිට්ඨිවිසුද්ධිය ඉපදවිය හැක්කේ නාම රූපයන් පිළිබඳ සංක්ෂේප හෝ විස්තර වශයෙන් හෝ, නියම තතු දැන ගැණීමෙනි. ආධ්‍යාත්ම ධර්ම නාම – රූප වශයෙන් දෙකට බෙදූ මේ නාමය; මේ රූපය; නාමය රූපය නොවේ; රූපය නාමය නොවේ; නාමය අනිකෙක; රූපය අනිකෙක; මේ නාම රූප දෙකින් අන්‍යවූ සත්වයෙක් හෝ පුද්ගලයෙක් නැතැයි දැන ගැණීම සංක්ෂේප ක්‍රමයයි. එබඳු දැනීමක් ලැබීමට නාම-රූපයන් පිළිබඳ පරිචිත බුද්ධියක්-තියුණු නුවණක්-තිබිය යුතුය. උද්ඝටිතඥ – විපචිතඥ පුද්ගල ශ්‍රාවකයෝ එක්තරා ධර්ම කථාවක් අවශානයේ නාම රූපයන්ද බෙදූ නාම රූප පරිවෙජ්ද ඥානයද ලැබ නිලකුණු වඩා චතුසච්චන්‍යය ප්‍රතිවෙධ කරයි. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය ඇති "නෙය" පුද්ගලයෝ කලක් නිස්සේ පඤ්ඤාඡ්ජනිය ප්‍රගුණකොට ප්‍රතිපත්තියෙහිද් පිහිටා ඇදුරන් ආසුරෙන් දැනීම දියුණු කර ගනිත්. බුදු-පසේ බුදු වරයෝ පෙර මිසු කඳ පිළිවෙල දන්නා නුවණින් නාම රූපයන් වහා.පිරිසිඳ දක්නාහ. ක්ෂණයකින්ම නාම රූපයන් බෙදූ වෙන් කොට ඔවුන් පිළිබඳ ලක්ෂණ – රස – පච්චුපට්ඨාන – පදට්ඨානයන් දැක දිට්ඨිවිසුද්ධිය සම්පූර්ණ කරන්නාහ.

ලක්ෂණ – රස – පච්චුපට්ඨාන – පදට්ඨාන – වශයෙන් දැනගත් නාම රූපයන් සකාය – ධාතු – ආයතන වශයෙන් බෙදූ දැන ගැණීම දිට්ඨිවිසුද්ධිය ලබන විස්තර ක්‍රමයයි. පෙර මුසු කඳ පිළිවෙල දන්නා නුවණ උපදවා ගත් ධ්‍යාන ලාභීහු ඔවුන්ගේ අතීත ජාතීන් පිළිබඳ නාම රූපයන් දැක ඒ නාම රූපයන් පිළිබඳ ලක්ෂණාදිය බලා දිට්ඨිවිසුද්ධිය ලබන්නාහ. රූපාවචර – අරූපාවචර , ධ්‍යාන අෂ්ට සමාපත්ති උපදවා ගත් ධ්‍යානලාභීහු චිත්තාදි ධ්‍යානාඞ්ගයන් හා සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන් පිළිබඳ ලක්ෂණ – රස ආදිය නුවණින් බලා නාම රූපයන් හැඳින දිට්ඨිවිසුද්ධිය ලබත්. එසේද නොමැති සෙස්සෝ ඛන්ධ – ධාතු – ආයතනාදී වශයෙන් බෙදූ එක් එක් නාම-යෙක හා රූපයෙක ලක්ෂණාදිය වෙන් වෙන්ව බලා දිට්ඨිවිසුද්ධිය උපදවත්නාහ.

විස්තර ක්‍රමය: ධ්‍යාන සමාපත්ති ලබාගත් යෝගාවචරයා තෙව් සඤ්ඤා නාසඤ්ඤායතනය හැර සෙසු රූපාවචර අරූපාවචර ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයකට සමවැද ඉන් නැඟී

චිතක්ඛාදි ඛ්‍යාකාඛගයන්ද සෙසු සම්ප්‍රයුක්ත ධම්මයන්ද ලක්ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශයෙන් බලන්නේය. ("තත්ථ ඵුසතීති ඵස්සෝ සඞ්ගමං ඵුසන ලක්ඛණෝ. සංඝට්ටන රසෝ. සන්නිපාත පච්චු පට්ඨානෝ ආපාථගත විසය පදට්ඨානෝ" ආදී වශයෙන් නාම රූපයන් පිළිබඳ ලක්ඛණ-රසාදිය විශුද්ධිමාර්ගයෙහි විස්තර ලෙස ඇත්තේය. නියම විස්තර මෙහි ලියතොත් මෙවැනි ධම්ප්‍රසන්නක කීපයක් ඒ සඳහා ම ලිවිය යුතු බව සැලකන්න.) මෙසේ බලා ඒ සියලුම චිත්ත චෛතසිකයින් අරමුණට අභිමුඛව නැමෙන හෙයින් "නාම"යයි නිශ්චය කරයි. (මෙහි චිත්ත චෛතසික අරූපී ධම් සියල්ල නාම වශයෙන් සැලකිය යුතුයි.) ඉක්බිති ගෙය තුළ සජීවයෙකු දැක ඌ ලුහුබඳින්නෙක් ඌ වසන තැන දක්නාසේ යෝගාවචර තෙමේද මේ නාමය කුමක් ඇසුරු කොට කොහි ප්‍රවත්නේදැයි සොයන්නේ චිත්ත චෛතසිකයන්ට නිශ්‍රයස්ථානවූ හෘදය වස්තු රූපය දකියි. අනතුරුව ඒ හෘදය රූපය ඇසුරු කරන්නාවූ භූත රූපයන් හා සෙසු උපාදා රූපයන්ද දැක ඒ සියල්ල ශීතොෂ්ණාදියෙන් විකාරඛවට පැමිණෙන හෙයින් රූපන (නැසෙන) අර්ථයෙන් "රූප" යයි නිශ්චය කරයි. (මෙහි අටලොස් නිෂ්පන්න රූපයෝගණු ලැබෙත්) මෙසේ අරමුණට නැමෙන ලක්ෂණය ඇත්තේ "නාමය" කියාද; නැසෙන ලක්ෂණය ඇත්තේ රූපය කියාද; නාම රූපයන් විනිශ්චය කොට දැනගණී.

ඇතැම් යෝගාවචරයෙක් "චතුධාතු" වශයෙන්ද අනෙකෙක් "අට්ඨාරසධාතු" වශයෙන්ද, අනෙකෙක් "ද්වාදශායතන" වශයෙන්ද, ඇතැමෙක් "සකඛ" වශයෙන්ද නාම රූපය නිශ්චයකරයි.

වෙන් වෙන්ව පැවති කල්හි ක්‍රියාකාරී ශක්තියක් නැති මේ නාම-රූප දෙදෙනා එක්වීමෙන් "අඛ කොර දෙදෙනා එක්ව ගමන් කරන්නාක් මෙන්" යම් ඊම් හිඳීම් සිටීම් ආදී ඉරියව් පැවැත්වෙනු මිස එසේ පැවැත්වෙන වේග මාත්‍රයක් මිස ඉරියව් පවත්වන සත්ත්වයෙකු පුද්ගලයෙකු වශයෙන් සංසිඳුවා ගතයුත්තක් නොමැති බව නිශ්චය කරයි. තවද හුණ මිටි පසක් එකට බැඳ සිටුවූ කළ නොවැටී පවත්නාක් මෙන් පඤ්චඋපාදානස්කන්ධය එක්වූ කළ සංයෝග බලයෙන් පවත්නා බවද සලකයි.

මෙසේම ලෝකඨා විසින් සත්වයෙකු-පුද්ගලයෙකු වශයෙන් සලකනු ලබන මේ සවෙතනික ශරීරයෙහි කෙස්-ලොම්-නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩු, හෘදයමාංශ, අක්මා දලබු, බඩදිව, පපුමස, බඩවැල, අතුනු බහන් උදර, මල, හිස්මොළු, යන මේ කොටස් විස්ස තද ගති ඇති බැවින් පඨවීධාතු යයි කියාද;

පිත්, සෙම, සැරව, ලේ, ඛහදිය, මේද තෙල්, කඳුලු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳමිදුලු, මුත්‍ර, යන කොටස් දෙළස (ආබාධික) බැඳෙන හා වැගිරෙන ගතිය ඇති හෙයින් **ආපොධාතුයයි** කියාද;

එසේම ශරීරයේ උණුසුම් ඇතිකරන සන්තාපන තේජස; රූප ධාතූන් දිරවන ජීරාපන තේජස; දුහගති ඇතිකරන පරිඛයහක තේජස; ආහාර පැසවන පරිපාචක තේජස; යන සතරාකාර උෂ්ණය **තේජොධාතු** යයිද;

ශරීරය පිළිබඳව පවත්නා ඉක්කාව වමනය ආදිය ඇතිකරවන උද්ධඞ්ගම වාතය; මිලමූත්‍ර බැහැර කරවන අධොගම වාතය; කුසතුළ ඔබ වැලෙන් පිටත හැසිරෙන කුවජිසය වාතය; බඩවැල ඇතුලේ හැසිරෙන කොට්ඨාශය වාතය; ශරීරයේ සැමතැනම විසිරී ශරීරාවයවයන් ක්‍රියා කරවීමට අනුබල දෙන අඞ්ගමඞ්ගානුසාරී වාතය; ආශ්වාස ප්‍රශ්වාස වාතය, යන සය වැදෑරුම් වාත **කොට්ඨාශයන් වායොධාතු** නමින්ද නිගවය කරයි.

මෙසේ විසිවැදෑරුම් පඨවී ධාතූන්ද; දෙළොස් වැදෑරුම් ආපෝ ධාතූන්ද; සිව්වැදෑරුම් තෙජෝ ධාතූන්ද; සයවැදෑරුම් වායෝ ධාතූන්ද; හැර සත්වයෙකු හෝ පුද්ගලයකු නැතැයි දැනගත්තේය.

නැවත මේ පඨවී ආදී ධාතූන් එක එකක් පාසා වෙන් වෙන් වශයෙන් බලන්නේය. මේ කේශයෝ නම් ශරීරයේ පවත්නා **එක් පඨවී** ධාතු කොටසකි. එක් එක් කෙස් ගසක් පඨවී ධාතු කලාප සමූහයක්ය. එහිම ආපෝ ධාතු-තෙජෝ ධාතු-වායෝ ධාතු යන ධාතූන්ද ඇත්තේය. එසේම වණ්ණ-ගන්ධ-රස-ඔජා යන-ගති සතරද එහි ඇත්තේය. මෙසේ එක කෙස්ගසක "ශුද්ධාෂ්ටක" කලාප සමූහයක් ඇතිබව දක්නේය. මේ කෙස් ගස **සසම්භාර පඨවී** ධාතු නමැසිද එහි ඇති තදගතිය **පරමාණු පඨවී** ධාතු නමැසිද දන්නේය. පරමාණු වශයෙන් සලකන කල ධාතු සමූහයකට "කෙස්ගස" යන ප්‍රඥප්තිය යොදනු විනා පරමාණු වශයෙන් කෙස් ගස යන නමින් හැඳින්වෙන දෙයක්-සත්වයෙක්-ජීවයක්-ආත්මයක් නැතැයි දැනගන්නේය. නවද මේ සත්වශරීරයෙන් පිටත් තැන ගස්-ගල්-පළිත ආදියෙහි ඇති පඨවී ධාතුවෙහින් කෙස්වල **පවත්නා** පඨවී ධාතුවෙහින්, පඨවී ධාතු වශයෙන් සලකනකල වෙනසක් තැති බව දන්නේය. ගස්-ගල්-පළිතාදියද කෙස්ගස මෙන්ම පඨවී ආදී සියුම් ධාතු කලාප සමූහයක් බව මෙනෙහි කරන්නේය. **එවිට** ගස්-ගල්-පළිතාදියෙහි පවත්නා පඨවී ධාතුව සත්වයන්-පුද්ගලයන් නොවන්නාසේ කේශයෝයයි කියනු ලබන මේ පඨවී ධාතුවිද සත්වයෙක්-පුද්ගලයෙක් නොවේයයිද, ආත්මය නොවේයයිද, මම

හෝ-මගේ හෝ වශයෙන් නොසැලකිය යුතුයයිද දැනගන්නේය. ප්‍රධාන වශයෙන් තදබව ලක්ෂණකොට ඇති පඨවී ධාතු කලාප සමූහයක් බව මෙනෙහි කරන්නේය. ආත්ම දෘෂ්ටියෙන් තොරව මේසේ ධාතු වශයෙන් දැකීම දිට්ඨිවිසුද්ධියයි. ශරීරය පිළිබඳ සෙසු ලොම්-නිය දත් ආදී පඨවීධාතු කොටස් පිළිබඳවද මෙසේ නුවණින් මෙනෙහි කරන්නේය.

ආපොධාතු ගත කොටස් පිළිබඳව "මේ ශරීරයෙහි වැගිරෙන සඵභාවය ඇති පිත; ආපොධාතු කොටසකි. පරමාණු වශයෙන් බැඳුනකළ වැගිරෙන සඵභාවය ඇති ආපොධාතු කලාප සමූහයක් මිස "පිත" කියා ගතයුතු දෙයක් නැත. වැව්-ලිං පොකුණු ආදියෙහි පවත්නා ආපොධාතුවත්, පිතයයි කියන මේ ආපොධාතු-වත් ධාතු වශයෙන් එකමය. වැව්-ලිං-පොකුණු ආදියෙහි පවත්නා ආපොධාතුව සත්ත්වයෙක්-පුද්ගලයෙක් නොවන්නාසේ පිතයයි කියන මේ අභ්‍යන්තර ආපොධාතුවද සත්ත්වයෙක්-පුද්ගලයෙක් නොවේ. පිත ආපොධාතු කලාප සමූහයක් නිසා එය **සසම්භාර ආපොධාතුව** නම්. එහි ඇති වැගිරෙන සඵභාවය **පරමාණු ආපොධාතුව** නම්. එහෙයින් එය සත්ත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නොවේ. මම නොවෙමි. මගේද නොවේ." යනුවෙන් දැන ගන්නේය. මෙසේ සෙසු සෙම්-සොටු ආදී ආපොධාතුගති කොටස් පිළිබඳවද නුවණින් මෙනෙහි කරන්නේය.

මෙසේම තෙජෝධාතුගත කොටස් පිළිබඳවද "මේ ශරීරය පිළි-බඳව පවත්නා සන්තාපන - ජීරාපන - පරිපාචක - පරිඩයහක - යන ප්‍රභෙදගත තෙජෝ ධාතුවෙහිත් ශරීරයෙන් පිටත පවත්නා තෙජෝ ධාතු කලාපයන්හිත් වෙනසක් නැත්තේය. ඒ සියලුම තෙජෝ ධාතුහු උෂ්ණය සඵභාව කොට ඇත්තාහුය. මේ තෙජෝ ධාතුහුද උෂ්ණය සඵභාව කොට ඇත්තාහුය. මේ තෙජෝ ධාතුවද එකක් නොව තෙජෝ ධාතු කලාප සමූහයක්ය. අභ්‍යන්තරවූද බාහ්‍යවූද මේ සියලුම තෙජෝධාතුහු සත්ත්වයෝද පුද්ගලයෝද නොවෙති. මම නොවෙමි. මගේ නොවේ" ආදී වශයෙන් නුව-ණින් මෙනෙහි කරන්නේය.

වායෝ ධාතුව පිළිබඳවද මෙසේ දක්නේය. කෙසේදයත්; "මේ ශරීරය පිළිබඳව පවත්නා (උදඹගමාදී වශයෙන් දැක්වූ) වාත කොට්ඨාශයන්හිත් පිටත පවත්නා වාතයෙහිත් වෙනසක් නැත. යාම් ඊම් ඉඳීම් සිටීම් ආදී ඉරියව් පැවැත්වීමට අනුබල දෙන මේ වාතයෝ සත්ත්වයන් - පුද්ගලයින් - නොවන්නාසේ ශරීරය පිළිබඳ වාතයෝද සත්ත්වයෙක් - පුද්ගලයෙක් නොවේ. වායු ධාතු කලාප සමූහයකි. උඩුඹගමාදී සම්මුති වායු කලාපයන් විනා හුදු ආත්ම යක් හෝ ජීවයක් නැත" මෙසේ ලබන පිරිසිදු දර්ශනය දිට්ඨි-විසුද්ධියයි.

රූප ධාතු කොටස් පිළිබඳව මෙසේ දැනීම ලබාගත් පසු අනාතුරුව නාම ධාතුව පිළිබඳ දැනීම දියුණු කරගත යුතු වෙයි.

පෘථවී ආදී මේ ධාතු කලාපයන්ගෙන් සැදුම්ලත් මේ ශරීරයෙහි විඤ්ඤාණ ධාතුවක්ද ඇත්තේය. පෙනෙන්නේද ඇසෙන්නේද දැනෙන්නේද ක්‍රියා කරන්නේද ඒ විඤ්ඤාණ ධාතුව නිසාය. මළ සිරුරෙහි විඤ්ඤාණ ධාතුව නැති හෙයින් එහි ක්‍රියා කාරීත්වයක් නැත. විඤ්ඤාණ ධාතුව අරමුණ දැනගැනීම් අතීයෙන් එකක් වුවද උපදින ස්ථානවල හා ඉපදීමේ හේතු වශයෙන් චක්ඛු විඤ්ඤාණ - සොත විඤ්ඤාණ - ඝාණ විඤ්ඤාණ - ජිවහා විඤ්ඤාණ - කාය විඤ්ඤාණ - මනෝවිඤ්ඤාණ යයි සය‍ාකාරවේ.

චක්ඛුඃ ප්‍රසාදයත්; රූපාරම්මණයත් එකට ගැටීම නිසා චක්ඛු විඤ්ඤාණ සිත පහළවේ. මේ සිත පහළවූයේ ශරීරය පිළිබඳව පවත්නා විඤ්ඤාණ ධාතුවක් ඇති හෙයිනි. එයද හුදු එකම විඤ්ඤාණයක් නොව විඤ්ඤාණ පරම්පරාවකි. සන්තතියකි. එබඳු විඤ්ඤාණ පරම්පරාවක් ඇති හෙයින් චක්ඛුඃප්‍රසාදය හා රූපාරම්මණය එකට හැපීම නිසා "බෙර ඇස හා අත එකම ගැටීම නිසා ශබ්දයක් නැහෙන්නාසේ" ගැටුන වස්තුව පිළිබඳ දැනීමක් පහළවන්නේය. පෙනීමය, දැකීමය, කියන්නේ එබඳු ගැටීමක් නිසා ඇතිවූ විඤ්ඤාණයටයි. එයට චක්ඛුඃප්‍රසාදය දොරය කොට ඇතිවූ නිසා චක්ඛු විඤ්ඤාණයයි කියනු ලැබේ. පෙනුනේය, දැක්කේය, ආදී වශයෙන් ලෝක සම්මුතිය අනුව ව්‍යවහාර කරනත් බලන කෙනෙක් හෝ, පුද්ගලයෙක් නැත. බලන ආත්මයක් හෝ පුද්ගලයෙක් ඇතිනම් රූපාරම්මණ හමුනොවීම චක්ඛුවිඤ්ඤාණයෝ ඉපදිය යුත්තාහුය. එහෙයින් චක්ඛුවිඤ්ඤාණයෙහි අධිපතිකම් කරන ආත්මයක් නැත. ඒ ඒ චක්ඛුවිඤ්ඤාණයද ක්ෂණයකින් නිරුද්ධවෙයි. රූපයක් දෙස බොහෝ වේලා බලා සිටියොත් කෝටි ගණන් චක්ඛුවිඤ්ඤාණයෝ ඉපද නිරුද්ධවෙත්. ඇස් දෙක පියාගෙණ සිටියොත් කොපමණ රූපාරම්මණ ඇති වුවත් චක්ඛුවිඤ්ඤාණයෝ පහළ නොවෙත්. මෙසේ හේතූන්ගේ සංයෝගය නිසා පහළවනු මිස එබඳු හේතු සංයෝගයක් නැති තැන චක්ඛුවිඤ්ඤාණයෝද පහළ නොවෙත්. උපත් චක්ඛුවිඤ්ඤාණයන්ටද බොහෝ වේලා නැවතී සිටීමේ ශක්තියද නැත.

මෙසේ චක්ඛුප්පසාද-රූපාරම්මණ දෙදෙනාගේ සංඝට්ටණයෙන් චක්ඛුවිඤ්ඤාණයන්ද; සොත - ඝාණ - ජිවහා - කාය යන ප්‍රසාදයන් සමඟ ශබ්ද - ගන්ධ - රස ඵොට්ඨබ්බ යන ආරම්මණයන් ගැටීම් නිසා සොත - ඝාණ ජිවහා - කාය - යන විඤ්ඤාණයන්ද පහළවීම

බව දැනගන්නේය. ආරම්මණ - ප්‍රසාද දෙදෙනාගේ ඝට්ටනය නිසා විඤ්ඤාණ පහළවනු විනා බලන - අසන - රස විඳින - කෙනෙක් නැති බව දැන ගන්නේය. චක්ඛුරාදී පසළු ප්‍රසාදයන්ට රූපාදී අරමුණු හමුනොවූ විටකදී මනොද්වාරයෙහි - (හවඞග චිත්ත යෙහි) මනොවිඤ්ඤාණයන් පහළවන බවද දන්නේය. මේ ඇතිවන විඤ්ඤාණයෝ ආත්ම නොවෙති සත්වයෝ නොවෙති. පුද්ගලයෝ නොවෙති.

මෙසේ ඇතිවන පිරිසිදු දැනීම දිට්ඨි විසුද්ධියවේ.

මේ දිට්ඨිවිසුද්ධිය නම් දුරටත් නහවුරුවීම පිණිස "අටළොස් ධාතු" වශයෙන්ද "දොළොස් ආයතන" වශයෙන්ද නාම රූපයන් බෙදා බලන්නේය.

අටළොස් (18) ධාතු

දොර	-	ආරම්මණ	-	විඤ්ඤාණ
(6)	-	6)	-	(6)
චක්ඛු ධාතු	- රූප	ධාතු	-	චක්ඛුවිඤ්ඤාණ ධාතු -
සොත ,,	- සද්ද	,,	-	සොත ,, ,, -
ඝාණ ,,	- ගන්ධ	,,	-	ඝාණ ,, ,, -
ජිව්හා ,,	- රස	,,	-	ජිව්හා ,, ,, -
කාය ,,	- පොට්ඨබ්බ	,,	-	කාය ,, ,, -
මනො ,,	- ධම්ම	,,	-	මනො ,, ,, -

සත්වයෙකු නෝ පුද්ගලයෙකු නොවන සවභාව ලක්ෂණ ප්‍රමාණක් දරණ චක්ඛුආදීහු ධාතු නම් වෙත් සත්වයෙක් හෝ ආත්මයක් නැත ඇතු **ධාතු** යන්නෙහි අදහසයි.

චක්ඛු - සොත - ඝාණ - ජිව්හා කාය යන ප්‍රසාදයෝ මෙහි චක්ඛුධාතු - පෙ - කාය ධාතු යනුවෙන් දත යුත්තාහ. කුසල විපාක අකුශල විපාක උපෙක්ඛා සහගත සම්පටිච්ඡන සිත් දෙක; හා පඤ්චද්වාරාවජ්ජන සිත; යන සිත්තුන **මනොධාතු** නම්වේ.

ඉතිරි සිත් 79 (දසපඤ්චවිඤ්ඤාණ - 10 + සම්පටිච්ඡන 2 + පඤ්චද්වාරාවජ්ජන 1 = 13 හැර) **මනොවිඤ්ඤාණ** ධාතු නම්. චෛතසික 52; සුඛුම රූප 16; නිබ්බාණය යන මේ ධම් 69 **ධම්මධාතු** නම්.

සුඛුම රූප සොළස:- ආපෝ ධාතු ඉන්ද්‍රිය, පුරිසින්ද්‍රිය, හදය රූප, ජීවිත රූප, ආහාර රූප, පරිවෙජ්ද රූප, කාය විඤ්ඤත්ති රූපසඤ්ඤුතා, මුදුතා, කම්මඤ්ඤතා, උපචය, සන්තති, ජරතා අනිච්චතා,) මෙසේ චක්ඛුරාදී අටලොස් ධාතූන් හැර සත්වයෙකු හෝ පුද්ගලයෙකු හෝ ආත්මයක් හෝ ජීවයක් නැතැයි දන්නේය. මෙසේ ඇතිවන දැනීම දිටඨි විසුදධියයි.

තවද චක්ඛුවිඤ්ඤණාදී සය වැදෑරුම් විඤ්ඤණයන්ගේ උත්පත්තියට හේතුවන ආයතන නම්වූ චක්ඛු – සොතාදී දවඅශ ආයතනයන්ගේ වශයෙන්ද නාම - රූපයන් බලන්නේය "සත්ව" ප්‍රඥප්තියෙහි ආයතනයෝ දෙළොසකි. ඒ මෙසේයි.

ආයතන 12

දවාර (6)		ආරම්මණ (6)
චක්ඛායතනය	–	රූපායතනය
සොතායතනය	–	සද්දායතනය
ඝාණායතනය	–	ගන්ධායතනය
ජිව්හායතනය	–	රසායතනය
කායායතනය	–	පොට්ඨබ්බායතනය
මනායතනය	–	ධම්මායතනය

සසර දුක් පළල් කරන බැවින් මේවිහු "ආයතනයෝ" වෙති චක්ඛු – සොත ඝාණ – ජිවහා – කාය යන ප්‍රසාදයෝ මෙහි චක්ඛායතන ආදී නම් වලින් හැඳින්වේ. 89 වැදෑරුම් චතුභූමික සිත් සියල්ල "මනායතනය" නම්.

චක්ඛු – සොතාදී ආයතනයන්ට ගොදුරුවන රූපාදී ආරම්මණයෝ රූපායතනාදී වශයෙන් හඳුන්වනු ලැබෙති. චෛතසික 52 ය, සුඛුමරූප 16, ය, නිවණය, යන ධම් සමූහය ධම්මායතනයයි කියනු ලැබේ.

මෙසේ "සත්ව" ප්‍රඥප්තියෙහි ඇත්තේ දවාදශ ආයතනයන් යයිද ආයතනයන් හැර ඉන් පිටත් සත්වයෙක් ආත්මයක් නැතැයිද දන්නේය. චක්ඛුරාදී ආයතනදසය "රූප"යයිද මනායතනය හා ධම්මායතනය "නාම" යයිද දැන ගන්නේය.

මෙසේ නාම රූපයන් පිළිබඳ දැනගත් යෝගාවචරයාට **නාම** රූපයන් සත්වයන් පුද්ගලයන් නොවන බවත්, නාම – රූප **දෙකින්** පිටත් සත්වයෙකු හෝ පුද්ගලයෙකු නොමැති බවත් වැටහෙන්නේය.

නැව නිසා සාගරයෙහි මිනිසුන් යන්නාක් මෙන් නාමය නිසා රූපය පවත්නේයයිද; එකකට එකක් එක්කොට හේත්තු කොට තබන ලද දරම්ටි දෙකින් එකක් වැටුණු කළ අනිකද වැටෙන්නාසේ මේ නාම රූප දෙකින් එකක් වැටුනුකල අනිකද වැටෙන්නේයයි දැන ගන්නේය. මෙලෙසින් දිටඨි විසුද්ධිය ලැබූ යෝගියා හට දිටඨි විසුද්ධිය සම්පූණී වීමෙන් නාම රූපයන් හොඳින් පැහැදිලිව පෙනෙන්නේය. නාම රූපයන් කෙරෙහි පැවති ආත්ම දෘෂ්ටිය – සත්ත්ව සංඥාව දුරුවන්නේය.

භවයෙකු මරන්ට ගෙණයන කල්හි ගවයා ගෙණයම්. ගවයා බඳිම් ගවයා මරම් යනුවෙන් ගව සංඥාව ඇතිවෙයි. ගවයා මැරීමෙන් පසුව මස් විකුණම්. මස් ගෙණයම් මස් පුළුස්සම් ආදී වශයෙන් මස් සංඥාව ඇතිවෙයි. එසේම පෙර පැවති සත්ත්ව සංඥාව දුරුවී නාම රූපයන් වශයෙන් පෙනෙනි නම් යෝගාවචරයාට දිටඨි විසුද්ධිය සම්පූණී වෙයි.

මෙලෙසින් දිටඨිවිසුද්ධිය ලැබූ යෝගාවචරයන්ගේ සක්කාය දිටඨිය විෂකම්භන වශයෙන් ප්‍රහීන වන බව දැක්වේ. එපමණක්ද නොවේ. **සඤ්ඤා විපල්ලාස; චිත්ත විපල්ලාස; දිටඨිවිපල්ලාස** යන "විපල්ලාස"යන්ද දිටඨි විසුද්ධියෙහිදී විෂකම්භන වශයෙන් ප්‍රහීන වන බව දැක්වෙයි.

විපල්ලාසධම්:— "චත්තාරෝ මේ භික්ඛවෙ සඤ්ඤා විපල්ලාසා චිත්ත විපල්ලාසා දිටඨි විපල්ලාසා කතමේ චත්තාරෝ අනිච්චෙ භික්ඛවෙ නිච්චංති සඤ්ඤා විපල්ලාසෝ චිත්ත විපල්ලාසෝ දිටඨි විපල්ලාසෝ දුක්ඛෙ භික්ඛවෙ සුඛංති සඤ්ඤා විපල්ලාසෝ චිත්ත විපල්ලාසෝ දිටඨි විපල්ලාසෝ. අනත්තනි භික්ඛවෙ අත්තාති සඤ්ඤා විපල්ලාසෝ චිත්ත විපල්ලාසෝ දිටඨි විපල්ලාසෝ. අසුභෙ භික්ඛවෙ සුභංති සඤ්ඤා විපල්ලාසෝ චිත්ත විපල්ලාසෝ දිටඨි විපල්ලාසෝ ඉමෙඛෝ භික්ඛවෙ චත්තාරෝ සඤ්ඤා විපල්ලාසා චිත්ත විපල්ලාසා දිටඨි විපල්ලාසා" (චතුක්කඛඩුත්තර)

මේ දෙශනාවෙහි විපල්ලාස (විපර්‍යාස) ධම් හොඳින් විස්තර සහිතව ඇත්තේය. අනිත්‍ය– දුඃඛ– අනාත්ම– අසුභ යන සංඛාර ලක්ෂණයන්හි එක එකක් පාසා සඤ්ඤා – චිත්ත – දිටඨි වශයෙන් විපල්ලාසයන් දෙදෙන බව වදාළ සේක. මේ නයින් බලන කල සියලුම විපල්ලාස ධම් දෙළසක් වේ. මේ සියලුම විපල්ලාසධම් ප්‍රථග්ජනයන් කෙරෙහි පවතී. දිටඨි විශුද්ධිය සම්පූණී වූ විට මේ **දවාදශ විපල්ලාසයෝ** විෂකම්භන ප්‍රහානයෙන් ප්‍රහීනවේ (ඔබ්බා ගෙණ තද කරගෙන ඇත්තේය.) සොවාන් මාගී ඥණයෙන් මේ දවාදශ විපල්ලාස ධම් අතුරෙන් 8ක් සමුචෙජද ප්‍රහානයෙන් (නිරවශෙෂ ලෙසින්) ප්‍රහානය වන්නේය.

මෙසේ මහබෝසතුන් වහන්සේ ප්‍රථම යාමාවසානයෙහි "පුබ්බේ-නිවාසානුසතිඤාණය" උපදවා අනෙකවූ ජාති – ජන්ම භාවයන් පිළිබඳ නාම – රූපයන් දක්නාසේක් සක්කාය දිට්ඨිය හා "දසාදශ විපල්ලාස"යන්ද විෂකම්භන වශයෙන් දුරුකොට දිට්ඨි විසුද්ධිය සම්පාදනය කළ සේක.

මධ්‍යම යාමයෙහිදී:— නැවත මහබෝසතුන් වහන්සේ මධ්‍යම යාමයෙහිදීද පළමු ලෙසින්ම ආනාපාන සති චතුර්ධ්‍යානයට සමවැද ඉන් නැගී සිට සත්වයන්ගේ චුති – උපපත්තීන් බැලීමට සිත යොමු කළ සේක. එකල්හි අණ්ඩජ – ජලාබුජ – සංසෙදජ – ඔපපාතික යන චතුර්විධ සත්වයන් පිළිබඳ චුති – උපපත්තීන්ද ඔවුන් විසින් කරණු ලබන කුශලා කුශල කර්මයන් නිසා ඔවුන් සුගති – දුගති භවයන්හි ඉපද ඉපදී මැරි මැරියන අයුරුද මනාසේ දක්නා චුතූපපාතඤාණය" එළඹ සිටියේය. එසින් මහතාණෝ "මම අතීතයෙහි ඒවිද? නොඒවිද? ආදී වශයෙන් ඇතිවන සොළොස් වැදෑරුම් සැකයන් දුරු කළහ. එසින් (චුතූපපාතඤාණයෙන්) **"කඞ්ඛාවිතරණ විසුද්ධිය සම්පාදනය විය.**

නමන් වහන්සේට මෙසේ **මධ්‍යම යාමයෙහි චුතූපපාතඤාණය** උපන් බවද **එසින් සත්වයන් පිළිබඳ චුති – උපපත්තීන්ද සුගති – දුගතිද දුටු බව** පසුව වෙරඤ්ජ සූත්‍රයෙහිදී මෙසේ වදාළසේක.

"සෝ එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදු භූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙන සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහාරමෙසිං සොහං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තෙන මානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාමි. ඉමෙ වත භොන්තෝ සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනෝ දුච්චරිතෙන සමන්නාගත අරියානං උපවාදකා මිච්ඡා දිට්ඨිකා මිච්ඡා දිට්ඨි කම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙවාපන භොන්තෝ සත්තා කාය සුචරිතෙන සමන්නාගතා වචී – මනෝ සුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මා දිට්ඨිකා සම්මා දිට්ඨිකම්ම සමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජන්නා ති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තෙන මානුසකෙන සත්තෙ **පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ**

කර්මයෙන් හෝ අය සඞ්ඛ්‍යාත සුචරිත කර්මයන්ගේ අභාවයෙන් අපාය නම්වූ (දුකට පිළිසරණ වන බැවින් හෝ දුෂ්ට කර්මයෙන් නිපන් බැවින්) දුගති නම්වූ (සිය කැමැත්තක් නැතිව පනිතුවන බැවින් හෝ බිඳෙන අඟපසඟ ඇතිව පතිතවන හෙයින්) විනිපාත නම්වූ; සුඛාසඞ්ඛාදයෙන් කොරවූ නිරයෙහි උපන්නාහුය. නොහොත් සතර අපායෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූවාහු; ආර්‍යයන්ට උපවාද නොකරන්නාවූ සම්‍යක් දෘෂ්ටි සමාදානය ඇත්තාහුද ඔවුහු මරණින් මත්තෙහි (සොඟකඟති ඇති හෙයින්) සුගතිනම්වූ (පඤ්චකාමයන්ගෙන් මනාකොට අඟ්‍ර හෙයින්) සඟී නම්වූ ලෝකයෙහි උපන්නාහුය. මෙසේ දිව ඇසින් සත්වයන් බලමි.

බ්‍රහ්මණය! මේ වනාහි (එදා) රාත්‍රි දෙවෙනි යාමයෙහි මට උපන් දෙවෙනි විද්‍යාවයි. 'එයින් තත් ප්‍රතිවේධක මොහය දුරුවිය. විද්‍යාව උපන්නීය. ආලෝකය උපන්නේය. අප්‍රමාදීවූ කෙලෙස් ප්‍රහීන කරණ වීර්‍යයෙන් යුත් නිවත් පිණිස මෙහෙයවූ සිත් ඇත්තෙකුට යම්සේ විද්‍යාවක් පහළවන්නීද එසේම මටද මේ දෙවෙනි විද්‍යාව පහළවූවාය. බ්‍රහ්මණය මේ වනාහි රාත්‍රියේ දෙවෙනි යාමයේ මගේ මොහයාගේ දෙවෙනි බිඳීම වීය. එය කුකුළු පැටවෙකුගේ අණ්ඩය බිඳ යාමක් මෙනි.''

මෙසින් මහබෝසතුන් වහන්සේ බුදුවනදා දෙවෙනි යාමයෙහි චුතූපපාත ඤාණය ඉපදවූ බව දක්වෙයි.

චුතූපපාත ඤාණය:—සත්වයන්ගේ ව්‍යුති-උත්පත්තීන් දක්නා නුවණ චුතූපපාත ඤාණය නමි. (මෙයට දිබ්බචක්ඛු ඤාණ-දිව්‍ය චක්ෂුරභිඥාන-දිවැස යනුද නම් වේ.) දෙවියන්ගේ (සුචරිත කර්මයෙන් නිපන්) ප්‍රසාද වක්ඛුස සෙම්-ලේ ආදියෙන් කිළිටු නොවූයේ ඉතා දුර පවත්නා රූපද පිළිගැණීමෙහි සමත්ය. කඳු-පර්වත ආදිය විනිවිදගෙණ සැතැපුම් ගණන් යොදුන් ගණන් ඇත තිබෙන දෙයද අරමුණු කරයි. එහෙයින් දෙවියන්ගේ ඇස දිවැස යනුද දිබ්බ-චක්ඛු යනුද වෙයි. මේ චුතූපපාත ඤාණයද භාවනා බලයෙන් ළඟදවාගත් හෙයින් දෙවියන්ගේ දිවැස මෙන්ම බලවත්ය. සත්ත්වයන්ගේ චුතිය හා පටිසන්ධිය පෙනෙන හෙයින් මේ ඤාණය මේ නමින් දක්වේ.

ලොව ඇතැම් අය චුතිය පමණක් දකිති. ඇතැමෙක් පටිසන්ධිය පමණක් දකිති. චුතිය පමණක් දකින්නෝ උච්ඡේද දෘෂ්ටිකයෝය. ඔවුහු පටිසන්ධිය නොදක්නා හෙයින් පරිසඞ්ඛ

ආලෝකය පැවතිය හැක. එහි රූප දකින්ට හැකිසි. එක් මිනිසෙක් රාත්‍රියෙහි ගිණිඝුලක් ගෙණ ගමනක් යයි. අතරමගදී ගිණිසුල නිවෙයි. එවිට කිසිවක් නොපෙනෙයි. එකල හෙතෙම ගිණිසුල බිමගසා නැවත දල්වා ගනී. එවිට පෙරට වඩා ගිණිසුල් පත්තුවෙයි. නැවතත් නිවෙයි. එවිටද පොළොවෙහි ගසා දල්වා ගනී. නැවත වඩාත් හොඳින් පත්තුවෙයි. මෙසේ වරින්වර නිවෙන ගිනිසුල පොළොවෙහි ගසා වරින්වර වඩ වඩා හොඳින් දල්වාගනිමින් ගමන් කරයි. ඒ අතර සූර්‍යයා උදාවෙයි. ඔහු දැන් "ගිණිසුලින් වැඩක් නැතැයි" ගිණිසුල ඉවත ලා සූර්‍යාලෝකයෙන් මුළු දවස තුළම ගමන් කරයි. මෙය උපමාවකි. දිවැස ලබන ආදි කාර්මිකයාද තමාගේ ගිණිසුල වැනිවූ කසිණාලෝකය උපදවා වාරවාරයාගේ ඉක්මයාමෙන් අතුරුදහන්වූ කල්හි නැවත නැවතත් පාදක ධ්‍යානය ඉපදවීම සඛ්‍යාත ඝට්ටනයෙන් ආලෝකය උපදවා ගැණීමද සූර්‍යාලෝකය මෙන් ස්ථිර ආලෝකය උපන් කල්හි එයින් රූප දැකීමද එමෙනි.

යම් කලක මෙසේ උපන් ආලෝකයෙන් ප්‍රකෘති මසැසට නොපෙනෙන කුක්ෂිගතවූ හෝ හෘදය නිශ්‍රිතවූ හෝ යට පෘථිවී නිශ්‍රිතවූ හෝ භිත්තාදී ප්‍රකාර පර්වත ආදියෙන් ඔිටතවූ හෝ සක්වළ ගලින් පිටතවූ හෝ රූපයන් මසැසට පෙනෙන ලෙසින් නැණැසට පෙනෙන්නේද එකල දිවැස උපන්නේයයි කියනු ලැබේ. මෙහිදී ප්‍රථග්ජනයින්ට නම් මේ පෙනීම අනතුරු සහිතවීමටද හැකිසි. යට්කී පරිදි ආලෝකය පැතිරවූ තැන්හි භයානක අමනුෂ්‍ය රූප දැකීමටද ඉන් බියවීමටද හැකි නිසයි. එහෙයින් ප්‍රවේසම්විය යුතු බව දක්වේ.

මෙසේ පූර්වෝක්තාකාරයෙන් උපන් වර්තමාන රූපාරම්මණය පිළිබඳව මනොද්වාරාවජ්ජනය ඉපිද නිරුද්ධවූ පසු එයම් අරමුණු කරගෙණ සතර වරක් හෝ පස්වරක් ජවන් සිත් පහළවන බවද අවසානයේ පස්වැනිව හෝ සිවුවැනිව යෙදෙන රූපාවචර චතුර්ථධ්‍යානික සිතේ ඇතිවන ඤාණය දිබ්බචක්ඛුඤාණ නමැයිද දැක්වේ. පාදකචිත්තය අධිට්ඨාන චිත්තය නැවත පාදක චිත්තය යන චිත්ත සන්තතිය අනතුරුව මේ අභිඤ්ඤාචිත්තය උපදින බවද දක්වේ.

එදා මහතාණන් වහන්සේ බොධිද්‍රුම මූලයෙහිදී ඔධාතම යාමාවසානයෙහි චුතූපපාත ඤාණය උපදවා සවකීය ආත්මභාවයාගේද සත්වයන්ගේ හා ලොකයන්ගේද උත්පත්තිය-සම්භවය දුටුසේක්. පෙරවුසු-කඳපිළිවෙළ දන්නා නුවණින් තමන්වහන්සේ පිළිබඳ

හේතුවන්නේය. ආහාරය පැවැත්මට උපකාර වන්නේය. **ඔවුන්** අතුරෙන් අවිද්‍යා-තෘෂ්ණා-උපාදාන මේ මෙන්ද, **කර්ම** පියා මෙන්ද, ආහාරය තිරිමේ මෙන්ද උපකාර වනබව දන්නේය. මේ තෙයින් රූපකය පිළිබඳ ප්‍රත්‍යය දැනගන්නේය. තවද රූපකයටම සම්බන්ධව පවත්නා චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-හදය යන වස්තූන් නිශ්‍රයකොට එම විඤ්ඤාණ පරම්පරා පහළවෙමි යන බව දැනගන්නේය.

මෙසේම **පටිච්ච සමුප්පාදනය** වශයෙන්ද නාම-රූපයන් පිළිබඳ හේතූන් දැනගන්නේය. අනුලෝම ප්‍රතිලෝම වශයෙන් අවිද්‍යාදී අඞ්ගදෙලොස මෙනෙහි කිරීමෙන් අතීත-වර්තමාන-අනාගත යන කාලත්‍රයවර්තී නාම-රූප-ධර්ම සන්තතිය පිළිබඳ හේතුඵල පරම්පරාව දැනගන්නේය. අතීතයෙහිවූ අවිජ්ජා-සඞ්ඛාර-තණ්හා-උපාදාන-භව යන හේතු නිසා වර්තමානවූ විඤ්ඤාණ-නාම රූප-සළායතන-ඵස්ස-වේදනා යන ඵල පසද තණ්හා-උපාදාන-භව-අවිද්‍යා-සඞ්ඛාර යන වර්තමාන හේතු පස නිසා විඤ්ඤාණ-නාමරූප සළායතන-ඵස්ස-වේදනා යන අනාගතඵල පසද ඇති වන අයුරු සිහිකරන්නේය. (මේ පිළිබඳ විස්තර අප විසින් ලියූ හේතු-ඵල වාදය බලා දැනගැනීමට හැකිසි.)

තවද ඒ ඒ සත්වයන් විසින් කරණලද කුශලා'කුශල කර්ම හේතුකොටගෙණ ඒට අනුරූප විපාක ඇතිවෙත්. නැවත විපාක හේතුවෙන් අලුත් කර්ම රැස්කෙරේ. එයින් නැවත ඉපදීම සිදු වෙයි. මෙයින් අතීත-වර්තමාන අනාගත යන කාලත්‍රයවර්තී සංඝකාරයන් පිළිබඳවූ චුති-පටිසන්ධි පෙනෙන්නේය. භව-යෝනි-ගති-ඡ විඤ්ඤාණට්ඨිති-නවසත්තාවාස ආදීන්හි පවත්නේ හේතු-ඵල **සම්බන්ධ** වශයෙන් පවත්නා නාම රූප ධර්ම පරම්පරාවකි. කර්ම-ප්‍රත්‍යයෙන් උපන් අතීත නාමරූපයෝ එහිම නිරුද්ධවූහ. වර්තමාන කිසිවක් නොආහේය. මේ භවයේ පහළවූ නාමරූපයෝ මතු භවයට නොයන්නාහ. එහෙත් නාමරූපයන්ගේ සන්තතිය නොසිඳී පවත්නේය.

මෙසේ සියලු ආකාරයෙන් පඤ්චස්කන්ධය පිළිබඳවූ නාම-රූපයන් චුති-පටිසන්ධි වශයෙන්ද හේතුප්‍රත්‍ය වශයෙන්ද **දක්නේ** ඇවිදින්නේ නාම රූපයන් පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහ ඥානය (හේතූන් සොයාගන්නා නුවණ) ලබන්නේය. එහෙයින්ම සමුදය සත්‍යය නිශ්චයකොට දැනගන්නා නුවණ ඇති වන්නේය. මම පෙර ජාතියක උපන්නෙමිද? නූපන්නෙමිද? ආදී වශයෙන් යට **දක්වූ** සොළොස් වැදෑරුම් සැකයන්ද බුද්ධාදී අට නැන්හි පැවති සැක-යන්ද දුරුකරයි.

දෙසැට මිථ්‍යාදෘෂ්ටිද විෂකම්මතය වෙයි. මෙසේ නොයෙක් ක්‍රමයෙන් නාම රූපයන් පිළිබඳ හේතු ප්‍රත්‍යයන් දැනීමෙන් තුන් කාලය පිළිබඳ සැක දුරුකරණ නුවණ **කඞ්ඛාවිතරණ විසුද්ධියය.** ධම්මට්ඨිකි ඤාණ- යථාභූතඤාණ - සම්මා දස්සන යනුද මේ කඞ්ඛාවිතරණ විසුද්ධියටම පර්‍යායය නාමයෝය. මේ කඞ්ඛාවිතරණ විසුද්ධි ලාභී යෝගාවචරයා බුදුසසුනෙන් නියම පිහිට ලද්දේ චුල්ලසෝතාපන්න යන නමින්ද හඳුන්වනු ලැබේ.

නාම රූපයන් බෙදා වෙන්කර දැන ගත්තත් නාම රූපයන්ගේ හේතු සෙවීම ඉතා දුෂ්කර වූවකි. චුති පටිසන්ධිය හා ප්‍රත්‍යයාකාර ධර්මයද දැන්මට ඉතා දුෂ්කර ධර්මයන් හෙයින් කඞ්ඛාවිතරණ විසුද්ධි ප්‍රතිලාභයද ඉතා දුකසේ ලැබිය යුත්තකි. එහෙයින්ම මිථ්‍යාදෘෂ්ටිකයා නාම රූපයන්ගේ හේතු ඵලයන් සොයාගනු නොහැකිව නාම රූපයන් ඉබේ හට ගණිතැයි කෙනෙකු විසින් මවනලදැයිද නිගමනය කරයි. කඞ්ඛාවිතරණ විසුද්ධිලාභී යෝගාවචරයා අතීතාදී කාලත්‍රය වනීතී පඤ්චස්කන්ධ පිළිබඳවද බුද්ධාදීන් පිළිබඳවද සැක දුරු කිරීමෙන් නියම සම්‍යක් දර්ශනයට පැමිණියේ වෙයි.

ඵස්සපඤ්චමයාමඥයකිඳි:— රාත්‍රියෙහි තෙවන යාමයද පැමිණියේය. මහබෝසතාණන් වහන්සේ පළමු පරිදිම ආනාපාන චතුර්ධ්‍යානයට සමවැද ඉන් නැගිට පඤ්චස්කන්ධය අනිත්‍ය - දුඃඛ අනාත්ම වශයෙන් තීරණකුණට නහා විදර්ශනා කරන්නට පටන්ගත් සේක. තේ‍රහුමික සංස්කාර ධර්මයන් කලාප වශයෙන් අතීතාදී කොටස් වලට බෙදා **1. කලාප සම්මර්ශනය** කළසේක. අනතුරුව එක එක ප්‍රතීත්‍ය සමුත්පාද අඞ්ගය **2. සත්වැදෑරුම් අනුපස්සනාවන්ගේ** විශයෙන් බැලූ සේක. නැවත සියලුම සංස්කාරයන් නාම - රූප වශයෙන් දෙකට බෙදා **3. උදය - ව්‍යය වශයෙන්** බලන්ට පටන් ගත් සේක. එසේවූ කල මනාවූ විරියද; එලඹ සිටි සිහියද; සන්සුන් සිතද; සියුම්වූ ප්‍රඥාවද එයට පොහෝනා පරිදි ශ්‍රද්ධාවද: යන පඤ්ච ධර්මයෝ වඩ වඩාත් දියුණුවන්ට වූහ. මේ නිසා මහතාණන්ට බලවත් ප්‍රීතියෙක්ද උපනි. හෘදය වස්තුවද චක්ෂුරාදී ඉන්ද්‍රියයෝද ප්‍රසන්නවූහ. (එහෙයින්ම ලෙයද ප්‍රසන්න විය. ශරීරයෙන් ආලෝකධාරා නික්මෙන්ට විය. අවට සියල්ල රන්වන් කරමින් යටින් අජටාකාශය. තෙක්ද උසින් භවාග්‍රය තෙක්ද අවටින් අනන්තාපරිමාණ සක්වළ ලෝකධාතූන්හි ආලෝකය පැතිරෙන්ට විය. එපමණක්ද නොවේ.

ඒ ආලෝකය සමඟම පෙර කළුන් වහන්සේට ඇතිනොවූ **ශ්‍රේෂ්ඨ** බලවත් **ප්‍රීතියක්ද; ප්‍රශ්‍රබ්ධියකි** කියාලද කාය – චිත්ත ඳුනේ බලවත් සැහැල්ලු බවක්ද අනුගමණය කරණ ප්‍රීතිපත්ති-යෙහි සිර විශ්වාසය ඇති කිරීම් වශයෙන් පහළවූ **ශ්‍රද්ධාවද;** පිරිය සමතා යයි කියනු ලබන අසිපිළිවූ - අනවද්‍යාරාධවූ **ඒයර්යයද;** සකල ශරීරයෙහි ගලා යන්නාක් මෙන් **සුඛයද;** නාම – රූපයන් සියැසින් දක්නාක් මෙන් දැනියහැකි අතිපරිශුද්ධවූ **ඤාණයද;** ප්‍රතීතයක්සේ හැඟිරවූ **ඝනියද උපෙක්ඛාව** හා සවකිය විදර්ශනාවට ඇලුම් කරන **නිකාන්තිය (තෘෂ්ණාව)** ද; යන **විදර්ශනොප කෙලේ-ශයෝ** පහළවන්ට වූහ. එකල මහතාණන් වහන්සේ "ඉට උපන් මේ ආලෝකය හා ප්‍රීතිය ආදිහු තෘෂ්ණා දෘෂ්ටි මානයන්ට අරමුණු වන්නාහ. එබැවින් මොවුහු විදසුන් වඩන්නාහට මිතුරන් මෙන් එලඹෙන්නාවූ සතුරෝ වෙත්. මොවුන් හෙත් මිදුනු විදර්ශනා වට පැමිණි ඤාණයම මාර්ගඵල සුතුය" යි නුවණින් මෙනෙහි කොට ඒ ආලෝකාදීන් කෙරෙහි නොඇලී සිත විදර්ශනා භාවනා-වටම අභිමුඛ කොට මෙහෙයවූ සේක.

මෙහිදී උන්වහන්සේට මාගී – අමාගී දෙක නිරණය කරන්නාවූ අති සූක්ෂමවූ විදර්ශනා ප්‍රඥාව පහළ විය. එහින් **මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි** ප්‍රතිලාභය විය.

---

1. කලාපසම්මසනය:- නාම රූපයන් පිළිබඳ කොටස් වෙන් වෙන් වශයෙන් ගෙණ නිලකුණට නහා භාවනා කිරීමට කලාප සම්මර්ශනයයි කියනු ලැබේ. **"සම්මසනඤාණය"** යනු එකී කලාප සම්මර්ශනය නිසා ඇතිවන විදර්ශනා ඥානයට නමකි. යොගාවචරයා දිට්ඨි විසුද්ධියෙන් නාම රූපයන්ද; කඞ්ඛාවිතරණ විසුද්ධියෙන් නාම රූපයන් පිළිබඳ සැකයන්ද දුරුකොට; නාම රූපයන්ගේ හේතු ප්‍රත්‍යයන්ද සොයා දැන; අනාදිමත් කාලයක සිට නාම රූප ධර්ම සන්තතිය පවත්නා බවද නිරණය කරයි. ඉක්බිති ඉපද ඉපදී ජීවයි පැවතී නැසි නැසී යන මේ නාම රූපයන්ගේ අතිශීඝ්‍ර පැවැත්ම පිළිබඳව නුවණින් බලයි. මේ නාම රූපයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා ඉපද ඉපදී බිඳි බිඳී යත්. නොනැවතී ගලන ජල ධාරාවක් සෙයින් අතර කොතැනක හෝ රැඳීමක් නැතුව ඉපද ඉපදී බිඳි බිඳී යන නාම රූපයන්හි අතිශීඝ්‍ර පැවැත්මක් නැති හෙයින් **අනිත්‍යයෝය.** ඉපදීම් බිඳීම් නැලීම් පෙළීම් ආදියෙන් පීඩා යෙදෙන හෙයින් **දුක්ඛය.** නමා වශයෙහි නමාට අනිමත පරිදි – නොපවත්නා හෙයින් **අනාත්මයෝය.** කලාප සම්මර්ශනය කරණ යෝගාවචරයා ත්‍රෛභූමික (කාම- රූප- අරූපී) සංස්කාරයෙන් (හේතු ප්‍රත්‍යයන්

මේසේ සෘතු – මාස – පක්ෂ – රාති – දවස් – රෑ – දවල් වශ-යෙන්ද නාම රූපයන් බෙදා තිලකුණට නගා භාවිතා කරන්නේය.

නැවත කම්මජ – චිත්තජ – උතුජ – ආහාරජ – වශයෙන්වූ රූප කලාපයන් තිලකුණට නගන්නේය.

2. මෙසේ ත්‍රෛභූමික සංඛතාරයන්ගේ ත්‍රිලක්ෂණ සම්මර්ශනය කොට පටිච්ච සමුප්පාද අඟ එක එකක් පාසා සත් වැදෑරුම් අනුපස්සනාවන්ගේ වශයෙන් භාවනා කරන්නේය. අනිච්චානු පස්සනා – දුක්ඛානුපස්සනා – අනත්තානුපස්සනා – විරාගානු පස්සනා නිබ්බිදානුපස්සනා – නිරෝධානුපස්සනා – පටිනිස්සග්ගානුපස්සනා යන මෙච්චු අනුපස්සනාවෝ වෙති.

මෙකී අනුපස්සනාවන් අතුරෙන් නිච්ච සඤ්ඤාව අනිච්චානු පස්සනාවෙන්ද සුඛ සඤ්ඤාව දුක්ඛානුපස්සනාවෙන්ද අත්තසඤ්ඤාව අනත්තානු පස්සනාවෙන්ද රාගය විරාගානුපස්සනාවෙන්ද; නන්දිය නිබ්බිදානු පස්සනාවෙන්ද; සමුදය නිරෝධානුපස්සනාවෙන්ද; ආදා-නය පටිනිස්සග්ගානු පස්සනාවෙන්ද දුරුවී යන්නේය.

3. අනාගතයේ නාම රූපයන් උදය-ව්‍යය දෙකට බෙදා ප්‍රත්‍යය වශයෙන් **උදය – ව්‍යය** බලන්නේය. උදයනම් නාම රූපයන්ගේ පහළවීමයි. වය නම් විපරිණාමයයි. (සම්පණ්ණ ආකාර උදයව්‍යය භාවනාව කරණ අනුරු අප විසින් ලියූ "ලොකොත්පත්තිය හා ලොක විනාශය' නම් දහම් පොතෙහි විස්තර කර ඇත.)

මෙසේ විදසුන් වඩන යෝගාවචරයාගේ "සම්මසන ඤාණය" දියුණුවන්ට පටන්ගනී. එතෙකින්ම ආරබ්ධවීර්ය ඇති තරුණ විදර්ශකයාට විදර්ශනා භාවනා බලය නිසාම ඔහුගේ සිත හා ලෙය ප්‍රසන්නවීමෙන් ශරීරයෙන් ආලෝකයක් විහිදෙන්ට පටන් ගනී. ඒ සමගම ප්‍රීති-ප්‍රශ්‍රබ්ධි ආදී උප ක්ලේශයෝද පහළ වෙත්. එකල යෝගාවචරයා "මට මෙතෙක් පෙර කිසි විටෙක මෙබඳු දීප්තිමත් ආලෝකයක් පහළ නොවීය. මට දැන් පවත්නා මේ ආලෝකය මාර්ගය හා සම්බන්ධ වූවකි. ඒකාන්තයෙන් මම මාර්ග ඵලයට පැමිණියෙමි" යි සිතා රැවටෙන්නේය. එසේ රැවටී එම ආලෝකය හෝ ලැබීමට හේතුවූ විදර්ශනා ඥානය හෝ මාර්ග – ඵලයයි සිතා වර-දවා ගෙන අමාර්ගය මාර්ගය ලෙසද අඵලය ඵලය ලෙසද තීරණය කොට නොමඟට බසී. භාවනා කම්මය හැර දමයි. ඔබොක්ක ඔභාසය - ආලෝකය ගැන සිතමින් සතුටුවෙමින් වාසය කරයි.

කලක් නිස්සේ කරණලද ක්‍රමානුකූල විදර්ශනා භාවනා බලය නිසා යෝගාවචරයා කුළ රාග-ද්වේස මොහාදීහුද බොහෝ තුනීව ගොස් ඇති හෙයින් ඔහු මාගී - ඵල ලැබූ බව වෙසෙසින් සිතයි. කලක් සාමේදී භාවනා කම්ය හැර දමා වසන ඔහුට ඒ ලැබූ ආලෝකයත් උදය ව්‍යය භාවනාඥානයත් යන දෙකම නැතිවන්ට හැකියි. එසේ-සින් මේ ආලෝකය ප්‍රධාන කොට ඇති ප්‍රීති ප්‍රශ්‍රබ්ධි ආදීහු විදර්ශනා-ව්ට උපක්ලේශයෝ වෙත්.

එබඳු විදර්ශනොපක්ලේශයන් පහලවූවිට දිට්ඨි- මාන- තණ්හා ආදී ක්ලේශයන් සියුම් වශයෙන් හෝ ඇතිවන බවද මාගී - ඵලාව බොධයදීනම් මෙවැනි තත්වයක් සිදු නොවිය හැකි බවද සලකා මේ ආලෝකාදීහු මාගීය ඉපදවීමට බාධකවූ උපක්ලේශයන් වශයෙන් මෙනෙහි කොට ඒ ඕභාසාදියද අනිත්‍ය - දුඃඛ - අනාත්ම වශයෙන් බලන්නේය. එසේ සලකා ගැණීම "මග්ගාමග්ග ඤාණ දස්සන" විසුද්ධියයි. අමාගීයවූ ආලෝකාදීහු මාගීයයි ගන්නා වැරදි දැකි-මෙන්ද එයට ආශා කිරීමෙන් ඇතිවන නිකාන්ති තෘෂ්ණාවෙන්ද මිදිසිදුවන හෙයින් මෙම විසුද්ධිය "මග්ගාමග්ගා ඤාණ දස්සන - විසුද්ධිය" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(සප්ත විශුද්ධීන් අතුරෙහි "මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය" විශිෂ්ට තැනක් ගනී. එයට හේතුව ත්‍රිලක්ෂණ භාවනා කම්ය සිදුකර ගෙන එන යෝගාවචරයා "විදර්ශනා'ලෝකයෙන්" මුළාවන්ට නොදී ආරක්ෂා කිරීම නිසයි. පූර්වෝක්ත "විදර්ශනා'ලෝකය" මාගී-ඵල ප්‍රතිවෙධය කළ ආර්‍ය්‍ය ශ්‍රාවකයන්ට හෝ කමටහන් නොවඩන භාවනා කම්යක නොයෙදෙන සම්‍යක් ප්‍රතිපත්තියට නොපිළිපන් කුසීත පුද්ගලයන්ට හෝ පහළ නොවේ සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිළිපන් විදර්ශනා භාවනායෙහි යෙදෙන අරඛ්ධ විදර්ශක කුලපුත්‍රයෙකු වම මේ විදර්ශනා'ලෝකය පහළවේ. යෝගාවචරයන්ගේ විදර්ශනා ඥානයෙහි බලවත් තරමට මෙම ආලෝකයද බලවත්ය. ඇතැම් යෝගාවචරයෙකුට විදර්ශනා'ලෝකය තමා සිටින පර්‍ය්‍යඞ්කය අවට පමණක් ආලෝක කරන තරම් කුඩා වශයෙන් පහළවේ. භාවනා කම්ඃයන් ක්ලේශයන් යටපත්වීම නිසා සිත පවිත්‍ර වෙයි. පවිත්‍රවූ සිත අරම්මණෙහි සන්සුන් වෙයි. සිත පවිත්‍රවූ කල ලෙයද පිරිසිදු වෙයි. පිරිසිදු ලෙය සකල ශරීරයෙහි පැතිරයාම නිසා ශරීරයෙන් ආලෝකධාරා විහිදේත්.) ඇතැම් යෝගාවචරයින්ට ඇතුළ ගැබ - පමණක් ආලෝක කරමින්

ඒ ආලෝකය පහළවේවි. තවත් ඇතැමෙකුම ඇතුළු ගැබින් පිටතද; ඇතැමෙකුට මුළු වෙහෙරද; ගවුවක්ද; දෙගව්වක්ද යොදුනක්ද; දෙයොදනක්ද ප්‍රදේශය පුරා ආලෝකය පහළවේ.

මහබෝසතුන් වහන්සේට එදා උපන් විදර්ශනා'ලෝකය දසදහසක් සක්වළ පුරා පැතිර බිඹි බව විසුදුයි මංගීයෙනි දැක්වේ.

සිතුල් පව් වෙහෙර දෙබින්නි ගෙයක ඇතුළේ කාමර දෙකක යෝගාවචර භික්ෂූන් දෙනමක් විසූහ. එදවස අහස කළු-අඳුරු වැසි වලාකුළු වලින් ගැවසුනු මහේ පෝය දිනයකි. අවටද තද අඳුරකි. මධ්‍යම රාත්‍රියහි එක් තෙරුන් වහන්සේ නමක් අනික් තෙරුන් වහන්සේ අමතා "ඇවැත්නි මව දැන් සැමලුවෙහි මලස්-තෙහි පුදු නිබෙන මල් මෙතනට පෙනේ යයි කී සේක. අනික් තෙරුන් වහන්සේ ඇවැත්නි ඔය කුමන ආශ්චර්‍යයක්ද? මට දැන් මහ සයුරේ යොදනක් තැන හැයිරෙන මත්ස්‍යයන් පෙනෙන්නයසේ පිළිවදන් දුන්සේක.

මේ පෙනීම් ඇතිවන්නේ ප්‍රකෘති ඇසට නොව සිතටය. දිව්‍ය-චක්ෂුඥාණ මෙම ආලෝකය මනසිකාරය බලයෙන් ඇතැම් විට ප්‍රකෘති ඇසින්ද යෝගාවචරයෝ යටකී විදර්ශනා'ලෝකයෙන් ආලෝකවත්වූ අවට ප්‍රදේශය දකිත්. මෙසේම මේ **විදර්ශනා'ලෝකය බොහෝ** සෙයින් සමථ විදර්ශනා දෙකම ලබා සිටින යෝගාවචරයන්ට පහළ් වන බව දැක්වේ. සමාපත්ති බලයෙන් යටපත්වූ කොළෙයි ඇති ඇතැම් ධ්‍යාන සමාපත්ති ලාභී යෝගාවචරයෝ කෙලෙසයන්ගේ අසමුදාචාර බව නිසා "මම රහත්මි"සි සිතයි. විදර්ශනා භාවනා බලයෙන් උපන් යථොක්ත විදර්ශනා ලෝකය නිසා වඩාත් මුළාවෙයි. විදර්ශනා'ලෝකය බලමින් එසින්ම භාප්තිමත්ව වෙසෙයි. මෙයට සුදුසු නිදසුනක් මෙන්න:-

උවවාකුලිකවාසී මහානාග සථවිරයන් වහන්සේ සමථ භාවනා බලයෙන් ධ්‍යාන සමාපත්තීන් උපදවා අභිඥාවන් ලැබ; කඩාවිතා-රණ විසුද්ධියෙන් මතු සංසකාර ධර්ම සම්මර්ශනය කරමින් සම්මසන ඤාණයද උපදවා උදය - ව්‍යය භාවනා බලයෙන් විදර්ශනා'ලෝකය ලැබූ සේක. කෙලෙසයන්ගේ විෂ්කම්භනය හා අසමුදාචාර බව නිසා භාවනා කර්මය හැරදමා විදර්ශනා'ලෝකය දෙස බලමින් "මම රහත්-මි"සි ආලෝකයට රැවටී ප්‍රථග්ජනත්වම වසන සේක. උන්වහන්සේ-ගේ උපදේශ අනුව කුම්භස්ථාන භාවනා කොට මගඵල නුවණ ලැබූ රහත් භික්ෂූහු බොහෝ විසූහ. **නරඹගලවාසී ධම්මදින්නා** නම්වූ මහරහතුන් වහන්සේ එයින් එක් නමකි.

බොහෝ භික්ෂු පිරිසකට අනුශාසනා කරන්නාවූ සිවුපිළිසිඹියා පත් මහරහත් තෙර නමක්වූ උත්වහන්සේගේ ආචාර්යවූ පුණ්‍යෝක්ත **මහානාම** සථවිරයන් පිළිබඳව "කෙසේද මගේ ආචාර්යයන් වහන්සේගේ ශ්‍රමණ ධර්ම්‍ය මසකප්‍රාප්තවීද"යි ආවර්ජනා කරණ සේක. ආචාර්යයන් වහන්සේ රහත් නොවීම රහත්වූ යෙමියි සිතා විදර්ශනා ලොකයට රැවටී සිටින බව දැක මා පිහිට නොවුවහොත් මගේ ආචාර්යතුමන් ප්‍රථග්ජන තත්ත්වයෙන්ම කලුරිය කරතැයි බහා අහසින් අවුත් ඇදුරු තෙරුන් වැද වත් දක්වා සිටියහ. ඇවැත්නි ධම්ම දින්නය! අවේලාවේ ආයේ කුමක් නිසාදැයි මහානාග තෙරහු පිළිවිසූහ. (ඒ වේලාව මහතෙරුන් ලඟට නොයායුතු අවේලාවක්වූ නිසයි. එසේ ප්‍රශ්න කළේ) "ස්වාමීනි! ප්‍රශ්නයක් අසනු පිණිස ආවෙමි"යි ධම්ම දින්නයන් වහන්සේ පිළිතුරු දුන්සේක. ඇවැත්නි! අසව දත් දෙයක් නම් කියන්නෙමියි මහානාග තෙරහු කීහ. ධම්ම දින්න රහතන් වහන්සේ ඇදුරු මහතෙරුන්ගෙන් ප්‍රශ්න දහසක්ම ඇසූහ. මහතෙරහුද නොපැකිල ප්‍රශ්න දහසම විසඳූහ. ස්වාමීනි! ඔබගේ නුවණ ඉතා තියුණුය කවදා ධර්ම්‍ය අධිගමනය කළ සේක්දැයි විමසූහ ඇවැත්නි! මෙයට සැට වසකට පෙරදීයයි මහතෙරහු පිළිවදන් දුන්හ.

ධම්ම දින්න ථේර:- ස්වාමීනි! ඔබවහන්සේ සමාධියත් පරිහරණය කරණ සේක්ද?

මහානාග ථේර:- ඇවැත්නි එය මට බරෙක් නොවේ.

ධම්ම දින්න ථේර: ස්වාමීනි එසේ නම් ඇහැකු මවනු මැනවි!

මහ තෙරහු සෘණයකින් ඇහැකු මැවූහ. ස්වාමීනි! ඔය ඇතා යම්සේ දෙකන් හා වළග ඔසවා හොඳම්මට තුළ බහා ගයානසා ලෙස කුකුළනාද කෙරෙමින් ඔබ වහන්සේ ඉදිරියට පැමිණේද; එලෙස කරණු මැනවයි ධම්ම දින්න තෙරුන් වහන්සේ කී සේක. මහ තෙරහු ඇතා එලෙස නමන් වහන්සේ වෙතට එන ලෙස යෙදවූහ. ඇතා වේගයෙන් ඉදිරියට එන්ට විය. මහතෙරහු බියවී පලායන්ට [පැන දුවන්ට] තැත් කළහ. ක්ෂීණාශ්‍රව තෙරහු එකෙණෙහිම අත දික්කොට ඇදුරු තෙරුන් වහන්සේ සිවුරු කොණින් අල්වා රඳවා ගෙණ ඇතා අතුරුදහන් කරවා ස්වාමීනි! රහතුන්ට බයකුත් ඇද්දැ"යි ඇසූහ. එකල මහානාග තෙරහු තමන් නොරහත් බව දැන "ඇවැත්නි මට පිහිටවනු මැනව"යි අතැවැසි මහ තෙරුන් පාමුල උකුටිකයෙන් හුන්හ. "ස්වාමීනි! පිහිටවෙමි, ඒ සැදහාමි ආර්ය"යයි පැවසූ ධම්ම දින්න තෙරහු ඇදුරු තෙරුන්ට කමටහන් දුන්හ. සුක්ෂ්මනට පිවිසි මහානාග මහ තෙරුන් වහන්සේ තුන්වන පද ඕරයෙහි කෙලෙසුන් නසා රහත්වූ සේක.

මහානාග තෙරහු ධ්‍යාන සමාපත්ති බලයෙන් යටපත් කළ කෙලෙස් ඇත්තාහු විදර්ශනා ලෝකයට රැවටී භාවනාව නවතා සිසුහ. උන්වහන්සේගේ අවුරුදු 60 කම සිට තමන් රහත් බව සිතා සිසු අයුරු ආශ්චර්‍යයී නොවේද, සිතිනෙනුදු කාම චිතක්කාදියක් පහළ නොකළ හෙයින් නොරහත් බව නොදන්හ. ඇතා දැක බිය ඇතිවූ හෙයින් කෙලෙස් සහිත බව දන්හ.

මේබඳු යෝගාවචරයෝ විදර්ශනා ලෝකයෙන් රැවටුනු අයවෙති. මහාමගග ඤාණ දස්සන විසුද්ධියෙන් යෝගාවචරයාගේ මුළාවීම දුරුකොට සම්‍යක් මාර්ගයට ඔහු යොමුකරවයි.)

මහබෝසතාණන් වහන්සේ එදා, පශ්චිම යාමාරම්භයේ සිට ආරම්භකළ විදර්ශනා භාවනාව හේතුකොටගෙණ උන්වහන්සේගේ ප්‍රසන්නවූ ලෙය මුළු සිරුර පුරා පැතිර යාමෙන් ඉන් නිකිලුනාවූ විදර්ශනා-ආලෝකය අවට සියල්ල රන්වන් කරමින් දසදහසක් සක්වළ පුරා පැතිර ගියේය. ආලෝකය සමගම මුළු සිරුර පුරා පැවණක් ප්‍රීතියද; නාමකයේ හා රූපකයේ සැහැල්ලු බවද; සියුම් විදර්ශනා ප්‍රඥාවද; ශ්‍රද්ධාව හා එලඹ සිටි ඕතියද; සුඛවේදනාව හා විදර්ශනොපෙක්ෂාවද; උට්ඨානවීරිය හා විදර්ශනාවට ඇලුම් කරණ නාමණාවද පහළවිය.

මෙතිදී නුවණින් මෙනෙහි කරණ මහානාණෝ 'මට මෙබඳු ආලෝකයක් පෙර කිසිකලෙක නොවීය. මේ ආලෝකය පිළිබඳව මට නාමණාවක්ද මානයක් හා මිථ්‍යාදර්ශනයක්ද පහළවිය. තරුණ විදර්ශකයාට ධර්මතා වශයෙන් පහළවන උපක්ලෙශයන් වශයෙන් මේ ආලෝකාදීහු පහළ වෙත්. එහෙයින් මේ ආලෝකාදීහු නියම මාර්ගය නොවෙත්. මෙසින් මිදුනු විදර්ශනා මාර්ග ඵලයට බැසගත් ඤාණයම මාර්ගය විය යුතුය''යි මෙසේ මග්ගා'මග්ගය පිරික්සා දැන ඒ ආලෝකාදීන් කෙරෙහි නොඇලී සිත විදර්ශනාවට අභිමුඛ කොට **මග්ගා'මග්ග ඤාණ දස්සන විසුද්ධිය** සම්පාදනය කළ සේක.

මෙසේ වත විට මහතාණෝ ආර්‍ය්‍ය සත්‍ය තුණක් පිරිසිඳ දැන ගත් සේක. එනම් දිටනි විසුද්ධි අවස්ථාවෙහි නාම රූප ව්‍යවස්ථාදියෙන් **දුඃඛ සත්‍යයද**, කඞ්ඛාවිතරණ විසුද්ධියෙහිදී ප්‍රත්‍යය පරිග්‍රහයෙන් **සමුදය සත්‍යයද**; පිරිසිඳ දත් සේක. මේ මග්ගා'මග්ග ඤාණ දස්සන විසුද්ධියෙහිදී සම්‍යක් මාර්ගය නිශ්චය කර ගැණීමෙන් **මාර්ග සත්‍යය** වෙන්කර දැනගත් සේක. ඉද්ධියට අවබොධ කළ යුත්තේත් නිරෝධ සත්‍යයයි. එය ලැබූ අයුරු විස්තරවේ.

---

iiපශ්චිමයාමයෙහිදී:-පූර්වෝක්තාකාරයෙන් මහා'මග්ග ඤාණ දස්සන විසුද්ධි ප්‍රතිලාභයෙන් ''උපක්ලේශයන්ගෙන් මිදුනු විදසුන් නුවණම මාගීය වේය''යි නිගමය කළ මහබෝසතාණන් වහන්සේ නැවතත් විදර්ශනා මාගීයට බැසගත් සේක. එලෙස විදසුන් වඩන මහතාණන්ට ක්‍රමයෙන් උදයබ්බයානුපස්සනා; භඞ්ගානුපස්සනා; භයතුපට්ඨාන; ආදීනවානුපස්සනා; නිබ්බිදානුපස්සනා; මුඤ්චිතුකම්‍යතා; පටිසඞ්ඛානුපස්සනා; සඞ්ඛාරුපෙක්ඛා; යන විදර්ශනාඥන අටද, නවවෙනි අනුලෝම (සච්චානුලෝම) ඤාණයද; යන නවමහා විදර්ශනා ඥනයෝ පහළ වූහ. ලෞකිකවූ නාම - රූපයන් අරමුණු කරගෙන විදසුන් නුවණ දියුණුවීමෙන් ක්‍රමයෙන් ලොකොත්තර ආර්‍ය්‍ය මාගඥන - ඵලඥන ඉපදවූ අයුරු මෙහිදී විස්තර කළ යුතුව තිබේ.

මහා'මහාඤාණ දස්සන විසුද්ධිය ලැබී මට පෙර මහතාණන් තිලකුණු වඩමින් සම්මසනඤානය ලැබූ බවද අනතුරුව නාම-රූප දෙක සම්බන්ධ උදය-හා වය අනුව උදයබ්බානු පස්සනා භාවනාව වඩමින් උදයව්‍යය ඤාණය දියුණුවී ගන එන අතර විදර්ශනා ලොකය ප්‍රධාන කොට ඇති දශවිධ විදර්ශනොපක්ලේශයන්ගෙන් උදයව්‍යය ඤාණය කිලිටිවූ බවද මේ කියවන ඔබට මතක ඇතැයි සිතමු. එනෙයින් මතු මත්තෙහි නුවණ දියුණු කරගනු සඳහා තිලකුණු වැඩිය යුතු උවද විදර්ශනොප ක්ලේශයන්ගෙන් කිලිටුවූ ඤාණයෙන් තිලකුණු මනාසේ නොවැටහෙයි. ඒ නිසා නැවතත් උදය - ව්‍යය ඤාණය දියුණු කරගත යුතු වෙයි. අනිත්‍යාදී සංඛාර ලක්ෂණ මොනවට වටහා නොගත්තොත් නිරෝධ සත්‍යය ප්‍රතිවෙධ නොවන හෙයිනි.

හෙතු-ප්‍රත්‍යයන්ගෙන් හටගත් සවිඤඤාණක - අවිඤඤාණක සියල්ලටම පොදුවේ සංඛාර යන නම ලැබේ. මේ සංඛාරයන් පිළිබඳ සවභාවය නම් ඉපදීම හා පැවතීම බිඳීම යන ලක්ෂණයෝය. නිවන් ලබනු රිසියහු විසින් අනිත්‍ය - දුඛ - අනාත්ම යන තිලකුණු නුවණ [විදර්ශනා ඥනය] දියුණු කළ යුතුය. සංඛාරයන් පිළිබඳ උදය [පහළවීම] හා ව්‍යය [විනාශය] මෙනෙහි නොකිරීම නිසා අනිත්‍ය ලක්ෂණය සන්තතියෙන් වැසේ. එහෙයින් අනිත්‍ය ලක්ෂණය වැටහීමට නම් සන්තතිය බින්ද යුතුය. සංඛාරයන්ගේ උදය - හා වය බලන්නහුට සන්තතිය බිඳී අනිත්‍ය ලක්ෂණය ප්‍රකට වෙයි එහෙයින් උදය-ව්‍යය ඤාණයෙන් සන්තතිය බිඳගත් කළ අනිත්‍ය ලක්ෂණය මැනවින් ප්‍රකටවේ.

දැල්වෙන පහනක් දෙස බලන්න! පහනේ තෙල් තිබෙන තාක් පහන්වැටිය ගෙවී නොයනතාක් පහන දැල්වේ පහත් දැලි නිවී නිවී යන සැටිද අලුත් පහන් දැලි දැල්වී දැල්වී යන සැටිද සියුම් පරීක්ෂාවෙන් බලනකල පෙනේ. එනෙත් දැල්වූ අවස්ථාවේ පටන් නිවෙන තාක්ම එකම පහන් දැල්ලක් පවත්නාසේ බැලූ බැල්මට පෙනේ. නිවෙන පහන් දැල්ල හා දැල්වෙන පහන් දැල්ල අතර-වෙනසක් නොපෙනෙන ලෙසින් වහ වහා නිවී නිවී දැල්වී දැල්වී යන පහත් දැල්ල එකක් නොව පහන් දැලි පරම්පරාවකි. එසේම සංඝකාරයෝද ඉපද ඉපදී බිඳී බිඳී යන පරම්පරාවකි. බිඳෙන සංඝකාරයන්ගේ බිඳීම ප්‍රකට කරගන්ට අපහසු තරමට අලුත් සංඝකාරයන් පහළවන හෙයින් සංඝකාරයන්ගේ මේ වේගවත්ව පවත්නා සංඝකාර පරම්පරාවට **සන්තතිය** යයි කියනු ලැබේ. මේ සන්තතිය නිසා සංඝකාරයන්ගේ අනිත්‍ය **ලක්ෂණය** මැසී යයි. උදය-ව්‍යය බැලීමෙන් මෙකී සන්තතිය බිඳගෙන අනිත්‍ය ලක්ෂණය ප්‍රකටව වැටහෙයි.

සංඛාරයෝ දුක්ඛා. එනෙත් ඉරියව් වෙනස්වීම නිසාද නිතර ලැබෙන පීඩාවන් මෙනෙහි නොකිරීම නිසාද **දුක්ඛ ලක්ෂණය** අප්‍රකටව පවතී. උදය-**ව්‍යය** බලන යෝගාවචරයාට **සංඝකාරයන්** ඉපද ඉපදී බිඳී බිඳී යන සැටි පෙනේ. සංඝකාරයන් ඉපද **ඉපදී** බිඳී බිඳී යාම සැපයක් නොව දුකකි. උපන් **සංඝකාරයන්** සදාකාලික පවතීනොත් නොවෙනස් වෙනොත් එය සැපයකි. උදය-ව්‍යය ඥාණය සංඝකාරයන්ගේ දුබලක්ෂණය ප්‍රකටවීමටද හේතු වෙයි.

සංඛාරයෝ අනත්තා. එහෙත් අනාත්ම ලක්ෂණය ධාතු විනිබෙහොගය නොකිරීම (ධාතූන් වෙන්කොට නොබැලීම) නිසාද ඝණයෙන් වැසී ඇති නිසාද ප්‍රකට නොවෙයි. (ගලා යන ජලයක එකාබද්ධ නාවය නිසා එකම ජලයක් ලෙසද දැල්වෙන පහනක දැල්ල එකක්ම ලෙසද පෙනෙන්නා සේ නාම රූපයෝ වහා වහා ඉපදී ඉපදී බිඳී බිඳී යන නමුත් ඒ ඉපදීම හා බිඳීම ප්‍රකට නොවන ලෙසින් එකම සත්වයෙකු පුද්ගලයෙකු ඇතැයි සැලකෙන ලෙසින් පවත්නා **සභාවය** ඝණ නම් වේ.) සංඝකාරයන් පිළිබඳ අනාත්ම ලක්ෂණය මේ ඝණයෙන් වැසී තිබේ. තමා වශයෙන් කොපමත්තා නිසාද හේතු-ප්‍රත්‍යයන් නොමැතිව හුපදනා නිසාද **සංඝකාරයෝ** අනාත්මයෝය. සංඝකාරයන් පිළිබඳ උදය-ව්‍යය බලන්නහුට අනාත්ම ලක්ෂණයද ප්‍රකට වෙයි. එහෙයින් විදර්ශනා ලෝකයෙන් කිලිටුවූ උදය-ව්‍යය ඥාණය නැවත උපදවා ඉන්පසු ත්‍රිලක්ෂණයන් මනාව

ප්‍රකට කරගෙන විඳසුන් වැඩිය යුතුය. නිලකුණු ප්‍රකට කරගැනීමට උදය-ව්‍යය ඤාණය අතිශයින් උපකාර වෙයි. විශෙෂයෙන් සංඝකාරයන්ගේ ඉපදීම බිඳීම දෙක මනසේ දක්නහුට ආත්ම සංඥව බොහෝ සෙයින් දුරුවීයාමට හේතුවෙයි. ශාඝත දෘෂ්ටිකයා ලෝකය හෝ පඤ්චඋපාදානස්කන්ධය හෝ ආත්ම සහිතයයිද සදාකාලිකයයිද දන්නේ එහි තුළ නොවෙනස්වූ ක්‍රියාකාරී බලවේගයක් ඇතැයි සිතීම නිසාය. ඉපදීම බිඳීම දක්නහුට එබඳු සථිර දෙයක් නොමැති බව නිතැතින්ම වැටහෙයි මේ නිසා අනාත්ම ලක්ෂණය වසා පවත්නා ඝණය බිඳී යාමට උදය-ව්‍යය ඤාණය අත්‍යාවශ්‍යවෙයි.)

කරුණු මෙසේ හෙයින් මහතාණන් වහන්සේ විදර්ශනා ලෙස-යෙන් කිලිටුවූ උදය ව්‍යය ඤාණය ලබනු පිණිස නැවතත් උදය ව්‍යය භාවනාව කරන්ට පටන් ගත් සේක. (සම්මසන ඤාණය හා උදයබ්බය ඤාණය ලබනු පිණිස භාවනා කළයුතු භාවනා වාක්‍ය මෙහි දක්වෙන්නේ සංක්ෂෙපයෙනි.)

උදය - ව්‍යය (සංක්ෂෙපයෙන්)

පඨවීධාතු උදයබ්බයං; ආපොධාතු උදයබ්බයං; තෙජොධාතු උදයබ්බයං; වායොධාතු උදයබ්බයං; චක්ඛුධාතු උදයබ්බයං රූප-ධාතු උදයබ්බයං චක්ඛුවිඤ්ඤාණධාතු උදයබ්බයං; සොතධාතු උදයබ්බයං සද්දධාතු උදයබ්බයං සොත විඤ්ඤාණ ධාතු උදයබ්බයං; ඝාණධාතු උදයබ්බයං ගන්ධධාතු උදයබ්බයං ඝාණවිඤ්ඤාණ ධාතු උදයබ්බයං; ජිවහා ධාතු උදයබ්බයං. රසධාතු උදයබ්බයං ජිවහා-විඤ්ඤාණධාතු උදයබ්බයං; කාය ධාතු උදයබ්බයං ඵොට්ඨබ්බධාතු උදයබ්බයං කාය විඤ්ඤාණධාතු උදයබ්බයං, මනොධාතු උදයබ්බයං ධම්මධාතු උදයබ්බයං මනොවිඤ්ඤාණධාතු උදයබ්බයං;

(පඨවී ධාතුව ඉපිද බිඳෙන්නේය. ආපොධාතුව ඉපිද බිඳෙන්-නේය. තෙජොධාතුව ඉපිද බිඳෙන්නේය. වායොධාතුව ඉපිද බිඳෙන්නේය. චක්ඛුධාතුව ඉපිද බිඳෙන්නේය. රූප ධාතුව ඉපිද බිඳෙන්නේය. චක්ඛුවිඤ්ඤාණධාතුව ඉපිද බිඳෙන්නේය. සොත ධාතුව - පෙ - සද්ද ධාතුව - පෙ - සොත විඤ්ඤාණ ධාතුව ඉපිද බිඳෙන්නේය. ඝාණ ධාතුව - පෙ - ගන්ධධාතුව - පෙ - ඝාණ විඤ්ඤාණ ධාතුව ඉපිද බිඳෙන්නේය. ජිවහා ධාතුව - පෙ - රසධාතුව පෙ - ජිවහා විඤ්ඤාණ ධාතුව ඉපිද බිඳෙන්නේය. කාය ධාතුව - පෙ - ඵොට්ඨබ්බ ධාතුව - පෙ - කාය විඤ්ඤාණ ධාතුව ඉපිද බිඳෙන්නේය. මනෝ ධාතුව - පෙ - ධම්මධාතුව - පෙ - මනොවිඤ්ඤාණ ධාතුව ඉපිද බිඳෙන්නේය.)

රූපං උදයබ්බයං; වෙදනා උදයබ්බයං; සඤ්ඤා උදයබ්බයං; සඞ්ඛාරා උදයබ්බයං විඤ්ඤාණං උදයබ්බයං;

රූපය ඉපිද බිඳෙන්නේය. වෙදනාවෝ – පෙ – සඤ්ඤාවෝ – පෙ – සඞ්ඛාරයෝ ඉපිද බිඳෙන්නාහ. විඤ්ඤාණය ඉපිද බිඳෙන්නේය.

ඉක්බිති නැවතත් තිලකුණු වඩන්නේය.

පඨවීධාතු අනිච්චං දුක්ඛං අනත්තා. ආපොධාතු අනිච්චං දුක්ඛං අනත්තා. තෙජොධාතු අනිච්චං දුක්ඛං අනත්තා. වායොධාතු අනිච්චං දුක්ඛං අනත්තා.

චක්ඛුං අනිච්චං දුක්ඛං අනත්තා රූපං – පෙ – චක්ඛුවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා. සොතං අනිච්චං දුක්ඛං අනත්තා සද්දා – පෙ – සොතවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා. ඝාණං අනිච්චං දුක්ඛං අනත්තා ගන්ධා – පෙ – ඝාණවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා. ජිව්හා අනිච්චා දුක්ඛා අනත්තා රසා – පෙ – ජිව්හා විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා. කායෝ අනිච්චං දුක්ඛා අනත්තා ඵොට්ඨබ්බා – පෙ – කායවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා. මනං අනිච්චං දුක්ඛං අනත්තා ධම්මා – පෙ – මනොවිඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා.

(මෙහි අඵ සුගමයි ඛන්ධ – ධාතු – ආයතන – පටිච්ච සමුප්පාද ආඛ්‍යා යන මොවුන්ද මෙලෙස යොදා භාවනා කළ හැකිය.)

මෙසේ මහබෝසතාණන් වහන්සේ උපක්ලෙශයන්ගෙන් මිදුනාවූ නියම මාර්ගයෙහි ගමන් කරමින් සංඝකාරයන් පිළිබඳ උදය හා වයද ඒ සමග ත්‍රිලක්ෂණයන්ද මේනෙහි කරමින් භාවනා කරණ කල්හි තවමහා විදර්ශනා ඥානයන්ගෙන් උදයබ්බය ඤාණය සම්පූර්ණ විය.

ඉක්බිති සංඝකාර ධර්මයන්ගේ උදය ව්‍යය හා ත්‍රිලක්ෂණයද උපක්ලෙශයන්ගෙන් මිදුනු පිරිසිදුවූද දියුණුවූද විදර්ශනා ඥානයෙක් බලන්නාවූ මහතාණන් වහන්සේට සංඝකාරයන් පිළිබඳ තණ්හාය ශීඝ්‍රයෙන් වැටහෙන්ට පටන් ගන්නේය. සංඝකාරයන්ගේ උදයට වඩා ප්‍රකටව ව්‍යයම පෙනෙන්ට වන්නේය. මහා වර්ෂාවක් වර්ෂා කල ගං ඉවුරක හෝ වැව් ඉවුරක සිටින කෙනෙකුට වැසි බින්දු වැටීමෙන් ගඟේ හෝ වැවේ දියබුබුලු වහා වහා නැගී බිඳී බිඳී යනා අයුරු පෙනේ. එහෙත් දිය බුබුලු නැගීමට වඩා බොහෝ බිඳීමම්

ප්‍රකටව පෙනෙන්නේය. එලෙසින්ම උදය ව්‍යය බලන කල්හි උදය ඛය ඤාණය සියුම්ව මුහුකුරායාමෙන් සංස්කාරයන්ගේ උදයයට වඩා ව්‍යයයම් වැටහෙන්ට විය. එහිදී මහතාණෝ උදය අනුව බැලීම නවත්වා ව්‍යයම-භඞ්ගයම බලන්ට පටන් ගත්හ.

භාවනා ක්‍රම:- සබ්බෙ සඞ්ඛාරා භිජ්ජනත්‍ති. අතීතා සඞ්ඛාරාපි අභිජ්ජිත්‍සු අනාගතා සඞ්ඛාරාපි භිජ්ජනත්‍ති. සඞ්ඛාරාරම්මණතා භිඤ්ඤාමපි භිජ්ජති යථෙවා සඞ්ඛාරෙ අඤ්ඤෙ කොචි භිජ්ජනක සත්තොවා පුග්ගලොවා නත්‍ථි. සඞ්ඛාරාව භිජ්ජනත්‍ථෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ සඞ්ඛාරා අනත්තා.

සියලුම සංඝකාරයෝ බිඳෙත්. බිඳෙත්. අතීත සංඝකාරයෝ බිඳුනාහුය. අනාගත සංඝකාරයෝද බිඳෙත්. බිඳෙන සංඝකාරයන් අරමුණු කළ සිතද බිඳේ. සංඝකාරයන් හැර බිඳෙන අන්කිසි සත්වයෙකු හෝ පුද්ගලයෙක් නැත. සංඝකාරයෝම බිඳෙත් නිරුද්ධ වෙත්. එහෙයින් සියලුම සංඝකාරයෝ අනිත්‍යයහ. සියලුම සංස්කාරයෝ දුක්ඛයහ. සියලුම සංඝකාරයෝ අනාත්මයහ. රූප-වෙදනා සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන සඤ්ඤ පසඳ ධාතු - ආයතනයන්ද අරමුණු කරගෙන මෙසේ භාවනා කරන්ට හැකිසි.]

මෙසේ සංඝකාරයන්ගේ භඞ්ගයම - නිරෝධයම බලමින් නිල-ඛුණු වඩන මහතාණන් වහන්සේට වැසි වටනා කල්හි වැවක් දෙස බලා සිටින්නෙහුට දිය බුබුලු බිඳි බිඳී යන සැටි පෙනෙන්නාක් මෙන්ද; රත්වූ කබලක තල බැදෙනකල පුපුර පුපුරා තල බැදෙනු පෙනෙන්නාක් මෙන්ද; සංස්කාරයන්ගේ බිඳීමම් ප්‍රකටව පෙනෙන්ට ඉඳ. එසින් මහතාණන්ගේ භඞ්ගානු පස්සනා ඤාණය සම්‍යක් විය

(සංස්කාරයන්ගේ භඞ්ගය-නිරුද්ධිය දැකීම නිවනට උපනිශ්‍රය වන බව:-

යථා බුබ්බුලකං පස්සෙ - යථාපස්සෙ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං - මච්චුරාජා න පස්සති

යන්නෙන්ද වදාරා ඇත. "බිඳෙන දිය බුබුලක් මෙන්ද; නිස්සාර මිරිඟුවක් මෙන්ද ලෝකය බලන්නහු මෘත්‍යු රාජයාට නොපෙනේ" යනු එහි අදහසයි.)

මෙලෙසින් සංස්කාරයන්ගේ භඞ්ගය බලන මහතාණන් වහන්සේගේ භඞ්ගානුපස්සනා ඤාණය මුහුකුරායන්ට විය. අත්තනුවේ සංස්කාරයන්ගේ නිරතුරුව යෙදෙන බිඳීම බලන්ම් සැසඳාර

යන් කෙරෙහි බිඟක්ද ඇතිවන්ට විය. භව – ගති – යොනි-සත්ත්ව සත්ත්වාවාස යන භූමි වශයෙන් ප්‍රභේදගතවූ සියලුම සංස්කාරයෝ මහබෝසතුන්ට මනඹියක් ලෙස නුවණැසට එලඹ සිටියහ.

"අතීතවූ සියලුම සංස්කාරයෝ බිඳුනහ. වර්තමාන සංස්කාරයෝද බිඳෙති. නිසැකයෙන්ම අනාගත සංස්කාරයෝද බිඳෙති. නිරුද්ධ වෙති."

මෙලෙසින් බඳන කල්හි බිඳි බිඳී යන නිරතුරුවම නිරුද්ධවන සංස්කාරයන්ගෙන් විරුණු සම්පූර්ණ භවත්‍රයම බිහිසුණු වණඹ මෘගයන්ගෙන් හා බියකරු දුර පිඹුරු ආදී සතුන්ගෙන් ගහණවූ මහ වනයක් මෙන්ද ගිනි අඟුරු වළක් මෙන්ද වැටහෙන්ට විය.

(**උපමාවක්ද දක්වනු ලැබේ**:– එක් සත්‍රියකට දරුවෝ තිදෙනෙක් වූහ. ඔව්හු තිදෙනාම රාජාපරාධ කළාහුය. ඔවුන් රජු වෙතට පමුණුවනු ලැබූ කල්හි රජ තෙමේ මොවුන්ගේ හිස් සිදුවසී නියොග කෙළේය. මවී තොමෝද මරණීය දඬුවමට නියමවූ දරුවන් තිදෙනා සමග ආඝාතන සථානයට ගියාය. වධකයින් වැඩිමල් පුතාගේ හිස සිඳ දෙවෙනි පුතාගේ හිස සිඳීමටද සැරසෙනු දැක මවී තොමෝ තුන්වෙනි පුතු පිළිබඳ ආලයද හැර දැමිය. වැඩිමල් පුතුගේ හිස සිඳින. දෙවැන්නාගේ හිසද සිඳියි. නිසැකයෙන්ම නෙවැන්නාද මරණු ඇතැයි ඕ නිශ්චය කළාය. මේ උපමාවෙහි අතීත සංඝස්කාරයෝ මරණු ලැබූ වැඩිමල් පුතුමෙනි. වර්තමාන සංඝස්කාරයෝ වධයට පමුණුවන දෙවෙනි පුතා මෙනි. අනාගත සංඝස්කාරයෝ මරණයට නියමවූ තෙවෙනි පුතා මෙනි.

නවත් උපමාවක්:– එක් සත්‍රියක් දරුවන් දස දෙනෙක් ප්‍රසූත කළාය. එයින් නව දෙනෙක් මළහ. එක දරුවෙක් අතේ සිටියදී මැරෙයි. ගහීයෙහිද දරුවෙකි. ඕතොමෝ මළාවූ දරුවන් නව දෙන දැක; අතේ මැරෙන දරුවාද දැක කුසතුළ සිටින දරුවාගේ ජීවත්වීම පිළිබඳ ආලය දුරු කළාය. සංස්කාරයන්ගේ භඞ්ගයද මෙසේ මැයි.) සංඝස්කාරයන් කෙරෙහි බියවූ මහබෝසතුන් වහන්සේ "අතීත සංඝස්කාරයෝ බිඳුනාහුය. වර්තමාන සංඝස්කාරයෝ බිඳෙති. අනාගත සංඝස්කාරයෝද ඒකාන්තයෙන් බිඳෙන්නාහ. බිඳෙන සංඝස්කාරයන්ගෙන් පිරුණු භවත්‍රය ගිනි අඟුරු වළක් වැන්න. ඛිනිගත් නගරයක් වැන්න! පාළු ගමක් වැන්න. රකුසන් වෙසෙන ගුහාවක් වැන්න! වග වළසුන් වෙසෙන මහ වනයක් වැන්න" ආදී වශයෙන් මෙනෙහි කරන්ට වූ සේක. එහෙයින් භඞ්ගානුපස්සනා ඤාණයට අනතුරුව සංඝස්කාරයන් කෙරෙහි බියක් පහළ කළේය.

"භය සහිතවූ මේ සංඝකාරයෝ අනිත්‍යයහ. එහෙයින්ම දුක්ඛයහ. අනාත්මයහ"යි විදසුන් නුවණ වඩන්ට වූ සේක. එයින් මහතාණන් වහන්සේට **භයතුපට්ඨාන ඤාණය පහළවිය.**

(**සැලකිය යුතුයි:**- මේ නුවණින් කරන්නේ සංඝකාරයන්ට භයවීම නොවේ. සංඝකාරයන් භයට කාරණයකි දැනීමයි. ගිනි වළක් දුටු කෙනෙකු එයට භයවන්නේ එහි වැටුනොත් දැවෙන බව දන්නා නිසයි. සර්පයෙකු දුටු කෙනෙක් සර්පයන් ගැන දන්නම් සර්පයා බියකරු විෂඝෝර සර්පයෙකු බව දැනගනී. එහෙයින් සංඝකාරයන් බය සහිත බව දැකීම ත්‍රිලක්ෂණ භාවනාවට ඉවහල්ය. අතීතාදී කාල වශයෙන් ප්‍රභෙදගතවූ සංඝකාරයෝ බිඳෙන හෙයින් අනිත්‍යයහ. එහෙයින් බිඳෙන සංඝකාර නිමිත්ත භය වශයෙන් දකී. සංඝකාර ලක්ෂණය ප්‍රවෘත්තියෙහිදී තැළීම්-පෙළීම් ආදියෙන් පීඩාවන්ට පත්වනු දැක දුක් බව සලකයි. බෝම්බ වැටීමෙන් විනාශවූ ගිස් නගරයක් මෙන් සංඝකාරයන්ගේ අනාත්ම බව සලකයි. එහෙයින් සංඝකාරයන්ගේ බිය බව දැක්ම විදසුන් නුවණ දියුණු වීමට හේතු වෙයි. සංඝකාරයන්ට බියක් නොවන මඳ බුද්ධික ලෝකයා ගිනි අඟුරු වලේ වැටී නසින්නකු ලෙසින් ජාති ජරා මරණාදී විපත්වලින් නැසෙයි.)

භයතුපට්ඨාන ඤාණයෙන් සංඝකාරයන්ගේ බය දක්නා මහසක්තුමෝ වඩවඩාත් ත්‍රිලක්ෂණයන් ප්‍රකට ලෙස දටහ. භයට හේතුවන සංඝකාරයන්ගේ ආදීනව (දොෂ) ද මෙනෙහි කරන්ට වූ සේක. නයෙකු දැක බියවන හැනැත්තේ නයාගේ විෂ වේගයද ඔහුගේ සියුම් දළද ගැණ මෙනෙහි කරයි. බියකරු වෘළ මිගාදීන්ගෙන් සිදුවන අනතුරු විපත් නිසා වනය බියකරු තැනක් ලෙස සලකයි. මේලෙසින් භයතුපට්ඨාන ඤාණයෙන් පසුව මහතාණන් වහන්සේ සංඝකාරයන් පිළිබඳ නානාප්‍රකාර ආදීනව බලන්ට පටන් ගත්සේක. "මේ සංඝකාරයෝ නිරතුරුව බිඳි බිඳි යන්නාහ. මොවුන්ගේ බිඳීම නිසා ජාති-ජරා-ව්‍යාධි මරණ සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාසයන් ගල ගලා එන්නේය. එය වැළැක්විය හැකි මහක් නැත. වැළැක්විය හැකි කෙනෙක්ද නැත. භවත්‍රයම අසරණය. ප්‍රතිෂ්ඨා රහිතය. සතර මහා භූතයෝ විෂඝෝර සර්පයන් මෙනි. පඤ්චස්කන්ධය කඩු ඔසවාගත් වධකයෝ මෙනි. ආධ්‍යාත්මික ආයතනයෝ ශූන්‍යවූ ගම් මෙනි බාහිර රූපාදී ආයතනයෝ මං පහරණ සොරුන් මෙනි.

සප්ත විඤ්ඤාණස්ථිති හා නවඛීඩ සත්ත්වාවාසයෝ ගිහිනෙන් ඇමිළ ගත්තාක් මෙනි. මේ සංස්කාරයන්ගේ පහළවීම මහා කරදරයකි. බිහිසුනු විපතකි. මේ සියලුම් කරදර සංස්කාරයන් නිසාය එහෙයින් සංස්කාරයන්ගෙන් මිදීමම ඔවුන්ගේ සංසිදීමම ශාන්තිය වියයුතුය.

මෙලෙසින් භාවනාකරණ මහතාණන් වහන්සේට සංස්කාරයන්ගේ දෝෂ (ආදීනව) දක්නා **ආදීනවානුපස්සනා ඤාණය සම්පාදනය** වීය.

සංස්කාරයන්ගේ දෝෂ-ආදීනව හා අසරණ බව දැනගත් මහතාණන් වහන්සේ නැවත නැවතත් සංස්කාරයන්ගේ ආදීනව මෙනෙහි කරන්ට වූසේක. ආදීනවානුපස්සනා ඤාණයෙන් සංස්කාරයන්ගේ ආදීනව බලමින්ම සංස්කාරයන් කෙරෙහි කලකිරුණුසේක, ආදීනව-දෝෂ දුටු යම්දෙයක් කෙරෙහි කලකිරීම ස්වභාවිකය. එහෙයින් ජරා-මරණ ශෝක-පරිදේවාදී ආදීනවයන්ගෙන් යුක්තවූ සංස්කාරයන් කෙරෙහි වඩ වඩාත් කලකිරීම ඇතිවීය. කලකිරීම ඇතිවූ දෙය පිළිබඳ ඇල්ම දුරුකිරීමද ආදීනව රහිත දෙයකට ආශා කිරීමද **ලෝක සභාවයයි.** එහෙයින් චිත්‍රකූට පර්වතයෙහි ගුණදුටු හංසයෙක් ගවරවළෙහි නොඇලෙන්නාසේ සංස්කාරයන් කෙරෙහි සම්සුණියෙන්ම කලකිරුණුසේක. එපමණක්ද නොවේ. සංස්කාරයන් කෙරෙන් සිත මිදීමම යහපත් දෙය ලෙස සලකයි. එසින් වඩවඩාත් භාවනාවෙහි සිත දැලෙන්ට විය, එසේම ජාති-ජරා-මරණාදියෙන් නිදහස්වූ වූපසම සුඛය පිළිබඳ සෙවීමෙහි උද්‍යෝගය ඇතිවිය. මෙසේ සොයන මහතාණන්ට **නිබ්බිදානුපස්සනා ඤාණය** ඇතිවිය.

භයතුපට්ඨාන – ආදීනවානුපස්සනා – නිබ්බිදානුපස්සනා යන ඤාණ තුනම බොහෝසෙයින් සංස්කාරයන්ගේ දෝෂ දැකීම් වශයෙන් සමානය. ඇත්තේ සියුම් වෙනසක් පමණකි. මෙලෙසින් සංස්කාරයන් පිළිබඳ භය හා ආදීනවද කලකිරීමද ඇතිවූකල එසින් මිදීමේ කැමැත්ත පහළවන්ට විය. භව-යොනි-සත්ත්වාවාසයන්හි ඇති සියලුම් සංස්කාරයන්ගෙන් වෙන්වීමට සිත්විය. කුඩුවකට අසුවූ නිදැල්ලේ හැසිරෙන පක්ෂියෙකුට මෙන්; සිරමුහුණට අසුවූ මැඩියෙකුට මෙන්; මඩිගොඩක එරුණු ඇතෙකුට මෙන්; සංස්කාරයන්ගෙන් මිදීමේ උද්‍යෝගය උපන්නේය. ලෞකික සියලුම් සංස්කාරයන්ගෙන් මිදීමේ කැමැත්ත පහළවිය. එසින් මහතාණන්ට **මුඤ්චිතුකම්‍යතා ඤාණය** උපන්නේය.

මෙසේ සියලු සංඝකාරයන් කෙරෙහිම කලකිරුණු මහබෝසතුන් වහන්සේට සංඝකාරයන්ගෙන් මිදීමේ කැමැත්ත මුඤ්චිතුකම්‍යතා ඤාණයෙන් පහළවූ කල්හි අනතුරුව ඉන් මිදීමේ උපාය මාර්ගය සොයන්ට විය. කලකිරුණු දෙයක් හැරදැමීමේ උපායමාර්ගය සෙවීම සවභාවයෙන්ම සිදුවන්නකි. එහෙත් කාලානන්තරයක් මුළුල්ලෙහි මමය-මගේය කියමින් මමත්වය ඇතිව පොෂණය කරණ ලද සංඝකාරයන්ගෙන් සම්පූර්ණයෙන් මිදීම එතරම් ලෙහෙසි නොවේ සත්වයාගේ චිත්තසන්තානගතව පවත්නා ලොභ දෙස-මොහ දිට්ඨි ආදී කෙලෙශයන් සම්පූර්ණයෙන් නිරවශෙෂයෙන් නසන-නාක් සංඝකාරයෝ නොකැමැත්තෙන් උවද පහළ වන නිසයි එහෙයින් සංඝකාරයන්හෙන් මිදීමට කළයුත්තේ සංඝකාරයන්ගේ සම්භවයට හා පැවැත්මටද හේතුවන ඒ ලොභ දෙෂාදී පාප ධර්මයන්-කෙලෙශයන් නැවත නූපදනාසේ ප්‍රහාණය කිරීමයි. සංඝකාරයෝ වනාහී නානාප්‍රකාර ආදීනවයන්ගෙන් යුක්තවෙති. බොහෝ ආදීනව සහිත උවද සුළු ආස්වාදයක් පෙන්වා සත්වයා මුළාකරවති. සංඝකාරයන් කෙරෙහි පවත්නා බලවත් ප්‍රකට දෙෂ-ආදීනව සටපත්කොට සුළු ආස්වාදයක් ප්‍රකට ඉෂ්ටය ලෙස දක්වා සත්වයා මුළාකරවීමද සංඝකාරයන් කෙරෙහි පවත්නා අද්භූත බලයකි. ගවර වළකින් නෙලුම් සොයාගන්නාසේ පස් අතරින් රුවන් සොයා ගන්නාසේ ලොව්තුරු මගපල නුවණ ලැබීමම සංඝකාරයන්ගේ ඉෂ්ටය ලෙස සැලකිය යුතුය. එය ලබනු පිණිස සංඝකාරයන්ගේ අප්‍රකට ආදීනව සොයා දැන වහවහා සංඝකාරයන්ගෙන් මිදීමේ උපාය මාර්ගයද සම්පාදනය කළ යුතුය.

රාග-දෙස-මොහාදී කෙලෙශයන් උපදින්නේ සංඝකාරයන් නිත්‍යශුභයෙන් සැප හා ආත්ම වශයෙන් ගැණීම නිසයි. කෙලෙස් දුරුවන්නේ සංඝකාරයන් පිළිබඳ අප්‍රකටවූ අනිත්‍ය-දුඃඛ-අනාත්ම-අශුභ යන ආදීනව දැකීම නිසයි. ආදීනවානුපස්සනා-නිබ්බිදානුපස්සනා මුඤ්චිතුකම්‍යතා යන විදර්ශනා ඥානයන්ගෙන් සංඝකාරයන්ගේ ආදීනව දැක මිදෙන කැමැත්ත ඇති කළත් එපමණකින් සංඝකාරයන්ගෙන් මිදෙනු නොහැකියි. එහෙයින් සංඝකාරයන්-ගෙන් මිදීමේ උපාය මාර්ගය සලසාගැණීම වශයෙන් කුවහත් සංඝකාරයන් පිළිබඳ තිලකුණු වැඩිය යුතුය.

කරුණු මෙසේ හෙයින් මහබෝසතාණන් වහන්සේ නැවතත් සංඝකාරයන් පිළිබඳ තිලකුණු වඩන්ට පටන්ගත්සේක.

සෝ සබ්බසඞ්ඛාරේ අනිච්චතෝ දුක්ඛතෝ රෝගතෝ උප්පාදවය පටිවිජ්ජනතෝ ආදී වශයෙන් "විදර්ශී මාර්ගයෙහි" දැක්වූ ප්‍රකාරයි "සියලු සංඝකාරයෝම විනාශය අත්තකොට් ඇති

නැතිද; තාවකාලික නෙයින්ද; උදය-**ව්‍යය** දෙකින් පරිච්ඡින්න **නැතිද;** ජරා-ව්‍යාධි-මරණයන්ගෙන් හා අෂ්ටලෝක ධර්මයන්-**ගෙන්** සොලවනු ලබන නෙයින්ද; උපක්‍රමයන්ගෙන් හා **සභාව-විශයෙන්** බිඳෙන නෙයින්ද; අස්ථිර බැවින්ද; ජරා මරණයන්ගෙන් **පෙරලෙන** බැවින්ද; අසාර නෙයින්ද; නිත්‍ය-සුඛ-සුභ ආදී **අභිවෘද්ධියෙන්** තොර නෙයින්ද; ප්‍රත්‍යයන්ගෙන් නිපන් නෙයින්ද; **මරණය** සවභාවකොට ඇති නෙයින්ද **අනිත්‍යයෝය''** යි අනිත්‍ය **ලක්ෂණය** වැඩූහ.

එසේම ''සියලුම සංඝකාරයෝ නිතර නිතර පීඩාවන නිසාද; දුකින්ම ඉවසිය යුතු නිසාද; දුක්වලට වසඟවන බැවින්ද; රෝග-යන්ට හේතු බැවින්ද; ගණ්ඩයන්ට හේතුවන බැවින්ද; ඇතුළත රිදවන බැවින් හා බැහැරකිරීම දුෂ්කර නෙයින් හුල් වැනි බැවින්ද; පාපයට වසඟවන බැවින්ද; ආඛාධයන්ට උත්පත්තිස්ථාන බැවින්ද, රාග-දෙසාදී උපද්‍රවයන් එල්ලී ඇති බැවින්ද; ජාත්‍යාදී පස්ළිසි මහබයට හේතු බැවින්ද; ආරක්ෂාවක්; ''ආරක්ෂාස්ථානය්ක්'' නැති බැවින්ද; ආදීනව සහිත බැවින්ද; දුකටම හේතුවන බැවින්ද; ජාති-ජරා-ව්‍යාධි-මරණ-**ශෝක**-පරිදේවයන් සවභාවකොට ඇති නෙයින්ද; අනිශයින් සිත කය දවන බැවින්ද; තෘෂ්ණා දෘෂ්ටි මානයන්ට විෂය වන බැවින්ද **දුඃඛයෝය''** යි දුඃඛ **ලක්ෂණය** වැඩූසේක.

මේසේම ''සංඝකාරයෝ අපවිත්‍ර නෙයින්ද; දුගඳක්‍රය ඇතිවන නෙයින්ද, පිළිකුල් කටයුතු නෙයින්ද; කොපමණ සෑරසුවත් පිළිකුල් බව නොවැසියහැකි බැවින්ද; විරූප බැවින්ද අශුභයෝය''යි අශුභලක්ෂණය වැඩූසේක

එසේම ''සංඝකාරයෝ තමාට අනුකූලව නොපවත්නා නෙයින්ද සවවශයෙහි නොපවත්නා බැවින්ද; ධ්‍රැව-ශුභ-සුඛ- ආත්ම භාව-යන්ගෙන් හිස් බැවින්ද; ඉතා සළුප බැවින්ද; සවාමි-කාරක-වෙදකාදී වශයෙන් හිස්වූ; ඇතුළත හරයක් නොමැති බැවින්ද; අසවාමික බැවින්ද; **අනාත්මයහ''** යි අනාත්ම **ලක්ෂණය** දියුණු කළසේක.

මෙසේ නවත්‍රයටම අයත් සංඝකාරයන් කෙරෙන් **මිදීමේ** උපාය මාර්ගීය සෙවීම් වශයෙන් නැවත නැවතත් සංඝකාරයන් අනිත්‍යාදී වශයෙන් භාවනා කරන්ට වූසේක. මෙසේ භාවනාකරන් **කරන්ම** මහනාණන්ට අනිත්‍යාදී වශයෙන් සංඝකාරයන් **පරීක්ෂා** කරන්නාවූ **පටිසඹ්භානු පඤ්ඤා ඤාණය** පහළ විය.

මෙහිදු උපමාවෙක් වෙයි.

(එක් මිනිසෙක් මසුන් අල්වනු පිණිස දියෙහි කෙමනක් අටිවා තැබීය. පසුව හෙතෙම කෙමන් මුවෙන් අත දමා එහි තුළ සිටි සතෙකු අල්වාගෙණ සතා නොදැකම මවිසින් ලොකු මත්ස්‍යයෙක් අල්වාගන්නා ලදැයි සතුටුව සතා දියෙන් උඩට ඔසවා බැලීය. එහෙත් ඔහුගේ අදහස ව්‍යර්ථවිය. ඔහුට අසුවූයේ සජීයෙකි, නයෙකි. ඔහු නයාගේ සෝවැනි තුන දැක "අහෝ සජීයෙකැ"යි හැඳින ගියට පත්වී නයාගේ විෂවේගය ගැන සිතා දෙස් දැක නයා කෙරෙන් කලකිරුණේ නයාගෙන් මිදෙනු කැමතිව මිදෙන උපායක් සොයන්නේ නහුට අග පටන් අතේ වෙළා අත ඔසවා දෙතුන් වරක් හිස වටේ කරකවා සජීයා දුබලකොට "පල දුෂ්ට සජීය!"යි ගසාදමා වේගයෙන් ඇතට දිවපැන "මම ඒකාන්තයෙන් මහා සජීයෙකුගෙන් මිදුනෙමි" යි සතුටුව ආපසු බලමින් සිටියේය.

මේ උපමාවෙහි ඒ මිනිසාගේ මත්ස්‍යයෙකැයි සජීයා නොදැක බෙල්ලෙන් අල්වාගෙණ සතුටුවූ කාලය මෙන් යෝගාවචරයා මුලදී ආත්මභාවය ලබා සතුටුවන කාලය දතයුතුයි. කෙමන් මුවෙන් සජීයා ගෙණ සෝවැනි තුන දැකීම මෙන් සංඝකාරයන්ගේ අනිත්‍යාදී ලක්ෂණත්‍රය දැකීම දතයුතුයි. සජීයාට බියපත්වූ කාලය මෙන් භයතුපට්ඨාන ඤාණයද; සජීයා මුදනු කැමැත්ත මෙන් මුඤ්චිතු කම්‍යතා ඤාණයද; මිදීමට උපාය සමපාදනය කිරීම මෙන් සංඝකාර-යන් නිලකුණට නඟාබලන පටිසඞ්ඛානු පස්සනා ඤාණයද දතයුතුයි.

යම්සේ ඒ පුරුෂ තෙමේ සජීයා හිසවටේ කරකවා දුබලකොට නැවත දෂ්ටකරන්ට නොහැකි බවට පමුණුවා මනාසේ සජීයාගෙන් මිදේද එසේම යෝගාවචර තෙමේද සංඝකාරයන් ත්‍රිලක්ෂණයට නැඹීමෙන් දුර්ලකොට නැවත නිත්‍ය සුඛශුභ ආත්ම වශයෙන් ඵලඹ සිටින්නට නොහැකි බවට පමුණුවා මනාසේ සංඝකාරයන්ගෙන් මිදෙයි. එහෙයින් සංඝකාරයන්ගෙන් මිදීමේ උපාය සමපාදනය කිරීම් වශයෙන් නැවතත් සංඝකාර පරිග්‍රහය දක්වන ලදී.)

මෙසේ පටිසඞ්ඛානුපස්සනාඤාණයෙන් සංඝකාරයන්ගේ අනිත්‍ය-දුඃඛ-අනාත්ම-අශුභ යන ලක්ෂණයන් වටහාගත් මහා-ඛෝසකාණෝ ඒ සංඝකාරයන් පිළිබඳ කිසිත් භරයක් හෝ සෘජු පැවැත්මක් නොමැති බව නුවණින් දැක ශූන්‍යතාව සම්මර්ශනය කරන්ට වූහ.

ශූන්‍යතාව යනු අනාත්ම **ලක්ෂණමය**. සංඝකාරයන් පිළිබඳ අනිත්‍ය-දුඃඛ-අශුභ යන **ලක්ෂණයන්** වටහාගැනීම එතරම් අපහසු නැත. ප්‍රකට හෙයිනි. දුරවබෝධ වන්නේ අනාත්ම **ලක්ෂණයයි**. ලෝකයා සංඝකාරයන්ට ආශා කරන්නේ විශේෂයෙන් අනාත්ම **ලක්ෂණය** අප්‍රකට හෙයිනි. ඇතුළත හරයක් ස්ථිරස්වභාවයක් ඇත යනුවෙන් සලකමින් ඒ ස්ථිර ස්වභාවය ආත්මයයි වරදවා ගෙණ අඛ පෘථග්ජනයා සත්‍ය වශයෙන් නොමැත්තාවූ ආත්මය තහවුරු කරගැනීම හා පාලනය කරගැනීම පිණිස නානාප්‍රකාර **කම් රැස්කරගනී**. එයින් නැවත නැවතත් සංඝකාර සන්තතිය දියුණුවෙමින් පවතී. ඇතුළත හරයක් නැතැයි **සැලකීමෙන්** සංඝකාරයන් කෙරෙහි ඇති කරන නානණාව දුරුවෙයි. ඒ නිසා පවිසඛ්ඛානු පස්සනා ඤාණයෙන් පසු සංඝකාරයන්ගේ ශූන්‍යතාව මෙනෙහි කළයුතු බව දැක්වේ.

දවිකොටික; චතුකොටික; ඡඩාකාර; අෂ්ටාකාර; දශාකාර; ද්වාදශාකාර; ද්වාචත්වාරිංශාකාර යන ආකාරයන්ගෙන් ශූන්‍යතා **ලක්ෂණය** මෙනෙහිකළ යුතුබවද ධර්මයෙහි පෙනේ.

දවිකොටික (2) ශූන්‍යතා පරිග්‍රහය (භාවනාව)

"සුඤඤමිදං අත්තෙනවා අත්තනියෙනවාති දවිකොටිකං සුඤඤකං පරිගණ්හාති" යනුවෙන් විශුද්ධිමාර්ගයෙහි දැක්වූ පරිදි "මේ සංඝකාර ධර්මයන්හි 1 **මමය** කියා ගතයුතු කිසිත් නැත. 2 **මාගේ** යයි ගතහැකි කිසිවක්ද නැත. **එබැවින්** සංඝකාරයෝ ආත්ම ස්වභාවයෙන් හා ආත්මනීය ස්වභාවයෙන් හිස්වූවෝය" මෙසේ දැකීම දවි කාටික ශූන්‍යතා පරිග්‍රහයයි.

චතුෂ්කොටික (4) ශූන්‍යතා පරිග්‍රහය

"නාහං කුවචනි කස්සචි කිඤ්චන තස්මිං;
න ච මම කුවචනි කිස්මිඤ්චි කිඤ්චි නත්ථි."

1 මේ සංඝකාරයන් අතර මමයයි ගතයුතු කිසිම සංඝකාර-**යක්** නැත. 2 මේ සංඝකාර ධර්මයන්ගේ අධිපතිකාරයෙක්ද නැත. 3 මමය කියනු ලබන මේ සංඝකාරයන්ගෙන් අන්‍යවූ **සංඝකාරයක්** අතුරෙහිද ආත්ම වශයෙන් ගතයුතු කිසිත් නැත. 4 ඒ **සංඝකාරයන්ගේ** මමයයි කියනු ලබන මේ සංඝකාරයන්ට කිසිද **අධිපතියෙක්** නැතැ"යි මෙසේ දැකීම චතුෂ්කොටික ශූන්‍යතා **පරිග්‍රහයයි**.

ඡඩාකාර (6) ශූන්‍යතා පරිග්‍රහය

"රූපං සුඤ්ඤං අත්තෙනවා අත්තනියෙනවා නිච්චෙනවා ධ්‍රුවෙනවා සස්සතෙනවා අවිපරිණාම ධම්මෙනවා. 1 "රූපය ආත්ම සවභාවයෙන්ද; 2 ආත්මනීය (ආත්මයට අයිති) සවභාවයෙන්ද; 3 නොබිඳෙන ගතියෙන්ද; 4 නොසැලෙන ගතියෙන්ද; 5 සදාකාලික සවභාවයෙන්ද; 6 නොපෙරළෙන ගතියෙන්ද; ශූන්‍යය (හිස්ය)-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන මොව්හුද ආත්ම සවභාවයෙන්ද; ආත්මනීය සවභාවයෙන්ද; නොබිඳෙන ගතියෙන්ද; නොසැලෙන ගතියෙන්ද; සදාකාලික සවභාවයෙන්ද; නොපෙරළෙන ගතියෙන්ද; හිස්ය."

මෙසේ දැකීම ඡඩාකාර ශූන්‍යතා පරිග්‍රහය වෙයි. ධාතු-ආයතන විෂයෙන්ද මෙලෙස සයාකාරයෙන් බෙදා භාවනාකළ හැකියි.

අෂ්ටාකාර (8) ශූන්‍යතා පරිග්‍රහය

"රූපං අසාරං නිස්සාරං සාරාපගතං නිච්චසාර සාරෙනවා ධ්‍රුවසාර සාරෙනවා සුඛසාර සාරෙනවා අත්තසාර සාරෙනවා නිච්චෙනවා ධ්‍රුවෙනවා සස්සතෙනවා අවිපරිණාම ධම්මෙනවා යථා නළෝ අසාරෝ නිස්සාරෝ සාරාපගතෝ යථා එරණ්ඩා -පෙ- යථා උදුම්බරෝ -පෙ- යථා සෙතවෙජා -පෙ- යථා පාළිභද්දකෝ -පෙ- යථාඵෙනපිණ්ඩා -පෙ- යථා උදකබුබ්බුළං -පෙ- යථා මිරිචි -පෙ- යථා කදලිකක්ඛන්ධෝ -පෙ- යථා මායා."

"යම්සේ බටගස සාරයක් නොවේද සාරයක් නැත්තේද සාරයෙන් පහවූයේද එසේම එරඬුගස; දිඹුල්ගස; ලුණුවරණාගස; එරබදු ගස; පෙණපිඬ; දියබුබුළු; මිරිඟුව; කෙසෙල්කඳ; මායාව; සාරයක් නොවේද සාරයක් නැතිවේද සාරයෙන් පහවූයේද, එමෙන් රූපය 1 නිත්‍ය සාරයෙන්ද; 2 ධ්‍රැව සාරයෙන්ද; 3 සුඛ සාරයෙන්ද; 4 ආත්ම සාරයෙන්ද; 5 නිත්‍ය සවභාවයෙන්ද; 6 ධ්‍රැව සවභාවයෙන්ද; 7 ශාස්වත සවභාවයෙන්ද; 8 අවිපරිණාම සවභාවයෙන්ද; සාරයෙක් නොවේ, සාරයෙක් නැත්තේය. සාරසවභාවයෙන් පහවූයේය."

වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ හා ධාතු-ආයතනයන් පිළිබඳවද මෙලෙසින්ම වාක්‍ය යොදා ශූන්‍යතා පරිග්‍රහය කළහැකිය.

දශාකාර (10) ශූන්‍යතා පරිග්‍රහය

"රූපං රිත්තතෝ පස්සති, තුච්ඡතෝ සුඤ්ඤතෝ අනත්තතෝ අනීසරියතෝ අකාමකාරියතෝ අලබ්භනියතෝ අවසවත්තකතෝ දුක්ඛතෝ විපරිණාමතෝ පස්සති.

1 රූපය නිත්‍ය සාරාදියෙන් හිස්ය. 2 හිස් බැවින්ම පහත්ය 3 ආත්ම සාරයක් නැත. 4 තෙමේද ආත්ම නොවන්නේය. 5 අන්‍යයන් කෙරෙහි හෝ තමා කෙරෙහි හෝ අධිපති බවක් නැත්තේය. 6 කෙනෙකුගේ කැමැත්තක් පරිදි නිත්‍ය සුභාදියකට නොපැමිණේ. 7 මෙසේ වේවා! මෙසේ නොවේවා!! යනුවෙන් සිය කැමැත්ත හෝ අනිකෙකුගේ කැමැත්ත කෝ පරිදි නොලැබිය හැකිය. 8 සවශයෙහි නොපැවැත්මිය හැකිය. 9 එහෙයින්ම අන්‍යයෙකු වැනිය. 10 ඇතුළත කිසිවක් නැති බැවින් හිස්ය."

මේලෙසින් දශාකාර ශූන්‍යතාව හිස්බව මෙනෙහි කළයුතුවෙයි. වෙදනා-සඤ්ඤා සඞ්ඛාර-විඤ්ඤාණ හා ධාතු-ආයතනයන් පිළිබඳවද මෙලෙස වාක්‍ය යොදා භාවනාකළ හැකියි.

දවාදශාකාර (12) ශූන්‍යතා පරිග්‍රහය

"රූපං න සත්තෝ, නජීවෝ; නනරෝ; නමාණවෝ; න ඉත්ථී; න පුරිසෝ; න අත්තා; න අත්තනියං; නාහං; න මම; න අඤ්ඤස්ස න කස්සචි.

1 රූපය සත්ත්වයෙක් නොවේ. 2 ජීවයක් නොවේ. 3 නරයෙක්; නොවේ, 4 මානවයෙක් නොවේ, 5 ස්ත්‍රියෙක් නොවේ, 6 පුරුෂයෙක් නොවේ, 7 ආත්මයක් නොවේ, 8 ආත්මනීය (ආත්මයට අයත් නොවේ, 9 මම නොවේ, 10 මාගේ නොවේ, 11 අනෙකෙකුගේ නොවේ, 12 කිසිවෙකුගේ නොවේ.

මෙසේ සැලකීම දවාදශාකාර ශූන්‍යතා පරිග්‍රහයයි. වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ හා ධාතු-ආයතනයන් පිළිබඳවද මෙසේම වාක්‍ය යොදා භාවනාකළ හැකියි.

ද්වාචත්තාලීසාකාර (42) ශූන්‍යතා පරිග්‍රහය

රූපං අනිච්චතෝ දුක්ඛතෝ රෝගතෝ ගණ්ඩතෝ සල්ලතෝ අඝතෝ ආබාධතෝ පරතෝ පලෝකතෝ ඊතිතෝ උපද්දවතෝ භයතෝ උපසග්ගතෝ චලතෝ පභඞ්ගුතෝ අද්ධුවතෝ අතාණතෝ අලේණතෝ අසරණතෝ අසරණීභූතතෝ රිත්තතෝ තුච්ඡතෝ සුඤ්ඤතෝ අනත්තතෝ ආදීනවතෝ විපරිණාම ධම්මතෝ අසාරකතෝ අඝමූලතෝ වධකතෝ විභවතෝ සාසවතෝ සඞ්ඛතතෝ මාරාමිසතෝ ජාතිධම්මතෝ ජරාධම්මතෝ ව්‍යාධිධම්මතෝ මරණධම්මතෝ සෝකපරිදේව දුක්ඛදෝමනස්සුපායාස ධම්මතෝ සමුදයතෝ අත්ථඞ්ගමතෝ නිස්සරණතෝ පස්සති

රූපය අනිත්‍යය, දුකය, ලෙඩක, ගඩුවෙක, හුලක, පාපයෙක, ආබාධයක, තමාගෙන් අනිකෙක, පලුදුවන දෙයක, විපතට හෙලන දෙයක, උපද්‍රවයෙක, භයෙක, අනර්ථයෙක, සෙලවෙන දෙයක, බිඳෙන දෙයක, අසථිර දෙයක, පිහිටක් නැති දෙයක, ආරක්ෂා සථානයක් නැති දෙයක, පිහිට නොවන්නක, පිහිටක් වශයෙන් නොගත යුත්තක, හිස්වූවක, හිස් බැවින්ම ශූන්‍යවූ දෙයක, අසාරවූ දෙයක, අනාත්මය, ආශවාද රහිතය, ආදීනව සහිතයෙක, විපරිණාම ධර්මයෙක, හරයක් නැති දෙයක, පවට මුලෙක, වධකයෙක, විනාශවන්න දෙයක, ආශ්‍රව උපදවන දෙයක, ප්‍රත්‍යයෙන් කරණ ලද්දක, මරහුගේ ඇමක, ඉපදෙන සවභාවය ඇත්තේය. දිරන සවභාව ඇත්තේය, ව්‍යාධිය සවභාවකොට ඇත්තක, මරණය සවභාවකොට ඇත්තක, උපදින දෙයක, තැසෙන දෙයක, ඇල්ම දුරුකළයුතු දෙයක."

වෙදනා-සඤඤා-සඞඛාර-විඤඤාණ හා ධාතු-ආයතනයන්ද පිළිබඳව මෙසේ යොදාගෙණ භාවනාව ඇරඹිය.

(මේ දෙසාළිස් ආකාර ශූන්‍යතා පරිග්‍රහයට "තීරණ පරිඤඤා" යයි දක්වේ. "පරිඤඤාවෝ" තිදෙනෙකි.

ඒ බව සංයුත්තනිකාය අටඨකථාවෙහි මෙසේ දක්වේ. "තත්‍ථ කතමා ඤාත පරිඤඤා? පඤචක්ඛන්ධේ පරිජානාති අයං රූපක්ඛන්ධෝ -පෙ- අයං විඤඤාණක්ඛන්ධෝ ඉමාති තෙසං ලක්ඛණ-රස-පච්චු-පට්ඨාන-පදට්ඨානීති අයං ඤාත පරිඤඤානාම. කතමා තීරණ පරිඤඤා? එවං ඤාතා පඤචක්ඛන්ධේ තීරෙති අනිච්චතෝ දුක්ඛතෝ රොගතොති ද්වාවත්තාළිසාය ආකාරෙහි අයං තීරණ පරිඤඤානාම. කතමා පහාණපරිඤඤා? එවං තීරයිත්වා අග්ගහණෙන පඤචසු ඛන්ධෙසු ඡන්දරාගං පජහති අයං පහාණ පරිඤඤා."

පඤචස්කන්ධය පිළිබඳ ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන් විසෙසා දැනගැණීම ඤාතපරිඤඤා නම්වේ.

දෙසාළිස් අයුරින් ශූන්‍යතා පරිග්‍රහය කිරීම තීරණ පරිඤඤා නම්වේ.

අතීත් මාඝීඤඤණයෙන් පඤචස්කන්ධය කෙරෙහි පවත්නා ඡන්ද රාගය දුරුකිරීම පහාණ පරිඤඤා නම්වේ. "පරිඤඤා" යනු පිරිසිඳ දැනීමයි.)

මෙසේ දක්වූ ද්වාවත්තාළිස ආකාරයෙන් ශූන්‍යතා පරිග්‍රහය කරන කල්හි සංඝඨාරයන් පිළිබඳ භයද ඇල්මද දුරුවී උදාසීන බවක්-මධ්‍යස්ථභාවක්-ඇතිවෙයි. භයතුපට්ඨාන ඤාණයෙන් සංඝඨා-

මේ නුවණ ලැබූ යෝගාවචරයාගේ සිත ඉතා නිර්මලවත්ය. විදර්ශනාව බොහෝ සෙයින් දියුණුය. සංඝකාරයන්ගේ ලක්ෂණාදිය හොඳින් ඔහුට ප්‍රකටය. එපමණක්ද නොවේ දැන් යෝගාවචරයාගේ සිත සංඝකාරයන් කෙරෙන් මිදෙන්ට ඉතා ආසන්නය. යම් හෙයකින් ඔහුගේ සිතට නිවන පෙණේද, නිවන අසුවේද, ඔහුට එයම ශාන්ත වශයෙන්ද ප්‍රනීත වශයෙන්ද වැටහෙයි. එසේ වීමෙන් සිත, අරමුණු කිරීම් වශයෙන් නිවණට ප්‍රවිෂ්ට වේ. නිවන අසු නොවන තාක් ඔහුගේ සිත වරින්වර සංඝකාරයන් කරාම යොමු වන්නේය. සංඝකාරයන්ගේ දෙස් කෙතෙක් දුටුවත් නිවන දකින තුරු ඔවුන්ගේ සිතට අරමුණුවන්නේ සංඝකාරයෝමය. මෙයද ප්‍රකට කරවීමට උපමාවක් වෙයි.

පුරාණ කාලයේ නාවික වෙළෙන්දෝ නැව් නැඟී වෙළඳාම් පිණිස සමුද්‍රය තරණය කරමින් යන්නාහු කාකයෙක්ද ගෙණ ගියහ. හේ හෙයකින් ඔවුන්ට ගොඩ බිමක් සොයාගත නොහැකි වූවහොත් [නැව වාතවේගයෙන් මහ ඉක්ම ගියහොත්] ඔවුහු නැවේ සිටි පක්ෂියා මුදා හරින්නාහුය.

නැවෙන් පිටකල පක්ෂියා අහසේ ඒ මේ අත පියාසර කරන්නේය. ඔහුට ගොඩබිමක් දක්නට ලැබුණොත් පියාසර කොට ගොඩ බිමට යයි නැවත නැවට නොඑයි. ඒ ලකුණෙන් නැවියෝද පක්ෂියා ගිය දෙසට නැව පදවා ගෙන ගොස් ගොඩ බිම් දක්නාහුය. පක්ෂියාට ගොඩ බිමක් දක්නට නොලැබුන හොත් ඔහු නැවත ආපසු නැවටම එන්නේය.

මෙසේම සඞ්ඛාරුපෙක්ඛා ඤාණයෙන් සංඝකාරයන් කෙරෙහි මධ්‍යස්ථවූ යෝගාවචරයාට නිවන පෙනේ නම් ඔහුගේ සිත නිවනට (අරමුණු කිරීම් වශයෙන්) පැමිණෙන්නේය. නැතහොත් ගොඩබිම් නොදක ආපසු නැව කරා පැමිණෙන දිශා කාකයා මෙන් සංස්කාරයන්ම අරමුණු කරන්නේය.

සංඝකාරයන් කරා වරින්වර අරමුණු කිරීම් වශයෙන් පැමිණෙන සිත කෙසේනම් සංඝකාරයන් කෙරෙන් නියත වශයෙන්ම දුරුකළ යුත්තේද? නිවන සොයා ගත නොහැකිව නිවන නොපෙනී ආපසු සංඝකාරයන් කරාම දුව එන සිත නිවන කරාම ඇදී යාමට නම් නැවත නැවතත් සංඝකාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණය වඩ වඩා දියුණු ලෙසින් දැක්ක යුතුය. එහෙයින් ආධ්‍යාත්මවූද බාහිරවූද සඞ්ඛතියවූද; පරකීය [අනුන් පිළිබඳ) වූද සකල සංඝකාරයන්ගේම අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ත්‍රිලක්ෂණය නැවත නැවතත් මෙනෙහි

රයන් කෙරෙහි ඇතිකළ භය දුරුවන අකර මේ ශූන්‍යතා පරීග්‍රහය නිසා ඇල්මද දුරුවන්නේය. එහෙයින්ම සංඝකාරයන් මම කියා හෝ මගේ කියා හෝ නොගණියි. මධ්‍යස්ථවෙයි. සංඝකාරයන් කෙරෙහි උපෙක්ෂකවීමේ තත්ත්වය උපමාවෙන්ද දතයුතුය. ඒ මෙසේයි.

එක් පුරුෂයෙකුට සුරූපී භාර්‍යාවක් වෙයි. පුරුෂයා ඇයට ඉතා ආදරය කරයි. ප්‍රාණය සමාන කොට සලකයි. ඇ අත් පුරුෂයෙකු දෙස බැලීමද ඔහුගේ සිතට වේදනා ඇති කරවයි. නමුත් භාර්‍යාව සවාමියාට ඇල්ම නැත. ඕ සැමියා ඉක්ම හැසිරෙයි. පරපුරුෂයන්හා ආශ්‍රය කරයි. පුරුෂයා ඇයට කොතෙකුත් අවවාද කළත් ඇයගේ දුරාචාරකම නොවැලැක්විය හැකියි. පසුව පුරුෂයා ඇය ගැණ කළකිරී නොසතුටුවම කෝපයටද පත්ව ඇය ගෙණ ගොස් දෙමව්පියන්ට පවරාදී ඇයගෙන් සදහටම වෙන්වෙයි පසු කලක යටකී ඉනිරිය නාට්‍ය කණ්ඩායමකට බැඳී නැටුම් ඉගෙණ ඒ නාට්‍ය කණ්ඩායම සමග නාට්‍ය ප්‍රදර්ශනය කරමින් ඇවිදින්නට වූවාය. එක් තලෙක වෙදිකාවෙක්හි සෙසු නාට්‍ය කරුවන් සමග ඇය තවත කල්හි පළමු සවාමිපුත්‍රව සිටි පුරුෂයාවද ඇය දකින්ට ලැබුනේය. එහෙත් මැය මගේ භාර්‍යාව නොවේදැයි කියා ඇල්මක් හෝ මැය පුරුෂයන් සමග නටන්නී නොවේදැයි දෙමහයක් හෝ ඇය පිළිබඳව ඔහුට ඇති නොවීය. තමාගේ ඇල්ම දුරුකළ හෙයිනි.

මේ උපමාවෙන් දැක්වූවාක් මෙන් ලූඛෝකනාකාර ශූන්‍යතා ලක්ෂණ මෙනෙහි කිරීම නිසා යෝගාවචරයාගේ සිත සංඝකාරයන් කෙරෙහි ඇතිලෙයි. දෙස් දැක හරණලද භාර්‍යාව පිළිබඳ ඇල්මක් වත් දෙමහයක්වත් ඇති නොකරන්නාසේ සංඝකාරයන් කෙරෙහි මැදහත් වෙයි. ගින්නට ලංකළවිට හැකිලෙන කුකුළු පිහාටුවක් ලෙසින් සංඝකාරයන් කෙරෙන් හැකිලෙයි. මදක් ඇලකොට තබන ලද තෙලුම්පතට ඉසිනා දියබිඳු එහි නොරඳා වහ වහා හැකිලී හැකිලී පෙරලී පෙරලී යන්නාසේ සංඝකාරයන් කෙරෙන් සිත හැකිලෙන්ට වෙයි. සංඝකාරයන් පිළිබඳ "මම" හෝ "මගේ" යයි ගත යුත්තක් නොදැක භය හා ඇල්මද දෙමහයද දුරුකොට සංඝකාරයන් කෙරෙහි මධ්‍යස්ථ වෙයි. සියලුම භව- යෝනි- ගති- විඤ්ඤාණට්ඨිති- සත්තාවාසයන් පිළිබඳ සිත හැකිලෙයි. නිරාලය වෙයි. මධ්‍යස්ථවෙයි.

මෙසේ සංඝකාරයන් පිළිබඳව නිරාලයව මධ්‍යස්ථ භාවයෙන් මෙනෙහි කරන කල් සඞ්ඛාරුපෙක්ඛා ඤාණය (සංඝකාරයන් මධ්‍යස්ථභාවයෙන් දක්නා ඥාණය) උපදී.

නම්. සංඝකාරයන් "සැප" වශයෙන් සලකන තැනැත්තේ කාම තෘෂ්ණාදී වශයෙන් ප්‍රණිධියක් ඇතිකරයි. සුඛාසඤ්ඤ වශයෙන් සලකනු ලබන කල්හි සංඝකාරයන් මතුමත්තෙහිද ලබන තෘෂ්ණා ප්‍රණිධියද (ප්‍රාර්ථනාව) ඇතිවෙයි. සංඝකාරයන් දුක් වශයෙන් බලනකල සංඝකාරයන් පිළිබඳ ඒ තෘෂ්ණා ප්‍රණිධිය දුරුවෙයි. එහෙයින් සංඝකාරයන් දුක් වශයෙන් බලන දුක්ඛානුපස්සනාව **අප්‍රණිහිත විමොක්ෂ නම්.** සංඝකාරයන් පිළිබඳ ස්ථිර පැවැත්මක් නැතැයි ශූන්‍යතා ලක්ෂණය අනුව බලන කැනැත්තේ ආත්මාභිනිවේශය ("ආත්මය" යන දෘෂ්ඨි ග්‍රහණය) දුරුකරන්නේය. එහෙයින් අනත්තානුපස්සනාව **ශූන්‍යතා විමොක්ෂ** නම්.

"එත්ථ අනිමිත්තෝ විමොක්ඛෝති අනිමිත්තාකාරෙන නිබ්බානං ආරම්මණං කත්වා පවත්තෝ අරියමග්ගෝ. සොහි අනිමිත්තාය ධාතුයා උප්පන්නත්තා අනිමිත්තෝ. කිලෙසෙහිච විමුත්තත්තා විමොක්ඛෝ. එතෙනව නයෙන අප්පණිහිතා කාරෙන නිබ්බානං ආරම්මණං කත්වා පවත්තෝ අරියමග්ගෝ අප්පණිහිතෝ. කිලෙසෙහිව විමුත්තත්තා විමොක්ඛෝ. සුඤ්ඤතා කාරෙන නිබ්බානං ආරම්මණං කත්වා පවත්තෝ අරියමග්ගෝ සුඤ්ඤතෝ කිලෙසෙහිව විමුත්තත්තා විමොක්ඛෝති වෙදිතබ්බෝ. යනුවෙන්.

පූර්වෝක්ත ත්‍රිවිධ අනුපස්සනාවන්ට විදර්ශනා වශයෙන් විමොක්ෂ මුඛ යන නම ලැබෙන අන්දම නිවන් අරමුණු කරගෙණ නිවන් පිණිස මෙහෙයවූ සිත ඇතිව කරණු ලබන විදර්ශනාවෙන් සංඝකාරයන් අනිත්‍ය වශයෙන් විදර්ශනා ඥානයෙන් ලැබෙන ඥානඥේයය "අනිමිත්ත විමොක්ෂ" නමැයිද; සංස්කාරයන් දුක් වශයෙන් විදර්ශනා ඥානයෙන් ලැබෙන ඥානඥේයය "අප්‍රණිහිත විමොක්ෂ" නමැයිද; සංඝකාරයන් අනාත්ම වශයෙන් විදර්ශනා ඥානයෙන් ලැබෙන ඥානඥේයය "ශූන්‍යතා විමොක්ෂ" නමැයි"ද **විශුද්ධි මාර්ගයෙහි** දක්වේ.)

මෙසේ එදා මහඇබ්සතුන් වහන්සේට පූර්වෝක්තාකාරයෙන් සංඝකාරයන් අධ්‍යාත්මාකාරයෙන් දක්නා සංඛාරුපෙක්ඛා ඤාණය පහළවිය. එසේම ත්‍රිවිධ අනුපස්සනාවන් දියුණුවීමෙන් ත්‍රිවිධ විමොක්ෂ මුඛද පිරිසිදුවූහ.

ක්‍රමයෙන් පශ්චිම යාමයද ගෙවීයයි. විදසුන් වඩන මහාවීරවූ මහතාණන්ගේ උදයබ්බයඤාණ-භඞ්ගඤාණ-භයතුපට්ඨානඤාණ-ආදීනවානුපස්සනාඤාණ - නිබ්බිදානුපස්සනාඤාණ - මුඤ්චිතුකම්‍යතාඤාණ - පටිසඞ්ඛානුපස්සනාඤාණ - සඞ්ඛාරුපෙක්ඛාඤාණ

කළ යුතුය. එහෙත් ප්‍රකටවූ ත්‍රිලක්ෂණ දර්ශනය ඇති යෝගාවචරයාට ඒ සඳහා කළයුතු අමුතු භාවනාවක් නැත. යටකී ශූන්‍යතා දර්ශනය හැරදමා සංස්කාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණයම බලමින් හිඳිය යුතුය.

ත්‍රිවිධ අනුපස්සනා හා විමොක්ෂ මුඛ:- සංස්කාරයන්ගෙන් නිදහස්වූ; හේතු ප්‍රත්‍යයන්ගෙන් සංස්කරණය නොවූ අසංඛත ධාතු" සඛ්‍යාත නිර්වාණධාතුව **මොක්ෂ** නමින් හඳුන්වනු ලැබේ. මෝක්ෂයෙ ලබන මාර්ගඥනය "විමොක්ෂ මුඛ" නමින් දැක්වේ. නිවණ අවබෝධ වන්නේ මාර්ගඥන ඵලඥනයන්ගෙන් කෙලෙසුන් සහමුලින්ම නසා දැමීමෙන් පසුවයි. කෙලෙසුන් ඇතිවන්නේ සංස්කාරයන් පිළිබඳ "මම්ය" "මගේය" යන හැඟීම් ඇති නිසයි. එහෙයින් අනිච්චානු පස්සනා-දුක්ඛානුපස්සනා-අනත්තානු පස්සනා යන "අනුපස්සනා-වන්ගෙන්" උපකාරකරණු ලැබූ මාර්ගඥනයන්ගෙන්ම කෙලෙස් ප්‍රහීනකළ යුතුය. එහෙයින් සංස්කාරයන්ගේ අනිත්‍ය ලක්ෂණය දැකීම **අනිච්චානු පස්සනා** යයිද; දුඃඛ ලක්ෂණය දැකීම **දුක්ඛානු පස්සනා** යයිද අනාත්ම ලක්ෂණය දැකීම **අනත්තානු පස්සනා** යයිද කියනු ලැබේ. ඇතැම් යෝගාවචරයෙකුට සංස්කාරයන් පිළිබඳ අනිත්‍ය ලක්ෂණය ප්‍රකටව වැටහෙයි. තව කෙනෙකුට දුඃඛ ලක්ෂණය ප්‍රකටව වැටහෙයි. තවත් අයෙකුට අනාත්ම ලක්ෂණය වඩා ප්‍රකටව වැටෙහෙයි. ත්‍රිලක්ෂණයම එක්වර දකින යෝගාවචරයෝ සුලභ නොවෙති. **ඛුද්දකනිකාය පටිසම්භිදා තෙරණුවෝ** අනිත්‍ය ලක්ෂණය ප්‍රකටව දටහ. **පඤ්ච ඛණ්ඩිනිය** භික්ෂූහු අනාත්ම ලක්ෂණය වැඩිපුර ප්‍රකටව දුටහ.

මේ ත්‍රිවිධ අනුපස්සනාවෝම **විමොක්ෂ මුඛ** නමින්ද හඳුන්වනු ලැබෙන්. කෙලෙසුන්ගෙන් හා ලෝකයෙන්ද එතෙරවීමට හේතුවන ලොකොත්තර මාර්ගය විමොක්ෂය බවද **විමොක්ෂ** සඛ්‍යාතවූ ලොකොත්තර මාර්ගය කරා ඝන යොමු කරවන බැවින් ත්‍රිවිධ අනුපස්සනාවෝම "විමොක්ෂමුඛ" යන නම ලබන්නාහ.

සියලුම සංස්කාරයෝ ඉපද ඉපද බිඳි බිඳී යන්නාහ. එහෙයින් සංස්කාරයන් කෙරෙහි සතියෙක් හෝ පුද්ගලයෙක් නොලැබේ.

සංස්කාර පුඤ්ජයකට යන්ත්‍ර පුරුෂ-මනුෂ්‍ය නිරඟවීන යන ප්‍රඥප්තිය යෙදී ඇත්තේය. එහෙයින් යන්ත්‍ර-පුරුෂ යනු සංස්කාර නිමිත්තෙකි. නිත්‍ය සාඥාව ඇතිවන්නේ සංස්කාර නිමිති ආවරණ කරගෙණය. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය වශයෙන් බලන්නා සංස්කාර නිමිත්ත කෙරෙහි පැවති නිත්‍යය යන විපර්යාස හැරීම දුරුවන්නේය. එහෙයින් අනිච්චානු පස්සනාව **අනිමිත්තවිමොක්ෂ**

නම්ත්ද; මාගීඥනයන්ට ගැලපෙන අයුරින් දුර්ගති ගවඝන්ගෙන් හා සංසාර නිමිත්තවලින්ද උඩට නඟන නෙසින් (වළකාලනනෙසින්) **ඔභාගාමිනී විපස්සනා** නම්ත්ද හඳුන්වනු ලැබේ.

මෙකී "උදයබ්බය" ඤාණයේ පටන් "අනුලෝම" ඤාණය තෙක් පවත්නා නවමහා විදර්ශනාඥාණයන් දියුණුවෙමින් **මහබෝසතුන් වහන්සේට පට්පදඤාණ දස්සන විසුද්ධි ප්‍රතිලාභය වීය.**

"අනුලෝම ඥනය" උපදවාගත් මහතාණන් වහන්සේට ආර්ය්‍ය මාර්ගඥනය ඉපදවීම සඳහා කළයුතු අමුතු දෙයක් නැත. එහෙත් තවම නිරෝධ සත්‍යය (නිවණ) ප්‍රතිවෙධ නොවීය. නිවණ ප්‍රතිවෙධ කළයුත්තේ මාර්ගඥනයේදී කෙලෙසුන් ප්‍රහීන කිරීමෙනි. කළුවර කාමරයක පහනක් දැල්වීමෙන් එහි ආලෝකය පැතිරයයි. අඳුර දුරුවීම්ද ආලෝකය පැතිරයාම්ද යන දෙකම එකම පහණින් සිදුවෙයි. එලෙසම ආර්ය්‍යමාර්ගඥනාලෝකයෙන් කෙලෙස් අඳුර දුරුවීම්ද නිවණ පෙනීම්ද එකවිට සිදුවෙයි. කෙලෙස් ප්‍රහීන වන්නේද නිවණ පෙනෙන්නේද ලොකොත්තර විදර්ශනාඥනයටමය. "උදයබ්බයාදී නවමහාවිදර්ශනා ඥනයෝ ලෞකිකයහ. එහෙත් ලෞකිකඥනය දියුණුවීමෙන්ම ලොකෝත්තර ආර්ය්‍යමාර්ගඥනය ලැබිය යුතුයි.

—

"නිවණ" යනු කොහේවත් නිබෙන දෙයක් නොව ලොකෝත්තර මාර්ගඥනයෙන්ම ප්‍රතිවෙධ කළයුතු ශාන්ත සුඛසභාවයකි. මිසැසට යමක් පෙනෙන්නාසේ නිවණ ප්‍රත්‍යක්ෂ වන්නේ මනසටය. එය ප්‍රත්‍යක්ෂ වන්නේද ලෞකික දෙයක්ම ඇසුරු කරගෙණ විදසුන් වැඩීම නිසයි. පරවෙන මලක් දැක; ගලායන ජලයක් දැක; නිවෙන පහනක් දැක; යෝගාවචරයෝ විදසුන් වඩා සංඝකාරික සභාවය දැන අධ්‍යාත්ම සංඝකාරඝන්ගේද සභාවය එලෙසින් වටහාගෙණ විදසුන් වඩා ලොකෝත්තර මගඵල නුවණ ලබති. චිත්තපරම්පරාව දියුණුවීමෙන් ලෞකිකත්වය ඉක්ම්වා ලොකෝත්තර බවට පමුණුවන්නේ විදර්ශනා බලයෙනි.

කරුණු මෙසේ හෙයින් මහබෝසතුන් වහන්සේගේද පාරමී බලයෙන් හා විදර්ශනා භාවනාවේ බලයෙන් ක්‍රමයෙන් චිත්තපරම්පරාව දියුණුවීමෙන් ආර්ය්‍යභවට පැමිණීමට ඉතා ආසන්න විය. "නිවණ" ප්‍රතිවෙධ කිරීමට චිත්තවීථියක් පහළ විය. එය ලොකොත්තර අභිඥා චිත්තවීථිය" නම්ත් හෝ "මාර්ග චිත්තවීථිය" නම්ක් හඳුන්වා ඇත්තේය.

සත විදර්ශනා ඥනයෝ දියුණුවූහ. පූරිත පාරමී බලයෙන්ද පේර බුදුවරයන් වෙත පැවිදිව ධර්ම්ය ඉගෙණ විදර්ශනා වැඩීමෙන්ද පෙර භවයන්හිදී උපදවන ලද මේ ඤාණයෝ අලුයට ගිනි පුපුරු මෙන් තිබී මහතාණන් වෙත පහළවූහ. එහෙයින් සිත ලොකොත්තර මාර්ගඥනය ඉපදවීමට ඉතා ආසන්නවිය. මහතාණන්ගේ සිතේ ශ්‍රද්ධාව බලවත් විය. වීර්ය්‍ය හා සතිය්‍යද මනාසේ පිහිටියේය. සිත සන්සුන් විය. මෙසේ-සද්ධා-විරිය-සති-සමාධි-පඤ්ඤා යන පඤ්ච ධර්මයෝ දියුණුවූවාහු ලොකොත්තර මාර්ගඥන-ඵලඥන ඉපදවීමෙහි ලා අනිමුඛවූවාහු කෙලෙස් සතුරන් නැසීමෙහි සබළමුළක් මෙන් මහතාණන් පිරිවරා ගත්හු.

මෙසේ ත්‍රිවිධ අනුපස්සනාවන්ගේ වශයෙන් ඉතා සූක්ෂ්මවූ එශ්‍රේෂ්ඨවූ විදර්ශනා ඥනයෙන් සංඛාරයන් බලන මහතාණන්ගේ සිත භවඔහ විය. ඉක්බිති "සඛ්බාරුපෙක්ඛා ඤාණයෙන් සම්මර්ශනය කරණලද පරිදි සංඛාරයන් පිළිබඳ නිලකුණු අරමුණු කරමින් "මනොද්වාරාවජ්ජන" සිත ඉපිද නිරුද්ධවිය. ඉක්බිති යට පහළවූ "උදයබ්බය" ඤාණාදී අටවැදෑරුම් විදර්ශනා ඥනයන්ටත් අනුකූලවූ, මතු පහළවියයුතු ආර්ය්‍යමාර්ගඥන ඵලඥන යන්ටද ප්‍රත්‍යක්ෂ නොවූ; වහුසඝාර්යයන් වඩාලන අව්‍යාකෘත ද්‍රව්‍යකරමින්; අනිත්‍යාදී නිලකුණු මනාසේ ප්‍රකට කරමින් ලෞකික සියලුම විදර්ශනා ඥනයන්ගේ ඔජඝාතය වශයෙන් සලකනු ලබන කාමාවචර මහාකුශල් පිළිබඳ ජවනගත ඤාණත්‍රය (පරිකම්-උපචාර-අනුලෝම) පිළිවෙළින් බලවත්ව පහළවිය. මෙහි අනුලෝම යන කාමාවචර මහාජවනය සචවානුලෝම ඤාණ යන නමින් හඳුන්වනු ලැබේ.

විශෙෂයක්:—මන්ද බුද්ධිකයින්ට මේ ජවනගත ඤාණත්‍රය පරිකම්-උපචාර-අනුලෝම යන නමින් තුන්වරක් පහළවන බවද "නිකන්තිපඤ්ඤ" යන්ට උපචාර-අනුලෝම යන නමින් දෙවරක්ද පහළවන බව දැක්වේ. "සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත කාමාවචර මහාකුසල් සිත" මෙලෙසින් දෙවරක් හෝ තෙවරක් උපදින බවද මහබෝසතුන්ට මෙහිදී පරිකම් සිත නොයෙදුන බවද දක්වා ඇත. මේ මහාකුශල් සිතේ යෙදෙන ප්‍රඥාචෙතසිකයම් මෙහි අනුලෝමඤාණ යන නමින් හඳුන්වන බවද දතයුතුයි.

තවද මේ අනුලෝම ඥනයම විදර්ශනා ඥනයේ මස්තකය වන හෙයින් නිබ්බාපන විදර්ශනා නමින්ද, අනුලෝමඥනය සහිත හෙයින් සානුලෝම විදර්ශනාඤාණය නමින්ද; සංඛාරයන් කෙරෙහි උපෙක්ඛක භාවයෙන් පවත්නා හෙයින් සඛ්බාරුපෙක්ඛා

අත්හැර වෙවුලමින් එතෙර වැටී ගනික (වහා) නැගිට සිටින්නේය. එලෙසින්ම විදර්ශනා භාවනා කරණ යෝගාවචර තෙමේද භව--යෝනී--ගති විඤ්ඤාණට්ඨිති ආදීන්ගේ පරතෙරවූ නිර්වාණයෙහි පිහිටා සිටිනු කැමැත්තේ "උදයබ්බයානුපස්සනා" ආදී විදර්ශනා ඥානයන්ගේ වේගයෙන් දිව අවුත් ආත්මභාව සඞ්ඛ්‍යාත වෘක්ෂ ශාඛාවෙහි බැඳි එල්බෙමින් පවත්නා රූපසඤ්ඤ නමැති රුහැන වෙදනාදීන් අතුරෙන් එක්තරා එකක් නැමැති රිට හෝ; අනිත්‍යය කියා හෝ දුකය කියා හෝ අනාත්මය කියා හෝ **අනුලෝම** නැමැති අතින් ගෙණ; එය අත්නොහැරම පළමුවෙනි අනුලෝම සිතින් උඩපැන; දෙවන අනුලෝම චිත්තයෙන් පරතෙරට නැමුණු බරවූ කය ඇත්තහු මෙන් නිවණට බරවූ-නැමුනු සිත් ඇතිව තුන්වන අනුලෝම චිත්තයෙන් පරතීරයෙහි මත්තට පැමිණියහු මෙන් දැන් පැමිණියයුතු නිවණට ආසන්නව **එකී** තුන්වන අනුලෝම චිත්තයාගේ නිරෝධයෙන් ඒ **සංඛාර අරමුණ** මුදා ගොත්‍රභූ සිතින් විසංකාරවූ පරතීර සඞ්ඛ්‍යාතවූ නිර්වාණයෙහි වැටෙයි. එක් වරක් ගත් අරමුණෙහි ආසෙවන ප්‍රත්‍යයන්ගේ නොලැබීමෙන් වෙවුලමින් සිටි ඒ පුරුෂයා මෙන් මේ තාක් නිවණෙහි මනාසේ නොපිහිටියේ වෙයි. ගොත්‍රභූ ඤාණයට අනතුරුව පහළවන මාර්ග ඥානයෙන්ම නිවණෙහි පිහිටයි.

මෙහි දැක්වූ "අනුලෝම" ඥානය වනාහී චතුස්සත්‍යය මුවහ කරන කෙලහාඞ්කාරය දුරුකිරීමට නැකියි. එහෙත් නිවන් අරමුණු කරන්නට නොහැකියි. ගොත්‍රභූ ඤාණයම නිවන් අරමුණු කරයි. එහෙත් සත්‍යයන් ආවරණය කරන අඳුර දුරු කරන්නට නොහැකියි. එයටද උපමාවෙක් වෙයි. එක් ඇස් ඇති පුරුෂයෙක් නැකැත් යෝගයක් බලමිසි රාත්‍රිභාගයෙහි ගෙසින් නික්ම සඳ බලනු පිණිස උඩබැලිය. වලාකුල්වලින් වැසී නිබුනු හෙයින් ඔහුට සඳ නොපෙණිනි. ඉක්බිති එක් වාතයක් නැගී අවුත් ඝන ඝන වලාකුල් නැසීය. අනෙක් වාතයක් පැමිණ මධ්‍යම ප්‍රමාණයේ වලාකුල්ද; අනෙක් වාතයක් පැමිණ සියුම් වලාකුල්ද නසාලීය. අවසානයේ ඒ පුරුෂතෙමේ පහවූ වළාකුල් ඇති අහස්හි සඳ බලා නක්ෂත්‍ර යෝගය දැනගත්තේය.

මෙහි **වළාහකයක්** තිබෙන මෙන් චතුස්සත්‍යය මුවහ කරන ඝන-මධ්‍යම-සියුම්වූ කෙලෙස් නැමැති අඳුර දකියුතුය. වාතයන් නිඟන මෙන් අනුලෝම චිත්තයන් තිබෙනා දතයුතුයි. ඇස් ඇති පුරුෂයා මෙන් ගොත්‍රභූ ඤාණය දකියුතුයි.

මෙහිදී භවඞ්ග සන්තතිය සිඳී මනොද්වාරවජ්ජන සිතක් ඉපද නිරුද්ධ් ශිය බවද; ඊට අනතුරුව දෙතුන් විදර්ශනා චිත්ත කෙනෙකුත් උපන්බවද යට පටිපදාඤාණදස්සන විසුද්ධි කථාවෙහිදී විස්තර කරණලදී. එහි පළමුවැන්න, පරිකම් නමින්ද; දෙවැන්න උපචාර නමින්ද; තුන්වැන්න අනුලොම නමින්ද; හඳුන්වනු ලබන බවත්; මහබෝසතුන් වහන්සේට පරිකම් සිත නූපත් බවත් යට දැක්වීමු. ("මාගී චිත්තවීථියෙහි" යෙදුනු මෙකී කාමාවචර මහා කුසල ජවනයෝ එයට පළමුවෙන් සඞ්ඛාරුපෙකඛා ඤාණයට අරමුණුවූ රූපාදී සංඛාරයක්ම ත්‍රිලක්ෂණ වශයෙන් අරමුණු කරන්නාහ.)

මේ අනුලොම සිත්වලට අනතුරුව පෘථග්ජන ගොත්‍රය ඉක්ම-වන්නාවූ ආර්‍යගොත්‍රයට පමුණුවන්නාවූ ආර්‍යභූමියට නොපැමිණ ආපසු නොහැරෙන්නාවූ "ගොත්‍රභූ" චිත්තය පහළවිය.

මේ "ගොත්‍රභූ චිත්තය" විනාගී යටකී නවමහාවිදර්ශනාඥාන-යන්ට නොව ඉදිරියෙහි පහළවන ලොකෝත්තර මාගීඥානයට බර බැවින් පටිපදාඤාණදස්සන විසුද්ධියට ඇතුළත් නොවේ. එහෙත් බෙලෙහි ප්‍රභාණයක් ගොත්‍රභූ සිතින් නොයිදුවන නිසා මාගීඥානයන්ට අයත්ද නොවේ. අනුලොම ඤාණයට අනතුරුව, මාගීඥාන සිතට පෙරාතුව එහෙත් නිවණ අරමුණු කරමින් පහළවන ඤාණමාත්‍රයකි, එහෙත් විදර්ශනා ගොත්‍රයට අයත් බැවින් විදර්ශනා යන නම් ලබයි. (රූපාවචර අරූපාවචර ධ්‍යාන සිතට පෙරාතුවද කාමාවචර ගොත්‍රය ඉක්මවා ධ්‍යානය ලබන්නට ඉහා ආසන්නව නිබියදී ධ්‍යාන සිතට පෙරාතුව උපදනා සිතටද කාමාවචර ගොත්‍රය ඉක්මවීම නිසා "ගොත්‍රභූ" යන නම ලැබෙයි.) අනුලොම ඤානයෙන් සංඛාරයන් පිළිබඳ ත්‍රිලක්ෂණයන් මනාසේ දැකීම නිසා නැවත සංඛාරයක් අරමුණු කරගෙණ සිතක් ඉපදිය නොහැකි හෙයින් "ගොත්‍රභූ" සිතට නිවණ අරමුණුවන බවද දක්වා ඇත.

එකම ආවජ්ජනාවකින් එකම චිත්තවීථියක පවත්නා අනුලොම-ගොත්‍රභූ යන සිත් දෙක පිළිබඳ නානාරම්මණයන්හි පවත්නා ආකාරය දැක්වීමට උපමාවක් වේ.

"යම්සේ වනාහි මහා ඇලකින් පැන එතෙරවන කැමති පුරු-ෂයෙක් වේද; හෙතෙම වේගයෙන් දුවවිත් ඇලේ මෙතෙර රුක් අත්තක බැඳ එල්ලෙමින් පවත්නා රුහැනක් හෝ රිටක් හෝ අල්වාගෙණ උඩපැන එතෙරට නැවුනු-එතෙරට බරවූ ශරීරයෙකු සුකනව පැද්දෙමින් එතෙරට පැමිණ අල්වා සිටි රුහැන හෝ රිටි

යන නමින්ද හඳුන්වනු ලැබේ. මේ මාර්ගඥන ඛින සමගම එයට විපාක වශයෙන් ඵලසිතද උපදී. සොතාපත්ති මගඥණය පමණක් ලැබ ඵලඥනය නොලබන පුද්ගලයෙක් නොලැබේ. "අකාලිකො" යනුවෙන් වදාරා ඇත්තේද මාර්ගඥනය ලැබීමත් සමගම අනතුරුව ඵලඥනය ලැබෙන බවය. තවද "පුග්ගල-පඤ්ඤත්තිප්පකරණයෙහි" ඒකපුග්ගල නම් පුද්ගලයෙකු පිළිබඳ විස්තරයක්ද ඇත්තේය. මාර්ගඥනය උපදවාගත් පුද්ගලයා ඒකාන්තයෙන් ඵලඥනය ලබන බවද සම්මෙයකින් මාර්ගඥනය උපදවාගන්නාවිට කල්පවිනාශය එලඹ සිටියේනම්, ඔහු ඵලඥනය ලබනතෙක් කල්පය විනාශ නොවන බවද දැක්වේ.

"කතමොව පුග්ගලො ඒකබීජී. අයංව පුග්ගලො සොතා-පත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නො අස්ස, කප්පසසව උඩ්ඩයහන වෙලා අස්ස, නෙව තාවතාපෙපා උඩ්ඩහෙය්‍ය, යාවායං පුග්ගලො න සොතාපත්ති ඵලං සච්ඡිකරොති අයං වුච්චති පුග්ගලො ඒකබීජී. සබෙබපි මහග සම්ඛගිනො පුග්ගලා ඒකබීජිනො." (පුග්ගල පඤ්ඤත්ති) යනුවෙන් ඒකබීජී පුද්ගලයා පිළිබඳව විස්තර දක්වා ඇත්තේය.

මාර්ගඥනය උපදවාගත් පුද්ගලයා ඵලඥනය නිසැකයෙන් ලබන බවට උපමාවක්ද අට්ඨවාවෙහි දක්වා ඇත්තේය;—

"සොතාපත්ති මාර්ගඥනය ලැබූ පුද්ගලයාගේ හිස කෙළින් ඉහළ අහසෙහි යොදුනක් පමණ විශාලවූ එකඝන ගල්කුලක් පොටවල් තුනකින් බැඳි ලනුවකින් එල්ලෙන්නේයයි සිතන්න. ගලේ බරින් එක්ලනු පොටක් කැඩුනුවිට ඉතිරි පොටවල් දෙකින් ගල එල්ලෙනු හැකිය. ඉනුදු එක පොටක් කැඩුනනොත් ගල තනි පොටෙන් උසුලනු ඇතැයි සිතන්න. එහෙත් තනිපොටද කැඩී ගියේ නම් වළාකුලක් වැනිවූ ඒ විශාල ගල නිරාධාරවූ අහසෙහි නොපිහිටයි. නමුත් මාර්ගඥනයට අනතුරුව ඵලඥනය ලබනතුරු ඒ ගල ඔහු මත නොවැටේ. ගල වැටෙනතත් වැටෙන්නේ ඔහු ඵල ඥනය උපදවා ගැනීමෙන් පසුවයි.

මෙසේ හෙයින් මාර්ගඥනයට අනතුරුව එම චිත්තවීථියෙහිම ඵල සිතද ලැබෙන බව දැක්වේ. එහෙත් ආර්‍ය්‍ය පුද්ගල විභාගයෙහිදී මාර්ගස්ථයා ඵලස්ථයාසයි සොතාපත්ති අරිය සාවකයින් දෙදෙනෙකු දක්වා ඇත්තේය. එය කුශල-විපාක වශයෙන් මාර්ග සිත හා ඵල සිත් දෙකක් ලෙස යෙදෙන නිසයි.

තවද සෝවාන් මඟ-ඵල නුවණ ලැබූ ආර්‍යපුද්ගලයා නියත සම්මාදිට්ඨිකයෙක් වේ නිවන්මගට ඒකාන්තයෙන් පිවිසියෙක් වේ. නිවනට නොගොස් ආපසු සසර නොරැඳෙන්නේ වේ. අපාගයොත්-

වඳුරා මෙන් නිවණ දනයුතුයි. එක් එක් වානයෙන් පිළිවෙළින් වළා නැසීම මෙන් එක් එක් අනුලෝම සිතින් පිළිවෙළින් චතුස්සත්‍යයක් වසන අදුර දුරලීම දනයුතුයි. පහවූ වළා ඇති අහසෙහි ඒ පුරුෂයාගේ ඔරිසිදු සඳ දැකීම මෙන් චතුස්සත්‍යය වසාලන කෙලෙශාන්ධකාරය දුරුවූ කල්හි ගොත්‍රභූ ඥානයෙන් නිවන් දැකීම දනයුතුයි. වානයන් තුන්දෙනා සඳ මුවාකරන වළා දුරු කිරීමට සමත් වූවද සඳ දක්නට අසමත් වෙති. එමෙන්ම අනුලෝම ඤාණයෝද සත්‍යයන් වසාලන මොහඳුර දුරුකරන්ට සමත්වෙති. නිවන් දක්නට අසමත්ය. ඒ පුරුෂ තෙමේ සඳ දක්නට සමත්ය. එහෙත් ඔහු වළා දුරුකරන්ට සමත් නොවේ. එමෙන්ම ගොත්‍රභූ ඥානය නිවන් දක්නටම සමත්වේ. කෙලෙස් අදුර දුරුකරන්ට අසමත්ය. මේ නිසා ගොත්‍රභූ ඥානය; **මාගීවජ්ජනය** නම්ද හඳුන්වනු ලැබේ.

නවද මාගීඥානයට ඉතා ආසන්නව සිටී මේ "ගොත්‍රභූ" ඤාණය, මාගීඥානයට "මේසේ උපදුව"යි කියන්නාක් මෙන් මාගීඥානයට සංඥාව දෙමින් මෙන් ඉපද නිරුඛවෙයි. මාගීඥානයද ගොත්‍රභූ ඥානය විසින් දෙනීලද සඤ්ඤා නොහැරම නිවන් අරමුණු කරමින් පෙර නොඉදිනලද පෙර නොපලනලද ලෝභ දෙස මොහ යන කෙලෙස් රාශිය කෙලෙස් කඳ බිඳිමින්ම පලමින්ම උපදී. නවද මේ මාගීඥානය ලෝභාදීන් පැලීම පමණක් නොකරයි. අනවරාග්‍ර සංසාර වෘත්ත දුඃඛසමුදය ද්‍රියලයි. අපායයන්හි දොර පියයි. සපත ආර්‍ය්‍ය ධර්‍මයෙහි හමුබව කෙරෙයි. මිථ්‍යාදෘෂ්ටි-මිථ්‍යාඅභිකාර දුරුකරයි. සියලුම භය හා වෛර සිංසිඳුවයි. මෙබඳු ගුණ ඇති **ලෝකෝත්තර ප්‍රථම මාගීචිත්තය, ගොත්‍රභූඥානයට අනන්තරයේ පහළ වන්නේය.** මේ ප්‍රථම මාගීචිත්තය ලබන තෙක්ම පහළවන ඤාණයෝ ලෞකික වෙති. (ගොත්‍රභූඥානය වනාහි නවමහාවිදර්ශීනා ඥානයටවත් ලොකොත්තර ආර්‍යමාගී ඥානයටවත් අයත් නොවූ ඒ අතර පහළවන ඤාණමාත්‍රයකි.) නිර්‍වාණය නැමැති මහඅයුර කරා යන සැඩපහරක් වැනි හෙයින්ද; "සොත" නම්වූ ආර්‍යඅෂ්ටාඞ්ගික මාගීයට පළමුවෙන්ම පැමිණීමවූ මාගීය හෙයින්ද මේ ප්‍රථම මාගී චිත්තය **සොතාපත්ති මග්ගඤාණ** නමින් හැඳින්වේ. (නිර්‍වාණ නැමැති මහඅයුර කරා ගමන්කරන සැඩපහරක් වැනි හෙයින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාගීයට "සොත" යන නම ලැබේ.)

මේ සිතේ යෙදෙන ප්‍රඥාවම ලොකොත්තර වේ. "ආර්‍ය්‍යමාගී ඥාන" නම්ද දැක්වේ. මේ ආර්‍ය්‍යමාගී ඥානයෙන් යුක්ත පුද්ගලයා "සොතාපත්තිඵලට්ඨ අරියපුග්ගල" (සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවකයා)

පත්තියට හේතුවන කෙලෙස් සම්පූර්ණයෙන්ම ප්‍රහීනකළ හෙයින් ඔහු කිසිකලෙක දුගතියක නූපදී. මතු මාගීඵල නොලැබෙන්නේ උඩත්පිරිසෙසින් සුගතියෙහි උවද සත්වරකට වඩා නූපදී. ලෝකොත්තර ආර්‍යමාගීඥන-ඵලඥන අවින් ලැබීමට ඉඟා දුෂ්කර කෘත්‍යයද සෝවාන් මග-පල දෙකමය. එහෙයින්ම:—

පඨව්‍යා එක රජ්ජන-සග්ගස්ස ගමනෙනවා,
සබ්බලෝකාධි පච්චන-සොතාපත්ති ඵලංවරං.

(ධම්ම පදය)

යනුවෙන් "මහ පොළොවෙහි අධිපති රාජ්‍යයටත් වඩා, සදෙව්ලෝ අධිපති දෙව්රජ්ජයටත් වඩා, මුළුලෝ පිළිබඳ ලෝකාධිපත්‍යයටත් වඩා සෝවාන් ඵලය ශ්‍රේෂ්ඨවේ" වදාරා ඇත්තේය. සසරදීවත් තෙරුවන් හැර අන්සරණක් නොසොයන සෝවාන් ආර්‍යශ්‍රාවකයා නියත ගතිකයෙක් වේ. චතුරාර්‍ය්‍ය සත්‍යය ඡෝඩශ (16) කාරයෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරන මේ ආර්‍ය්‍ය පුද්ගලයා විසින් ප්‍රහීන කරණ කෙලෙසුන් පිළිබඳ විස්තර පට 68, 69, 70 යන පිටුවල සඳහන්වී ඇත.

1 සොතාපත්ති මහාවීර්‍ය (මන්දඉන්ද්‍රියයාගේ)

000	000	000	000	000	000	000	000	000	000	000
හ.	ල.	ජේ.	ම.	ප.	උ.	අ.	ගො.	ම.	එ.	එ.

000	000	000	000	000	000
හ.	හ.	හ.	හ.	හ.	හ.

---

2 සොතාපත්ති මහාවීර්‍ය (තික්ඛ පඤ්ඤයාගේ)

000	000	000	000	000	000	000	000	000	000	000
හ.	ල.	ජේ.	ම.	උ.	අ.	ගො.	ම.	එ.	එ.	එ.

000	000	000	000	000	000
හ.	හ.	හ.	හ.	හ.	හ.

මේ වීවි.සින් දෙකේ මන්ද පඤ්ඤයාට අනුලොම් සින් තුනක්ද ඵලසින් දෙකක්ද යෙදෙන අයුරු හා තික්ඛපඤ්ඤයාට අනුලොම් සින් දෙකක්ද ඵලසින් තුනක්ද යෙදෙන අයුරු සැලකිය යුතුයි.

මේසේ රූපරාග- අරූපරාග- මාන- උද්ධච්ච - අවිජ්ජා යන සංයෝජන ධර්ම සමූච්ඡේද වශයෙන් ප්‍රහීන කිරීමෙන්; සියලු දුක් පිරිසිඳ දකිමින්, දුකෙහි සමුදය ප්‍රහීන කරමින්, නිරෝධය ශාක්ෂාත් කරමින් මාර්ගය භාවිත කරමින් සසර පුරුද්දෙන් ඇතිවන වාසනා දෙෂද සමග සියලු කෙලෙස් නැසීමෙන් අර්හත්ඵල විමුක්තියෙන් නිර්වාණධාතුව ප්‍රතිවෙධ කළසේක. එහෙයින්ම ක්ෂීණාසව විසුද්ධියද සම්පූර්ණ විය. (සෝතාපත්ති ආදී සත්‍යාවබෝධඥානයෝ ක්ෂීණාසව විසුද්ධිය නම්වෙත්. සකදාගාමී ඥානයෙන් කෙලෙසුන් ප්‍රහීන කරන අතර ඵලඥානයෙන් කෙලෙසුන්ගේ "කෙලෙස් රස්නය" නිවාදමන බව මූලින්ම දක්වා ඇත.)

අර්හත් මාර්ගඥානයට අනතුරුව අර්හත් ඵලයද; ප්‍රහීන කෙලෙස්-යන්ද නිර්වාණයද දකිමින් ප්‍රත්‍යවෙක්ෂාඥාන සතරක්ද පහළවූහ. (අවශිෂ්ට-ඉතිරි කෙලෙසයන් බලන වධ්‍යකෙලෙස ප්‍රත්‍යවෙක්ෂා ඥානයක් ඇති නොවේ. කෙලෙසයන් නිරවශෙෂයෙන් ප්‍රහීනවූ හෙයිනි.)

මෙසේ මහාවීරවූ කෘතාධිකාරවූ ඒ මහාපුරුෂයාණන් වහන්-සේට අර්හත් මාර්ඥානය සමගම චතුප්‍රතිසම්භිදා; ෂඩ්අසාධාරණඥාන; දසබල ඥාන; චතුවෛශාරද්‍යඥාන; අටළොස් ආවේණික ධර්ම යනාදී බුද්ධ ගුණයෝද ප්‍රාදුර්භූවෝද පහළවූහ.

මෙසේ ඒ මහාවීරවූ කෘතාධිකාරවූ ශ්‍රීමත් සිද්ධාර්ථ ගෞතම මහාපුරුෂයාණන් වහන්සේ; තුරු ලිය මලින් නොබ-වත ඇතැම් තුරුමත කොවුල්-ගිරා-සැළලිහිණි ආදී සියොතුන් රංචුගැසි නදදෙන වසන්ත සිරියෙන් ලොව අසිරිමත් වෙද්දී; කලියුග වර්ෂ 2513 වැන්නෙහි වෙසඟ මැදි පොහෝදින (බදාදා) නෙරඤ්ජරා නදී තීරයෙහි පිහිටි අශ්වත්ථ (ඇසතු) නම් බෝධීන්ම මූලයෙහි වැඩහිඳ දසබිම්බරක් පිරිවර සහිතව පැමිණි **දෙව්පුත් වසවත් මරු පරදවා** ප්‍රථම යාමයෙහිදී පූර්වේනිවාසානුස්මෘති ඥානයද; මධ්‍යම යාමයෙහිදී දිව්‍යාංචක්ෂුර්ඥාන ඥානයද; **පශ්චිම යාම-යෙහිදී** ආශ්‍රව ක්ෂයකර ඥානයද; උපදවා සවාසනා සකල කෙලෙස-යන් ප්‍රහීනකොට; කිලෙසමාර-අභිසඛ්ඛාරමාර-ඛන්ධමාර-මච්චුමාර-යන සෙසු **චතුමාරයන්ද දිනා;** අනෙක ගුණගණාභරණ විභූසිත සර්වඥතාඥානාලෝකයෙන් සකල ලොකධාතුව එකාලෝක කරමින් දෙතිස් පෙරනිමිති පහළ කරවමින් **නිරුත්තර සම්‍යක් සම්බුද්ධ පදවියට පැමිණ වදාළසේක.**

එහෙයින් වදාළහ:—"සෝ එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ

බවෙන් පසු වොදන නමින් හඳුන්වනු ලබන බවද දැක්වෙයි.) අනුරුව දෙවෙනි මාගීචිත්තය පහළවිය. එහි චිත්තවීථියද මුලින් දැක්වූ "සොතාපත්ති මග්ගවීථිය" මෙනි. මේ දෙවෙනිව පහළවූ මග-ඵල තුවණ සකදාගාමි නමවේ **කාමරාග; පටිඝ** යන කෙලෙස් තුනීවී ගියද එහිදී කිසිම කෙලසෙයක් සමූච්ඡේද වශයෙන් ප්‍රහීන නොවිය. **මෙලෙසින් මහතාණෝ දෙවෙනි වාරයෙහිදී සකදාගාමි මාගී ඥාන හා ඵලඥාන එකම චිත්තවීථියකදී උපදවා ලොකොත්තර ඥාන සතරකින් සමන්විතවූ සේක් ඥානදස්සන විසුද්ධියද ලැබූහ.**

මෙහිදීද මහබෝසතාණන්ට සකදාගාමී ඵලඥානය ලැබීමෙන් පසුව මාගීයද; ඵලයද; ප්‍රහීන කෙලසයන්ද; අවශිෂ්ට කෙලසයන්ද; නිබ්බානයද යන කරුණු ප්‍රත්‍යවෙක්ෂා කරන ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝ පස්දෙනා පිළිවෙළින් පෙරකී ලෙසින් පහළවූහ. කාමරාග-පටිඝ දෙක තුනීවූබවද එකම කෙල්ලසයක්වත් ප්‍රහීන නොවූ බවද දැන මතු-මත්තෙහිත් කෙලෙසුන් ප්‍රහීන කිරීම පිණිස චිත්ත බලය මෙහෙයවූ මහතාණෝ නැවතත් පෙර ලෙසින්ම උදය-ව්‍යය ඥානයේ පටන් සංඛාරයන්ගේ ලක්ෂණ බලන්ට පටන්ගත් සේක ක්‍රමයෙන් බිඳ-ඇලුන් නුවණ දියුණුවීමෙන් සඞ්ඛාරුපෙක්ඛා ඥානයාගේ අවසානයේ ඇතිවූ අනුලෝම සිත් දෙකට පසුව පහළවූ වොදන සිත නිරුද්ධ-වීමට අනතුරුව සොතාපත්ති මග්ග චිත්තවීථිය මෙන් **අනාගාමි මග්ගචිත්තයෙ** හා ඵලසිත් තුනක්ද පිළිවෙළින් ඉපද නිරුද්ධවීමෙන් පසු ඔත භවඞ්ග විය. එසින් මහබෝසතුන් වහන්සේ ඒ අනාගාමී මග්ගඥාන බලයෙන් කාමරාග-පටිඝ යන කෙලෙස් බැම් දෙක නිරවශේෂයෙන් ප්‍රහීනකොට **අනාගාමී ආර්ය පුද්ගල ඵලයට පැමිණිසේක. එයද මහතාණන්ගේ ඥානදස්සන විසුද්ධි ප්‍රතිලාභය විය.**

අනතුරුව නැවතත් පෙර ලෙසින්ම මාගී-ඵල-ප්‍රහීනකෙලස-අවශිෂ්ට කෙලස-නිබ්බාන යන මොවුන් පරීක්ෂාකරන ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝද පිළිවෙළින් පහළවූහ. නවත් ප්‍රහීන කළයුතු කෙලෙසුන් ඇති බව දුටුසේක. එහෙයින් නැවතත් පළමු පරිදිම උදය-ව්‍යයාදී නවමහා විදර්ශනයන්හෙන් සංඛාරයන් ත්‍රිලක්ෂණයට නොසා ක්‍රමයෙන් විමසා බලන්ට පටන් ගත්හ. අවසානයේ සඞ්ඛාරු-පෙක්ඛා ඥානයද; අනතුරුව මනොද්වාරාවජ්ජනයෙන් පසු **අනු-ලෝම** වොදන යන ඥානයෝද පහළවූහ. එහෙයින්ම **අතීත් මාගී** ඥානඞ්ද අනතුරුව ඵලසිත්ද ඉපිද නිරුද්ධවූහ.

සුතු කිසිත් දෙයක් නැතැයි දැන ගතිමි. බ්‍රාහ්මණය! මෝ වකාහි (එදා) රාත්‍රි පශ්චිම යාමයෙහි මා විසින් අධිගමනය කරණ ලද විද්‍යාව වූවාය. අවිද්‍යාව දුරුවූවාය. විද්‍යාව උපන්නීය. අඳුර දුරුවිය. ආලෝකය පහළ විය. අප්‍රමාදීව කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇති කෙනෙකුට පහළවන යම් විද්‍යාවක් වේද, එය මට මැනවින් පහළ වූවාහ.

බ්‍රහ්මණය! මේ වනාහි එදා රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි මාගේ තුන්වෙනි බිඳීම විය. කුකුළු පැටවෙකුගේ අණ්ඩය (පිට කටුව) බිඳ යාමක් මෙන් මමද අවිද්‍යා නැමැති අණ්ඩය බින්දෙමි.

මෙසින් තථාගතයන් වහන්සේ තමන් වහන්සේ බුදුවූ දින රාත්‍රි පශ්චිම යාමයෙහි ආශ්‍රවක්ෂය කර ඥානයෙන් සියලු කෙලෙසුන් නසා චතුස්සත්‍යය ප්‍රතිවෙධ කළ බව පැහැදිලි කළසේක.

මහතාණන් සම්‍යක් සම්බුද්ධ පදවියට පැමිණි කල්හි දස දහසක් සක්වළ එක පැහැර එකාලෝක විය. ජලය කෙළවර කොට මහා පෘථිවියද කම්පාවිය. දෙතිස් පෙර නිමිති පහළවූහ. මෙසේ සම්‍යක් සම්බෝධි සම්ධිගමය කළ මහා වීරයාණන් වහන්සේ "මම මහත් සසර දුකින්ද කෙළෙස් බැම් වලින්ද මිදුනෙමි. **මාරවිජයට** පැමිණියෙමි. මහත්වූ දහම් ඇස පහළ කර ගතිමි; ලොක සත්වයාටද සදහම් දෙසා ඔවුන්ද සසර සසුරෙන් හොඬනහා අමාමහ නිවනට පැමිණවීමට පොහොසත්මි"යි සිතූ සේක. එසේ සිතන් සිතන්ම සියල් සිරුර පුරා පැනිර ගිය මහා ප්‍රීතියක් උපනී. ඉක්බිති මහතාණෝ **ඒ ප්‍රීති** වේගයෙන් යුකත වූවෝ මෙසේ උදන් ඇනූහ.

අනෙකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවේසමානා - දුක්ඛාජාති පුනප්පුනං.
ගහකාරක දිට්ඨොසි - පුනගේහං නකාහසි
සබ්බාතේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා.

"සිය දහස් ගණන් ජාති ඇති සංසාරයෙහි; ආත්ම භාව නැමැති ගෙය කරණ තැනැත්තා නැමැති වඩුවා [දැකීමට සමත් සම්බුද්ධත්වය නැමැති ඇස] සොයමින්; නොනැවතී. (මේතාක්) ඇවිද්දෙමි.

(ඒ ඇයි?) ජාතියක් පාසා ඉපදී ඉපදී මැරී මැරී යාම දුක් හෙයිනි.

ඒතෙ ආනෙඤ්ජාභිසඤ්ඤාය චිත්තං අභිනින්නාමේසිං. සෝ අහං "ඉදං දුක්ඛං" ති යථාභූතං අබ්භඤ්ඤාසිං.

"අයං දුක්ඛ සමුදයෝ" තියථා භූතං අබ්භඤ්ඤාසිං "අය දුක්ඛ නිරෝධෝ"ති යථා භූතං අබ්භඤ්ඤාසිං "අයං දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා"ති යථාභූතං අබ්භඤ්ඤාසිං ඉමෙ ආසවාති යථාභූතං අබ්භඤ්ඤාසිං. "අයං ආසව සමුදයෝ"ති යථා භූතං අබ්භඤ්ඤාසිං "අයං ආසව නිරෝධෝ"ති යථාභූතං අබ්භඤ්ඤාසිං "අයං ආසව නිරෝධ ගාමිනී පටිපදා"ති යථාභූතං අබ්භඤ්ඤාසිං.

තස්ස මෙ එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවාභි චිත්තං විමුච්චිත්ථ. භවාසවාපි චිත්තං විමුච්චිත්ථ. දිට්ඨාසවාපි චිත්තං විමුච්චිත්ථ අවිජ්ජාසවාපි චිත්තං විමුච්චිත්ථ. විමුත්තස්මිති ඤාණං අහොසි. ඛීණාජාති. වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නා'පරං ඉත්ථත්තායාති" අබ්භඤ්ඤාසිං 'අයං ඛෝ මෙ බ්‍රහ්මණ! රත්තියා පඨමෙ යාමෙ තතියා විජ්ජා අධිගතා. අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමෝ විහතෝ ආලොකෝ උප්පන්නෝ. යථාතං අප්පමත්තස්ස අතාපිනෝ පහිතත්තස්ස විහරතෝ අයං ඛෝ මෙ බ්‍රහ්මණ රත්තියා තතියෙ යාමෙ තතියානි නිබ්බේධ අහොසි. කුක්කුටච්ඡාපකස්සෙව අණ්ඩ කොසම්හා"ති.

එම්බ බ්‍රහ්මණය! මෙසේ ඒ මම; සිත සමාහිතවූ (එකඟවූ) කල්හි; පිරිසිදුවූ කල්හි; එතෙසින්ම ප්‍රභාස්වරවූ කල්හි; පහවූ රාගාදී අඟණ ඇති කල්හි; එතෙසින්ම පහවූ උපක්ලේශයන් ඇති කල්හි; මොළොක්වූ කල්හි; කම්‍මනීයවූ කල්හි; නොසැලෙන බවට පැමිණි කල්හි; ආශ්‍රවක්ෂය කර ඥානය (අර්හත් මාර්ගඥානය) පිණිස විදශීනා චිත්තය අභිමුඛකොට නැමුවෙමි. (යොමු කෙළෙමි.) ඒ මම ආශ්‍රවක්ෂය කර ඥානයෙන් "මේ දුඃඛ ආර්‍ය්‍ය සත්‍යය' යි යථා සබහාව ලක්ෂණ වශයෙන් තතුයේ දැන ගතිමි. "මේ දුඃඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය"යි – පෙ – "මේ දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය' යි තතුයේ දැනගතිමි. [එසේම] මොහු ආශ්‍රවයෝයයි – පෙ – මේ ආශ්‍රව සමුදයයි – පෙ – මේ ආශ්‍රව නිරෝධ යයි – පෙ – මෝ ආශ්‍රවයන් නිරුද්ධියට පමුණුවන ප්‍රතිපදාව යයි තතුයේ දැන ගතිමි. මෙසේ දැන ගත්තාවූ මෙසේ බලන්නාවූ මගේ සිත කාමාශ්‍රවයන්ගෙන් මිදුනේය. භවාශ්‍රව – පෙ – දෘෂ්ටාශ්‍රව – පෙ – අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. (එසේ සිත ආශ්‍රවයන්ගෙන්) මිදුනු කල්හි) සිත පවෙන් මිදුනේයයි දැන ගත්තා ඤාණයද පහළ විය. [එතෙසින්ම] උත්පන්නිය ක්ෂීණ විය. (අභාවයට ගියේය.) මගබඹ සරණ වැස නිම කෙළෙමි. කළයුතු සියල්ල අවසන් විය. මත්තෙහි කළ

iii මාර විජය

ශාක්‍ය වංශොද්භූතවූ; පරදුඃඛ දුඃඛිතවූ කරුණානිධානවූ සම්‍යක්සම්බුද්ධ සර්ව්ඥ රාජෝත්තමයාණන් වහන්සේ ධූලෝකනා කාරයෙන් **පෂ් මරුන් දිනා** සම්බුද්ධ රාජ්‍යශ්‍රීයට පැමිණිසේක් මීට; වර්ෂ 2545 ට පෙර අද වැනි වෙසක් පුණු පෝහෝ දිනකදීය.

මහබෝසතුන් වහන්සේ එදා කළ ඒ "මාර විජය" කුමක්දැයි අදත් අපට ප්‍රශ්නයකි. මේ මාරවිජය නිසා බොහෝ පැවිදි ගිහි පඬුවන් දක්වන නානාප්‍රකාර මතභෙද නිසා මාරවිජය; මාරවිජය කරමටම වටහා ගැණීමට දුෂ්කර කරුණක් වී තිබේ.

ත්‍රිපිටක ධර්මයේ තථාගත දෙශනාවන්හිද ශ්‍රාවක භාෂිතයන්හිද දක්වෙන **"මාර"** ශබ්දයේ පාපාත්මීයක් ප්‍රධාන වශයෙන් ගැබ්වී තිබේ. **සතෙන අනතෙ යොජෙඩා - මාරෙතීති මාරෝ** [මර්ධාතු + ණ ප්‍රත්‍යය] යනුවෙන් අඞ්ගුත්තර නිකායට්ඨ කථාවෙහි "සත්වයන් අනර්ථයෙහි යොදවා මරණ හෙයින් විපතට පත් කරවන හෙයින් ලොභාදීනු මාරයෝ වෙති"යයි අර්ථ විවරණ කර ඇත්තේය. **කෙලෙශයන් පිළිබඳ විස්තරයක් කරණ නිසා** එහිදී **"කෙලෙශ මාරයා" පිළිබඳව** අර්ථ විවරණය කිරීම සුදුසුය.

ඇතැම් පඬිවරු මේ අර්ථය පමණක් සලකාගෙණ **මාරයා** යනු **"කිලෙස මාරයා"** පමණකැයි කියති. **දස මරසෙන්** දක්වූ නැත තථාගතයන් වහන්සේ **කාමාදී** පාප ධර්මයන් යොදා දෙශනා කොට ඇත්තේය. මේ අදහස දැඩිකොට ගත් අය එදා ජයසිරි බෝමුල විදුරුසුන් අරා වැඩ සිටි මහබෝසතාණෝ රාගාදී කෙලෙශයන්ගෙන් තමන්වහන්සේගේ චිත්ත සන්තානය නිදහස් කර ගැණීමට තුන්-යම් රාත්‍රියක් මුළුල්ලෙහි යොදන ලද බලවත් උත්සාහයත්; මහ බෝසතුන් වැනි කෙනෙකුන් විසින් පවා තුන්යම් රාත්‍රියක් තුළම කරණලද බලවත් කෙලෙස් සවනකින්ම දමනය කළයුතු තරමට කෙලෙශයන් පිළිබඳව ඇති භයානක විෂම **තත්වයත්;** සලකාගෙණ **එදා වසවත් මරු** නම් කෙනෙකු සමග කළ සටනක් නැති බවද ඇතිවූයේ කෙලෙස් මරුන් සමග සටනක් බවද දක්වත්. මහ-බෝසතුන් කෙලෙසුන් දමනය කිරීම සඳහා කරණලද "කෙලෙස්

නෙමිඬා වඩුව! මා විසින් තෝ දක්නා ලද්දෙහිය. මින් මතු ඔතෝ මට ආත්ම භාව නමැති හෘදය තොම කරන්නෙහිය. (තා විසින් සාදන ලද ගෙහි) සෙසු කෙලෙස් නමැති පරාල මා විසින් බිඳින ලදී. අවිද්‍යාව නමැති කැණී මඩලද පලා දමන ලදී. මගේ සිත සංස්කාරයන් කෙරෙන් ඉවත් විය. [එහෙයින්] ඒ මම තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත රහත් මග - පලයන් ලැබීමි."

මෙසේ ඒ මහා වීරයාණන් වහන්සේ දෙව පුත්‍ර මාර - කිලෙස් මාර - අභිසඞ්ඛාර මාර - ඛන්ධමාර - මච්චුමාර - යන පස් වැදෑරුම් මාරයන් පරාජය කොට අසීත් ඵල විමුක්ති සඞ්ඛ්‍යාතවූ සෙවෘච්ඡ-න්‍රය ඔසවා ලබනලද සම්‍යක් සම්බුද්ධ රාජ්‍යශ්‍රීය ඇතිසේක් එදා සිට පස්සාලිස් (45) වසක් මුළුල්ලෙහි සදෙවඟ ලෝකයාට හිත වැඩ ප්‍රණිස සම්මුති - පරමත්ථ සඞ්ඛ්‍යාතවූ දෙයාකාර සත්‍යයෙන් ලොවට පහදදී දුකඛ - සමුදය-නිරෝධ - මග්ග - යන චතුස්සත්‍යයන් ප්‍රති-වෙධ කරවා වෙනෙය ජනයන්ගේ කෙලෙස් ගිනි නිවා ඔවුන් සසර සසුරෙන් ගොඩනන්වා නිර්වාණ මහා පුරප්‍රවරයට පැමිණවූ සේක.

"පඤ්චමාර විජය" කථා නිමි.

අටුවාවන් කලෝ කවරහුද?

තථාගතයන් වහන්සේ ආශයානුශයඥානයෙන් සත්වයන්ගේ චරිතානුකූලව ධර්මදේශනා කරණසේක. මාතෘකාවශයෙන් සූත්‍රයක් හෝ ගාථාවක් වදරා එය විස්තර කරණසේක. ඇතැම් විට තථාගතයන් වහන්සේගේ "භූතානු මොදනාව" අඛ්‍යුත්තර සභිය; දික්සභිය; තරමට විශාල බව දක්වෙයි. ත්‍රිපිටක ධර්මයෙහි පෙළෙහි ඇත්තේ සම්බුදුරදුන් වදාළ මාතෘකා දේශනා පමණකි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ඇතිවූ ප්‍රථම ධර්මසඞ්ගායනා වෙහිදී මහා කාශ්‍යප මහා සථවිරාදී සිවු පිළිසිඹියා පත් මහරහතුන් පන්සියයක් දෙනා වහන්සේ **පුළෝකන** මාතෘකා පාඨ – දේශනා ගාථා සූත්‍ර ආදිය කොටස් වශයෙන් ත්‍රිපිටකයක් කොට බෙදූ; විස්තර දේශනාව "අට්ඨ කථා" නමින් වෙන්කොට අර්ථකථා සහිත (සංවර්ණිතකථා) ත්‍රිපිටකය ආචාර්‍ය පරම්පරා මඟින් වාචොදග්ගකොට පවත්වාගෙන එන ලෙසින් යෙදවූ සේක.

ලඞ්කාද්වීප ප්‍රසාදක **මහා මහෙන්ද්‍ර** මහරහතුන් වහන්සේ ලක්දිවට පැමිණ මහජනයාගේ පහසුව පිණිස අට්ඨ කථාවන් හෙළ බසින් දේශනා කොට ලියා තුබූ සේක. '**සච්චබ්‍යා - කුරිඤ්ඤි** යන නමින් අට්ඨ **කථා** දෙකක්ද **මහා අට්ඨකථා** නමින් තවෙකක්දැයි අට්ඨකථා තුනක් හෙළ බසින් ලියා තුබූ බව දක්වේ. පසුව පැමිණි **බුද්ධඝෝෂ** මහා සඞ්ඝරාජයන් විසින් මිහිඳු මහරහතුන් වහන්සේ හෙළ බසින් වදාළ අට්ඨකථාවන් නැවතත් පාලි භාෂාවට පරිවර්තනය කර අට්ඨ**කථා** ලියන ලදී. ශ්‍රී මුඛ දේශනාව (පෙළ) මාගධියෙන් තිබියදී අට්ඨකථාවන් හෙළ බසින් තිබීම වරදක් ලෙස සැලකූ බුදුගොස් හිමියන් විසින් මිහිඳු රහතුන් ලියූ "හෙළ – අටුවා" නැවතත් මාගධී භාෂාවට පරිවර්තනය කොට ලියනලදී. ලොක විස්තර වැනි කරුණු වලදී බුදුගොස් හිමියන්ද වෙද මතාන්තර නොදැනුවත්වම වගේ ඇතුළත් කළ බව පෙනෙනත් **අටුවාවන්හි ඇත්තේ තථාගතයන් වහන්සේ විසින් වදාළ ප්‍රකිර්ණක දේශනාවන් මිස බුදුගොස් හිමියන්ගේ ධර්මයවත් මිහිඳු මහරහතුන් වහන්සේගේ ධර්මයවත් නොවන බව සැලකිය යුතුය.** යම් යම් තැන්වලදී අටුවා වාක්‍යයන් වහන්සේලා සඞ්කිය අදහස්ද ඇතුළත් කළහ. එහිදී **"අත්‍ත නොමති"** යනුවෙන් "මේ මගේ අදහසය" කීද දක්වූන. (බුදුගොස් හිමියන් ලියූ පාලිඅටුවා නිසා මිහිඳු මහරහතුන් ලියා තැබූ හෙළ අටුවා අභාවයට යාම නම් අපට සිදුවූ පාඩුවකි. (ක්ෂණයක් ක්ෂණයක් පාසා වෙනස් වන සුළු ලෝකයේ මනුෂ්‍යයන්ගේද

සටන" 'කවියා කවිබසින් ලිවීමේදීද සිතුතරා ඔහුගේ සිතුනමට නැඟීමේදීද කෙලෙස් සටන මනඃකල්පිත ලෙසින් කවිබසට හා චිත්‍රයට නඟා යක්ෂ-නාග-රාක්ෂසාදීන් භයානක අවි ආයුධ රැගෙණ මුවහ් ගිනිදැල් විහිදුවීම වැනි නානාප්‍රකාර "වෙස්" පෑමින් බෝසතුන් සමඟ සටන්කළ අයුරක් දැක්වීම විනා බෝසතුන් සමඟ ජයසිරි බෝමුලදී යම්කිසි සත්වයෙකුගේ භූතයෙකුගේ දෙවියකුගේ සටනක් නොවීයයිද වර්තමාන බොහෝ පඬුවන්ගේ මතයයි.

ප්‍රථමයෙන්ම "මාරපරාජයක්" පිළිබඳව කවි බසින් ලියා ඇත්තේ කිතුවසින් යට 1 වන ශතවර්ෂයේ විසූ ප්‍රථම මහා බෞද්ධ මහා කාව්‍ය කර්තෘවන **ශ්‍රී අශ්වඝොෂ** හිමියන් විසිනැයි **කියයි.** උන්වහන්සේ විසින් කවි බසින් ලියනලද මේ "මාරපරාජය" අනුගමනය කරමින් පසු කාලවල විසූ ග්‍රන්ථ **කර්තෘන්ද** සිය ගද්‍ය-පොත්පත්වල "මාර සටනක්" නිරූපනයකොට විස්තරකරන ලදැයිද බොහෝදෙනාගේ අදහසයි. ඒ පොතපත බැලූ චිත්‍රශිල්පීන් විසින් සිය කෘතීන්හි (බිතුසිතුවම් ආදියෙහි) "මාර පරාජයක්" නිරූපණය කරමින් **ඉදිරියට නෙරාඹිය** විශාල උදරයක් හා **මුවින්** පිටට විහිදුනු දළ දෙකක් ඇති, **ලෝගුලි දෙකක්** වැනි **විශාල ඇස්** දෙකක් ඇති යක්ෂයෙක් "මාරයා" ලෙස නිරූපණය **කරණ ලදැයිද** ඇන්න වශයෙන් "මාරයෙක්" බෝසතුන් හමුවට නොපැමිණියේ-යයිද ඇතැම් අය වැඩිදුරටත් කියත්. එහෙයින් "මාර පරාජය" යනු කෙලෙසුන් දමනයකිරීම විනා අනිකක් නොවේයයිද පළකරත්.

තවද "බ්‍රහ්ම - විෂ්ණු - මහෙශ්වර - සරස්වී - අනඹ - සිරිකත ගණදෙවි ආදීන් **සිළිබඳ** පැරණි පඬුවන් කළ විස්තර දෙස බලන කල වචනයට නඟා දැක්වීමට අසීරු බොහෝ කරුණු චිත්‍රයට නඟා රූපවත් කර - සිත්තරුන්ට අභිමත පරිදි නිරූපණය කර කියූ බැව් සිතිය හැකැයි"ද මතාන්තරයකි. **සවභාවික** සිද්ධීන් මනඃ **කල්පිත** පරිදි චිත්‍රයට නඟා රූපවත්කර දැක්වීම දක්ෂ ශිල්පීන්ගේ හා කවීන්ගේද සිරිත නිසා "මරදෙව්" පුතු සමඟවූ සටනද කෙලෙස් සටන රූපවත් **කර** දැක්වීමක් බව කියති.

අර්ථ කථාචාර්ය බුද්ධ ඝොෂ හිමියන් ත්‍රිවේදයෙහි පාරප්‍රාප්ත කෙනෙකු හෙයින් සිය (ජාතකට්ඨකථා - සුත්තනිපාතට්ඨකථා ආදී) අර්ථ කථාවන්හි යොදනලද වසවත් මරු පිළිබඳ ඇති **විස්තර** මනඃ **කල්පිත** යයිද කියත්.

ජනීක - ක්ෂානතිවාද – ආදී ජාතක දෙශනාද තථාගත දෙශනා වශයෙන් ප්‍රකටව ඇතත් "ජාතක දෙශනා ප්‍රබන්ධ කථාවන්" බව දක්වන විචිකිච්ඡා බහුල පුද්ගලයෝ කෙසේ නම් තථාගත ධර්මයෙන් පිහිටක් ලබද්ද?

විතණ්ඩවාදය හෙවත් තර්ක වැදගත් ශාස්ත්‍රයකි. එයින් ලෞකික කරුණු පිළිබඳ විනිශ්චයක් ලබා ගැනීමට බොහෝ සෙයින් හැකියි. එහෙත් තර්කානුකූල නොවන කොතෙකුත් දේ ලොව ඇත්තේය. මසැසට නොපෙනෙන තර්කානුකූල නොවන ඒ හැම දෙයම අසත්‍යයයි සිතනොත් සම්බුදු කෙනෙකුද නොලැබිය හැක. "මාරයා" පිළිබඳ ඇතැමුන්ගේ හැඟීම්ද මෙබඳු යයි කිව හැකිය.

"වසවත්මරු" යනු කවරෙක්ද?

"සදෙව්ලොව අතුරෙන් ඉතාම සැප හා ආයු අයිකවූ දෙව්ලොව **පරනිම්මිත** වසවත්තිය" වේ. "අනුන් විසින් මවනලද සැපයෙහි අධිපතිව වසන්නෝය" යන අර්ථයෙන් මේ දෙව් ලොව වැසියෝ පරනිම්මිත වසවත්ති දෙවියෝ යයි හැඳින්වෙති. එහි දෙවිවරුන් ඔවුනොවුන්ගේ කැමැත්ත අනුව ඔවුනොවුන් විසින් මවා දෙන ලද සැප අනුභව කරණ බව දක්වත්. මේ පරනිම්මිත වසවත්ති දෙව්ලොව වසන විශාල පිරිස් බලයක් ඇති කෙනෙකි වසවත් මර දෙව්පුත්. ඔහු එහි එක්වරා දුර්මරික තර්ජයකින් ක්‍රියා කරන බවද දක්වත්. එසේම සපත කාම භූමිය කෙරෙහිම අධිපති බවක්ද ඇතිව වෙසෙයි. එහෙයින් ඔහුට කාම භූමීශ්වරවූ වසවත් මරදෙව් පුත්" යයිද කියති. එපමණක්ද නොවේ. රූපාවචර බඹුන් කෙරෙහිද ඔහුගේ බල පැවැත්වීමක් ඇති බව තථාගත දෙශනා තුනින් පෙනේ: මැදුම් සඟියේ **බ්‍රහ්මනිමන්තනික සූත්‍රයෙහි** වදාළ පරිදි තථාගතයන් වහන්සේ **බකබ්‍රහ්මයා** දමනය කිරීම පිණිස බඹලොවට වැඩිය අවස්ථාවේදී මරදෙව්පුත් බඹෙකුට ආවේශවී තථාගතයන් වහන්සේට නිගාකළ අයුරු දැක්වේ. මහාසමය සූත්‍රය දෙශනාකරණ අවස්ථාවේදී දසදහසක් සක්වළින් පැමිණි දෙව් බඹ පිරිස අතර "මාරතජ්ජනිය" නම් මහා ඝෝෂාවක් කොට පිරිස කලබල කරවීමට මරහු දුරු ප්‍රයත්නයක්ද විඳතරවේ. ඔහු සෑම යහපත් කටයුතුවලට විරුද්ධය. පව්කරන්නහුට සම්පූර්ණ අනුබලය දෙයි කාමාවචර පින්කරන අයට වඩා ඔහු විරුද්ධකම් පාන්නේ ධ්‍යාන වඩනු පිණිස හා නිවන් ලබනු පිණිස වෙහෙසෙන

ගති ගුණ හා සිරිත් විරිත් කලින් කළ වෙනස්වීම සවභාවිකය. එක රටක උපන් ජාති කීපයක් අතර භාෂා වීලාසය හා චාරිත්‍ර විධිඳ නානාප්‍රකාරය. එකම ජාතිකයින් අතර උවද පලාත් වශයෙන් ඔවුනොවුන්ගේ සිරින් විරිත් වෙනස් බවද පෙනේ. මෙබඳු ලෝකයක සම්බුද්ධ කාලයේ පැවති ඇතැම් සිදුවීන් පිළිබඳ අටුවාවන්හි දැක්වෙන කරුණු වත්මන්මාන තර්කයෙන් වටහා ගැණීමට නොහැකි අවස්ථාද එමට ඇති බව පෙනේ. නමුත් වත්මන්මානයේ උවද භාරත දෙශයේ පවත්නා බොහෝ කරුණු සම්බුද්ධ කාලයේ පැවති සිදුවීන් සත්‍ය බවට නිදසුන් වශයෙන් පෙනේ. **විනයවස්තුකථා** වැනි ඇතැම් අටුවාවන්හි සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඇතිවූ සිද්ධීන්ද "අනුරාධපුර හා පොළොන්නරු යුගයේ" සිදුවීන්ද බොහෝ වීට ඇතුළත්වී තිබෙන බව පෙනේ. එහෙත් ඒවාද සත්‍ය සිදුවීන් ඇසුරෙන් ලියැවී ඇති බව නිසැකය. අට්ඨකථාවන්හි ඇත්තේ ආචාර්‍ය්‍ය මත පමණකැයි නිගමණය කෙරෙයි නම් ත්‍රිපිටක පාලියෙහි පමණක් ඇති ධර්මය අනුව තථාගත දෙශනාව වටහා ගත හැකිවේද? විශෙෂයෙන් පරාජිත පාලි- දීඝනිකාය- මජ්ඣිම නිකාය - සංයුත්ත නිකාය- වැනි ධර්ම ග්‍රන්ථයන්හි ඇතුළත් ධර්ම කලාප හා සූත්‍ර දෙශනාවන්හි නියම ධර්මය වටහා ගැණීමට "අට්ඨකථාව" හැර අන් කිසිවකින් පිළිසරණක් ලැබේද? නවද ධජග්ග පරිත්ත වැළද පරිත්ත ඛුරිය පරිත්ත මෝර පරිත්ත ආදී සූත්‍ර දෙශනාවන්හි ඇතුළත් දෙව කථාවන් පිළිබඳවද සක්කපඤ්හ සූත්‍රයෙහි එන ශක්‍රයා හා අභිඤ්ඤාතර නිකායෙහි එන රාහු අසුරෙන්ද්‍රයා පිළිබඳවද දැක්වෙන විස්තර සම්බන්ධයෙන් පවා බොහෝ දෙනා සැක කරත්. දෙවදූත සූත්‍රයෙහි දැක්වෙන "නිරිසතාගෙන් යමරජු විචාරණ පඤ්ච දෙවදූත ප්‍රශ්න" ගැණද ඇතැම් අය සැක කරත්. එපමණක්ද නොවේ. "ජාතක කථා" පිළිබඳව වර්තමාන පඬුවන් දක්වන "විවිකිච්ඡාව"ද අද්භූතය. අවිද්‍යාවක මහත!

"ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං-ගෙය්‍යං වෙය්‍යාකරණං - ගාථං - උදානං - ඉතිවුත්තකං - ජාතකං - අබ්භුතධම්මං - වෙදල්ලං උත්තරිඤ්ඤාසා පකාසෙය අත්ථං නප්පජානාති" (පඤ්චකඔඝුත්තර) සඳහුවෙන් තථාගතයන් වහන්සේ "තවෘඩග ශාසනය දෙශනාවක්" වදාරා ඇතිබව පෙලෙහිද දක්වා ඇතත් බොහෝ දෙනා ජාතක දෙශනාවන් "ශ්‍රුබඤ්ඤ කථා" බව ප්‍රකාශ කරත්. **දීඝ කොසල- මහා සුදස්සන- අරඤ්ඤ** ආදී කොළින්ම පෙළට සම්බන්ධ ජාතක දෙශනාද - වරියා පිටකයෙහි දැක්වූ දසපාරමී පරමාර්ථ වශයෙන් පිරූ සස- සඞ්ඛපාල- මහා

යෝගාවචරයින්ටය. කාමාවචර කුශලකර්ම බලයෙන් උපදින්නේ දෙව්ලොව හෝ මිනිස් ලොවය. එයින් සසර දැක්වන බව මරහු දනිති. එසේම කාමාවචර ලෝකය ඔහුට අවනතද හෙයිනි.

රූපාවචර ලොව ඔහුගේ බලය සීමාසහිත හෙයින් ධ්‍යාන වඩා ඔබලොව උපදින්නට ප්‍රයත්න දරන්නාහට ඔහු වඩා වඩාත් සතුරු කම් දක්වයි. ඇතැම් යෝගාවචරයන් කරා සත්‍රීවෙසින් පැමිණි-මෙන් හෝ නොයෙක් බියකරු අරමුණු දැක්වීමෙන් යෝගාවචරයා දුබල කරයි. පිළිවෙත අවුල් කරවයි. චිත්ත බලය අඩු යෝගා-වචරයෙක් නම් මේ "මාරපාශ"යන්ට රැවටී භාවනා කම්ය හැර දමයි, නැතහොත් ලෙඩෙක් වෙයි. සම්බුදුරදුන් කල **වජීරා, උත්පලවණ්ණා,** ආදී මෙහෙණිවරුන් කරා පැමිණි මරදෙවිපුත් උන්වහන්සේලාට අපහාස කළබව **සංයුත්තනිකායෙහි** දැක්වේ.

අකුසල් පාපයෙහි යොදවන අතර තෙමේද ඉවෙහි යෙදෙයි. තමාගේ විෂය ඉක්මවන අය කරදරයට හා විපතට පත්කරයි. පාපකාරීන්ට ඉතා හොඳින් අනුබලදෙයි. ඒකාන්ත අකුශල පක්ෂය භජනය කරයි. එහෙයින් ඔහු **පාසිමාමාරෝ-කණ්හ-පමත්තබන්ධු-වසවත්ති** යන නම්වලින්ද හඳුන්වා තිබේ. **එසේ උවද වසවත් මරදෙවිපුත් දෙව් ඛවට පත්වන්නේ උදාර කාමාවචර කුශල බලයෙනි.** එහෙත් මාරයෙකු වන්නේ මෙතම් කුශලයෙන් යයි ධර්මයෙහි නොදක්වේ. දෙව්දත් තෙර තථාගතයන් වහන්සේට කරණලද ඛාහිර කරදර හා විරුද්ධවාදීකම් කෙබඳුද? කෝකාලි දරුණුද? සම්බුදුරදුන් වැනි උතුමෙකුට විරුද්ධවාදීකම් දැක්වීමට කරම් පුණ්‍යබලයක් දෙව්දතුන් කෙරෙහි නොතිබුනේ නම් ඔහු ක්ෂණයකින්-මොහොතකින් මහපොළොව පැලී අපායට පැමිණෙනු නිසැක නොවේද? එහෙත් බලවත් පුණ්‍යබලයක් ඔහු කෙරෙහි පැවති බව **කොපෙතෙන්නේද?** දිනපතා "ලඟබත්" පන්සියයක් ලබමින් විශාල සිවුවණක් පිරිසක් ඇතිව සිටීමට තරම් බලයක් දෙව්දතුන් කෙරෙහි තිබුනේය. එබඳු බලයක් කුමන කුශල විපාකයක් නිසා ඔහුට ලැබුනේදැයි දක්වා නැත. "දෙව්දතුන් සසර රජකම් කළ බොහෝවාරවල ආරොග්‍යශාලා තැබීමෙන් ඒදඬුපාලම් දැමීමෙන් දුගීමගී යාචකාදීන්ට සංග්‍රහ කිරීමෙන් ලද කුශල විපාක" යයි **මිලිඳු ප්‍රශ්නයෙහි** දැක්වේ.

මෙලෙසින්ම වසවත් මරදෙවිපුත්කම සඳහා **කරණ අඹුසු** කුශලයක් නැත. එතකෑට කාමාවචර කුශල බලයෙන් **පරනිම්මිත** වසවත් දෙව්ලොව උපත් මරදෙව්පුත් තමන් ලද දිවසැප **බලමින්** "මට වඩා අනිකෙක් බලයට පත්නොවේවා" යන **හැඟීම් ඇතිකොට**

කාමසුගතියේම අධිපතිකම් දැරීමට ප්‍රයත්න දරයි. මහාපෘථිවියේ සිට යොදුන් දෙලක්ෂ සිවුඅනූදහසකින් මත්තෙහි "පරනිම්මිත-වසවත්තී" දෙවිලොව පිහිටි බව දැක්වෙයි. දෙවිලෝ ගණනින් එහි පරමායුෂ්ක සොළොස් දහසකි. මිනිස්ලෝ ගණනින් හවුරුදු තවයිය විසිඑක්කෝටි සැටලක්ෂයක් (921,60,00000) එහි පරමායු බවද **විභඞ්ගයෙහි** දැක්වේ.

"**තස්ස සොභ පරෙතස්ස වීණාකච්ඡා අභස්සථ**" යන්නෙන් පධානසූත්‍රය ආදියෙහි දැක්වෙන පරිදි "මරදෙවිපුත්" අත වීණාවක් තිබෙන බවද නන්වෙසින් මිනිස්ලොවට වීණාවත් රැගෙණ එන බවද ධම්මයෙහි පෙනේ. ඇතැම් පොත්වල "නිල්වන් ගසින් බබලන මිණිඔටුනු දරන" මරහුට පෘථුල්ලද (වක්‍රායුධය) ද ගිරිමේඛල නම් ඇතෙක්ද විශාල පිරිස් බලයක්ද ඇති බව දැක්වෙයි. "මාර පාක්ෂික දෙවිවරුන් හා භූතයන් පිළිබඳ විස්තර ධම්මයෙහි කොතෙකුත් ඇත්තේය. සම්බුදුරදුන් විශාලාපුර වැඩවෙසෙන කල භික්ෂූන් සියගණනක් මරා ලේවැකුණු කඩුව සේදීම පිණිස වත්ගුමුද, නදියට ගොස් කඩුව සෝදනකල කැවිගැසුණු ලේ ජලයෙහි දියවෙමි යනු දැක බියට පත් **මිගලණ්ඩික සමණකුත්තකයා** නමා කළ භික්ෂූඝාතනයෙන් සංවේගයට පැමිණිකල "**මාරපාක්ෂික**" එක් දෙවතාවෙක් ඔහු ඉදිරියේ පෙනී සිට "පින්වත! ඔබ සංවේග නොවෙව! සසර සයුරෙන් එතෙරවන්ට නොහැකිව සිටි බොහෝ භික්ෂූහු තොප විසින් එතරකරණ ලදහ. එබැවින් තවතවත් භික්ෂූන් මරව ඔබට එය සුගතිගාමී කුශලයක් වනු ඇතැ" යි පවසා සමණකුත්තකයා උදෙසූහි කළ බව තෘතීය පාරාජිකා ශික්ෂාපද වර්ණනාවෙහි දැක්වේ.

වසවත් මරහුගේ පිරිස:—මහබෝසතුන් බෝමුල විදුරසුන් අරා වැඩසිටින කල "වසවත්තීමාරයා සිදුනත් කුමරු මාගේ විෂය ඉක්මවනු කැමැත්තේය. ඔහු දැන් බෝමුලහිදී. දැන්ම ගොස් මොහු දෙකකුල් අල්වා පරසක්වළ ගසමි. මාගේ විෂය ඉක්මවා යා නොදෙමියි **දසඛිම්බරක්** සේනාව හැරගෙණ" (බුත්සරණ) යන්නෙන් වසවත් මරුගේ පිරිස දසඛිම්බරක් බව දැක්වූහ. **පණ්ඩිත වටද්දර මෙධානන්ද** හිමියෝ 1950 "දිනමිණ" වෙසක් කලාපයෙහි "දසඛිම්බර මරසෙනඟ" යන මාතෘකාවෙන් ලිපියක් ලියමින් දස ඛිම්බර නම්.–"කෝටි දශකොටියකැ" යි දක්වති.

කොටි සියය අයුතයක් බවද; අයුත සියය නයුතයක් බවද; නයුත සියය කඛකාරයක් බවද; කඛකාර සියය ඛිම්බරයක් බවද; දක්වන්නාහ.

මෙබඳු පිරිස් බලයක් වසවත් මරුට ඇතිවීම පුදුමයක් නොවේ, කුශල විපාක බලයෙන් උසස්ම කාමසවගීයෙහි වෙසෙන මොහුට මෙතරම් දිව්‍යමය පිරිසක් ඇතිවීම ආශ්චර්‍යයක්ද? කෙබඳු පුද්-ගලයෙකුට උවද තම තමාගේ ශක්තිතරමින් පිරිසක් සදාගත හැකි නිසයි. **ධම්මඤ්ච අධම්මඤ්ච ලෝකස්ස සතුට්ඨවෙති.** දුසිරිතට තරම් සුසිරිතට ප්‍රිය නොකරති. කෙබඳු සත්ක්‍රියාවක් උවද කරන කල එයට විරුද්ධවන්නෝ කොතෙක්ද? සඛාවයෙන්ම පහළට ගලායන ගඞ්ගාජලය රැඳවීමට බොහෝ උත්සාහදරා අමුණක් බැන්දයුතුය. එමෙන් පාපයට බරවී විපතකරා යන ලෝකයා බලවත් ප්‍රයාසයකින් ධර්ම තමැති අමුණ බැඳ රැඳවාගත යුතුය. එබැවින් පවට අනුබල දෙන පවට බරවූ වසවත් මරහුට පිරිසක් ඇතිවීම ආශ්චර්‍යයක්ද? තවත් ප්‍රශ්නයකි! එදා ඇසතු බෝමූල වැඩසිටි බෝසතුන් හාරා දසබිම්බරක් සෙනඟ සමග පැමිණි වසවත් මරු බෝසතුන් පලවා හැරීමට නවවිධ මහා වාත්‍යවක් වස්වා මහා ඝෝෂා කරමින් බියකරු රුදුරු සෙතඟඩ වැනි හඬ පතුරුවමින් ආවේ නම් වැනිදුර තබා උරුවෙලා දනවවෙහි සේනානී නිගමයෙහි මිනිසුන්ටවත් එය නොඇසුනේද? සි ඇතැමුන්ගේ නිසරු ප්‍රශ්න-යකි. මෙන්න එයට පිළිතුරු:- මරදෙවිපුත් එදා සටනට එලඹියේ අන් කිසිවකු සමග නොව බෝසතුන් සමගය. සෙසු කුරුකුණුඹු-වෙකුටවත් පීඩාවක්-බයක් ඇති කරවනු ඔනුව රිසි නොවෙයි. සටන සිදුවූයේද බෝමැඩ අසළ පමණයි. එය දිව්‍යමය සටනකි. නොඑසේ නම් එදා වැස්වූ පර්ජන්‍ය වර්ෂාවෙන්ම මහපොළොව පරමාණු බවට පත්වනු නිසැකයි. ගම්බද මිනිසෙකුට මළ යකෙකු හෝ මළපෙරේතයෙකු හෝ ආවේශවූවිට ඒ යක්ෂයා හෝ ප්‍රේතයාවත් සෙස්සන්ට නොපෙනෙන කල මරදෙවිපුත් බෝසතුන් බියගැන්වීම කළ මාරසටන අනිකෙක් තෙයේ දකීද? දෙවියන්ගේ ආහාරය සුධාභොජනය නම්වූ අරුත් ගෙඩියක් පමණ ඇති සියුම් ආහාරයකි. දෙළියන්ගේ සළු දිවඳුහුල්; ඉතා සියුම් වෙති. දෙවියන්ගේ සිරුරුද ඉතා සියුම් වෙති. මහපොළොව මත දෙවියෙකු සිටිනකල වළාකුළක් මවා ඒ මැදට වී සිටී. නැතහොත් පරණ ලාපතක් සෙයින් සුලහට වැකෙනු ඇත. දෙවියන්ගේ බත්ධන දිවඹැම්ද මකුළු හුයසේ ඉතා සියුම්ය.

දිනක් ශක්‍රයාට එරෙහිව ආ "වෙපචිත්‍රති" අසුරේන්ද්‍රයා ශක්‍රයාගේ නියමිස පිට "කණ්ඨපඤ්චමක" බන්ධනයෙන් බැඳ දෙව සභාව ඉදිරියට ගෙණා බවද නෙලුම්හුය, මකුළුහුය වැනි සියුම් "දිඹුහුසින් බඳිනාලද ඒ බැම්ම කැඩිය නොහැකිවූ බවද බජ්ඣන්ත සූත්‍ර අට්ඨවණ්ණි ඇත්තේය. මෙයේ නෙසින් එදා **බෝසතුන් සමඟ**

සිදුවූ "මාරසටන" දිව්‍යමය සටනක් බවද බෝසතුන්ට හා දෙවි බඹුන්ට පමණක් පෙනෙන ලෙසින් මරසෙනඟ බියකරු අරමුණු හා භීරුජනක දැක්වූ බවද නිංඝනකා ක්‍රියාකල බවද පිළිගතයුතුව තිබේ.

දසමරසෙන්:—උරුවෙල් දනවිවෙහි තවුස්දම් රකිමින් සිටි මහබෝසතුන් කරා එලඹියාවූ "වසවත්මරු" ව්‍යාජ දයාවක් දක්වා බෝසතුන්ගේ උද්‍යොගය අඩුකරවීමට ප්‍රයත්න දරු අයුරු මෙහි මුලින් (47-48-49 යන පිටුවල) විස්තරකර ඇත. එද, මහබෝසත්තුමෝ වසවත්මරු අමතා **කාමාතෙ පඨමාසෙනා-පෙ-පඤ්චවනි** ආදී ගාථා පඬිතියකින් දසමරසෙන් විස්තර කළහ. මේ ගාථා පඬිතිය අනුව බොහෝ උගත්හු වසවත්මරු බෝසතුන් කරා නොආවේයයිද බෝසතුන් කාමාදී දශකෙලශයන්ට නිගා කළේයයිද දක්වත්. වසවත්මරු බෝසතුන් කරා නොපැමිණි බවද කෙලෙස්මරු සමග සටනක් සිදුවූ බවද දැක්වීමට ඇතැම් උගත්තු මේ තථාගත දෙශනාව ආවුධයක් කොට ගණිති. එහෙත් එද, දුෂ්කර ක්‍රියා කරණකොට සිරුර, ඉතා දුබලවූ බෝසතුන්ට කාමාදී කෙලශයන්ගේ බල පැවැත්වීමක් සිදුවීද? මේ උගතුන්ගේ කියමනේ හැටියට **කාමසංකප්පනා-අරති-ඛුප්පිපාස-තණහා-පිනමිද්ධ-භය-විචිකිච්ඡා-මක්ඛ** ආදී, දසමරසෙන් බෝසතුන්ට පීඩාකළ බව නොහැඟේද? එසේනම් "මාරය මගේ සිරුර දුබල උවත් සිත එන්ට එන්ටම බලවත් වේය" යි මහබෝසතුන් කීවේ කෙලශයන්ටද? එතරම් කෘශවූ දුබල සිරුරක් ඇතිව සිටි බෝසතුන්ට කාමවෙතනාවකුත් පහළවිය හැකිද? භාවනා කම්ය හැරදමා සිය නුවරට යන්ට සිත්වීද? බියකරු අරමුණුවලින් තැති නොගැණීමට පුරුදුකළ මහතාණන්ට භාවනා කරගෙණ යනකල බයකුත් ඇතිවීද? සෙසු තවුසන් ගැණ ඊර්ෂ්‍යාවකුත් පහළවුනාද? මේ උගතුන්ගේ අදහසේ හැටියට දසමරසෙන් කෙලශයෝම නම් බෝසතුන්ට එද, **ථීන මිද්ධය** ඇතිවී නිදුවැටෙන්නට ඇත. ගුණමකු බව පහළවන්ට ඇත. අතතුකකංඝන පරවම්භන ගතිය උපදින්ට ඇත. නැවතත් ලාභ සත්කාර ලැබීමට සිත් පහළකරන්ට ඇත. නමුත් "මගේ වීර්‍යය හා ධෛර්‍යය තවතවත් දියුණුවනු වීනා එහි අඩුවක් නම් නොවේමය" යි ඒ උතුමෝම වදළහ.

එහෙයින් කාමාදී **දසමරසේනාවෝ දෙවපුත්‍ර වසවත් මරහුගේ සේනාවන්** බවම **දතයුත්තාහ.** ඒකාන්ත අකුශල පක්ෂයට දිරිදෙන; සත්වයා පාපයෙහි යොදවන; වසවත් මරදෙව්පුත් ලෝකයාගේ සිත්වලට මෙකී දසමාරසේනාවෝ ඇතුල් කරවති. භාවනා කම්යක යෙදෙන යෝගාවචරයාට පින මිද්ධය උපදවති.

අරතිය ඇතිකරවයි. කාමසංකල්පනා උපද්වයි. භාවනා කම්ය හැරදමා යන්ට සිත්දෙයි. බියකරු අරමුණුවලින් නැතිගන්වයි. ලාභසත්කාර උපදවනු රිසිකරවයි. භාවනා කරණ යෝගාවචරයාට භාවනා බලයෙන් බොහෝ ලාභසත්කාර උපදිනු සුභාවයයි. ඒයට යෝගාවචරයා නිද්‍රාකරවයි. ඇල්ම කරවයි. අකනිට්ඨකායන පරවම්භන ගතිය උපදවයි. සුභාවයෙන් පුහුදුන් පුහුලා (ප්‍රථග්-ජනයා) ලඟ මේ කෙලෙස් බහුල වශයෙන් ඇතිවෙයි. වසවත්මරු භාවනාවත් කෙලෙසුන් කරා යොමුකරවයි. එසේනම් වසවත්මරු යෝගීන් සොය සොයා යනු විනා ඔහුට අනික් කටයුත්තක් නැද්දැයි ප්‍රශ්නයක් ඇතිවේ. සත්‍යවශයෙන්ම ඔහු වෙන කුමක් කරන්නේද? ඔහුගේ වසඟයෙන් මිදෙන්ට වෙරවඩන්නන්කරා ඔහු-නිතර නිතර එලෙසින් පිරික්සමින් යෝගාවචරයා දුබල කෙනෙකු නම් වහාම යෝගියා භාවනා කම්යෙන් පහකරවයි. යෝගාවචරයා විභාබලය සහිත කෙනෙකු නම් හැකි අයුරකින්ම විරූපිකම් දක්වයි. එසේ නොමැතිව "මම මාරයාවෙමි ඔබ වහාම භාවනාව හැරදමනු මැන." යනුවෙන් බැගෑවීමක් හෝ තර්ජනයක් හෝ කරන්නේද? "ඔබ පින් නොකළයුතුය මම මාරයා වෙමි" යනුවෙන් පෙනී පෙනී සිට කියන්නේද?

එවද මේ කාමභූමිගවරවූ "මාරයා" සෝවාන් අරිය සාවකයන්ට පවා යම් යම් අවස්ථාවන්හිදී හිරිහැර කරන බවද පෙනේ.

තථාගතයන් වහන්සේ චාපාල චෛත්‍යස්ථානයෙහිදී ආනන්ද තෙරුන්ට මෙසේ වදාළහ.

තථාගතස්සවෝ ආනන්ද චත්තාරෝ ඉද්ධිපාදා භාවිතා -පෙ-සෝ ආකඞ්ඛමානෝ ආනන්ද තථාගතෝ කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසංවා.

"ආනන්දය සතර ඉද්ධිපාදයන් මනාකොට වඩනලද හෙයින් ඉදින් කැමති නම් තථාගත තෙමේ කල්පයක් හෝ කල්පභාගයක් ජීවත්ව සිටීමට හැකිය"යි යනුයි.

එකල්හි "වසවත්තී මාර දිව්‍ය පුත්‍රයා" එතනට පැමිණ ආනන්ද මහතෙරුන්ගේ සිත වංචල කෙළේය. **යථා නං මාරෙන පරියුට්ඨිත චිත්තෝ** යනුවෙන් දැක්වෙන පරිදි වසවත් මරහු විසින් ආනන්ද මහ තෙරුන්ගේ සිත වික්ෂිප්ත කරණලද හෙයින් "සුවාමීනි **එසේ** නම් තව කලක් සම්බුදුහු ලෝවැඩ පිණිස වැඩ සිටින සේක්වා"යි ආරාධනා කරන්ට සිත් නොවීය තථාගතයන් වහන්සේ පූර්ව්වාපර වචනය තෙවරක්ම වදාළ නමුත් ආනන්ද මහතෙරුන්ට තථාගත

වචනය වටහාගත නොහැකිවිය. මරහු විසින් සිත වික්ෂිප්ත කළ හෙයිනි! (මේ ප්‍රවෘත්තිය මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි ඇත.) බලන්න මරහුගේ බලයක තරම! සෝවාන් අරිය සාවකයා කෙරෙහිද ඔහුගේ බල පැවැත්වීම යෙදෙන අයුරු අසිරිමත් නොවේද? තථාගතයන් වහන්සේ එහිදී මරු පලවා හැර තමන් වහන්සේට කල්පයක් වැඩ සිටින ලෙස ආරාධනා කරවා ගත්සේක් නම් යහපතැයි සිතනු හැකියි. එහෙත් එබඳු "ආත්මාර්ථකාමී" ක්‍රියාවක් බුදුවරු කිසි විටෙක නොකරති. මහපල නුවණ ලබන්ට සැරසී සිටින්නෙකුට මාර්ගාවේශයක් වෙන්ට යතොත් සම්බුදුහු එබඳු තැනදී ඒ පුහුලා මරුගෙන් නිදහස කර ගණිති.

ආනන්ද මහ තෙරුන් වැනි ආර්‍යයන්ට පවා මරහු කෙසේ නම් මෙලෙස සිත චාවල කරද්ද? එයට හේතුව විපල්ලාස ධර්ම සතරක් ආනන්ද තෙරුන් කෙරෙහි පැවතීමයි. සියලුම ප්‍රථග්ජනයින් කෙරෙහි විපල්ලාස ධර්ම දෙළසක් ඇති බවද සෝවාන් අරිය සාවකයා කෙරෙහි විපල්ලාස ධර්ම සතරක් ඇති බවද එහෙයින් සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවකයා කෙරෙහිද මාරයාගේ බල පැවැත්වීම ඇති බවද අට්ඨාවෙහි දැක්වෙයි. (විපල්ලාස ධර්ම ගැන මේ ග්‍රන්ථයෙහිම 120 පිටුවෙහි විස්තර ලෙස ඇත) සොවාන් ආර්‍ය්‍ය ශ්‍රාවකයා කෙරෙහි "දුක්ඛෙ සුඛසඤ්ඤා සුඛවිත්ත – අසුභෙ සුභ සඤ්ඤා- සුභ චිත්ත" යන්නෙන් දැක්වූ පරිදි දුකෙහි සැපය යන සඤ්ඤාව හා සිතද (2) අසුභයෙහි සුභය යන සඤ්ඤාව හා සිතද (2) යනවිපල්ලාස ධර්ම (4) ඇති හෙයින් මාරයා විසින් චංචල කරණු ලබනබව සැලකිය යුතුය.

"වසවත්තී මාරයා" නමින් දෙවි කෙනෙක් සිටී. බෝසතුන් බුදුවන විට එරෙහිව පැමිණියේද මොහුය. එදා **බෝසතුන්ගේ පාරමී ගුණයෙන් මහ පොළොව කම්පාවූ විට ඔහු පැරදී පලා ගියේය. පසුව තථාගතයන් වහන්සේ ජීවමානව වැඩසිටි පන්සාළිස් වස මුළුල්ලෙහි වරින් වර සම්බුදුන් වෙතද ශ්‍රාවකයින් වෙතද පැමිණියේය. එසේම සම්බුදුන්ට පිරිනිවීම පිණිස ආරාධනාද කෙළේය. "තථාගත දෙශනා" නයින් මෙන්න විස්තර. ඉදිරියෙහි බලන්න!**

මරහුගේ නිසපල ප්‍රයත්නයක්

සම්‍යක් සම්බෝධිය සම්ධිගමය කළ භාග්‍යවතුන් වහන්සේ සම්බුඩත්වයෙන් පස්වෙනි සතියෙහි අජපල් නුගරුක මුල වසන සේක. ඉක්බිති තථාගතයන් වහන්සේ "රජ බවට පැමිණියකු නමෝ අයත් හාණ්ඩාගාර ඇර සත්රුවන් බලන්නාක් මෙන්" ප්‍රතිවෙධ කළ ධර්මය මෙතෙහි කරණසේක් මෙබඳු විතර්කයක් පහළ කළ සේක. "ඒකාන්තයෙන් මම සාවුරුද්දක් මුළුල්ලෙහි කරණුලද ඒ බලවත් දුෂ්කර ක්‍රියායෙන් මිදුනේ වෙමි. ඒ කාන්තයෙන් අනර්ථදායකවූ ඒ දුෂ්කර ක්‍රියායෙන් මම වෙන් වූයෙමි. කෙළෙසුන්ගෙන්ද මිදුනේ වෙමි. මනා ප්‍රතිපත්තියෙහි පිහිටියෙමි සම්‍යක් සම්බෝධියද අධිගමය කෙළෙමි"

මෙසේ සිතමින් වැඩ සිටින අතර වසවත් මර දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේගේ මෙකී චිත්ත විතර්කය දැන; උන්වහන්සේ කරා එළඹියේය. එළඹ මේ ගාථාව කීය.

තපෝ කම්මා අපක්කම්ම - යෙන සුජ්ඣන්ති මානවා
අසුද්ධා මඤ්ඤසුද්ධි සුද්ධා - සුද්ධිමග්ගා මපරද්ධා

(යම්කිසි තාපසකින් මනුෂ්‍යයෝ පිරිසිදු වෙද්ද එබදුවූ තාපෝ කර්මයෙන් ඉවත්ව අපිරිසිදු වූයේම පිරිසිදු වූයේයයි සිතති! සුද්ධි මාර්ගය වැරදුණෙහි.)

එකල තථාගතයන් වහන්සේ "මේ තෙමේ මාරයාය"යි දැන පාපීවූ මාරයාට මේ ගාථා දෙක පිළිතුරු වශයෙන් වදාළ සේක.

අනක්ඛා සංහිතං ඤත්වා - යංකිඤ්චි අමරංතපං
සබ්බාසාපරිවජ්ජිතං හොති - පියා පිතතංව වම්මනි
සීලං සමාධිං පඤ්ඤඤ්ච - මග්ගං බොධාය භාවයං
පතෙනාඤ්ඤි පරමං සුද්ධිං - නිහතෝ ත්වමසි! අන්තකා

එම්බා මාරය! තා කියන පරිදි රූක්ෂ ප්‍රතිපදාවක් (අත්තකිලමථානුයෝගයක්) අනුගමනය කෙළෙමි. නමුත් එය අනර්ථ සහිත බව දැන අත් හළෙමි. එබදු රූක්ෂ ප්‍රතිපත්ති සියල්ල නිසපල වෙයි. යම්සේ මහ වනයක ගොඩබිම නැවක් තබා බඳු පුරවා එහි මහජනයා කැඟි; හබල් - රිටි - ආදිය ගෙණ; පැදවීමට උත්සාහ කරත්නේද, විසුඩිය පිණිස මා යෙදුනේද එබදු නිරර්ථක දුෂ්ප්‍රතිපත්තියෙකැයි, එබැවින් මම එය හැර දැමීමි.

බුදුන්ට බියක් - තැති ගැන්මක් - ලොමු දැහැගැනීමක් ඇතිකරවනු සඳහායැ. අනෝ මුලාවක මහත! 'මේ තෙම මාරයාය'සි දත් සම්බුදුහු මරුන් අමතා මේ ගාථාව වදාළහ.

සංසාර දිසමද්ධානං - වණණං භන්තා සුභා සුභං
අලං තෙ තෙන පාපිම - නිහතොසමසි අනන්තක!

බොහෝ කලක් සසර සැරිසරන්නාවූ තා යහපත් - අයහපත් වෙස් ගෙණ මා කරා ආයෙහිය. වසවත් දෙව්ලොව පටන් උරුවෙලාව දක්වා බිහිසුණු වෙස් ගෙණ ආයෙහිය. මාරය! මම තා හඳුනමි. තගේ උත්සාහය නිශ්ඵල වෙයි. තා මා විසින් පරදවන ලද්දේ නැසුනෙහිය!

"භාග්‍යවතුන් මා හඳුනති"සි දැනගත් වසවත් මරු තෙමේ එහිම අතුරු දහන්විය.

තවද මෙලෙසම කීපවරක් නානා වෙස්ගෙණ පැමිණි මාරයා තථාගතයන් වහන්සේ ඉදිරිපිට "අවතාර" කළ බවද බුදුන් පෙර ලෙසම ඔහු පලවාහැරිය බවද මාරසංයුත්තකයෙහි දක්වා ඇත්තේය.

මෙහි ඇත් වෙසින් පැමිණියේ සැබෑලෙස් මාරයාද? වසවත් මරුද? සැබෑලෙස් මාරයා ඇත්වෙසින් පැමිණි බව සිළිගන්ට හැකිද? නැතහොත් මේ තථාගත දෙශනාව අසත්‍යද? මාරදිව්‍ය පුත්‍රයා නැතැසි කියන්නෝ මෙයට කුමන පිළිතුරක් දෙන්නාහුද?

මරහූ සම්බුදුරදුන්ට පිරිනිවණට ආරාධනා කිරීම

සම්බුදුබවට පැමිණි තථාගතයන් වහන්සේ බුදඔසයෙන් පස්වෙනි සතියෙහි අජපල් නුගරුක මුල විවේකීව වැඩ සිටින සේක. දිනක් පාපිවූ මාරතෙම තථාගතයන් වහන්සේ කරා එළඹ "පරිනිබ්බාතු දානිභන්තෙ භගවා පරිනිබ්බාතු සුගතෝ පරිනිබ්බාන කාලෝ දානිභන්තෙ භගවතෝ" යනාදියෙන් "සෝමනි භාග්‍යවතුන් වහන්ස! ඔබට පිරිනිවනට දැන් කාලයයි. එබැවින් වහා පිරිනිවන් පා වදාරණ සේක්වා"සි යාච්ඤා කෙළේය. එකල්හි සම්බුදුරජාණන් **"නකාමාහං පාපිම පරිනිබ්බායිස්සාමි"** ආදීන් "පාපිවූ මාරයා! මගේ භික්ෂූහු ව්‍යක්ත - විනීත විශාරද බහුශ්‍රැත ධම්මානුධම්ම ප්‍රතිපන්නා සාමීචි ප්‍රතිපන්නා අනුධම්මචාරී ශ්‍රාවකයෝ නොවෙද්ද **සවකේ** ආචාර්‍යවාදය ශාස්තෘවාදය මනාසේ ඉගෙන විස්තර **සහිතව** **ගැඹුරු**

අතීයන් විවරණය කොට විභජනය කොට නෛයර්‍යාණික ධර්ම ප්‍රකාශ නොකරද්ද ඒ තාක් මම පිරිනිවන් නොපාම්''යි වදාළ සේක. එහිදී මාරයා අතුරුදහන් විය.

එතැන් සිට වරින්වර සම්බුදුරජුන් හා ශ්‍රාවකයින් කරා පැමිණි බවද උන්වහන්සේලාට ''සමව්වල්'' කළ බවද පෙනේ. තථාගත-යන් වහන්සේගේ සම්බුද්ධත්වයෙන් පන්සාළිස් වැන්නෙහි චාපාල චෛත්‍ය ස්ථානයෙහිදී නැවත මාරයා පිරිනිවනට ආරාධනා කෙළේය.

තථාගතයන් වහන්සේ විශාලාපුර කූටාගාර ශාලාවෙහි වැඩ විහරන සමයෙහි දිනක් ආනන්ද මහතෙරුන් අමතා ''එව! ආනන්දය චාපාල චෛත්‍යස්ථානය කරා යමු''යි වදාරා එහි වැඩ පණවනලද අසුන්හි වැඩ හුන්සේක. ආනන්ද මහතෙරුන් අමතමින් සම්බුදු-රජාණෝ මෙසේ වදාළ සේක.

''ආනන්දය මේ විශාලා පුර චාපාල චෛත්‍යස්ථානය; උදෙන චෛත්‍යස්ථානය; ගොතමක චෛත්‍යස්ථානය; හා; සත්තඹක – බහුපුත්තක – සාරන්දද – යන මේ චෛත්‍යස්ථානද ඉතා සිත්කලු රමණීය ස්ථාන වන්නේය. ආනන්දය යමෙක් සතර ''ඉද්ධිපාද'' මනාසේ භාවිත බහුලීකෘත කෙළේ නම් ඔහු ඉදින් කැමති නම් කල්පයක් හෝ කල්ප භාගයක් ජීවත්ව සිටින්නේය ආනන්දය තථාගත තෙමේද මේ සතර ඉද්ධිපාද (ඡන්ද – චිත්ත – විරිය – වීමංසා යන ඉද්ධිපාද සතර) මනාසේ භාවිතා බහුලීකෘත කළ හෙයින්; මනාකොට වැඩූ හෙයින් මනාකොට පිහිටි හෙයින් ඉදින් තථාගත තෙමේ කැමති වන්නේ නම් කල්පයක් හෝ කල්ප භාග-යක් ජීවත් වන්නේය.

මෙහිදී වසවත් මරු පැමිණියේය. මේ තථාගත වචනය පිළි-ඹඳ ආනන්ද හිමියන්ට නොවැටහෙන ලෙසින් සිත වංචල කරවිය. (මාරයා සියුම් අතක් මවා එසින් ආනන්ද හිමියන්ගේ හෘදය වස්තුව පිරිමැද්දේයසි කියති.) මාරයා විසින් වංචල කරණලද සිත් ඇති ආනන්ද තෙරණුවෝ ''තථාගතයන් වහන්සේට තව බොහෝ කලක් වැඩ සිටිනු පිණිස'' ආරාධනා නොකළහ. එසේ ආරාධනා කළානුත් එය පිළිගැණීමට සම්බුදුරදුන්ට හැකිසි.

ඉද්ධිපාදයන්ගේ බලය පහදමින් ''ඉදින් බලාපොරොත්තු වන්නේ නම් සම්බුදුන්ට කල්පයක් හෝ කල්ප භාගයක් ජීවත්විය හැකි යයි'' තෙවරක්ම සම්බුදුහු වදාළසේක. එහෙත් ආනන්ද මහ-තෙරුන්ගේ සිත වංචල සහිතව පැවතුනේය.

යව ආනන්දය! ධිවේක ගණුව''සි බුදුහු අනඳ තෙරුන්ට වදාළහ. අනඳ මහා තෙරහු ඉවත් ගොස් රුකක් මුල හුන්හ. ගත වූයේ නිමේෂයකි. වසවත් මරු තථාගතයන් වහන්සේ කරා එළඹියේය. එකත්පසක සිට ''ස්වාමීනි; පිරිනිවන් පා වදාරණ සේක්වා! භාග්‍ය වතුන් වහන්සේ පිරිනිවන් පා වදාරණ සේක්වා. ඔබට පිරිනිවන් පෑමට මේ කාලයයි. ඔබට මම මීට පෙර තෙරඤ්ජරා නදී තීරයෙහි ප්‍රථම සම්බෝධි අවස්ථාවෙහි පිරිනිවන් පානු පිණිස ආරාධනා කෙළෙමි. එදා ඔබ ප්‍රකාශ කළේ ඔබගේ ශ්‍රාවකයින් බහුශ්‍රැත ව්‍යක්ත විශාරදයින් වනතුරු පිරිනිවන් නොපාන බවයි දැන් ඔබගේ ශ්‍රාවකයෝ මනාසේ තෙවළා දහම් දැන ඉගෙණ පරප්‍රවාදයක් දමනය කිරීමෙහි සමත්ව සිටිති. එපමණක් නොවේ. එබඳු සිව්වණක් පිරිසක් ඔබට ඇත. දැන් ඔබට පිරිනිවනට කාලයයි. දැන් දැන් පිරිනිවන්පාන සේක්වා''සි ආයාචනා කෙළේය. එකල්හි බුදුරජාණෝ **අපේපාසඤ්ඤකොසිමාරපාපිම හොහි! නචිරසෙසෙව පරිනිබ්බානං භවිස්සති**'' යනුවෙන් පවිටු මාරය; මිදක් ඉවසව! තථාගත තෙමේ නොබෝ කලකින්-තෙමසකින් පිරිනිවන් පාන්නේය''සි වදාළහ.

මේ දැක්වූයේ තථාගත දෙශනාවක්ම අනුවය. **මහාපරිනිබ්බාණ** සූත්‍රයෙහි දැක්වෙන මේ මාරයා කෙලෙස් මාරයාද? **නැතහොත් මේ** තථාගත දෙශනාව අසත්‍යද? **''මාර'' නමින් දෙවිකෙනෙක් සම්බුදුන් වෙතම නොසැමිණියේයයිද ''මාර'' නමින් දැක්වූයේ මහලෙස් මාරයායයිද කියන්නෝ මෙයට කුමන පිළිතුරක් දෙන්ද?**

විශෙෂයෙන් දනයුත්තක්:—සම්බුදුරජුන්ට පිරිනිවන් පිණිස මරහුගේ ආරාධනා ලැබීම අනවශ්‍යය. එය ධර්මතාවයක්ද නොවේ. මරහුට බියෙන් සම්බුදුරජාණෝ පිරිනිවන්පාන බව නොවදාළසේක. ජන්මයෙන් අසූවන වියෙහි සිටි තථාගතයන් වහන්සේගේ ආයුකාලය එසින් අවසාන වෙයි. සම්බුදුවරයෝ ලෝකයේ ඒ කාලයට සම්මත පරමායු වර්ෂ ගණනින් පහෙන් හතරක් ආයු වලදන්නාහුය. ''අපේ බුදුහු මහලුය, දන්වැටී ඇත **රැලිනැඟී දුබලව වෙසෙති**'' යනුවෙන් ලෝකයාගේ අපවාද වචන අසන්ට ඉඩ නොතැබීම ධර්මතාවයකි. එහෙයින් පරමායු සියයක්ව පැවති ගෞතම තථාගත කාලයේ පහෙන් හතරක්වූ අවුරුදු ගණන අසූවක් හෙයින් සම්බුදුහු ඒ ආයුසය වැළඳුහ. ''කල්පයක් හෝ කල්පාවශයක්'' යනුවෙන් අනඳ තෙරුන්ට වදාළේ මහාකල්පයක් ගැණ නොව **ආයුසංඛාරය** ගැණයි. එහෙයින් ඉද්ධිපාද බලයෙන් සම්බුදුන්ට පරමායු **සියයක්**

ගතකළ හැකිබව එදා අනඳ හිමියන්ට දෙශනා කළසේක. එහෙයින් මාරයා ආරාධනා කළ නිසා හෝ මාරයාට භයින් හෝ සම්බුදුහු පිරිනිවන් වැඩියෝ නොවෙති.

"මහා ශ්‍රමණය! ඔබ නොමිදුනෙහි!"

සම්බුද්ධත්වයෙන් ප්‍රථම වර්ෂය තුළ එක් දිනක බරණැස ඉසිපතනාරාමයෙහි ශ්‍රාවක සන්නිපාතයකි. "යස" කුලපුත්‍රාදී සැට නමක් රහතුන්ට තථාගතයන් වහන්සේ අනුශාසනාවක් කරණසේක.

"මහණෙනි! මම නුවණින් මෙනෙහි කිරීමෙන් නුවණින් මිදීම් කිරීමෙන් දිව්‍යමයවූද මානුෂිකවූද සියලු මාරපාශ (කෙලෙස් බැම්) වලින් මිදුනෙමි. නුඹලාද එලෙසම මාරපාශයන්ගෙන් මිදුනහුය! මහණෙනි ලෝකයාට අනුකම්පා පිණිස ගම්-නියම්ගම්-ජනපද-රාජධානිවල හැසිරෙව්! දෙදෙනෙක් එක්මගින් නොයවු! මහණෙනි මුල-මැද-අග යන තුන්සථානයෙහිම් යහපත්වූ සම්තොභද්‍රවූ සම්පූර්ණවූ අර්ථ ව්‍යඤ්ජන සහිතවූ මේ ධර්මය ලෝකයාට දෙශනා කරවු! එසේම සම්පූර්ණයෙන්ම පිරිසිදුවූ මේ ශාසන බ්‍රහ්මචර්‍යය මනාසේ ප්‍රකාශ කරව! මහණෙනි ප්‍රඥා නැමති ඇස්නි ඝට්ටනවූ මෙම්ලෝ රජස් ඇති සත්වයෝ වෙත්. ඔවුන්ට මේ ධර්මය අසන්ට නොලැබුනොත් ඔව්හු මේ ධර්මලාභයෙන් පිරිහෙති. එහෙයින් ඔවුනට වැඩ පිණිස ගම් නියම්ගම් ජනපද රාජධානිවල ඇවිදිමින් මේ ධර්මය ප්‍රකාශ කරව්. මමද උරුවේලායෙහි සේනානී නිගමය කරා එලඹෙන්නෙමි."

තථාගතයන් වහන්සේ මෙසේ අනුශාසනා කරන කල්හි වසවත් මරුතෙම එහි පැමිණියේය. බුදුරදුන් අමතා:-

බද්ධොසි මාරපාසෙහි-යෙ දිබ්බායෙව මානුසා,
මහාබන්ධන බද්ධොසි නමෙ සමණ මොක්ඛසි.

යනුවෙන් (මහා ශ්‍රමණය! දිව්‍යමයවූද මානුෂිකවූද සියලු මාරපාශයන්හෙන් ඔබ බැඳුනෙහිය ඔබ මාගේ විෂය නොඉක්ම වූයෙහිය. මගෙන් ඔබට මිදීමක් නැත) පැවසී.

වසවත් මරුන් සම්බුද්ධරදුන්ට නොපෙනී සිට මෙසේ පවසනු කල "මේ කවරෙක්දැයි" ආවර්ජනා කළ තථාගතයන් වහන්සේ මරහු බව දැන ඔහුට පිළිතුරු වශයෙන් මේ ගාථාව වදාළසේක.

මුත්තොහං සබ්බපාසෙහි-යෙදිබ්බා යෙව මානුසා,
මහා බන්ධන මුත්තොම්හි-නිහතෝ ත්වමසි අන්තක.

"මාරය! මම දිව්‍යමයවූද මානුෂිකවූද සියලු ඒ මහා මාර බැම්වලින් මිදුනෙමි. මාරය! මා විසින් නුඹ පරදවනු ලැබුයෙහි. මාරයා තා නැසුනෙහි"

තථාගත තෙමේ මා දැනගත්තේයයි සැලකූ මාරයා එහිම අතුරුදහන් විය.

මෙහිදී මාරයා "මේ මහා ශ්‍රමණයා තමාගේ අභිමතාර්ථයද සිදුකරගෙණ මගේද විෂය ඉක්මවා එයින් නොනැවතී අන්‍යයිනුත් ඒ පිළිබඳව යොමුකරවන්ටයයි. මොහුගේ මේ ප්‍රයත්නය වලක්වමි" යනුවෙන් සිතමින් සම්බුදුන් වෙත පැමිණ කලබල කළබව පෙනේ. එහෙත් ඔහුගේ අඥානකම තව තවත් ප්‍රකටවනු විනා බුදුරදුන්ගේ ප්‍රයත්නය කෙසේ වළක්වයිද?

මෙහි දැක්වූ **මාරපාසයෝ** නම් වසතුකාම-කෙලශකාමයෝය. මේ පැමිණියේ කෙලශමාරයාද වසවත්තී මාරයාද? **මාරයෙකු නැතැයි කියන්නෝ මෙයට කුමන පිළිතුරක් දෙත්ද?**

සම්බුදුරදුන් වෙතට පැමිණි "මහානාගයා"

තථාගතයන්වහන්සේ රජගහපුර වෙළුවන මෙහෙරෙහි වැඩ වසනසේක් දිනක් අඬකාර රාත්‍රියක හුදකලාව **අභ්‍යවකාශයෙහි** (එලිමහන්හි) විවේකීව වැඩ සිටිසේකි. පොදුවැස්සද මදින්මඳ පැවැතුනි.

එකල තථාගතයන් වහන්සේ කරා මහානාගයෙක් ඇදෙන්ට විය. නයාගේ ශරීරය ඔරුකදක් මෙන් මහත්ය. පෙණය සුරා සොඬුන් පිට පතුරන කලාලයක් මෙන් විශාලය. ඇස්දෙක කරත්ත රෝද දෙකක් මෙන් විශාලද වටකුරුද විය. විශාල තැව් හඬලක් වැනි දිවක්ද ඇතිව වරින්වර දිව ඇතුල් කරමින්ද පිට කරමින්ද දුටුවන් බියකරවන අයුරින් මසින හමක් පිඹින්නාක් මේන් හොස්; හොස්; යන අනුකරණ පවත්වමින් මේ නයා තථාගත යන් වහන්සේට පෙනෙන පරිදි නුදුරින් ඔබමොබ හැසිරෙන්ටද විය.

මේ මහානාගයා කවරෙක්ද? අනිකෙකු නොව වසවත් මරුය. මේ කළුවර රාත්‍රියෙහි හුදකලාව වැඩසිටින සම්බුදුන්ට බියක් තැති ගැන්මක් ලොමු දහඇගැන්මක් උපදවනු රිසියෙන් වසවත් මරු මේ අවතාර කළ අයුරුයි. මෙබඳු බියකරු අරමුණුවලින් තථාගත සිත නොකැලඹිය හැකිබව මොහු නොදනීද? දනී. එහෙත් උහුගේ මූලාව කොහියාද?

මේ නාඝමේශයෙන් පැමිණියේ මරුබව දැන වදාළ තථාගතයන් වහන්සේ ඔහු අමතා ඔහුට වැඩක් නැතත් තමන්වහන්සේගේ නිර්භීයභාව මෙසේ වදාළසේක.

යා සුඤ්ඤගෙහානියෙවති–යෙය්‍යා සෝ මුනි අත්තසඤ්ඤතෝ
වොස්සජ්ජ චරේය්‍ය තඤ්ඤථා–පනිරූපංහි තථා විධස්සතෙ.

චරකා බහූ භෙරවා බහූ–අථෝ ඩංස සිරිංසපා බහූ
ඵලාමමපි තත්ථ නඉඤ්ජය–සුඤ්ඤාගාරගතෝ මහාමුනි

නභං එලෙය්‍ය පඨවිං චලෙය්‍ය–සබ්බෙඛවපාණා උදහෙතසෙය්‍යුං
සලලමඣි වෙ උරසිපඛප්පසෙය්‍යුං–උපධීසු තථී නඛරොතිබුධා

එම්බා මාරය! යම්කිසි සංයතවූ ආත්ම ඇති මුනිවරයෙක් වේද ඒ මුනි තෙමේ සතර ඉරියව්ව පිණිස ශූන්‍යාගාරයන් සේවනය කරයි. එබඳු මුනි තෙමේ මේ ආත්ම භාවයෙහි ආලය හැර වාසය කරනුයේ වනයෙහි සිටින සිංහ – ව්‍යාඝ්‍ර – කොටි – වලස් – තසි – පොළොන් – ආදී සතුන් නිසා භයක් තැති ගැන්මක් ඇති නොකරන්නේය. අහස ගිගුරුවත් පෘථිවිය සැලුනත් සත්වයෝ බියෙන් තැති ගණිත්. සකඇබොපඩින් කෙරෙහි තෘෂ්ණාව දුරුකළ බුදුවරයෝ ලෙනි අඩයට හුලින් අනිනු ලැබුවත් නොසැලෙති.

තථාගත දෙශනාවෙන් දුම්මුඛවූ වසවත් මරුතෙමේ අතුරුදහන්විය.

"කුමක්ද මේ නින්ද?"

සම්බුදුරදුන් වෙළුවන වෙහෙරෙහි වසන කළ දිනක් රාත්‍රී බොහෝ වේලා එලිමහනෙහි සක්මන් කොට පශ්චිම යාමයෙහි සිරිපා සෝදා; ගඳකිළියට පිවිස අවදිවන වෙලාව සලකා සිහිනුවණින් හැතපුණු සේක. ඉක්බිති වසවත් මරුතෙම බුදුරදුන් කරා එළඹ මෙසේ කීයේය.

කිං සොපසි; කිතනු සොපසි;
කිම්දං සොපසි දුක්ඛගෙ විය
සුඤ්ඤඤ්ච මගාරහතී සොපසි
කිම්දං සොපසි සුරියෙ උග්ගතෙ.

"කිම හෝනෙහිද? කුමක් නිසා හෝනෙහිද? මළ එකෙකු මෙන් කිම හෝනෙහිද? මෙය ශූන්‍යාගාරයක් යයි සිතා හෝනෙහිද? හිරු නැඟිකල්හිත් කුමක් නිසා හෝනෙහිද?"

("හිරු නැගි කල්හි"යයි මාරයා කිවුත් එවිට හිරු උදාවී නැත. බුදුරදුන්ට සරදම් කරණ අටියෙන් මෙසේ කීබව පෙනේ.)

අනතුරුව තථාගතයන් වහන්සේ මරු අමතා මෙසේ වදාළ සේක.

යස්ස ජාලිනී විසතතිකා
තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවේ
සබ්බූපධිනං පරිඤ්ඤයා
බුද්ධෝ සොඤ්ඤති කිං තවෙත්ථ මාර!

"මාරය! යමෙකුගේ චිත්ත සන්තානයෙහි රූපාදී නානාප්‍රකාර ආරම්මණයන්හි ඇලෙන තෘෂ්ණාව නැත්තේද; ඔහුගේ සිත කාමාදී භවත්‍රයෙහිම ප්‍රතිසන්ධි වශයෙන් පැමිණීමක් නැත. ඒ බුදුරජතෙම කාම – බන්ධ – කිලෙස – අභිසංඛාර යන සියලු උපධීන්ගෙන් වෙන් වූයේ සැපසේ හොවියි. මාරය! මෙහිලා තට කිමෙක්ද (මගේ නින්දෙන් තට ඇති පීඩාව කුමක්ද?)

"භාග්‍යවත් තෙමේ මා දැන ගත්තේය. සුගත් තෙමේ මා දැන ගත්තේය"යි දුක්වූ මාරයා එහිම අතුරු දහන්විය.

මේ මාරයා කවුරුන්ද? තථාගත දේශනාව අසන්නේද? බුදුන්වහන්සේ පසුවක් කෙලෙහොත්පත්තියක් වේද?

මරහු බුදුන්ට "ඛණ" කියති

තථාගතයන් වහන්සේ දෙවිරම වැඩ වසන සේක. දිනක් මරහුට බුදුරදුන් හමුවට එන්ව සිතක් වී එහෙත් ඔහුට කරුණක් හමුනොවීය. උවමනාවේ ඇති උද්‍යෝගය නිසා ඔහුට ප්‍රශ්න කිපයක් සහිත ගාථාවක් ගොතාගන්ට හැකිවිය. ඔහු බුදුරදුන් කරා එළඹියේය. මෙසේ කියයි.

නන්දති පුත්තෙනාපි පුත්තිමා
ගොම්කෝ ගොහි තත්ථේව නන්දති
උපධීහි නරස්ස නන්දනා
නහිසෝ නන්දති යෝ නිරූපධි

"දරුවන් ඇති තැනැත්තේ දරුවන් නිසා සතුටුවෙයි. ගවයන් ඇති තැනැත්තේ ගවයන් නිසා සතුටු වෙයි. එයේම සත්වයාගේ සතුට ඇතිවන්නේ "උපධීන්" නිසාය. එහෙයින් උපධි රහිත වූවහුට සතුටක් නැත."

බොහෝ දරුවන් ඇති මනුෂ්‍යයෙකුගේ ඇතැම් දරුවෝ ගොවිතැන් කොට අටු – කොටු – පුරවති. සමහරු වෙළඳුම් කොට රන් – රුවන් ගෙණෙති. රාජ සේවාවන්හි යෙදෙන දරුවෝ ගම් – බිම් නිලතල බලති. එකල ඔවුන්ගේ මව – හෝ පියා ඔවුන් එසේ ලාභයෙන් හා යසසින් වැඩෙනු දැක "අපේ දරුවෝ දියුණු වෙති. අපේ දරුවෝ යසසින් වැඩෙති" ආදීන් ප්‍රීතිය පහළ කරයි. 'දරුවන් ඇති තැනැත්තේ දරුවන් නිසා සතුටුවෙයි." යනුවෙන් මාරයා කීයේ ඒ නිසාය.

ගවයන් අසිති තැනැත්තේද තමාගේ ගව සම්පත්තිය වැඩෙනු දැක තුටුවෙයි. පස්ගෝරස අනුභව කරන්නේ වැඩි වැඩියෙන් සතුටුවේ. එහෙයින් මාරයා "ගව හිමියා ගවයන් නිසා සතුටුවන බව" කීය.

තුන්වෙනිව මාරයා කීවේ "උපධීන්" නිසා මිනිසා සතුටුවන බවයි.

මෙහි "උපධි" නම් රූප ශබ්ද – ගන්ධ – රස – පොටව්බබ යන පඤ්චකාම ගුණයෝය. ගේ දොර ඉඩ කඩම් යාන – වාහන – ශයනාසන – වස්ත්‍රාභරණ – භාර්‍යා සවාමිපුත්‍ර – ආදීහු සත්වයාට කාමාස්වාදය ඇති කරත්. මනොහරවූ – ප්‍රියවූ – අලඞ්කාරවූ මේ කාම ගුණයෝ සත්වයා සතුටු කරවති. "උපධීන්" නිසා මිනිසා සතුටු වන බව මාරයා කීවේ ඒ නිසයි.

මාරයාගේ සිවුවෙනි "බණපදය" "උපධි රහිතවූවහුට සැපයක් නැත" යනුයි එයින් මාරයා අදහස් කළේ ආහාර-පාන වස්ත්‍රාභරණ ඉඩ කඩම් ආදියෙන් තොරවූ; දුගී දුප්පත් අසරණ තැනැත්තේ සතුටක් නොලබන බවයි.

"මේ බණකාරයා කවරෙක්ද"යි ආවර්ජනා කළ තථාගතයන් වහන්සේ මාරයා බව දැන ඔහුගේ අදහස වැරදි බව පහදමින් පහත දක්වන ගාථාව වදාල සේක.

සොචති පුත්තෙහි පුත්තිමා
ගොමිකෝ ගොහි තථෙව සොචති
උපධීහි නරස්ස සොචනා
නහිසෝ සොචති යෝ නිරූපධි

එම්බා මාරය! දරුවන් ඇති තැනැත්තේ දරුවන් නිසාද ගවයන් ඇති තැනැත්තේ ගවයින් නිසාද ශොක කරයි. එසේම උපධීන් ඇති තැනැත්තේද උපධීන් නිසා ශොක වෙයි. ඒ එසේ මැයි. දරුවන්ගට දුකක් හෝ විපතක් ඇතිවූ විටද මව්පියෝ

අධික ශොකයට පත්වෙති. ගවයන් ඇති ගව හිමියෝද එසේම තැවෙති. කාමය පතන්නාවූ වසතු කාමයන් නිසා කෙලෙසකාමයන් දියුණුකරන්නාහුද එලෙසින්ම තම තමන් බලාපොරොත්තුවන ඇලුම් කරණ, ගේදොර ඉඩකඩම්-යාන-වාහන-සවාමි-පුත්‍ර-භාර්‍යා-දීන් හා මිල මුදල් නිසා එලෙසම ශොක වෙති. ඇලුම් කරණ කාම ගුණයන් නොලැබූ විටද විනාශවූ විටද පසුවට හුලකින් අනින්නාක් මෙන් පීඩා ඇතිවේ. එහෙයින් යමෙක් "නිරූපධි" නම් හෙතෙම කිසිකලක කිසි දුයක් පිළිබඳව ශොක නොකෙරේ.

මේ පැමිණි මාරයා කෙලෙස මාරයාද? දෙව පුත්‍ර මාරයාද? මාරයෙකු නැතැයි කියන්නෝ මෙයට කුමක් කියද්ද?

"වසවත් මරුගේ බණ"

සම්බුදුහු රජගහපුර වෙළුවනයෙහි මහඹික් සඟන පිරිවරා සදහම් දෙසති.

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු" ගමනීයෝ සම්පරායෝ කත්තබ්බං කුසලං – චරිතබ්බං බ්‍රහ්මචරියං – නත්ථි ජාතස්ස අමරණං යොහි භික්ඛවෙ චිරං ජීවති සොවස්සසතං අප්පංවා භීයෝ"

මහණෙනි! මනුෂ්‍යයින්ගේ ආයුසය ඉතා සුවල්පයි. (මැරී) පරලොව යා යුතුයි. එහෙයින් (මරණයට පෙර) කුසල් කළ යුතුයි. බඹසරවස් හැසිරිය යුතුයි. ඒ ඇයි? උපන්නහුට මැරීමක් ඇති නිසයි. යමෙක් බොහෝ කලක් ජීවත්වන්නේ නම් ඔහු අවුරුදු සියයක් හෝ එයට මදක් වැඩිව හෝ ජීවත්වෙයි.

සම්බුදුරදුන් මෙසේ වදාරණ කල වසවත් මරුතෙම තථාගතයන් වහන්සේ කරා එළඹ මේ ගාථාව කියා.

දීඝමායු මනුස්සානං – තතංනීලෙ සුපොරිසෝ
වරෙය්‍ය බීර මත්තෙනාව – අත්ථි මච්චුස්ස නාගමෝ

මිනිසුන්ගේ ආයුසය දීඝයි. සත්පුරුෂ තෙමේ එයට පරිභව නොකරන්නේය. කීරෙන්මත්වූ ලදරුවෙකු මෙන් කුල්මත්ව හැසිරෙන්නේය. මරහුගේ ඊමක් නැත.

මාරයාගේ මේ ගාථාවට පිළිතුරු වශයෙන් **සම්බුදුරජාණෝ** මේ ගාථාවද වදාළහ.

අප්පමායු මනුස්සානං – නීලෙය්‍යානං සුපොරිසෝ
චරෙය්‍යාදිත්තක සීසොව – නත්ථි මච්චුස්ස නාගමෝ

මිනිසුන්ගේ ආයුෂය ඉතා සුවල්පය සත්පුරුෂතෙම් ඒ ආයුසය දුබල කොට ප්‍රකාශ කරන්නේය. හිස ගිනිගත්තෙකු මෙන් හැසිරෙන්නේය. මාරයාගේ නොරිමක් නැත. (මරණය පැමිණේමය යනු අදහසයි)

ජීවිතයෙහි කිසිම සැප පහසුකම් හෝ කම් කටොල් නොදන්නා කුඩා දරුවා මවගේ තුරුල්ලෙහි හෙව බඩ පිරෙන තුරු මවගෙන් කිරි බී දුහුල් රෙදි කඩක් උඩ උඩුකුරුව නිදන්නේ, ජීවන කාලයේ දික් බවක් හෝ කෙටි බවක් නොසිතා අසඥියෙකු මෙන් නිදයි. මිනිසාද එසේ පැවතිය යුතුයයි මාරයාගේ අදහසයි.

එහෙත් "හිස ගිනි ගත්තෙක් ඒ භයානක ගින්නෙන් මිදීමට උත්සාහ කරන්නාසේ ආයුසය ඉතා සුවල්ප බව දැන සත්පුරුෂයා වහ වහා සුප්‍රතිපත්තියෙහි හැසිරිය යුතුය" යනු තථාගතයන් වහන්සේගේ අදහසයි.

මෙසේම තැවතද දිනක් තථාගතයන් වහන්සේ පෙර ලෙසින්ම භික්ෂූන් වහන්සේට අනුශාසනා කරන අතරක වසවත් මරු පැමිණ පහත සඳහන් ගාථාව කීයේය.

නාවවයන්ති අහොරත්තා – ජීවිතං නොපරුජ්ඣති
ආයු අනුපරියාති මච්චානං – රථ නෙමීව කුබ්බරං

රාත්‍රී ඳිනයෝ (රෑ-දවල්) පුද්ගලයා ඉක්ම නොයන්. ජීවිතය නිරුද්ධ නොවෙයි. කොපමණ කලක් උවත් ගමන් කරන රිය-සකෙහි නිම් වළල්ල කිඹුල් මුව අනුව යන්නාක් මෙන් ආයුෂය සත්වයා අනුවම යයි.

මාරයාගේ කථාවට පිළිතුරු වශයෙන් තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

අවවයන්ති අහොරත්තා – ජීවිතං උපරුජ්ඣති
ආයුඛීයති මච්චානං – කුන්නදීනංව ඔදකං

රෑ දවල් ඉක්ම යන්. (ජීවිතයද ඒ සමගම) නිරුද්ධ වෙයි. ගෙවී ගෙවී යයි, පළුතයකින් ගලා බස්නා කුඩා ගඩොලාවක ජලය වහා බැස යන්නාක් මෙන් සත්වයාගේ ආයුසය වහා ගෙවී යයි.

"ගෞතම බුදුන් මා දැනගත්ත"යි සැලකූ වසවත් මරු තෙමේ එහිම අතුරුදහන් විය.

මේ මාරයා කෙලෙශමාරයාද? මේ තථාගත දෙශනා අසන්‍යද?

"බුදුරදුන් නුදුරෙහි ගල් වැටෙනි"

දිනක් තථාගතයන් වහන්සේ ගිජුකුළු පව්වෙහි එළිමහන් තැනක හුදෙකලාව මහ අදුරෙහි විවේකීව වැඩ සිටියේකි. පොද වැස්සද මඳින්මඳ පැවතුනි. පළිත මසකයෙහි පිහිටි මහා ගල් කුළු එකිනෙක ගැටෙමින් මහා ශබ්ද පවත්වමින් තථාගතයන් වහන්සේ ඉදිරිපිට නුදුරුව වැටෙන්නට පටන් ගත්හ. ආකාරණයේ මේ මහා ගල් කුළු නොවැටෙති. මෙයට හේතු කිම්දැයි ආනන්ද තෙරණුවෝ තථාගතයන් වහන්සේ එය මාරයාගේ සමච්චලයක් බව දැන වදාළ සේක.

එකල තථාගතයන් වහන්සේ මරදෙව්පුත් අමතා මෙසේ වදාළ සේක.

සචෙමං පබ්බතං සබ්බං – ගිජ්ඣකූටං චලෙය්‍යසි
නෙව සම්මාවිමුත්තානං බුද්ධානං අත්ථි ඉඤ්ජිතං.

(මාරය!) මේ සියලුම ගිජ්ඣකූට පර්වතය නුඹ සෙලෙව්වත් අර්හත්ඵල විමුක්තියෙන් මොනවට මිදුනාවූ සම්බුදුවරයන්ට කම්පාවක් ඇති නොවේ.

මාරයා තථාගතයන් වහන්සේට බයක් කැති ගැන්මක් ලොමු දැහැගැන්මක් උපදවනු රිසියෙන් මෙසේ ගල් කුළු පෙරලූ බව පෙනේ **මෙහි පෑමිණි මාරයා කවරෙක්ද** කෙලෙසමාරයාද නැතහොත් දෙවපුත්‍ර මාරයාද? **මේ තථාගත වචනය අසත්‍යද?**

"කිම? සිංහයෙකු මෙන් නාද කෙරෙහිද?"

සම්බුදුරජාණෝ දෙව්රම් වෙහෙරදී මහා පිරිසක් මධ්‍යයෙහි සදහම් දෙසති. එකල මාරදිව්‍ය පුත්‍රයාට මෙබඳු සිතක් පහළ විය. "ගෞතමයෝ මහා පිරිස් සිදිවරා බණ දෙසති. මම ගොස් බණ අසන පිරිසේ පැණැස නසමි" යනුයි එසේ සිතා වසවත් මරු තථාගතයන් වහන්සේ සමීපයේය. මෙසේද කියයි.

කිනනු සීහොව නදසි – පරිසායං විසාරදෝ
පවිමලෙලාකිතෙ අපි – විජිතාවීනු මඤ්ඤසි.

සිවු පිරිස්හි නිර්භීතව එළිතරව **සිංහයෙකු මෙන් නාද කෙරෙහිද?** යුෂ්මතුන්ට බලවත් විරුද්ධ කාරයෙකු – **ප්‍රතිවාදියෙකු** ඇති බව දනුව; කිම "ජයගන්නෙමි" යයි සිතන්නෙහිද?

ඉක්බිති "මේ වසවත් මරු"යයි ආවර්ජනා කළ සම්බුදුහු ඔහුට මෙසේ වදාළහ.

නදනති වෙ මහාවීරා – පරිසාසු විසාරදා,
තථාගතා බලප්පත්තා – නිණ්ණා ලොකෙ විසත්තිකා.

(මාරය!) විසත්තික සඞ්ඛාත ෂඩ්ද්වාරික තෘෂ්ණාව තරණය කළාවූ; දසබලධාරීවූ; මහා වීරවූ; තථාගතවරයෝ අටපිරිස්හි නිර්භීතවූවාහු ඒකාන්තයෙන් අභීත නාද කරත්.

"ගෞතමයන් මා දනිති"යි දෞර්මනස්වූ වසවත් මරුතෙමේ එහිම අතුරුදහන්විය.

මේ කෙලෙස මාරයාද "මරු" නැතැයි කියන්නෝ මෙයට කුමන් පිළිතුරක් දෙද්ද?

මරහුගේ "සරදම්"

එක් කලෙක තථාගතයන් වහන්සේ කොසොල්රට එකනාලා නම් බමුණුගම වැඩවාසය කරණසේක. දිනක් තථාගතයන් වහන්සේ මහා හිතිපිරිසක් මධ්‍යයෙහි ධර්මදේශනා කරණසේක. එහිදී වසවත්මරු "ධර්මශ්‍රවණය කරණ පිරිස අතරෙහි කලබලයක් ඇතිකොට පැණැස දුබල කරවීම පිණිස" එහි පැමිණියේ තථාගතයන් වහන්සේ අමතා මෙසේ පැවසී.

නෙතං තව පතිරූපං–යදඤ්ඤ මනුසාසති,
අනුරොධ විරොධෙසු–මාසජ්ජිතො තදුවරං.

"මිතණ! මෙලෙසින් මහපිරිස් පිරිවරා දහම් දෙසීම ඔබට නුසුදුසුය. මෙහිදී ඔබට රාගය හා ක්‍රෝධය ඇතිවේ. එහෙයින් **අනුරොධ-විරොධ** (රාග-පටිඝ) දෙක්හි නොඇලේවා "(මෙබඳු බණ කථාකිරීමෙන් රාගය දෙවෂය නූපදවාවා!)"

මෙහිදී සම්බුදුරජාණෝ වසවත්මරු අමතා මෙසේ පිළිතුරු වදාළසේක.

හිතානුකම්පී සම්බුද්ධා–යදඤ්ඤ මනුසාසති,
අනුරොධ විරොධෙහි–විප්පමුත්තෙනා තථාගතො.

"මාරය! තථාගතවරයෝ ලොවට හිතානුකම්පිව ධර්මදේශනා වශයෙන් අනුශාසනා කරත්. එහෙයින් තථාගතවරයෝ අනුරොධ විරොධ දෙකින් මෙන්වූවාහු වෙත්."

මෙහිදී බණ අසන පිරිසේ වංචල බවක් ඇතිකරවීම පිණිස වසවත්මරු මේ සරදම කළබව දතයුතුයි.

අනුරෝධය නම් රාගයයි. විරෝධය නම් ද්වේෂයයි. බණ අසන පිරිස සාධුකාර දෙමින් මනාසේ බණ අසනකල දෙශකයා ඔවුන් කෙරෙහි ආදරය දක්වයි. නොසතුටුව බණ අසන්නන් කෙරෙහි දෙශක නෙමේ කිපෙයි. මෙලෙසින් දෙශකයාගේ සිතේ බණ අසන්නවුන් කෙරෙහි ආදරය හෝ නොසතුට නිසැකයෙන් ඇති වෙයි. මෙහි ආදරය අනුරෝධ නම්. අමනාපය විරෝධ නම්. අනුරෝධ විරෝධ දෙක ඉවතගන්නා හෙයින් බණ නොකිය යුතුය යනු මාරයාගේ අදහසයි, පෙනේද මරහුගේ දැනීමක තරම!

මරහුට පිළිතුරු වදාරණ තථාගතයන් වහන්සේ තමන් වහන්සේ හිතානුකම්පිව බණ වදාරණ බවත් රාගය හා කෝපය දුරුකළ බවත් එහෙයින් ධර්මදෙශනාවෙන් වරදක් නොසිදුවනබවත් වදාළසේක.

දෙව්රමට පැමිණි "ගවයා"

දිනක් තථාගතයන් වහන්සේ දෙව්රම්හිදී භික්ෂූන් පිරිවරා පඤ්චුපාදානසකන්ධය ඇසුරුකොට සවහාව ලක්ෂණ පඤ්ඩමින් භික්ෂූන්ගේ සිත් විදර්ශනාවට යොමුකරවමින් ධර්මය දෙශනා කරණ සේක. භික්ෂුහුද මනාසේ කන්යොමා සන්සුන් ලෙසින් බණ අසන්-නාහුය. ගතවූයේ සවල්ප වේලාවකි. හැඩිදැඩි ගවයෙක් එහි හැසිරෙන්ට විය. භික්ෂුවක් නවත් භික්ෂුවකට කථාකොට ඇවැත්නි, මෙන්න! මෙන්න!! ගවයෙක්. මේ ගවයා පාත්‍ර බිඳින්නේයයි කිය. (ගවයා හැසිරෙන පෙදෙසෙහි භික්ෂූන්ගේ පාත්‍රාදි වනාතිබුනු හෙයින් ඒ භික්ෂුව කලබලවී එසේ පැවසී.) එවිට තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි! ඒ ගවයෙක් නොවේ. ඒ මාරයාය. නුඹලාගේ පැණැස වනසනු පිණිස ඔහු ආයේය"යි වදාරා ඉක්බිති වසවත්මරුට මෙසේ දෙශනා කළසේක.

රූපං වෙදනිතං සඤ්ඤං-විඤ්ඤාණං යංච සඞ්ඛතං
නෙසෝ හමස්මි නෙතං මෙ-එවං තත්ථ විරජ්ජති
එවං විරත්තං ඛෙමත්තං-සබ්බසං යොජනාතිගං
අතික්කමං සබ්බඨානෙසු-මාරසෙනාපි නාජ්ඣගා.

එම්බා මාරය! රූප-වෙදනා-සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය; "මම නොවේමි" "මගේ නොවේය" යි දැන්නේ ඒ පඤ්චස්කන්ධයෙහි නොඇලේ. එහෙයින්ම එබදු පුද්ගලයා පඤ්ච-

සඤ්ඤියෙහි නොඇලෙන්නාවූ; නිදහස්වූ ආත්මභාවය (සිත) ඇති; සංයෝජනයන්ගෙන් වෙන්වූ; ක්ෂීණාශ්‍රවයෙක් වේ. මාරය! තට තබා තගේ "**මරසෙනඟට**" ද ඔහු නොදැක්ක හැකිය. (කොතෙක් වෙහෙස දරා සෙව්වත් නොපෙනේ.)

භගවත්තෙමේ; සුගතතෙමේ; මා **දූතගණියයි** දැම්මතස්වූයේ එහිම අතුරුදහන් විය

විශෙෂයෙන් සැලකිය යුතුයි:—මේ පැමිණියේ කෙලෙස් මාරයාද? වසවත්මරුද? කෙලෙස්මරුට නානාප්‍රකාර "වෙශයන්" මවාගන්ට හැකිද? නැත්නම් මේ තථාගත දෙශනාව බොරුද? මෙයින් "**මාරසේනා**" **පිළිබඳ ප්‍රශ්නයද නිරවුල් වන්නේය.** මර සෙනඟ ආවත් ක්ෂීණාශ්‍රවයා සොයන්ට නොහැකියයි මෙහිදී තථාගතයන් වහන්සේ වදාරා ඇත්තේය. **කාමාතෙ පඨමාසෙනා දුතියා අරති වුච්චති** යනුවෙන් තථාගතයන් වහන්සේ දක්වූ කාමතෘෂ්ණාව-අරතිය-පිනමිදුඛ ආදී දසමරසෙන් වසවත්මරුගේ පිරිවර බව නිශ්චය කළයුතු නොවේද? නැතහොත් "මාරය! නා පමණක් නොව තගේ දසබිම්බරක් මරසෙනඟ ආවත් ක්ෂීණාශ්‍රවයා සොයන්නට නොහැකිය"යි යන අදහස ඒ තථාගත දෙශනාවෙහි ඇතුළත් බව නොපිළිගත යුතුද?

ඉව වෙයින් මේ ආවේ කෙලශමාරයායයි පිළිගණිතොත් බුදුවීමෙන් පසුවත් තථාගතයන් වහන්සේ කරා කෙලෙසුන් පැමිණි බව පිළිගතයුතු නොවේද?

ඛුනාථ ඔවදුනො සෙනං. "මරසෙනඟ **කමපාකරව්**" යන්නෙන් වදාළේ වසවත්මරුගේ "දසමරසෙන්" පිළිබඳවයි. **මාර සෙනා අභිකකාමුං** "මාරසේනාවෝ **පැමිණියහ**" යන්නෙන් "**මහාසමය**" සූත්‍රයෙහිදී වදාළේ මරහුගේ දසබිම්බර හෝ එබඳු විශාලවූ "සහවර දෙවිපිරිස" පිළිබඳවයි. එසේ නොමේනම් දශ කෙලෙශමාරයෝ ක්‍රියාත්මක වූවාහු මහාවනයෙහි වැඩසිටි තථාගතයන් හා ශාක්‍යකුල භික්ෂූන් කරා පැමිණියාහුද?

පෘථිවිය "පට පට" ශබ්ද කරයි

සම්බුදුරජාණන් වහන්සේ එක් කලෙක විශාලා මහනුවර කූටාගාර ශාලායෙහි වැඩ වාසය කරණ සේක දිනක් භික්ෂූන් පිරිවරා චක්ඛු සම්ඵස්සය, සොත සම්ඵස්සය; ඝාණ සම්ඵස්සය; ජිව්හා සම්ඵස්සය; කාය සම්ඵස්සය; මනො සම්ඵස්සය; යන සඅවැදෑරුම්

ඇපණීයාගේ රූපාදී ආයතනයන් පිළිබඳ දැහැමි කථාවක් පවත්වන්නේක. භික්ෂුහුද එය මැනවින් සවන් යොමා නුවණින් යුකතව ශ්‍රවණය කරන්නාහ. වසවත් මරු මෙසේ සිතයි. "මහා ශ්‍රමණතෙමේ "ආයතනයන්" මුල්කොට ගෙණ ධර්මදේශනාවක් කරයි. භික්ෂුහුද මනාසේ දහම් අසයි. මම එතැනට ගොස් ඔවුන්ගේ නුවණැස වසාලුවහොත් මැනව"

ගතවූයේ සවල්පවේලාවකි. ධර්මශ්‍රවණය කරණ භික්ෂූන් වහන්සේලාට මහා පෘථිවිය "පට පට" යන ශබ්ද නගනු ඇසෙන්ට විය. භික්ෂුවක් නවත් භික්ෂු නම්කට කථාකොට ඇවැත්නි! මිය කරු හඬක්. ඇසෙයි. මහ පොළොව "පට පට" යන හඬින් පුපුරන්නාසේ මට දැනේ. කිම? ඔබට එය නැසේද? යනුවෙන් විවාළේය.

එවේලෙහි තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනී ඒ මහපොළොව පුපුරනවා නොවෙයි. වසවත් මරුතෙම නුඹලාගේ සිත කලබල කරවීම පිණිස නොසන්සුන් කරවීම පිණිස කරන "මාරාවතීනය" කැයි පැහැදිලි කළසේක. ඉක්බිති බුදුරජහු වසවත් මරුන් අමතා මෙසේ වදාළසේක.

රූපා සද්ද රසා ගන්ධා - එස්සා ධම්මාව කෙවලා
එතං ලොකාමිසං සොරං - එත්ථ ලොකාධි මුච්ඡිතෝ
එතඤ්ච සමතික්කම්ම - සතෝ බුධස්ස සාවකෝ
මාරධෙය්‍යා මතික්කම්ම - ආදිච්චොව විරොචති

එම්බා මාරය! රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන ආරම්මණයෝද තෙත්‍රභූමික ධර්මයෝද යන මොවුහු දරුණුවූ ලෝකාමිෂය වේ. මේ ඇඩාලම්බනයන්හි ලෝවැසි තෙම තෘෂ්ණාවෙන් අධිමූර්ඡිත වෙයි මනා සිහිබුද්ධියෙන් යුත් බුද්ධශ්‍රාවක තෙමේ මේ ආයතන සයද ඉක්මවා මේ ආයතනයන් නිසා පවත්නා "මාරධෙය්‍ය" යද ඉක්මවා හිරුමෙන් බබලයි.

බුදුන් මෙසේ වදාළකල්හි "ගෞතමයෝ මෑ දැනගත්හ' යි වසවත් තෙමේ එහිම අතුරුදහන් විය.

(මෙහි "මාරධෙය්‍ය" නම් කාම-රූප-අරූප සංඛ්‍යාත තෙත්‍රභූමික වෘත්තයයි. මේ ස්ථාන මාරයාගේ ස්ථාන කෙවත් මාරබලය ඇතිතැන් වශයෙන් දැක්වේ.)

මහා පෘථිවිය ශබ්ද කරවූ මේ මාරයා කවරෙක්ද; කෙලෙශමාරයාද? නැතහොත් මේ කථාගත දෙශනාව අසත්‍යද භ්‍රමජනකද?

මාරයා සම්බුදුන්ගේ දානය වලකයි

එක් කලෙක තථාගතයන් වහන්සේ මගධ රට පඤ්චශාලා නම් බමුණුගම ඇසුරු කරගෙණ වැඩ වසන සේක. **එකල්හි** වනාහි එම බමුණුගම බමුණු කුමරුන්ගේ "පාහුණකයෝ" වීය. **පාහුණක** නම් වර්ෂයකට වරක් පවත්වන නක්ෂත්‍ර ක්‍රීඩෝත්සවයකදී කුමර කුමරියන් ඔවුනොවුන්ට යවන පඬුරුවලට කියන නමකි. මේ සෑණකෙළි දිනවල සමාන වයස් ඇති; සමාන කුල ඇති; සමාන ගොත්‍ර ඇති; කුල කුමරුවෝද කුල කුමරියෝද ඒ ඒ තැන්වල නන් වැදැරුම් වස්ත්‍රාභරණයන්ගෙන්ද සැරසී හැසිරෙන්නාහුය. **එහිදී** කුමාරිකාවෝ තම තමාට කැමති කුමරුවන්ට පඬුරු යවති. කුමරුවෝද තම තමන්ට අභිමත කුමරියනට පඬුරු යවත්. වචිනා පඬුරු නැතොත් මල් මාලයක් පමණකුදු යවති.

මේබදු උත්සව දිනයක තථාගතයන් වහන්සේ පෙරවරුයෙහි **පා** සිවුරු ගෙණ පිඬු පිණිස එගමට වැඩිසේක **එකල්හි** වසවත් මරු නෙමේ එදින **එගම** බොහෝ දෙනාට **සිදුවන** යහපතටද; තථාගතයන් වහන්සේගේ ආහාරයටද; බාධා **කරණ පාපී** අදහසින් යුක්ත වූයේ පඤ්චශාලා බමුණුගමේ වැසියනට ආවේශ වීය. **තථාගතයන්** වහන්සේද පිඬු සිඟා කිසිත් නොලැබ ආපසු පාත්‍රය-සේදුවනම රැගෙන වැඩිසේක සියලු ගම්වැසියෝම "මාරාවර්ජන-යෙන්" ආවර්ජිතය වූවාහු තථාගතයන් වහන්සේට කිසිවක් පූජා නොකළහ.

ඉක්බිති මාරයා තථාගතයන් වහන්සේ කරා එලඹ "මහණ! පිඬු ලැබූයෙහිදැයි ප්‍රශ්න කෙළේය. එවිට සම්බුදුහු **"තථා නොඛ පාපිම අකාසි යථාහං පිණ්ඩං අලභෙයං"** පාපී මාරය යම්සේ මම පිඬු නොලබම්නෙම්ද නුඹ එසේ කෙළේ නොවෙහිද? (නුඹ ඉගේ ඕඝපාතය වැළැක්වූයේ නොවෙහිද?) යනුවෙන් වදාළහ එසේ නම් සවාමිනි නැවත ගමට පිඬු සිඟා වඩිනු මැනවි මම **නැවත** පිඬු ලැබෙන ලෙස කෙරෙමි යයි මරු දෙවෙනිව පැවසී. මරහුට වැඩක් නැතත් බුදුහු බහුවත් මරුගේ දුෂ්ට ක්‍රියාවෙන් ඔහුට අවැඩ වන බවද තමන් වහන්සේට පීඩාවක් නොවූ බවද මෙසේ වදාළහ.

අපූජිතඤ්ච පඤ්ච මාරෝ - ආසජ්ජන තථාගතං
කිනාහු මයඤ්ඤාසි පාපිම - නමේ පාපං විපච්චති
සුඛං ඛත ජීවාම - යෙසං නෝ නත්ථි කිඤ්චනං
පීති භක්ඛා භවිස්සාම - දේවා ආභස්සරා යථා

පෘථිවූ මාර තෙමේ සම්බුදුන් ගටහ (සම්බුදුන්ට පිඬු කොට) පව් රැස් කෙළේය. කිම (කට) පව විපාක නොදේයයි නෑ හඟනෙහිද?

අපට රාහාදී කෙලශයක් නැති හෙයින් අපි සැපසේ ජීවත් වෙමු. ආහසසර දෙවියන් මෙන් ප්‍රීතියම අහර කොට ඇත්තෝ වෙමු.

පෘථිවූ මාරතොමෙ "භගවත් තෙමේ මෑ දැනගත්තේ"යයි එහිම අතුරුදහන් විය.

සම්බුදුහු මේ මාරවර්තනය නුදුමුවාහුද? එසේය. එයට හේතුව අසවල් තැනින් දන් ලබන්නේයයි ආවජ්ජනා කිරීම බුදුවරුනට නුසුදුසු නිසාය. අට්ඨවාවෙහි දැක්වේ. ආවජ්ජනා කිරීමක් නොමැතිව ගමට පිඬු පිණිස පිවිසියේක් මිනිසුන් කෙරෙහි බලපවත් වන මාරවර්තනය දැක "ආමිශය තකා මාරාවර්තනය සිදවීම නුසුදුසු" හෙයින් හිස්වූ පාත්‍රය ඇතිවම ආපසු වැඩියහ. ඒ අතර නැවත වසවත් මරු සම්බුදුරදුන්ට ගම් දරුවන් ලවා සරදම් කරවන අටියෙන් පෘථි අදහස් පෙරදැරි කරගෙණ දෙවැනිවත් ගමට පිඬු පිණිස යනු පිණිස ආරාධනා කෙළේය. එසේ වීනම් මරහුගේ හිස සත් කඩක්ව පැලී යන හෙයින් ඔහුට අනුකම්පා පිණිස දෙවෙනිවර ගමට පිඬු සිඟා නොවැඩිය බව දැක්වෙයි.

මෙහිදී මාරයාගේ බලය අධිකවීද? සම්බුදුන්ගේ පාරමී බලය දුබලවීද? ඕන අවසන්වීද? යනු ප්‍රශ්නයකි. මිලිඳ ප්‍රශ්නයෙහි මෙයට නිසි පිලිතුරු විස්තර වෙයි.

සම්බුදුරදුන් උදෙසා පිළියෙල කළ භොජනයද බුදුන්ට පිදීම පිණිස ගෙණෙන භොජනයද; බුදුරදුන් වළඳන භොජනයද; වැළැක්වීමෙහි සමතෙක් නෙදියතෙහිම නැති බවද පඤ්චශාලා බමුණු ගමෙහි එබඳු අහරක් නොවූ හෙයින් මරුට වැළැක්විය හැකිවූ බවද මිනිසුන්ට නොපෙනී සිට කරණලද ඒ දුෂ්ට ක්‍රියාව මරහුගේ දුබලකම පිළිබිඹු කරන්නක් බවද තාගසේන හිමියෝ මිලිඳුරජුට පැවසූහ.

මෙසේම වෙරඤ්ජ පුරයෙහි උදය බමුණාටද මාරා වෙශය ඇතිවූ හෙයින් සම්බුදුරජුන් ප්‍රධාන පන්සියයක් භික්ෂූන් වහන්සේලා තෙමසක් යවහාලේ ආහාර වළඳමින් වස්වසා වැඩ සිටි බවද දැක්වෙයි.

මේ දෙතැන්හිදීම මාරාවර්තනය තසා දමා ආහාර ලබාගැනීමට තථාගතයන් වහන්සේගේ බලය ඇතිවුවත් ආමිශය තකා එබඳු දෙයක් නොකිරීම තථාගත සිරිතක් බවද දැක්වෙයි.

"දෙවපුත්‍ර මාරයෙක් නැත. ඇත්තේ කෙලශ මාරයා පමණකැ"යි කියන්නෝ මෙයට කුමක් කියද්ද?

"මහණ! කිම? ගොනුන් දැක්කෙහිද"?

තථාගතයන් වහන්සේ සැවැත්පුර දෙව්රම් වෙහෙර වැඩ වසන කල දිනක් භික්ෂූන් අමතා නිර්‍වාණ ප්‍රතිසංයුක්ත ධර්ම කථාවක් දෙශනා කරණ සේක. භික්ෂූහුද මනාසේ සවන් යොමා සදහම් අසන්නාහ. භික්ෂූන් වහන්සේලාට දැන් දැන් මාගීඵල ලැබෙනැයි සිතිය හැකි තරමට දෙශනාව මනොහර ලෙසින් පැවැත්වේ. හදිසි යෙන්ම බලාපොරොත්තු රහිත අරමුණකින් භික්ෂූන් වහන්සේලාගේ සිත් සදහම් අරමුණෙන් බැහැර විය.

මහත්වූ නඟුලක් කරේ තබාගත්; දික්වූ කෙවිටක් අතින් ගත්; විසුරුණු කෙස් ඇති; හණ වැහැරියක් හැඳි; මඩ වැකුණු දෙපා ඇති; "ගොවියෙක්" සම්බුදුන් කරා එලඹියේය. සියලුම භික්ෂූහු මේ කවරෙක්දැයි ඔහු දෙස විමසුම් සහිතව බැලූහ. "ගොවියා"ද බුදුරදුන් අමතා "ශ්‍රමණය! ගොනුන් දැක්කෙහිද"යි ඇසී. (සීසාමින් සිටියදී ගොනුන් නැතිවූ බවක්ද ගොනුන් සොයමින් වෙහෙරට පැමිණි බවක්ද මේ ආගන්තුකයා පිරිසට ඇගෙන අයුරින් ක්‍රියා කෙළේය.) මොහු කවරෙක්ද? අනිකෙකු නොව පිරිසේ නුවණැස නසාලනු පිණිස ගොවි වෙසින් පැමිණි මාරයාය.

සම්බුදුරජාණෝ ඔහු මාරයා බව දැන අමතා මාරය! තට 'ගොනුන්ගෙන් කවර ප්‍රයෝජනයක්ද"යි ඇසූහ. එවිට මාරයා කථා කරමින්,

මහණ! ඇස මගේමය රූපයෝද මගේමය චක්ඛු සම්ඵස්සය හා චක්ඛුවිඤ්ඤාණයද මගේමය. ශ්‍රමණය! කොහිගොස් මගෙන් මිදෙන්නෙහිද? ශ්‍රමණය! ශ්‍රොත්‍රය හා ශබ්දයද සොත සම්ඵස්සයද සොතවිඤ්ඤාණයද, මගේමය. ඝ්‍රාණය හා ගන්ධයද ඝාන සම්ඵස්සය හා ඝාණ විඤ්ඤාණයද මගේමය. දිව හා රසයද ජිව්හා සම්ඵස්සයද ජිව්හා විඤ්ඤාණයද මගේමය. ශරීරයද පොට්ඨබ්බයද කාය-සම්ඵස්සය හා කාය විඤ්ඤාණයද මගේමය. මනසද ධම්මාරම්මණයද මනො සම්ඵස්සයද මනො විඤ්ඤාණයද මගේමය. මහණ තොප කොහි ගොස් මගෙන් මිදෙන්නෙහිද? කියා ඇසීය.

සම්බුදුරජාණෝ වසවත්මරු අමතා "පාප මාරය! චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මනො යන මොවුහුද මොවුන් පිළිබඳවූ සඵස්ස හා විඤ්ඤාණයන්තයෝද තගේමය. (මම්ද එය පිළිගණිමි.) එහෙත් යම්තැනක චක්ඛු සොතාදීහුද-ඵස්ස විඤ්ඤාණාදීහු නොවෙත්ද; එහි නා විසින් නොයැමක් වෙයි. (තට එබඳු තැනට යාමට නොහැකියි) යනුවෙන් පිළිතුරු වදාළසේක.

නැවත මරු මේ ගාථාව කීය:-

යං වදන්හි මම ඉදන්ති-යෙ වදන්ති මමන්ත්‍රීව,
එත්ථව තෙ මනෝ අත්ථි-නමේ සමණ මොක්ඛසි.

යම් භාණ්ඩයක් වේද "මේ මමය" කියා හෝ "මේ මගේය" කීයා හෝ යම් කෙනෙකුන් කියද්ද; මහණ නුඹේ සිත මේ සථාන-යෙහි ඉඳින් ඇද්ද; (නුඹගේත් එබදු දෘෂ්ටියක් ඇද්ද) නුඹ මගේ විෂයයෙන් නොමිදෙන්නෙහිය.

සම්බුදුහු මරහුට මෙසේ පිළිතුරු වදාළහ.

යං වදන්ති න තං මයහං-යෙ වදන්ති න තෙ අහං,
එවං පාපිම ජානාහි-නමේ මහහම්පි දක්ඛසි.

"යම් භාණ්ඩයක් "මගේය" කියද්ද මාරය එය මගේ නොවෙයි. යම් පුද්ගල කෙනෙක් "මාගේය" කියද්ද ඒ පුද්ගලයෝ මම නොවෙමි. මාරය මෙසේ දනුව; තෝ මා ගිය මාගීයද නොදක්-නෙහිය."

(මමය; මගේය; යන දෘෂ්ටිය ඇති සියල්ලන්ම තමාගේ වශයෙහි පවත්නා බව මෙහිදී මාරයා විසින් කියනලදී. බුදුහු තමන් වහන්සේගේ එබදු දෘෂ්ටියක් නැතිහෙයින් මරහුගේ විෂය ඉක්මවූ බව වදාළසේක.)

මේ "මාරයා" කෙලෙශ මාරයාද? දෙවපුත්‍ර මාරයාද? සක්කාය දිට්ඨිය ඇති සියල්ලෝම මාරයාගේ වශයෙහි ඇතුළත් බව මෙයින් දක්වා ඇත්තේය. එසින්ම වසවත් මරහුගේ පිරිස දිටසි විචිකිච්ඡාදී කෙලෙසයන් බව නොපෙනේද? පඤ්චමාර කථාවෙහිදී කෙලෙසයන් වෙන්කොට "කෙලෙසමාර" නමින් දක්වූයේ විශෙෂයෙන් සත්වයා විසකට හෙළීමට සමත් හෙයිනි.

මේ දක්වූයේ "සංයුත්තනිකායෙහි මාරසංයුත්තකයට අයත් සූත්‍රානන්ත සමූහයක සාරාංශයෝය; මේ සියල්ලම ත්‍රිපිටක පාළියට අයත් තථාගත දෙශනාවෝ වෙත්. තවද ධම්මපදවග්ග කථාවෙහිද මාරයා අරමුණු කරගෙණ වදාළ තථාගත දෙශනා ගාථා සමූහයක් ඇත්තේය. "මාර නමින් දෙවියෙකු නැතැයිද ඇත්තේ කෙලෙස මාරයා පමණකැයිද" නිගමණය කරන්නෝ තථාගත දෙශනාවන් පිළිබඳව කුමක් කියද්ද? මෙපමණක් නොවේ. වසවත්මරු වරින් වර ඇතැම් ශ්‍රාවක ශ්‍රාවිකාවන් කරා පැමිණ "සරදම්" කළ අයුරු සංයුත්සනියෙහිද ධම්මපද අට්ඨවාවෙහිද දක්වේ. මෙන්න උදාහරණ කීපයක්:—

රාහුල තෙරුන් ලඟට පැමිණි ඇතා

දිනක් රාහුල මහතෙරුන් වහන්සේ රහත් බවට පැමිණි නොබෝ දිනකට පසු සිය ආවාස ගෘහය තුළ වැඩසිටින කල ආගන්තුකව පැමිණි බොහෝ භික්ෂූහු රාහුල තෙරුන්ගේ ඔවරක-යෙහි (කාමරයෙහි) රාත්‍රී නවාතැන් ගත්හ. එතෙක් රාහුල තෙරුන් අනුපසම්පන්න කෙනෙකුව සිටි හෙයින්ද අනුපසම්පන්න-යින් හා උපසම්පන්න භික්ෂූන්ට එක ආවාස ගෘහය තුළ අරුණු නැන්වීම වරදක්කොට ශික්ෂාපද පණවාතිබූ නිසාද රාහුල තෙරුන්ට නිදාගන්ට තැනක් නොමැතිව තථාගතයන් වහන්සේගේ ගඳකිළි පිරිවෙණේ ඉදිරි ප්‍රමුඛයෙහි (ඉස්තෝප්පුවෙහි) එදා රාත්‍රී සැතපුණු සේක.

එකල වසවත්මරු "මහාශ්‍රමණයා ගඳකිළිය ඇතුළේ නිදාගෙණ සිටියදී ඔහු පුත් ගඳකිළි පමුවෙහි (ඉස්තෝප්පුවෙහි) නිදාගෙණ සිටී. මහාශ්‍රමණයාගේ පුතුට කරණ පිඬාව උහුටද කළානම් වේ" යනුවෙන් සිතා තථාගතයන් වහන්සේටද "රිදවන" අටියෙන් මහත්වූ ඇත්රජ වෙසක් මවාගෙණ රාහුල තෙරුන් කරා පැමිණ උන්වහන්සේගේ හිස සොඬවැලින් වටකොට මහත් ශබ්දයෙන් කෑගැසුවාද කෙළේය.

එවිට සම්බුදුරජාණෝ ඇතුල් ගඳකිළියෙහි වැඩසිටිමින් මාර ශබ්දයෙන් රාහුල තෙරුන් බය නොවන බව දක්වමින් වසවත් මරහු අමතා "**නිට්ඨංගතෝ අසන්තාසි-වීතතණ්හෝ අනඞ්ගණෝ**" ආදී ගාථා දෙකක් (ධම්මපදට්ඨ කථා තණ්හාවග්ග) වදාළසේක. මාරය! නුඹ වැනි මාරයින් දහසක් ලක්ෂයක් පැමිණ ශබ්දකළත් මපුතුට බියක් ඇති නොවේ" යයිද පැහැදිලි කළසේක.

මහලු බමුණෙක්

ශාක්‍ය ජනපදයෙහි "සිලාවතී" යෙහි භික්ෂූහු සමූහයක් උදෙසාගීව ත්‍රිවිධ ශික්ෂාවන් සම්පූර්ණ කිරීමෙහි යත්න දරති. දිනක් ඒ භික්ෂූන් කරා මහලු බමුණෙක් ආවේය. මහත් ජටාමඬුල්ලක් හිස දරා; කුර සහිත අදුත් දිවිසමක් හැඳ පෙරවා; මඳක් වක්වූ දිඹුල් දණ්ඩක් අතින් ගෙණ පැමිණි මේ බමුණා වයොවෘද්ධවූ ඝුරු ඝුරු යන අනුකරණ පවත්වන්නාවූ දුබලයෙක්ද වීය. බමුණා භික්ෂූන්ට කථාකොට පින්වත්නි; දහරවූ; කලුකෙස් ඇත්තාවූ; සොඳුරු යොවුන් වියෙහි පිහිටි; ප්‍රථම වයසෙහි ගතකරන; පින්වත්හු

මානුෂක කාමය (ලදරු වියෙහි වින්දයුතු කම්සැප) අනුභව නොකළාහු පැවිදිවූවාහුය. සාන්දෘශ්ටිකය හැර කාලිකය අනුව නුදුවව්! (මේලොව කම්සැප නොවිඳ පරලොවදී ලැබෙන සැපගැණ වෙහෙස නොගණිව්) මානුසකවූ කාමයන් අනුභව කරත්වා! (මරණින් මතු ලැබෙන) කාලිකය කරා නොදුවව්!" යනුවෙන් අවවාද කෙළේය. භික්ෂුහු බම්බුණාට කථාකොට තමන්වහන්සේලා කාලිකවූ කාම කෙලෙසයන් හැර දමා සාන්දෘශ්ටිකවූ ලොකොත්තර ධර්මය අනුව ගමන්කරන බවද ලොකොත්තර ධර්මය **සාන්දෘශ්ටික අකාලික** ගුණ ඇතිබවද දැක්වූහ. එවිට බම්බුණා තළලෙ රැළිගස්වා දිව දික්කොට හිස වනා සරදම්කොට ගියේය.

පසුව සම්බුදුරදුන් සමීපයෙහි භික්ෂුහු මේ "බම්බුණු පුවත' බුදුරදුන්ට සැලකළාහුය. සම්බුදුහු "මහණෙනි ඒ බම්බුණෙක් නොවේ. නුඹලාගේ නුවණැස වසාලනු පිණිස පැමිණි මාරයා' යි වදාළසේක.

මෙසේම සම්දඩි තෙරුන්වහන්සේ කරා පැමිණි වසවත්මර සම්දඩි තෙරුන් බියගැන්වීම පිණිස තෙවරක්ම මහාපෘථිවිය "පට පට" යන හඬින් ශබ්දකරවූ බවද අවසානයේ තථාගතයන් වහන්සේට මේ පුවත සැලකළ කල්හී "සම්දඩිය! ඒ වසවත්මරුගේ මාරාවතීනයකැ" යි වදාළ බවද සංයුත්තනිකායයෙහි විස්තාරකොට ඇත්තේය.

"සවාමිනි ඔබගේ ශ්‍රාවකයෙක් බෙල්ල කපාගෙණ . . . ."

'තථාගතයන් වහන්සේ එක්කලෙක වෙළුවන විහාරයෙහි වැඩවසන සේක. එකල ඉසිගිලි පාශ්වයෙහි කාලසිලායෙහි **ගොධික** නම් තෙර කෙනෙක් භාවනායෝගීව අප්‍රමාදීව වසනුවෝ පස්වරක්ම "සාමයික චෙතෝ විමුක්තිය" (ලෞකික සමාපත්තිය) උපදවා පස්-වරම ඉන් පිරිහුණාහු ජීවිතය පිළිබඳව කලකිරීමට පත්වූහ ඉක්බිති **ගොධික** තෙරහු සිතනුවෝ "මම පස්වරක්ම බලවත් උත්සාහයෙන් **ලබාගත්** ධ්‍යානයෙන් පිරිහුණෙමි. මා හදිසියෙන් මළේ නම් **ගති අනියත** හෙයින් දුගතියෙහි ඉපදීමටද සිදුවනු ඇතිමි. **එහෙයින් සඅවෙනි** වාරයෙහි මා සමාපත්තිය ලදින් නම් එයින් පිරිහීමට **පෙර දිවි** තොරකර ගනිමි" කියාගි.

තෙරහු සයවෙනිවර ධ්‍යානය ඉපදවූහ. ඉක්බිති "වහාම මේ සමාපත්තියෙන් පිරිහීමට පෙර දිවි නසාගෙණ නියත ගතිකයෙක් වෙමි" යි සලකා කාමරයට පිවිස හිසකෙස් කපන ආවුධය අතින් ගත්හ.

එකෙණෙහිම වසවත්මරු තෙමේ "මේ තෙරහුගේ උද්‍යොගය මහති. නිසැකයෙන්ම වෙදනා පරිග්‍රහයකොට රහත්වනු හැකියි. එය මම වළක්වා ලමි" යි සිතා වහා සම්බුදුරදුන් කරා එලඹ තථාගතයන් වහන්සේට වැඳ "මහාවීරවූ මහාප්‍රඥවූ ඉද්ධියෙන් හා යසසින් බබලන්නාවූ චක්ඛුමතුන් වහන්ස! ඔබගේ දෙපා වඳිමි. සුගතයන් වහන්ස! ඔබගේ කීකරු ශ්‍රාවක නමක් (ගොධික තෙර) දිවිනසාගණු පිණිස ප්‍රයත්න දරයි. එය වහා නවත්වනු මැනවි. සුගතයන් වහන්ස! ඔබගේ ශාසනයෙහි භක්තිමත්වූ ශ්‍රාවකයෙක් තෙමේ කෙසේ නම් රහත්ඵලය නොලබා කලුරිය කෙරේද (එය ඔබට ඉවසිය හැකිද?)

සම්බුදුහු මෙ කවරෙක්දැයි විමසූහ. වසවත්මරු බව දැනගත් සේක.

ඒ වනවිට ගොධික තෙරුන් බෙල්ල කපාගෙණ අවසානය. ඒ බෙල්ල කපාගන්නාවිට ඇතිවූ වෙදනාව අරමුණුකොට නාම-රූප ව්‍යවෙක්ෂද ඥානය උපදවා වෙදනා විසකාමහනයකොට විදසුන් වඩා රහත්ව සමසිසිව පිරිනිවන් පෑහ. (සමසිසි පිරිනිවන් පෑම නම් රහත්වීමත් පිරිනිවන් පෑමත් එකවිට සිදුවීමයි.)

මේ බව දත් තථාගතයන් වහන්සේ වසවත්මරුට මෙසේ වදාළසේක.

එවංගිධීරා කුබ්බන්ති-නාවකඩ්ඪන්ති ජීවිතං,
සමූලං තණ්හං අබ්බුය්හ-ගොධිකෝ පරිනිබ්බුතෝ.

"මාරය! ඤාණවන්තයෝ මෙසේද කිපෙන්. ජීවිතය ප්‍රාර්ථනා නොකරත්. ගොධික තෙම අවිද්‍යා-තෘෂ්ණා සියල්ල නසා අනුපාදි-ශෙෂ පරිනිර්වාණයෙන් පිරිනිවිණේය" යනුයි.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ බික්සහත පිරිවරා ගොධික තෙරුන් පිරිනිවී තැනට වැඩිසේක. ගොධික තෙරුන්ගේ මළ සිරුර බෙල්ලෙන් වෙන්ව යහන මත වැතිර තිබෙනු දක්නට ලැබිණ. ඒ අතර ඒ අවට දුමාරයක් දුම්ගෝලයක් කැරකෙන්ට විය. වරක් ඌර්ධ්‍ව දිශා පැත්ත දුමන බවට (දුම්දැන බවට) අන්ධකාර බවට යෙයි. වරක් බටහිර පැත්ත අදුරු වෙයි දුමාරයක් ඇතිවෙයි. මෙසේ දිශා අනුදිශාවන්හි එහා මෙහා පෙරලෙන දුමාරය භික්ෂූන්ට පෙන්වා

වදාළ සම්බුදුරජාණෙනි මහණෙනි! මේ දුම්රය බලව! මෙය අනීකක් නොවේ, මහණෙනි! වසවත් මරුතෙමේ ගොඩික තෙරුන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤනය සොයන අයුරුයි. මහණෙනි! මාරයා රැවටුනේය. ගොඩික තෙරුන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤනය පිහිටි තැනක් නැත. ඔහු පිරිනිවන් පෑහ''යි වදාළහ.

අවසානයේ වෙහෙසට පැමිණි මාරයා තථාගතයන් වහන්සේ කරා එළඹ ''සවාමිනි දිසා අනුදිසාවන්හි සොයන්නාවූ මම ගොඩික තෙරුන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤනය නොදකිමි. ගොඩික තෙර කොහි ගියේදැයි (කොහි උපන්නේදැයි) ඇසී. බුදුරජාණෝ මරහුට මෙසේ පිළිතුරු දුන්හ.

සොධිරෝ ධිතිසම්පන්නෝ – ඛාධි ඛාන රතෝසදා
අහොරත්තං අනුයුඤ්ජං – ජීවිතං අනිකාමයං
හෙත්වා නමුච්චිනෝ සෙනං – අනාගණනඛා පුනබ්භවං
සම්මූලං තණ්හං අබ්බුය්හ – ගොඩිකෝ පරිනිබ්බුතෝ

''ප්‍රඥාවන්වූ ධෘතිමත්වූ; ධ්‍යාන කරණ සුලුවූ; ධ්‍යානයෙහි ඇලුනාවූ ජීවිතය පිළිබඳ නිරපෙක්ෂකත්වයෙන් ප්‍රතිපත්තියෙහි යෙදුනු; ඒ උදෙසීමත් ගොඩික තෙර මරසෙන් බිඳ; පුනරුත්පත්තියක් නොපැමිණ; තෘෂ්ණාව තසා පිරිනිවියේය.''

මෙහි පෙනෙන මාරයා ක්ලේශමාරයාද? දෙව පුත්‍ර මාරයාද? මෙහි ''මරසෙන්'' යනුවෙන් වදාරා ඇත්තේ කාමාදී දශ ක්ලේශයන්ට නොවේද? එසේනම් කාමාදීහුම වසවත් මරුගේ පිරිස් බව නොපිළි ගණ්මුද? වසවත් මරු නමින් කෙනෙකු නැතැයි කියන්නෝ මෙයට දෙන පිළිතුර කුමක්ද?

මෙසේම **ආලවිකා; සොමා; වජිරා;** ආදී භික්ෂුණීන් වහන්සේලා වෙතද පැමිණි වසවත් මරු හෙමේ උන්වහන්සේලාටද කැනි ගැනීම් ඇතිකරවීමට ප්‍රයත්න දැරූ අයුරු ''නිකබුනි සංයුත්තක'' යෙහි පෙනේ. මෙපමණක්ද නොවේ. එක් කලෙක තථාගතයන් වහන්සේ බඹ කම් බ්‍රහ්මයා දමනය කරන්ට බඹ ලොව වැඩමවූ අවසථාවකදී වසවත් මරු එහි එක්ව සිටි බ්‍රහ්මයෙකුට ආවිෂ්ට වී සම්බුදුරදුන්ට නිගා කළ අයුරු මැදුම් සඟියෙහි තථාගතයන් වහන්සේ වදාළ **බ්‍රහ්මනිමන්තණික සූත්‍රයෙහි** මනාසේ විස්තර කර ඇත්තේය. ඒ මෙසේය.

"බක බ්‍රහම තෙමේ සියල්ල දන්නේය."

එක් කලෙක තථාගතයන් වහන්සේ **උකකට්ඨා පුර** සුභග නම් සාලවෘක්ෂ සවමීපයෙහි වැඩ වසන සේක. එකල බඹලොව වසන **බක** නම් බඹෙකුට "මේ බ්‍රහමාත්ම භාවය නිත්‍යය. සදාකාලිකය. සර්වසම්පූර්ණය. මේ බඹලොව උපන් කෙනෙක් නැවත නොදිරයි. නොමැරෙයි. චුත නොවෙයි. නූපදියි. මෙයින් මත්තෙහි නිර්වාණයක් නැත" යනුවෙන් මිථ්‍යා දෘෂ්ටියක් පහළ විය. බක නම් බඹහුගේ මේ අදහස දැන වදාළ තථාගතයන් වහන්සේ වක්කළ අතක් දික් කිරීමට පෙර සුභග නම් ශාල රාජ මූලයෙහිදී අතුරුදහන්වූ සේක් බඹලොව පහළවූ සේක.

ඉක්බිත්තෙන් බකබ්‍රහමතෙම දුරින් වඩින තථාගතයන් වහන්සේ දුටුයේය. දැක තථාගතයන් වහන්සේට අමතා "**නිදුකාණෙනි** මෙහි එව! මේ ඊම යහපත්ය. "නිදුකාණෙනි! මේ බ්‍රහමාත්ම භාවය නිත්‍යය. සර්වය. සදාකාලිකය. මෙය සියල්ලෙන් සම්පූර්ණය. මෙය චුත නොවන සුභාව ඇත්තක්ය. මේ වනාහී නොඋපදියි. නොදිරයි. නොමියයි. මෙයින් අන්‍යවූ නිවණක් නැත"යනුවෙන් කී.

"**බක**" නම් මහ බඹ මෙසේ කී කල්හි තථාගතයන් වහන්සේ ඔහු අමතා "පින්වත! බක බ්‍රහමය! නොපැ අවිද්‍යාවෙන් යුක්ත වෙහි! අනිත්‍යවූවක්ම නිත්‍යයයිද; අසර්වවූවක්ම සර්වයයිද; සදාකාලික නුවූවක්ම සදාකාලිකයයිද; අසම්පූර්ණ වූවක්ම සම්පූර්ණයයිද; කියන්නෙහි. බ්‍රහමය චුත නොවන; නූපදින; නොදිරන; නොමියන; සුභාවයෙන් යුක්තවූ කිසිම ලොවක් නැති බව සර්ව වශයෙන් දනුව! යනුවෙන් වදාළ සේක.

එකෙණෙහිම පාපිවූ; ලාමක අදහස් ඇති වසවත් මරදෙව් පුත් හෙමේ ඒ බඹ පිරිසෙහිවූ එක්තරා බඹෙකුට ආවේෂවව තථාගතයන් වහන්සේට මේසේ කීයේය.

"මහණ මේ! බ්‍රහම පදවියට නිසැ නොකරව! මේ මහා බ්‍රහමයාය.

අන්‍යයන් මැඩ පවත්වන්නේය. අනුන් විසින් නොමැඩලිය හැකි බලයක් දරන්නේය. සියල්ල දක්නාවූද; සියල්ලන් අභිභවනය කළාවූද; සියල්ලන්ටම ඊශ්වරවූද; මේ මහබඹු තෙමේ **ලෝකය** මවන්නේය. ලෝකයාගේ පියාය. ලෝකයේ ශ්‍රේෂ්ඨයාය. සජීවක අජීවක සියලුම දෙය මොහුගේ කැමැත්තට අනුව පවතී. මහණ! ඔබට පෙරද ලොව විසූ ඇතැම් මහණ බමුණෝ පඨවී – ආපෝ – තේජෝ –වායු – යන ධාතූන්ට ගරහා; දෙවියන්ට හා බඹුන්ටද

මාරයාටද ගරහා සතර අපා දුකට පැමිණියාහුය. පඨවී – ආපෝ තෙජෝ – වායු – යන ධාතූන්ට නිත්‍ය සුඛාදී වශයෙන් ප්‍රශංසා කළාවූ අභිනන්දනය කළාවූ සියලුම බ්‍රහ්මණෝ මරණින් මතු උතුම්වූ බඹලොව උපන්නාහුය, එබැවින් මහණ ඔබද මේ උතුම් බඹහුගේ වචනය පිළිගණුව. මේ බඹහු යමක් කියාද එය නොඉක්මව; මේ බඹහුගේ වචනය සත්‍යම වෙයි. ඔබ යම් හෙයකින් මේ මහබඹහුගේ වචනය ඉක්ම වන්නෙහි නම් ඔබ වෙතට පැමිණෙන සිරිසඟ මුගුරකින් ගසා ආපසු පලවා හැරීමක් වැන්න; සියක් රියන් මහා වළෙක්හි හීමක් (වැටීමක්) වැන්න; මෙහි රැස්ව සිටින සියලුම බ්‍රහ්මයෝ මේ බඹ නම් මහබඹහුගේ වචනය අනුව පවත්නාහු සිරියෙන් හා සැපෙන්ද බබලන්නාහුය ඔබද මේ බඹුහුගේ වචනය නොඉක්මව! මේ දෘෂ්ටිය පිළිගණුව"යි වසවත්මරු බඹපිරිස් මැද තථාගතයන් වහන්සේ අමතා නිගරු කෙළේය.

එවිට තථාගතයන් වහන්සේ වසවත් මරු අමතා,
"එම්බා පාපිමටය! මම නා දනිමි.

මා නා නොහඳුනතියි නොසිතව! බුඹ මාරයා වෙහි (පාපීවූ) වසවත් මරු නා වෙහි, මේ බඹ නම් බඹද සෙසු බඹ පිරිස්ද තගේ වසඟයට පැමිණියාහුය. මා පිළිබඳව එසේ නොසිතව! මම තගේ විෂය ඉක්මවීම්. මා ගිය පාර හෝ නා නුදුටු වෙහි "යනුවෙන් වදාළ සේක.

ගෞතමයෝ මා හඳුනා ගත්හ"යි දුක්වූ දෙම්නස්වූ වසවතීනි මාරයා එකෙණෙහි අතුරුදහන් විය.

මෙය තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණලද ,බ්‍රහ්මනිමන්තනික (මජ්ඣිම නිකාය) සූත්‍රාන්ත දෙශනාවෙහි ඇතුළත්ය. මෙහි සඳහන් **මාරයා** කවරේද? **වසවත් මරු** නමින් කෙනෙකු නැතැයි සලකන්නෝ මෙයට කුමක් කියද්ද? තථාගතයන් වහන්සේ වෙත පැමිණි මේ මාරයා කෙලෙස මාරයාද? දෙවපුත්‍ර මාරයාද?

දූසි මාරයා හා වසවත්තිව මාරයා

එක් කලෙක ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන රහතුන් වහන්සේ සුංසුමාර ගිරි නගරවරයට අයත් භෙෂකලා නම් වනය ඇසුරු කොට වාසය කරණ සේක. දිනක් උන් වහන්සේ ආධ්‍යාත්ම සමාධියක සක්මන් කරන කල වසවත්තී මාරයා උන්වහන්සේගේ කුස තුලට පිවිසියේය. (යොදුන් සියයකට ඇතින් උමඳ ඇත්තාවූ

මිනිස් සිරුරක ගඳ දෙවියන්ට වැටෙන්නේ ගැරඩි කුණපයක ගඳමෙනි. එබඳු මිනිස් සිරුරක අභ්‍යන්තරය කෙබඳු දුගඳ ඇද්ද? නමුත් ප්‍රතිවාදියා දමනය කිරීමෙහිලා කෙබඳු නීච ක්‍රියාවක් උවද සිදුකළ හැකි වසවත් මරුට මුගලන් තෙරුන්ගේ සිරුර තුළ පඤ්ඤාසයසථානයෙහි සැඟවී සිටීම එතරම් අසිරු දෙයක් නොවේ. ඒ ඇයි? මුගලන් මහතෙරුන්ට පීඩා කරණ අදහස මරහු සිතා තුළ බලපෑවැත්වූ නිසයි. එහෙයින් බඩවැල තුළ පඤ්ඤාසයසථානයෙහි මරතෙම සැඟවී සිටියේය.) එවිට මහ මුගලන් තෙරුන් වහන්සේට උඳුබත් අනුභව කලෙක්හි මෙන් කුක්ෂියෙහි බරගතියක් දැනුනේය. සක්මනින් බැස කුටියට වැඩ කුසතුළ පවත්නා බර ගතිය කුමක් දැයි ආවජ්ජනා කළ සේක. පාපිවූ මාරයා කුසතුළට වන්බව වැටහුනේය. ඉක්බිති උන්වහන්සේ වසවත් මරු අමතා:-

පාපිෂටය! පිටතට නික්මෙව! පාපිෂටය වහා නික්මෙව! තථාගතයන් වහන්සේට හෝ තථාගත ශ්‍රාවකයෙකුට හෝ වෙහෙස නොකරව! තට හිත වැඩ පිණිස දුක් නොලැබෙනු පිණිස මම මෙසේ කියමි''යි පැවසූ සේක.

එවිට මාරයා මෙසේ සිතීය. ''මුගලන් තෙර මේ කියන්නේ දැනගෙණ නොවේ. නොදැනය. දැක නොවේ. නොදැකය. ගෞතම බුදුන් වහන්සේ වත් මා වහා නොදැන ගන්නා කල ශ්‍රාවකයෙක් කෙසේ දැනගන්නේද?

මරහුගේ අදහස දත් මුගලන් තෙරණුවෝ මරු අමතා ''එම්බා මාරය! මම තා හඳුනමි මම තා නොදනිමියි නොසිත! තෝ පාපිවූ මාරයා වෙහිය'' යනුවෙන් වදාළ සේක.

ඉක්බිති මාරයා මහ තෙරුන් වහන්සේගේ මුඛයෙන් පිටතට වින් දෙර කවුළුව අසළ සිටියේය. උන්වහන්සේ මරුට පෙරවූ දෙයක් විස්තර කළසේක.

''පාපිෂටය! තට පෙරවූ දෙයක් කියමි. මම පෙර ජාතියක ''දූසි නම් මාරයාවීමි. එකල කාලිනම මගේ නැගනියක් වූවාය. එකල තො ඇයගේ දරුවා වූවෙහිය. එහෙයින් එකල තෝ මගේ බෑනනු වූයෙහිය. එසමයෙහි කකුසඳ නම් බුදුහු ලෝ පහළ වූහ. ඒ බුදුන්ට විධුරය සඤ්ජීවය යන නම් ඇති අගසවු දෙනමක් වූහ. එකල දූසි මාරතෙම බුදු සව්වන්ට පීඩා කරණු කැමැත්තේ නගර වැසි-දනව් වැසි බ්‍රාහමණ ගෘහපතික ආදීන්ට ආවිෂ්ටව ඔවුන් ලවා සිල්වත් ගුණවත් භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් ආක්‍රොශ පරිභව කරවන්ට විය.

"මේ මුඩු මහණෝ ශ්‍රමණ ප්‍රතිරූපකයෝය, ගෘහපතියෝය. උසස් පැවැත්මක් මුන්ට නැත. බඹහුගේ පිටිපත්ලෙන් උපන් පහත් ගති ඇති පාපියෝය. මේ මුඩු මහණෝ "අපි ධ්‍යාන කරමු" යයි බිම බලාගෙණ අලසකමින් නන්වැදෑරුම් ලාමක හැඟීම් ඇතිව වෙසෙත්. යම්සේ බකමූහුනුතෙම ගොදුරු පිණිස මියෙකු හෝ එබන්දෙකු පරීක්ෂා කරමින් රැක්අත්තක බිම බලාගෙණ සිටිද; මේ මුඩු මහණෝද එලෙස කෙලෙස් සිතුවිලි පහළ කරවමින් තැන් තැන්වල බිම බලාගෙණ සිටිත්. යම්සේ සිවල්තෙම ගෑතෙරක මසුන් සොයමින් සිතුවිලි බරින් සිටිද; බළල්තෙම කසලගොඩක මියෙකු සොයමින් සිටිද; එමෙන් මේ මුඩු මහණෝද තැන් තැන්වල බිම බලාගෙණ අපි ධ්‍යාන කරමුයි. සිතුවිලි බරින් අලසව කල් යවත්. මොවුහු හීන ගති ඇති ලාමක අදහස් ඇති පාපියෝය."

යනුවෙන් මහජනයා ආක්‍රොශ පරිහව කෙළේය. එකල කලුරිය කරන බොහෝදෙනා බොහෝසෙයින් නිරයෙහිම උපදිත්.

ඝකුසඳ සම්‌බුදුයන් වහන්සේ ශ්‍රාවකයින්ට ආමන්ත්‍රණකොට මහණෙනි! බ්‍රාහමණ ගෘහපතිහු මෙරාවිඝටව භික්ෂූන්ට පරිභව බෙණෙති. කෙපි සියල්ලෝ සතුන්වෙත මෙත්තා-කරුණා-මුදිතා-උපෙක්ඛා යන සඤ්ඤබඹ විහරණයෙන් යුතුව වසමි යනුවෙන් අවවාද කළසේක. භික්ෂූහු අවවාදය ලෙස ක්‍රියාකළහ. මාරයා අදහස් කළේ භික්ෂූන් තුළ කෙලශොත්පත්තියයි (කෙලෙසුන් ඉපදවීමයි.) එහෙත් ඔහුගේ අදහස් ඉටු නොවිය.

ඉක්බිති මාරයා බ්‍රාහමණ ගෘහපතීන්ට ආවිඝටව ඔවුන් ලවා භික්ෂූන්ට බොහෝ උසස් ලෙසින් සත්කාර ගරුකාරමානන පූජාදිය කරවන්ට විය. (ඔහු එයින් බලාපොරොත්තුවූයේ භික්ෂූන් ආමිඝයට ලොල්කරවීමයි.) එකල කලුරිය කරණ බොහෝදෙනා බොහෝසෙයින් දෙව්ලොවම උපදිත්. සම්‌බුදුයන් වහන්සේ මරහුගේ අදහස භික්ෂූන්ට පහදා දුන්සේක. බ්‍රාහමණ ගෘහපතියන්ගේ සත්කාර ගරුකාරයන්ගෙන් වෙනසකට නොපැමිණෙන ලෙස අවවාද කළසේක.

මේ නිසා දෙවෙනි වාරයෙහිද මාරයාගේ අදහස ඉටුනොවිය. මෙයින් වඩාත් කුපිතවූ දුසිමාරතෙමේ පලිගැණීමට අවසථාවක් බලමින් සිටියේය.

දිනක් ඝකුසඳ බුදුරජාණන් වහන්සේ අග්‍රශ්‍රාවක "විධුර" නම් මහරහතුන් වහන්සේ සමග පිඬු පිණිස ගමට වැඩිසේක. එකල දුසිමාරයා එක්තරා කුඩා දරුවෙකුට ආවිඝටව ඔටෙහි තබක්තව

නැකිකරම් ලොකු ගලක් ගෙණ **විධුර** නම් රහතුන් වහන්සේගේ හිසට එසින් ඇසීය. හිස පැලුනේය. උන්වහන්සේ ලේ වගුරුවමින්ම තථාගතයන් වහන්සේ අනුව වැඩිසේක. සම්බුදුන් වහන්සේ තැවතී ආපසු හැරී "හස්තිවිලෝකනයෙන්" (මුළු සිරුර හරවා) බලා **"දුසිමාරතෙමේ ප්‍රමාණය ඉක්මවූයේය. ඔහුගේ කරම ඔහු නොදක්නේය"** යනුවෙන් වදාළසේක. එකෙණෙහිම දෙවඹුයෙන් චුතවූ මාරයා අවීචිමහනරකයෙහි උපන්නේය.

එම්බා වසවත්තීති මාරය! අවීචිමහනරකයෙහි උපන් ඒ දුසිමාරවූ මම වසී දසදහස් ගණනක් ඒ මහානරකයෙහි පැසුනෙමි. එසේම අවීචිනරකය පිළිබඳවූ-ඒ අසලවූ-ඔසුපත් නරකයෙහි දසදහසක් හවුරුදු නිරාදුකින් පැසුනෙමි. මාරය! අවීචියෙහි උපන් ඒ මට මිනිස් සිරුරක් මෙන් ශරීරයද මත්ස්‍ය ඔලුවක් මෙන් හිසද පිහිටියේය. බුදුන්ට හා සව්වන්ට චෝදනාකරවූ අකුශලයෙන් අවීචියෙහිද ඔසුපත් නරකයෙහිද ගිනිදැල්වලින් වෙළිවෙළී දුකින් පැසුනෙමි. **විධුර** නම් අගසව් තෙරුන්ට පහර දෙව්ම නිසා නිරිසනාවූ මගේ හිසට තියුණුවූ යවුල් පහර සීයක් එක්වර වැදෙමින් පීඩා ඇතිවිය.

මාරය! තෘද මෙසේම බුදුසව්වෙකුට හිංසා කිරීමෙන් දුකට පැමිණෙන්නෙහිය.

මුගලන් තෙරණුවෝ වසවත්තීමරුට මෙසේද වදාරා තමන් වහන්සේගේ වර්තමාන බලයද පහදමින් නැවතත් මරු අමතා

"එම්බා මාරය! භික්ෂුසඞ්ඝයා බලා සිටියදී **මිගාරමාතු පාසාදය** (පූර්වාරාම විහාරය) මාපටහිල්ලෙන් ගසා කම්පා කෙළේද? ශක්‍රයාගේ වෛජයන්ත ප්‍රාසාදය පයේ මාපටහිල්ලෙන් ගසා කම්පා කොට දෙවියන් සංවේගයට පත්කෙළේද; වෛජයන්තප්‍රාසාදයෙහිදී ශක්‍රයාගෙන් "තෘෂ්ණාක්ෂය විමුක්තීන්" ප්‍රශ්නකොට තථාගත දෙශිත ලෙසින් ශක්‍රයාගෙන් එයට පිළිතුරු ලද්දේද; බඹලොව "සුධර්මා" නම් බ්‍රහ්ම සභාවෙහි බඹුන් විසමයට පත් කෙළේද; ධ්‍යාන විමොක්ෂයෙන් මහාමේරු පර්වතයෙහි මුදුන ඍජූ කෙළේද; එබඳු බලවත් තථාගත ශ්‍රාවකයෙකුට පීඩාකොට තෘද බොහෝ කලක් නිරාදුකට පත්වන්නෙහිය. මාරය තථාගතයන් කෙරෙහි නොකලකිරෙව තථාගත ශ්‍රාවකයන්ට පීඩා නොකරව!! යනුවෙන් පැවසූසේක.

මෙසේ හෙසකලාවනයෙහිදී මහමුගලන් රහතන් වහන්සේ තමන් වහන්සේ පෙර කකුසඳ සම්බුදුන් කල දුසිමාරයාව ඒ තථාගතයන්ට හා විධුර නම් අගසව් රහතුන්ට කරනලද පීඩාව නිසා

නිරාදුක් විදි අසුරු මේ වසවත්මරුට පහදුදී මේ වසවත්මරු එකල තමන් වහන්සේගේ බැනහුවන්ව සිටි අසුරුද විස්තරකළ සේක.)

මේ විස්තරයෙන් නොසතුටුවූ වසවත්මරු තෙම එහිම අතුරුදහන්වීය.

(මැදුම්සඟියට අයත් **මාරතජ්ජනීය** සූත්‍රයෙහි සාරාංශයයි මේ දැක්වූයේ. මෙහි පෙනෙන මාරයෝ කවරහුද; කෙලෙසමාරයෝද? මාර තමින් පුද්ගලයකු නැතැයි කියන්නෝ මෙයට කුමක් කියද්ද? මේ සූත්‍රදෙශනාව බොරුයයි කියද්ද?)

තවද ''සවණ්ඨකකීටක'' ජාතකයෙහිදී බෝසත් **සාලිඥිය** බමුණා මරණු පිණිස දෂ්ටකරනලද කෘෂ්ණසර්පයා (පොළඟා) වසවර්ත්තීමාරයාවූ බව තථාගතයන් වහන්සේ විසින් වදාරා ඇත.

කාමෙ තදා දෙවදමෙතා අහොසි–
මාරොතදා කණ්හසප්පො අහොසි,
ආනන්ද භද්දා ච කිකකටමබා අහොසි–
අහං තදා බ්‍රාහ්මණො හොමි තත්ථ.

(ජාතක පාලි)

මරහුගේ ශොකාලාපය හා

මාර දුහිතෘන්ගේ නිෂ්ඵල ප්‍රයත්නය

(තණ්හා - රතී - රගා)

භාග්‍යවත් තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් වසකට පමණ පසු දිනක් අජපල් නුගරුක්මුල වැඩහිඳ වදාළ සේක. මහාභිනිෂ්ක්‍රමණයේ සිට සත්වසක් තුළම මහාපුරුෂයාණන් පසුපස ලුහුබැඳීමෙන් වුවද කිසිම සිදුරක් නොලැබූ වසවත්මරු එදින තථාගතයන් කරා එළඹ මෙසේ කීයේය.

සොකාවතිණෙණා නුවනමහි ඣායසි?
විත්තං නුජ්ඣතෝ උදපත්ථයානෝ?
ආගුං නු ගාමසම්මං අකාසි කිඤ්චි?
ජනෙන කස්මා නකරොසි සඞ්ගිං?
සඞ්ගිං නසමපජ්ජති කෙතව තෙ?

(කිම? (මේ ගසමුලටවී) ධ්‍යාන කෙරෙහිද? නැතහොත් සිතේ ශොකයක් නිබේද? දූකෙළි ආදියකින් ධනයක් පැරදුනේවෙහිද? නැතහොත් පැරදුනු වස්තුව පිළිබඳව සිතමින් හිඳිනෙහිද? ඇතුළු ගමදී වරදක්කොට මහජනයාහමුවට යා නොහැකිව සැඟවී සිටිනෙහිද? කිසිවෙකුගේ ආශ්‍රයක් නොකැමැත්තෙහිද?) මාරයා මෙසේ කීකල ඔහුට පිළිතුරු වශයෙන් සම්බුදුහු මෙසේ වදාරති.

සොකස්ස මූලං ඌරිඛාය සබ්බං
අනාඝ ඛ්‍රායාමි අසොච මානෝ
ජෙතාන සබ්බං භවලොභ ජප්පං
අනාසවෝ ඛ්‍රායාමි පමත්ත බන්ධු.

පමත්ත බන්ධුවූ (පමාවූවන්ගේ ඤාතියාවූ) මාරය! මම ශොකයාගේ මූලි උදුරාදමා නිශෝකීව නිරපරාධීව මෙහි ධ්‍යාන කරමි. සියලුම භවයන් පිළිබඳ ආශාව (භව ලොභ ජල්පය) සිඳ ආශ්‍රව රහිත වූයෙම් මෙහි (විවේකීව) ධ්‍යානකරමි.

නැවත මාරයා මෙසේ කියයි.

යං වදන්ති මම ඉදන්ති යෙ වදන්ති මමන්ති ච
එත්ථව තෙ මනෝ අත්ථි-නමෙ සමණ මොකඛසි.

එවිට සම්බුදුහු මෙසේ පිළිතුරු දෙති.

යං වදන්ති නතං මය්හං- යෙ වදන්ති නතෙ අහං
එවං පාපිම ජානාහි-නමෙ මගහමපි දකඛසි.

(මෙහි අර්ථ මූලින් දක්වා ඇත.)

වසවත්මරු නැවතත් මෙසේ කියයි.

සචෙ මය්හං අනුබුද්ධං-ඛෙමං අමත ගාමිනීං
පෙහී ගච්ඡ තව මෙවෙකො-කිමඤඤ මනුසාසති.

(ඉදින් ඔබ අමෘතමහා නිර්‍වාණධාතුව ප්‍රතිවෙධ කෙළෙහි නම් ඔබම හුදකලාව භවයෙන් ඉවත්ව යව. (කලුරිය කරව) අනුන්ට අනුශාසනා කරන්නේ ඇයිද?)
සම්බුදුහු:—

අමචඡුඛෙය්‍යං පුච්ඡතී-යෙ ජනා පාරගාමිනෝ
තෙසාහං පුට්ඨෝ අකඛාමි-යං සඛ්ඛං තං නිරූපධිං.

භවයෙන් එතෙර යනු කැමති සත්වයෝ එයට උපදෙශය මගෙන් විමසති. මම ඔවුන්ට එය විස්තරලෙස කියමි. (මාරය! **එහි** ඇති වරද කිම?)

මාරයා සිතයි:—"මේ මහණා සමග කථාකිරීමෙන් පලක් නැත. මොහු සමග කථා කරනුද නොහැකියි. මොහු මගේ විෂය ඉක්ම විය. ලෝකයාටද විමුක්තිමාර්ගය පහදුදෙයි. මට වූයේ මහත්ම හානියෙකි."

ඉක්බිති මාරයා තථාගතයන් වහන්සේ අමතා මෙසේ කියයි.

සවාමීනි! යම්තිසි ගමකට හෝ නිගමයකට නුදුරුව විලෙක් වෙයි. එහි කකුළුවෙක්ද වෙසේ. සවාමිනි! බොහෝවූ ගම් දරුවෝ ගමින් නික්ම පොකුණ කරා පැමිණියාහු ඒ කකුළුවා ගොඩට ගෙණ ගොඩබිම පිහිටුවන්නාහුය. සවාමිනි ඒ කකුළුවා වරින්වර අඩු එලියට දික් කරයි. ගම්දරුවෝද එලියට දික් කරන දික්කරන අඩුව දණ්ඩකින් හෝ කැට කැබිලිත්තකින් බිඳින්නාහුය. අවසානයේදී සියලුම අඩු බිඳුනු කල්හි නැවත පොකුණට යා නොහැකිවූ කකුළුවා එහි අනාථ වෙයි. වහන්ස, එපරිද්දෙන් මනේද යම්කිසි මාර විසූක (විහිළු) කෙනෙක් වෙත්ද; විරුද්ධව කරණලද සේවනයක් ඇද්ද; ඇත්වෙස් උරග වෙස ආදී වෙස් දැක්වීම් කෙනෙක් ඇද්ද; ඒ සියලුම විසූකාදීහු (විහිළු) භාග්‍යවතුන් වහන්සේ විසින් සිදින ලදහ. ඔබගේ සිදුරු සෙවීමෙන් මට දැන් වැඩක් නැත ඔබ කරා එලඹෙන්ට මම නුසුදුස්සෙක්වීමී.

නැවතද මාරයා බලවත් කලකිරීම් සහිතව මේ ගාථාද ප්‍රකාශ කෙළේය.

මේද වණ්ණසදිසා පාසාණං – වායසෝ අනුපරියගා
අපෙත්ථ මුදු වින්දෙම – අපි අස්සාදනාසියා
අලද්ධාන්ත්‍ථ අස්සාදං – වාය සෙත්‍ථෙතා අපක්කමේ
කාකෝවසෙල මාසජ්ජ – නිබ්බිජ්ජාපෙම ගොතම

කවුඩෙක් (කාකයෙක්) මෙදවණ් (ගිතෙල් පැහැය ඇති) පාෂාණයක් දැක; (අනුභව කරණු රිසියෙන්) මෙහි කොතැනක කොතැනක මොලොක් බවක් ඇද්දැයි ඒ පර්වතය අවට කැරකෙමින් පිරික්සන්නේ වේද; නමුත් (එය ඒකාන්ත පාෂාණයක් හෙයින්) එහි කිසිම ආශ්වාදයක් නොලැබ කවුඩු තෙම පර්වතය කෙරෙන් ඉවත්ව යන්නේද; එසේම මමද කලකිරී ගෞතමයන් වහන්සේ කෙරෙන් ඉවත්ව යමි.

මෙසේ කියා මාර තෙමේ තථාගතයන් වහන්සේ වෙයින් ඉවත්ව ගොස් නුදුරු තැනෙක පලක් බැඳ (අරමුණය ගොහා) බිම හිදගෙණ කල්පනා කරමින් කිසිවක් නොවැට හෙන්නේ කාළඔය (කෝටු කැබෙල්ල] කින් බිම ඉරි අඳිමින් හුන්නේය.

එකල මරහුගේ දූවරුන් වන **තණහා-රතී-රගා** යන (මාර දුහිතෘන්] තිදෙනා වසවත් මරු වෙත එලඹියාහුය. වසවත් මරු දුම්මුඛව සිටින අයුරු දැක එයට හේතු මෙසේ විචාලාහුය.

කෙනාසි දුම්මනෝ තාත – පුරිසං කත්තු සොචසි
මයං තං රාගපාසෙන – අරඤ්ඤම්හි කුඤ්ජරං
බන්ධිත්වා ආනයිස්සාම් – වසගෝ තෙ භවිස්සති

පියාණෙනි! කුමක් නිසා දෙමිනස් සහිතව නිදන්නෙහිද? ඔබට කිනම් පුරුෂයෙක් කරදර කෙළේද? කවරෙකු නිසා ඔබ ශොක කෙරෙහිද? අපි ඔහු වනැතෙකු (කැලේ වෙසෙන වල් අලියෙකු) ලෙසින් රාග නැමති පාශයෙන් බැඳගෙන ඔබකරා එන්නෙමි.)

මාරයා දුවරුන්ට කියයි.

"අරහං සුගතෝ ලොකෙ – නරාගෙන සුවානයෝ
මාරධෙය්‍යං අතික්කන්තෝ – තාසමා සොචාමහං භුසං"

(අර්හත්වූ" සුගත පොමේ ත්‍රෛභූමක වෘත්තය ඉක්ම ගියේය. ඔහු රාගයෙන් සුවසේ ගෙණ ආ නොහැක්ක. එහෙයින් මම අතිශයින් ශොක කරමි")

ඉක්බිත්තෙන් **තණහා- රතී- රගා** යන නම් ඇති ඒ මාර දුහිතෘන් තිදෙනා භාගවතුන් වහන්සේ වෙත එලඹියාහුය. එලඹ "මහණ! අපි නුඹගේ පාද පරිවාරිකා කම් කරමු"යි කීහු. එහෙත් ඔවුන්ගේ වචන නැසුනාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම් භූතව බිම බලා වැඩහුන් සේක. **නිරුත්තරවූ උපධි සඛයෙහි** (නිවණෙහි) සිත ඇලුනු හෙයින් මොවුන්ගේ වචනයන් මනෙහි නොකළ සේක.

එකල ඒ මාර දුහිතෘහු මදක් ඉන් බැහැර ගොස් ඔවුනොවුන් මන්ත්‍රණය කළාහුය. "පුරුෂයෝ වනාහි නානාප්‍රකාර අදහස් ඇත්තාහුය. ඒ නිසා අපි තිදෙනා එකිනෙකා එක සියය, එකසියය, බැගින් **කුමරි වෙස්** මවාගෙණ වෙන වෙනම භාග්‍යවතුන් කරා එලඹෙමු" එසේ කොට ඔව්හු භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මහණ! අපි ඔබගේ පාද පරිවාරිකාකම් කරමු"යි කීහ. ඒ වචනයද නොඇසුනාක්වන්ව තුෂ්ණීම්භූතව වැඩහුන් සේක.

නැවත මරහනෝ මන්ත්‍රණය කොට **නොවැදූ ගැහැණුන්ගේ** වෙස්ගෙන සම්බුදුන් කරා එලඹ පෙර ලෙසින්ම පාද පරිවාරිකා බව ඉල්ලුවාහුය. එවරද සම්බුදුහු "මුවින් වචනයක් වත් නොවදරා නොඇසුනාක්වන්ව වැඩහුන්හ.

මෙහේ මරහනෝ **එක් වරක් වැදූ** ගැහැණුන්ගේ වෙස්ද; **දෙවරක් වැදූ** ගැහැණුන්ගේ වෙස්ද; **මධ්‍යම** ස්ත්‍රීන්ගේ **වෙස්ද; මහා** ස්ත්‍රීන්ගේ වෙස්ද; **ගෙණ** සම්බුදුන් කරා එලඹ පරිචාරිකා බව පැතූහ. ඉන් කිසි පිහිටක් නොවීය. සම්බුදුන්ගෙන් වචන මාත්‍රයක සංග්‍රහයක් හෝ මුව ඔසවා හෙලන බැල්මක් හෝ ඔවුහු **නොලද්දාහුය.**

අනතුරුව මරහනෝ එක්ව "ඒකාන්තයෙන් අපේ පියතුමා කියේ සැබෑවක්මය. අර්හත්වූ සුගත තෙමේ මාරධෙය්‍යය ඉක්මවූ හෙයින් රාගයෙන් ගෙණ ආ නොහැක්ක. අපි අවීතරාගීවූ යම් මහණ කෙනෙකු හෝ බ්‍රාහ්මණ **කෙනෙකු** මේලෙසින් උපක්‍රම **කරන්නමෝ** නම් ඔහුගේ හෘදය හෝ පැලෙන්නේය. මුඛයෙන් උණු ලෝ හෝ නහන්නේය. (වමනය කරන්නේය.) ඔහු උමතු බවට හෝ චිත්ත වික්ෂෙපයට පැමිණෙන්නේය. පලාවන්වූ ඔට ගසක් කපා උණු පහණක් (ගලක්) උඩ දමන ලද්දේ යම්සේ වියලේද එසේම ඔහුද වියලෙන්නේය"යි (නමුත්) මේ මහණ **කෙළෙසින්වත්** දමනය නොකළ හැක්ක. නියමින් දුක්වූවාහුය. අවසානයේ තිදෙනාම එක්ව තථාගතයන් වහන්සේ කරා ගොස් **තණහා** කොමෝ මේ ගාථාව කීවා.

සොකාවතිණෙණානු වනමහික්ඛායහි?
චිත්තානු ජීතෝ උදපජ්ජියානෝ?
ආගතනු ගාමියම්ං අකාසි කිඤ්චි?
කසමා ජනෙන නකරොසි සක්කිං?
සක්කිං නසම්පජ්ජති කෙනචිතෝ?

"කිම [මේ ගස මුලටවී] ධ්‍යාන කෙරෙහිද? නැතහොත් සිතේ ශොකයක් තිබේද? (දූ කෙළි ආදියකින්) ධනයක් පැරදුනේ වෙහිද? නැතහොත් පැරදුනු වස්තුවක් ගැණ සිතමින් හිඳිනෙහිද? ඇතුළ ගමදී වරදක් කොට මහජනයා හමුවට යා නොහැකිව සැඟවී සිටිනෙහිද? කිසිවෙකුගේ ආශ්‍රයක් කිම නොකැමැත්තෙහිද?)

ඇයට සම්බුදුහු මෙසේ වදාරති.

අපථස්ස පතිතිං හදයස්ස සනතිං
ජෙත්වාන සෙනං සියසාත රූපං
එතොහං කායං සුඛමනු ඵඛාධිං
නසමා ජනෙන නකරොම් සක්කිං
සක්කිං නසම්පජ්ජති කෙනචිමෙ

"මම ප්‍රිය මනාප සුභාවයෙන් ඉදිරියට එන්නාවූ කෙලෙස සේනාව සිඳ ධ්‍යාන කරමින් හෘදය ශාන්තියට පැමිණ අර්හත්ඵල විමුක්ති සඞ්ඛ්‍යාතවූ අමෘතසිද්ධිය ලැබූ හෙයින් හුදෙකලාව වෙසෙමි. එහෙයින් කිසිවෙකු සමග මගේ මිත්‍ර සන්ථවයක් හෝ හමුබවක් නොයෙදෙයි."

ඉක්බිති අරති මාර දූ තෙමෝ මෙසේ කියයි.

කථං විහාරී බහුලෝධ භික්ඛු
පඤ්චාසතිණ්ණං අතරීධ ජට්ඨං
කථං ඛ්වාසිං බහුලං කාම සඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධයොනං?

"මේ ශාසනයෙහි කවර විහරණයක් බහුලකොට ඇති භික්ෂුව පඤ්චඕරම්භාගිය කෙලෙස් තරණය කෙළේද? මනොඕරම්භාගිය කෙලෙස් කෙසේ තරණය කෙළේද? කවර ධ්‍යානයක් බහුල කොට ඇති භික්ෂුවගෙන් කාම සඤ්ඤාවෝ බැහැරව යෙද්ද?

සම්බුදුහු මෙසේ වදාරති.

පස්සද්ධකායෝ සුවිමුත්ත චිත්තෝ
අසඛ්බරානෝ සතිමා අනොකෝ
අඤ්ඤාය ධම්මං අවිතක්ක ඣායී
නිකුප්පති නිස්සරති නිවීනෝ

සංසිඳුනු නාම කය හා රූපකය ඇති; සංස්කාරයන් රැස් නොකරන; ක්ෂීණාශ්‍රව රහත්තෙම; චතුස්සත්‍යය දැන අවිතර්ක ධ්‍යානයෙන් [චතුර්ථ ධ්‍යානයෙන්) ධ්‍යාන කරණ සුළු වූයේ නොකිපෙයි. (අරමුණ) රාග වශයෙන් සිහිනොකරයි. ඒන මිද්ධයන් ඇත්තේද නොවෙයි (මෙයින් මොහය ගත්තයුතු බව දැක්වේ.)

එවං විහාරී බහුලෝධ භික්ඛු
පඤ්චාසතිණ්ණා අතරීධ ජට්ඨං
එවං ඛ්වාසිං බහුලං කාම සඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධයොනං

"මෙබඳු විහරණයක් බහුල කොට ඇති භික්ෂුහෙම පඤ්චඕරම්භාගිය කෙලශොඝය හෙවත් පඤ්ච ඔරම්භාගීය සංයෝජනද; සවන මනොඕරම්භාගිය කෙලශොඝය හෙවත් උද්ධම්භාගීය සංයෝජනද කරණය කෙළේය. මෙබඳු මහණහු කෙරෙන් කාම සඤ්ඤාවෝ ඇත් වෙත්.

අනතුරුව රහා මරදූ තොමෝ මෙසේ කියයි.

අවෙජ්ජ තණහං ගණ සඞ්ඝවාරී
අඤ්ඤා වරිසසනන්ති බහුව සඤ්ඤා
බහු වතායං ජනතං අසොකෝ
අවජ්ජ නෙසසති මච්චු රාජසස පාරං

ජන සමූහයා අතුරෙහි හැසිරෙන මේ ශාසනානු තෘෂ්ණාව සිඳලූහ. ඒකාන්තයෙන් බොහෝ සැදුවත්හුද මොහු ඇසුරු කෙරෙත්. (මොහුගේ ධර්ම අනුව පවතිත්.) මේ ශාසනානු බොහෝ ජනයා මරහුගේ අතින් පැහැර ගෙණ නිවත් පුරයට පමුණුවත්.'' (අහෝ හානියකි!)

මෑයට පිළිතුරු වශයෙන් තථාගතයන් වහන්සේ මෙසේ වදාරණසේක.

නයනතිවෙ මහාවීරා – සඤ්ඤමෙමන තථාගතා
ඔමෙමන නයමානානං – කා උසූයා විජානතං

තථාගතවරයෝ ලෝසතුන් දැහැමින් හික්මවත්. (කෙනෙකුට අලාභයක් හෝ පීඩාවක් නොකර අනුකම්පාවෙන් කරුණු පහදන්) දැහැමින් හික්මවද්දී කුමන ඊර්ෂ්‍යාවක්ද?

මරහතන් විසින් මෙසේ දක්වනලද සත්‍රී මායාවන් හෝ යොදන ලද උපක්‍රමයන්ගෙන් හෝ කරණලද කථාවලින් හෝ සම්බුදුරදුන් වශී කරණු නොහැක්කාහු බලවත් කළු කිරීම් සඳහාවයෙන් පසු තැවිලි ගතියෙන් පරාජිත ආකාරයෙන් වසවත් මරු කරා ආපසු ගියාහුය. මාරයා තවමත් බිමහිරි අදිමින්ම සිටියේය. ඇත එත දූවරුන් තිදෙනා දැක ''දරුවනි මම නුඹලාට මේ බව ප්‍රථමයෙන්ම නොකීවෙම්ද? නෙලුම් දඬුවකින් මහ පර්වතයක් ඔසවන්ට යත්න දරන්නාහුද? කලුගල් පර්වතයක් නියෙන් හාරන්නාහුද? යකඩය දතින් සපන්නාහුද?'' (මෙසේ කියා මරදූන් සමග වසවත් මරු දෙව්ලොවටම ගියේය.)

මෙලෙසින් තථාගතයන් වහන්සේ ''තණහා''– ''රති'' ''රහා'' යන මරහතන් තිදෙනා සුලභින් දුරුවන සුළුන් පොදක් මෙන් දුරුකළ සේක.

"තණහා-රතී-රගා" යනු "රාග-දෙස-මොහ" තුනද?

මෙහි දැක්වූයේ සංයුත්ත නිකායෙහි ඇතුළත් මරහතන් පිළිබඳ ප්‍රවෘත්තියයි. මෙතරම් ප්‍රකටව පැහැදිලි ලෙසම පෙනෙන්ට තිබියදීත් – තථාගත දෙශනා මහ දවල් හිරුසේ ප්‍රකටවී බබලද්දීත් වර්තමාන බොහෝ පණ්ඩිතයෝ "මරදෙව් පුතු" නැතැයිද කෙලෙස් මරු පමණක් ඇතැයිද කියති. සිංහල බෞද්ධ පොත් තිබියේවා. අට්ඨකථාද තිබියේවා. **මේ ශ්‍රී මුඛ දෙශනාවන් අසත්‍යයයි කියන්නෝ කවරහුද; තමන්ට "මරු නොපෙනුනත්" බුදුරදුන් කරා පැමිණියේ මරදෙව්පුන් නොවේයයිද කෙලෙස් මරුගයිද දක්වන්නෝ** සම්බුදුරදුන්ගේ සම්බුද්ධත්වය සක්වළ ගලිනුත් එපිට වීසි නොකරද්ද? ඔව්හු බෞද්ධයෝද? තමන්ට "මාරයා" නොපෙනෙන පලියට මාරයෙක් නැතැයි නිගමනය කළොත් මේ තථාගත දෙශනාවන් සියල්ලම වෛතුල්‍ය ධර්මලෙස සලකා ත්‍රිපිටකයෙන් බැහැර කරන්ට සිදුවෙයි. මාරයා අරමුණු කරගෙණ වදාළ තථාගත දෙශනා පමණක් ඉවතලූ කල තවත් එලෙස සැකකළ යුතු දෙශනාවන්ට කුමක් කරන්නෝද? එසේම තථාගත දෙශනාවෙහි බොහෝ තැන්වල ශක්‍රයා අරමුණු කරගෙණ දෙශනාකර වදාළ"

සාහු දස්සන මරියානං-සන්නිවාසෝ සදා සුඛෝ" (ධම්මපදය) ආදී දෙශනාද හැරදැමිය යුතුය. ඇයි? ශක්‍රයා අපට නොපෙනෙන නිසයි. ඔහු දැන් සියලූ බෞද්ධ කටයුතු හැරදමා කෙළි දෙලෙන් වරහන් සමග නටමින් සිටින නිසයි. නර පණුවන් ගැණ දැන් ඔහු කිසිම බැල්මක් නොහෙලන නිසයි. ශක්‍රය! ඔබේ පඬුපුල් සලස්න **දැන්** නැද්ද?

ඇතැම් අයගේ අද්භූත කථාවක් නම් තණහා-රතී රගා යන මාර දුහිතෘන් තිදෙනා රාග දෙස-මොහ වශයෙන් හැඳින්වීමයි. මාර දුහිතෘන් සම්බුදුරදුන් කරා පැමිණියේ බුද්ධත්වයෙන් වළියකට පසුවයි. ඇතැම් තැනක "පස්වෙනි සතියේ"දී ආ බවක්ද පෙනේ. ඒ කෙසේ උවත් ඔවුන් ආවේ බුද්ධත්වයෙන් පසුව බව **නම්** නිසැකය. **එසේ කල්හි සම්බුදුරදුන් වෙතට ආවේ මරහතන් නොව රාග-දෙස-මොහ යයි හත්කල බුදුබවෙන් පසුවත් තථාගතයන් වහන්සේට රාග-දෙස මොහයන් පහළවූ බව පිළිගත යුතු නොවේද?**

මාගන්දිය සූත්‍රය

සංයුත්තනිකායෙන් පිටත්තන්හිද "මාර දුහිතෘන්" පිළිබඳව වදාළ තථාගත දෙශනා ඇත්තේය. ඒ මෙසේයි. කුරුරට මාගන්දිය මහබමුණුගේ හා බැමිණියගේ ආදරණීය දුවනියක් විසුවාය. ඇයගේද නාමය "මාගන්දිය"ය. රජ කෙනෙකුට භාර්‍යාවක් වීමේ භාග්‍යයද ඇතිව සිටි මාගන්දිය බැමිණිය පිළිබඳ නොයෙක් රජ-ඇමති-සෙනෙවි ආදීන්ගේ දරු කුමරුවන් විසින් විවාහ යෝජනා කරණ ලද නමුත් ඒ සියල්ල මාගන්දිය විසින් නුසුදුසු බව පවසා ප්‍රතික්ෂේප කළාය. "මා සමාන රූපයක් නැති කෙනෙකු සමග විවාහ නොවෙමැයි" නිගමනය කර සිටියාය. තථාගතයන් වහන්සේ මහ බමුණු යුවලගේ උපනිශ්‍රය සම්පත් දැක ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් එක් දිනක් උදෑසන මාගන්දිය මහ බමුණු ගිනිදෙවියා පුදන කල්හි සම්බුදුරජාණෝ ඔහුට පෙනෙනසේ නුදුරින් වැඩ සිටියහ. බමුණා තථාගතයන් වහන්සේගේ රූපශ්‍රීයාව දැක "අහෝ! මොහු ශෝභමාන පුරුෂයෙක මොහු සමාන කෙනෙක් කිසි දිනෙක නොදුටුවෙමි. මගේ දුවට මොහු නම් ඉතා සුදුසු"සි යනුවෙන් සිතා ලඟට ගොස් "පින්වත මගේ උත්තම රූප ධර ප්‍රියකරු දුවක් සිටී. ඇයට නිසි භිමියෙකු නොලදින් මේ වනතෙක්ම අව්වා-හකව කල් යවයි. ඔබ නම් මගේ දුවට ඉතාම සුදුසු බව පෙනේ. දුවට ඔබද ඔබ දුවටද පෙන්වා දෙදෙනා කැමති නම් විවාහ කරන්ට හැකියි. පැවිදි උවත් ගිහිවනු හැකියි. එහි වරදක් නැත. රැකියාවක් කරන්ට උවමනා නැත. අපට කෝටි ගණනක දේපලද ඇත්තේය. දුවණියට සුදුසු භිමියෙකු පමණි අප සොයන්නේ" යනුවෙන් පවසා ඇය සරසවා ගෙණෙන තෙක් මෙහිම මඳක් හිඳිනු මැනවයි අයැද බමුණා වහ වහා සිය නිවසට ගොස් මහ බැමිණියට කථාකොට "අප දුවණියට ගැලපෙන උතුම් රූසිරි දරන කෙනෙකු ලදිමි. දුවණිය සමග වහා සැරසී එව"සි පවසා තිදෙනාම එක්ව සම්බුදුරදුන් වැඩ සිටි තැනට පැමිණියාහුය.

සම්බුදුහු බමුණා ගියපසු එතැන පා සටහණ පමණක් පෙනෙනසේ ඉටා නුදුරුව අදෘශ්‍ය මානව වැඩ හුන්හ.

අඹුව හා දුවණිය සමග ආපසු පැමිණි බමුණා තථාගතයන් නොදැක ඒ මේ අත සොයනුයේ පා සටහන් දැක මේය ඔහුගේ පියවරය. දැන් දැන් මෙහිදී දැකිය හැකියයි නෙපලේය. බැමිණි තමා නුවණැති හෙයින් සිරිපා සටහන් දැක:- "රතනාසනි එකකුම්භකං පදං හමෙ" ආදීන් "මේ පා සටහණ ඇති තැනැත්තේ ඒකාන්තයෙන් රාග-දෙස මෝහයෙන්

ප්‍රහීන කළ උතුමෙකු විය යුතුයයි" පැවසුවාය. සිරිපා සටහණ පිළිබඳ මෙසේ විවාද කරණකල සම්බුදුරජාණන් පෙනී සිටියහ "භා! අන්න! අන්න!! ඒ උතුමා" යනුවෙන් පැවසූ මහ බමුණා දුවණියත් සමග ගොස් තථාගතයන් වහන්සේට දුවණිය පෙන්වා කැමැත්ත විවාළේය. එවිට සම්බුදුහු:-

දිස්වාන තණහං අරතිං රගඤ්ච
නාහොසි ජන්තු අපි මෙථුනයම්හි
කිමෙවිදං මුත්තන කරීස පුණ්ණං
පාදාපි නං සම්ඵුසිතුං නඉච්ඡේ

යන ගාථාව වදාළහ. (බමුණ! **තණහා රතී - රගා** යන (දිව්‍ය) මාර දුහිතෘන් තිදෙනා දැකත් මට කාම සංකල්පනාවක් ඇති නොවීය. මළ මුත්‍රවලින් පිරුණු මේ කුණු ගොඩ වැළඳ ගැනීම තබා මගේ දෙපා පිස දැමීමටවත් මම කැමති නොවෙමි" යනු එහි අදහසයි.

මේ ගාථාව ප්‍රධාන කොට ඇති මාගන්දිය සූත්‍රයෙන් ධර්මදේශනා කළසේක. අවසානයේ මහ බමුණා හා බැමිණියද අනාගාමී ඵලයෙහි පිහිටියාහු දුවණිය ගෙණ ගොස් ඔවුන්ගේ සොහොවුරු කෙනෙකුට පවරා සස්නෙහි පැවිදි උපසැපත් බව ලැබී.

"එපා නම් ඒ බව නොකියා මා අසුචි වළක් ලෙස මවු-පියන් ඉදිරියේ අවඥාවට පැමිණවූ මොහුගෙන් මම කවදා හෝ පළිගනිමැ"යි මාගන්දිය වෛර බැන්දය. පසුව ඇය උදේනි රජුට අග මෙහෙසියවී සම්බුදුරජුන්ට අපහාස කළ අයුරු ප්‍රකටය.

මෙහි අපට උවමනා කරන්නේ **"දිස්වාන තණහං අරතිං රගඤ්ච"** යනාදී ගාථාවයි. මෙය තථාගත දෙශනාවක් බව පිළිගන්නාහුද? එසේ නම් **මරහතන් පිළිබඳ දුර්මත නිරාකරණය වෙයි.** වැඩි කථා කුමටද? තථාගත දෙශනාවක් නොවෙයි නම් ඒ බව ස්ථාපිත කළ යුතුයි.

විශේෂයක්

මරහතන් අජපල් නුගරුක මූලදී සම්බුදුරදුන්ගේ පාදපරිචාරිකා බව පතද්දී ඔවුන්ට නොරැවටිය යුතු බව දක්වා:-

යස්සජිතං නාවජීයති-ජිතමස්ස නොයාති කොචිලොකෙ
ආදී ගාථා දෙකක්ද දෙශනා කළ සේක. එය **ධම්ම පදයේ** "බුද්ධ වර්ගයෙහි" දත යුතුයි.

"මාරයා" පිළිබඳව තවත් දෙශනා

අට පිරිස්:- **"අට්ඨකෝ ඉමා සාරිපුත්ත පරිසා"** යන්නෙන් "මහා සීහනාද" සූත්‍රයෙහි අට වැදෑරුම් පිරිසක් පිළිබඳව දෙශනා කර ඇත්තේය. තථාගතයන් වහන්සේ මේ අටවැදෑරුම් පිරිස මධ්‍යයෙහි වෛශාරද්‍ය ප්‍රාප්තව වැඩ වසන සේක.

රජ- බමුණු- **ගහපති**- **සමණ**- **චාතුම්මහාරාජික**- **තාවතිංස** - **මාර** - **බ්‍රහ්ම** - යන පිරිස අට පිරිස නම්වේ. මේ පිරිස්වලට අයත් සියලු සත්වයන්ට හිතවැඩ පිණිස සම්බුදුහු සදහම් දෙසූහ, ඔවුන් මධ්‍යයෙහි විශාරදව අසීතව වැඩ සිටියහ.

මෙහි **"මාර පිරිස"** යන්නෙන් තථාගතයන් වහන්සේ වදාළේ කෙලෙස් මරුන් පිළිබඳවද? නැතහොත් වසවත් "මර" දෙව් පුතුගේ පිරිස ගැණද; **"මාරකායික"** දෙවියන් වශයෙන් ධර්මයෙහි දැක්වෙන්නේ කවුරුන් පිළිබඳවද? **මාරයා නැනැසි කියන්නෝ මෙයට පිළිතුරු දෙත්වා!**

"සමාරකෙ"

නෙව තාවාහමයිකඛවෙ සදෙවකෙලොකෙ "සමාරකෙ" සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රහ්මණියා සදෙවමනුස්සාය-(ධම්මචක්ක) **(11) නබ්බාහංතං ආවුසො පස්සාමි සදෙවකෙ ලොකෙ "සමාරකෙ" සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය**:- ආලවක (සුත්තං) ආදී ස්ථානවල සම්බුදුරජාණන් වහන්සේ "සමාරකෙ" (මරුන් සහිතවූ) යන්නෙන් වදාළේ;කෙලෙස් මරුන් පිළිබඳවද; නැතහොත් **වසවත් මරු** පිළිබඳවද? **පිළිතුරු දෙත්වා!**

"මාර" ශබ්දය යෙදූනු තැන්

මුත්තෙනාහං "මාර" පාසෙනි:- මෙහි මාර ශබ්දයෙන් දිව්‍යමය-වූද මානුෂිකමයවූද කාම ගුණයෝ දෙසිනයහ. (මහාවග්ගපාලි)

ඛුන්ථ මච්චුනො සෙනං:- "මරසෙනඟ කම්පා කරවි!" **මෙහි** මාරසේනාවෝ නම් 1500 ක්වූ කෙලෙශයෝය.

නත්ථි මච්චුස්ස නාගමො:- මාරයාගේ නොඑමක් නැත. **මෙහි** "මාර" ශබ්දයෙන් මරණය අදහස් කරනු ලැබේ. (සංයුත්තනිකාය)

තේ ඡෙත්වා මච්චුනෝ ජාලං – අථියා ගච්ඡන්ති කාමදා

(දෙවපුත්ත සංයුත්තක කාමද සූත්‍ර)

"ආයස්සියෝ මරුගේ දැල බිඳ දමා යති" මෙහි "මාර" ශබ්දයෙන් **"ක්ලේස් මාරයා"** අදහස් කරණු ලැබේ.

හත්වා නමුචිනෝ සේනං:– "මරසේනඤ්ච බිඳ" යන්නෙන් දෙවපුත්ත සංයුත්තකයෙහි යෙදූ "මාර" ශබ්දයෙන්ද දැක්වූයේ ක්ලේස් මරුය.

"අයං" වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධකාර මකාසි **මාරං** අපදං වධිත්වා **මාර චක්ඛුං** අදස්සනං ගතෝ පාපිමතෝ" යන්නෙන් මැදුම් සඟියෙහි **නිවාප** සූත්‍රයෙහිදී "විදර්ශනා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදුණු භික්ෂු තෙමේ **මාරයා** ගේ ඇස අඳුරු කෙළේය. ප්‍රතිඡ්ඡාදනය කෙළේය. මාරයාට නොපෙනී ගියේය"යි වදාළ සේක. විදර්ශනාපාදක චතුර්ථ ධ්‍යානයට සම වැදුනු භික්ෂුවගේ සිත මෙනම් අරමුණක් නිසා පවතියයි මාරයාට නොපෙනේ. වසවත් මරු එය දැකීමට අපොහොසත්ය. විදර්ශනා පාදක චතුර්ථ ධ්‍යානය **මාරවිෂය** ඉක්ම යාමකි. ඒ නිසා මෙහි "මාර" ශබ්දයෙන් "වසවත් මර දෙවිපුත්" අදහස් කරණු ලැබේ.

මෙහි දැක්වූ මාරයා ක්ලේශමාරයා වශයෙන් සැලකුව හොත් විදර්ශනා පාදක චතුර්ථධ්‍යානයෙන් සියලුම **ක්ලේස්** ප්‍රහීන විය යුත්තාහ.

තුවං බුද්ධෝ තුවං සත්ථා–තුවං මාරාභිභූ මුනි යන්නෙහි යෙදී තිබෙන "මාරාභිභූ" ශබ්දයට චතුමාරාභි භවනෙන" යනුවෙන් අර්ථ කථාවෙහි අර්ථදී තිබේ. චතුර්මාරයන් දමනය කළ යනු එහි අර්ථයි. මෙහි දෙවපුත්‍ර – ක්ලේස – ස්කන්ධ – අභිසංස්කාර – යන සිවුමරුන් පමණක් ගෙණ අර්ථ විවරණය කර තිබේ.

මේ අර්ථයම **සලකා** ගෙණ "නාමාෂ්ට ශතක" නම් ශ්ලෝක පොතේ කර්තෘවරයා තථාගතයන් වහන්සේට සතුති ගීතිකා ප්‍රබන්ධ කරමින් **"චතුර්මාරාරි චිජිතං–තථාඥං සංකරං ශිවං"** යන්නෙන් "සිවුමරුන් දිනූ" කියා දෙවපුත්‍ර – ක්ලේශ – අභිසංස්කාර – **ස්කන්ධ** යන මරුන් සතර දෙනා පමණක් ඇතුළත් කෙළේය.

දික් සඟියේ "මහාවදන" සූත්‍රයෙහි **"විජිත සඞ්ගාම"** යන දෙශනා පාඨයට විස්තර ලියූ අටුවාවෙහි දෙවපුත්‍ර – මෘත්‍යු – කෙලශ යන මරුන් තිදෙන පමණක් ගෙණ "දිනන ලද ත්‍රිවිධ මරුන් ඇති" යන්නෙන් අර්ථ විවරණය කර තිබේ.

"අගහඤ්ඤ" සූත්‍රයෙහිදී "මහණෙනි **මාර බලය** තරම් මැඩ පැවැත්විය නොහැකි අන්කිසි බලයක් මම නොදනිමි. එයද මේ අතීත් ඵලයෙන් මැඩ පැවැත්වේ"යයි – වදාළ "**නාහං භික්ඛවෙ අඤ්ඤං එකබලම්පි සමනුපස්සාමි යං එවං දුප්පසහං යථයිදං භික්ඛවෙ "මාරබලං"**" යන්නෙහි ඇතුළත් "මාර" ශබ්දයට අර්ථ-කථාවෙහි අර්ථ විවරණය කිරීමේදී දෙවපුත්‍ර – කෙලශ – මෘත්‍යු – යන මරුන් තිදෙනා පමණක් ඇතුළත් කරණලදී.

මේ දක්වූ සෑම සථානයකදීම විශෙෂයෙන් දෙවපුත්‍ර මාරයා ඇතුළත් කර තිබෙන බව පෙනේ.

"මාරයා බුදුවූ හැටි"

තථාගතයන් වහන්සේගේ **මහාපරිනිර්වාණයෙන්** පසුව "වසවත්ති මරු" ප්‍රසිද්ධියේ පැමිණි අවස්ථාවක් පිළිබඳව "සඟසරණ" නම් සිංහල බණ පොතේ ඇතුළත් ප්‍රවෘත්තියක් වෙයි. සැදැහැවතුන්ගේ දැන ගැණීම පිණිස එහි තිබෙන අයුරින්ම මෙහි දක්වමු.

කලදරවාසී "**පුස්සදෙව**" නම් තෙරුන් වහන්සේ දඟැබ් මලුව හැමද සිවුර එකන්පස්හි බහලා අතුරණලද නිකමල් රැසක් වැනිවූ සමව පතලාවූ වැලි ඇති දහඟැබ් මලුව බලා බුද්ධාලම්බණ ප්‍රීති උපදවා සිටිසේක. එකෙණෙහි **මාර** තෙම පවිත්‍ර සම්පයෙහි උපන් කළු වඳුරක්හු සැටියෙන් දඟැබ් මළුයෙහි ගොම විසුරුවා ගෙණ ගියේය. තෙරුන් වහන්සේ චිත්තෙකාග්‍රතාවක් නොලදින් රහත්වන්නට නොපොහොසත්වූ සේකි. ඔවුන් වහන්සේ නැවත මළුව හැමද වැඩ සිටිසේක් දෙවෙනි දවස් මාලු ගොණෙකු සැටියෙන් එසේම ගොම්ලාගෙණ ගියේය.

තෙරුන්වහන්සේ එදවස්ද රහත් වන්නට නොපොහොසත්වූ සේක් තුන්වන දවස් පය කොර **එකක්හුගේ** සැටියෙන් පය **බිම** ගාගෙණ ගියේය. තෙරුන් වහන්සේ මෙවැනි **පිළිකුල්** සත්වයෙක් හාත්පසින් යොදනක් පමණ තැන තැන. මේ **මාරයා දැසි විවාරා වදාළසේක.**

ඉක්බිති **මාර** තෙම දැන්වූකලී වංචාවක් නොකොට හැක්කැයි සිතා මම "**මාරයෙමි**"යි කීය.

තෙරුන් වහන්සේද තොප සම්බුදුන් වහන්සේ දුටු විරූදැයි විචාළසේක. වහන්ස! එසේය දුටුමියි කීය. තෙරුන් වහන්සේ **මාරයා** තම් මේ මහානුභාව ඇත්තේය. එබැවින් සම්බුදුන් වහන්සේ වැනි රූපයක් මවවයි! වදාළ සේක. වහන්ස! එවැනි රූපයක් මවන්ට නොපිළිවන. එහෙත් එවැනි රූ සටහණක් මවමියි කීයා තමාගේ සැටිය හැර සම්බුදුන් වහන්සේගේ රූපය හා සමවූ ආත්මභාවයෙන් සිටියේ.

ඉක්බිති තෙරුන් වහන්සේ **මරණු** බලා මේ සරාග – සදෝස – සමෝහ එකෙක් පවා මෙසේ හොබී නම් කිසි රාගාදී දෝෂයක් නැති සම්බුදුන් වහන්සේ කෙසේ හොබනා සේක් දෝහෝසි සිතා වදාරා බුද්ධාලම්බණ ප්‍රීතිය උපදවා විදසුන් වඩා රහත්වූ සේක."

මාරය! නුඹ පැරදුනෙහියසි තෙරණුවෝ උදන් ඇනූහ. නොසතුටුවූ මාරයා "මම රැවටුනෙමි"යි දුක්වූයේ එහිම අතුරුදහන් විය.

නිගමණය

මෙය කියවන ඔබට දැනට "මාරයා" පිළිබඳ විශිෂ්ට දැනීමක් ලැබී ඇතැයි සිතමු. යම්කිසි ශබ්දයක අර්ථවිවරණය කිරීමේදී ඒක දෙශයක් පමණක් නොසලකා සම්ප්‍රකාරයෙන්ම එහි ඇති අර්ථ බේරුම්කරගත යුතුවෙයි. එහෙයින් "මාර" ශබ්දයට අර්ථ ලියූ පෙළරාණික ආචාර්යවරයෝ:—

දෙවපුත්තෙනා කිලෙසාච-අභිසඞ්ඛාර මාරකෝ
ඛන්ධමාරෝ මච්චුමාරෝ-මාරෝ පඤ්චවිධෝ මතෝ

යනුවෙන් මාරයින් පස්දෙනෙකු ඇති බව හේතු යුක්තිසහිතව දැක්වූහ. මෙහි කිලෙස-අභිසඞ්ඛාර-ඛන්ධ-මච්චු; යන මාරයන් පිළිබඳ විවාදයක් නැත මතභෙදය හා විවාදය ඇත්තේ දෙවපුත්‍ර මාරයා සම්බන්ධයෙන්ය. මේ ධර්ම ග්‍රන්ථයෙහි තථාගත දෙශනා නයින් "දෙවපුත්‍රමාරයා" පිළිබඳ කරුණු විස්තර කරණ ලදී. මෙහි දෙවපුත්‍ර මාරයෙකු ඇති බවට නොබිඳිය හැකි ශාක්ෂි දැක්වීමු. තථාගතා දෙශනා නයින් නම් වසවත්මරු ඇති බව පිළිගත යුතුය. තමන්ගේ ඇසට නොපෙනෙන සියල්ල පිළිබඳවද ප්‍රකෘති ඇසට ගොචර නොවන; තර්කානුකූල නොවන; දේ පිළිබඳවද සැක උපදවන විචිකිච්ඡාහරිත පුද්ගලයින්ට නම් "මෘත්‍යුමාරයා දකින්නතුරුම" වසවත්මරු දකින්ට නොලැබෙනවා ඇත. දෙවියන් බඹුන් පිළිබඳ විශ්වාසයක් ඇත්නම් වසවත්මරු පිළිබඳව පමණක් සැක උපදවනු සුදුසුද? ඔපපාතික සත්ව සඞ්ඛ්‍යාවෙහිලා සලකනු ලබන වසවත්මරු බලවත් දෙවියෙකු බව මෙහි දැක්වූ කරුණුවලින් ස්ඵුට නොවේද? **සක්කපඤ්හ-සක්කසංයුත්තක-බ්‍රහ්මසංයුත්තක-විභඞ්ග** ආදී තථාගත දෙශනා අනුව: ශක්‍ර බ්‍රහ්මාදීන් වෙසෙන බව හා ඔවුන් පිළිබඳ නොරතුරුද සත්‍යබව නොපෙනේද; එහෙත් ඒ ශක්‍ර බ්‍රහ්මාදීන් අතුරෙන් ඔබ කවරෙකු දුටුවෙහිද? නොපෙනෙන ශක්‍රබ්‍රහ්මාදීන් පිළිබඳ සැකයක් නොමැති නම් වසවත්මරු පිළිබඳව පමණක් සැක උපදවීම් යුක්තියුක්තද?

වසවර්ත්තීමාරයාද පින්වතෙකු බව අපි මූලික්ම සඳහන් කෙළෙමු. ලොව්තුරා බුදුබව පතන නියත විවරණ ලැබූ බෝසතුන් හැර සෙසු කවරෙකුට උවද මාරපදවිය ලැබිය හැකි බව විස්තර කෙළෙමු. ඔහුගේ ආයුබලයද සීමාසහිතය. පුණ්‍යඵලය අවසන්-

මීමෙන් ඔහු වසවත්මරු බවින් චුතවන්නේය. කකුසඳ බුදුන්ගේ කාලයේ වසවත්මරුවී සිටියේ ගෞතම බුද්ධශ්‍රාවකවූ මහමුගලන් තෙරුන් බවද ඒ කාලයේ ඒ මාරයාගේ බැණහුවන්වූ දෙවියා ගෞතම බුද්ධකාලයේ වසවත්මරුවූ බවද මෙහි මූලින් දැක්විමු. **මාරෝ ආධිපතෙය්‍යානං-ඉද්ධියා යඤ්ඤා ජලං යත** (වතුක්කඔඟුත්තර) තථාගත දෙශනාවෙන්ම ඔහු ඉද්ධියෙන් හා යඤ්ඤින් පිරිවර බලයෙන් අගතැන්පත් බව දැක්වෙයි. ලෝකයා තමාගේ වසඟයෙහි තබාගැණීමට වෙහෙස දරයි. කුශල විපාකයෙන් උසස් ධන බලය හා පිරිස් බලය ලැබූ මනුෂ්‍යයෝද බලවත් අපරාධ රහසිගතව හා ප්‍රසිද්ධියේ සිදුකරයි. දරුණු අදහස් ඇති ධනෘස්‍ය මිනිසා සෙස්සන් තමාගේ වශයෙහි තබාගැණීමට ප්‍රයත්න දරයි. එමෙන් කුශල විපාක බලයෙන් දෙව්ලොව උපදින වසවත්මරුද ලෝකයා තමාගේ වශයෙහි තබාගැණීමට වෙහෙසෙයි.

මාරයා **මහබෝසත්** තුමන් **කරා** දසබිඹරක් **මරසෙනඟ රැගෙණ** ආවත් **සෙස්සන් කරා** පැමිණෙන්නේ එලෙසින් නොවේ. රූපාවචර-අරූපාවචර කුශල් උපදවන අයට තරමක හතුරුකම් දක්වන මාරයා ලොකොත්තරබව සඳහා වැරවඩන අය කරා මෙහෙයවන්නේ "දසමරසෙන්"ය. **වඤ්ඤකාම** කෙලශකාමයන්හි ඇලුම් කරවයි. ගුණධර්ම පූරණයෙහි **උත්සාහ** කරවයි. **ක්ෂුධාව** හා පිපාසය අධික කරවයි. එහෙයින්ම **අහර සෙවීමෙහි** උද්‍යෝගී බවක් ඇතිකරවයි. **ථීනමිද්ධ** (අධික නිදට කැමැත්ත) උපදවයි. නානාප්‍රකාර **බියකරු අරමුණු මවාපා** බියකරවයි. බොහෝ-සෙයින් යෙදෙන භාවනා කර්මය හරියාදේ නොයාදේ; හරිදේ වැරදිදේ යනුවෙන් විශෙෂයෙන් අධික **විචිකිච්ඡා** සහිත කරවයි. අවවාදයට නොකැමෙන **දුඩිගතියක්ද** තද **මාන්නාධික** සුභාව-යක්ද ඇතිකරවමින් යෝගාවචරයා ලවා අනුන්ට **අවනම්බුකරවන** බවද තමා **උසස්තැනට සලකන හැගීම්** බහුල කරවන බවද පෙනේ. මෙතරම් පැහැදිලිව කරුණු තිබියදීත් වසවත්මරු බෝසතුන් ලඟට නොවේයයි කියන්නෝ තමන් ලඟට "මරු" එන තුරුත් ඒ දෘශ්‍යය නොඉරින්නෝය.

"අවිජ්ජාය නිවුතා ලොකෝ!"

"අමෘතවාහිනී" "ලොක තත්වය" "ලොක විජය" "හේතු-ඵල වාදය" "ලොකොත්පත්තිය හා ලොක විනාශය" යන ධර්මග්‍රන්ථක සම්පාදකය කළ **මුනිදස්ස විරතෝන්** වන මා විසින් ලියූ "මාරවිජය හෙවත් පඤ්චමාර දමනය" මෙයින් නිමියේය.

නිබ්බාණ පච්චයෝ හොතු

ප්‍රාර්ථනාව

බුදෙකානං බොධයිස්සාමි-මුතෙනාහං මොචයෙ පරෙ
තිණෙණාහං තාරයිස්සාමි-සංසාරොඝා මහබ්භයා

මම වතුස්සත්‍යය අවබෝධ කරම්වා! අන්‍යයින්ටද අවබෝධ කරවම්වා! මගේ සිත පවෙන් මිදේවා! අන්‍යයන්ගේ සිත්ද පවෙන් මුදවම්වා! මහා බියකරු සංසාර සාගරයෙන් මම එතෙර වෙම්වා! අන්‍යයන්ද එතර කරවම්වා!

සාධු! සාධු!! සාධු!!!

සියලු සත්වයෝ හැමකල්හි සුවපත්වෙත්වා! නිදුක් වෙත්වා! නීරෝගී වෙත්වා! අවෙර වෙත්වා! කිසිවෙක් කිසිවෙකුට වෛර නොකෙරේවා! කිසිවෙක් කිසිවෙකුට හිංසා නොකෙරේවා! සියල්ලෝම සියලුදෙනාගේම සැප කැමැත්තෝ වෙත්වා!

සබ්බසත්තා භවන්තු සුඛිතත්තා.

සබ්බෙ සඞ්ඛාරා අනිච්චා
සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා
සබ්බා ධම්මා අනත්තා

සියලු සංස්කාරයෝ ඇතිව නැතිවන හෙයින් අනිත්‍යයන. විපතට ගොදුරු වන හෙයින් දුක්ඛය. සඞ්ඛත-අසඞ්ඛත සියලුම ධර්මයෝ අනාත්මයහ.

ඉමාය ධම්මානු ධම්මපටිපත්තියා බුද්ධං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සඞ්ඝං පූජෙමි
අදධාය ඉමාය පටිපත්තියා ජාතියා-ජරා-මරණම්හා
පරිමුච්චිස්සාමි.

තවලොකොත්තර ශ්‍රී සද්ධර්මයට අනුගතව පුරණලද මේ ධර්මානුධර්ම ප්‍රතිපත්ති පූජාවෙන් තථාගත බුදුරජාණන් වහන්සේ පුදමි.

ශ්‍රී සද්ධර්මය පුදමි. සඞ්ඝරත්නය පුදමි. පූජාවේවා! පූජාවේවා!! පූජාවේවා!!! ඒකාන්තයෙන් මේ ධර්මානුධර්ම ප්‍රතිපත්ති පූජාව හේතු කොටගෙණ ජරා මරණාදී දුක්වලින් වහා මිදෙම්වා!

මෙකී වන්දන-මානන-අභිවාදන-අඤ්ජලීකම්-නමස්කාර-සරණාගමන ධර්මශ්‍රවණ-ධර්ම දෙශනා-ධර්මානුධර්ම ප්‍රතිපත්ති ආදියෙන් ජනිත කුශල සම්භාරය හේතුකොටගෙණ මගේ සිත පවෙන් මිදේවා! තෘෂ්ණාව දුරුවේවා! අවිද්‍යාව දුරුවේවා! වේවා! මොහාන්ධකාරය දුරුවී ප්‍රඥාලොකය පහළවේවා! චතුස්සත්‍යය ප්‍රතිවෙධ වේවා! අවසන සිත සුඛලක්ෂණ අමෘතමහා නිර්වාණ ධාතුව මට ශාක්ෂාත්වේවා!

ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයාවහං හොතු!

(මෙය කටපාඩම් කරගෙණ නිත්‍ය ප්‍රාර්ථනාව ලෙස පුරුදුකර ගන්න! මෙයින් නිවන නොවරදවාම ප්‍රත්‍යක්ෂවෙනවා ඇත)

ශිෂ්ටාචාරය හා සභ්‍යත්වය-සහමූලින්ම වගේ වෙනස් කරවීමට තරම් බලවත් විය. එදා යාපන අධිවීපයෙන් මැණිකක්ද අතේ ඇතිව ලංකා සංචාරයකළ රුමිතියකට නිරුපද්‍රතව ආපසු සිය ගමට යාමට හැකි තරම් අභය භූමියක්ව පැවති මේ රටේ අද තත්ත්වය ඉදුරාම වෙනස්ය.

අද මේ රටේ සිදුවන සාහසික අපරාධ හා දුරාචාරකම්ද දෙස බලන කල මේ රටට කුමක්වීදැයි සිතේ. ජීවිතයක වටිනාකම පිළිබඳ කිසිත් හැඟීමක් නැති කෙසේ නෝ ආත්මාර්ථයම ගරුකොඳ සලකන මනුෂ්‍ය ධර්මයෙන් හා ශිෂ්ටත්වයෙන් ඇත්වූ මිනිසුන්ගෙන් මේ රට දැන් ගහණවී ඇත. **සංගීතය; සුරා ව; සූදුව; පරසිරිතට ලොල්වීම;** යන මේ කරුණු පෙර කිසි කලක නොපැවැති තරම් උච්චස්ථානයක පවත්නා බව පෙනේ. එයද අපරාධ හා දුරාචාරකම් ගහණවීමට ප්‍රධාන හේතුවක් වී ඇත. **ආගම අඹින් මෙනැසිද ආගමක් මිනිසාට නුවමණායසිද** පවසන අදහන මිනිසුන් එන්ට එන්ටම වැඩිවෙති. රටක දියුණුවට ජාතික ඇල්ම අත්‍යාවශ්‍යක වුවද විජාතික විදෙශික හැඟීම බහුලකොට ඇති සංකර මිනිස්සු අද මේ රටේ බලවත් තැන්වල වෙසෙති. **විදේශිකවූ ක්‍රිෂ්ණ අධ්‍යාපනය සිංහලයාගේ හා බෞද්ධයාගේ ජීවප්‍රණාලිය විනාශ කරණ විෂ බීජයක් මෙන් දියුණු වේගෙන යයි.**

කරුණු මෙසේ නෙසින් මේ රට නැවත යථා තත්ත්වයට පැමිණීමට නම් බෞද්ධ අධ්‍යාපනය හා බෞද්ධ පරිසරය දියුණු විය යුතුයි. සංකර ගති හළ යුතුයි. විදේශික හැඟීම් බැහැර කළ යුතුයි. ප්‍රංස රුසියා ජර්මන් ආදී යුරෝපීය රටවල බුද්ධාගම දියුණු කරවීමට දහලන ජර්මනියා බෞද්ධයින්ට මේ රටේ අභ්‍යන්තර තත්ත්වය නොපෙන්නාසේය. **බෞද්ධ බලය ඉතා වේගයෙන් පිරිහෙන්නන එයි.** ආගන්තුක විදේශිකයාට මේ රටේ ප්‍රථමයෙන්ම මූණ ගැසෙන්නේ අබෞද්ධ ලකුණුය. ඔහුට ගතකරන්ට වන්නේ අබෞද්ධ පරිසරකය. මහා බෞද්ධයන්යයි කියා ගන්නා ඇතැම්හු අතර බාල් නැටීම (කොක්ටේල්පාටි) සූදුව අධික මද්‍ය පානය සංගීත ලෝලකම් ආදී කරුණු බහුල වශයෙන් පවතී. මේඛන්දත්-ගෙන් බෞද්ධ ගති රැකේද?

2500 ශ්‍රී සම්බුදධ ජයන්තිය

මෙයට අවුරුදු දහයක පමණ සිට මේ රටේ හා වෙනත් බෞද්ධ රටවලද පුරා පැවති **මහ කෝලාහලයක් බුදු ජයන්තිය නමින් විය දියුණුන කෙනෙක්ද බිහි කරවා ගැනීමට ඇතැම් දෙනා ප්‍රයත්න දරුහ. දියුණුන තබා අනාගත බෞද්ධ බලය රැකීමෙහි තරම් ශක්තිමත් කුඩා දරුවෙක්වත් මේ රටේ බිහිවූ-වාදැයි නොදනිමු. "දියුණුන පිස්සුව" ඇතැමුන් තුළ තවමත් පවති.** ලෝකයට ඇසෙන්නට මහා ඝෝෂාවක් කළ ජයන්ති ඝොෂාව බොල්හඬක් විය. මදුතුගේ කුසතුළට පිවිසි දිවුල්ගෙඩියක් විය. පොදු බෞද්ධයා මුළාකළ මායාවක් විය. කාගේ වරද නිසා හෝ වේවා! ජයන්ති වර්ෂය තුළ සිදුවූ අපරාධ හා දූෂණ ක්‍රියා බෞද්ධවූ මේ රටට කිසිසේත් තරම් නොවේ. සම්මේලන පැවැත්-වීමෙන් නෝ පෙරහර කිරීමෙන් බුද්ධජයන්ත්‍ය සමාඩවූයේ නොවේ. **බෞද්ධ බලය තහවුරුවන එකද කටයුත්තක් මේ ජයන්ති වර්ෂය තුළ සිදු නොවීම** බෞද්ධයින් වශයෙන් අපට සංවේග උපදවන්නකි. පාලන බලය හා වසතු බලය පෙරදැරිකරගෙන මෝරුන් හා තල්මසුන් සටන්කරද්දී ඉන්ද්‍රියස්සෝ කුමක් කරද්ද?

පිටකොටුවේ

ශ්‍රී සද්ධම්දූත සමිතිය

කොළඹ වරායේ සේවය කරණ සැදුනැවත් භවතුන්ගේ ධර්ම ඥානය හා බෞද්ධ හැඟීම් දියුණුකරවීමේද, ප්‍රතිපත්ති වර්ධනය කරවීමේද අදහසින් 1954 මැයි 1 දා සිට අප සමිතිය ආරම්භ කෙළෙමු. දිනපතා උදේ 6 සිට 7 දක්වා ධර්මදේශනා කරවීම මේ සමිතියේ **මූලික** පරමාධ්‍යාශයයි. වර්ෂයකට වරක් වටිනා ධර්ම පුස්තකයක් මුද්‍රණය කරවා ධර්මදූතය වශයෙන් පරිත්‍යාග කිරීමද සමිතියේ සද්ව්‍යාපාරයන්ගෙන් එකකි. භික්ෂූන් වහන්සේලා දිනපතා අළුයම වැඩමවා ගැනීමේ අපහසුව නිසා **මුනිදුන වීරකෝන් මහතා** ලවා ධර්මකථා පවත්වත්නෙමු. ධර්මදේශනා කරණ ස්ථානය පිටකොටුවේ මල්වත්ත පාරේ බාන් ඔර්ලෝසු කණුව ඉදිරිපිට සන්නිසථානයයි. දිනපතා කුන්සියයකට නොඅඩු පිරිසක් ධර්මශ්‍රවණය කරණ බවද මේ සද්ව්‍යාපාරය නිසා බොහෝදෙනාගේ ධර්මඥානය හා බෞද්ධ හැඟීම් වැඩිවී ඇති බවද අපරාධ මර්දනයට හා සුචරිත වර්ධනයට විශෙෂ රුකුලක්වී ඇති බවද අවංකව ප්‍රකාශ කරමු.

සමිතියකළ වැඩ

මෙම සමිතිය ආරම්භකොට දැනට (1957 මැයි 1 දිනට) පුරා වසී තුනකි. මේ තෙවෂීය තුළ අප සමිතිය මගින් **ධම් දේශනා දහක් පමණ** පවත්වා ඇත. මාසයකට වරක් ගරු සඟමින් වහන්සේ කෙනක් වැඩමවා ධම්දේශනා කරවනු ලැබේ. (**මුනිදුස වීරකෝන් මහතා** ඉරිදා හැර දිනපතා ධම්දේශනා කරයි.) සෑම **පසළොස්වක්** පොහෝදිනයකම තෙරුවන් විෂයෙහි **විශෙෂ පූජා-වක්ද** පවත්වනු ලැබේ. **ගෞරවණීය ගල්කිස්සේ සුමංගල, පිටකෝට්ටේ සෝමානන්ද, කොට්ඨාවත්තේ සඛාතිස්ස, වැලිගම ඤාණරතන, ගල්කිස්සේ ඤාණරතන, අම්පිටියේ රාහුල, බුද්ධම්පල සුදස්සි,** බද්දේගම **විමලවංශ** යන ධම්කථික සඟමින් වහන්සේලා වැඩමවා ධම්දේශනා කරවනලදී. අප සමිතියේ පැවිදි අනුශාසක ධුරන්ධර ගෞරවණීය **ගල්කිස්සේ සුමංගල** සඟාම්පාදයන් වහන්සේ විශෙෂයෙන් ධම්දේශනා පිණිස වැඩිපුර වැඩමවන බවද සඳහන් කරමු. එසේම එම සඟමින් වහන්සේ ආරෝග්‍යශාලාවේ රෝහිව සිටි අවස්ථාවකදී උන්වහන්සේගේ ග්ලානොපස්ථානය පිණිස අප සමිතිය මගින් **රුපියල් 50/- ක** මුදලක් පරිත්‍යාග කරණලදී. නැවත මේ තුන්වෙනි වර්ෂයේ උන්වහන්සේම දඹදිව සිඛස්ථාන වන්දනා පිණිස වැඩමවූ අවස්ථාවේ අප සමිතිය මගින් **රුපියල් 300/- ක ආධාර මුදලක්** ගමන් **ව්‍යදම්** වශයෙන් පරිත්‍යාග කෙළෙමු. එපමණක්ද නොවේ. **ලංකාදීප පත්‍රය මගින් ඇතිකල රජරට නියං සා අරමුදලට අප සමිතිය මගින්** 1956 ඔක්තෝබර් මාසයේ **රුපියල් 175/- ක** පරිත්‍යාගයක් කරණලදී. තවද 1957 පෙබරවාරි 15 ද පිටකොටුවේ බෞද්ධ සමිතිය මගින් සිදුකරණලද ඕල්කට් ගුණානුස්මරණ පිංකමේ පිරිත් දේශනාකළ සඟමින්වහන්සේලාට අප සමිතිය මගින් පිරිකර පූජාකෙළෙමු ඒ සඳහා **රුපියල් 50/- ක්** ප්‍රදානය කෙළෙමු. එසේම පසළොස්වක් පොහෝ දිනයන්හි සාමාජික පිරිස ශීල ප්‍රතිපත්තියෙහිද යෙදේ.

මේ දක්වා අප සමිතිය මගින් වටිනා ධම්ග්‍රන්ථක තුනක් පරිත්‍යාගකර ඇත. **ලොකවිජය, පිටපත් 2000. ලොක නිස්ස-රණය හෙවත් හේතුඵල වාදය, පිටපත් 2500. ලොකොත්ත-තනිය හා ලෝක විනාශය පිටපත් 4500.** යන දහම් පොත් මුද්‍රණය කරවා ප්‍රදානය කෙළෙමු. සමිතිය ආරම්භ කිරීමට පෙර **ලොකනන්දය** නමැති කුඩා ධම්ග්‍රන්ථකයක්ද පිටපත් 4000 ක්

බුදුධාගම හා සිංහල ජාතිය

ශ්‍රී සම්බුද්ධ තථාගතයන් වහන්සේ ශ්‍රීපාද සඝගීයෙන් පවිත්‍රවූ මේ ලංකාද්වීපය බෞද්ධ රටක් වූයේ විජයා ගමන යටත් පෙර සිටය. මිහිඳු මහා රහතන් වහන්සේගේ පැමිණීමෙන් පසු සෘජු වශයෙන්ම බෞද්ධ රටක් විය. එතැන් සිට ක්‍රමයෙන් බෞද්ධ පරිසරය හා බෞද්ධ ශිෂ්ටාචාරය අනුව හැඩ ගැසුනු මේ රට ධාර්මිකත්වයෙන් හා සුනිඝෂ්ත්වයෙන්ද ලොව අද්විතීයව පැවති බවට ඉතිහාසය සාක්ෂි දරයි.

අවුරුදු දස දහස් ගණනක පරම්පරාවක් ඇති වීත ජපන් ආදී තවත් ජාතීන් ලොව ඇතද වසී දෙදහස් පන්සියයක් තුළ අඛණ්ඩව පවත්නා සත්‍යවූද ක්‍රමානුකූලවූද ඉතිහාසයක් ඇති ජාතියක් සිංහල ජාතිය හැර ලොව කිසිම තැනක නැත. ශිෂ්ටාචාරය කලා ශිල්ප විද්‍යාව ආදියෙන් උච්ච සථානයක වැජඹුන ආර්‍ය සිංහල නමින් ජාතියක් පෙර මෙහි විසූ බවද අමතක නොකළ යුතුයි. ලොක ඝිනියමේ අඛ ඇටයක් පමණවූ මේ කුඩා දිවයිනට අදද ලෝකයා ගරු කරන්නේ අන් කිසිවක් නිසා නොව බෞද්ධ සභ්‍යත්වය හා බෞද්ධ සංස්කෘතිය අනුව හැඩ ගැසුන නිවහල් නිදහස් උදාර ජාතියක් මේ රටේ විසූ නිසාය. ඒ සියල්ලටම ප්‍රධාන හේතුව වූයේ නිමීලවූ තථාගත බුද්ධ ධර්මය බව කිව යුතුයි.

අද වුවද විදේශිකයෙකු මේ රටට පැමිණි කල්හි සිංහලයාගේ තත්ත්වය වටහා දීමට ඔහුව කැඳවාගෙන යන්නේ සිගිරි පොළොන්නරු අනුරාධපුර ආදී පුරාණ නටබුන් සථාන කරායය. ආර්‍ය සිංහලයාගේ කලා කෞශල්‍යය හා සභ්‍යත්වය මූර්තිමත් කොට දක්වන කෞතුක දේවල් දැකීමෙන් විදේශිකයා විස්මය පළ කරයි. පුරාණ සිංහලයාගේ ධීර වික්‍රමාන්විත ගතිය හා පුරාණ සිංහලයා තුල පැවති අද්භූත ආගමික භක්තිය; විදහා පෑන කැඩපත් වැනි කෞතුකවූද ආගමිකවූද තෂ්ටාව ශිෂ්ටයන් දැකීමෙන් වර්තමාන සිංහලයා කෙරෙහි ඉතා ශීඝ්‍රයෙන් දියුණුවෙගන යන අසිංහල - අබෞද්ධ සංකර සිරිත් විරිත් ගැණ ඔවුන් කල කිරෙනු නිසැකය. ලොක සවභාවය අනුව කාලයාගේ පරිවර්තනය හා විදේශිකයින්ගේ අධික සංක්‍රමණයද ඔවුන්ගේ අධ්‍යාපනය හා මිථ්‍යා දර්ශනයන්ද මේ රටේ අධික වශයෙන් බලපවත්වන්ට විය. අවුරුදු 450 ක පිට ඇතිව තිබෙන මේ විදේශීය අවුල මේ රටේ පැවති පූර්වෝක්ත

නොමග යන බෞද්ධයන්ට කියවන්නට සැලසීම බව කියමු. **ඉතා වැදගත් දහම් කොටස් රාශියක් ලිහිල් බසින් මෙහි ඇතුලත් කිරීමෙන් මුනිදුස විරකෝන් මහතාගේ බහුශ්‍රැතභාවය** පෙනේ. ඒ මහතා සම්පාදනය කළ අතගි දහම්පොත මෙසේ නොමසුරුව ශොභන ලෙස මුද්‍රණය කරවා බෙදාදීමට ඉදිරිපත්වූ **ඔබ සමිතිය ප්‍රශංසාවට හා උදාර පිණකමද** භාජන වේය. කියවීමට ප්‍රියවූ දහම් රසයෙන් පිරිපුන් මේ අතගි දහම්පොත අප වෙත පිරිනැමීම් ඔබ හැමට නිවන් සුව පිණිස වේවා!

මීට, භිතවත්,

වලගෙදර සෝමාලෝකතිස්ස ස්ථවිර

30-10-56.

කොටහේනේ උතුරු ස්කිතර් පාරේ අබේසුන්දරාරාමයේ

ගිංතොට අනෝමදස්සි කිමියෝ

මෙසේ ලියති.

මෙත් සිතිනි,

සුපින්වත් මහතාණනි,

ශ්‍රී සද්ධම්දූත සමිතිය මගින් මුද්‍රණයකොට ප්‍රචාරය කළ ලොකොතප්පතනිය හා ලොකචිතාශය තමැති ධම්ග්‍රන්ථය ලැබුන දින සිට කියවූයේ මහත් ආශාවෙනි. එහි විස්තරකොට තිබෙන දහම් කොටස් මෙකලට යෝග්‍යවනසේ පිළියෙලකොට තිබීම වැදගත්ය. එය **ශාස්ත්‍රීය පර්යේෂණ කරන්නවුන්ට ශාස්ත්‍රීය ග්‍රන්ථයකි. ධම්ගවේශකයන්ට සද්ධම් කොෂයකි.** මෙවැනි දහම් පොත් ප්‍රචාරය කරවීම පින්කමක් මෙන්ම ශාස්ත්‍රානිලාෂින්ට මහෝපකාරී වන සත්ක්‍රියාවකි. නිදුක් වෙත්වා!

මීට, කාරුණික,

ගිංතොට අනෝමදස්සි

1-10-56.

සේනපුර අලුවිහාරේගම ශ්‍රී වනසිංහාරාමාධිපති

ඩී. වනරතන ස්ථවිර සවාමිපාදයන් වහන්සේ

මෙසේ ලියති.

තිසරණ සරණයි.

පිටකොටුවේ ශ්‍රී සද්ධම්දූත සමිතියේ
ගරු භාණ්ඩාගාරික තුමන් වෙතටයි.

ප්‍රිය මහත්මයාණනි,

ඔබ සමිතිය මගින් ධම්දූතය පිණිස මුද්‍රණයකළ ලොකොතප්පතනිය හා ලොකචිතාශය තමැති වටිනා ධම්ග්‍රන්ථයෙන් පිටපතක්

මුද්‍රණයකොට ප්‍රචාරය කෙළෙමු. අප සමිතියේ ගිහි අනුශාසක තැන්පත් මුනිඳුස වීරකෝන් මහතා ලවා මේ සියලුම පොත් සමපා-දනය කරවා ගත්තෙමු.

කවද විශෙෂයෙන් 1956 ඇසළ පුරපසළොස්වක් පොහෝදින පනස්තමක මහාසංඝරත්නය වෙත **සඟින් ඍාංඛික දානයක්** පිරිනැමුවෙමු. එහිදී අටපිරිකර 51 ක්ද තවත් බොහෝ ගරු ඔබු සහිතවූ පිරිකරද පූජාකෙළෙමු. **වරාගේ ප්‍රධාන පාලක තැන්පත් ඇම්. චන්‍රසෝම මහතාණන්ගේ** විශෙෂ අනුග්‍රහය ඇතිව "නිව් ඉලෑක්ට්‍රිකල් හෝල්"හිදී එම දානය පිරිනැමූ බවද ප්‍රීතියෙන් සඳහන් කරමු.

පසුගිය වර්ෂයේ එනම් 1956 මැයි මාසයේදී අප සමිතිය මගින් ප්‍රදානයකරණ ලද්දේ **ලොකොතප්පතනිය හා ලොක විනාශය නම්වූ** වටිනා ධර්ම පුස්තකයයි. රුපියල් 3500/- ක වියදමකින් පිටපත් 4500 ක් මුද්‍රණය කරවා ප්‍රදානය කෙළෙමු. මෙම ධර්ම පුස්තක ලබාගත් ගෞරවණීය ස්වාමීන් වහන්සේලා හා ගිහි සැදුහැ-වතුන්ද අප වෙත සතුතිපූර්වකව ලිපි සිය ගණනක් පමණ එවා තිබේ. අප සමිතියේ උදාර පරිත්‍යාගය පිළිබඳව සතුති ප්‍රශංසා ඒ හැම ලිපියකම ඇතුළත්ය. සැදුහැවත් ලෝකයාගේ දැනගැනීම පිණිස එයින් ලිපි කීපයක් පිළිබඳ සාරාංශය මෙහි පළකරවමු.

---

1 වන ලිපිය

අම්බලම්ගොඩ මහාවෙහෙර පිරිවෙනේ ගෞරවණීය

වලගෙදර සෝමාලෝකනියා නායක මාහිමියන් වහන්සේ

මෙසේ ලියති.

පිටකොට්ටේ ශ්‍රී සද්ධම්මදාන සමිතියේ
ගරු ලේකම් මහතා වෙත පුණ්‍යානු-
මෝදනා පූර්වකව ලියා දැනුම් දීමයි.

ධර්මදානය සඳහා මුද්‍රාපනය කරවා ඔබ සමිතිය මගින් බෙදාදුන් ලොකොතප්පතනිය හා ලොකවිනාශය නම්වූ ධර්මපුස්තකය පින්වත් ඇල්. ජී. එච්. පී. ජෝන් මහතා විසින් අපට පිරිනමනලද්දව පිළිගෙන බොහෝදුර කියවා බැලුවෙමු. බෞද්ධ නාමධාරී විශාල ජනසමූහ-යකගේ වාසභූමියවූ මේ ලක්දිව ක්‍රමයෙන් අපරාධ වැඩිවීම ආගමා-නුගත අධ්‍යාපනයක් නොලැබීමේ හේතුවෙන් බව පිළිගත යුතුවේ. එය වළක්වාලීමට ඇති ප්‍රධාන උපාය මෙබඳු බණපොත් පහසුවෙන්

දෙමටගොඩ ඇන්තනීස් පාරේ නො. 64 ආරාමයේ

උඩුබාදන සෝරත හිමි:-

"මා වෙත එවනලද ලොකොතපත්තිය හා ලොකවිනාශය නමැති අගනා දහම්පොත පින්දීමෙන් භාරගතිමි. ඒශෙෂයෙන් ඉගෙණීමෙහි යෙදී සිටින අප වැන්නන්ට මෙයින් ලැබෙන සේවය කිව නොහැකි තරම්ය. මහතුන්ගේ මේ සේවය හදවතට එකඟවම කරන්නක් බව පෙනේ. **සකල බෞද්ධ ලෝකයාගේ නොමසුරු අඟිරය මෙයට හිමිවේවා.**"

බෝමිරියේ සුමනතිස්ස හිමි:-

"දහම් පොත් රාශියක් බලා දනගුතු කරුණු රැසක් මේ එක පොත බැලීමෙන් දනහැක. බණ දහම් පුහුණු කරවන අයට **මෙය හසනසාර වසනුවකි.**"

පුහුල්වැල්ලේ කරයල්කනත්තේ පුරාණ විහාරයේ රාජකීය

පණ්ඩිත කිරින්දේ විමලසිරි හිමි:-

"මේ පොත සකස්කර නිබෙන අයුරු ඉතා අගනේය. බෞද්ධ විශ්වවිද්‍යාලයක ඉගෙනීමෙහි ලබන්නාක්මෙන් බුද්ධාගමේ සෑම විෂයයක් පාසාම **තකීානුකූලව සත්‍යවූ ඥානයක්** මෙයින් ලද හැකියි."

දෙමටගොඩ ශ්‍රී ලංකා ධම්දූත විද්‍යාලයේ

අඹේවෙල පඤ්ඤාසාර හිමි:-

"නොම්ලේ බෙදුදෙන දහම්පොත් රැසක් මා දක ඇතත් ඔබ සමිතිය මගින් බෙදුදුන් මේ පොත් තරම් විශාලවූත් සාරවත්වූත් දර්ශනීයවූත් **වෙන පොත් මා නුදුටු** බව සඳහන් කරන්නේ බලවත් ප්‍රීතියෙනි."

පානදුරේ මිණුවන්පිටියේ අභිනවාරාමයේ

උඩගම බුද්ධානන්ද හිමි:-

"රහවත් මටයිලිටු බසින් විවේචනාත්මකව ධර්මාර්ථයෙන් ඔප්නගා බොහෝ මහන්සියෙන් සකස්කර ඇති **මේ බණපොත** ඉතා වැදගත්ය. ඔබ සමිතියද ඉතා අවංක ප්‍රතිපත්තියක් **පිට පවත්වාගත** යන්නක් බව අවංකව ප්‍රකාශ කරමි."

මා වෙත එවීම ගැන කෘතඥවෙමි. **ගැඹුරු දහම් කොටස් රාශියක් විමර්ශනාත්මකව ධර්මාභිලාෂී හිඟ පැවිදි පිණිතියනට ප්‍රයෝජනවත් ලෙස ලිහිල් බසින් පලවී ඇති අසුරු ඉතා** වැදගත්ය. මෙහි ඇතැම් කරුණු නවීන විද්‍යාඥයින්ගේ මත හා සසඳමින් පුළුල් අවබෝධයක් ආධුනිකයින්ට ලබාදීමට ගත් උත්සාහය මනඹරය. .....

මෙබඳු වටිනා ධර්මප්‍රසාදක කලින්කල වුවද පළවීම සඟර්මී ව්‍යාප්තියටත් භවගාමී සන්තානතතියට නිවන්පුර දෙර විවරවීමටත් හේතුවනු නියතය. ඔබ ශ්‍රී සඟර්මෝදය සමිතිය වටිනා තවතවත් දහම්පොත් බිහිකරවමින් තිරකල් යෙහෙන් වැජඹේවායි ඉෂ්ටාශිංසනය කරණ අතරම දහම්පොතක් එවීම ගැන මගේ ලිපිනය ඔබට දුන් අප හිතවත් ආල්. ජී. එච්. පී. ජෝන් මැතිතුමා ඇතුළු ඔබ හැමට පින් සිදුවේවා.

මිට, හිතකාමී,

ද: **වනරතන**

6-7-56.

වෙනත් උතුමන්ගේ අදහස්.

මරදානේ ස්ටැන්ලි ප්ලේස්හි ගෞරවණීය

ගම්මැද්දේගොඩ ඤාණාරාම හිමි:-

"ඔබතුමන්ගේ සමිතිය මගින් සම්බුද්ධ ජයන්තිය නිමිතිකොට ධර්මදාන වශයෙන් විසුරුවා හරිනලද ලොකොත්තරත්තිය හා ලෝක විනාශය නම් දහම්පොතේ පිටපත් 5 ක් තැපැල් මුද්දර පවා භාර නොගෙන අප වෙත එවීම ගැන කෘතඥවෙමි. **ඔබ සමිතියේ මේ ධර්මදානය හුදු පුණ්‍යාභිලාෂයෙන්ම කරණ බව අවංකව ප්‍රකාශ කරමු.** ඔබ සමිතිය දිනෙන් දින දියුණුවේවා"

හක්මණ මීයැල්ලේ කන්දෙබැද්දේ ශ්‍රී නාගාරාමාධිපති

පණ්ඩිත දෙණගම පියතිස්ස හිමි:-

"මේවර නිකුත්කළ ලොකොත්තරත්තිය හා ලොක විනාශය නම් ධර්මග්‍රන්ථය **ධර්මාකරයක් බඳුය.** මුනිදාස වීරකෝන් මහතාගේ උසස් ධර්මඥතය මේ ග්‍රන්ථයෙහි පිළිබිඹුවී ඇත..... ..... මේ ග්‍රන්ථය කියවීමෙන් බෞද්ධයන්ට ලැබුනුයේ විශාල ප්‍රයෝජනයකි. සැදහැවත්හු මෙයට අනුබල දෙත්වා."

පින්වතුන්ටම කෘතඥතා පූජාකව පින් දෙමු. අප කෙරෙහි විශ්වා-සය තබා ඇත පලාත්වලින් තැපැල් මගින් මුදල් එවූ පින්වතුන්ටද සතුතිවන්ත වෙමු. ආර්ථික තත්ත්වයෙන් නිසිම ප්‍රබල තමක් නැති අප සමිතියේ කටයුතු පිළිබඳව පොදු ලොකයාගෙන් ලැබෙන ආධාර අපි ඉතා උසස් කොට සලකමු. තවද විශෙෂයෙන් අප සමිතියේ නිත්‍ය සාමාජිකත්වයට ඇතුළත්ව මාසික සාමාජික මුද-ලක් ගෙවාගෙන ධර්මදූත කුසලය ලබාගන්නා පින්වතුන් පිළිබඳව අපි වඩාත් කෘතඥ වෙමු. **පින්වත් සාමාජික මහත්මයාණනි.** අපේ දිනපතා ධර්ම දෙශනාව සිදු කිරීමට ඇති ප්‍රබල ශක්තිය ඔබගේ මාසික ආධාරයයි. මේ ධර්ම දූත කුසලයේ මූලික වගකීමද ඔබ සතුය. එහෙයින් ඔබගේ ආධාරය මතු මත්තෙහිත් නොමසුරුව ලැබේවා.

තවද අප සමිතියේ සභාපති ධුරය දරණ ලංකාණ්ඩුවේ විදෙශ කටයුතු ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සැනේට් මන්ත්-රයේ **ඇල්. ජී. එච්. පී. ජෝන් මහත්මයාගේ සහයෝගය** අපගේ මේ සද්ව්‍යාපාරයට විශෙෂ අනුබලයක් බව කිව යුතුයි. අප සමිතියේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කරණ මේ මහතා පරිත්‍යාග ශීලී සත්පුරුෂ කෙනෙකු බව නොමසුරුව සඳහන් කළ යුතුයි. **මේ** ධර්ම පුස්තකයේ මුද්‍රණය සඳහා **රුපියල් 150/- ක පරිත්‍යාගයක්ද** කරණ ලදී. එසේම සමිතියේ කුඩා මහත් සෑම සද්ක්‍රියාවකම මූලික වගකීම භාරගෙන අමතර කාලයක් සමිතිය වෙනුවෙන් යොදවමින් අමතර වියදම්ද කරමින් සමිතියේ දියුණුව සඳහා බොහෝ වෙහෙස ගෙන ක්‍රියා කරයි. අප සමිතියේ ගිහි අනුශාසක මුනිදාස වීරකෝන් මහතාටද අමතර පරිත්‍යාගයක් වශයෙන් ලංකා බෞද්ධ මණ්ඩ-ලය මගින් සම්පාදනය කරනු ලබන **සිංහල ත්‍රිපිටකය හා සිංහල විශ්ව කොෂය** ගැනීම පිණිස මුදලින් රුපියල් 500/-ක පරිත්‍යාග-යක් කළ බවද මතක් කළ යුතුව තිබේ. සැදැහැවත් ජෝන් මහතාගේ චිරජීවනය අපි බලාපොරොත්තු වෙමු.

මෙසේම අප සමිතියේ මුදල් සුරැකිව තබාගෙන ඉතා අවංකවද උදාරීවද සමිතියේ දියුණුව පිණිස නිතවත්ව ක්‍රියා කරණ **භාණ්ඩා-ගාරික තැන්පත් පන්නිපිටියේ පී. ඩී. ඇස්. රාජපක්ෂ මහතාගේ** සේවයද ඉතා ප්‍රසංසනීය බව කියමු. බොහෝ සමිති සමාගම් අභි-වෘධියට යන්නේ මුදල් ප්‍රශ්නය උඩ බව ප්‍රකටයි. අප සමිතියේ භාර භාණ්ඩාගාරික මහතාගේ අවංක ක්‍රියා මාර්ගය ඉතා ඵැදගත් බව පවසන්නේ බලවත් ප්‍රීතියෙනි. මෙබඳු අවිඥා මහතුන්ගේ සහයෝගය සමිතියට බලවත් රැකුලකි.

මේ ගැන මනැස යොදන්න

මේ ලිපිවලින් අප සමිතියේ කටයුතුවල ඇති වැදගත්කම හා අවංකකම මෙය කියවන ඔබටද වැටහී යනවා ඇත. මේ ලිපි එකක්වත් අපේ ඕනෑකමින් ලියවා ගත් ඒවා නොවෙයි අප සමිතියේ මේ ධර්මදාන ව්‍යාපාරය නිසා අද රටේ දහස් ගණන් පොදු මහජනයා ධර්මඥානය දියුණු කරගෙන හොඳ බෞද්ධයන් බවට පැමිණ සිටින බව අප වෙත එවන ලිපි වලින් සනුට වෙයි. සම්බුද්ධ ජයන්තිය සඳහා ශීල ව්‍යාපාරයෙහි යෙදෙන බොහෝ පින්වතුන් අතර අප සමිතියෙන් ප්‍රදානය කරණ ලද බණ පොතක්ද නිබෙනු දක්නට හැකිය. මහජනයාගෙන් ආධාර මුදල්ද ලබාගෙන මෙය කරනත් විශාල අරමුදල් තබා ගෙන මුදල් එකතු කිරීමේ බලාපොරොත්තුවක් ඇතිව සම්මාදම් ලෝකයක් වශයෙන් අප මේ කටයුතු නොකරන බව සිතන්න. පොදු ලෝකයාගේ ආධාර අපවෙත අවංකව ලැබෙන නිසා වඩාත් හොඳින් අපට කළ හැකිවී තිබේ මෙතරම් බැරුරුම් විශාල ව්‍යාපාරයක් අප සමිතිය මගින් සිදුකරනත් අප සමිතිය තවම සංචාරක තත්වයෙන් පවතී. සභා රැස්වීම් පමණකටවත් සමිති කාර්‍යාලයක් නැත. නිත්‍ය සාමාජික භවතුන් දෙසියයකට ආසන්න පිරිසක් ඉසින් මාසික සාමාජික මුදලක් ගෙවාගෙන මේ සමිතිය පවත්වාගෙන යන තමුත් සමිතියේ කිසිම අරමුදලක් නැත. **ලැබෙන සියලුම මුදල් ධර්මදානය සඳහා යොදවනු ලැබේ.**

මේ වර අප විසින් ප්‍රදානය කරණලද මේ වටිනා **මාර විජය** නම් බණ පොත මෙයට පෙර අප විසින් ප්‍රදානය කරණ ලද සියලුම බණ පොත් වලට වඩා ශ්‍රේෂ්ඨ වන බව අපේ හැඟීමයි. අප සමිතියේ අවංක ව්‍යාපාරය ඉතා සාර්ථකවත් බව ඔබද පිළිගන්නවා ඇත. එහෙයින් මතු මත්තෙහිත් ඔබගේ නොමසුරු ආධාරය ලැබේවා!

එතුනි පුවීක පුණ්‍යානුමොදනාව

සුසීන්වන්නි,

මේ වර අප විසින් ප්‍රදානය කරණලද මේ ධර්ම පුස්තකය පිළිබඳව අප සමිතිය මගින් ආධාර පත්‍ර 87 පිටකරණ ලදි. එයට රුපියල් 5696 ශත 45 ලැබී තිබේ. පෝස්ටල් ඕඩරවලින් රුපියල් 32–00 ක් ලැබී ඇත. අයවැය වාර්තාව අවසානයේ ඇත. ආධාර පත්‍ර භාරගෙන ඉතා උනන්දුවෙන් ආධාර මුදල් සපයා දුන් සියලු

විශෙෂ ඉල්ලීමක්

සුපින්වත්නි,

අප සමිතිය මෙතෙක් පවත්වාගෙන ඒමට හැකිවූයේ නිත්‍ය සාමාජික මහතුන්ගේ උදේගය හා පරිත්‍යාගය නිසාය. එහෙත් රටේ ආර්ථික තත්ත්වය දුබලකම නිසාද අපේ සාමාජික මහතුන් බොහෝ දෙනෙකුගේ පදිංචිය හා රැකීරක්ෂා ස්ථාන වෙනස්වීම නිසාද නිත්‍ය සාමාජික පිරිස දැන් බොහෝ අඩුවී තිබේ. අපට දැන් ලැබෙන සාමාජික මුදල ඉතා අඩුය. සාමාජික ල්ැයිසතුවේ නම් දෙසියයක් පමණ ඇතත් මාස්පතා ලැබෙන මුදල ඉන් අඩක් පමණය. **තත්ත්වය මෙසේ වුවහොත් අප සමාගම වැඩිකල් යන්ට පෙර විසුරුවා හරින්ට සිදුවෙයි. එවිට මෙබඳු වටිනා දහම් පොත් ප්‍රදානය කිරීමද වළකින්නේය.** අප සමිතියේ කටයුතුවල ශක්තිය රඳා ඇත්තේ නිත්‍ය සාමාජික පින්වතුන් අතරය. අවුරුද්දකට වරක් ප්‍රදානය කරණ බණ පොතේ බර පැණ සඳහා මුදලකින් ආධාර කිරීම පමණකින්ම මෙම සමිතිය පවත්වන්ට නොහැකියි. එබැවින් අපි වඩා වඩාත් සාමාජික මහතුන් උනන්දුවන ලෙස ඉල්ලා සිටීමු මෙය මුදල් ගැරීමක් හෝ කොල්ලකෑමක් නෝ නොවේ. දහස් ගණනකගේ නුවණැස පාදන අපරාධ මර්දනයට හා සුචරිත වර්ධනයට රුකුල්දෙන විමුක්ති සුඛයද ලබාදෙන ශ්‍රේෂ්ඨ පිංකමකි. එහෙයින් මෙය කියවන ඔබද අප සමිතියේ නිත්‍ය සාමාජිකයෙක් නොවෙහි නම් **අද අදම සාමාජිකත්වයක් ලබාගන්න.** ඇත පළාත්වල සිටින පින්වතුන්ට තැපැල් මාර්ගයෙන් මුදල් එවීමෙන් සාමාජිකත්වයක් ලැබිය හැකියි මාසික සාමාජික මුදල රු: 1/- කි. විශෙෂ රු 2/-කි. ඔබ සතුටු නම් එය එකවරකට හෝ කිපවරකට හෝ මාස්පතා හෝ ගෙවිය හැක. එබැවින් මේ වටිනා ධර්මදාන පිංකමට **ඔබද කොටස් කරුවෙක් වන්න!**

සියලුම ආධාර මුදල් හා ලියුම් භාණ්ඩාගාරික මහතා තමට එවනු මැනවි.

පී. ඩී. ඇස්. රාජපක්ෂ මහතා

පිටකොටුවේ ශ්‍රී සද්ධර්මෝදය සමිතියේ

ගරු භාණ්ඩාගාරික

තෙ: 20, පරණ පාර,
පන්නිපිටිය.

කවද අප සමිතියේ ආරාධනය පරිදි මෙබඳු වටිනා දහම් පොතක් සම්පාදනය කර දීමෙන් **මුනිදුස වීරඤ්ඤාන් මහතා** අපට කරණ අනුග්‍රහය පිළිබඳවම සඳහන් කළ යුතුව තිබේ. ඛණ පොත සම්පාදනය කිරීම ශුද්ධ කරවා ගැනීම ආදී කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන ඒ මහතා විසින්ම මෙය අවසන්කර දීමද අපට ලොකු පහසුවකි.

මෙසේම මෙහි මුද්‍රණය කටයුතු ඉතා ශොභන ලෙසද සැලකිලි වත් ලෙසද ලොකු ලාභයක් අය නොකර හුදු අවංක චේතනාවෙන් කරදුන් **මරදානේ ඩිජිබර්ග්ස් ඇවනිවිහි ගුණරත්න සහ සමාගමේ අධිකාරි මහතුනටද කායික මණ්ඩලයටද** සතුතිවන්ත වෙමු.

ලබන වර්ෂය

2500 සම්බුද්ධ ජයන්ති උත්සවය මේ වෙසක් පුර සොළොස්-වසකින් අවසන් වෙයි. සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් පටන්ගත් බොහෝ ව්‍යාපාරයන් මෙයින් අවසන්වන්ට හැකියි එහෙත් අප සමිතිය මගින් කරගෙන යනු ලබන ධර්මදූතමය මහා පුණ්‍යෝත්-සවයන් තව දුරටත් පවත්වාගෙන යාමට බලාපොරොත්තු වෙමු. ඒ පිළිබඳව ඔබගේ නොමසුරු ආධාරය ලැබේවා. ලබන වර්ෂයේ විශෙෂ ප්‍රින්කම් කිපයක් කරන්ට බලාපොරොත්තු වෙමු. නිත්‍ය සාමාජික මහතුන්ගේ ආධාරයද නොමසුරුව ලැබේවා!

අප සමිතිය මගින් ලබන වර්ෂයේ ප්‍රදානය කරණු ලබන්නේ **ඉරණම හෙවත් කර්ම විපාකය** නමැති වටිනා ධර්ම ග්‍රන්ථයකි. එයද සම්පාදනය කරණු ලබන්නේ **මුනිදුස වීරඤ්ඤාන්** මහතා විසිනි. විශෙෂයෙන් **තථාගතයන් වහන්සේට විපාක දුන් එකොළොස් අකුශලකර්ම පිළිබඳවද** විශෙෂ විස්තරයක් එහි ඇතුළත් වනවා ඇත. බලාපොරොත්තු වන්න. අලඞ්කාර කලාත්මක පිට කවරයකින්ද වටිනා ධර්ම කලාපයකින්ද සම්පාදනයවන ඒ ධර්ම ග්‍රන්ථයකයද සැදහැවතුන්ගේ ධර්මඥනය හා ගුණ නුවණ දියුණු වීමට හේතුවනවා ඇත.

"මාර විජය" ධර්ම ප්‍රකාශනය පිළිබඳ
අය-වැය ලැයිස්තුව

අය	රු. ශත.
ආඛ්‍යාරපත්‍ර 87 කට ලැබුනා	5696. 45
පෝස්ටල් ඕඩර වලින්	32. 00
එකතුව	5728. 45

වැය	රු. ශත
"මාර විජය" ධර්ම ප්‍රකාශනයෙන් පිටපත් 4000 ක්ද ආඛ්‍යාර ලැයිස්තු 300 ක්ද මුද්‍රණය කරවීම, සඳහා මුද්‍රණ ශාස්ත්‍රු වශයෙන්	3590. 00
"මාර විජය" සම්පාදක මහතාට විශෙෂ පරිත්‍යාගයක් වශයෙන්	250. 00
කවරයේ පින්තූරය ඇඳීමට	45. 00
බෙලෝක් තුනක් කැපීමට	150. 00
ආඛ්‍යාර පත්‍රිකා 200 ක් මුද්‍රණය කිරීමට	20. 00
දිග ඇන්වලෝප් 75 ට	1. 75
පෝස්ට් කාඩ් 25 ට	75
වැය එකතුව	4057. 50

අය රු. 5728. 45
වැය රු. 4057. 50
ඉතිරි 1670. 95

මේ මුදල් සමිතියේ ධර්මදූත කටයුතු සඳහා යොදවනු ලැබේ.

මීට අණපරිදි,

ඇල්. ජී. එච්. පී. ජෝන්
ප්‍රධාන සභාපති.
(ආරක්ෂක හා විදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, සැනේව් මන්දිරය)

නිවැරදි බවට
ඩී. ඩී. මුණසිංහ,
පරීක්ෂක.

පී. ඩී. ඇස්. රාජපක්ෂ
භාණ්ඩාගාරික.

ඇල්. බාලසුන්දරම්
ටී ජී. සුංම්බණ්ඩා } සමලේකම්වරු.

විශෙෂයෙන් සැලකිය යුතුයි

සාධුනි

අප සමිතිය මගින් මේ වනවිට දහම් පොත් කලාප (මේ වර්ෂයේ කලාප ගණනත් ඇතුළුව) 15,000 ක් ධර්මදාන වශයෙන් බෙදා විසුරුවා හරින ලදී. පසුගිය වර්ෂවලදී ප්‍රදානය කරණ ලද පොත් ඉල්ලා බොහෝ සාදුහැවතුන් ලියුම් එවා තිබේ. එහෙත් පසුගිය වාරවල ප්‍රචාරය කරවනලද ධර්ම පුස්තකවලින් එකම පිටපතක්වත් අපට වැඩිපුර නැත එහෙයින් **පසුගිය වාරවල ප්‍රචාරය කරණලද පොත් ඉල්ලා එවන සාදුහැවතුන්ට පරිත්‍යාග කිරීමට අප ලග පොත් නැති බව** කරුණාවෙන් මතක්කර සිටිමු.

පුණ්‍යානුමොදනාව

සුපින්වත් සාධුනි,

මේ ගතවූ කෙවර්ෂය තුළ අප සමිතිය මගින් සිදුකරගත් උදාර ධර්ම දානමයවූද ශාසනාලොම්කවූද සියලුම කුශල සම්භාරයන් ලොකශාසනාභිවෘද්ධිකාමී සියලුම දෙව් දෙවතාවෝද; ඔබගේ හා අපගේ නමින් නැසී ගිය සියලුම මළගිය ඤාතීහුද; **අප සමිතියේ නිත්‍ය සාමාජිකත්වය දරාගෙන දිනපතා ධර්මදෙශනා පින්කම් පවත්වාගෙණ යාමට විශෙෂයෙන් මූලිකව ක්‍රියා කරන්නාවූ සියලුම නිත්‍ය සාමාජික** සාදුහැවත්හුද; වෙනත් ආධාරකාරී අනුග්‍රහක පින්වත්හුද; මෙත් සිනින් අනුමෝදන් වෙත්වා! සෙසු සදෙවක ලෝකයාද අනුමෝදන් වෙත්වා! ඔබටත් අපි සැමටත් පරමරමණීය ශාන්ත සුන්දරතර අමෘත මහා නිර්වාණ ධාතුව සාක්ෂාත් වේවා!

මීට සමිතියේ අණපරිදි,

ඇල්. බාලසුන්දරම්

පී. ඒ. පුංචිබණ්ඩා

සම්ලේකම්වරු.

මුදලකට විකිණීම තහනම්. "ලොකවිජය" ග්‍රන්ථමාලා අංක 3.

ලෝක නිර්වරණය

හෙවත්

හෙතු - ඵල වාදය

(ප්‍රතීත්‍ය සමුත්පාදය)



සම්පාදක: ආචාර්ය මුනිදාස වීරකෝන් මහතා

ප්‍රකාශක: සිරිමංගලාරාමාධිපති ශ්‍රී සද්ධම්මරතන සංඝනායක

පළමු වරට (ධම්මදානය පිණිසයි.) 1955

පිටකොටුවේ

ශ්‍රී සද්ධම්දූත සමිතිය

තුන්වෙනි වර්ෂයේ නිලධාරි මණ්ඩලය

පැවිදි අනුශාසක:- ගල්කිස්සේ සුමනාරාමාවාසී ගෞරවණීය ගල්කිස්සේ සුමඞ්ගල සාමිපාදයන් වහන්සේ

ගිහි අනුශාසක:- ආචාර්‍ය්‍ය මුනිදාස වීරකෝන් මහතා

ප්‍රධාන සභාපති:- ඇල්. ජී. එච්. පී. ජෝන් මහතා

උප සභාපති:- සී. සී. වර්ලිස් වෛද්‍යාචාර්‍ය්‍ය මහතා

භාණ්ඩාගාරික:- පී. ඩී. ඇස්. රාජපක්ෂ මහතා

සම්පාදක වරු:- ඇල්. බාලසුන්දරම් මහතා, පී. ඒ. පුංචිබන්ඩා මහතා

පරීක්ෂක:- ඩී. ඩී. මුනසිංහ මහතා

විශෙෂ නිවේදනයයි

ලබන වර්ෂයේදී **"ඉරනම නෙවත් කම්ම විපාකය"** නම් ධර්ම පුස්තකය ප්‍රචාරය කරන්නෙමු. මුද්‍රණය කරවන්නේ සීමාසහිත පිටපත් ගණනකි. ආධාර මුදල් ලැබුනු පමණට කලාප ගණන මුද්‍රණය කරවනු ලැබේ. ඔබද කල් ඇතිව ආධාර කිරීමෙන් පිටපතක් ලබාගත හැකියි.